***Maithree* –** being compassionate towards all.

***Sathya* –** Truthful living

***Aathmgnatha* –** Understating one's own self.

***Sathvangnatha* –** Understating all beings including humans.

***Dharmgnatha* –** Understating the dharma.

***Kalagnatha* –** Understating the time to do something and to refrain from it.

***Nihathamanitha* –** Being a person free from pride.

***Virya* –** Engaging in one's work with unshaken diligence .

***Smruthi* –** Mindfulness.

***Punya sambhara* –** Converting life a place where merits can be accumulated.

***Ghana sambhara* –** Converting life the medium through which wisdom can be acquired.

**Literary Statement – 2**

***"Sathyan vada, dharman chara, sathyanna pramadithvyam, kushalanna pramadithvyam, deva pithru kaaryabhyaan na pramadithvyam, mathru devo bhava, pithru devo bhava, athithi devo bhava, yaanyanavadyani karmani thaani sevithvyaani notharani."***

"Speak the truth, pursue righteousness; do not disregard Truth; do not be indifferent to Dharma; do not disregard good acts; do not forget and fail to do what needs to be done to the several *devathas*, revere your mother, father, visitor as God. Engage in good deeds and refrain from evil."

**Literary Statement – 3**

*"Suddenly awoke from a horrible dream…*

*Starving children begging for meals I had seen…*

*While the entire world was sleeping so comfortably*

*Tears drenched my eyes feeling the unutterable misery."*

**Gibert Yalegama.**

**Literary Statement – 4**

*"Muhudaka wathura langa thiyan rail paarak pichchena tharam…."*

*How severely a rail track gets burn, having "an ocean of water" at hand.*

**From the Sinhala Poetry"Uthurayanna Ganga Mama Kemahi Pokunata" by Thusharika Anthony.**

**Literary Statement – 5**

Time becomes most apt when we see the things as they are. Prior we can live on Moon, Mars or on Venus; we should master the art of living on our very own Earth.

**From "Same Sky, Different Nights" by Nandasiri Jasenthu Liyanage.**

We can use any form of folklore statements or literary statements as aforementioned as a *kamatahana* (object meditated upon) for seeing life.

Finally, I would like to mention something of the word ***"paryeshana"*** (research). This word is formulated by placing the prefix **"pari"** which stands for "every respect, from every direction" at the first and then by adding the word **"eshana"** which is "going in search of" in meaning. Thus, ***Paryeshana*** is going in search every respect, and from every direction. Such a search will add a new knowledge to the world and this knowledge, and this understanding will lead to make the man wise exceeding the limitations of intelligence.

The following quotation extracted from a speech delivered by Dr. EW Adhikaram on 30th October 1969¦ encapsulates the gist of definition of research.

'Education" the advancement of knowledge and educational research are utilized to improve human living conditions: to provide better food" accommodation and transportation. Yet" it does not seem that those have been adequate as to satiate the unquenchable thirst of human beings. Thus" what is expected from a university is a research which would eliminate this perpetual restlessness and ambiguity within human mind. Such a research can be identified as an inner research. Even though a degree or other advantages will be obtained from an effectively conducted external research, no such advantage will be gained from an inner research' Yet it would undoubtedly abide for the well-being of the entire human race'

The following methods can be utilized in any mode of research¦

1. Structural Method.
2. Non-Structural Method.

The above mentioned first method is widely used today while the second method seems to be very rarely followed. Therefore, our special focus is on the second method.

Further, the insight of these scholars of Anthropology is drawn to the following three questions.

1' Is learnedness is about confined to a certain structure rejecting sentiments of life?

2' Should a researcher or a writer limit himself or made limited to a particular structure?

3' Is it impossible to use the standard scholarly research structure to express our sentiments?

As we perceive, academics engaging in researching of any topics, may use the standard scholarly structure to communicate the nonstructural and genuine life patterns of people. Thus, it should be the behavior **(*vijjacharana)*** of the anthropologists.

Significant anthropologist, who emerged in the world from time to time, investigated their own life here on the earth as the medium of research without being restricted to any frame whatsoever. The best examples are Lord Buddha, Jesus Christ, and Socrates. Whatever research result that is enjoyed by the present-day world is nothing, but the comprehensive wisdom socialized by such noble personalities.

I sincerely wish that; this symposium will be a charming transmitter of meaningful research results to the universal society we all are living in!

**Saman Chandra Ranasinghe**

Senior Professor, (Sanskrit)

Department of Languages, Cultural Studies and Performing Arts,

Faculty of Humanities and Social Sciences,

University of Sri Jayawardenepura,

Sri Lanka.

18.12.2020

English Translation by Ayesha Senadheera

## ஒரு சிறந்த சமுதாயத்தை உருவாக்க மானிடவியலைப் பயன்படுத்துதல்

'மனிதன்' என்பது **மன்+இதன்** என்ற இரண்டு சொற்களின் சேர்க்கையாகும் என்று கூறப்படுகிறது. அதாவது, மனத்தை தெளிந்து, மனம் நிலைத்து, மக்களுக்கும் பிற உயிரினங்களுக்கும் மன இதமாய் தொண்டாற்றுகின்ற பெருமக்களே மனிதர்கள்.

'***விஞ்ஞானம்***' என்ற பதத்தில் காணுதல் மற்றும் உணர்தல் என்ற அர்த்தங்கள் உள்ளன. அதன்படி, மனிதன் உட்பட முழுச் சூழல் தொடர்பாகவும் காணுதல் மற்றும் உணர்தல் திறன் கொண்டவரே மானிடவியலாளர் ஆவார்.

மனிதன் தனது உடல் மற்றும் மனத்தைப் பற்றி நன்றாக புரிந்துகொள்ளும் போது நல்ல கதாபாத்திரங்கள் வெளிப்படுகின்றன. அத்தகைய நல்ல கதாபாத்திரங்கள் இருக்கின்ற ஒரு சமூகத்தில் எந்தவித மோதல்களும் ஏற்படுவதில்லை. இதற்கு பௌத்த மதத்தில் கற்பிக்கப்படுகின்ற '***தம்மச்சக்கப்பவத்வன***' என்ற சூத்திரத்தைப் பயன்படுத்தலாம்.

| | |
|---|---|
| '***சக்கு உதபாதி***' | கண் உருவாகியது. அதாவது உலகத்தையும் வாழ்க்கையையும் காண்பதற்காக கண் உருவாகியது. |
| '***ஞானம் உதபாதி***' | புத்தி உருவாகியது. அதாவது உலகம் மற்றும் வாழ்க்கையை பற்றி உணர்தல் உருவாகியது. |
| '***பஞ்ஞா உதபாதி***' | ஞானம் உருவாகியது. அதாவது உலகம் மற்றும் வாழ்க்கையை பற்றி ஞானம் உருவாகியது. |
| '***விஜ்ஜா உதபாதி***' | விஞ்ஞானம் உருவாகியது. அதாவது உலகம் மற்றும் வாழ்க்கையை பற்றி காணுதலும் உணர்தலும் உருவாகியது. |
| '***ஆலோகோ உதபாதி***' | ஒளி உருவாகியது. உலகத்தையும் வாழ்கையையும் காண்பதற்காக ஒளி உருவாகியது. |

இந்த இலட்சணங்களைக் கொண்ட சமூகம், பௌத்த மதத்தின்படி '***விஜ்ஜாசரணசம்பன்ன***' மனித சமூகமாகும்.

'***விஜ்ஜா***' என்ற சொல்லின் சமஸ்கிருத சொல் '***விஞ்ஞானம்***' ஆகும். முன்னர் குறிப்பிட்டபடி, '***விஞ்ஞானம்***' என்பது காணுதல் மற்றும் உணர்தல் ஆகும். '***சரண***' என்ற சொல்லில் பயணம் அல்லது நடத்தை என்ற அர்த்தங்கள் பொதிந்துள்ளன. அப்பொழுது தான் காணுதல், உணர்தல் மற்றும் நல்ல நடத்தை இருக்கின்ற மனித சமுதாயம் உருவாகும்.

அவ்வகையில் '***விஜ்ஜாசரண***' என்பது வாழ்க்கையைப் பற்றி உணர்ந்து, கண்டு, நன்றாக நடந்துகொள்வதாகும். இதற்கு '***சுனாத தாரேத சராத தம்மே***' எனும் பாளி கூற்றை பயன்படுத்தலாம். செவிமடுத்தல்; செவிமடுத்தைப் புரிந்துகொள்ளல் மற்றும் புரிந்துகொண்டவற்றுள் ஒழுகுதல் என்பது இதன் அர்த்தமாகும்.

'நாட்டுப்புறவியல்' என்பது 'செவிமடுக்கப்பட்ட விடயங்கள்' என்ற அர்த்தமாகும். அப்படியே செவிமடுத்த விடயங்கள் நல்லவை எனில் நாங்கள் அதன்படி வாழ வேண்டும். அதன்படி, வாழ்க்கைக்குப் பயன்படும் சில நாட்டுப்புறவியல் கூற்றுகள் மற்றும் இலக்கியக் குறிப்புகள் பின்வருமாறு:

**01 நாட்டுப்புறவியல் கூற்று**

'அனைவரினது நல்ல குணங்களை மதிக்கிறோம்
மனிதராகப் பிறந்து மனிதராக இருக்கிறோம்'

- இது ஒரு ஊனமுற்ற பிச்சைக்காரரின் கூற்றாகும்.

**02 நாட்டுப்புறவியல் கூற்று**

'பதவிவாதக் கொள்கைக்கு உங்களை கல்வி அறிவுள்ளவராக அல்லது புத்திசாலியாக மாற்றலாம். ஆனால் அதற்கு உங்களை ஞானம் படைத்தவராக மாற்ற முடியாது.

- கலாநிதி ரஜ்னீஸ்

**03 நாட்டுப்புறவியல் கூற்று**

'புத்த பெருமானின் தர்மம் நூல்களில் எழுதப்படாமல் உங்கள் இதயத்தில் எழுதப்பட வேண்டும்.'

- தம்பாண வேடுவர் இனத்தலைவர் வன்னிலெத்தோ

**04 நாட்டுப்புறவியல் கூற்று**

'எல்லா உயிரினங்களையும் நண்பர்களாகப் பார்ப்போம்.

- கலாநிதி ராமா டுப்லிஷ்

**05 நாட்டுப்புறவியல் கூற்று**

'கலாசாரம் ஒரு மலர் என்றால், நாகரிகம் என்பது அதன் வாசனை.'

- ஓர் இந்திய ரிஷியின் கூற்று

**01 இலக்கியக் குறிப்பு**

'***லலிதவிஸ்தர***' என்ற நூலில் 108 ஒளி வாயில்களைப் பற்றி குறிப்பிடப்படுகிறது. போதிசத்துவர்கள் இளம் வயதிலேயே இந்த ஒளி வாயில்கள் வழியாக நுழைந்தார்கள். இந்த வாயில்கள் வழியாக நுழைவோர் இருண்ட வாயில்களுக்குச் செல்வதில்லை. அவற்றுள் 12 ஒளி வாயில்கள் மாத்திரம் இங்கே குறிப்பிடப்படுகின்றன.

***'தியாகம்'*** மீண்டும் எதையும் எதிர்பார்க்காமல் நன்கொடை அளித்தல்.
***'மைத்ரி'*** அனைவருக்கும் அன்பு செய்தல்.
***'சத்தியம்'*** உண்மையாக வாழ்வது.
***'ஆத்மஞ்ஞுதா'*** தன்னைப் புரிந்துகொள்வது.
***'சத்வஞ்ஞுதா'*** மனிதன் உட்பட அனைத்து உண்மைகளையும் புரிந்துகொள்வது.
***'தர்மஞ்ஞுதா'*** தர்மத்தைப் புரிந்துகொள்வது.
***'காலஞ்ஞுதா'*** பொருத்தமான காலத்தைப் புரிந்துகொள்வது.
***'நிகதமானிதா'*** பெருமை இல்லாமல் ஒரு மனிதனாக மாறுதல்.
***'வீரியம்'*** வீரியம் விட்டுக் கொடுக்காமல் காரியங்களைச் செய்தல்.
***'ஸ்முர்தி'*** மனதுடன் செயல்படுவது.
***'புண்ணியசம்பாரம்'*** வாழ்க்கையை, புண்ணியங்கள் சேகரிக்கக்கூடிய இடமாக மாற்றுவது.
***'ஞானசம்பாரம்'*** வாழ்க்கையை ஞானம் சேகரிக்கக்கூடிய இடமாக மாற்றுவது.

**02 இலக்கியக் குறிப்பு**

'உண்மையைப் பேசுங்கள்; தர்மத்தில் நடந்துகொள்ளுங்கள்; உண்மையாக இருக்க தாமதிக்க வேண்டாம்; தர்மத்தில் செயற்பட தாமதிக்க வேண்டாம்; புண்ணியங்கள் செய்வதற்கு தாமதிக்க வேண்டாம்; தாயை தெய்வமாகவும், தந்தையை தெய்வமாகவும், விருந்தினரை தெய்வமாகவும், நினையுங்கள்; சரியானதை செய்யுங்கள்; தவறு செய்யாதீர்கள்.'

**03 இலக்கியக் குறிப்பு**

'கனவில் பயந்து, திடீரென்று எழுந்தேன்
பசியுடன் குழந்தைகள் உணவு கேட்பதை கண்டேன்
உலகில் எல்லோரும் மன அமைதியுடன் உறங்கும்போது
என் விழிகள் கண்ணீரில் நனைந்தன'

- கில்பட் யாலேகம

**04 இலக்கியக் குறிப்பு**

'கடல் நீரை அருகில் வைத்துக்கொண்டு, ஓர் ரயில் பாதை எரிகிறது'

- துஷாரிகா எந்தனியின் ***'பொங்கி வழிந்து செல் ஆறே, நான் விரும்பும் பொய்கைக்கு'*** எனும் நூலின் கூற்று.

**05 இலக்கிய குறிப்பு**

'உண்மையை உண்மையாகப் பார்ப்பதன் மூலம் காலத்தை வெல்லலாம். சந்திரனில் அல்லது செவ்வாய் கிரகத்தில் அல்லது வீனஸ் கிரகத்தில் வாழ்வதற்கு முன் நாங்கள் நமது பூமியில் வாழ்வதற்கு கற்றுக்கொள்ளல் வேண்டும்.'

- நந்தசிரி ஜசெந்துலியனகேயின் ***'ஒரு வானம் ஆயிரம் இரவுகள்'*** எனும் நூலின் கூற்று.

மேலே குறிப்பிட்டபடி நாட்டுப்புறவியல் கூறறுகள் மற்றும் இலக்கியக் குறிப்புகளை, வாழ்க்கையைக் காண்பதற்கு நாங்கள் பயன்படுத்தலாம்.

'***ஆராய்ச்சி***' என்பது தேடுதல் ஆகும். அந்தத் தேடல்கள் உலகத்திற்கு புதிய அறிவை சேர்க்கின்றன. அது போல, இந்த புதிய அறிவு, ஞானம் படைத்தவர்களை உருவாக்குகிறது. இத்தகைய ஞானம் படைத்தவர்களை உருவாக்குவதற்காக இரண்டு வழி முறைகளைப் பயன்படுத்தலாம்.

அவைகள்,

- கட்டமைப்பு முறை
- கட்டமைப்பு அற்ற முறை

முதலாவது முறைமை, இன்று அதிகமாகப் பயன்படுத்தப்படுகிறது. இரண்டாவது முறைமை, ஆகக் குறைந்த அலவிலேயே பயன்படுத்தப்படுகிறது. கற்றல் என்பது ஒரு சட்டத்திற்குள் ஒட்டிக்கொள்வது அல்ல. எழுத்தாளரோ, ஆராய்ச்சியாளரோ இத்தகைய சட்டத்திற்குள் செயற்படக்கூடாது. புத்தபெருமான், இயேசுபிரான், சோக்ரடீஸ் போன்றவர்கள் ஒரு கட்டமைப்புக்குள் அல்லது சட்டத்திற்குள சிறைப்படாமல் ஆராய்ச்சி செய்த மானுடவியலாளர்கள் ஆவார்கள். அவர்களால் கண்டுபிடிக்கப்பட்ட அறிவை நவீன சமுதாயமும் ஏராளமாக பயன்படுத்துகிறது. எனவே நாம் இரண்டாவது முறையை பயன்படுத்துதல் நன்று.
இறுதியாக, இந்த ஆராய்ச்சி அமர்வு நாம் வாழும் சமுதாயத்திற்கு நல்ல ஆராய்ச்சி முடிவுகளை வழங்குவதற்காக இருக்க வேண்டும்.

**சமன்சந்தர ரணசிங்க**
சிரேஷ்ட பேராசிரியர் (சமஸ்கிருதம்)
மொழிகள், பண்பாட்டுக் கற்கைகள் மற்றும் அரங்கேற்றற்கலைகள் துறை,
ஸ்ரீ ஜயவர்தனபுர பல்கலைக்கழகம்,
கங்கொடவில, நுகேகொட.
2020.12.18

# FOLK ART

# ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ග්‍රාමීය රූකඩ නිෂ්පාදනය සහ රූකඩ නාට්‍ය කලාව පිළිබඳ ව සමාජ සංස්කෘතික අධ්‍යයනයක් (අම්බලන්ගොඩ, ශ්‍රී අනුර රූකඩ කලා සංගමය ආශ්‍රයෙන් සිදුකරන ලද සිද්ධි අධ්‍යයනය)


වී. ඒ. වී. ද සිල්වා

අපරාධ විද්‍යාව හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*vidudesilva77@gmail.com*



ශ්‍රී ලාංකේය ග්‍රාමීය ආර්ථිකයන්හි ඉතා වැදගත් ස්ථානයක් ග්‍රාමීය කර්මාන්තවලට හිමි වේ. සමහර ප්‍රදේශවල ගැමි ජනතාවගේ වැඩි කොටසක් පූර්ණකාලීන ව මෙම කර්මාන්තවල නිරත ව සිටින අතර එය ඔවුනගේ එක ම ජීවිකා වෘත්තීය වේ. ඒ අතුරින් රූකඩ නිෂ්පාදනය සඳහා හිමි වනුයේ අද්විතීය ස්ථානයකි. රූකඩ කලාව යනු පාරම්පරික ව පැමිණෙන ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමයකි. ශ්‍රී ලාංකේය රූකඩ කලාව හඳුන්වා දී ප්‍රචලිත කිරීමේ ගෞරවය හිමිවනුයේ ගම්වාරි පොඩිසිරිනා ගුරුන්නාන්සේට ය. අම්බලන්ගොඩ, බෝගහවත්ත, වතුගෙදර සහ කන්දේගොඩ රූකඩ ශිල්පීන්ගේ නිජබිම ලෙස ප්‍රචලිත ය. මෙම අධ්‍යයනය අම්බලන්ගොඩ "ශ්‍රී අනුර රූකඩ කලා සංගමය" ආශ්‍රයෙන් සිදු කළ අතර අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වූයේ සාම්ප්‍රදායික ග්‍රාමීය රූකඩ කලාව මුහුණ දී ඇති අනතුරුදායක තත්ත්වයන් සහ ගැටලු විමර්ශනය කිරීම යි. ගැඹුරු සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණය භාවිත කරමින් ප්‍රත්‍යක්ෂ අධ්‍යයන ක්‍රමවේදය ඔස්සේ දත්ත රැස් කිරීම සිදු විය. ප්‍රකට රූකඩ නාට්‍ය ශිල්පී ලව්නේරිස් ගම්වාරි මහතා විසින් ආරම්භ කරන ලද සංගමය ඔහුගේ අභාවයෙන් පසු ඔහුගේ පුතුන් වන නලීන් සහ විපුල ගම්වාරි විසින් පවත්වාගෙන යනු ලැබේ. අධ්‍යයනයට භාජනය කළ රූකඩ කලාවේ නියැලෙන දත්ත දායකයින් පහළ මධ්‍යම පාන්තික, ද්විතීයික අධ්‍යාපනයක් ලද, රූකඩ කලාව තම ජීවිකා වෘත්තීය කරගත්, සරල ආර්ථික රටාවකට හුරු වූවන් බවට නිගමනය කළ හැකි ය. මොවුන් සාම්ප්‍රදායික කුල ව්‍යූහයේ "බෙරවා" කුලය නියෝජනය කරන්නන් ලෙස හඳුනාගත හැකි ය. ආර්ථික අපහසුතා, රූකඩ නිෂ්පාදනයට අවශ්‍ය කඳුරු ලී හිඟ වීම, රූකඩ කලාව නිසි අයුරින් අගය නො කිරීම, රූකඩ කලාව පිළිබඳ ව වත්මන් පරම්පරාවේ ඇති උදාසීනත්වය සහ මූල්‍යමය අරමුණු ප්‍රධාන කරගත් ආධුනික රූකඩ ශිල්පීන්ගේ මතු වීම වර්තමානයෙහි රූකඩ කලාව ක්‍රමයෙන් අභාවයට යාම සඳහා හේතු වී ඇත. රූකඩ කලාව ආශ්‍රිත ව පරිවර්තනයන් කිහිපයක් කාලයාගේ ඇවෑමෙන් සිදු වී ඇති අතර වර්තමානයේ රූකඩ නිර්මාණය සඳහා රුක්අත්තන ලී භාවිතය, රූකඩ නිර්මාණයේ දී ශ්‍රම විභජනය, රූකඩ නාට්‍ය ප්‍රදර්ශනයේ දී තිරරෙදි භාවිතය, කාන්තාවන් චරිත සඳහා යොදා ගැනීම සිදු වේ. පාසල් සහ විශ්වවිද්‍යාල ආශ්‍රිත ව රූකඩ නාට්‍ය ප්‍රදර්ශනය, විදේශිකයින් අතර රූකඩ කලාව ප්‍රචලිත කිරීම සඳහා හෝටල් ආශ්‍රිත ව ප්‍රදර්ශන පැවැත්වීම, රූකඩ ගම්මානයක් නිර්මාණය කිරීම සහ රූකඩ ශිල්පීන් නිසි පරිදි ශ්‍රේණිගත කර ඇගයීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම රූකඩ සම්ප්‍රදායේ අනාගතය රැකගැනීමෙහි ලා යෝජනා වශයෙන් දැක්විය හැකි ය.



***ප්‍රමුඛ පදඃ*** *ග්‍රාමීය රූකඩ කලාව, ග්‍රාමීය ආර්ථිකය, සංස්කෘතිය, රූකඩ නිෂ්පාදනය*

# ශ්‍රී ලාංකේය ජන කලාවෙහි එන රූකඩ කලාවෙහි අතීත වර්තමාන සමාජ භාවිතයන් පිළිබඳ අධ්‍යයනය (පොල්වත්ත ප්‍රදේශය ආශ්‍රයෙන්)

ටී. ටී. එන්. තෙවරප්පෙරුම සහ එස්. ඒ. ඩී. පී. මදුභාෂිනී

දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

*tharathewarapperuma13@gmail.com

ශ්‍රී ලාංකික ජන කලාවේ ප්‍රාථමික යුගයේ සිට පැවත ආ කලාවන් අතර රූකඩ කලාව ප්‍රමුඛ වේ. රූකඩ යනු රූපයෙන් භාගයකි. ඉතිරි භාගය නටන්නා විසින් සපයනු ලබයි. රූකඩ කලාව ප්‍රධාන වශයෙන් නිර්මාණය කරන ලද මාධ්‍ය හා හැසිරවීමේ ස්වභාවය අනුව වර්ග කරනු ලබයි. නූල් රූකඩ, ඇඟිලි රූකඩ, සෙවණැලි රූකඩ, අත් රූකඩ, රිටි රූකඩ මෙයට උදාහරණ වේ. දැවමය රූකඩ නිර්මාණයේ දී රුක්කත්තන, කඳුරු ආදි ගසක් තෝරා කපා කොටා වේලා පදම් කර අවශ්‍ය ලෙස සකසා ගනියි. රූකඩය රංගනය කෙරෙන අවස්ථාව වන විට රූප නිර්මාණය, වෙස්ගැන්වීම, ආලෝකකරණය, සංවාද, සංගීතය, වේදිකා සැරසිලි ආදි අංග ගණනාවක් ම සම්බන්ධ වේ. රූකඩ කලාවේ කලාවේ අතීත, වර්තමාන භාවිතය පිළිබඳ අධ්‍යයනය මෙම අධ්‍යයනයේ අරමුණ වී ඇත. ඒ සඳහා රූකඩ කලාව අදටත් පවතින ගාල්ල දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ පොල්වත්ත ග්‍රාමයෙන් තෝරාගත් ගෘහ ඒකක 100ක් අතරින් මෙම කර්මාන්තයේ ආභාසය ඇති ගෘහ ඒකක 15ක් සමඟ කළ සම්මුඛ සාකච්ඡා ඇසුරින් දත්ත රැස් කළ අතර දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රස්තාර යොදාගන්නා ලදි. ඒ අනුව දැනට රූකඩ කලාව කර්මාන්තයක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමට ඇති නො හැකියාවත්, වියදම ආදායමට වඩා වැඩිවීමත්, රාජ්‍ය අනුග්‍රහය නොමැතිවීමත් යන හේතූන් නිසා රූකඩ කලාව අගාධයට යන බව (80%) වැඩිහිටි කර්මාන්තකරුවන්ගේ මතය යි. පාරම්පරික ව රූකඩ කර්මාන්තය උරුම වූ තරුණ පිරිස (20%) තවමත් වැඩිහිටි ආභාසය ලබමින් මෙම කර්මාන්තයෙන් ජීවිතය සකසා ගනී. ග්‍රාමීය ජනයාට රසාස්වාදය අතරින් සමාජයේ සිදු වන විවිධ හැල-හැප්පීම් ග්‍රාමීය මනසට උචිත ලෙස සමාජගත කිරීම සඳහා මෙම රූකඩ නාට්‍ය යොදාගනු ලබයි. පොඩිසිරිනා ගුරුන්නාන්සේ සාම්ප්‍රදායික ව රූකඩ නාට්‍ය ඉදිරිපත් කළ පුරෝගාමියෙකි. ඔහුගෙන් පැවත එන දරු මුණුපුරෝ අදටත් මෙම ප්‍රදේශයේ පාරම්පරික රූකඩ නාට්‍ය කලා රඟ දක්වති. මෑතකාලීන රූකඩ කලාව සැලකූ විට දකුණු ඉන්දියානු ප්‍රභවයකින් ලැබී අනතුරු ව ලාංකිකයන් අතින් වැඩි දියුණු වී අද වන විට විදේශීය ලක්ෂණ ද කැටි ව ඉදිරියට ගලා යමින් තිබේ. එහි ප්‍රමුඛයන් අතර මහාචාර්ය ජයදේව මහතා ප්‍රධාන වේ. මහල්ලාගේ සිට කුඩා දරුවා දක්වා එකට සිට නැරඹිය හැකි රූකඩ කලාව රැක ගනිමින් ඉදිරියට පවත්වාගෙන යාමට සුළුතරයක් තමන්ගේ දායකත්වය සපයන බවත් අද වන විට සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නො වන ධාරාවන් නියෝජනය කරන ශිල්පීන් මෙම කලාවේ නියැලී සිටින බවත් නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** *රූකඩ, නූල් රූකඩ, ඇඟිලි රූකඩ, සෙවණැලි රූකඩ, අත් රූකඩ*

# ශ්‍රී ලාංකේය ජන කලාවෙහි එන වෙස් මුහුණු කලාව හා බැඳි අතීත සමාජ භාවිතයන් හා වර්තමාන තත්ත්වය පිළිබඳ අධ්‍යයනයක් (අම්බලන්ගොඩ, වතුගෙදර ප්‍රදේශය ආශ්‍රයෙන්)

එම්. එල්. පී. එන්. ලියන්ගේ[1]* සහ කේ. සී. එච්. පෙරේරා[2]

[1]ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, [2]දර්ශන හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**piyunimasha@gmail.com*

ශ්‍රී ලාංකේය ජන කලාවෙහි තවමත් ශේෂ ව පවත්නා අංශයක් ලෙස වෙස් මුහුණු කලාව හඳුනාගත හැකි ය. විවිධ ගුරු කුලයන් විසින් ප්‍රධාන වශයෙන් කදුරු ලී භාවිත කරමින් නිර්මාණය කරනු ලබන වෙස් මුහුණු කලාව කාණ්ඩ කිහිපයක් යටතේ හඳුනාගත හැකි ය. ඒවා අතුරින් රාක්ෂ, කෝලම් සහ සන්නි වෙස් මුහුණු ප්‍රධාන වේ. රාක්ෂ සහ සන්නි වෙස් මුහුණු කලාව ශ්‍රී ලංකාකේය ඈත ඉතිහාසය දක්වා දිව යන අතර කෝලම් වෙස් මුහුණ උපත ලබා ඇත්තේ යටත් විජිත සමයේ දී ය. සන්නි වෙස් මුහුණු ගණන දහ අටක් වන අතර ඒවා තුළින් එකිනෙකට ආවේණික වූ විශේෂිත රෝග නිරූපණය වේ. කෝලම් වෙස් මුහුණු මඟින් බොහෝ විට උපහාසය නිරූපණය කෙරෙයි. අතීතයේ සිට පැවත එන මෙම වෙස් මුහුණු කලාව පිළිබඳ ව හා ඒවා අද දක්වා ජන සමාජගත ව පවතින ආකාරය සොයා බැලීම අධ්‍යයනයේ අරමුණ විය. මෙම අධ්‍යයනය සඳහා ගාල්ල දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ පිහිටි වෙස් මුහුණු කලාකරුවන්ගේ නිජබිමක් වන වතුගෙදර ගම්මානයෙහි සිටින ගෘහ ඒකක 120ක් අතරින් අහඹු නියැදියක් ඔස්සේ පවුල් 20ක වැඩිහිටි ජනතාවගෙන් සිදු කරන ලද ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් දත්ත රැස් කරගත් අතර එම දත්ත විශ්ලේෂණය සඳහා Excel මෘදුකාංගය භාවිත කරන ලදි. මෙහි සමස්තය අධ්‍යයනය කරන විට වැඩි මතය (85%) වූයේ වෙස් මුහුණු සඳහා වත්මන් ඉල්ලුම පහළ බව, මෙම කර්මාන්තයෙන් ලබාගත හැකි ආදායම් මට්ටම පහළ බව, මේ සඳහා අවශ්‍ය දැව සපයා ගැනීමේ ගැටලු පවතින බව සහ නූතන පරපුර මේ පිළිබඳ අවධානය යොමු නො කිරීම යන හේතු නිසා වෙස් මුහුණු කලාව අභාවයට යන බව යි. වැඩිහිටි ආභාසය ලබමින් පසු වන 15ක් පමණ පිරිසක මෙම කලාව අගය කිරීම හා එම කර්මාන්තයෙහි නිරත බව පැහැදිලි විය. වෙස් මුහුණු කලාව රාවණා යුගයේ දී යුධ බිමෙහි සතුරන් බිය වැද්දීමට භාවිත කර ඇත. අතීත ජන සමාජය බවබෝග සරු කර ගැනීම, ලෙඩ රෝග තුරන් කිරීම, යක්ෂ, ප්‍රේත ආදීන්ගෙන් වන දෝෂ දුරු කර ගැනීම සඳහා සිදු කළා වූ උඩරට, පහතරට හා සබරගමු ශාන්තිකර්මයන්හි දී ද, වෙස් මුහුණු කලාව උපයෝගී කර ගත්හ. වෙස් මුහුණු කලාව ශ්‍රී ලාංකේය සංස්කෘතිය ඔප් නැංවීමෙහි ලා සාධනීය දායකත්වයක් ලබා දී ඇත. විවිධ ගුරුකුලයන් යටතේ වෙස් මුහුණු කලාව අතීත ජන සමාජය තුළ ප්‍රබල ලෙස මුල් බැස තිබූ ජන කලාවකි. වර්තමානයේ ආරියපාල ගුරුන්නාන්සේගේ පරම්පරාව විසින් තවදුරටත් මෙම කලාව පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව සීමිත පිරිසක විසින් මෙම කලාව තවදුරටත් ආරක්ෂා කරගනිමින් ඉදිරියට ගෙන යන බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** *ගුරුකුල, කදුරු ලී, රාක්ෂ වෙස් මුහුණු , කෝලම් වෙස් මුහුණු, සන්නි වෙස් මුහුණු, වර්තමාන තත්ත්වයි.*

# වියැකෙමින් යන සාම්ප්‍රදායික හස්ත කර්මාන්තයක් ලෙස පන් කර්මාන්තය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ඉඳුරුව ප්‍රදේශය ඇසුරින්)

යූ. ඩී. ආර්. එස්. තිලකරත්න

පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

*shehanthilakarathna1205@gmail.com*

අනාදිමත් කාලයක සිට පැවතෙන පරම්පරානුගත ව පවත්වාගනු ලැබූ ගෘහ කර්මාන්ත සාම්ප්‍රදායික කර්මාන්ත ලෙසට හඳුනාගත හැකි ය. ඒ අතරට ගැනෙන පන් කර්මාන්තයෙහි මූලික ම නිෂ්පාදනය වන්නේ පැදුරු විවීම යි. වර්තමානය වන විට මෙම පන් කර්මාන්තය දිවයිනේ ප්‍රදේශ කිපයකට පමණක් සීමා වී සාම්ප්‍රදායික තාක්ෂණයෙන් මිදී නවීන ක්‍රම භාවිතයට යොමු ව ඇති බවට හඳුනාගත හැකි ය. එබැවින් සාම්ප්‍රදායික පන් කර්මාන්තයේ වර්තමාන ස්වරූපය සහ අනාගත පැවැත්ම කෙරෙහි එල්ල වී ඇති අභියෝගයන් පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ. සාම්ප්‍රදායික පන් කර්මාන්තයට ප්‍රචලිත ගාල්ල දිස්ත්‍රික්කයේ ඉඳුරුව ප්‍රදේශය මෙහි දී අධ්‍යයන ක්ෂේත්‍රය විය. ඉඳුරුවේ පන් කර්මාන්තය තුළින් සාම්ප්‍රදායික ශිල්ප ක්‍රම හඳුනාගත හැකි ද? යන්න අධ්‍යයන ගැටලුව විය. පන් කර්මාන්තයෙහි නියුතු ශිල්පීන් සමග සම්මුඛ සාකච්ඡා පවත්වමින් සහ ක්ෂේත්‍ර නිරීක්ෂණයන් මගින් තොරතුරු ලබා ගැනීම සිදු කළේ ය. සම්මුඛ සාකච්ඡා පැවැත්වීමට දීර්ඝ කාලයක් පන් කර්මාන්තයේ නිරත වී මෙන් ප්‍රදේශයේ ප්‍රසිද්ධියක් උසුලා සිටින හා රුහුණු විස්කම් පළාත් හස්ත කර්මාන්ත සම්මාන උලෙළෙන් ඇගයීමට බඳුන් වූ ශිල්පිනියන් යොදා ගන්නා ලදි. තව ද පන් කර්මාන්තයේ සාම්ප්‍රදායික ස්වරූපය හඳුනාගැනීමට ආනන්ද කුමාරස්වාමි මහතාගේ මධ්‍ය කාලීන සිංහල කලා කෘතියෙහි පන් කර්මාන්තය පිළිබඳ ව සඳහන් තොරතුරු සහ පන්නම් කතුරු පැදි පෙළෙන් අනාවරණය වන තොරතුරු ද්විතීයික මූලාශ්‍ර වශයෙන් මීට පදනම් කර ගත්තේ ය. "ඉඳුරුවේ පැදුරු වියනවා ගෙදරක් ගාණෙ - පැණි රඹුටන් තිබෙයි හරියට මල්වානේ" යැයි ජනප්‍රවාදගත ව කවි පද බැඳුණේ අතීතයේ ඒ තරමට ම ඉඳුරුවේ පැදුරුත් මල්වානේ පැණි රඹුටනුත් කිසිදු හිඟයක් නැති ව ඕනෑ තරම් තිබූ නිසා ය. අද වන විට මෙම ප්‍රදේශයෙහි සාම්ප්‍රදායික පන් කර්මාන්තය දැඩි ලෙස වියැකෙමින් යයි. පාරම්පරික ක්‍රම භාවිතය අවම ය. බොහෝ ශිල්පීන් අද වන විට පැදුරු විවීම අතහැර ඇත. වේවැල්දෙණියෙන් පන් මිල දී ගන්නා ඔවුහු පන් තලා ගැනීමට 'පන් මෝල' යනුවෙන් හඳුන්වන යන්ත්‍රය භාවිත කරති. පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවලින් ලද තොරතුරුවලට අනුව පොලිතින් භාවිතය නිසා පන් නිර්මාණ භාවිතය අඩු වීම, නිසි මිලක් නොමැති වීම, නූතන පරම්පරාව මෙම දැනුම ලබා ගැනීමට අකැමැති වීම, නිමි භාණ්ඩවලට ශක්තිමත් වෙළෙඳ පොළක් නොමැති වීම යනාදි හේතුන් නිසා මෙම ශිල්පයේ අනාගත සුරක්ෂිතභාවයට දැඩි තර්ජනයන් එල්ල වී තිබෙන බවට පෙනී යයි. බෙන්තොට සංචරක පුරවරය ආසන්නයේ සිටින මොවුන්ගේ පන් නිර්මාණ සංචාරකයන් අලළා අලෙවි කිරීමට විධිමත් වැඩපිළිවෙළක් නොමැත. එවැන්නක් රජය මගින් ක්‍රියාවට නැංවීම ඉතා වැදගත් වේ. තව ද පුරාවිද්‍යාව, ලලිත කලාව විශේෂ උපාධිය හදාරන විද්‍යාර්ථීයින්ට මෙවැනි සාම්ප්‍රදායික ශිල්ප කර්මාන්තයන් පිළිබඳ ව පුළුල් වශයෙන් අධ්‍යයනය කිරීමට අවස්ථාව සලසා දීම මගින් සාම්ප්‍රදායික ශිල්පයන්ගේ අනාගත පැවැත්ම යම් පමණකට හෝ සුරක්ෂිත විය හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *අභියෝග, ඉඳුරුව, නවීන තාක්ෂණය, පන් කර්මාන්තය, සාම්ප්‍රදායිකත්වය*

# Angampora as Nationalist Spectacle: Analyzing the Application of Traditional Martial Arts in Postwar Sri Lanka*

S. V. Hemachandra

University of Colombo

*samalvh@yahoo.com*

Postwar Sri Lankan society has witnessed the intensification of Sinhala Buddhist nationalism since the end of war in 2009. Angampora, in this context, plays a significant role in the collective mind of Sinhala Buddhists as the form of an ancient martial art. This is evident in the wave of postwar nationalistic movies and the outburst of angampora presentations in reality TV shows. This paper attempts to analyze how angampora has become nationalist 'spectacle' in recent years. By following Guy Debord's concept of spectacle, this paper argues that representations of angampora have created a concrete inversion of nationalistic life for Sinhala Buddhists. To scrutinize this argument, the paper focuses on two angampora presentations in reality TV programs, Sirasa TV's Sri Lanka's Got Talent 2018 and ITN's Youth with Talent 2018 which are currently on YouTube. Both presentations resemble a nationalistic setting portraying angampora as the traditional martial art which saved the Sinhala Buddhist nation in ancient times from foreign invaders. This historical representation justifies the Sinhala Buddhist's supremacy over the minorities of the country. Judge boards, the audiences and the YouTube viewers have been mesmerized by these performances and agree with the nationalistic atmosphere created by the performances. Discourse analysis method was used to examine these visual presentations of these two videos and the comments they received from the viewers. The tentative conclusion that will be arisen in this research is that the images presented in these two angampora presentations constitute a nationalist spectacle or a 'false' unity that merely aggregates a collection of isolated and contradictory elements. This paper offers a critical perspective on the relationship that has been formed between the representations of angampora and present Sinhala Buddhist nationalism.

***Keywords:*** *Angampora, Sinhala Buddhist Nationalism, Spectacle, YouTube, Discourse Analysis*

* This research is supported by the AHEAD-DOR HEMS 73 project funded by the World Bank

# සාම්ප්‍රදායික පන් කර්මාන්තයේ වත්මන් ස්වභාවය පිළිබඳ අධ්‍යයනයක් (අනුරාධපුර කුඩා කර්මාන්ත සංවර්ධන අධිකාරිය ඇසුරින්)

එන්. එම්. පී. නෙත්තසිංහ,[1*] යූ. එන්. කේ. රත්නායක,[2] සහ එල්. ඩී. එම්. ප්‍රේමරත්න[3]
[1,2]ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, [3]ප්‍රධාන පුස්තකාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*neththasinghe@sjp.ac.lk

අනාදිමත් කාලයක සිට පැවත එන කර්මාන්ත අතර දේශීය ශිල්ප ඥානයට මුල්තැන හිමිවන කර්මාන්ත බොහෝමයක් වේ. ලාක්ෂා, පිත්තල, කපු හා පන් ආශ්‍රිත කර්මාන්ත ඒ අතරින් කිහිපයක් පමණි. මේ අතරින් පන් කර්මාන්තය පිළිබඳ විමසීමේ දී එහි ප්‍රධාන අමුද්‍රව්‍ය වශයෙන් වගුරු බිම් ආශ්‍රිත ව වැවෙන පන් නමින් හැඳින්වෙන ශාකය යොදා ගනී. අතීත ගැමියෝ පන් ගස විවිධ වර්ගීකරණයන්ට ලක් කිරීමෙහි ලා මෙන්ම පන් කපා, වේලා, නිසි පරිදි පදම් කර අවසානයේ දී වට්ටි, පෙට්ටි, හැඹිලි, අතුල්පත්, ආන, දරණු මෙන් ම පැදුරු, කළාල විවීම හා වර්ණ ගැන්වීම සම්බන්ධයෙන් ද ප්‍රවීණයෝ වූහ. කින්නර ගීතය, පන්නම් කතුර ආදී ගැමි වහරේ පවතින මූලාශ්‍රයවලින් ද මේ හා සම්බන්ධ තොරතුරු අනාවරණය වේ. පන් කර්මාන්තය හා සම්බන්ධ ඓතිහාසික තොරතුරු නිරිතදිග රාජධානි ක්‍රියාත්මක වූ අවධියේ දී වැඩි වශයෙන් වාර්තා වී ඇත. මෙම කර්මාන්තය බහුල වශයෙන් කුලහීනයන් අතර පැවති නමුත් ඇතැම් කුලීනයන් ද මෙම කටයුත්තේ නියැලිණි. මහනුවර යුගය අවසානයේ බ්‍රිතාන්‍ය පාලනය යටතේ මෙම කර්මාන්තය කෙරෙහි අවධානය නො ලැබීමත් හා නිදහස ලබා ගැනීමෙන් අනතුරු ව විවෘත ආර්ථික ප්‍රවණතා යටතේ පන් කර්මාන්තය වෙනුවට ප්ලාස්ටික් හා වෙනත් කෘත්‍රිම නිෂ්පාදන බහුල වීමත්, පන් හා සම්බන්ධ කර්මාන්තවලට වෙනත් ආදේශක කර්මාන්තයන් බිහි වීමත් එම කලාවේ පරිහානියට මුල් විය. සාම්ප්‍රදායික පන් කර්මාන්තය වර්තමානයේ ක්‍රියාකාරී බවකින් යුක්ත වේ ද? යන්න පර්යේෂණ ගැටලුව ලෙස ගෙන එහි වත්මන් ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීම ප්‍රධාන අරමුණ වශයෙන් ද ගෙන මෙම පර්යේෂණය සිදු කරමින් වියළි කලාපයට අයත් සාම්ප්‍රදායික පන් කර්මාන්තය ආශ්‍රිත ප්‍රදේශ හා ආයතන අධ්‍යයනයට ලක් කරන ලදි. එහි දී සම්මුඛ සාකච්ඡා හා සාහිත්‍ය මූලාශ්‍රය මගින් ලබාගත් ප්‍රාථමික හා ද්විතීයික දත්ත විශ්ලේෂණය කිරීමේ දී මේ වන විට පන් කර්මාන්තයෙන් ශිල්පීන් ඉවත් වීමට ඔවුන්ගේ කර්මාන්තයන් උදෙසා අවශ්‍ය අමුද්‍රව්‍ය සුලබ නො වීමත්, පාරම්පරික ශිල්ප ඥානය හීන වී යාමත්, නව පරම්පරාව රැකියා වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් නව රැකියා සඳහා යොමු වීමත්, ඔවුන්ගේ නිර්මාණ සඳහා නිසි ආර්ථික වටිනාකමක් නො ලැබීමත්, ඒ සඳහා අවශ්‍ය උපකරණ මෙවලම් නොමැතිකම මෙන් ම ස්වාභාවික පන් ශාකය වගා කිරීම කෙරෙහි කර්මාන්තකරුවන්ගේ අවධානය යොමු නො වීම හා ඒ මගින් කර්මාන්තයට සරිලන පන් අස්වැන්නක් නො ලැබීම හා ඒවායේ භාවිත අගයන් පිළිබඳ වත්මන් පරපුර තුළ පවතින නො දැනුවත් බව හා නො සලකා හැරීම ඒ සඳහා විශේෂ ලෙස හේතු වී තිබෙන බව පැහැදිලි විය. රාජ්‍ය ආයතන හා ශිල්පීන් සම්බන්ධ වෙමින් පවත්වාගෙන යන ශිල්පසභා ආදිය මගින් මෙම කර්මාන්තය නගා සිටුවීමට මූලික වශයෙන් පියවර ගෙන තිබෙන බව නිගමනය විය.

***ප්‍රමුඛ පදඃ*** *පන් කර්මාන්තය, පන් ශාකය, රාජ්‍ය ආයතන, අනුරාධපුරය, ශිල්ප කලා*

# Sri Lankan Marital Art Angampora and its Psychophysical Training Regime: A Case of Guru Karunapala and His Disciples*

S. Liyanage[1*] and L. Honcharova[2]

Faculty of Graduate Studies, University of the Visual and Performing Arts

*saumya.l@vpa.ac.lk

This paper examines one of the least explored martial arts traditions of Sri Lanka, *angampora*, a psychophysical martial art form, through one of its last inheritors, Guru Karunapala. Guru Karunapala is 80 years of aged *angampora* master who has been teaching and passing his *angampora* martial arts tradition to the next generation of performers. His school named *angampora maduwa* is located near Colombo city limits and he conducts classes on a weekly basis to train *angampora* beginners. This research, therefore, observes Guru Karunapala's *angampora* martial arts training through an ethnographic approach. The focus of this research is the way Guru Karunapala adapts and teaches orally transmitted knowledge of *angampora* martial arts. Further this research investigates *Guru-shishya parampara tradition*; teacher-disciple tradition of knowledge acquisition in *angampora* and how the learning takes place through bodily repetitive training and embodied practice of basic stances. This research therefore suggests a new paradigm of actor training through *angampora* martial arts and emphasizes the possibility of extricating key elements of foot works and body movements in creating a series of exercise regimen to train contemporary actors.

***Keywords:*** *Angampora Martial Arts, Guru Karunapala, Guru-Shishya Parampara, Actor Training, Embodiment*

* This research is supported by the AHEAD-DOR HEMS 73 project funded by the World Bank

# හෙළ අංගම් හටන් ශිල්පයේ පරිහානිය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

ඩබ්. එල්. ජී. කේ. සෙව්වන්දි[1*] සහ ඩී. අයි. ධර්මපාල[2]

[1]සමාජ විද්‍යා අධ්‍යයනාංශය, [2]සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*wlgkalani123@gmail.com

මින් වසර 33000කට එපිට ආරම්භ වී ප්‍රචලිත වූ හෙළයන්ට ආවේණික සටන් ශිල්පයකි, හෙළ රාවණා අංගම් හටන් ශිල්පය. දිගු ඉතිහාසයකට උරුමකම් කියන අංගම් ශිල්පය වර්තමාන සමාජය තුළ ප්‍රචලිත නො වීමට හේතු අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව යි. පර්යේෂණ අරමුණු ලෙස යොදා ගනු ලැබුවේ හෙළයේ ජාතික උරුමයක් වන සටන් කලාවෙහි වැදගත්කම අධ්‍යයනය කිරීම සහ පාරම්පරික උරුමය සුරක්ෂිත කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම යි. මෙහි දී පරමාර්ථගත නියැදීමේ ක්‍රමය උපයෝගී කරගනිමින් නියැදිය ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විදුදැය අංගම් කලායතනයේ පුහුණු ගුරුතුමා ඇතුළු සිසුන් 10ක් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වා දත්ත රැස් කර ගත්හ. ලබා ගත් දත්තවල ප්‍රතිඵල අනුව, 1815 දී රදළයින් විසින් උඩරට රාජධානිය සුදු ජාතිකයින්ට පවරා දීමත් සමඟ අංගම් හටන් ශිල්පයේ අභාවයට මුල පුරා ඇත. එතෙක් රාජ්‍ය අනුග්‍රහය සහිත ව ආරක්ෂා කරගෙන පැමිණි හටන් ශිල්පය ඉංග්‍රීසි පාලකයින් විසින් තහනමකට ලක් කර අංගම් ශිල්පීන් රාජද්‍රෝහීන් ලෙස නම් කරමින් පාරම්පරික අංගම් ශිල්පීන් පවුල් පිටින් සමූල ඝාතනය කිරීම අංගම් ශාස්ත්‍රයේ පරිහානියට හේතු වී ඇත. ඉංග්‍රීසි පාලකයින් පාරම්පරික අංගම් ශිල්පීන් අතර ඇති කළ ගැටුම්වල ප්‍රතිඵලයක් ලෙස පාරම්පරික අංගම් ශිල්පීන් රාශියක් ඔවුනොවුන් අතින් ම මරණයට පත් වීම අංගම් ශාස්ත්‍රයේ පරිහානියට ප්‍රබල හේතුවක් විය. සමාජයෙන් තුරන් ව පැවති අංගම් යන වචනය 1995 දී දඹුබස්නාමානය ඔස්සේ නැවත කරළියට පැමිණීමෙන් පසු අංගම් ශිල්පය හැදෑරූ ඇතැම් ගුරුවරුන් වාණිජමය වාසි තකා ගුණාත්මකභාවයකින් තොර ව මුදලට අංගම් ශාස්ත්‍රය විකිණීම මෙන් ම මලයාලම් සටන්, චීනාතේ, කරාතේ වැනි සටන් ශිල්පයන් අංගම් ලෙස ලෝකයාට පෙන්නමින් වැරදි ශිල්පයන් ලබා දීම, ජනතාව තුළ අංගම් ශිල්පයෙහි වටිනාකම පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැති වීම සහ නවීනත්වය අගයන සමාජය තුළ දේශීය අංගයන් පිටු දැක විදේශීය සටන් ශිල්පයන් වැළඳ ගනිමින් තරුණයින් නවීන කාය වර්ධන මධ්‍යස්ථාන වටා එක්වීම ද අංගම් හටන් ශිල්පයේ පරිහානියට හේතු වී ඇත. අංගම් හටන් ශිල්පියෙක් තුළ ඒ සඳහා දැඩි කැපවීමක් සහ කාය ශක්තියක් තිබීම අවශ්‍ය වේ. අංගම් හටන් ශිල්පයේ පරිහානියට වර්තමාන තරගකාරී සමාජය තුළ පුද්ගලයින්ට ඒ සඳහා කැප කිරීමට කාලය වෙන් කර ගැනීමට නො හැකි වීම සහ කය වෙහෙසා වැඩ කිරීමට ඇති අකැමැත්ත හේතු වී ඇත. 2017 වර්ෂයේ පනාගොඩ යුධ හමුදා ජනපදය කේන්ද්‍ර කරගනිමින් ආරම්භ කළ අංගම්පොර සංචිතය අභාවයට යාමට ද නිලධාරින්ට ප්‍රමාණවත් කාලයක් කැප කිරීමට නො හැකි වීම හේතු වී ඇත. පරිහානියට පත් වෙමින් පවතින අංගම් ශිල්පය ආරක්ෂා කරමින් ප්‍රචලිත කිරීමට සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ මැදිහත් වීම, විශ්වවිද්‍යාල සහ පාසල් මට්ටමින් අංගම් හටන් ශිල්පය හඳුන්වාදීම සහ ශ්‍රී ලංකා යුධ හමුදා සහ පොලිස් නිලධාරින්ට අංගම් ශිල්පය ඉගැන්වීම සටන් පරම්පරාවල ඉතුරු ව සිටින සියල්ලන් එක් වී සටන් සංඝායනාවක් සිදු කර පරිහානියට පත් වෙමින් පවතින අංගම් හටන් ශිල්පය ආරක්ෂා කර ගනිමින් සමාජය තුළ ප්‍රචලිත කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *අංගම් හටන් ශිල්පය, හෙළයේ, සිංහල, ශාස්ත්‍රය, පරිහානිය*

# පහතරට විහාර බිතුසිතුවම් තුළින් නිරූපිත නවග්‍රහ සංකල්පය

ජී. කේ. විදානපතිරණ

ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*pathiranagayathri@gmail.com*

නවග්‍රහයන්, රාශි, නැකැත් ආදි වූ ජ්‍යෝතිෂය සංකල්ප සිංහල බෞද්ධ ජනවිඥානය සමඟ බද්ධ වී පවතින ඇදහිලි හා විශ්වාස වශයෙන් සැලකිය හැකි ය. මේ අතරින් නවග්‍රහයන් පිළිබඳ සංකල්පය උපතේ සිට මරණය දක්වා විවිධ සුබ-අසුබ කටයුතුවල දී සිංහල බෞද්ධයන් විසින් මූලික කරගනු ලබයි. විද්‍යාත්මක ලෝකය තුළ සූර්යයා හා චන්ද්‍රයා ප්‍රධාන ග්‍රහලෝක හුදෙක් ආකාශ වස්තූන් ලෙස සැලකුව ද ජ්‍යෝතිෂය තුළ නවග්‍රහයන් යනු මිනිසාගේ ජීවිතයට සුබ හෝ අසුබ ඵල ගෙනදිය හැකි බලවත් දේව කොට්ඨාසයකි. නවග්‍රහයන් මූලික කරගනිමින් නිර්මාණය වූ විවිධ අභිචාරවලට අමතර ව මෙම සංකල්පය ප්‍රකට වන තවත් සන්දර්භයක් වශයෙන් විහාර බිතුසිතුවම් පෙන්වාදිය හැකි ය. 18 හා 19 වන සියවස්වලට අයත් පහතරට විහාරස්ථානවල ඉරු, සඳු, කුජ, බුධ, ගුරු, සිකුරු, ශනි, රාහු, කේතු යන නවග්‍රහයන් වස්තුවිෂය කරගනිමින් නිර්මාණය වූ බිතුසිතුවම් දැකගත හැකි ය. නවග්‍රහ සංකල්පය බෞද්ධ විහාර සිතුවම් තුළින් නිරූපණය කරනු ලැබුවේ කවර අර්ථයක් පදනම් කරගෙන ද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මේ සඳහා ප්‍රධාන වශයෙන් ජ්‍යෝතිෂය සංකල්ප මූලික කරගනිමින් නිර්මිත සිතුවම් සහිත කරගම්පිටිය සුබෝධාරාම, පිළිකුත්තුව රජමහා විහාරය, දොඩන්දුව ශෛලබිම්බාරාමය, සපුගස්කන්ද රජමහා විහාරය, උඩුපීල්ලේගොඩ ශ්‍රී සුදර්ශනාරාමය යන විහාරස්ථානවල සිතුවම් අධ්‍යයනය කරන ලදි. මෙම සිතුවම් විහාරස්ථානයේ ප්‍රධාන බුද්ධ මන්දිරය තුළ වියන ආශ්‍රිත ව ඇඳ දක්වා තිබේ. සිතුවමෙහි කේන්ද්‍රස්ථානය සූර්යයාට ලබා දී ඇත. අධ්‍යයනයට බඳුන් කරනු ලැබූ සෑම විහාරස්ථානයක ම නවග්‍රහයන් ඇඳ දක්වා ඇත්තේ දේව ස්වරූපය ආරෝපණය කිරීම සඳහා මිනිසෙකුගේ මෙන් හිස, කඳ, අත්පා, ඇඳුම්-පැළඳුම් ආදිය සහිත ව ය. සෑම නවග්‍රහ දෙවියෙකු ම, ඒ ඒ නවග්‍රහයාට අයත් වාහනය යැයි ජ්‍යොතිෂයේ විස්තර කරනු ලබන සත්ත්ව රූප සමඟ ඇඳ දක්වා තිබේ. මෙම සිතුවම්වල සුබ ඵල දෙනවා යැයි විශ්වාස කරන ග්‍රහයන් සුදු හෝ කහ වර්ණයෙනුත් අසුබ ඵල ගෙනදෙනවා යැයි විශ්වාස කරනු ලබන ග්‍රහයන් කළු පැහැයෙනුත් දක්වා ඇත. මෙම සිතුවම් වියන ආශ්‍රිත ව ඇඳ දක්වා තිබීම තුළින් මේවා ආකාශ වස්තූන් ය යන සංකල්පයට වඩා දේවත්වයක් ආරෝපණය කර දෙවියන් අහසෙහි වැඩ හිඳිනවා යන අර්ථයෙන් සිතුවම් කරන්නට ඇත. මෙම නවග්‍රහ සිතුවම් සහිත සෑම විහාරස්ථානයක් ම 18-19 සියවස්වලට අයත් ඒවා වන බැවින් ජ්‍යෝතිෂය සංකල්පවල බලපෑම සෙසු කාලවලට වඩා වැඩි වශයෙන් මෙම අවධියේ ක්‍රියාත්මක වන්නට ඇතැයි සිතිය හැකි ය. ඒ අනුව සමකාලීන සමාජය තුළ ප්‍රචලිත ව පැවති සංකල්පයක් වශයෙන් නවග්‍රහයන් විහාරබිතුසිතුවම්වලට එක්වන්නට ඇති බවත් මෙම විහාරස්ථාන සියල්ල ම ශ්‍රී ලංකාවේ පහතරට කලාපයට අයත් බැවින් දිවයිනේ සෙසු ප්‍රදේශවලට වඩා මෙම ප්‍රදේශවල නවග්‍රහයන් පිළිබඳ සංකල්පය දැඩි ව පවතින්නට ඇති බවත් නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** *ජ්‍යෝතිෂය, නවග්‍රහයන්, පහතරට, විහාර බිතුසිතුවම්*

# Analysis of the Potteries and Its Utility with Special Reference to the *Pomparippu* Burial Site

P. N. Hansani

Department of Archaeology, University of Peradeniya

*nararchi0726@gmail.com*

According to the burial typology in Sri Lanka, the largest urn burial type is recognized as *Pomparippu* which yielded different types of pottery forms and pottery wares. It is important to study the utility and the art of this material culture as the site belonged to the Early Iron Age which existed from 9th century B.C. to 6th century B.C. The excavation report of Pomparippu prepared by Wimala Begley is used as the primary source for this study. It is located near the estuary of *Kala Oya* on *Puttalam - Mannar* road. Bowls yielded as deep bowls, which is tapering, slightly interned, rounded base similarly, small bowl, slightly interned rounded base while some bowl as an erect, rounded base. The thickness and the rims are important to identify the advanced technology. This can be suggested to have used to offer the food and beverages for the dead ones. Dishes where the rim is interned, slightly flattened base, and another ware the erect rim with slightly convex base can be suggested as the utilized objects of the dead people. The deeper dish most probably could be used as the liquid containers. Rounded dish which is rarely found can be suggested the potteries belonged to a high class or a noble family. Stands are another type of pottery, which can be used as the platforms to keep the potteries in the funerary rites. It is a black ware and highly thick with an outturned rim. Wide mouthed wares and a variety with an outturned pointed rim manifest the technological advancement during the early Iron Age. Small jars yielded show a globular body, narrow neck, narrow mouth with a rounded base while some bases are exaggerated convex. Medium sized narrow necked jars represent the graffiti marks and one symbol mostly resemble with a human figure. The non-Brahmi symbols recognized from the potteries are important as a folk art prevailed in the burial site. The clan's mark or the potter's identity or the owner's mark would be carved on the potteries. Urns are the main type pottery, which is outturned, rounded rim adorned with incised decoration. Mostly the potteries found from the *Pomparippu* can belonged to the wealthy and noble people in the society, which used for the sacrifices of the dead and the inhumation of the utilized goods with the dead.

***Keywords:*** *Pottery, Pomparippu, Utility, Deep Bowls, Technology*

# පිත්තල කර්මාන්තයේ නූතන අභියෝග (ගඩලාදෙණිය පිත්තල කර්මාන්තය ඇසුරින්)

බී. එම්. එස්. එම්. බස්නායක

භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*sajithbasnayaka94@gmail.com*

දුමින්දාගමනයෙන් පෝෂිත ව වර්ධනය වූ නවන්දන්නා කුලයෙන් පැවත එන පාරම්පරික කර්මාන්තයක් ලෙස පිත්තල කර්මාන්තය හඳුනාගත හැකි ය. විවෘත ආර්ථිකය හඳුන්වාදීමත් සමග පිත්තල කර්මාන්තයට එක් වූ ආර්ථික වටිනාකම හේතුවෙන් ම පාරම්පරික නො වූ පිරිස් ද මෙම කර්මාන්තය සමග මුහු විය. අද වන විට මෙම දෙපිරිස ම පිත්තල කර්මාන්තය ආශ්‍රිත ව මුහුණ දෙන ගැටලු මොනවා දැයි හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ බවට පත් විය. ඒ අරමුණ සාක්ෂාත් කරගනු පිණිස ලංකාවේ පිත්තල කර්මාන්තයේ දීර්ඝ ඉතිහාසයක් පවතින උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගඩලාදෙණිය ගම්මානය මෙහි අධ්‍යයන ප්‍රදේශය බවට පත් විය. මෙම ගම්මානය තුළ පාරම්පරික ව පිත්තල කර්මාන්තයේ නියැළෙන හා අලෙවිකරුවන් ලෙස කර්මාන්තය තුළ රැඳී සිටින පුද්ගලයින් 50ක නියැදියක් ආශ්‍රිත ව ප්‍රශ්නාවලියක්, සම්මුඛ සාකච්ඡා සහ ඍජු නිරීක්ෂණ මගින් ප්‍රාථමික දත්තත්, පොත්පත්, සඟරා  හා අන්තර්ජාලය මගින් ද්විතීයික දත්තත් රැස්කරන ලදි. සමීක්ෂිත දත්තයන්ට අනුව අද වන විට ප්‍රාග්ධනය හිඟ වීම හා නිෂ්පාදන පිරිවැය ඉහළ යාම කර්මාන්තය මුහුණ දෙන ප්‍රමුඛ අභියෝගයක් බව 85%කගේ මතය විය. කර්මාන්තයෙන් ලැබෙන ආදායම අඩු වීම නිසා කර්මාන්තයේ නියැළි පිරිසෙන් 60%කට වැඩි පිරිසක් වෙනත් ආදායම් මාර්ග වෙත නැඹුරු වීම නිසා කර්මාන්තය තුළ ශ්‍රම හිඟතාවක් නිර්මාණය කොට තිබේ. පිත්තල කිලෝග්‍රෑම් එකක මිල ශීඝ්‍රයෙන් ඉහළ යාමත්, නිෂ්පාදන යන්ත්‍රසූත්‍ර ආනයන කරන නිසාවෙන් ඉහළ මිලක් යටතේ ඒවා මිල දී ගැනීමට සිදු වීම කර්මාන්තය මුහුණ දෙන අභියෝගයක් බවට 70%කගේ මතය විය. තව ද කර්මාන්තය ආශ්‍රිත ව පරිසර දූෂණයක් සිදු වීම කර්මාන්තයේ පැවැත්මට අභියෝගයක් බව හඳුනාගත හැකි විය. ඉන්දියාවෙන් පිත්තල නිෂ්පාදන ආනයනය කිරීමත්, ප්ලාස්ටික්, මැටි වැනි ආදේශක භාණ්ඩත් කර්මාන්තයේ පැවැත්ම කෙරෙහි බලපෑමක් ඇති කරන බව 65%කට ආසන්න පිරිසගේ මතය විය. 80%කට වඩා පිරිසක් කර්මාන්තය නගාසිටුවීම කෙරෙහි රාජ්‍ය අංශයේ දායකත්වය ඉතාම අල්ප බවට ප්‍රකාශ කොට ඇත. රාජ්‍ය හා පෞද්ගලික අංශ ද්විත්වයේ ම ඒකාබද්ධතාව මගින් පිත්තල කර්මාන්තයේ වත්මන් ගැටලුවලට සාධනීය පිළිතුරු ලබාදීමට නො හැකි වුවහොත් අනාගතයේ දී මෙම කර්මාන්තයේ පරිහානිය වළක්වාගත නො හැකි වනු ඇත.

***ප්‍රමුඛ පද:*** *පිත්තල කර්මාන්තය, ගඩලාදෙණිය, පාරම්පරික කර්මාන්ත, පරිසර දූෂණය, ශ්‍රම හිඟතාව*

# ශ්‍රී ලාංකේය බෞද්ධ විහාර අවකාශයේ යක්ෂ රූපාර්ථ සහිත ශිව දේව නිරූපණය පිළිබඳ අධ්‍යයනයක්

එන්. එච්. එස්. උදයංගනී

දෘශ්‍ය කලා පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

*sachithraudayangani111@gmail.com*

හින්දු ආගමෙහි මූලික දෙවියෙකු වන ශිව දෙවියන්ගේ රූපය ඉන් පරිබාහිර බෞද්ධ අවකාශයකට පැමිණ තිබීම සුවිශේෂ වෙයි. බෞද්ධ අවකාශයේ ශිව දෙවියන් නිරූපණය බුද්ධ ශ්‍රාවකයෙකු, කේවල දෙවියෙකු සහ යක්ෂ රුවක් ලෙස ආකාර ත්‍රිත්වයකින් හඳුනාගත හැකි ය. නිදසුන් ලෙස ලංකාතිලක, දඹුල්ල විහාර තුළ බෞද්ධ ශ්‍රාවකයෙකු ලෙස ද සැස්සේරුව, වළල්ගොඩ බුදු පිළිම අසල දෙවියෙකු ද ලේවැල්ල ගංගාරාමය, දෝව ආදියෙහි යක්ෂ රූපාර්ථ සහිත ව ද ලෙස ය. මෙම යක්ෂ රූපාර්ථ සහිත ව ශිව දෙවියන් නිර්මාණය ක්‍රි.ව 1750 - 1950 කාලයේ විහාර අවකාශ තුළ ජනප්‍රිය තේමාවක් වන අයුරු පෙනෙයි. මේවා විහාර ද්වාරය වෙත ආරක්ෂක යක්ෂ ස්වරූපයක් ලෙස පැමිණීම සුවිශේෂ වෙයි. මෙහි දී කේන්ද්‍රීය ව සාකච්ඡා කරන ගැටලුව වන්නේ ශිව දේව සංකල්පය තුළ යක්ෂ රූපාර්ථ නිරූපණය කර ඇත්තේ කෙසේ ද හා ඉන් අපේක්ෂිත අභිප්‍රේරණාර්ථ මොනවා ද යන්න යි. මෙම අධ්‍යයනය සඳහා සංඥාර්ථවේදය, රූපාර්ථවේදය හා තත්කාලීන සමාජ දේශපාලනය පිරික්සීමේ දී යටත්විජිතකරණය යන න්‍යායන් භාවිත කරන ලදි. නියැදිය ලෙස මධ්‍යම මහනුවර ගුරුකුලයේ සහ දකුණු ගුරුකුලයේ විහාරාරාම, දෝව, ලේවැල්ල ගංගාරාමය, ගොඩඋඩ ගල්කන්ද විහාරය, කසාගල රජමහා විහාරය ආදි විහාර දහතුනක් යොදා ගැනුණි. සිතුවම් විශ්ලේෂණය, සාහිත්‍ය මූලාශ්‍ර හා තත්සමාජ සාධක භාවිතයෙන් නිගමන කරා එළඹෙන මෙම පර්යේෂණයේ ප්‍රතිඵල අනුව බෞද්ධ විහාරවල ශිව සංකල්පය හින්දු ආගමට වඩා සාම්ප්‍රදායික දේශීය බලි තොවිල් මඟින් පැමිණ ඇති බව පෙනී යයි. ලාංකේය සමාජය තුළ දියුණු වූ බලි යාග ක්‍රමයේ එන රූප හා සෘජු සම්බන්ධයක් පර්යේෂණයට ලක් වූ ශිව දෙවියන් හා සම්බන්ධිත යැයි සැලකෙන ශිව වටුක හා ශිව අඝෝර රූපවල ඇත. සාම්ප්‍රදායික බලි ඇදුරන්ගේ අත්පිටපත්වල ශිව වටුක යන්ත්‍රය නමින් යන්ත්‍රයක් සහ බලියට අදාළ රූපාර්ථ අඩංගු අතර ඒවාට සමාන රූපාර්ථ තත්විහාර අවකාශයේ ශිව අඝෝර හා ශිව වටුක තුළ හඳුනාගත හැකි ය. මෙම කාල වකවානුව වන විට විහාර සිතුවම් ඇඳීමට සාම්ප්‍රදායික බලි තොවිල් සිත්තරුන්ගේ එක්වීම එයට සෘජු ව බලපා ඇති බව උපකල්පනය කළ හැකි ය. මෙවන් යක්ෂ රූපාර්ථ විහාරයේ දොරටුව කරා ම පැමිණීම තත්සමාජ දේශපාලනය සමඟ වටහා ගැනීම යෝග්‍ය වනු ඇත. විශේෂයෙන් ම යටත්විජිත පාලනය හා මුසු ව ලාංකේය බෞද්ධ සමාජය අනපේක්ෂිත සදාචාරමය පරිහානියක් පර්යේෂිත අවධියේ ලාංකේය සන්දර්භයෙන් හඳුනාගත හැකි ය. මත්පැන්, අවි ආයුධ, කාම මිථ්‍යාචාරය ආදි තත්සමාජයේ ඉහළ ගිය ප්‍රශ්න ගැටලුවට ප්‍රතිප්‍රකාශන යක්ෂ රූප සමඟ විහාර අවකාශයට පැමිණීම 'අපාය' දර්ශන ආදියෙන් මෙම යුගයේ පැහැදිලි ව නිරාවරණය වෙයි. ඒ අනුව විහාර ද්වාරය කරා යක්ෂ රූපාර්ථ සහිත ව පැමිණෙන ශිවගේ ස්වරූප දේශීය බලි සිතුවම්වලින් පෝෂණය ව යම් බිය මුසු මානව හික්මවීමක් උදෙසා තත් බොදු සමාජයේ බහුල ව යොදා ගන්නට ඇතැයි යෝජනා කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** *ශිව දෙවි, බලි යාග ආශ්‍රිත කලා නිර්මාණ, සංඥාර්ථවේදය, රූපාර්ථවේදය, යටත්විජිතකරණය*

# සිංහල ජනශ්‍රැතිය තුළ සංයුක්ත ව පවතින කටහඬ ප්‍රගුණ කිරීමේ ශිල්පක්‍රම

පී. දහනායක

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය

*pramith8003@gmail.com*

සිංහල සංස්කෘතික සන්දර්භයට යෝග්‍ය වූ කටහඬ ප්‍රගුණ කිරීමේ (vocal warm up) විද්‍යාත්මක විධික්‍රමයක් මෙතෙක් නිර්මාණය වී නැත. එබැවින් සිංහල භාෂණයේ යෙදෙන ශිල්පීන් භාවිත කරනුයේ යුරෝපීය කටහඬ ප්‍රගුණකිරීමේ විධික්‍රමය යි. එය යුරෝපීය සංස්කෘතික සන්දර්භයට අනුව නිර්මාණය වූවකි. යුරෝපීය සංස්කෘතික සන්දර්භයන් සඳහා නිර්මාණය වූ කටහඬ ප්‍රගුණ කිරීමේ විධික්‍රම, සිංහල භාෂාව උච්චාරණය සඳහා කොතෙක් දුරට යෝග්‍යවේ ද යන්න ගැටලුකාරී තත්ත්වයක් වේ. ජනශ්‍රැතිය, විවිධ සංස්කෘතීන්හි කටහඬ ප්‍රගුණකිරීමේ විධික්‍රම නිර්මාණය වීමේ දී බලපානු ලබන ප්‍රධාන සාධකයක් වේ. ඒ මඟින් විවිධ සංස්කෘතික සන්දර්භයන්හි භාෂණ අනන්‍යතාව හා විවිධත්වය තහවුරු කරයි. සිංහල ජනශ්‍රැතිය (ජන ගායනා හා ජන වහර) දෙස විමර්ශනාත්මක ව බැලීමේ දී පෙනී යනුයේ, කටහඬ ප්‍රගුණ කිරීමේ ශිල්පක්‍රම ඒ තුළ සංයුක්ත ව පවතින බවකි. මෙම අධ්‍යයනයේ අරමුණ වනුයේ සිංහල ජනශ්‍රැතියෙහි සංයුක්ත ව පවතින කටහඬ ප්‍රගුණකිරීමේ ශිල්පක්‍රම හඳුනාගැනීම යි. මෙය මානවවංශ හා ප්‍රාමාණික විද්‍යා පර්යේෂණ යටතට ගැනෙන අධ්‍යයනයක් වන අතර දත්ත විශ්ලේෂණයේ දී උද්ගාමී ක්‍රමය යටතේ නිගමනවලට එළඹීම සිදු කරනු ලැබී ය. සිංහල ජන සංගීතය පිළිබඳ විශේෂඥයින් සමඟ විධිමත් සම්මුඛ සාකච්ඡා පැවැත්වීමත්, සිංහල ජන ගායනා පිළිබඳ හඬපට අධ්‍යයනය, පුස්තකාල හා අන්තර්ජාල භාවිතය යටතේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර පරිශීලනය මෙහි දී සිදු කෙරිණ. විවිධ අවස්ථාවන්හි ගායනා වූ සිංහල ජන ගායනා හා ජනවහර තුළ ශ්වසන ශිල්පක්‍රම, උච්චාරණය, කටහඬ පරාසය (register), තිත් ක්‍රම හා ලය (beat & tempo), තාරතාව, අනුනාදය (resonance), ප්‍රකාශන විධික්‍රම (expression), හඬෙහි ශක්තිය (tone energy), හඬෙහි ගතිකත්වය (dynamism), හඬ ප්‍රක්ෂේපණය, නම්‍යශීලී බව (flexibility), ස්වර සුසංවාදය (harmony), කායික අභ්‍යාස (physical warm up) ආදිය ශිල්පක්‍රම සංයුක්ත ව පැවතීම මෙම අධ්‍යයනයෙහි දී මූලික වශයෙන් හඳුනාගැනීමට ලැබිණ. ‘අඬහැරය’ පෑමේ දී මහා ප්‍රාචීර ශ්වසනය (diaphragm breathing), ශ්වාස සංයමය, මෘදු හඬේ (piano) සිට ඉතා වැඩි හඬ (fortissimo) දක්වා හඬ විස්තාරණය කරමින් ගතිකය පවත්වා ගැනීම, හඬ පරාසය, අනුනාදය, හඬෙහි ශක්තිය, හඬ ප්‍රක්ෂේපණයත් ‘හොරණෑඕස’ ගායනා තුළ තාරතාව, අනුනාදය, ශ්වාස සංයමයත් ‘ටීකා’ ගායනා තුළ උච්චාරණය, ශ්වාස සංයමය, තිත් ක්‍රම හා ලය, අනුනාදයත් ‘දරුනැළැවිලි’ ගායනයේ දී මෘදු හඬ හා භාවප්‍රකාශනයත් ‘පාරු කවි’ ගායනය තුළ මහා ප්‍රාචීර ශ්වසනය සඳහා වන කායික අභ්‍යාස, අනුනාදයත් ‘පන් නෙළීමේ කවි’ තුළ ස්වර සුසංවාදයත් ‘දේශීය තාල භාවිතය’ තුළ ශබ්ද උච්චාරණය, තිත් ක්‍රම හා ලය, නම්‍යශීලීබවත් ප්‍රධාන වශයෙන් සංයුක්ත ව පවතින බව උදාහරණ ලෙස දක්විය හැකි ය. එබැවින් සිංහල ජනශ්‍රැතිය තුළ කටහඬ ප්‍රගුණ කිරීමේ ශිල්පක්‍රම, අමුද්‍රව්‍යමය සම්පත් (resources of raw material) ලෙස සංයුක්ත ව පවතින බව මෙම අධ්‍යයනයෙන් ගම්‍යමාන වේ.

***ප්‍රමුඛ පදඃ*** *කටහඬ ප්‍රගුණකිරීමේ ශිල්පක්‍රම, සිංහල ජන ගායනා, සිංහල ජනවහර*

# සංගීත භාණ්ඩ පිළිබඳ සතුන් හා බැඳි ජනකතා


ආර්. එන්. කරුණාතිලක

සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණවේද අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*rasangikarunathilaka22@gmail.com*



සංගීත භාණ්ඩ පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මානව විද්‍යාත්මක පසුබිමකින් අධ්‍යයනයේ දී එය හුදෙක් සංගීතමය වටිනාකමක් ඇති මෙවලමක් පමණක් නො ව, ඒ වටා ගොඩ නැගුණු දැවැන්ත මානව හා සමාජ විද්‍යාත්මක පදනමක් පවතින බව පැහැදිලි වේ. සතුන් හා මිනිසා අතර ඇති සබඳතාව මිනිස් වර්ගයාගේ නිර්මාණ, අදහස් හා ප්‍රකාශන මාධ්‍යයන්ට ද ආරෝපණය වී ඇති අතර එම සබඳතාව මැනවින් පිළිබිඹු කෙරෙන ජනශ්‍රැතිකාංගයක් ලෙස 'ජනකතාව' හැඳින්විය හැකි ය. ලොව ඕනෑම ජන කොට්ඨාසයකට අයත් ජනශ්‍රැතිකාංග අතරින්, ජනකතාව යනු ඉතා ප්‍රබල ස්ථානයක් හිමි කරගන්නා ජනශ්‍රැතිකාංගයකි. එය යම් ජන කොටසකට ආවේණික වූ සංස්කෘතිය හා ඇදහිලි විශ්වාස මත ගොඩනැගුණු පාරම්පරික දායාදයක් බඳු ය.  ආසියාතික රටවල්වල ජන සංගීත භාණ්ඩ පිළිබඳ සතුන් හා බැඳි ජනකතා අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වන අතර සත්වයකුගේ අනුරුවක් ලෙස හෝ සත්වයකුගේ හැඩය එක් කර සංගීත භාණ්ඩ නිර්මාණය කිරීමේ දී එම රූප යොදා ගැනීමට බල පෑ හේතු සාධක හෙළි කරගැනීම පිණිස ජනකතාව ඉවහල් වන්නේ කෙසේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. මානවවංශ පර්යේෂණ යටතට ගැනෙන මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරනු ලැබී ය. ආසියාතික රටවල්වලට පමණක් පර්යේෂණය සීමා වූ අතර දත්ත එක්රැස් කිරීම උදෙසා පුස්තකාල ග්‍රන්ථ අධ්‍යයනය, ආසියානු කලාපයේ සංගීත භාණ්ඩ තැන්පත් කර ඇති කෞතුකාගාර වාර්තා අධ්‍යයනය, අන්තර්ජාලය ඔස්සේ e-books පරිශීලනය යන ක්‍රම උපයෝගී කර ගනු ලැබිණි. සත්ත්ව අනුරුවක් ලෙස හෝ සත්වයකුගේ ශරීරයේ කොටසක් (විශේෂයෙන් ම හිස) එක් කර තනා ඇති වාද්‍ය භාණ්ඩ වටා ගෙතී ඇති ජනකතාවලින් එකී සත්වයා එම සංගීත භාණ්ඩයට ආදේශ වීමට හේතු වූ කරුණු හෙළි කර ගැනීමට හැකි විය. ඒ සඳහා පුරාවෘත්ත (උපත් කතා හා මිත්‍යා කතා) මූලික වශයෙන් ඉවහල් වී ඇති අතර (මෝරින් හූර්, ශංඛය, දැවමය මත්සයා, කොමුස්, දම්ෆු, ජෙම්බේ, පයික්ෂ්‍යාඔ, මී ගයාවුන්ග්, චෙලිස් ලයර්) සමහර සංගීත භාණ්ඩ සඳහා එම අනුරුව එක් වීම පිළිබඳ උපත් කතාවක් මෙන් ම මිථ්‍යා කතාවක් ද ඇති බව හෙළි විය. (මෝරින් හූර්, දැවමය මත්සයා)  ඒ අනුව එම සංගීත භාණ්ඩ සඳහා සත්ත්ව අනුරුවක් එක් වීමට බල පෑ හේතු සාධක ලෙස, ඒවා අයත් ජන කොට්ඨාසවල ඇදහිලි හා විශ්වාස බල පා ඇති අතර ඒ පිළිබඳ කරුණු හෙළි කර ගැනීමට ජනකතා මනා පිටිවහලක් වන බව නිගමනය කළ හැකි ය.



***ප්‍රමුඛ පදඃ*** *සංගීත භාණ්ඩ, සතුන්, පුරාණෝක්ති, පුරාවෘත්ත*

# සිංහල ජනශ්‍රැතිය පෝෂණයෙහි ලා සංස්කෘත සාහිත්‍යයෙහි බලපෑම; විමර්ශනාත්මක අධ්‍යයනයක්

පූජ්‍ය කරඳගොල්ලේ සෝභිත හිමි

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර

*sksobhitha@gmail.com*

විවිධ ජන සමාජයන්හි වෙසෙන ජනයා ඇසු පිරූ තැන් ඇති බව ඇති කරගනු ලැබුවේ ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨයන්ගෙන් ලත් ඥාන දායාදයේ ප්‍රතිඵලයක් වශයෙනි. එම වැඩිහිටි ජනතාව මුඛ පරම්පරාවෙන් පරපුරෙන් පරපුරට උරුම කරදුන් එම ඥානය නිර්මාණාත්මක ගුණයෙන් අනූන වූවකි. එම ඥාන මාර්ගය අපර නාමයකින් ජනශ්‍රැතිය (දෙකනකදරු) නමින් හඳුන්වනු ලබයි. සිංහල ජනශ්‍රැතිය පිළිබඳ විමසීමේ දී ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු, උපමා හා ඉඟිවැකි හඳුනාගත හැකි ය. එමගින් ජන සමාජයේ ජීවත් වූ සහ ජීවත් වන්නවුන්ගේ ජීවන තොරතුරු රාශියක් හඳුනාගත හැකි වෙයි. ජන වහරේ එන එම ප්‍රකාශයන් නිර්මාණය කරගැනීමෙහි ලා විවිධ භාෂාවන් කථා කරන ජන කොට්ඨාසයන්ට අයත් සිදුවීම් හා සාහිත්‍යයන්හි අන්තර්ගත කතාන්දර හා ප්‍රකාශයන් ඉවහල් වූවාට සැකයක් නැත. විශේෂයෙන් සිංහල භාෂාව සහ සාහිත්‍යය පෝෂණයෙහි ලා සංස්කෘත භාෂාව හා සාහිත්‍යය බලපෑවාක් මෙන් ම සංස්කෘත භාෂාවෙන් රචිත ග්‍රන්ථයන්හි අන්තර්ගත උපදේශාත්මක කතාන්දර හා ප්‍රකාශයන් සිංහල ජනශ්‍රැතියට අයත් ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු, උපමා හා ඉඟිවැකි නිර්මාණයෙහි ලා ඉවහල් වී ඇති අකාරය ඒ පිළිබඳ විග්‍රහ කර බැලීමේ දී අපට දැකගත හැකි අතර ඒ පිළිබඳ පුළුල් ව අධ්‍යයනය කිරීම කාලෝචිත ය. ඒ අනුව සංස්කෘත සාහිත්‍යයෙහි එන උපදේශ කථාවන්ට අයත් සිදුවීම් හා ප්‍රකාශයන් මෙන් ම ශතක ග්‍රන්ථයන්හි අන්තර්ගත ඇතැම් ශ්ලෝක පාඨ සිංහල ජනශ්‍රැතියෙහි සඳහන් පාඨ හා කතාන්දර සමග සමන්වා බලමින් මෙම අධ්‍යයනය සිදු කෙරේ. සිංහල ජනශ්‍රැතියෙහි දක්නට ලැබෙන ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු නිර්මාණයෙහි ලා සංස්කෘත ශ්ලෝක පාඨ හා උපදේශාත්මක කතාන්දර උපස්ථම්භක වී ඇති අකාරය පහත නිදසුන් මගින් හඳුනාගත හැකි ය. ''බල්ලාගේ වැඩේ බූරුවා බාරගත්තා වගේ'' මෙම ප්‍රකාශය තහවුරු කරන කතාන්දරය හිතෝපදේශයෙහි සුහෘද්භේද කාණ්ඩයෙහි දෙවන කථාවෙන් හඳුනාගත හැකි ය. ''ඇතාගෙන් කැටකිරිල්ල පළිගත්තා වාගේ'' මෙම ප්‍රකාශය තහවුරු කරන කථාව පඤ්චතන්ත්‍රයේ මිත්‍රභේද කාණ්ඩයේ පසළොස්වැනි කථාවේ අන්තර්ගතය තුළින් හඳුනාගත හැකි ය. ''අහසේ මාළිගා තනනවා වාගේ'' මෙයට සමාන අදහස් ඇති කතාන්දරයක් පඤ්චතන්ත්‍රයේ අපරීක්ෂිතකාරක කාණ්ඩයේ අටවැනි කථාවේ අන්තර්ගතය තුළින් හඳුනාගත හැකි ය. ''ඉබ්බා අහසින් ගියා වගේ'' පඤ්චතන්ත්‍රයේ මිත්‍රභේද කාණ්ඩයේ දහතුන්වැනි කථාවේ අන්තර්ගතය තුළින් හඳුනාගත හැකි ය. ''ගස් නැති රටේ එරඬු ගසුත් ගස් ය.'' (..නිරස්තපාදපෙ දේශේ එරණ්ඩෝ'පි ද්‍රැමායතෙ- හිතෝපදේශය), ''ඇදේට ඇදක් ම කළ යුතු ය.'' (..ඍජුකං ඍජුකං චෛව වංකං වංක මේවච..), ''දිය ඇදි ඉර වගේ''/ ''දියපිට ඇඳි ඉරක් වගෙයි'' (ජල ලෙඛෙව නීචානාං යත්කෘතං තද්විනශ්‍යති), ''උස එකා මහා මෝඩයා'' (අතිදීර්සෝ මහා මූර්ඛඃ- මධ්‍යමස්තු විචක්ෂණඃ...), ''පිරුණු කළේ දිය නො සැලේ.''(..සම්පූර්ණ කුම්භො න කරෝති ශබ්දම්..) ඒ අනුව මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් සිංහල ජනශ්‍රැතිය පෝෂණයෙහි ලා සංස්කෘත සාහිත්‍යයෙහි බලපෑම ලැබී ඇති ආකාරය හඳුනාගත හැකි අතර ඒ පිළිබඳ ජනශ්‍රැතිය විෂය ක්ෂේත්‍රය හා සම්බන්ධ විවිධ අනුප්‍රභේදයන් යටතේ දීර්ඝ වශයෙන් විමර්ශනය කළ හැකි බව ද හඳුනාගත හැකි වේ.

***ප්‍රමුඛ පදඃ*** *හිතෝපදේශය, පඤ්චතන්ත්‍රය, සිංහල ජනශ්‍රැති, ශතක ග්‍රන්ථ, උපදේශ*

# ශ්‍රී ලාංකේය බ්‍රිතාන්‍ය යටත්විජිත සිතුවම්, සන්නිදර්ශන සහ ඡායාරූපවල නිරූපිත හස්ති රූපය; යටත්විජිත රුචිකත්වයේ ප්‍රකාශනයක් ලෙස

එස්. එම්. ඩී. ජී. සූරියබණ්ඩාර

ඉතිහාසය හා කලා සිද්ධාන්ත අධ්‍යයනාංශය, දෘශ්‍ය කලා පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

*dularisuriyabandara@gmail.com*

ශ්‍රී ලාංකේය බ්‍රිතාන්‍ය යටතවිජිත සමයේ (ක්‍රි.ව 1796-1948) යුරෝපීය සිත්තරුන් ඇඳි සිතුවම්, සන්නිදර්ශන හා ඡායාරූපගත දෘශ්‍ය නියැදින්හි අන්තර්ගත හස්ති රුව, පූර්ව යටත්විජිත සමයේ නිරූපිත හස්ති රුව හා සැසඳීමේ දී කරුණු කිහිපයකින් වෙනස් වන බව නිරීක්ෂණය වේ. එනම් පූර්ව යටත්විජිත සමයේ ආගමික සංකල්ප අරමුණු කර ගනිමින් නිර්මිත හස්ති රුව බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ දී පෙරදිග පිළිබඳ අනන්‍යතා අඟවන ප්‍රබල දේශපාලනික රූපකයක් බවට පරිවර්තනය විය. මේ නිසා හස්ති රූපය යොදා ගනිමින් බ්‍රිතාන්‍යයන් ලංකාව පිළිබඳ යටත්විජිත රාජ්‍ය ලාංඡනය නිර්මාණය කරන ලදි. එතෙක් අර්ධ ශෛලිගත ස්වරූපයකින් ස්වදේශික කලාවේ නිරූපිත හස්ති රුව බ්‍රිතාන්‍ය යටත්විජිත ව්‍යාපෘති හරහා යුරෝපීය ශාස්ත්‍රාලීය යථාර්ථවාදයට අනුව නව ස්වරූපයකින් ප්‍රතිනිර්මාණය විය. ඒ අනුව මෙම පර්යේෂණයේ මූලික ගැටලුව වනුයේ 'ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ යුරෝපීයයන් විසින් සම්පාදිත දෘශ්‍ය මූලාශ්‍රවල අන්තර්ගත හස්ති රුව යටත්විජිතකාරකයාගේ රුචිකත්වයේ ප්‍රතිනිර්මාණයක් වශයෙන් වරනැගෙන්නේ කෙසේ ද? යන්න සහ එකී ඇඟවුම්වලට පදනම සැපයූ දේශපාලනික හා මතවාදීමය ප්‍රවේශයන් කවරේ ද?' යන්න අවබෝධ කර ගැනීම යි. ගුණාත්මක පර්යේෂණ විධික්‍රමය යටතේ සිදු කෙරෙන මෙම අධ්‍යයනය සඳහා තෝරා ගැනෙනුයේ ක්‍රි.ව 1796-1948 අතර කාල පරිච්ඡේදය තුළ නිර්මිත ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයන් ය. එම කාලසීමාවට අදාළ ව අලි-ඇතුන් දඩයම් කිරීම, ගාල් කිරීම, ඇතුන් ලවා විවිධ කාර්යයන් කරවා ගැනීම, පෙරහැර දර්ශන ආශ්‍රිත අලි-ඇතුන් සහිත අවස්ථා දැක්වෙන තෝරාගත් කෘති 20ක නියැදියක් ආශ්‍රයෙන් මෙම පර්යේෂණය සිදු කරන ලදි. අධ්‍යයනයට යටත් දෘශ්‍යමය කියැවීම් සඳහා මූලික ව ම භාවිත වූයේ පශ්චාත් යටත්විජිතවාදී න්‍යායාත්මක ප්‍රවේශය යි. එමෙන් ම පියරේ බෝර්දියෝගේ රුචිකත්වය පිළිබඳ අධ්‍යයන මෙම පර්යේෂණයේ දී භාවිත විය. යටත්විජිත දෘශ්‍ය ක්ෂේත්‍ර තුළ ස්වදේශික හස්ති රූපයේ හැසිරවීම ඔස්සේ පිළිබිඹු වන යටත්විජිතවාදී රුචිකත්ව ප්‍රකාශන හා වීරත්වය ඇඟවීමේ ව්‍යංග්‍යාර්ථ අවබෝධ කර ගැනීම සඳහා සංඥාර්ථවේදී හා පශ්චාත් ව්‍යුහවාදී න්‍යායාත්මක ප්‍රවේශ ද වැදගත් විය. අධ්‍යයනයට යටත් දෘශ්‍ය නියැඳි තුළ හස්ති රූපයේ ස්ථානගත වීම, හස්තීන් විෂය කරගත් තේමා ගොඩනැගීම හා ඉරියව් නිරූපණය, පසුබිම් සංරචනය යනාදි දෘශ්‍ය ක්ෂේත්‍රයන් පිළිබඳ ව අවධානය යොමු කරන ලදි. අධ්‍යයන ප්‍රතිඵල අනුව, බහුතරයක් දෘශ්‍ය මූල තුළ හස්ති රූපය දේශපාලනික අරමුණු සහ කතිකාවත් ගණනාවක් හා බද්ධ වී ඇති බව අනාවරණය කර ගැනීමට හැකි විය. විශේෂයෙන් ම එය ශ්‍රී ලංකාව ඇතුළු පෙරදිග ලෝකයේ ගූඪත්වය සහ චමත්කාරය පිළිබඳ අපරදිග ලෝකයට සම්ප්‍රේෂණය කෙරෙන වැදගත් දේශපාලනික දෘශ්‍ය සංඥාවක් ලෙස භාවිත වී තිබේ. එසේ ම අලි ඇතුන් දඩයම් කිරීම වැනි අවස්ථාවන්හි දී එය යටත්විජිතකාරකයාගේ ශූරවීරභාවය සහ නිර්භීතභාවය හඟවන වැදගත් දේශපාලනික රූපකයක් බවට ද පත් ව ඇත. මේ අනුව බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ නිර්මිත දෘශ්‍ය මූලයන්හි නිරූපිත ස්වදේශික හස්ති රූපය යටත්විජිත රුචිකත්වය අනුව ස්වකීය ආස්ථානය මත සැලසුම්කරණය වූ බව නිගමනය විය.

***ප්‍රමුඛ පද*** *හස්ති රූපය, බ්‍රිතාන්‍ය යටත්විජිත යුගය, යටත්විජිත දෘශ්‍ය මූලාශ්‍ර, යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිය, පෙරදිගවාදය*

# FOLK DANCE & DRAMA

# කිරිමඬු ශාන්තිකර්මයේ අන්තර්ගත ඇත් බන්ධනයෙන් ප්‍රකටවන කුරුවේ රාජකාරි ක්‍රමය පිළිබඳ අධ්‍යයනයක්

සී. එම්. ආර්. පී. චන්ද්‍රසේකර

කැලණිය විශ්වවිද්‍යාලය

*ramithpreshal04@gmail.com*

මංගර දෙවියන් පිදීම උදෙසා පවත්වනු ලබන ප්‍රධාන ශාන්තිකර්මය වශයෙන් කිරිමඬු ශාන්තිකර්මය දැක්විය හැකි ය. මෙම ශාන්තිකර්මය ඌව, සබරගමුව හා පහතරට යන ප්‍රදේශ ආශ්‍රිත ව ව්‍යාප්ත ව පවතී. කිරිමඬු ශාන්තිකර්මයේ ඇත් බන්ධනය නම් නාට්‍යමය පෙළපාළිය පාරම්පරික ශිල්පීන් ඉදිරිපත් කරනුයේ මංගර දෙවියන් බින්තැන්න වනයේ විසූ විශාල ඇතෙකු මෙල්ල කළ කථා පුවත ගෙන හැර දැක්වීමට ය. මංගර දෙවියන් සතු බලය ප්‍රකට කිරීම එම නාට්‍යමය පෙළපාළියේ පරමාර්ථය යි. නමුත් මෙම නාට්‍යමය පෙළපාළියට අයත් පද්‍යය විමර්ශනය මගින් අතීතයේ රජු සතු ව පැවති කුරුවේ හෙවත් අලි, ඇතුන් පිළිබඳ ව කාර්ය අංශයේ රාජකාරි ක්‍රමය හා එම රාජකාරි සිදු වූ ආකාරය පිළිබඳ පූර්ණ විස්තරයක් ප්‍රකට වන බව දක්නට ඇත. ගජනායක නිලමේ විදානේවරුන්ට ඇතුන් බැඳීමට අවශ්‍ය වන සන්නස් ඉදිරිපත් කිරීම, බලතල අනුව රාජකාරි බෙදී යාම, ඇතුන් ඇල්ලීම සඳහා අවශ්‍ය වන උපකරණ සූදානම් කර ගැනීම, ඇතුන් බැඳීම උදෙසා වනගත වීම, ඇතුන් ඇල්ලීමේ පැරණි ශිල්ප ක්‍රම, ඇතුන් ඇල්ලීම හා එම ඇතුන් හීලෑ කිරීම යන කුරුවේ අංශයට අයත් රාජකාරි ක්‍රම මෙම ඇත් බන්ධනය නාට්‍යමය පෙළපාළියේ ඇතුළත් පද්‍ය මගින් ප්‍රකට වේ. මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ කිරි මඬු ශාන්තිකර්මයේ අන්තර්ගත ඇත් බන්ධනය නම් නාට්‍යමය පෙළපාළිය මඟින් කුරුවේ රාජකාරී ක්‍රමය ප්‍රකට වේ ද යන්න ය. මෙම පර්යේෂණයේ ක්‍රමවේදය ලෙසට ප්‍රාථමික, ද්විතීයික මූලාශ්‍රය භාවිතයට ගැනිණි. ප්‍රාථමික මූලාශ්‍රය යටතේ කුරුවිට, පරකඩුව, හිදැල්ලන, රත්නපුර, ඕපනායක, බළන්ගොඩ, ගලගම, හල්දුම්මුල්ල, බොරලන්ද, හල්පේ, වැලිමඩ, බූත්තල, කඹුරුපිටිය යන ප්‍රදේශයන්හි වෙසෙන කිරිමඬු ශාන්තිකර්මය සිදු කරනු ලබන පාරම්පරික ශිල්පීන් හමු වී ඔවුන් සතු අත් පිටපත් විමර්ශනය කරන ලදි. ද්විතීයික මූලාශ්‍රය ද මෙම පර්යේෂණය සඳහා යොදාගත් අතර පුස්තකාල අධ්‍යයනය මඟින් ද තොරතුරු ලබා ගන්නා ලදි. කුරුවිට, කළුකැලේ, අයගම, තැන්න, හල්දුම්මුල්ල, පුවක්ගහ ආරාව, බොරලන්ද, වැලිමඩ, බූත්තල, පැල්වත්ත, කඹුරු පිටිය යන ප්‍රදේශ ආශ්‍රිත ව ද පැවැති කිරිමඬු ශාන්තිකර්මයන් සඳහා සහභාගිත්ව නිරීක්ෂණ මගින් හා සම්මුඛ සාකච්ඡා මඟින් ද තොරතුරු ලබා ගන්නා ලදි. මෙසේ රැස් කරගත් දත්ත විශ්ලේෂණය කිරීම මඟින් ප්‍රකට වෙන කාරණය නම් ඇත් බන්ධනය නම් නාට්‍යය පෙළපාළිය මගින් මංගර දෙවි බින්තැන්නේ ලේවායේ විසූ විශාල ඇතා මෙල්ල කර අයුරින් මංගර දෙවි ආශිර්වාදය මත ඇතෙකු ඇල්ලීම පිළිබඳ ව කුරුවේ රාජකාරී ක්‍රමය ද ඇතුළත් නාට්‍යයක් මෙහි දී ඉදිරිපත් වන බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *කිරිමඬුව, ඇත් බන්ධනය, නාට්‍යමය පෙළපාළි, කුරුවේ, මංගර දෙවි*

# A Study on the Folk Play of Kaman Festival

M. Manoj[1*] and K. Pasumathi[2]

[1]Department of English Language Teaching, [2]Department of Political Science, University of Jaffna

*manojmohanraj195@gmail.com

Culture is that complex whole which includes knowledge, beliefs, art, morals, law, customs, and any other capabilities and habits acquired by man as a member of the society. Kaman festival or Kamandi festival is one of the traditional and cultural events of the Hindu devotees. There are two types of dramas in Tamil culture. One is a play and the other one is a drama. Plays are considered as the oldest cultural practices, and as the universal elements of human culture in all communities and groups. The folk play of Kaman festival is very famous in India and it is a popular event among the plantation sector communities of Sri Lanka. The story of Kaman festival has begun from the Vedas, it is a story of love. Kaman festival is a worshiping event of Manmathan, the god of love. In estates there are separate places for the play of Kaman festival which is known as 'Kaman place'. There are 108 characters in the folk story of Kaman festival. Usually, they perform the play with 42 major characters. God Manmathan, Goddess Rathi, and God Siva are the main characters. The play is performed in the following order from 16 to 18 days, starting pooja, planting the Kaman pole, Manmathan and Rathi wedding ceremony, starting the dance and perform, firing the Kaman, lamenting, a living ceremony, Kaman feast. The master of the ceremony who is the trainer of the play in the estates is known as Master or Annavi. The objective of this research was to analyze the original Indian cultural identities and traditions that are reflected in the Sri Lankan play. Primary data were collected through the observations, interviews, and case studies. Secondary data were collected from relevant books, magazines, and internet sources. The thematic data analysis techniques were applied for data analysis. This paper revealed two important findings on traditions and cultural identities of the plantation community. This research analyzed this performing art that is played without stage, more light settings, and modern makeups. In addition, it is performed using traditional costumes, traditional drums, and in the traditional way of storytelling. All these practices are done to protect their traditions and cultural identities to the next generation.

***Keywords:*** *Tradition, Kaman festival, Culture, Play*

# Nata Sankirtana: The Role of Folk Culture

W. Salgamuwa

Department of Dance and Music, Manipur University, Imphal, Manipur, India

*dw.salgamuwa@gmail.com*

In Manipur, Maharaj Garibaniwaz founded Drupad Hari Sankirtana which was known as Ariba Sankirtana (Bangdesh Pala) in the rituals of dead ceremonies like Asti Sanjay, Shradha, Samasor etc. Then in 1763-1798 A.D. under the rule of Maharaj Bhagyachandra, Drupad Hari Sankirtanaa accompanying Gourchandrika and Goura Bhavi became famous in Manipur. Maharaj Bhagyachandra was awarded the name Rajarshi and was believed to be the incarnation of Nortom Thakur Mahasoi, an intelligent Shiksha (student) of Loknath Goswami of Braja Brindavan. In Nata Sankirtana five aspects namely, Pung (rhythm/talas), songs, dance, story, and rituals are performed at the time of worshipping the lord. The different aspects used in these talas are all not that simple; they are all very ancient. This research was based on qualitative research methods and critical method was used to analyse data. It is clearly understandable with a thorough research into the ways of Punglons (drumbeats) as are used in the Sankirtana since long ago. Most Pandits (scholars) are of the opinion that such aspects of the Margi tala have long been ceased to exist from the Indian soil; except a few mentions in the "Shastra". It is the pride and practice of India that such types of Vedic talas found now here in India today have long been kept nourished and flourished within the folds of a tiny state like Manipur. It is possible to come to conclusions by discussing these issues. This research reviews information on the rural culture of Manipuri as well as the cultural value of drama and dance in other parts of the country.

***Keywords:*** *Nata Sankirtana, Srimad Bagavat, Gurukul System, Kirtana, Mahayajna*

# ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජන නර්තන පිළිබඳ අධ්‍යයනයක් (නැගෙනහිර පළාතේ සයින්දමර්දු ප්‍රදේශය ඇසුරින්)

කේ. සී. සම්පත්

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

*chamarasampath228@gmail.com*

මිනිසා විසින් අගය කරන්නා වූ දැනුම, විශ්වාස, කලාව, සදාචාරය, නීතිය, සිරිත් හා අනෙකුත් සියලු ම හැකියාවන්හි සංකීර්ණ සමස්තය සංස්කෘතිය යි. යම් සංස්කෘතියක ආවේණිකත්වය නිරූපණය කරන සාධකයක් ලෙස එහි ව්‍යවහාර ජන කලා මාධ්‍යයන් දැක්විය හැකි ය. ජනකලා යන්නට සාම්ප්‍රදායික ව සමජාතීය ප්‍රජාවක් වශයෙන් ග්‍රාමීය ව ජීවත් වන උපසංස්කෘතියකට අයත් ජනයාගේ නර්තන, නාට්‍ය, සංගීතය, සැරසිලි ආදිය අයත් වේ. ජන නර්තන කලාව මගින් එය අයත් ජන සංස්කෘතියෙහි ලක්ෂණ නිරූපණය කරයි. ශ්‍රී ලංකාවේ විවිධ සංස්කෘතීන්ට අයත් ජන නර්තන ක්‍රම හඳුනාගත හැකි අතර මුස්ලිම් ජනයා අතර ව්‍යවහාර ජන නර්තන ක්‍රමවේද ද ඒ අතර වේ. පසුගිය දශකයේ දී ශ්‍රී ලංකාව තුළ මුස්ලිම් හා අනෙකුත් ජන වර්ග අතර වාර්ගික ගැටුම් ඇති වූ අවස්ථා සඳහා ඒ ඒ ජාතීන් අතර සංස්කෘතික අවබෝධයෙහි පැවති ඌන ස්වභාවය ප්‍රධාන වශයෙන් ම බලපෑ බව නිරීක්ෂණය විය. එම ඌනතාව පූරණය කරමින් ශ්‍රී ලංකාවේ මුස්ලිම් හා අනෙකුත් ජන වර්ග අතර සමාජ ඒකාබද්ධකරණය උදෙසා ජන නර්තන කලාවෙහි ඇති වැදගත්කම විමසීමත් ඒ සඳහා අන්තර් සංස්කෘතික සන්නිවේදන මෙවලමක් ලෙස මුස්ලිම් ජන නර්තන ක්‍රම භාවිතය පිළිබඳ අධ්‍යයනය කිරීමත් මෙම පර්යේෂණයේ මුඛ්‍ය පරමාර්ථය විය. මෙම පර්යේෂණයේ ගැටලුව ලෙස ශ්‍රී ලාංකේය මුස්ලිම් සංස්කෘතිය පිළිබඳ අන්‍ය සංස්කෘතීන්ට අතර අවබෝධය ඇති කරලීම උදෙසා සන්නිවේදන මෙවලමක් වශයෙන් මුස්ලිම් ජන නර්තන ක්‍රම භාවිත කළ හැකි ද යන්න පිළිබඳ ව අධ්‍යයනය කරනු ලැබී ය. මේ සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කළ අතර ඒ යටතේ ද්විතීයික මූලාශ්‍රයන් වශයෙන් සම්මුඛ සාකච්ඡා, අන්තර්ජාල ප්‍රකාශන, පර්යේෂණ ලිපි මගින් එක්රැස් කරගත් දත්ත පදනම් කරගනු ලැබී ය. මෙහි දී ශ්‍රී ලංකාවේ නැගෙනහිර ප්‍රදේශයේ සයින්දමර්දු ප්‍රදේශයේ වෙසෙන මුස්ලිම් ජනයා අතර ප්‍රචලිත පොල්ලඩි නමැති ලී යුගලක් රැගෙන කරන නර්තනයත්, ඩෆ්මුට්ටු නමැති රබානක් අතින් ගෙන කරන නර්තනයත් යන අංග ද්විත්වය නියැදියක් ලෙස ගෙන එයින් මුස්ලිම් සංස්කෘතියෙහි ආගමික විශ්වාස, සදාචාරාත්මක ලක්ෂණ, සිරිත්විරිත් ආදි සංස්කෘතික ලක්ෂණ විද්‍යමාන වන ආකාරය විශ්ලේෂණය කරනු ලැබී ය. එයින් අනාවරණය වූයේ අන්‍ය සංස්කෘතීන්ට මුස්ලිම් සංස්කෘතියේ පවත්නා හර පද්ධතීන් සන්නිවේදනය කිරීමට ප්‍රමාණවත් දැනුම් සම්භාරයක් ඒ තුළ ගැබ් ව පවතින බව යි. ශ්‍රී ලංකාවේ ජන වාර්ගික අර්බුදයන්ට දිගුකාලීන විසඳුමක් වශයෙන් එම ජනවර්ග අතර අන්තර් සංස්කෘතික අවබෝධය ඇති කිරීම උදෙසා අන්තර් සංස්කෘතික සන්නිවේදන මෙවලමක් ලෙස එම ජාතීන්ට අයත් ජන නර්තන ක්‍රමවේද භාවිත කිරීම වඩාත් ඵලදායි වන බව මෙම පර්යේෂණයේ අවසන් නිගමනය වේ. පර්යේෂණ යෝජනා ලෙස ශ්‍රී ලංකාවේ සෞන්දර්ය අධ්‍යාපන විෂය ක්ෂේත්‍රයේ අධ්‍යයන විෂය ඒකකයක් ලෙස මුස්ලිම් ජන නර්තන ක්‍රමවේද අන්තර්ගත කිරීම යෝජනා කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *ජන නර්තන කලාව, මුස්ලිම් සංස්කෘතිය, සංස්කෘතික අවබෝධය, ගැටුම් නිරාකරණය*

# උඩරට සාම්ප්‍රදායික වන්නම්වල සංස්කෘතික පසුබිම පිළිබඳ අධ්‍යයනයක්

ඩී. කේ. යූ. එස්. ගුණදාස

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*udeshikasewwandius@gmail.com*

වන්නම් යන පදය දේශීය නර්තන ක්ෂේත්‍රය තුළ පමණක් ම යෙදෙන සුවිශේෂී වචනයකි. එහෙයින් ඒ පිළිබඳ ව අදහස් විමසා බැලීමේ දී වර්ණනාත්මක ගායනයක් හැඳින්වීම සඳහා යොදාගන්නා අරුත් ගැන්වීමක් ලෙස හඳුනාගත හැකි ය. බෙහෙවින් මේ පිළිබඳ ව මතවාද විමසීමේ දී දක්ෂිණ භාරතීය වර්ණම් යන පදය තුළින් බිඳී ආ පදයක් ලෙස වන්නම් යන්නෙන් ද පෙන්වා දිය හැකි ය. වර්ණම්වල දී ද වර්ණනාත්මක ගායනාවන්ට අනුකූල ඉදිරිපත් කිරීමක් යන්න මෙහි දී හුවා දක්වේ. උඩරට, පහතරට, සබරගමු යන ත්‍රිවිධ සම්ප්‍රදායේ ම එක ම අරමුණක් අරඹයා මෙකී වන්නම් යන පදය භාවිත වේ. එහෙත් සාම්ප්‍රදායික ව හා ප්‍රාදේශීය වෙනස්කම් මත එකී ව්‍යූහය යම්තරමක වෙනස් ව ව්‍යවහාර වේ. උඩරට වන්නම් මහනුවර යුගයේ කවිකාරමඩුව ආශ්‍රය කරගනිමින් දක්ෂිණ භාරතයෙන් පැමිණි ගණිතාලංකාර නම් බමුණෙකු විසින් මල්වතු පාර්ශ්වයේ හිමිනමකගේ ප්‍රධානත්වයෙන් සිදු වූ බවට සැලකේ. උඩරට වන්නම් දහඅටක් වශයෙන් නාමික ව හා සංඛ්‍යාත්මක ව දක්වෙන අතර විවිධ වකවානු තුළ මෙකී වන්නම් සැකසුණු බවට වන්නම් වාක්මාලා පරිශීලනය කිරීමෙන් පැහැදිලි වේ. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වන්නේ උඩරට සාම්ප්‍රදායික වන්නම්වල සංස්කෘතික පසුබිම කෙසේ ද යන්න යි. මෙහි අරමුණ වන්නේ උඩරට සාම්ප්‍රදායික වන්නම්වල සංස්කෘතික පසුබිම පිළිබඳ අධ්‍යයනය කිරීමට යි. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් මූලාශ්‍ර අධ්‍යයනය කරන ලදි. උඩරට සම්ප්‍රදායේ වන්නම් දහඅටක් සේ සලකන නමුත් අද වන විට නවතම වන්නම් කිහිපයක් භාවිතයේ ඇත. මීට අමතර ව අද වන විට භාවිතයේ නොමැති පැරණි වන්නම් ද මෙම සම්ප්‍රදාය තුළ දැකගත හැකි ය. සත්ත්ව චරිත, පුද්ගල චරිත, ඓතිහාසික සිද්ධි, බෝසත් චරිතයේ විවිධ අවස්ථා ආදි තේමාවන් උඩරට වන්නම් ව්‍යූහය තුළ ප්‍රායෝගික ව භාවිත වේ. මේ අතරින් තුරඟා වන්නමේ සිදුහත් කුමරු ඡන්න අමාත්‍යයා කැටුව කන්ථක අසුපිට නැග නේරංජනා ගඟින් එතර ව අභිනිෂ්ක්‍රමණය කළ පුවත විස්තර කෙරේ. කිරලා වන්නමේ දී කිරලා නැමති පක්ෂියාගේ නාදයත්, ඌ බොජුන් සොයා පියාඹා යන ආකාරයත් විස්තර කෙරේ. වන්නම්වල දී තානම, කවිය, කස්තිරම, සීරුමාරුව, අඩව්ව ලෙස සැකසීම දක්නට ලැබෙන අතර කවි ගායනය අතරතුර ඉතාමත් සරල ඉරියව්වක පිහිටා නර්තනයේ යෙදීමත් තානම තුළ අලංකාර මාත්‍රා නර්තනයත් එකී තාල රූපයට සුදුසු වන ආකාරයේ කස්තිරම, සීරු-මාරු නව අඩව්ව නැටීමත් අනිවාර්ය වේ. වර්තමාන ප්‍රාසංගික වේදිකාව තුළ මෙකී තත්ත්වය තරමක් වෙනස් වන්නේ තරඟකාරීත්වය හා නිර්මාණකරණය යොදාගැනීම අවශ්‍ය හෙයිනි. මෙයින් පැහැදිලි වන්නේ විවිධ වෙනස්කම්වලට ලක්වෙමින් උඩරට වන්නම් විකාශනය වී ඇති බව යි.

***ප්‍රමුඛ පදඃ*** *දේශීය නර්තනය, උඩරට, වන්නම්, සම්ප්‍රදාය*

# සිංහල ජනනාටක සහ ශාන්තිකර්ම පෙළපාළි තුළ අන්තර්ගත ස්වයංකථන රංග ලක්ෂණ පිළිබඳ ව අධ්‍යයනයක්


ආර්. එම්. යූ. පෙරේරා

ලලිත කලා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*ushan.pushpakumara@gmail.com*



ආදි මිනිසා විසින් නිර්මාණය කර ගන්නට යෙදුණු විවිධ ඇදහිලි හා විශ්වාස මත විවිධ රටවල විවිධ ජන රංග කලාවන් නිර්මාණය වී තිබේ. එහි දී ශ්‍රී ලාංකේය ජනරංග කලාවන් පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. ඊට ප්‍රධාන ම හේතුව වන්නේ සිංහල  ජන සමාජය තුළින් නිර්මාණය වී තිබෙන ජනරංග කලාවන්ගේ සුවිශේෂී එළඹීම් රැසක් හඳුනා ගන්නට ලැබෙන නිසා ය. ස්වයං කථන රංග ශෛලිය (Monologue) විෂය පද්ධතිය ලංකාව තුළ නව විෂය මාතෘකාවක් වන හෙයින් එය සිංහල ශාන්තිකර්ම විෂය ක්ෂේත්‍රයේ ජන රංගකලාවන් සමඟ සංසන්දනාත්මක විග්‍රහයක් කිරීම මෙම පර්යේෂණයෙන් සිදු වේ. ස්වයං කථනය යනු එක රූපණ ශිල්පියකු පමණක් ඉතා ප්‍රබල රංගාවස්ථාවක යෙදෙන නාට්‍යමය අවස්ථාවකි. ශ්‍රී ලංකාව තුළ පවතින උඩරට, පහතරට සහ සබරගමු යන නර්තන සම්ප්‍රදායන් තුළ පවතින සූනියම් යාගය, රිද්දියාගය, දහ අට සන්නිය වැනි නාට්‍යමය පෙළපාළි ඇතුළත් ශාන්තිකර්මයන්හි ප්‍රායෝගික භාවිතයන් අධ්‍යයනය කරමින් ඒවා තුළ භාවිත වන ස්වයං කථන රංග ශෛලියේ ලක්ෂණ සංසන්දනාත්මක ව විමර්ෂණය කරමින් කරන්නා වූ ප්‍රායෝගික පර්යෙෂණයකි. කේවල රංග සම්මුතියක් වශයෙන් ස්වයං කථන රංගනයන්හි දී ප්‍රේක්‍ෂකයාගේ අවධානය එම නිරූපණ ශිල්පියා දිනා ගන්නට බොහෝ දේ උපයුක්ත කර ගනියි. ස්වයං කථනයේ දී කරනු ලබන්නේ එම චරිතයේ ආත්ම ප්‍රකාශනය යි. එම චරිතයේ ඓතිහාසික සිදුවීම් හෝ කතාව යි. නැතිනම් එම චරිතයේ අභ්‍යන්තරික ගැටලුකාරීත්වය යි. එහි දී තමා කවරෙක් ද, තමාට අත් වූ ඉරණම හා ඊට හේතු මොනවා ද? යනුවෙන් ප්‍රේක්‍ෂකයාව මූලික ව ම දැනුවත් කරයි. ශාන්තිකර්ම පෙළපාළි තුළ ද මෙවැනි අවස්ථාවන් හඳුනාගැනීමට පුළුවන. විවිධ කවි ගායනාවන් ආශ්‍රයෙන් හා නිරූපණ ආශ්‍රයෙන් මූලික ව ම මෙම ක්‍රියාවලිය පෙළපාළියන්හි දී සිදුවේ. විශේෂයෙන් ම දහඅට සන්නිය වැනි නිරූපණයන්හි දී දහඅට සන්නි චරිත විසින් තම චරිතයන් හඳුන්වා දෙනු ලබයි. දෙවොල් මඩු ශාන්තිකර්මයේ එන පත්තිනි නිරූපණය, කොහොඹායක් කංකාරියේ යක්කම්පහ, අඹ විදමනේ පැමිණෙන මහලු චරිතය වැනි නිරූපණයන්හි දී ද, එම චරිත කවුද තමන් පැමිණි කාරණාව හා තමන්ට සිදු වී ඇති දේ පිළිබඳ ව ප්‍රේක්ෂකයාව දැනුවත් කරයි. ස්වයං කථන රංග ලක්‍ෂණ පෙළපාළිමය ජවනිකාවන්ගෙන් පෙන්නුම් කරනු ලබන්නේ මෙම ආකාරයේ නිරූපණයන් ඔස්සේ ය. කරළියට පැමිණෙන චරිතයට මුහුණ දීමට වූ සිදුවීම් සහ එම සිදුවීම නිසා ඔහුට හෝ ඇයට අත් වූ ඉරණම රංගය තුළ ශිල්පියා ප්‍රේක්ෂකයාට කවි ගායනා සහ දෙබස් මඟින් කියාපායි. වේදිකා භාවිතය, නිරූපණ ක්‍රමවේද, සංවාද කථනය මෙන් ම අනුරූපණ අවස්ථාවන්හි පුද්ගල ස්වකීය කථනයන් පෙළපාළිමය අවස්ථාන්ගෙන් හඳුනාගැනීමට හැකි ය. පර්යේෂණ දත්ත සමඟ සංසන්දනාත්මක ව විමර්ශනය කිරීමේ දී නාට්‍යමය පෙළපාළි තුළ පවතින ස්වයං විවරණය, ආත්ම කථනය, අත්දැකීම් කථනය වැනි ස්වයං කථන ලක්ෂණ හඳුනාගැනීමට පුළුවන. ජනනාටක නිර්මාණකරුවා චරිත නිරූපණයන් මඟින් එම චරිතයේ අධිඅරමුණ කරා මෙහෙයවනු ලබයි. ශිල්පියා එම චරිතය නිරූපණය කිරීමේ දී එම චරිතයේ සංස්කෘතිමය දේ මෙන් ම එම ශිල්පියාගේ  සමාජය පිළිබඳ ව අත්දැකීම් ද භාවිත කරයි. එහි දී එම ශිල්පියා එම චරිතයේ අධිඅරමුණ සබාගත කිරීමේ දී ස්වයංකථන රංග ලක්ෂණ පෙන්නුම් කෙරේ.



***ප්‍රමුඛ පදඃ** ස්වයං කථන රංගය, අධිඅරමුණ, අත්දැකීම් කථනය, කතා කීමේ කලාව, පුද්ගල විවරණය*

# සබරගමු වන්නම් තුළින් පිළිබිඹු වන ජන ව්‍යවහාර

ජී. ඩී. මද්දුමාගේ[1*] සහ එච්. පී. ඒ සුලෝචනා[2]

[1]සබරගමු නර්තන අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, [2]භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*gayanideepikam@gmail.com

දේශීය නර්තන සම්ප්‍රදායන් අතර පවත්නා සබරගමු වන්නම්, දීර්ඝ ඉතිහාසයක් සහිත වර්ණනාත්මක පද්‍ය රචනාවන්ගෙන් යුක්ත සබ නැටුම් විශේෂයකි, සංඛ්‍යාත්මක වශයෙන් විශාල ප්‍රමාණයක් රචනා වී ඇතත් වර්තමානයේ භාවිතයේ පවතින සබරගමු වන්නම් ගණනින් විසිඑකක් යැයි පිළිගැනෙන අතර ඒ තුළ අන්තර්ගත ජන ව්‍යවහාර ලක්ෂණ හඳුනාගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ යි. මෙම සබරගමු වන්නම්හි පද්‍ය රචනා ගැමි ජනයාගේ අත්දැකීම්, සොබාව සෞන්දර්ය වර්ණනා ආදි වූ නිදහස් තේමාවන් උපයුක්ත කරගනිමින් බිහි වූයේ ද යන අධ්‍යයන ගැටලුවෙහි පිහිටා සිදු කරන ලද මානවවංශ පර්යේෂණ යටතට ගැනෙන පර්යේෂණයකි. මෙහි දී පුස්තකාල අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යයනය යොදාගත් අතර පුස්තකාල අධ්‍යයනය යටතේ ද්විතීයික මූලාශ්‍රය පරිශීලනයත් ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා නිරීක්ෂණ ක්‍රමවේදයත් යොදා ගැනිණි. සබරගමු වන්නම්, කාව්‍යාලංකාර රීතිවලට අයත් උගත්යැයි සම්මත පිරිසෙන් නිර්මිත වන්නම් හා නිදහස් රචකයින් විසින් නිර්මාණය කළ වන්නම් ලෙසින් ද්විත්වාකාරයකි. ගායනය මුල් කරගනිමින් වන්නම් බිහි වී ය යන්න පිළිගත් සම්මතය වුවත් පසුකාලීන ව සබරගමු වන්නම් බහුතරයක් නිර්මාණය විමේහි ලා ගායනය ඉක්ම වූ නර්තනය ප්‍රමුඛ කරගත් පද්‍ය රචනා මුල් වී ඇති බවත් සබරගමු නර්තනය හා බැඳුණු වන්නම්හි පද රචනා බහුතරයක් ගැමි වහරින් නිර්මාණය වී ඇති බවත් අධ්‍යයනය තුළින් පැහැදිලි විය. සබරගමු වන්නම් ප්‍රස්තුත විවෘත ය. සැවුලා, කුදිරාඩි, මුසලඩි, මණ්ඩුක වැනි වන්නම්හි ගායනා ගත් විට සරල බස් වහරක් උපයුක්ත කරගෙන ඇත. "හයියෙන් කීවොත් වන්නම ඔබිනට-අයියෝ මේ වන්නම කියා දියන් මට" නිදසුනක් ලෙස දැක්විය හැකි ය. ගැමි ජන සමාජය තුළ ව්‍යංගාර්ථ ව දක්වන ලද උපදේශනය කොවුලා වැනි වන්නම් තුළින් ප්‍රකට ය. "ලොව දුදනා ගතිය මනා මෙම හට නර ලොව තිබෙනා" ආදිය නිදසුන් වේ. ජන විඥ්ඥාණගත ගුඪ විශ්වාසයන්ගෙන් ගැමි සමාජය අනූන ය. ඒ අතර පවත්නා මිථ්‍යා විශ්වාස ද සබරගමු වන්නම් සඳහා ගොනු කරගෙන ඇති බව කිඳුරු වන්නම් ගායනා අධ්‍යයනයෙන් පැහැදිලි වූවකි. මණ්ඩුක, අනිලා වැනි වන්නම් සඳහා තේමා වී ඇත්තේ සොබාදහම ය. ඒ අනුව සබරගමු වන්නම් පද්‍ය නිර්මාණවීමේ දී විදග්ධ භාෂාවෙන් නිර්මාණය වූ වන්නම් මෙන් ම බහුතරයක් සබරගමු වන්නම් සරල බස් වහර, උපදේශනය, මිථ්‍යා විශ්වාස, සොබාදහම වර්ණනා ආදි ලක්ෂණයන්ගෙන් යුක්ත ගැමි රචකයින්ගේ ගැමි ජීවන අත්දැකීම් තුළින් නිර්මාණය වී ඇති බැව් මෙම අධ්‍යයනය තුළින් අනාවරණය විය.

***ප්‍රමුඛ පදඃ*** *සබරගමු වන්නම්, පද්‍ය රචනා, භාෂාව, ජන ව්‍යවහාර*

# සිංහල ශාන්තිකර්ම හා ජන නාටකවල නිරූපිත පස්පව් සංකල්පය පිළිබඳ විමසුමක්

එම්. මනම්පේරි

භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගිකකලා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*manori.akms@gmail.com*

සිංහල ශාන්තිකර්ම හා ජන නාටක රටක සශ්‍රීකත්වය, කාම ක්‍රෝධාදි සිතිවිලි දිනීම, පස්කම් විෂයන්ගෙන් මනස මුදවා ගැනීම, උවදුරු දුරලීම, විනෝදාස්වාදය, ආදර්ශ සැපයීම සඳහා පවත්වනු ලැබේ. සිංහල ශාන්තිකර්ම හා ගැමි නාටකවල ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමයෙහි වරදවා හැසිරීම, මුසාවාදය සහ සුරාපානය යන පඤ්චපාප ක්‍රියාවල ආදීන ව නිරූපණය වන බව පෙනේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ශාන්තිකර්ම හෝ ජන නාටකවල පස්පව් සංකල්පය නිරූපණය වන අයුරු විමසීම යි. මේවාට පස්පව් ක්‍රියා අන්තර්ගත කිරීමේ හේතුව කුමක් ද අධ්‍යයන ගැටලුව යි. පර්යේෂණ ක්‍රමවේදය ලෙස, පුස්තකාල අධ්‍යයනය යටතේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය සිදු කෙරිණි. මහසොහොන් සමයම, සන්නියකුම, සූනියම්යාගයේ පුරාකථා හා බුලත් උපතත්, ගම්මඩුයාගයේ පත්තිනි පුවත, දෙවොල් පුවත, පහන්මඩුයාගයේ රාම මැරීම පුවත, කලු, රීරි, මහසොහොන්, අභිමාන යක්චරිත හා මහාකෝල සන්නිය, කෝලම් නාටකයේ ආරච්චි, අණබෙරකරු, පොලිස්, ජසයා සහ ලෙන්චිනා, මරක්කල, ලන්දේසි, යන කෝලම් ද, සොකරි නාටකයේ සොකරිය, ආඬිගුරු චරිතත්, අධ්‍යයනය සඳහා යොදා ගැනිණි. රීරි, කලුයකු මෙන් ම සංඛපාල රජු, මරක්කල කෝලම (හරක් මරමින්නේ මරක්කල කොළමයි එන්නේ) ප්‍රාණඝාතයට හවුල් වූ අය යි. ආරච්චිකෝලම අදත්තාදානයේ යෙදෙන්නෙකි. (''ගසා කෙත්වතු සැම--''). මහාකෝල සන්නි යකා ('---අරක්කු දෙන්නම් නුඹලට), රාම මැරීම පුවතේ රාම ''---අබිං කන්සා බීගත්තේ'', අණබෙරකරු, සුරාපානය කරන්නන් ය. පොලිස් කෝලමේ කවිවල ''චණ්ඩි සොරුන් ද, මිනීමරුවන් ද, බේබද්දන් ද, සූදුකරුවන් ද රට නසනා'' යනුවෙන් පැවසේ. මෙමගින් යකුන් මෙන් ම නිලතල දරන්නන්ගේ සැබෑ ස්වරූප ද හෙළි වේ. කෝලම් නාටකය අවසානයේ ඡත්‍රපානී ජාතකය, චුල්ලදනුද්ධර, ජන්නකින්නර ආදි ජාතක රඟ දැක්වීමෙන් සාරධර්ම වඩවා ගැනීමට ආදර්ශ සපයනු ඇත. බුලත් උපතේ කවිවල සස ජාතකයේ බෝසත් සාවාගේ කුසල චෛතසිකයේ බලය, ශක්‍රයා ලොවට පෙනෙනසේ සඳේ සිත්තම් කිරීමෙන් සන්නිවේදනය කරන්නේ පාපකාරී අදහස් නොමැත්තා සඳ සේ බබළන බව යි. යහපත, අයහපත පිළිබඳ ජනයා දැනුවත් කිරීමේ අරමුණෙන් මෙවැනි අවස්ථා ශාන්තිකර්ම හා ජනනාටකවලට එක්කර ගත්බවත් පස්පවෙන් දුරුව, ධනාත්මක සිතිවිලි පෝෂණයෙන් සියලු රෝගී තත්ත්ව ශූන්‍ය කරගත හැකි බවත්, නිගමනය කළ හැකි ය. රටක සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් වීමට නම් සාරධර්ම වර්ධනයෙහි ලා මෙවැනි දැනුම පාසල් විෂය නිර්දේශවලට ඇතුළත් කළ යුතු ය.

***ප්‍රමුඛ පද:*** *පස්පව්, පඤ්චශීලය, ශාන්තිකර්ම, ජනනාටක, සාරධර්ම*

# වතු ද්‍රවිඩ ජනයාගේ ජනකලා විශේෂයක් වන කාමන් කූත්තු නාටක පිළිබඳ අධ්‍යයනයක් (බදුල්ල, හොප්ටන් වතුකරය ආශ්‍රයෙන්)

ආර්. ඩබ්. ජේ. කේ විජේරත්න[1*] සහ ඩී. ඩබ්. එස්. කුමාර[2]

[1]ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, [2]කැලණිය විශ්වවිද්‍යාලය

*kumudumaliwijerathne@gmail.com

ඇදහිලි, විශ්වාස සැම විට ම විද්‍යාත්මක හෝ යථාර්ථවාදී නො වන නමුත් ඒ තුළ ප්‍රබල සමාජ විද්‍යාත්මක අර්ථයක් ඇත. ලංකාව බහුවාර්ගික රටක් වශයෙන් එකිනෙක ආගම් හා බැඳී පවත්නා වූ විවිධාකාර ඇදහිලි, විශ්වාස පවතී. ද්‍රවිඩ ජාතීන්ගේ ජන චර්යාව හා බැඳි ප්‍රබල ජනකලා විශේෂයක් ලෙස "කාමන් කූත්තු" හඳුනාගත හැකි ය. කූත්තු යන්න සිංහලෙන් නාටකය යි. කාමන් යන නාටකයේ විශේෂ චරිතයක් වන අතර මෙම නාටකය කාමන් කූත්තු ලෙස ප්‍රචලිත ය. දිගු ඉතිහාසයකට හිමිකම් කියන මෙම නාට්‍ය විශේෂය වර්තමානය වන විට ප්‍රදේශ කිහිපයකට පමණක් සීමා වී තිබේ. එලෙස මුළුගැන්වී ඇති ද්‍රවිඩ ජනකලාවක් වන කාමන් කූත්තු නාටකයේ අප්‍රකට තොරතුරු ගවේෂණය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. "කාමන් හෙවත් මන්මද" විසින් ඊශ්වර දෙවියන්ගේ දියණිය වූ "රදී" දෙවඟන විවාහ කර ගැනීමෙන් පසු කාමන් හා ශිව අතර ඇති වන ගැටුම මෙම නාට්‍ය මගින් නිරූපණය කරයි. පුද පූජා චාරිත්‍රවාරිත්‍ර සමඟින් සෑම වසරක ම පෙබරවාරි හා මාර්තු අතරතුර කාලයේ දින හතක් පුරා කාමන් නාටකය රඟ දැක්වීම විශේෂත්වයකි. වතුකරයේ ජනතාවට ආශිර්වාද පැතීම මෙම සංස්කෘතිකාංගයේ අරමුණ යි. දකුණු ඉන්දියානු කම්කරුවන් විසින් මෙරටට රැගෙන එන්නට ඇතැයි සැලකෙන මෙම ජන නාට්‍ය ලංකාවේ උතුරු, නැගෙනහිර, මධ්‍යම, සබරගමුව හා ඌව යන පළාත්හි විවිධ වූ ස්වරූපයෙන් දැකගත හැකි ය. ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හොප්ටන් වතුකරය ආශ්‍රිත ව වාර්ෂික ව පැවැත්වෙන කාමන් නාටකය සම්බන්ධයෙන් මෙම අධ්‍යයනය සිදු කර ඇත. පවුල් 350කින් සමන්විත වූ හොප්ටන් ග්‍රාමයේ තේ කර්මාන්තය ආශ්‍රිත ව රැකියා කරන ද්‍රවිඩ පවුල් වැඩි වශයෙන් වාසය කරයි. වර්තමානයේ තරුණ පරපුර අතරේ මේ සම්බන්ධ ව පවත්නා අදහස් මොනවා ද යන්නත් මෙමඟින් අධ්‍යයනය කර ඇත. මෙම අධ්‍යයනය සිදු කිරීමෙහි ලා පොත්පත් මඟින් මූලික කරුණු ලබාගත හැකි විය. නාටකය සඳහා අවශ්‍ය කූත්තු කණ්ඩායම සකසාගෙන ඇත්තේ වතුකරයේ ම ජනතාවගෙන් වන අතර දත්ත රැස්කර ගැනීමට ඔවුන්ගේ මෙන් ම කාලයක් මුළුල්ලේ කූත්තු නැරඹූ සිංහල, දෙමළ ජනතාව මඟින් කාමන් කූත්තු සංදර්ශනය පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීමට හැකි විය. නාට්‍ය ආරම්භයේ සිට අවසානය දක්වා දින 7ක් සහභාගී නිරීක්ෂණය මගින් තොරතුරු සොයා ගත්හ. කප් සිටුවීම, රඟ මඩල සෑදීම, නාට්‍ය පුහුණු වීම, නළුවන් උදෙසා සිදු කරන චාරිත්‍ර වාරිත්‍ර, අංග රචනය, වෙස් ගැන්වීම, මංගල දිනය, නාට්‍ය අවසානයේ සිදු වන නැවත ඉපිදවීම යන නාට්‍යයේ විශේෂ අවස්ථාවන්ට සහභාගි වීමෙන් කාමන් නාටකය සම්බන්ධ තොරතුරු රැසක් අනාවරණය කරගත හැකි විය. අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි වූයේ ආර්ථිකමය වශයෙන් කෙතරම් බාධක පැමිණිය ද අනාගත පරපුරට මෙම සංස්කෘතිකාංග දායාද කිරීමට වැඩිහිටි පරපුර මහත් පරිශ්‍රමයක් දරන බව යි. එබැවින් මෙවැනි සංස්කෘතිකාංග විනාශ වීමට නො දී, අගය කිරීමක් ලබා දී, ඉදිරියට පවත්වාගෙන යාමට වැඩපිළිවෙළක් සකස් කිරීමේ අවශ්‍යතාව මතු ව තිබේ.

***ප්‍රමුඛ පදඃ*** *කාමන් කූත්තු, ජන කලා, හොප්ටන් ජන ජීවිතය*

# ‘The Sinhalese Folk Play of *Ediriweera Sarachchandra*: The Turning Point of Sinhala Stage

K. M. N. Madhupani[1*] and Ven. K. Sugunadhamma[2]

[1]Department of Sinhala, University of Peradeniya, [2]Sri Lanka International Buddhist Academy (SIBA)

*[*]nayomimadhupani317@gmail.com*

In ‘The Sinhalese Folk Play’ (*Sinhala Gemi Natakaya*) published in 1968, *Ediriweera Sarachchandra* mainly discusses on the origin and features of drama, cultured drama and religion, Sinhala drama and cultural background, dramatic features of Sinhala folk rituals and contemporary Sinhala drama. The main thesis he brings out by this work is Sinhalese drama tradition should be arisen not as an acquired tradition, but as a tradition developed through existed folk arts in Sri Lanka. *Sarachchandra's* personal interest on drama and music, cultural renaissance and ideas on nationalism spread all over the country in that era, practice he had obtained by studying new western disciplines including Anthropology, Philosophy, Logical Positivism etc. and knowledge he acquired by oriental studies influenced him to find a native drama tradition. He pointed out that there was no opportunity for a Sinhala drama tradition to arise mainly due to religious obstructions, nevertheless there is a kind of a drama tradition among folks. He believed that Sinhalese drama tradition should be created with the light of the said tradition and oriental drama tradition. Therefore, this research attempted to investigate the facts that how ‘The Sinhalese Folk Play’ of *Sarachchandra* acted as the turning point of Sinhala drama providing a preface to modern creative Sinhala stage. Data collected through library sources and field studies were used for the study. The study reveals that the thesis presented by the work: ‘Sinhalese drama tradition should be arisen not as an acquired tradition, but as a tradition developed through existed folk arts in Sri Lanka’, led artists to find a native drama tradition arisen through folk rituals, folk religion, folk music, folk arts, folk tales and classical Sinhala literature and language.

***Keywords***: *Sinhalese Folk Play, Ediriweera Sarachchandra, Sinhalese Drama Tradition*

# කෘෂිකාර්මික ජීවන වෘත්තීන් හා බැඳුණු ජන නැටුම්වල අද්‍යතන තත්ත්වය පිළිබඳ අධ්‍යයනයක්

එච්. පී. ඒ සුලෝචනා

භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*arunisulochana25@gmail.com*

කෘෂිකාර්මික ජීවන වෘත්තීන් හා බැඳී පවතින ගොයම්, පන්, කුළු, මෝල්ගස් ආදි ජන නැටුම් ලාංකේය සමාජ සන්දර්භය විවරණය කරන එක් පැතිකඩකි. විඩාව, කාන්සිය මග හරවා ගැනීමටත් විනෝදාස්වාදය උදෙසාත් මෙය ඔවුන් තුළින් අව්‍යාජ ලෙස නිර්මාණය වූවකි. ලාංකේය සමාජ වෙනස් වීම හේතු කොටගෙන ජන නැටුම් ද වර්තමානය වන විට වෙනස් වීමකට ලක් ව තිබේ ද යන අධ්‍යයන ගැටලුවෙහි පිහිටා මෙම පර්යේෂණය සිදු කරන ලදි. කෘෂිකාර්මික ජීවන වෘත්තීන් හා බැඳුණු ජන නැටුම් බිහි වීමේ සමාජ සංස්කෘතික වපසරිය අධ්‍යයනය කිරීමත් වර්තමානයේ ජන නැටුම් වෙනස් වීම හා ඒ කෙරෙහි පවත්නා පුද්ගල ආකල්ප හඳුනාගැනීමත් මෙම පර්යේෂණයේ මූලික අරමුණු විය. මානවවංශ පර්යේෂණ යටතට ගැනෙන අධ්‍යයනයක් වන අතර දත්ත එකරාශී කිරීම සඳහා ගුණාත්මක ක්‍රමවේදය යොදාගනිමින් උද්ගාමී තර්කන ක්‍රමය යටතේ නිගමනවලට එළැඹිණි. මෙහි දී සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලී ක්‍රමය සහ නිරීක්ෂණ ක්‍රමය උපයුක්ත කරගන්නා ලදි. ජන නැටුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ නිරත වන ආචාර්යවරුන්, නිර්මාණකරණයේ නියුතු නර්තන ශිල්පීන්, විශ්වවිද්‍යාල සිසුන් හා පාසල් සිසුන් සම්මුඛ සාකච්ඡා සඳහා සම්බන්ධ කරගත් අතර පුස්තකාල අධ්‍යයන යටතේ ද්විතීයික දත්ත පරිශීලනය ද සිදු කැරිණි. අතීතයේ පැවති ජන නැටුම සරල, සාමූහික ගායනා සහිත වූවක් විය. පසුකාලීන ව පාසල් විෂය මාලාව තුළට ද ජන නැටුම් එක් වනුයේ එතුළ පැවති ලාංකේය ගැමි අනන්‍යතාව සුරැකීමේ පරමාර්ථයෙනි. නවීන තාක්ෂණය නතු වූ වත්මන් සමාජ ක්‍රමය තුළ ගැමි ජීවන ක්‍රියාකාරකම් ද වෙනස් වීමට ලක් ව ඇත. ගොයම් කැපීම, පන් නෙළීම, ආදී අතීත කෘෂි ජීවනෝපායමාර්ගයන් හා බැඳි ක්‍රියාකාරකම් වත්මන් සමාජය තුළ දක්නට නො ලැබීම හේතුවෙන් ඒ පිළිබඳ දැනුම ශූන්‍ය ව ඇත. වත්මන් ජන නැටුම් නිර්මාණකාර්යයෙහි බහුතරය නියැළෙනුයේ අනවබෝධයෙන් බව අධ්‍යයනයෙන් පැහැදිලි වූවකි. කමත තුළ ප්‍රභවයලත් සරල බව මූලික වූ ජන නැටුම වත්මන වන විට වේදිකාවට සුදුසු පරිදි ගොඩනැගී ඇත. සරල ගායනා, ඇඳුම්-පැලඳුම්, සරල අංගහාර වෙනුවට සංකීර්ණ බෙරපද, විචිත්‍ර රංග වස්ත්‍ර මෙන් ම වේදිකාවට සුදුසු පරිදි රංග රටා ආදියෙන් යුක්ත අර්ථාන්විත බව ඉක්ම වූ විචිත්‍රත්වයකින් යුක්ත ය. සමාජ වෙනස් වීම් හමුවේ ජන නැටුම ද වෙනස් විය යුතු නමුත් එහි මූලික හරපද්ධතියට හානියක් නො විය යුතු ය යන සමාජ ආකල්පය බහුතරය තුළ පවතී. කෘෂි ජීවන වෘත්තීන් හා බැඳි ජන නැටුම වර්තමානය වන විට කෘෂි ජීවන රටාවෙන් වියුක්ත වීම හේතුවෙන් වේදිකාවට උචිත පරිදි සංකීර්ණත්වයට පත් ව වෙනස් ව ඇති බවත් එය සමාජ වෙනස් වීම අරබයා සිදු වූවක් බවත් මෙම පර්යේෂණයෙන් අනාවරණය විය.

***ප්‍රමුඛ පදඃ*** *ජන නැටුම්, සමාජ වෙනස් වීම, සාම්ප්‍රදායික සමාජය, ගැමි ජනයා*

# සොරගුණු දේවාල පෙරහර හා සම්බන්ධ ඇත්කඳ ලිහිණි කෝලම් නර්තනාංගය පිළිබඳ අධ්‍යයනයක්

ඒ. දිසානායක

නර්තන හා නාට්‍ය කලා පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

*sapna.wije@gmail.com*

ඇත්කඳ ලිහිණි කෝලම සොරගුණු කුඩා කතරගම දේවාල පෙරහර හා සම්බන්ධ නර්තනාංගයකි. කෝලම් ලංකාවේ දකුණු හා බස්නාහිර පළාත් ආශ්‍රය කරගනිමින් ව්‍යාප්ත වී ඇති පහතරට බෙරය වාදනය කරන ජන නාට්‍ය විශේෂයක් වශයෙන් ප්‍රචලිත ය. එහෙත් සබරගමු හා ඌව පළාත් ආශ්‍රිත දේවාල පෙරහර වත්පිළිවෙත්වල දී ඉදිරිපත් කෙරෙන අප්‍රකට කෝලම් නර්තනාංග විශේෂයක් ද වෙයි. මෙකී කෝලම් නර්තනාංග සඳහා සබරගමු දවුලෙන් බෙර පද වාදනය කරනු ලැබේ. ඒ අතරින් සොරගුණු දේවාල පෙරහර හා සම්බන්ධ ඇත්කඳ ලිහිණි කෝලම් නර්තනාංගය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. සොරගුණු කුඩා කතරගම දේවාල පෙරහරට ඇත්කඳ ලිහිණි කෝලම නර්තනංගය සම්බන්ධවූයේ කුමන කරුණක් පදනම් කරගෙන ද යන්න මෙම අධ්‍යයනයේ ගැටලුව වෙයි. දත්ත රැස් කිරීම සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරන ලදි. 2017 හා 2018 වර්ෂයන්හි දී පවත්වන ලද සොරගුණු දේවාල පෙරහර නැරඹීමෙන් සහභාගීත්ව නිරීක්ෂණය සිදු කෙරිණි. හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කන්දපල්ල කෝරළයේ සොරගුණු ගම්මානයේ මෙම දේවාලය පිහිටා ඇත. දේවාල භූමිය අවට පදිංචි නිලපංගු රාජකාරියේ යෙදෙන මොහොට්ටාල, ඇත්කඳ ලිහිණි කෝලම් නර්තකයා, වාදකයා හා ගම්වාසීන් දෙදෙනෙකු සමග සම්මුඛ සාකච්ඡා පවත්වන ලදි. ඇත්කඳ ලිහිණියා මනඃකල්පිත පක්ෂියෙකි. ඇතෙක් වුව ද ගොදුරු කරගන්නා තරම් විශාල පක්ෂියෙකු ලෙස ජනශ්‍රැතියේ පවතී. දහසයවැනි ශතවර්ෂයේ අග භාගයේ හෝ දහහත්වැනි ශතවර්ෂයේ මුල් භාගයේ දී යාපා නම් වූ රජ කෙනෙකු විසින් සොරගුණු දේවාලය ඉදිකරවා කතරගම දෙවියන්ට පූජා කර ඇති බව සඳහන් වේ. දින පහළොවක් පුරා පැවැත්වෙන මෙම පෙරහර මංගල්‍යයේ දහහතර වන දින රාත්‍රියේ අලුයම ඇත්කඳ ලිහිණි කෝලම නර්තනය කරනු ලැබේ. දේවාල භූමියේ පිහිටි සිංහාසනය නම් වූ ස්ථානය ඉදිරිපිට දී ඇත්කඳ ලිහිණියා කෝලමට අදාළ ගායනා හා දවුල් පද විශේෂයට අනුව සුදු පැහැති වස්ත්‍රයෙන් සැරසුණු නර්තකයා සුදු පැහැති ඇත්කඳ ලිහිණි වෙස් මුහුණ පැලඳගෙන නර්තනාංගය ඉදිරිපත් කරනු ලැබේ. සිංහල සහ ද්‍රවිඩ යන භාෂාවන්හි කෝලම් පද ගත අරුත් විමසීමේ දී එයින් විකාර, විහිලු, නැටුම, වෙස් ගැන්වීම හෙවත් සමාරෝපය යන අරුත් සපයයි. එසේ ම කෝලම් විනෝදස්වාදය සපයන රැඟුම් විශේෂයක් ලෙස දහනවවන ශතවර්ෂය අග භාගයේ දී ජනප්‍රිය වුව ද ඇත්කඳ ලිහිණි කෝලම හා සම්බන්ධ නර්තන චලන, ගායන හා බෙර පද විශේෂයෙන් එහි ගැබ් වූ පූජා ස්වරූපයක් නිරූපණය වෙයි. කතරගම දෙවියන් වෙනුවෙන් කෙරෙන වත්පිළිවෙතක් වශයෙන් සොරගුණු කුඩා කතරගම දේවාල පෙරහරට ඇත්කඳ ලිහිණි කෝලම් නර්තනාංගය සම්බන්ධ වී ඇති බව මෙම පර්යේෂණයෙන් අනාවරණය විය.

***ප්‍රමුඛ පදඃ*** *ඇත්කඳ ලිහිණි, කෝලම, සොරගුණු දේවාලය, පෙරහර, කතරගම දෙවියන්*

# සබරගමු නර්තන සම්ප්‍රදාය සහ වැදි නර්තන සම්ප්‍රදාය හා බැඳි නර්තනාංගයන් සිදු කිරීමේ අරමුණු හා අපේක්ෂතා අතර පවතින සමානතාවන් පිළිබඳ අධ්‍යයනයක් 393

එල්. පී. කුමාරසිරි[1*] සහ ඩී. ආරියරත්න[2]

[1]විෂයාන්තර අධ්‍යයන අංශය, තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය, [2]සමාජ විද්‍යා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

*laknipr asanjali@gmail.com*

සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය නර්තනයේ දැකිය හැකි ප්‍රධාන නර්තන සම්ප්‍රදායක් ලෙස සබරගමු නර්තන සම්ප්‍රදාය හැඳින්විය හැකි අතර ශ්‍රී ලංකාව තුළ හඳුනාගැනීමට ලැබෙන ප්‍රධාන සහ එක ම ආදිවාසී ජන සමාජය ලෙස වැදි ජන සමාජය හඳුනාගත හැකි වේ. වැදි ජන සමාජයට ආවේණික පූජා නැටුම් මෙන් ම සබරගමුව නර්තනයට ආවේණික පූජා නැටුම් ද පවතී. සබරගමු සම්ප්‍රදායට අයත් නර්තනාංගයන් සිදු කිරීමේ හා වැදි ජන සම්ප්‍රදායට අයත් නර්තනාංගයන් සිදු කිරීමේ අරමුණු හා අපේක්ෂතා අතර පවතින සමානතාවන් කෙබඳු ද? යන ගැටලුව පාදක කරගනිමින් මෙම අධ්‍යයනය සිදු කර තිබේ. මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථය වූයේ, සබරගමු නර්තනාංගයන් සිදු කිරීමේ හා වැදි නර්තනාංගයන් සිදු කිරීමේ අරමුණු හා අපේක්ෂතා අතර පවතින සමනතාවන් විශ්ලේෂණාත්මක ව අධ්‍යයනය කිරීම යි. මෙම පර්යේෂණය සිදු කිරීමට තෝරාගත් අධ්‍යයන ප්‍රදේශය වූයේ දඹාන සහ හෙන්නානිගල යන ග්‍රාමයන් ය. පර්යේෂණ ක්‍රමවේදය ලෙස, ප්‍රාථමික දත්ත ලබා ගැනීමේ දී වැදි නායකතුමන් සහ වැදි පරපුරේ වැදි නැටුමෙහි නියැලෙන්නෙකුගෙන් ප්‍රවීණ සහ ආධුනික සබරගමු නර්තන ඇදුරන්ගෙන් මෙන් ම මනෝ වෛද්‍යවරයෙකුගෙන් ඍජු සම්මුඛ සාකච්ඡා 8ක් ලබාගත් අතර, නිරීක්ෂණ ක්‍රමවේදය ද යොදා ගන්නා ලදි. එම ලබාගත් දත්ත ක්‍රමවත් ව වාර්තාගත කළ අතර පසු ව එම වාර්තා සන්දර්භානුගත විශ්ලේෂණයකට (Contextual Analysis) ලක්කර තිබේ. සබරගමු නර්තනාංගයන් සිදු කිරීමේ හා වැදි නර්තනාංගයන් සිදු කිරීමේ අරමුණු හා අපේක්ෂතා සංසන්දනාත්මක ව අධ්‍යයනය කරන කල්හි, ලෙඩරෝග දුරු කරගැනීම, නිසි කලට වැසි ලබා ගැනීම, ස්වාභාවික විපත්වලින් මිදීම, ගැබිනි කතුන්ට උපද්‍රවයකින් තොර ව දරුවන් ලබා ගැනීම යනාදි සමාන අරමුණු හා අපේක්ෂාවන් මෙම නර්තන සම්ප්‍රදායන් දෙකෙහි ම පවතින බව පර්යේෂණයේ අවසාන නිගමනය ලෙස හඳුනාගත හැකි විය.

***ප්‍රමුඛ පද:*** *සබරගමු නර්තන සම්ප්‍රදාය, වැදි නර්තන සම්ප්‍රදාය, නර්තනාංග, අරමුණු හා අපේක්ෂතා*

# ‘Metaphoric Theatre Training Method’ in Modern Sri Lankan Tamil Theatre

T. Thevananth

Chairman, Journalism for People Movement

*tthevananth@gmail.com*

Drama relates to visual action that its capital. Therefore, the spectators are attracted towards the theatre. Mean time actors are the capital of theatre performances. Nowadays Modern Tamil theatre is trained non - actors, several of those who participated in the theatre training did not have any pre –experience in acting or performances, because of long-lasting war Tamil theatre lost its experienced traditional actors, need to train non-actors. They are being afraid about their body. Removing this fear from them and putting them on stage in-from of many people is a challenging task. Theatre training with folk elements must make them act without being fear. Participants were asked to travel through folk dances with drums (or Thalam). Whoever danced to the beat was asked to discover their body, but it was difficult task frustration and inferiority complex push them into misery. Eliminating this and bring a person to state of acting a character is in fact a very difficult task. But this task was made possible through folk theatrical training. This paper employed auto-ethnography research method and take advantage of the author’s direct observation as creator, performer, and trainer. Information was also obtained from participants of the theatre trainings. Aim of this paper is to evaluate the effectiveness of metaphoric theatre methods in modern Tamil plays in north srilanka. Objective is to identify the effective training methods for non-actors. The active theatre movement uses “Metaphoric Theatre Method”. Each one had to metaphor their stories into images. This is the main characteristic of folk theatre. The practice of applying a descriptive term of something on to some other things is called metaphor. This could be seen in the language culture of Tamils. Likewise, metaphors are also found in folk dramas. When a story is given in only one-dimensional nature, only those with that experience will understand it. On the contrary, when it is metaphorical it could be said that it gains a generality or generalist value. These images are created with this generality as the base. Because of this, those who see them will fit into them, their stories and experience. The paper concludes that, Tamil modern theatre training merged folk element for effective training for non-actors.

***Keywords:*** *Srilankan Tamil Theatre, Non-Actors, Folk Theatre, Theatre Training, Metaphoric Theatre*

# කොහොඹා කංකාරියේ භාවිත තේවාපද සඳහා මූලික වන රිද්මය හා තිත පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයක්

ඩබ්. ජී. එච්. එම්. වෙද්දෙනිය

මානව ශාස්ත්‍ර පීඨය, ලලිතකලා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*weddeniya@gmail.com*

කොහොඹා කංකාරියේ තේවා පද ලෙස මහනුවර ශෛලියයේ හත් පදය (බුලත් පදය, කොතල පදය, සළු පදය, දුම්මල පදය, පොල් පදය, වැදිපෙට්ටිය, කොරවැද්දන් පදය) හා දුනුමාලප්පුව, කොල්පාඩුව ආදි නර්තනාංග නර්තනයේ දී රිද්මය හා තිත මූලික වන අවස්ථාවන් පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ ප්‍රධාන අරමුණ වේ. මෙහි දී දත්ත ලියවී ඇති මූලාශ්‍ර සාධක, ක්ෂේත්‍ර ගවේෂණ සඳහා මහනුවර දිස්ත්‍රික්කය, සම්මුඛ සාකච්ඡා (පාරම්පරික ශිල්පීන්), ප්‍රායෝගික අත්දැකීම් පදනම් කරගෙන ලබාගත් දත්ත ඉහත අරමුණ ඉටු කරගැනීම සඳහා උපයෝගී කොට ගෙන ඇත. උඩරට නර්තන සම්ප්‍රදාය මහනුවර, සතර කෝරළය, සත් කෝරළය ලෙස ප්‍රධාන ශෛලීන් තුනක් යටතේ විකාශනය වී ඇත. කොහොඹා කංකාරිය උඩරට නර්තන සම්ප්‍රදායේ කෝෂ්ඨාගාරය ලෙස හැඳින්විය හැකි ය. කොහොඹා කංකාරිය පූජාර්ථය මූල්කරගත්, රෝග නිවාරණය අපේක්ෂාවෙන් පවත්වන ශාන්තිකර්මයකි. කොහොඹා කංකාරියේ පුද ලබන දෙවියන්ට තේවා පිණිස හා පූජාර්ථය මුල්කරගත් හත් පදය, (බුලත් පදය, කොතල පදය, සළු පදය, දුම්මල පදය, පොල් පදය, වැදිපෙට්ටිය, කොරවැද්දන් පදය) දුනුමාලප්පුව, කොල්පාඩුව ආදි පද නර්තනයේ දී මහනුවර පාරම්පරික නර්තන ශිල්පීන් හා වාදන ශිල්පීන් රිද්මය පිළිබඳ ව අවධානය පළමු කොටත්, දෙවෙනියට තිත පිළිබඳ ව අවධානය යොමු කරනු ලබන බව හඳුනාගත හැකි ය. හත් පදය, දුනුමාලප්පුව, කොල්පාඩුව පූජාර්ථය මුල්කරගත්, තේවා පිණිස නර්තනයේ යෙදෙන පද කොටස් ලෙස පාරම්පරික නර්තන ශිල්පින් කොහොඹා කංකාරිය තුළ භාවිත කරයි. නමුත් උසස් අධ්‍යාපන ආයතන මගින් පවත්වන උපාධි හෝ වෙනත් පාඨමාලාවන් සඳහා ඉගැන්වෙන මෙම තේවා පද ඒකී මුඛ්‍ය අරමුණින් බැහැර ව තිත පිළිබඳ ව අවධානය යොමු කරමින් හා තිත හා ලය හුරුවීම සඳහා පමණක් මෙම නර්තනාංග භාවිත කරන බව හඳුනාගත් ප්‍රධාන ගැටලුව යි. රිද්මය යනු විශ්වයේ සෑම නිමැයුමක ම අන්තර්ගත මූලික ලක්ෂණයකි. දේශීය නර්තන ශිලිපීන් රිද්මය සැලකුවේ ලෝකෝත්තර ස්වභාවයක් පවතින්නක් ලෙස ය. කොතල පදයෙන් ජලයේ රිද්මය, සළු පදයෙන් සළුවේ රිද්මය, දුම්මල පදය දුම්මල හා දුමේ රිද්මය ආදි සිද්ධාන්තයට මූලිකත්ව දෙමින් රිද්මය හා තිත ප්‍රායෝගික ව නර්තනයේ දී භාවිත වන ආකාරය පෙන්වා දීම මෙම පර්යේෂණයේ වැදගත්කම යි. මෙම පර්යේෂණයෙන් ලද දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීම මගින් කොහොඹා කංකාරියේ තේවා පද නර්තනයේ දී තිත නො ව රිද්මය මූලික ව නර්තන කරන බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *කොහොඹා කංකාරිය, මහනුවර ශෛලිය, රිද්මය, තිත, තේවාපද*

# FOLK LANGUAGE

# අර්ථාන්විත ධර්ම සන්නිවේදනයක් සඳහා අක්ෂර ප්‍රභේදයන්ගේ බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ගිරාඹේ ධම්මරුචි* හිමි සහ ඩී. ජී. ඒ. කේ. කුමාරි

රුහුණු විශ්වවිද්‍යාලය

*girambedhammaruchi@gmail.com

බුදුන්වහන්සේ තම ශ්‍රාවකයන්ට ධර්ම සන්නිවේදනයේ දි අනුගමනය කළ යුතු කරුණු රාශියක් අවධාරණය කොට ඇත. එහි දී භාෂා භාවිතය සඳහා දුන් උපදෙස් අතර "සාත්‍ථ" යන ක්‍රමවේදය ඉතාම වැදගත් වේ. මෙහි දී සාත්‍ථ යනුවෙන් හැඳින්වෙන්නේ අර්ථමූලිකභාවය යි. සන්නිවේදනයේ දී අර්ථමූලිකභාවය ඉතා ම වැදගත් වේ. "ධම්මපදයේ දී සහස්සම්පි චෙ ගාථා අනත්තපද සංහිතා එකං අත්ථ පදං සෙය්‍යො යං සුත්වා උපසම්මති" අනර්ථවත් පද දහසක් කීමට වඩා අර්ථවත් එක් පදයක් කීම උතුම් බව අවධාරණය කොට ඇත. පදයකට අර්ථයක් ගෙන ඒමට බලපාන ප්‍රධාන අංගය වන්නේ අක්ෂරය යි. අක්ෂරයන්ගේ දැනුම ධර්ම සන්නිවේදනයේ දී ඉතා ම වැදගත් වේ. බුදුන් වහන්සේ එහි පරිපූර්ණත්වයට පැමිණි සිටි බව ("සාක්ඛරප්පභෙදානං" අක්ෂර ප්‍රභේද හා පද, පාඨ වාග් විද්‍යාත්මක linguistic දැනුමෙන් යුක්ත වූ බව) යන පාඨයෙන් අනාවරණය වේ. මෙම දැනුමෙන් තොර වූ පුද්ගලයාට අර්ථාන්විත ව ධර්මය සන්නිවේදනය කළ නො හැකි ය. උදාහරණයක් ලෙස "නිබ්බාණං පරමං සුඛං" යන පාඨයෙහි "සුඛං" යන්නෙහි අර්ථය සැප ය යන්න යි. "නිබ්බාණං පරමං සුබං" මෙහි "සුබ" යනු ගිරවා යන අර්ථය යි. "සොත්‍ථි තෙ හොතු සබ්බදා" මෙහි "සොත්‍ථි" යනු යහපතක් යන අර්ථය යි. "සොත්ති තෙ හොතු සබ්බදා" මෙහි "සොත්ති" යනු අතුගාන කොස්ස යන අර්ථය යි. ගාථා උච්චාරණයේ දී හා ලිඛිත භාෂාවේ දි මෙවැනි දෝෂයන් බහුල ලෙස දැකිය හැකි ය. එහි දී ලිඛිත භාෂාව ප්‍රධාන වේ. මෙම පර්යේෂණයෙහි ගැටලුව වන්නේ නූතන සමාජයෙහි බොහෝ ධර්ම දේශකයින් හා ධර්ම ග්‍රන්ථ රචකයින් අක්ෂර ප්‍රභේදයකින් තොර ව ධර්ම සන්නිවේදනය කිරීම යි. ධර්මය සන්නිවේදනය කිරීමේ දී අර්ථමූලිකභාවය ඉතා ම වැදගත් වන බව අනාවරණය කොට සමාජගත කිරීම මෙහි මුඛ්‍ය අරමුණ යි. සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයන ක්‍රමවේද මෙහි දී යෙදා ගනු ලැබූ අතර, එහි දී ප්‍රාථමික මූලාශ්‍රයක් වන ත්‍රිපිටක සාහිත්‍යයට මූලිකත්වයක් ලබා දෙමින් ඓතිහාසික මූලාශ්‍රය යටතේ පර්යේෂණය සිදු කරන ලදි. පර්යේෂණය අවසානයේ දී නිගමනය කරන ලද්දේ අක්ෂර ප්‍රභේදයන් නිසි ලෙස භාවිත කිරීම තුළින් අර්ථමූලික වූ හා සාර්ථක වූ ධර්ම සන්නිවේදනයක් ගොඩනගාගත හැකි බව යි. එය ධර්මයෙහි සුරක්ෂිතභාවයට සෘජු ලෙස ම බලපානු ලබයි. නූතන සමාජය තුළ දැකිය හැකි අවාසනාවන්ත සිදුවීමක් ලෙස ධර්මය විකෘති කර දැක්වීම පෙන්වා දිය හැකි ය. අක්ෂරයන්ගේ අවභාවිතය එහි දී කැපී පෙනෙන ලක්ෂණයකි. සුභාවිත වූ අක්ෂර ප්‍රභේදයන්ගේ භාවිතයෙන් පමණක් අර්ථාන්විත ධර්ම සන්නිවේදනයක් ගොඩනැගෙන බව තහවුරු වීම මින් ලැබෙන ප්‍රතිඵලය යි.

***ප්‍රමුඛ පද:*** *අක්ෂර, අර්ථාන්විත, ධර්මය, ප්‍රභේද, සන්නිවේදනය*

# The Lotus: Analysis of The Intercultural Communication Implications

A. Lokumanange

Department of Mass Media, Sri Palee Campus, University of Colombo

*amila@spc.cmb.ac.lk*

This Study Analyzed, intercultural communication implication of the lotus. Intercultural communication is directly related to the socio-cultural anthropology; the holistic study of humanity. Anthropologists argue that culture and established areas of communication refer to the process of exchanging information, usually via a common system of symbols. Human being has evolved a universal capacity to conceive of the world symbolically, to teach and learn such symbols socially, and to transform the world based on such symbols. Symbols try to convey something that belongs to the unconscious, the unchartered world, clearly to the conscious. Lotus has its roots in the dirt, and its stem grows out of the water surface. Objectives of this research were to study the symbolic meaning of the lotus according to the culture and to study the intercultural communication implications of the lotus flower. Research was conducted based on primary and secondary sources related to cultural symbols. The research structure was formulated to enable an analysis of lotus symbol, covering background and symbolic meaning according to different cultures. As the lotus flower looks so clean and pure when it compared with the environment that it is grown it has been used to represent purity and beauty. The lotus is one of the eight auspicious symbols of Buddhism. Color of a lotus conveys a particular meaning and it represent cosmic of harmony. Lots of Hindu deities are sitting on a Lotus. Symbols deliver meanings and power to people. Symbols present not only the representative meanings but also the power within. Symbols play the role as a bridge that connects the two separate dimensions. In other words, symbols connect the unknown and known, and the conscious and unconscious. The language of symbols is a visual, poetic language with many layers of meanings and depth. It can be changed by country to country. It inspires us to understand cultural values and beliefs by their own meaning of symbols through intercultural communication.

***Keywords:*** *Intercultural communication, Symbol, Lotus, Culture*

# බිබිල ප්‍රාදේශීය ජන වහරේ භාෂා මාධ්‍යය පිළිබඳ අධ්‍යයනයක්

දිවුලපැලැස්සේ රතන වංශ හිමි

සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

*vendrathanawansha@gmail.com*

ඌව පළාතේ බදුල්ල මොනරාගල ජනතාව භාවිත කරන උපභාෂාව ඌව ජන වහර ලෙස හඳුනාගත හැකි ය. එම භාෂාව වෙනස් ම මුහුණුවරක් ගෙන තිබීම සුවිශේෂී ය. එය පිරිසිදු හෙළ භාෂාවක් බව විද්වතුන්ගේ මතය යි. ඌව පළාතේ බිබිල ජනතාවගේ ප්‍රාදේශීය ජන වහරේ ඇති විශේෂතා පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ යි. එය ශුද්ධ හෙළ භාෂාවේ ප්‍රවේණික වචන ම ද යන්න අධ්‍යයනය කිරීම පර්යේෂණ ගැටලුව ලෙස තබා ගතිමි. ග්‍රන්ථ සන්දාරයෙන් හා ක්ෂේත්‍ර අධ්‍යයන යන විධික්‍රම ඔස්සේ දත්ත සම්පීඩනය කරන ලදි. ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූ ගොවිතැන සම්බන්ධ වචන, ළමා-ළපටින් සතුන් හඳුන්වන නම්, පුද්ගල නාම හා විවිධ කාර්යයන්හි දී භාවිත කරන වචන ද අනෙකුත් පළාත්වල වහරන බසට වඩා වෙනස්කම් දැකිය හැකි ය. බිබිල ප්‍රාදේශීය උපභාෂාවේ ප්‍රශ්නාර්ථයේ දී භාවිත කරන "ද" යන නිපාතය ඔවුන් තුළ භාවිතයේ නොමැත. කොහේ ගියා ද? යන පැනය බිබිලේ වැසියන් අසනු ලබන්නේ කොහේ ගියා? යනුවෙනි. මීට අමතර ව ඌවේ වැසියන් භාෂා ව්‍යවහාරයේ දී ගෞරවාර්ථ යෙදුමක් ලෙස "එහෙමයි" යන පදය භාවිත කරනු ලැබේ. උදා: ලෙස කෑවා එහෙමයි, නෑවා එහෙමයි, වැඩේ ඉවර කරා එහෙමයි යනුවෙනි. ප්‍රාදේශීය භාෂාවක් වශයෙන් ඔවුන්ට ආවේණික වචන මාලාවක් දැකිය හැකි ය. මාංගුව (මාරුව) කාන්සිය (පාළුව) ගදල්ගොඩ (කැලෑ රොඩු ගොඩ) අනෝරාව (නොකඩවා වැස්ස) සංකාන්සිය (සැක සහිත) පත බානවා, (ගහනවා) බුඩා (මහලු මනුස්සයා) බුඩී (මහලු කාන්තාව) අහක් වෙලා (අමනාප වෙලා) පනික්කියා (බෙර වයන්නා) පුන්නනවා (නිදි කරනවා) කුට්ටනවා (සූරනවා) වැනි වචන ඔවුන්ගේ භාෂාව තුළ දැකිය හැකි ය. කාලයක් ඉංග්‍රීසීන්ගේ පාලනය පැවති අතර ඒ ආභාසයෙන් පැමිණිය වචන මාලාවකුත් හමුවේ. බාබරයා (කොණ්ඩේ කපන්නා) මැනේජරයා (සමූපකාරයේ ප්‍රධානියා) දොස්තරයා (වෛද්‍යවරයා) කොන්දොස්තරයා (බසයේ ටිකට් කඩන්නා) චීප් කලාක් (ලොකු ලියන මහතා) මීට අමතර ව ඉංග්‍රීසි නම් දරන අය ද සිටිති. ජේම්ස්, කරලිනා, සිඤ්ඤෝ, සොලමන්, කරෝලිස්, යන්න උදාහරණ කිහිපයකි. වැදි භාෂාවේ ආභාසයෙන් ආ වචන ද දැකිය හැකි ය. කැකුළා, කැකුළි, වැතිරෙනවා, කොටාබානවා, බාවනවා, නාඩා ඉදින්, දොඩවනවා යනාදිය යි. මීට අමතර ව දෙමළ ජනතාවගේ සම්භවයෙන් ආ වචන ද අසන්නට ලැබේ. සිරික්කලේ, කායම, සංතෝසේ, අම්මම්මා වැනි වදන් එම භාෂාවෙන් සම්මිශ්‍රණය වූ ඒවා යි. මේ අනුව බලන කල්හි බිබිල ප්‍රාදේශීය ජන වහර තුළ පිරිසුදු හෙළ වදන් ලෙස "ද" කාර්ථය රහිත ප්‍රශ්න විමසීම හා එහෙමයි යනුවෙන් ක්‍රියාපදයක් අවසානේ ගෞරවාර්ථ පදයක් යෙදීම, කාන්සිය, මාංගුව, අහක්වෙලා, බුඩා, බුඩී වැනී එම ප්‍රදේශයට ම ආවේණික වචන මාලවක් දැකිය හැකි මුත් ඉංග්‍රීසි, දෙමළ හා වැදි භාෂාවන්ගෙන් සම්මිශ්‍රණය වී පැමිණි වචනාවලියක් ද දැකිය හැකි වීම මෙම උපභාෂාවේ සුවිශේෂිතාවයකි.

***ප්‍රමුඛ පද:*** *ජන වහර, උපභාෂා, බිබිල ප්‍රාදේශීය වහර*

# ගසක් සමඟ බසක්: දුම්කොළ කර්මාන්තය ආශ්‍රිත ව භාවිත වන භාෂාව පිළිබඳ සමාජ-මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

එම්. එච්. ඩබ්ලිව්. ප්‍රනාන්දු

සමාජ විද්‍යා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

*haßhanifernando58@gmail.com*

භාෂාවක් යනු යම් සමාජයක ප්‍රජා ජීවිතය හා බැඳි වැදගත් අංගයකි. පොදු ජන සමාජයක භාවිත වන භාෂාවට අමතර ව සුවිශේෂී පුද්ගල කණ්ඩායම්වලට ආවේණික උපසංස්කෘතික අංගයක් වශයෙන් හැඳින්විය හැකි උපවහරවල් ද සමහර සමාජ අවකාශයන්හි වැදගත් තැනක් උසුලයි. ලාංකේය සමාජ මානව විද්‍යා අධ්‍යයනයන්හි උපසංස්කෘතික අනන්‍යතා පිළිබඳ ප්‍රමුඛ අවධානයක් ලබා දී තිබුණ ද මෙතෙක් අවධානයට යොමු නො වූ වැදගත් පැතිකඩක් ලෙස මෙම තේමාව හඳුනාගත හැකි ය. එනිසා ම ශාස්ත්‍රීය වශයෙන් පවතින පරතරය හේතුවෙන් උපසංස්කෘතික භාෂාව පිළිබඳ සිදු කළ මෙම ගුණාත්මක අධ්‍යයනය ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වේ. මෙම පර්යේෂණයෙහි මූලික අරමුණ වන්නේ වාණිජ භෝගයක් වන දුම්කොළ භෝගය හා බැඳි භාෂාව සමාජ මානව විද්‍යාත්මක ව ගවේෂණය කිරීම යි. එම ප්‍රධාන අරමුණට අදාළ ව දුම්කොළ කර්මාන්තය හා බැඳි භාෂාවේ ඇති සුවිශේෂිතා කුමනාකාර ද යන පර්යේෂණ ගැටලුව මූලික කොටගෙන මෙම පර්යේෂණය සිදු කරන ලදි. එහි දී නියැදිය වශයෙන් දුම්කොළ කර්මාන්තය ආශ්‍රිත ඍජු හා වක්‍ර රැකියාවල නිරත වන ස්ත්‍රී සහ පුරුෂ ප්‍රතිචාරිකයින් 50 දෙනෙකු සසම්භාවී නො වන නියැදි ක්‍රමවල එන අරමුණු සහගත නියැදි ක්‍රමය යටතේ තෝරා ගන්නා ලදි. ගුණාත්මක ක්‍රමවේදයක් මත පදනම් වූ මෙම පර්යේෂණයෙහි දත්ත රැස් කිරීම සඳහා ගැඹුරු සම්මුඛ සාකච්ඡා ශිල්පක්‍රමය සහ නිරීක්ෂණය භාවිත විය. පූර්ව අස්වනු අවධිය, අස්වනු අවධිය සහ පසු අස්වනු අවධිය යන ප්‍රධාන තේමා ඔස්සේ ලබාගත් දත්ත විශ්ලේෂණය හරහා පර්යේෂණ සොයාගැනීම්වලින් විශද වන්නේ දුම්කොළ කර්මාන්තය ආශ්‍රිත ව ගොඩනැගී ඇති මෙම උපවහර වාග්විද්‍යාවේ හඳුන්වන, සම්බන්ධතා සනත්වයක්, ලෙස හඳුනාගත හැකි අතර ම එය භාෂාවේ ඇති පරිමිත ස්වරූපයක් ද වන බව ය. කර්මාන්තය ආශ්‍රිත ව භාවිත ය. එවැනි පද සමහරක් නම් අලගු, ඉස්මුර, කඳමුර, කන්ජල්, සුදුවා, කොත්තු, ආදිය යි. ප්‍රජා අනන්‍යතාව පවත්වාගෙන යන සංරචකයක් ලෙස එම භාෂාව වැදගත් කෘත්‍යයක් ඉටු කරන අතර ම එය අදාළ ප්‍රජාවගේ ජන ජීවිතය හා කර්මාන්තය සමඟ තදානුබද්ධ ය. අදාළ උපවහර තුළ භාවිත වන සුවිශේෂී වචනවල අර්ථය හා එම අර්ථය ප්‍රතිනිෂ්පාදනය වන අවකාශය පිළිබඳ පර්යේෂණ සොයාගැනීම් හරහා විද්‍යමාන වන්නේ මතුපිටින් බලන කල එම අර්ථයන් නිෂ්පාදනය අදාළ උපසංස්කෘතික අවකාශය වෙතින් පෝෂණය වූව ද එය අවියෝජනීය ආකාරයෙන් මහා සමාජය හා බද්ධ ව පවතින බව යි. සමස්තයක් ලෙස ගත් කල දුම්කොළ කර්මාන්තය හා බැඳි වටිනාකම් දාමය තුළ විවිධ අයුරින් නිෂ්පන්න මෙම භාෂාව එම සමාජ දේහය, ජනතාව සහ කර්මාන්තයෙහි අනන්‍යතාව හැඩගැස්වීමෙහි ලා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන බව පර්යේෂණ සොයාගැනීම් මඟින් තහවුරු වෙයි.

***ප්‍රමුඛ පද:*** *දුම්කොළ කර්මාන්තය, උපවහර, උපසංස්කෘතිය, ප්‍රජා අනන්‍යතාව, ප්‍රතිනිෂ්පාදනය*

# සිංහල ග්‍රාමනාමකරණයේ සංස්කෘතික සාක්ෂරතාව; කොළොන්න කෝරළයේ ග්‍රාමනාම ආශ්‍රිත අධ්‍යයනයක්

කේ. ලංකාමුල්ල* සහ ජී. ඒ. එච්. විරංග

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*klankamulla@sjp.ac.lk

මානවයා විසින් කරනු ලබන භූමි නාමකරණ ක්‍රියාවලිය ග්‍රාමනාමකරණය නම් වේ. සිංහල ග්‍රාම නාමකරණයේ දී, කොළොන්න කෝරළයේ මානවයා සංස්කෘතික සාක්ෂරතාවෙන් යුතු එළඹුමක් අනුගමනය කොට තිබෙන්නේ ද යන්න පර්යේෂණ ගැටලුව සේ සලකා සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න කෝරළය ආශ්‍රයෙන් මෙම පර්යේෂණය සිදුකරන ලදි. මානව සංස්කෘතිය විමර්ශනය කිරීමේ සුවිශේෂ ධාරාවක් වශයෙන් සංස්කෘතික සාක්ෂරතාව හැඳින්වේ. භූගෝලීය සංස්කෘතිය ගොඩනැගීමේ දී ග්‍රාමනාමකරණය අතිශය වැදගත් වේ. සංස්කෘතියේ පදනම භූගෝලීය සාධකය මත ස්ථාපිත වෙයි. භූගෝලීය සාධකය භාෂාව පාදක කොට ස්ථාන, ප්‍රදේශ සංඥාකරණය කරයි. එය වාග්විද්‍යා - සංස්කෘතික ක්‍රියාවලියක් වන අතර දීර්ඝ විකාශන ක්‍රියාදාමයක ප්‍රතිඵලයකි. කොළොන්න කෝරළයේ මානවයා විසින් භූගෝලීය සාධක හා බැඳුණු මානව ක්‍රියා, විවිධ වෘත්තීන් ආදි සමාජීය, සංස්කෘතික හේතු පාදක කොට ගෙන සිංහල ග්‍රාමනාමකරණයේ යෙදී තිබේ. එයින් සංස්කෘතියේ විවිධත්වය, සංස්කෘතික වටිනාකම් සමාජයට අන්තර්ග්‍රහණය විය. මිනිස් සංස්කෘතිය ගොඩනැගී තිබෙන්නේ සංස්කෘතික ක්ෂේත්‍ර පද්ධතියක් මත ය. එම ක්ෂේත්‍ර පද්ධතියේ විශේෂ උපයෝගී වටිනාකමක් ග්‍රාමනාමකරණයට හිමි වෙයි. අන්තර්සංස්කෘතික හුවමාරුව මානවයා තුළ සිදුවීමේ දී ග්‍රාමනාම විශේෂ සංස්කෘතික පද්ධතියක් වශයෙන් ගැනේ. මානව සමූහයක අන්තර්සංස්කෘතික විඥානය සංස්කෘතික සාක්ෂරතාවක් සහිත ග්‍රාමනාමකරණයකට හේතු වේ. එසේ ම මානවයා විසින් සංස්කෘතිය පවරාදීමේ ක්‍රියාවලියේ දී ද සංස්කෘතික සාක්ෂරතාවෙන් යුතු ග්‍රාමනාම වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. සංස්කෘතිය භූගෝලීය වශයෙන් අනන්‍ය ආකාරය හඳුනාගැනීමට ද සංස්කෘතිය ඉගැන්වීමේ විධිමත් හා අවිධිමත් ක්‍රියාවලියට ද ග්‍රාමනාම පදනම ඉවහල් කරගත හැකි ය. මිනිසාගේ මානව වටිනාකම් සහ ක්‍රියාකාරකම් ප්‍රධානත්වයේ ලා සැලකිය හැකි ග්‍රාමනාම විශේෂයෙන් වැදගත් වේ. ග්‍රාමනාමකරණය කිරීමේ ලා ප්‍රධාන වශයෙන් වැදගත් වන සංස්කෘතික සාක්ෂරතාව පුද්ගලයා ඓතිහාසික ඉගෙනුම් පදනම් ඔස්සේ ලබාගත් දැනුම් සම්භාරය වේ. සමාන්තර සංස්කෘතියක සංස්කෘතික විවිධත්වය ගළපා ගැනීමට හා සමාජ ප්‍රතිරූපය ගොඩනගා ගැනීමට අත්‍යවශ්‍ය සාධකයක් වශයෙන් සංස්කෘතික සාක්ෂරතාව මගින් ග්‍රාමනාමකරණය කිරීම දැක්විය හැකි ය. මේ අනුව කොළොන්න කෝරළයේ සංස්කෘතික ක්ෂේත්‍ර පද්ධතියෙහි ග්‍රාමනාම විශේෂ වැදගත්කමකින් යුතු ය. එම බොහෝ නාම සංස්කෘතික වශයෙන් නිර්මාණාත්මකය. එම නාමයනට සංස්කෘතික පදනමක් තිබේ. කොළොන්න කෝරළයේ බොහෝ ග්‍රාමනාමවලින් මෙකරුණ පැහැදිලි වෙයි. නිදසුන් වශයෙන් නවන්දණ්ඩේල හීන්පැන්පොලොත්තආර, පැනිවැල්පොට, කුරුම්ණිදඹේ, කණපැදිආරේ, නැම්කෝමේ, මීරන්කඩුව ආදි නාම දැක්විය හැකි ය. එම ග්‍රාමනාම සංස්කෘතික සාක්ෂරතාවෙන් යුතු වූ බැවින් විශ්ලේෂණයට හැකියාව තිබේ. ග්‍රාම නාමකරණයට බහු පුද්ගල වූත් අවිධිමත් වූත් සාක්ෂරතාවක් අවශ්‍ය බව මෙම පර්යේෂණයෙන් පැහැදිලි විය. කොළොන්න කෝරළයේ ග්‍රාමනාම නූතනකරණය සමග නො කිලිටි වූ හා සංස්කෘතික සාක්ෂරතාව රැකුණු ග්‍රාමනාම පද්ධතියක් ලෙස හැඳින්විය හැකි බව පැහැදිලි ය.

**ප්‍රමුඛ පද:** *ග්‍රාමනාමකරණය, සංස්කෘතික සාක්ෂරතාව, කොළොන්න කෝරළය*

# FOLK LIFE & CULTURE

# The Possibilities of Structural Peace Through Cultural Tourism in Sri Lanka (A Case study on the '*Kuthandi'* Community, Anuradhapura, *Ikiriwawa*, Sri Lanka)

D. L. A. H. Shammika[1*] and H. M. R. P. Wijerathna

[1]Department of Public policy, Faculty of Humanities and Social Science, University of Ruhuna, [2]National Institute of Technology-Tangalle

**rpwijerathna@gmail.com*

'Kuthandi' a minority ethnic community in Sri Lanka who finds their living by snake charming, taming monkeies for performing and fortune telling. The specific '*Kuthandi'* group subjected to this research lives in Anuradhapura, Ikiriwawa. As a minority ethnic group their political, cultural, social, and economic position in the macro society is a critical issue in the view of their peaceful co-existence. The objective of this study was to explore their livelihoods, intra and inter relationships, socio-economic stability to find possibilities of structural peace through cultural tourism. Case study approach was applied utilizing in-depth and semi-structured interviews and observation methods. As a minority ethnic group as well as a migrated community *'Kuthandi'* people face many challenges that has threaten their peaceful cohabitation. Lack of power to represent them as a complex human being and to contest the negative stereotypes have been identified as central cultural problems that hinders peace. How far does the assimilation and homogenization of *'Kuthandi'* people obliterate differences and enable them to build a positive image is a matter of question. This study found that the process of assimilation has begun as a mean of finding livelihood opportunities and formal education. In the assimilation process *'Kuthandi'* is losing their own cultural and social specificities. This involves socio-political reasons that consider *'Kuthandi'* community as a marginalized group from the lowest end of caste system and ethnic categorization. Cultural tourism covers not just the consumption of the cultural products of the past, but also of contemporary culture, or the 'way of life' of a people or region. In other words, cultural tourism embeds both 'heritage tourism' (artifacts of the past) and 'arts tourism' (contemporary cultural production). From the research it have been revealed that there are multiple dimensions of social empowerment such as increased community cohesion, economic gain, enhanced pride in cultural traditions and inward flow of knowledge and new world views that can be brought in to the *'Kuthandi'* community to enhance structural peace.

***Keywords:*** *Case study, Cultural Tourism, Kuthandi, Structural Peace, Ethnicity*

# මහනුවර යුගයේ විහාර බිතුසිතුවම් සඳහා භාවිත කර ඇති වස්ත්‍රාභරණ තුළින් අනාවරණය වන සමකාලීන සමාජය (මහනුවර සිතුවම් සම්ප්‍රදායට අයත් තෝරාගත් විහාර කිහිපයක් ඇසුරින්)

එල්. ඩී. එම්. ප්‍රේමරත්න,[1*] එම්. නිශාන්ති[2] සහ එන්. එම්. පී. නෙත්තසිංහ[3]

[1,2]ප්‍රධාන පුස්තකාලය, [3]ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*mayurap@sjp.ac.lk

ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මෙරට පැවති බිතුසිතුවම් කලාව ක්‍රි. පූ. 03 වන සියවසේ සංඝමිත්තාගමනය, ශ්‍රී මහ බෝධිය වැඩමවීමත් සමඟ පැමිණි අටලොස් කුලයක (සිත්තර ඇතුළු ව) ශිල්ප ශ්‍රේණි නිසා ක්‍රමයෙන් විකාශනය වූ බව නොරහසකි. එම කලාව පාරම්පරික ගති ලක්ෂණ සමඟින් මහනුවර යුගය වන විට සුවිශේෂී ලෙස ඉස්මතු විය. විනය පිටකයේ චුල්ලවග්ගපාලියේ සඳහන් අයුරින් විහාරාරාමවල බිත්ති සුදු, ගුරු පැහැයෙන් වර්ණ ගැන්වීමට භික්ෂූන්ට අවසර තිබුණත් මානව රූප ඇඳීමට තහනම් විය. දුටුගැමුණු, පළමුවන පරාක්‍රමබාහු ආදි රාජකීයන් සම්බන්ධ පුරාවෘත්ත, විසුද්ධිමාර්ගය මෙන් ම වංශකතා ආදියෙහි ද බිතුසිතුවම් කලාව ගැන සඳහන් වේ. 17 වන සියවසෙහි මුල මහනුවර රාජධානියක් ලෙස බිහිවීම හා අවසන් සිංහල රජ කීර්ති ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රාජාභිෂේකය තෙක් (18 වන සියවස) විවිධ හැලහැප්පීම් මැදින් මහනුවර රාජධානිය විකාශනය විය. 1747 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජවන බවත් වැලිවිට සරණංකර හිමිගේ උපදෙස් ඔහු අනුගමනය කළ බවත් මූලාශ්‍රවල සඳහන් වේ. එම නිසා මෙම බිතුසිතුවම් විවිධ සමාජ විපරිණාමයන්ට ලක් වීම හා විවිධ සිත්තර අනන්‍යතා ලක්ෂණ පිළිබිඹු කිරීම ද විශේෂත්වයකි. මෙලෙස විකාශනය වූ මහනුවර යුගයේ, සමකාලීන සමාජයේ පැවති උස් පහත් භේදය විහාර බිතුසිතුවම් තුළින් නිරූපණය කිරීමට ශිල්පියා සමත් වී තිබේ ද? යන්න ගැටලුව වූ අතර එම බිතුසිතුවම්වල වස්ත්‍රාභරණ මඟින් නිරූපිත සමකාලීන සමාජ තොරතුරු අධ්‍යයනය කිරීම අරමුණ විය. ප්‍රාථමික, ද්විතීයික මූලාශ්‍ර භාවිත කරමින් හා බිතුසිතුවම් සහිත විහාර ස්ථානීය නිරීක්ෂණයන්ට ලක් කරමින් සිතුවම් පිළිබඳ ව අධ්‍යයනය කරන ලද අතර නුවර යුගයේ පහතරට හා උඩරට ශෛලියට අයත් විහාර බිතුසිතුවම් අතරින් මැදවල, සූරියගොඩ, කැලණිය, තෙල්වත්ත, දෙගල්දොරුව යන විහාරවලට අයත් සිතුවම් මෙහි දී අධ්‍යයනය කරන ලදි. එහි දී මහනුවර යුගයේ සුවිශේෂී පාරම්පරික සිත්තරා සමකාලීන සමාජයේ භාවිත වස්ත්‍රාභරණ බිතුසිතුවම්වල අන්තර්ගත චරිත සඳහා යොදා ගෙන තිබෙන බව සිතුවම් නිරීක්ෂණයේ දී පැහැදිලි විය. එම චරිත මඟින් ද සමකාලීන සමාජය නිරූපණය වන බව ද ගම්‍ය වේ. නො දුටු චරිතවලට පවා සමකාලීන සමාජයේ පැවති වස්ත්‍රාභරණ යොදා ගැනීම මඟින් ඒ බව මනා ව පැහැදිලි වේ. ඒ සඳහා මහනුවර යුගයේ දැඩි ව පැවති සමාජ උස්-පහත් බව ද හේතු වී ඇත. සුවිශේෂී ප්‍රකාශන මාධ්‍යයක් ලෙස යොදා ගත් බිතුසිතුවම් තුළට සමකාලීන සමාජයේ භාවිත වස්ත්‍රාභරණ යෙදීම මඟින් විශේෂ අර්ථ නිරූපණයන් දැක්වීමටත්, සමකාලීන සමාජය මැනවින් නිරූපණය කිරීමටත් ශිල්පියා සමත් වී තිබෙන බව මෙමඟින් නිගමනය විය.

***ප්‍රමුඛ පද:*** *චිත්‍ර ශිල්පීන්, මහනුවර යුගයේ සිතුවම්, වස්ත්‍රාභරණ, වෙහෙර විහාර, සමකාලීන සමාජය*

# Folklife and Culture: The Cultural Change and the Technological Impact

R. N. Fernando

Department of English and Linguistics, University of Sri Jayewardenepura

*ruth.nimna@gmail.com*

Culture is the essence of human beings which characterizes the traditions of a civilization. Folk life and behavior are often defined in relation to culture. Life and culture of the 21st century is a far away from the early human culture, where the primitive man first constructed his way of living and set the preliminary step towards the beginning of the culture. The purpose of this paper was to identify and explore these differences and changes that have been occurred throughout the years, and to identify the reminiscences of the folk life and culture of the primitive man prevailing in the modern folk culture, especially in Sri Lankan context, as well as to investigate the possible reasons for the change, prominently with the arrival of the information and communication technology. This research was an exploration on the perseverance and the resonance of early inherited cultural practices within the modern culture while fostering the idea of 'folk life'. The research has been carried out through observing the way of living of people in few selected local areas such as, Kalutara, Wadduwa, Panadura and Moratuwa and making written ethnographic records on them. As a country with a voluminous ethnic diversity, Sri Lanka's folk life and culture is mainly an exposition of Buddhist ideology with the elements of Indian folk culture dappled hither and thither. Moreover it has always been a problem as to what extent the culture is influenced by the information and communication technology and how it has been able to shape the life and culture, throughout the study it was discovered that, impact of information and communication technology in folk life and culture can be mostly seen in the urban area only, and in the outskirts of the country there are still traditions left where technology had no entry, especially in the religious rituals and customs. It was found that rather than the culture, what has changed are the attitudes and beliefs of man which had eventually led them into acclaiming tradition in a different way. In disputably it could be said that the cultural change in a society is an inevitable factor as it exposed to geological, intellectual, and technological evolution.

***Keywords:*** *Folk Life, Culture, Traditions, Technology, Changes*

# Surprise as the Key Tactic of Kandyan Military Heritage: An Analysis on Portuguese Invasions to Kandyan Kingdom

T. Witharana

General Studies Department, Academic Wing, Sri Lanka Military Academy, Diyatalawa

*thusharawith@gmail.com*

Since there is a shortage of studies in military point of view on the battle tactic of surprise which has displayed by the *Kandyan* Kingdom against Portuguese invasions, that knowledge gap has been taken as the main concern of this research. This exploratory and pure type research was conducted under the deductive thinking mode and qualitative research approach. With the independence of the *Kandyan* Kingdom in 1593 AD, *Kandyans* have tactically allowed the Portuguese invaders to conquer *Senkadagala*. But the Portuguese could not stay there as the *Senkadagala* city was already burnt down by *Kandyans*. On the way back to Colombo, the Portuguese army was ambushed and destroyed by the well-planned surprise attack of *Kandyans* in the mountains of *Danture*. When the Portuguese invaded the *Kandyan* Kingdom for the second time in 1603 AD, about 94% of them were comprised of local lowland Lascar soldiers. The Portuguese had been defeated by a surprise attack which was planned by the *Kandyan* king to separate the Lascar Leaders from the Portuguese. At the next Portuguese invasion in 1630 AD, *Kandyans* demonstrated that they were fleeing in to the *Kandyan* land and let Portuguese to pursue them. Suddenly, *Kandyans* launched a surprise attack on the Portuguese army and the retreating Portuguese army was ambushed and destroyed in *Randeniwela*. Again, the *Senkadagala* city had been allowed to be conquered in the last Portuguese invasion in 1638 AD. Portuguese were trying to escape form *Senkadagala* because Portuguese did not receive the support of King *Vijayapala* of *Matale* as they planned earlier. In *Gannoruwa*, near the *Mahaweli* River, the armies of King *Wijayapala* and King *Rajasingha* II have launched a surprise attack and Portuguese were massacred. The research reveals that the *Kandyan* Army has used surprise, which is combined with its geographic features, as their foremost military tactic to defeat the highly advanced western military knowledge.

***Keywords:*** *Kandyan Battles, Kandyan Kingdom, Portuguese Invasions, Surprise, Tactics*

# මහනුවර යුගයේ ප්‍රදානිත ඉඩකඩම්හි අනාගත ආරක්ෂාව උදෙසා පංචවිධ සපථයෙහි උපයෝගීතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එම්. ඒ. පී. කුමාර

මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*prasadmallawaarachchi85@gmail.com*

මහනුවර යුගයේ ප්‍රදානිත ඉඩකඩම්හි අනාගත ආරක්ෂාව උදෙසා පංචවිධ සපථයෙහි උපයෝගීතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ. මහනුවර රාජධානි සමයේ දී ඉඩකඩම්වල ආරක්ෂාව සඳහා පංචවිධ සපථය මගින් සිදු කළ බලපෑම හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණ විය. මහනුවර රාජධානි සමයෙහි ඉඩකඩම්හි අනාගත ආරක්ෂාව විෂයෙහි පංචවිධ සපථය මගින් සිදු කළ බලපෑම කෙබඳු ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. මෙහි දී අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් පුස්තකාල අධ්‍යයනය සිදු කෙරිණි. 17 වන සියවසේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය, කොළඹ සහ මහනුවර රාජ්‍ය ලේඛනාගාරයන්හි තැන්පතු ලේඛන, යුගයට අදාළ සන්නස්, තුඩපත් හා විදේශිකයන්ගේ වාර්තා, රැසක් අධ්‍යයනයට ලක්කොට ප්‍රස්තුතය විචාරාත්මක ප්‍රවේශයකින් සාකච්ඡාවට බඳුන් කිරීම මෙහි ක්‍රමවේදය වෙයි. සුමංගල ශබ්දකෝෂයට අනුව 'තමන් ප්‍රකාශ කරන ප්‍රකාශයෙහි සත්‍යතාව ප්‍රකාශ කිරීම සඳහා ගරු ගම්භීරාකාරයෙන් ප්‍රකාශයක් කරනවා, සපථ කරනවා, දෙවියන් ආදි අතිමානුෂීය බලයක් ඇත්තෙකු හෝ ශුද්ධ වූ වස්තුවක්, ස්ථානයක් දෙස් වශයෙන් තබා කරනු ලබන සත්‍ය ප්‍රකාශනය' දිව්රීම වශයෙන් දක්වා තිබේ. විශේෂයෙන් මහනුවර යුගයේ දිවි සීට්ටුවල තුන්වනු ව ම දිවිනැත, දිව්පහේ දිව්රන මාට දිවි නැත' යනා දී කියමන් දක්නට ලැබීමෙන් මෙම දිව්රීමේ සමාජගත බලපෑම පිළිබඳ ව අදහසක් ගොඩනගා ගත හැකි ය. මහනුවර යුගය වන විට ප්‍රධාන දිව්රීම් ක්‍රම පහක් දක්නට ලැබුන අතර උණු තෙලෙහි දිව්රීම, පුවක් ගොබ මගින් දිව්රීම, වී මගින් දිව්රීම, පොළොවට ගැසීමෙන් හෝ මඩ වතුර ඉසීමෙන් දිව්රීම හා'පොල්ගෙඩියේ දිව්රුම එම පංචවිධ දිව්රුම් ක්‍රම ය. ක්‍රි.ව. 1735 ටිකිරි අප්පු විසින් තමා භුක්ති විඳි ඉඩම් පරම්පරා භුක්තියට හිමිවන ලෙස කංකානමට පැවරීමේ දී දක්වා තිබෙන අදහස පංචවිධ දිව්රීම සම්බන්ධයෙන් විශේෂ වේ. "කංකානමට හෝ ඔහුගෙන් උරුමය ලබන්නා වූ යම් අයෙකු හට යම් අයෙකු විසින් අභියෝග කළහොත් හෝ තරග කළහොත් හෝ විරුද්ධ වුවහොත් හෝ රට ආරවුල් වියවුල් කළහොත් හෝ ඔවුන් හට මෙම පංචවිධ දිව්රුම් ප්‍රකාශවල අනිෂ්ඨ ඵල-විපාකයන් ඔවුන් වෙත පලදේවා....", ක්‍රි.ව. 1780 දී සමරතුංග පවුලේ ස්ත්‍රියක වන පුංචි එතනා විසින් අත්තරගම ස්ත්‍රියකට කරනු ලබන ඉඩම් ප්‍රදානයේ දී ද අත්තරගම උන්නාන්සේ පංචවිධ දිවුරීම සිදු කළ ද ඇයට සාප නො වන්නේ ඉඩමේ නිත්‍යානුකූල හිමිකම ඇය සන්තකයේ පවතින නිසා යැයි ප්‍රකාශ වී තිබේ. එනිසා මහනුවර යුගයේ දී ඉඩකඩම්හි අනාගත ආරක්ෂාව පංචවිධ දිව්රුම් ක්‍රම මත පිහිටා සුරක්ෂිත කරගත් අයුරු මනාව පැහැදිලි වේ.

***ප්‍රමුඛ පදඃ*** *සපථය, විනිශ්චය, අදෘශ්‍යමාන, දිව්රීම, දිවි සීට්ටු*

# මාතෘ මූලික වැදි සමාජ සංවිධාන තුළ වැදි කාන්තාවගෙන් කුටුම්බ ආර්ථිකය සම්බන්ධයෙන් පැවති සහයෝගීතාව සහ එහි කාලානුරූප විචල්‍යතා

එස්. ඩබ්ලිව්. පී. කුමාර* සහ ඒ. එන්. රේණුකා

පර්යේෂණ අංශය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

*swpkumara84@gmail.com

සාම්ප්‍රදායික වැදි සමාජ සංවිධානයේ පවුල් ක්‍රමය තුළ පවුලේ ප්‍රධානියා පියා වුවත් වැදි සමාජය මාතෘ මූලික සමාජ ක්‍රමයක් විය. එම සමාජ ක්‍රමයේ පවුල තුළ වැදි කාන්තාව ඉටු කළ කාර්යයන් අතර දරුවන් රැකබලා ගැනීම සහ ආර්ථික සහයෝගීතාව ප්‍රධාන කාර්යයන් විය. පිරිමින් දඩයමේ ගිය විට ස්ත්‍රීන් ළමයි කැටුව අවට ළඳු කැලෑවලට ගොස් අල වර්ග, ගෙඩි වර්ග, කොළ වර්ග සපයා ගෙන ඇත. විශේෂයෙන් ම වැදි ජන සමාජය තුළ අල වර්ග බිදීම කාන්තාවන්ගේ කාර්යභාරයක් ලෙස සලකා ඇති අතර එහි දී ඇය ගෝනල, කටුඅල සහ හිඟුරල වැනි අලවර්ග අවට වන ලැහැබින් සොයා ගන්නා ලදි. සාම්ප්‍රදායික වැදි කුටුම්බ තුළ පැවති වැදි කාන්තාවගේ ආර්ථික සහයෝගීතාවයෙහි කාලානුරූප විචල්‍යතා හඳුනාගැනීමේ මුඛ්‍ය පරමාර්ථයෙන් සිදු කරන ලද මෙම අධ්‍යයනයෙහි පර්යේෂණ ගැටලුව වූයේ වැදි ජන කුටුම්බය තුළ වැදි කාන්තාවගේ ආර්ථික සහයෝගීතාවයෙහි කාලානුරූප විචල්‍යතා මොනවා ද? යන්න යි. මෙම අධ්‍යයනය තුලනාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදු කරන ලද අතර පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස ඌව පළාතේ දඹාන වැදි ජන ගම්මානය තෝරා ගන්නා ලදි. නියැදිය ලෙස එම ගම්මානයෙහි දැනට කුමන හෝ ජීවන මාර්ගයකින් කුටුම්බ ආර්ථිකය සඳහා ශ්‍රම දායකත්වයක් ලබා දෙන වැදි කාන්තාවන් 50 දෙනෙකු අරමුණු සහගත නියැදුම් ක්‍රමය භාවිත කරමින් තෝරා ගන්නා ලදි. වෙනස්වන සමාජ ක්‍රමය තුළ ස්වාභාවික පරිසරය සමඟ සමීප සබඳතා පැවති වැදි ජීවන රටාව ද ක්‍රම ක්‍රමයෙන් පරිවර්තනයට ලක්වනවාත් සමඟ ම කුටුම්බය තුළ වැදි කාන්තාවගේ ආර්ථික සහයෝගීතාව ද ක්‍රමානුකූල ව විචල්‍යතාවට ලක් ව ඇත. වැදි ජනයා කව්පි, ඉරිඟු, කුරක්කන්, මෙනේරි, බතල, මඤ්ඤොක්කා, වට්ටක්කා වැනි බෝග වගාවන්ට යොමු වීමත් නිවස වටා පොල්, දොඩම්, මුරුංගා, අඹ සහ දෙහි ආදි බෝග වගා කිරීමත් සත්ත්ව පාලනය එනම්, කිරි ලබා ගැනීම සඳහා ගව පට්ටි පවත්වාගෙන යාම ආරම්භ වීමත් සමඟ කුටුම්බ තුළ වැදි කාන්තාගේ ආර්ථික සහයෝගීතාව සංකීර්ණත්වයට පත් ව ඇත. වර්තමානයේ වැදි කාන්තාව සිංහල ගොවීන්ගේ හේන්වල කුලීවැඩ කරදීම, සුළු වෙළඳ ව්‍යාපාර පවත්වාගෙන යාම, ඇඟලුම් කම්හල්වල සහ ගෘහ සේවයේ යෙදීම වැනි සාම්ප්‍රදායික නොවන විවිධ වෘත්තීන්වල නියැලෙමින් කුටුම්බයට සිය ආර්ථික සහයෝගීතාව ලබා දෙනු ලැබේ. වෙනස් වන සමාජ ක්‍රමය තුළ වැදි සමාජය ද පරිවර්තනයකට යාම සිදු ව පවතින අතර ජීවනෝපාය මාර්ගයන්ගේ ද නිරන්තර වෙනසක් පවතී. ඒ තුළ වැදි කාන්තාවගේ ආර්ථික සහයෝගීතාව ද වෙනසකට භාජනය වී ඇත. පැවති සාම්ප්‍රදායික වැදි සමාජ සංවිධානය වඩා ඉහළ ශ්‍රම දායකත්වයක් වැදි කාන්තාවගෙන් සිය කුටුම්බ ආර්ථිකය ශක්තිමත් කිරීම කෙරෙහි ලැබෙන බවත් ආර්ථික සහයෝගීතාව ලබාදෙන ජීවන මාර්ගයන් කාලානුරූප ව වෙනස් වී ඇති බවත් නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *මාතෘ මූලික, වැදි කාන්තාව, ආර්ථික සහයෝගීතාව, කාලානුරූප විචල්‍යතා, සාම්ප්‍රදායික*

# Challenges in Protecting the Identity of The Sea Aborigine Community

K. A. D. P. Kaluarachchi

Department of Sociology, University of Ruhuna

*kaluarachchi371@gmail.com*

The process of modernization scientifically describes a society moving from simple to complex. Social change affects the social, economic, political, and cultural aspects of a society. Marine Indigenous community has established settlements along the coast from Trincomalee to Batticaloa in the Eastern Province of Sri Lanka. They have been directly affected by terrorism. The purpose of the study was to study the challenges faced by marine indigenous communities in protecting their identity. *Kanjankalkulam* is a rural area in the town of Wakare in the Batticaloa District of the Eastern Province. 70 families are residing there, 12 were selected under the random sampling method. Interviews focus interviews and observations were used as primary data collection methods. Articles and journals used as secondary data. According to the new laws and regulations, they are not allowed to enter the forest. Traditional occupations such as beekeeping and hunting of animals have been challenged. Pigs, deers and elk are hunted only for self-consumption. They need to be integrated with the modern process of development to meet their needs. Although chena farming is practiced today, there is no water to meet the daily needs. As such, their cultivation is not successful. The nature of government action has been the main factor in transforming the community's life. In particular, the life status of a group of indigenous people is mainly associated with the jungle. Changing past habitat has directly impacted the changing socio-economic and cultural landscape of this community. The development of transport facilities has also enabled the community to work directly with the city. This community has been rendered invincible by the processes of globalization, urbanization, and industrialization. The reason for all these transformations is that these communities have escaped from jungle and established their settlements near the sea. This allows them to easily interact with the city. The new generation of marine indigenous people are reluctant to open their identity to the outside world. When compared to the indigenous community of Dambana one of the major problems facing the sea indigenous community is the lack of support from the government to maintain their identity.

***Keywords:*** *Marine Indigenous, Identity, Urbanization, Development, Community*

# ගිරය හා බැඳි ගැමි සංස්කෘතිය පිළිබඳ විමසුමක්

ඒ. එම්. එන්. කේ. අබේසිංහ

මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*nadeekaabesinghe21@gmail.com*

පැරණි ගැමි ජීවිතයේ ඉතා සුලබ ව භාවිතයට ගත් භාණ්ඩයක් වන "ගිරය" සරල ගෘහීය මෙවලමකි. මෙය කවාකාර හිසකින් ද උඩු අත සහ යටි අත යන දෙඅතින් ම කැපෙන තලය සහිත වූවකි. සාමාන්‍යයෙන් මෙය පුවක් කැපීමට යොදා ගත්ත ද අතීත ගැමි ජීවිතයේ දී එහි විවිධ භාවිතයන් හඳුනාගැනීම සහ ගැමි සංස්කෘතිය තුළ ගිරයේ උපයෝගීතාව කෙබඳු වී ද යන්න අධ්‍යයනය කිරීම මෙහි අරමුණු වේ. සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය, කෞතුකාගාර අධ්‍යයනය මත පදනම් ව දත්ත එක්රැස් කරන ලදි. ගිරය අතීත ගැමි සමාජය හා බැඳී ඇති මෙවලමකි. පැරණි රජ දවස කොට්ටල් බද්දේ ආචාරීන්ගේ ප්‍රධාන රාජකාරි අතර ගිරය තැනීම පැවති බව ආනන්ද කුමාරස්වාමි පෙන්වා දෙයි. විහාරස්ථානවල පැවැත් වූ පුද පූජාවලට ගිරය භාවිත කොට ඇත. අන්තිම කැමති පත්‍රය වෙනුවෙන් දුන් භාණ්ඩ අතර ගිරය ද වූ බව ලෝරි පෙන්වා දෙයි. ගිරය හා බැඳුණු අභිචාර විධි ගැමියන් අතර වේ. හදි හූනියම්, බලි තොවිල්වල දී දෙහි කැපීම් වැනි ශාන්තිකර්මවල දී ගිරය පූජා භාණ්ඩයක් ලෙස භාවිත කරයි. ගිරය විස්කම් දෙවියන්ගේ නිර්මාණයක් ලෙස සලකනු ලබන අතර ඇතැම්හු සක් දෙවියන් විසින් මවන ලද්දක් බව පවසති. රොබට් නොක්ස් ද ගිරය පිළිබඳ සටහන් කොට ඇත. ගැමි කාන්තාවගේ ජීවිතයේ සුවිශේෂී අවස්ථාවන් කිහිපයක දී ම ගිරයට විශේෂ වැදගත්කමක් හිමි වේ. වැඩිවියට පත් වීමේ දී කුඩා ගිරයක් තනා ඉඟ නූලේ හෝ ගෙලෙහි පලඳනු ලැබේ. "වැළකුම් ගිරය" ලෙස හඳුන්වන වත්මනෙහි ද ගැමි සමාජය තුළ භාවිත කරනු ලැබේ. එමෙන් ම මෑත කාලීන ව ද ගම්බද ප්‍රදේශවල තරුණියක් මල්වර වූ විට ඇය නිදාගන්නා කොට්ටය යටින් ගිරයක් තැබීමේ සිරිතක් දක්නට ලැබේ. තනිකම් දෝසවලින් ඇය ව ආරක්ෂා කිරීම මෙයින් බලාපොරොත්තු වී ඇත. මහනුවර යුගයේ දී විවාහ උත්සවවල දී මනාලයා විසින් මනාලියගේ මවට කිරිකඩ සේලය සමඟ ගිරයක් ද තෑගි කර ඇත. එය "පත්තිනි ගිරය" ලෙස හඳුන්වන බව රැල්ෆ් පීරිස් පෙන්වා දෙයි. ඒ අනුව ගැමි දිවිය තුළ ගිරය බොහෝ ඇදහිලි විශ්වාස හා චාරිත්‍ර, හදිහූනියම් සමඟ සම්බන්ධ වන බවට විශ්වාසයක් ගැමියන් තුළ පවතින බව මෙයින් තහවුරු වේ. එසේ ම අතීත ගැමියන්ගේ ආයතනමය ස්වරූපය ද හඳුනාගත හැකි බව නිගමනය කළ හැකි වේ.

***ප්‍රමුඛ පද*** *: අභිචාර, ගැමි ජීවිතය, ගිරය, සංස්කෘතිය*

# Role of Museums for the Preservation of Kantha Embroidery - A Traditional Culture of Bengal

A. Ghosh

Rabindra Bharati University, Kolkata, West Bengal, India

*g_arr333@yahoo.com*

The "Intangible Cultural Heritage" means the practices, representations, knowledge, skills – as well as the artifacts associated therewith–that communities, and in some cases, individuals recognize as part of their cultural heritage. This intangible cultural heritage, transmitted from generation to generation, is constantly recreated by communities in response to their environment, interaction with nature and history, and provides them with a sense of identity and continuity, thus promoting respect for cultural diversity and human creativity. History gives us enough information to prove that Bengal has had a quite rich tradition in the art of textile weaving from a very early age and it attains a significant achievement in the history of textile. *Nakshi Kantha* embroidery said to be indigenous to undivided Bengal. Depending on their size and use, *Kanthas* range from *Sujni, Jainamaz, Dastarkhan, Gilaf, Arshilata* etc. The area of enquiry of this research are types of *Kantha* and their uses, causes of extinction of the skill of *Kantha* embroidery, problems of preservation of this traditional craftsmanship, role of museums for safeguarding *Kantha*. Methodology used in this research were: studying *Kantha* embroidery from the collection of different museums, field survey and oral testimony, study of literature, books, previous research papers, practical preservation work on the textiles. In present days, due to increasing population and vast growing urbanization, this magnificent skill of embroidery and art is at the verge of extinction. Museums need to document them and exhibit those using suitable techniques to develop a better perception for visitors. Different educational and cultural activities organized by the museums can also safeguard this beautiful art of Bengal. Proper conservation treatment of the *Kantha* in the collection of museums is also essential for the preservation of the traditional art of Bengal. Museums of India have an extensive array of traditional, religious, and cultural *Kantha* arts in their collections and the *Kantha* embroidery is also a living heritage of a particular community which evolved in response to their environments and contribute a sense of identity and stability. Therefore, museums should engage themselves for the safeguarding of this rich traditional craftsmanship.

***Keywords:*** *Community, Arshilata Kantha Embroidery, Documentation, Conservation, Museum Activity*

# ශ්‍රී ලංකාවේ කුල භේදය සහ ඉඩම් භුක්තිය පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක්

ජී. එල්. ධනුෂ්ක*, එම්. එන්. කුමාර සහ ජී. පී. ඩී. චතුරංගනී

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*gladanushka@gmail.com

සිංහල ජන සමාජයේ කුල ක්‍රමය හා ඉඩම් භුක්තිය සමස්ත සමාජ ක්‍රමයේ ම පැවැත්ම වෙනුවෙන් මධ්‍යගත බලපෑමක් සිදු කරනු ලබන බව හඳුනාගත හැකි ය. නූතන සංකීර්ණ සමාජයේ ද කුල ක්‍රමය යම් ආකාරයකට බලපෑම් ඇති කරන බව පැහැදිලි වේ. කුල ක්‍රමය ශ්‍රී ලංකාව තුළ අනිවාර්ය රාජකාරි ක්‍රමය හරහා තවදුරටත් විකාශනය වී තිබේ. ඒ අනුව සාම්ප්‍රදායික සිංහල ජන සමාජයේ ඉඩම් හිමිකම් සඳහා කුලවත්භාවය කුමන ආකාරයක බලපෑම් සිදු කර තිබේ ද යන්න මේ ඔස්සේ සාකච්ඡා කරන ලදි. එහි දී කුල පන්තීන් අතරින් කුමන කුල පන්තියක් සඳහා ඉඩම් හිමිකම් පැවැතියේ ද යන්න මෙන් ම හිමිකම් නො කියන කුල පන්තීන් මොනවා ද යන්න මේ ඔස්සේ අධ්‍යයනය කරන ලදි. ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය සහ ඉඩම් භුක්තිය සම්බන්ධයෙන් ද යම් ආකාරයක දැනුමේ දායකත්වයක් ලබා දීම මෙම අධ්‍යයනයේ අරමුණු අතර වේ. සමාජයේ මානව විද්‍යාත්මක පර්යේෂණයන් සිදු කිරීමේ දී පර්යේෂණ ක්‍රම කිපයක් ම වේ. මෙම අධ්‍යයනය සාහිත්‍ය මූලාශ්‍රය ඔස්සේ සිදු කරනු ලැබී ය. එහි දී ඓතිහාසික ක්‍රමය යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්තියේ සහ කුල ක්‍රමය විකාශනය වූ ආකාරය අධ්‍යයනය කරන ලදි. අධ්‍යයනයේ කාල සීමාව වශයෙන් මහනුවර යුගයේ සිට දෙවන ජනරජ ආණ්ඩු ක්‍රමය හඳුන්වා දුන් අවධිය තෝරා ගන්නා ලදි. මහනුවර යුගයේ වැඩසම් ක්‍රමය හරහා ඉඩම් භුක්තිය හා කුලවත්භාවය තීව්‍ර ව පැවැති නමුත් බ්‍රිතාන්‍ය යුගයේ සිට ගෙනෙන විවිධ ක්‍රියාමාර්ග හරහා එම තත්ත්වය ක්‍රමයෙන් අවම වී තිබෙන ආකාරය හඳුනාගත හැකි විය. ඉඩම් භුක්තියේ දී කුලවත්භාවය සුවිශේෂී වැදගත්කමක් උසුලනු ලබන බව අධ්‍යයනයේ දී අනාවරණය විය. කුලභේදය ඉහළින් ම සලකනු ලැබූ සාම්ප්‍රදායික සමාජ අවධිය තුළ ගොවි කුලය කුල ධූරාවලියේ ඉහළ කුලයක් වශයෙන් සැලකුම් ලබන අතර ප්‍රමාණයෙන් විශාල පිරිසක් එම කුලයේ අය විය. රජයේ උසස් තනතුරුවලින් ද වැඩි ප්‍රමාණයක් හිමි කරගෙන ඇති අතර, විශේෂයෙන් අදිකාරම්, දිසාව, කෝරාළ, අතුකෝරාල සහ මුදලි වැනි තනතුරුවලින් සමන්විත වී ය. මෙම තනතුරුවලින් රටට කළ සේවාවන් වෙනුවෙන් රජු ඔවුන්ට නින්දගම් පවා ප්‍රදානය කර තිබිණි. මේ හේතුව නිසා ඉඩම් භුක්තිය වැඩි කොටසක් ගොවි කුලය සතුවූ බව වැඩිදුරටත් තහවුරු වේ. මේ අනුව ශ්‍රී ලංකාවේ සම්පදායික සමාජයන්හි ඉඩම් භුක්තිය පිළිබඳ ව සලකා බැලීමේ දී කුල ධූරාවලියේ ඉහළ කුලයක් වූ ගොවි කුලය පහත් යැයි සම්මත කුලවලට සාපේක්ෂව ඉහළ ඉඩම් ප්‍රමාණයක භුක්තියකට හිමිකම් පෑ බව නිගමනය කළ හැකි වේ.

***ප්‍රමුඛ පද:*** *ඉඩම් භුක්තිය, කුල ක්‍රමය, කුල ධූරාවලිය, හීන කුල, ගොවි කුලය*

# පානම්පත්තුවේ ගැහැනු දරුවන් මල්වර වීම හා බැඳි චාරිත්‍ර විධි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කේ. එම්. එස්. සෙනෙවිරත්න*, එම්. එම්. ආර්. උපාලි[2] සහ ඒ. අයි. සඳමාලි

මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

**mali.senevirathna@gmail.com*

අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පානම ගම්මානය පිහිටා ඇති අතර ක්‍රි.ව 1818 ඇති වූ උඩරට කැරැල්ලේ දී පලා ආ සිංහලයන් මෙහි පදිංචි වූ බවත් එවකට පානම විසූ ජනයා අතර සම්මිශ්‍රණයක් වී බොහෝ ඇදහිලි හා විශ්වාස වර්ධනය වූ බවත් පෙනේ. එම චාරිත්‍රවිධි අතුරින් මල්වර චාරිත්‍රය සුවිශේෂී ස්ථානයක් හිමි කර ගනී. පානම්පත්තුවෙහි ගැහැනු දරුවන් මල්වරවීම හා බැඳි චාරිත්‍ර විධි පිළිබඳ හඳුනාගැනීම මෙම පර්යේෂණයෙහි මූලික අරමුණ වන අතර එහි දී එම චාරිත්‍ර විධි සුවිශේෂී ලක්ෂණයන්ගෙන් යුක්ත වන්නේ ද? පිළිබඳ සොයා බැලීම මෙහි පර්යේෂණ ගැටලුව වේ. පර්යේෂණ ක්‍රමවේදය තුළ සාහිත්‍යමය මූලාශ්‍ර මත පදනම් ව ප්‍රායෝගික හා ද්විතීයික දත්ත ලබා ගත් අතර සම්මුඛ සාකච්ඡා මගින් විශේෂයෙන් අදාළ ප්‍රදේශයේ තෝරාගත් වැඩිහිටි කාන්තාවන් 10 දෙනෙකු සමඟ පවත්වන ලද අනාකෘතිමය සම්මුඛ සාකච්ඡා ක්‍රමය තුළින් දත්ත රැස්කර ගන්නා ලදි. හඳුනාගත් තොරතුරු මත පදනම් ව මෙම ප්‍රදේශයේ ගැහැනු දරුවන් මල්වර වීම හා බැඳි චාරිත්‍ර විධි සුවිශේෂී ස්ථානයක් හිමි කර ගන්නා බව ගම්‍ය වේ. විශේෂයෙන් ම ද්‍රවිඩ ආභාසයක් සහිත ව මෙම මල්වර චාරිත්‍ර විධි පවත්වා ගෙන යන ආකාරයක් දක්නට ලැබේ. මල්වර වීමේ සිට සියලු චාරිත්‍රයන් සිදු කරනු ලබන්නේ ද්‍රවිඩ රදා කාන්තාවන් විසින් ය. මෙවැනි තත්ත්වයක් ලංකාවේ දැකිය හැකි ප්‍රථම අවස්ථාව වන්නේ ද මෙම ප්‍රදේශයේ මල්වර චාරිත්‍රයන් තුළින් පමණි. වෙනත් පළාත් සමඟ සංසන්දනය කිරීමේ දී ද පෙනී යන කරුණ වන්නේ ඉතා සුවිශේෂී චාරිත්‍ර ඉටු කිරීමක් මෙම ප්‍රදේශයෙන් හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම අනෙකුත් පළාත් තුළ දැකිය නො හැකි කුවිල්ල ගැසීමේ චාරිත්‍රය, ආලත්තියක් ගැනීම, කහගෑම, පාවඩ මතට මුදල් නෝට්ටු දැමීම, ඇඳිරි වැටී හවස තරු දිස් වීම බලා 6.00 නැකතට නෑවීම ආදි මල්වර චාරිත්‍රයේ පානම ප්‍රදේශයට ම ආවේණික වූ චාරිත්‍ර කිහිපයකි. අතීතයේ පැවති බොහෝ අංග ඒ ආකාරයෙන් ම යම් යම් වෙනස්කම් සහිත ව පවතින බව පෙනී යයි. විශේෂයෙන් කුඩිල්ල ගැනීම වර්තමානයේ මස්සිනා විසින් සිදු නො කරනු ලබයි. මල්වර වීමේ චාරිත්‍රය උත්සවශ්‍රීයෙන් ගැනීම ද වර්තමානයේ සිදු කරනු ලබන බව පෙනී යයි. කෙසේ වුව ද වැඩිහිටි කාන්තාවන් පැරණි චාරිත්‍ර අංග ඉදිරියටත් නො නැසී පවත්වා ගෙන යාමට නිරන්තර උත්සාහයක යෙදෙන බව පෙනී යයි. මේ ආකාරයට පානම්පත්තුවේ මල්වර චාරිත්‍ර විධි ඊට ම ආවේණික වූ ලක්ෂණ සමඟ ද්‍රවිඩ මුහුණුවරකින් නිර්මාණය වී ඇති බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ** කුඩිල්ල, පානම්පත්තුව, මල්වර, චාරිත්‍ර, ගැහැනු දරුවන්*

# සෙංකොට්ටං හා මාණික්කාවත යන ප්‍රබන්ධවලින් හෙළි වන සබරගමුව පළාතේ සාම්ප්‍රදායික ජන ජීවිතයෙහි විකාශනය හා සංස්කෘතික උරුමය පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

ජී. එල්. බී. ඩී. තිලකරත්න

සමාජ විද්‍යා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

*dhanushkathilakarathne92@gmail.com*

සබරගමුව පළාතේ සාම්ප්‍රදායික ජන ජීවිතය හා බැඳි සංස්කෘතිය එයට ම ආවේණික වූ සංස්කෘතිකාංගවලින් සැදුම්ලත් ප්‍රාදේශීය සංස්කෘතියකි. සාහිත්‍යය හා කලාව ඕනෑ ම සංස්කෘතියක වැදගත් ම කොටසක් ලෙස සැලකෙන අතර සාහිත්‍ය සමාජය ප්‍රතිනිෂ්පාදනය කිරීමේ හැකියාවක් සහිත යාන්ත්‍රණයක් ලෙස ද සැලකේ. ඒ අනුව මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ සබරගමුව පළාතට ආවේණික ජන ජීවිතය, එහි විකාශනය, ඒ හා සම්බන්ධ සංස්කෘතික උරුමය පිළිබඳ ව මානව විද්‍යාත්මක වටිනාකමක් සහිත ව හඳුනාගැනීම හා සමාජ ක්‍රමය අර්ථකථනය කිරීමට, තමා අයත් සමාජය දෙස ම විකල්ප ඇසකින් බැලීමට, සංස්කෘතික ආධිපත්‍යයන්ට අභියෝග කිරීමට හා සමාජ ප්‍රතිව්‍යුහගතකරණයන් යෝජනා කිරීමට සාහිත්‍ය සතු ව ඇති හැකියාව පිළිබඳ අවධාරණය කිරීම යි. ඒ සඳහා මහින්ද ප්‍රසාද් මස්ඉඹුලගේ සෙංකොට්ටං හා මාණික්කාවත නම් ප්‍රබන්ධ උපයෝගී කරගෙන සබරගමුව පළාතෙහි සාම්ප්‍රදායික ජන සංස්කෘතිය හා සබැඳි සමස්ත සන්දර්භය කෙරෙහි අවධානය යොමු කරන ලදි. අස්පර්ශනීය සංස්කෘතියක් හා සභ්‍යත්වයක් තුළින් ජන ජීවිතයට ආවේණික සමාජ, සංස්කෘතික, ආර්ථික හා දේශපාලන යන සියලු ප්‍රවාහයන් ගොඩනැගුණු ආකාරය පිළිබඳ ව මෙම අධ්‍යයනය තුළින් අනාවරණය විය. ප්‍රධාන වශයෙන් ම කුලය පදනම් කරගෙන කුලීනයන් විසින් කුල හීනයන් අගතියට පත් කිරීම හා ඒ වටා ගෙතුණු අනෙකුත් සමාජ, සංස්කෘතික හා දේශපාලන ක්‍රියාවලිය මෙන් ම වසර සියයක් වැනි කාල පරාසයක් තුළ සමාජ, සංස්කෘතික, ආර්ථික හා දේශපාලන විපර්යාසයන් සිදු ව ඇති ආකාරය පිළිබඳ ව මෙහි දී හඳුනාගත හැකි විය. සමස්තයක් ලෙස ගත් කල පවුල් සංස්ථාවේ ආරම්භය හා විකාශනය (වී ගොවිතැන මූලික කරගත් පවුල), වී ගොවිතැන හා බැඳුණු ජන මූලාශ්‍ර, ආහාර සංස්කෘතිය, ජන කවිය හා ඒ ආශ්‍රිත සාහිත්‍යාංග, ජන ඇදහිලි හා විශ්වාස, ආගමික පසුබිම, කුල ක්‍රමය හා කුල පීඩනය, අධ්‍යාපනික පසුබිම, ජනවහර, උපහැරණ හා භාෂාවේ රිද්ම ලක්ෂණ, භාෂා ව්‍යවහාරය, ගම්වල නම් ඇති වූ ආකාරය, සාම්ප්‍රදායික වෙළඳාම් රටාව, සාම්ප්‍රදායික ප්‍රතිකාර ක්‍රම හා කෙම් ක්‍රම ආදි සමස්ත සමාජය විනිවිද යා හැකි සමාජ හා මානව විද්‍යාත්මක වටිනාකමකින් යුත් තොරතුරු රාශියක් මෙමඟින් හෙළි විය. සෙංකොට්ටං හා මාණික්කාවත යන ප්‍රබන්ධ නාමයන් පවා සබරගමුවේ ජන ජීවිතය හා බැඳි පුරාණ සන්දර්භය නිරූපණය කිරීම උදාහරණයක් ලෙස පෙන්වා දිය හැකිය. ඒ අනුව මෙම ප්‍රබන්ධ මඟින් සමාජ චලනතාවන් හරහා සමාජයේ ප්‍රගමනයන් ඇති කරමින් සංස්කෘතික ආධිපත්‍යයන්ට අභියෝග කිරීම මෙන් ම වෙනස්වන සමාජ අවශ්‍යතා අනුව වෙනස් වෙමින් සමාජ ප්‍රතිව්‍යුහගතකරණයන් ඇති වීමට අවශ්‍ය සාධක පෙන්වා දීම සාහිත්‍ය මඟින් සිදු කළ හැකි බව නිරූපණය විය.

***ප්‍රමුඛ පදඃ** සබරගමුව පළාත, සාම්ප්‍රදායික ජන ජීවිතය, සෙංකොට්ටං, මාණික්කාවත, සංස්කෘතික උරුමය*

# නූතන ජන ජීවිතය හා සබැඳි ඥාතීත්ව සංකල්පය (උතුරු මැද පළාතේ පුල්එළිය ප්‍රදේශය ඇසුරිනි)

ටී. වයි. ඩී. වික්‍රමනායක,* බී. ජී. ඒ. ටී. එන්. වික්‍රමරත්න සහ එස්. සමරසේකර

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*thamaliwickramanayake@gmail.com

මිනිසාට තනි ව ජීවත් විය නො හැකි නිසා විවිධ ස්වරූපයෙන් සම්බන්ධතා ගොඩනගා ගැනීම මානව සමාජය ආරම්භයේ සිට ම සිදු විය. ඒ සෑම සම්බන්ධතා වර්ගයකින් ම සමාජීය සහ සංස්කෘතික වශයෙන් අපේක්ෂිත කෘත්‍යයක් ඇත. ඥාතීත්වය ඒ අතර ඇති ප්‍රමුඛ සම්බන්ධතා වර්ගයකි. පුද්ගලයා සමාජගත කිරීමේ සහ සමූහගත කිරීමේ ඉතා වැදගත් මූලධර්මයක් වන ඥාතීත්වය අතීත සිංහල සමාජය තුළ මනා ව ක්‍රියාත්මක වූවකි. මේ බව සනාථ වන අධ්‍යයනයක් ලෙස විදේශීය මානව විද්‍යාඥයෙකු වූ ඊ. ආර්. ලීච් සිංහල සමාජයේ ඥාතීත්ව රටාව පිළිබඳ සිදු කළ අධ්‍යයනය දැක්විය හැකි ය. වර්ෂ 1954-1956 අතර කාලයේ ලංකාවේ රැඳී සිටිමින් ඔහු සිය ක්ෂේත්‍ර අධ්‍යයනය සිදු කළ අතර නියැදිය වශයෙන් උතුරු මැද පළාතේ පුල්එළිය ගම්මානය යොදාගෙන එතුළින් සම්පූර්ණ සිංහල සමාජ තත්ත්වය ම විවරණය කළේ ය. එකල කුල ක්‍රමය ඉතා සක්‍රීය ව පැවති අතර ඉඩම් භුක්තිය හා සමාජ පාලනය වූයේ ද ඥාතීත්වය මගින් බව ඔහු දක්වයි. 20 වන සියවසේ මැද සිදු කළ අධ්‍යයනය නැවත සිදු කිරීමක් වශයෙන් මෙම පර්යේෂණයේ අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස පුල්එළිය ගම්මානය තෝරා ගැනිණි. ඒ අනුව ලීච් සඳහන් කළ සිංහල ඥාති සම්බන්ධතා වර්තමානයේ කෙසේ පවතින්නේ ද යන්න පිළිබඳ ව විමර්ශනය කිරීම අධ්‍යයනයේ අරමුණු විය. මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික ලිඛිත මූලාශ්‍රය ලෙස ලීච් රචිත "Puleliya - A Village in Ceylon" (1961) ග්‍රන්ථය යොදා ගත් අතර ප්‍රාථමික අලිඛිත මූලාශ්‍රය වශයෙන් අහඹු ලෙස ප්‍රදේශයේ පවුල් ඒකක 20ක් යොදාගෙන ආකෘතිමය සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය මගින් දත්ත ඒකරාශී කරනු ලැබී ය. වර්තමානය වනවිට සිංහල ඥාතීත්ව රටාවේ වත්මන් ප්‍රවණතා රාශියක් දක්නට ලැබේ. පැරණි ඥාති ක්‍රමයේ මහගෙදර සංකල්පය සහ ඒ වටා ගොඩනැගුණු ක්‍රියාකාරකම් සමුදාය අද වන විට දක්නට නැත. නියැදිය තුළ මහගෙදරක් ලෙස ක්‍රියාත්මක පවුල් ඒකක සංඛ්‍යාව 5% කි. එමෙන් ම අද වන විට මෙම ගම්මානයේ 70%ක් න්‍යෂ්ටික පවුල් පවතින අතර 72%ක් ම පවතිනුයේ දීග විවාහයන් ය. එදිනෙදා ජීවිතයේ පවත්වන ඥාති සබඳතාවල දී මුල්තැන න්‍යෂ්ටික පවුලේ සාමාජිකයන්ට හිමි වන්නේ ය. එමෙන් ම අන්තර්ජන්‍ය විවාහයන් බහිර්ජන්‍ය විවාහ බවට පත් ව ඇත. ඇවැස්ස ඥාතීත්වය නො සලකා ස්වකැමැත්තට විවාහ වන අතර වත්මන් පරම්පරාවට සාම්ප්‍රදායික ඥාති පද පිළිබඳ ව නිසි අවබෝධයක් ද නොමැත. මේ අනුව අවධාරණය වූයේ සිංහල ඥාති ක්‍රමය කාලානුරූප වෙනස්වීම් රැසකට භාජනය වී ඇති බව යි. නාගරීකරණය, බටහිරකරණය, නවීකරණය ආදී වූ සමාජ සංස්කෘතික වෙනස්වීමේ බලවේග සිංහල සමාජයට බලපෑම් කර ඇත. ඒ අනුව ලීච් සඳහන් කළ පරිදි සිංහල සමාජයේ පැවැත්මට අතීතයේ ඥාතීත්වය තුළින් ඉටු වූ මෙහෙය වර්තමානය වන විට ඉටු නො වන බවත්, වර්තමානයේ සරල ඥාතීත්ව සම්බන්ධතා මත සංකීර්ණ සමාජයක් බිහි වී ඇති බවත් පර්යේෂණය අවසානයේ නිගමනය කළ හැකි විය.

***ප්‍රමුඛ පද:*** *සිංහල ඥාතික්‍රමය, ඥාතිත්ව රටාව, පුල්එළිය, නාගරීකරණය, මහගෙදර*

# පිදුරංගල වැව් ගම්මානයෙහි වාසස්ථානික සංචලතාව පිළිබඳ මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක්

එච්. ජේ. කේ. ප්‍රනාන්දු

මධ්‍යම සංස්කෘතික අරමුදල

*hjayanikumari2@gmail.com*

ස්ථිරවාසීතාව ඇති කරගත් සෑම ප්‍රජාවක් ම නිශ්චිත ස්ථානයක දීර්ඝ කාලයක් ජීවත් වූ බවට සාධක හමු නො වේ. එක් එක් පාරිසරික කලාපවල පවතින භූ භෞතික ස්වභාවය, සම්පත්වල විෂමතාව, යැපීම් රටාවල විවිධත්වය සහ දේශගුණික විපර්යාස එකී වාසස්ථානික අස්ථායිතාව ඇති කිරීමට පාදක වී ඇත. ශ්‍රී ලංකාවේ ස්ථිරවාසිතාව ඇති ජන සමාජ පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක, ක්‍රිස්තු පූර්ව පළමු සහස්‍රකයේ දෙවැනි භාගයේ දී පමණ වියළි කලාපයෙන් හා අන්තර් සංක්‍රාන්තික පාරිසරික කලාපයෙන් හමු වේ. වියළි කලාපයේ හා අන්තර් කලාපයේ ඇති භූ භෞතික සාධක එකී ජනාවාසවල හැඩය සකස් කිරීමට හේතු විය. එසේ ඇති වූ ජනාවාස රටාව අප හඳුන්වන්නේ වැව් ගම්මාන ලෙස යි. එවැනි වැව් ගම්මානයක් ලෙස පිදුරංගල දැක්විය හැකි ය. පිදුරංගල ග්‍රාමය හා තදාශ්‍රිත ප්‍රදේශය ප්‍රාග් ඓතිහාසික අවධියේ සිට මෑත අවධිය තෙක් කාලය හා අවකාශය ඔස්සේ භාවිතාවට ලක් වී ඇති බවත්, පිදුරංගල ග්‍රාමය ඒ අවට සාම්ප්‍රදායික ගම්මාන සමග ඒකාරාශී වී ඇති ආකාරයත් පුරාවිද්‍යාත්මක හා මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයන් මගින් පැහැදිලි කර ඇත. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ අන්තර් සංක්‍රාන්තීය පාරිසරික කලාපයක පිහිටි පිදුරංගල ග්‍රාමයෙහි වාසස්ථානික සංචලතාව පිළිබඳ සිදු කරන ලද මානවවංශ විද්‍යාත්මක සමීක්ෂණයක ප්‍රතිඵල ඉදිරිපත් කිරීම යි. පර්යේෂණ විධික්‍රම ලෙස පූර්ව පර්යේෂණ අධ්‍යයනයත්, ක්ෂේත්‍ර සමීක්ෂණය හා ව්‍යුහාත්මක සම්මුඛ සාකච්ඡා ක්‍රමය සිදු කරන ලද අතර මෙහි දී පිදුරංගල ග්‍රාම නිලධාරී වසමේ ස්ථිර පදිංචි වයස අවුරුදු 60ට වඩා වැඩි, යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුත් ගම්වාසීන් තෝරාගන්නා ලදි. ක්ෂේත්‍ර සමීක්ෂණයේ දී හා සම්මුඛ සාකච්ඡාවල දී ලබාගත් ප්‍රාථමික දත්ත විශ්ලේෂණය මගින් ප්‍රතිඵල ලෙස අනාවරණය කරගන්නා ලද්දේ වැව මූලික කරගනිමින් සාම්ප්‍රදායික කෘෂි ආර්ථිකයට හුරු වූ මෙම ගම්මානයේ මිනිසුන්ගේ වාසස්ථාන පිහිටුවා ගැනීම මෑත දශක පහ ඇතුළත දී එක ම ප්‍රදේශය තුළ අවස්ථා කිහිපයක් ඔස්සේ වෙනස් වී ඇති බව යි. එනම් ජනාවාස සංචලතාවයේ ස්වරූපය අදියර ත්‍රිත්වයක් යටතේ හඳුනාගත හැකි විය. පළමු අදියර යටතේ වැවට පහළින් සාම්ප්‍රදායික ව ජනාවාස ඉදි කරගන්නා ලද ගම්මැද්ද, දෙවන අදියර යටතේ 1950 ගණන්වල දී ඉඩම් ප්‍රමාණවත් නො වීම හා ගංවතුර නිසා විතැන් වීමද, තෙවන අදියර යටතේ ගම්උදාව සංකල්පයට සමගාමී ව නව නිවාස ක්‍රමයක් වූ කාශ්‍යප ගම වෙත සංක්‍රමණය වීම ද යන කරුණු ත්‍රිත්වය යි. පර්යේෂණ ප්‍රතිඵල අනුව නිගමනය වන්නේ පිදුරංගල වැව් ගම්මානය දීර්ඝ කාලයක් තිස්සේ සක්‍රීය වෙමින් පැවතිය ද, එය වැව කේන්ද්‍රකරගත් යැපීම් උපායමාර්ගවල විපර්යය මගින් ජනිත කළ අභිනව ජීවන රටාවන් හමුවෙහි අභියෝගයට ලක් වී ඇති බවත්, ප්‍රාග් නූතන සමාජවල පැවති සරල මෙන් ම පහසුවෙන් නඩත්තු කළ හැකි ජීවන ක්‍රමය වෙනුවට ඇති වූ සංකීර්ණ, බහුභාණ්ඩික ජීවන රටාව මෙම ගම්මානයේ වාසස්ථානික අස්ථායිතාව ඇතිකොට තිබෙන බවත් ය.

***ප්‍රමුඛ පදඃ*** *මානවවංශ විද්‍යාව, වාසස්ථානික සංචලතාව, වැව් ගම්මාන, ස්ථිරවාසීතාව*

# A Study on The Nature of Conflicts in Sri Lankan Traditional Folk Society

K. S. Dharmasiri*, K. B. N. De Silva, W. G. W. M. S. N. K. Weerakoon

Department of Criminology and Criminal Justice, University of Sri Jayewardenepura

**sanjudharmasiri94@gmail.com*

The society is a group of people with common territory, interaction, and culture. The overall existence of society is always determined by culture. Culture defines a particular set of customs, morals, codes, and traditions from a specific time and place. It is a collection of traditions, art and other forms of entertainment, and the language, interrelationships, values, virtues, rules, restrictions, skills, and lifestyles that are necessary for the survival of a society. Within this context, the term "conflict" has become a natural phenomenon. Conflicts can be detected within the family, the rural environment, the interior of a country, or beyond. In addition, these conflicts range from simple to complex situations. Even though traditional societies were known as a mutually supportive concept, the conflict has become a common phenomenon in society. The prime intention of the study was to discuss the nature of conflicts that prevail in the traditional folk society. For this purpose, the village of *Meemure* belonging to the *Ududumbara* Divisional Secretariat of the Kandy District of the Central Province was selected as the study area. Randomly selected 40 families were used for the data collection through unstructured interview method. Content analysis method was used for the data analysis. The study found that conflict is a rare phenomenon in *Meemure* village, with land disputes, plantation-related disputes, and disputes over land grabbing. In the case of non-violent conflicts, the elders, relatives, or villagers mediate to resolve them through negotiation. However, when these efforts are being unsuccessful, it will be settled on the advice of the *Gramasevaka*. The reasons for the reduction of conflicts in the *Meemure* village were being identified, as the limitation of population, urban isolation, kinship, rural lifestyle, indifferent culture, self-sufficient economy, technology, and distance between villages. Furthermore, it is proposed to allow the trade commodities to be brought to the city, without harming the rural culture, granting legal ownership of land, and improving transport facilities.

***Keywords:*** *Conflict, Rural culture, Rural Society, Meemure Village*

# Use of Intangible Cultural Heritage for Resolving Life-Problems: A Study on Unwritten Poems *(Kavi)* of Muslim Women

V. Alagaratnam[1*] and S. Santhirasegaram

[1]General Sir John Kotelawala Defense University, [2]Eastern University, Sri Lanka

[*] *alagaratnam@kdu.ac.lk*

Knowledge and its forms of expressions differ among the people as per their level of education and experience. People who are not formally educated have tacit knowledge on the worldly trend. Muslim women, in earlier days, did not study much. This trend made them to be empirically knowledgeable. Their form of *Kavi* (a form of poem) is a great example. *Kavi* is a form of poems which are not in printed form. Imaginary love and feelings were expressed in the Kavi in early days. Later, the people created *Kavi* expressing worldly problems which includes, destituteness, negligence of children, separated from husbands etc. The objectives of the study were to reveal these unexposed literature which can be considered as an intangible cultural heritage, to conserve and preserve the literature which may not exist in near future due to the impact of new technology and to reveal the way the literature that is used as a therapy to solve their daily problems. Qualitative research design was employed. Accidental and snowball sampling techniques were applied since the poets are unknown. Fifteen (15) poets were identified and interviewed. Unstructured questionnaires and in-depth interview were applied to gather the data. The unwritten poems are not imaginations, but based on the feelings, emotions and experiences. This research was carried out in Amparai District. The study identified that these poems are not exposed as a cultural heritage. They must be considered as an intangible cultural heritage and must be exposed. These poems must be taken to consideration to be preserved. These poems are not only a literature, but also a mind therapy. It was identified that this culture is in danger and the literature will be vanished due to many reasons. Actions must be taken to conserve and preserve this Intangible Cultural Heritage.

***Keywords:*** *Kavi (Poem), Unprinted Poem, Art Therapy, Social Issues*

# කරඬුලෙන සෙනසුන හා සබැඳි ජනශ්‍රැති පිළිබඳ අධ්‍යයනයක්

හල්මිල්ලකැටියේ රතනපාල හිමි* සහ පොලියර්වත්තේ ඤාණසාර හිමි

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*embrathanapala@gmail.com

හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි අම්බලන්තොට, රිදියගම මෙම ඓතිහාසික විහාරස්ථානය පිහිටා ඇත. පුරාවිද්‍යා හා සාහිත්‍ය මූලාශ්‍රයන්හි බිලිව (න) වෙහෙර, කුරන්ඩක ලෙන, කරඹගල හා කරඬුලෙන ආදි වශයෙන් ද හඳුන්වනු ලැබේ. විශාල ගල් පර්වත හා ඝන වනාන්තරයෙන් වට වූ සෙනසුන කරඬුවක් ලෙස ඈතට දර්ශනය වීම හේතුවෙන් කරඬුලෙන ලෙසින් ව්‍යවහාර වන බවට ප්‍රවාදයක් පවතී. අනුරාධපුර රාජධානි සමයට තරම් ඈත අතීතයට දිවයන මෙම පින්බිම කාවන්තිස්ස රජු දවස චිත්තගුත්ත තෙරුන් වහන්සේ ඇතුළු දොළොස් දහසක් රහතන් වහන්සේලා වැඩ සිටි බවට සාහිත්‍ය මූලාශ්‍රය තොරතුරු සපයයි. කරඹගල සෑම තැනක ම පාහේ  පර්වත ඇසුරු කරගනිමින් ලෙන් දැකගත හැකි යි. මෙහි ඇති ඡත්‍රාකාර ලෙන වර්තමානයේ කුඩ ලෙන ලෙස හඳුන්වන අතර "චිත්තගුප්ත ලෙන" ලෙසින් ප්‍රසිද්ධ ලෙනක් ද ඇත. වර්තමානයේ මෙම වෙහෙර කොටස් දෙකකින් යුක්ත ය. එනම් කරඬුලෙන වෙහෙර හා එයට සැතපුම් දෙකක් පමණ දුරින් පිහිටි මදුනාගල සෙනසුන වශයෙනි. එහෙත් ඓතිහාසික තොරතුරුවලට අනුව මදුනාගල යනු කරඬුලෙන සෙනසුනෙහි ම දාන ශාලාව බවට පිළිගෙන ඇත. ශ්‍රී ලංකාවේ හමු වන පැරණිතම රේඛා චිත්‍ර, ශිලා ලේඛන, සඳකඩ පහණ  හා ඉපැරණි නටබුන් රාශියක් අද ද දක්නට ඇති මෙම වෙහෙර හා සබැඳි ජනශ්‍රැති රාශියක් වන අතර එම ජනශ්‍රැතීන්ගේ සත්‍ය අසත්‍යතාව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. අධ්‍යයනය ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර පර්යේෂණය මගින් කරඬුලෙන ආරණ්‍ය සේනාසනය හා මදුනාගල ප්‍රදේශය නිරීක්ෂණය කරන ලදි. සෙනසුන වැඩවසන භික්ෂූන් වහන්සේලා හා වැඩිහිටි පුද්ගලයන් දස දෙනකු නියදියක් වශයෙන් ගෙන සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස්කිරීම හා සාහිත්‍ය මූලාශ්‍රය මගින් ලබාගත් දත්ත විශ්ලේෂණය කරන ලදි. එම ජනශ්‍රැති අතර අවධානය යොමු කළ යුතු ප්‍රවාද කිහිපයකි. එනම් දෙස් විදෙස් ජනයා අතර බොහෝ ප්‍රචලිත මදුනාගල උණුදිය උල්පත් මෙම වෙහෙර වැඩසිටි රහතන් වහන්සේ හට වැලඳුණු කුෂ්ඨ රෝගයක් සුවපත් කරවීම සඳහා ස්නානයට මණිමේඛලා නම් දෙව් දුව මැවූ බවත්, චිත්තගුප්ත ලෙන තුළට සෙවණ සලසන කොහොඹ ගසෙහි ලෙනට ඉහළ වූ ශාඛාවෙහි පමණක් පත්‍ර තිත්ත රසයෙන් තොර බවත්, මාගම විසූ රජු චිත්තගුත්ත තෙරුන් වහන්සේගේ ගුණ සම්පත්තිය අසා පැහැද තෙරුන් වැඳගැනීම සඳහා තුන්වරක් පණිවිඩ යවා මාළිගාවට ගෙන්වාගැනීමට නොහැකිව "තෙරුන්වහන්සේ වඩනා තාක් දරුවන්ට කිරිබොන්නට නොදෙමැ" යි ඒ ගම කිරි බොන දරුවන් ඇති කාන්තාවන්ගේ තන පටින් බඳවා මුද්‍රා තැබීමත්, තෙරුන් වහන්සේ වෙහෙර සක්මන් මලුවේදී නාග වෘක්ෂාධිගෘහිත දේවතාණෝ දඬුවැට පහන් අල්වා සිටගත් කල මැදියම ඉක්මෙන්නාම මුළු වනය නින්නාද කරවමින් රහත් වූ බවත්, එක් තිස් පැයක් මෙම පුද බිමෙහි දළදා වහන්සේ වැඩසිටි බවත් හා හාස්කම් සහිත වෙදකම් ක්‍රමයක් ද මෙහි වූ බවට ද ජනප්‍රවාද තොරතුරු සපයයි. මේ පිළිබඳව අධ්‍යයනයේදී විශේෂයෙන් මහාවංශය, විශුද්ධි මාර්ගය හා දාඨාවංශය වැනි මූලාශ්‍රගත තොරතුරු හා සාකච්ඡා මගින් ලබාගත් තොරතුරු අනුව එම ජනශ්‍රැති හුදු ප්‍රලාපයන් නොව යම් සත්‍යතාවක් පවතින ජනප්‍රවාද බව පැහැදිලි ය.

***පමුඛ පද;*** *ජනශ්‍රැති, ලෙන, සෙනසුන, මූලාශ්‍ර, තෙරුන්වහන්සේ*

# තෙලිඟු ජනතාවගේ අතීත ජනජීවිතය හා සංස්කෘතියේ වත්මන් ස්වභාවය පිළිබඳ ව මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක් (කුඩාගම තෙලිඟු ග්‍රාමය ඇසුරෙන්)

ඩබ්. ඒ. අයි. එල්. රාජපක්ෂ* සහ කේ. ඒ. ජේ. ඩී. කස්තුරිආරච්චි

සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*isharalak08@gmail.com

ලාංකේය මහසමාජය තුළින් යැපෙමින් එකී සමාජ ප්‍රවාහ සමග සංයෝජනය වීමෙන් වැළකී සංස්කෘතික ලැග්ම තුළ පවතින ජනවාර්ගික උපසංස්කෘතියක් හිමි ජන කණ්ඩායමක් ලෙස අහිකුණ්ඨික ජනතාව හඳුනාගත හැකි ය. පාලි බසින්" '**අහි**' යන්න සර්පයාටත් '**කුණ්ඨික**' යන්න අල්ලනු ලබන" ගැටගසනු ලබන අරුතින් සර්පයන් අල්ලා සිය ජීවිකාව පවත්වාගනු ලබන්නා අහිකුණ්ඨිකයා යන්න දක්වනු ලබයි. ස්වකීය සංස්කෘතික අනන්‍යතාව ප්‍රකට කරනු ලබන ප්‍රධාන සාධකය ලෙස ඔවුන් විසින් වහරනු ලබන ඉන්දීය ආන්ද්‍ර බසට අනුරූප තෙලිඟු භාෂාව නිසාවෙන් මොවුන් තෙලිඟු ජනතාව ලෙසින් ද හඳුන්වනු ලැබී ය. මෙහි ලා තෙලිඟු ජනතාවගේ ජනජීවිත හා සංස්කෘතියේ අතීත ස්වභාවය අධ්‍යයනය මූලික අරමුණ වීමත් එහි වර්තමාන තත්වය කෙබඳු වී ද? යන්න අධ්‍යයනය පර්යේෂණ ගැටලු වශයෙනුත් ගනිමින් මෙම අධ්‍යයනය සිදුකරනු ලැබී ය. අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් පර්යේෂණ ක්ෂේත්‍රය මූලික ව ප්‍රාථමික දත්ත රැස්කිරීම වශයෙන් ක්ෂේත්‍ර ගවේෂණය සම්මුඛ සාකච්ඡා පැවැත්වීම නිරීක්ෂණය කිරීමත් ද්විතීයික දත්ත රැස්කිරීම වශයෙන් පූර්ව පර්යේෂණ වාර්තා අධ්‍යයනයත්" ලිඛිත මූලාශ්‍ර අධ්‍යයනයත් වශයෙන් වන දත්ත රැස්කිරීමේ ක්‍රමවේදයන් භාවිත කරනු ලැබී ය. එහි ලා අතීත තෙලිඟු ජනතාව මෙරටට ඉන්දීය ජනසංක්‍රමණික පිරිසක් ලෙස පැමිණ නයින්" පොළොඟුන් අල්ලා නටවමින් අන්‍ය ජනතාව සතුටු කිරීම සිය ජීවන උපාය කරගනිමින් ඔවුන්ට ආවේණික භෂා ව්‍යවහාරයක්" සිරිත් විරිත් සම්ප්‍රදායක් හා ඇදහිලි විශ්වාස හා ජන කලාවක් සහිත සරල ජංගම නිවාස ක්‍රමයක් හිමි සංචාරක ජීවිතයක් ගත කරනු ලැබූ ජනප්‍රවාහයක් වශයෙන් හඳුනාගන්නා ලදි. එම වාචික හා වාචික නො වන නිෂ්පාදන ඇතුළත් මහ සමාජයට බද්ධ ව යමින් නුමුත් වෙන් ව පවතින එකී මානව ප්‍රජාවේ පැවැත්මේ සියලු ක්‍රියාකාරකම් ඔවුන්ගේ ජීවන රටාව හා සංස්කෘතිය වශයෙන් තහවුරු කරගනු ලබන අතර ම වර්තමානයේ වෙනස් වන සමාජ ආර්ථික රටාව හමුවේ තෙලිඟු ජනතාවට ආවේණික වූ මුඛ්‍ය සංස්කෘතික ලක්ෂණ වන භාෂාව එම සමාජයේ වයෝවෘද්ධ සාමාජිකයන්ට පමණක් සීමා වීමත් ස්වාභාවික සම්පත් භාවිතයෙන් ඉදි කළ සාම්ප්‍රදායික කුඩාරම් නිවාස ක්‍රමය සංචාරක දිවියක් ගත කරන එක් පිරිසකට පමණක් සීමා වීමත් සාම්ප්‍රදායික ආර්ථික යැපුම් මාර්ගයන් වන සාස්තර කීම හා නයි හා රිලවුන් නැටවීම වියකීයමින් අද වන විට බොහෝමයක් තෙලිඟු ජනතාව කම්කරු රැකියා සඳහා පිවිසීමත් සාම්ප්‍රදායික චාරිත්‍ර හා ඇදහිලි විශ්වාස මත හැඩගැසෙන සංස්කෘතික ලැග්ම මත මහ සමාජයේ අභාසය ලබමින් සංස්කෘතික විසරණයකට ලක්වෙමින් පවතින උපසංස්කෘතියක් බවට වර්තමාන තෙලිඟු සමාජය පිළිබඳ ව නිගමනය කළ හැකි ය.

***පමුඛ පද;*** *තෙලිඟු, අහිකුණ්ඨික, සංස්කෘතික ලැග්ම, උපසංස්කෘතිය, සංස්කෘතික විසරණය*

# Assuming the Dutch Burghers of Sri Lanka as Having Two Origins - Netherlands and Belgium; A Lore-Based Future Genetics Study

D. Gunawardana

The Research Council, University of Sri Jayewardenepura

*dilantha@sci.sjp.ac.lk*

Sri Lankan Dutch Burghers are known to have exclusive origins in the Netherlands. In contrast, I hope to find genetic markers that are known to be from modern day Netherlands and contemporary Belgium, and to use them in exploring the "Burgher" genome landscape in Sri Lanka. The hypothesis tested here is Burgher lineages too are derived from modern-day Belgium, which borders Netherlands. This study is at foremost using lore such as oral perpetuations and unverified myths such as those reported in Wikipedia to usher in genetics of identity. The first Dutch explorers to come to Sri Lanka, namely Joris Van Spilbergen (fleet 1) and Sebalt de Weert (fleet 2) were both born in Antwerp, which is a town in modern-day Belgium, which begs the question whether the demographic community we identify as Dutch Burghers in Sri Lankan are a misnomer. It is known that the Dutch Republic in 1658 is approximated with modern day boundaries of Netherlands, and the Former Spanish Netherlands is approximated largely with modern day Belgium. It is even said (through lore) that King Vimaladharmasuriya I, the ruling monarch at that time, thought highly of his newfound friend, Joris Van Spilbergen, that he even called Kandy as "New Flanders", which again is a part of Belgium. Furthermore, many common surnames found in Belgium, such as Peters, Janssen, Wouters and Muller etc, too are identified among Dutch Burghers in Sri Lanka. It should be remembered that Netherlands's golden age ran from 1600 to 1800s, where they possessed naval supremacy under the Dutch East India Company, which was founded in the early part of 1600s. Due to the fluidity and shifts in maps, from when Netherlands was part of the Holy Roman Empire to the Peace of Westphalia in 1648 (after the 80 Years War/Dutch War of Independence), we cannot clearly say whether the ancestors of Dutch Burghers in Sri Lanka, came from modern day Netherlands or Belgium, or both. The first part of this study, as shown above, details history and the second part of the study will be based on human genetics.

***Keywords:*** *Netherlands, Belgium, Burghers, Genetic Markers, Lore*

# අනුරාධපුර යුගයේ පූජනීය ගොඩනැගිලිවල වාමන රූප භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ටී. එස්. මාටින්

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කැස්බෑව

*thushanimartin47@gmail.com*

මහාවංශයට අනුව ලංකා ඉතිහාසයේ ආරම්භය ක්‍රි.පූ. 06 වන සියවසෙහි විජයාගමනයත් සමඟ සිදු වූවකි. එකල මෙරට වාසය කළේ යක්ෂ, නාග යන ප්‍රධාන ගෝත්‍රිකයින් ය. අනුරාධපුරය පළමු වරට වාස්තු විද්‍යානුකූල ව නිර්මාණය කළේ පණ්ඩුකාභය රජු ය. එසේ ම චිත්තරාජ, කාලවේල, වළවමුඛී යන යක්ෂයින්ට දෙවොල් ඉදිකර දී අවුරුදු පතා බලිදාන පවත්වා ඇත. පසු ව මහින්දාගමනයත් සමඟ දේශීය කලාවට නව මංපෙත් විවර වී කලාවට ආගමානුකූල ශික්ෂණයක් ඇති වී ය. ක්‍රි.පූ. 03 වන සියවසේ සිට මෙරට වාස්තු විද්‍යාත්මක ගොඩනැගිලි ඉදි විය. ඒ අතර රාජකීය හා ආගමික ගොඩනැගිලි ප්‍රධාන ය. වාස්තුවිද්‍යාත්මක නිර්මාණ කිරීමේ දී වාමන රුවට හිමි වූයේ සුවිශේෂී ස්ථානයකි. එනම් හාස්‍යය, ධෛර්ය, ශක්තිය, පෞරුෂත්වය හා ශෘංගාරය මතුවන පරිද්දෙන් නිර්මාණය කිරීම විශේෂත්වයකි. මෙම වාමන රූප දාගැබ් ආයකවල, ගොඩනැගිලි අත්තිවාරම්වල, කුලුනු හිස් හා පාමුල පඩි කඳන්වල, කොරවක්ගල් හා මුරගල් ආදියේ ද දක්නට ලැබේ. මෙම නිර්මාණ සඳහා කවර ඇදහිලි, විශ්වාස, වස්තු විෂය වූයේ ද යන්න පිළිබඳ ව ද මෙම සියලු ම ඉරියව්වන්ගෙන් යුත් වාමන රූප ආගමික ගොඩනැගිලි තුළ ද වේ. ඒ අනුව ආගමික ගොඩනැගිල්ලක් නිර්මාණයේ දී මෙවන් රූප යොදාගත්තේ මන්දැයි අධ්‍යයනය කිරීම වැදගත් ය. මෙම පර්යේෂණයේ ගැටලුව අනුරාධපුර යුගයේ වාමන රූ භාවිතය පිළිබඳවත් ඒවායේ කලාත්මක අගයන් ඉදිරිපත් කොට කුමන සංකල්පයක් මත වාමන රූපය ආගමික ගොඩනැගිලි තුළට ඇතුළත් වූයේ ද යන්න පිළිබඳ ව විමසීම ය. එහි දී මුතුන්මිත්තන්ගේ පැවති අභිචාරයන්හි ප්‍රතිඵලයක් මත මේවා ආගමික ගොඩනැගිලිවලට එකතු වූයේ ද නැතහොත් වෙනත් ජනප්‍රවාද, මූලාශ්‍රවල සංකල්පයන් මත එකතු වූවා ද යන්න පිළිබඳ ව අධ්‍යයනය කිරීම ද අරමුණු ය. මෙම පර්යේෂණයේ මූලික ක්‍රමවේද දෙකකි. පළමුවැන්න ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ අන්තර්ගතවන පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය යි. එහි දී පොත්පත්, ලිපි ලේඛන මෙන් ම ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් පෞරාණික හා කාලීන ලේඛන ද අධ්‍යයන කළේ ය. දෙවැන්න ක්ෂේත්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ උතුරු මැද පළාතේ පූජාභූමි කිහිපයක් ඇසුරින් පර්යේෂණ සිදු කළේ ය. එහි දී තෝරාගත් ඉලක්කගත පුද්ගලයන් හා කණ්ඩායම්ගේ සහභාගීත්වයෙන්, සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමවේදය යටතේ කරුණු එක්තැන් කළේ ය. ඒ අනුව එම ස්ථාන ආශ්‍රයෙන් එකිනෙකට වෙනස් වාමන ස්වරූප, භාවිතය හා ඒවායේ කලාත්මක අගයන් පිළිබඳවත් තොරතුරු හඳුනා ගැනුණි. එහි දී අනුරාධපුර විජයාරාමය, අභයගිරිය, මිහින්තලය, ඉසුරුමුණිය, රුවන්වැලි මහාසෑය හා මඟුල් මහා විහාරය ඇතුළු පූජනීය ස්ථාන ඇසුරින් බහිරව, වයන, උක්කුටික, නා රජ මුරගල, කණ්ඨක චේතිය වාහල්කඩ, සංඛනිධි මුරගල, පද්මනිධි මුරගල, සිංහ පොකුණ, ධාතු මන්දිරය, රන්මසු උයන, පිළිමගෙය වාමන රූප ඒ අතර වීය. සමස්තයක් වශයෙන් අනුරාධපුර යුගයේ වාමන රූ භාවිතය, ඒවායේ කලාත්මක අගයන් හා කුමන සංකල්පයක් මත ආගමික ගොඩනැගිලි තුළට ඇතුළත් වූයේ ද යන්න පිළිබඳවත් මෙමගින් පැහැදිලි වේ. එසේ ම වර්තමානයේ ද ආගමික ගොඩනැගිලි නිර්මාණය කිරීමේ දී පූර්වෝක්ත කරුණු අනුව සර්වකාලීන ව ඒවා ආරක්ෂා කරගනිමින් කටයුතු කළ යුතු ය.

**ප්‍රමුඛ පදඃ** අභිචාර, වාමන රූප, වාස්තු විද්‍යාව, විජයාගමනය, මහින්දාගමනය

# The Influence of Clash of Cultures for The Origin of *Svara* Names

H. Rodrigo

Faculty of Graduate Studies, University of Sri Jayewardenapura

*rodrigoharshani@gmail.com*

Indian classical music is one of the greatest and famous cultural heritages of India. It is based on seven musical notes which are called *Svara* and named as *Ṣadja, Riṣabha, Gāndhāra, Madhyama, Paṇcama, Dhaivata,* and *Niṣāda.* Although there are so many research works conducted on Indian classical music, a clear logical or scientific explanation is not given to explain when or how these names were given to the musical notes. Some explanations relate the *Svara* names to the cries of animals, numerals, parts of the human body etc. But these explanations cannot connect one *Svara* name to another. This research work provides a more accurate explanation on how and when the *Svara* names originated by using the modern archaeological evidence from ancient Indian culture. It proves how the *Indu* and *Saraswati* cultural fusion influenced the origin of *Svara* names. This research basically provides a scientific explanation on the origin of *Svara* names. It fills the gaps in the history of ancient Indian music while emphasizing a necessity of a scientific theory for the history of Indian classical music. As an applied research, this study was conducted to uncover new facts on the origin of *Svara*. Secondary sources such as translations of ancient *Sanskṛit* manuscripts and commentaries of renowned musicologists were used to draw the background of the research problem and government websites, newspaper articles of interviews with archaeologists who conducted the excavations in *Indu, Saraswati* valleys, and ancient manuscripts like *Rāmayana* were used to build up the conclusions in this research work. The new concept on the origin of *Svara* names was drawn based on the folklore and cultural mix up of Indu and *Saraswati* valley civilizations. This research work proves that the *Sapta Jāti* concept has to be the source which gave birth to the origin of *Svara* names of Indian music. The Epic period carries the characteristics of two declined civilizations which carried sacred values i.e. Vedic civilization, and profane values i.e. Indus civilization. The *Sapta Jāti* concept which was present during this period consisted seven melodies namely *Ṣadji, Ārṣabhī, Gāndhāri, Madhyami*, Paṇcami, *Dhaivati,* and *Niṣādi*. All these names can be related to the mortal and immortal beings and their folk songs present during that period and the order of the seven names were definitely congruent to the pitches which support the social hierarchy. With the decline of the Vedic and Indus civilization, those people shifted their settlements into new regions and at one point they mixed their social and cultural values which gave birth to the names of musical notes of the new musical tradition which started to establish between 1500 B.C. and 600 B.C.

***Keywords:*** *Svara, Indu, Sarawati, Sapta Jāti*

# කිරි අම්මාවරුන්ගේ දානයේ පවතින සුවිශේෂතාව පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

ඒ. එම්. යූ. එස්. කුමාරතිලක, එම්. එල්. එච්. එස්. නිරාෂා* සහ එස්. පී. නිෂාදි

සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

*chethana10011@gmail.com

කිරි අම්මාවරුන්ගේ දානය පත්තිනි දේවිය උදෙසා සිදු කරන, මෙරටේ බෞද්ධයන් අතර ප්‍රචලිත ව පවතින ඉපැරණි සාම්ප්‍රදායික පූජා ක්‍රමයක් වන අතර නිරෝගී බව හා සෞභාග්‍යය ලබා දෙන පූජාවක් ලෙස ගැමි සමාජය මෙය සලකනු ලබයි. කිරි අම්මාවරුන්ගේ දානයේ පවතින සුවිශේෂත්වය පෙන්වා දීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන අතර මෙම අධ්‍යයනය සඳහා ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, නාරංවත්ත ප්‍රදේශයේ කිරි අම්මාවරුන් පස් දෙනෙක් විනිශ්චය නියැදීම ඇසුරෙන් තෝරා ගැනුණි. එහි දී දත්ත රැස් කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිත කළ අතර ගුණාත්මක දත්ත තේමාකරණය යටතේ අර්ථ නිරූපණය කරන ලදි. පවුලේ දියුණුව, අමනුෂ්‍ය උපද්‍රව දුරු කර ගැනීම, බෝවන රෝග වැළැදීම, දරුවන්ට හා කාන්තාවන්ට වැළඳෙන රෝග පීඩා වැනි අවස්ථාවල දී කිරි අම්මාවරුන්ට භාරයක් ගැට ගැසීම සිරිතක් වන නමුත් ඇතැම්හු කිසිදු භාරයක් නො වී වර්ෂයක් පාසා නො කඩවා කිරි අම්මා දානය දීම පුරුද්දක් වශයෙන් සිදු කරි. කරති. අම්මාවරුන් තෝරා ගැනීමේදී ඒ ඒ ප්‍රදේශ අනුව වෙනස්කම් පවතී. මෙම ප්‍රදේශයට අනුව ඒ සඳහා තෝරා ගන්නේ දරුවන් හදා ඇති, මැදිවිය ඉක්ම වූ, සිල් මාතාවන් හත් දෙනෙකි. කිරි අම්මාවරුන්ගේ දානයක් පිරි නැමීමට පෙර වැදුම් කිල්ල, මල්වර කිල්ල, මරණ කිල්ල ආදි කිලිවලින් ආරක්ෂා වීමත්, දානය දීමට පෙර අඩු තරමින් දින තුනක් වත් පේවී සිටිය යුතු බවත් මෙම ප්‍රදේශයේ ජනයාගේ විශ්වාසය යි. කිරි අම්මාවරුන්ගේ දානය කපුටන් හැඬීමට පෙර ලබා දිය යුතු බව විශ්වාස කරන බැවින් මෙම කටයුත්ත ඇරඹෙන්නේ අලුයම හතරට පමණ ය. එක් පත්තිනියකට විනාඩි හත බැගින් විනාඩි 49 ක කාලයක් තුළ මෙය නිම කළ යුතු වේ. පත්තිනි පූජාව සඳහා කැවිලි සත් වර්ගයක්, පලතුරු වට්ටියක් (පලතුරු සත් වර්ගයක්), දැහැත් වට්ටියක් සහ සුවඳ ද්‍රව්‍ය ආදිය අවශ්‍ය වේ. කිරි අම්මාවරුන්ට බුලත් අතක් දී දානයට ආරාධනා කිරීම, කිරි අම්මාවරු නිවසට පැමිණෙන විට දෙපා සේදීම, කිරි ඉතිරවීම, ඉඳුල් කිරීම යනාදි චාරිත්‍රවලින් සමාජ සංස්කෘතික වැදගත්කම පිළිබිඹු වෙයි. සියලු පූජා කටයුතු, සෙත් ශාන්ති සිදු කර අවසානයේ දෙවියන් උදෙසා දැල්වූ පහනේ තෙල් අතට ගෙන නිවසේ සියලු දෙනාගේ හිසෙහි ගල්වා සෙත් පතයි. පත්තිනි මෑණියන්ට පූජා කළ සියලු පූජා ද්‍රව්‍ය කිරි අම්මාවරු හත් දෙනාට සමසේ බෙදා දෙන අතර දෙවියන්ට පින් දීමෙන් අනතුරු ව කිරි අම්මාවරුන් තම තමන්ට අයත් දාන කොටස් ද, පඬුරු වශයෙන් ලැබුණු තෑගි-බෝග ද අතට ගෙන කතා නො කොට නිවසින් පිට වී යාම සුවිශේෂී ලක්ෂණයක් වන අතර වර්තමානයේ දී  මිනිසුන් විවිධ බාර-භාරවීම් සිදු කළත් කිරි අම්මාවරුන්ගේ දානයක් සඳහා බාර-භාර වීමේ අඩු ප්‍රවණතාවයක්  හඳුනාගත හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *කිරි අම්මාවරුන්ගේ දානය, අධ්‍යයනය, බාර-භාර, කිල්ල, කිරි අම්මාවරු*

# යටත්විජිත බලපෑම හා ලාංකේය ගැමි ජීවිතයේ විපර්යාසය (අවසාන නින්දගම හා යකඩ සිල්පර නවකතා ඇසුරෙන් සිදු කෙරෙන අධ්‍යයනයක්)


පූජ්‍ය ඉඳුනිල්පුර ඉන්දානන්ද හිමි* සහ එස්. එම්. එස්. කුලරත්න

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

*indunilpura.indananda@arts.pdn.ac.lk



ශ්‍රී ලංකාවේ පැවති යටත්විජිත පාලනය හේතුවෙන් මෙරට සාම්ප්‍රදායික ගැමි ජනයාගේ ජීවන රටාව විපර්යාසයට ලක්විය. ඒ සඳහා හේතු වූයේ, යටත්විජිතවාදියාගේ ක්‍රියාකලාපය මෙන් ම එයට සම්බන්ධ වූ දේශීය පාලන පැළැන්තියේ බලපෑම යි. මේ නිසා සාම්ප්‍රදායික ගැමි ජීවන රටාවේ සමාජ, දේශපාලන, ආර්ථික හා ආගමික යන සන්දර්භ විපර්යාසයට ලක් විය. උක්ත තත්ත්වය අධ්‍යයනය කිරීමේ දී යටත්විජිත යුගය තේමා කරගනිමින් රචිත ''අවසාන නින්දගම'' හා ''යකඩ සිල්පර'' යන නවකතාවලට, එම ගැමි දිවියේ විපර්යාසය වස්තුවිෂය වී ඇති බැව් ප්‍රත්‍යක්‍ෂය. ඒ අනුව, ''ගැමි ජන දිවියේ විපර්යාසය සිංහල නවකතාවල ප්‍රතිනිර්මාණය කර ඇත්තේ කවරාකාරයෙන් ද?'' යන ගැටලුව යටතේ උභය නවකතාවල චරිත, සිද්ධි හා අවස්ථා මෙන් ම රචනෝපක්‍රම ද මූලාශ්‍රය කරගනිමින්, ගැමි ජන දිවියේ සිදු වූ වෙනස ගැන සාහිත්‍යික කියවීමක් සිදු කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. යුරෝපීය යටතවිජිතවාදියාගේ අභිප්‍රාය වූයේ යටත් භූමියේ බලය පැතිරීම, ස්වාභාවික සම්පත් හා වතුවගාවල අස්වැන්න සිය රටට ගෙන යෑම, ආගම් ප්‍රචාරය යනාදිය යි. එහි දී ලාංකේය ගැමි ජනයාට මුහුණපාන්නට සිදු වූ අභියෝග රැසකි. යටත්විජිත ආක්‍රමණිකයාගේ බලපෑම මත සිදු වූ විපර්යාසය හමුවේ ගැමි ජනයාගේ ශ්‍රමය සූරාකෑම, ලිංගික සූරා කෑම, කායික වදහිංසාවලට ලක්කිරීම සහ සමාජයෙන් කොන් කිරීම වැනි සිදුවීම් උක්ත නවකතා ද්විත්වයේ ම ප්‍රතිනිර්මාණිත ය. ''යකඩ සිල්පර'' නවකතාවට අනුව, යටත්විජිතවාදියා දුම්රිය මාර්ග ඉදිකිරීමේ දී සාම්ප්‍රදායික ගැමි ජන ජීවිතයට හා සමාජ ක්‍රමයේ පැවැත්මට බාධා එල්ල කළ අයුරුත් ඒ හේතුවෙන් මෙරට ග්‍රාමීය පාලකයන්ගේ අධිකාරිමය බලය ගිලිහීම, ලාංකේය පාලකයන්ගේ ක්‍රියාකලාප හමුවේ මෙරට සමාජ ධුරාවලියේ පහළ ස්තර නියෝජනය කළ පීඩිත මිනිසුන්ට සිදු වූ අසාධාරණය මෙන් ම කුල විභජනයේ පහළ පිරිස් මුදල් භාවිතයට යොමු වීම හේතුවෙන් සාම්ප්‍රදායික සමාජ ක්‍රමයේ ඇති වූ වෙනස ආදිය ද අවධාරණය විය. යටත්විජිත පාලකයන්ගේ හා ''මුදලි, ආරච්චි'' වැනි තනතුරු දැරූ දේශීය නිලධාරීන්ගේ හැසිරීම්, සාම්ප්‍රදායික ගැමි දිවිය විපර්යාසයට ලක් කිරීම ආදිය ඒ සඳහා නිදර්ශන ය. එසේ ම යටත්විජිත සමයේ ඉඩම් භුක්තියේ පැවති අසාධාරණය, දික්ගෙයි නැටුම් වැනි ම්ලේච්ඡ රාජකාරී ක්‍රම, ලිංගික සූරාකෑම් හා කාන්තා පීඩනය වැනි විෂමතා ''අවසාන නින්දගම'' නවකතාවේ රූපණ ඇසුරෙන් තහවුරු වේ. නිදර්ශන වශයෙන්, නවකතාවේ සමාජ වෙනස නිරූපණයේ දී ඉඩම් භුක්ති ක්‍රමයේ පීඩනය, කුල පීඩනය, සාම්ප්‍රදායික නීති ක්‍රම නිසා ඇතිවන පීඩනය මෙන්ම සමාජ ක්‍රමය පිළිබඳ නව අදහස් ඇති පරම්පරාවක ප්‍රභවය සිදුවීම යනාදිය පෙන්වාදිය හැකි ය. මේ අනුව, යටත්විජිත පාලනය නිසා ක්‍රමයෙන් විතැන් වූ සමාජ, ආර්ථික, දේශපාලන ක්‍රමවේදයෙන් විපිළිසර වන ගැමි ජනයා යටත්විජිත පාලනයේ ගොදුරු බවට පත් ව උභතෝකෝටිකයකට යටත් ව ජීවත් වූ බව උක්ත නවකතාකරුවන්ගේ නිරූපණවලින් මැනවින් ප්‍රතීයමාන වේ.



***ප්‍රමුඛ පදඃ*** *ගැමි ජනදිවිය, යටත්විජිතවාදය, සාම්ප්‍රදායිකත්වය, විපර්යාසය, පීඩනය, සමාජ ස්තරායනය*

## පෙළඹවීම් සංකල්පයේ දී, නිර්මාණකරුවා විසින් ජනවිඥානය හඳුනාගැනීමේ ඇති වැදගත්කම (ජනශ්‍රැතිය ඇසුරින් නිර්මාණය වූ වෙළඳ දැන්වීම් ඇසුරිනි)

එච්. ඩබ්. සී. පී. අහේෂිකා* සහ ඩබ්ලිව්. මුණසිංහ

නර්තන රංගකලා ඉතිහාසය සහ සිද්ධාන්ත අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

*chathurangiayesha88@gmail.com

නිර්මාණකරුවා යනු සමාජ සජීවීකරුවෙකු මෙන්ම සමාජයෙහි යම් වෙනසක් සිදු කිරීමේ අරමුණින් සිය අත්දැකීම් මෙන් ම සෙසු සමාජ අත්දැකීම් වින්දනාත්මක ආකාරයෙන් ප්‍රතිනිර්මාණය කරන්නා වේ. මොහුගේ ප්‍රධාන අරමුණ වන්නේ සිය නිර්මාණය රසවිඳීම මගින් ප්‍රේක්ෂක සමාජය ප්‍රඥාවෙන් පෝෂණය කිරීමයි. මෙහි දී පොදු ජන විඥානය නැතහොත් සමාජ විඥානය පිළිබඳ දැනුවත්භාවය නිර්මාණකරුවාට අතිශයින් ම වැදගත් වේ. විඥානය යනු යමක් පිළිබඳ වූ මූලික හැඟීම හෙවත් විශේෂිත ඥානය යි. නැතහොත් සංඥාවලට වඩා අරමුණු මුල් කොට ඇති වන්නා වූ විශේෂ විභාග දන්නා චිත්ත ගතිය වේ. හේතු ප්‍රත්‍යවලින් විඥානය හට ගන්නා බව බුද්ධ දේශනයේ සඳහන් වේ. විඥානය යනු වචනයෙන් පැවත එන සමාජ විඥානය හෙවත් ජන විඥානය යනු යම්කිසි නිශ්චිත සමාජයක පොදු ජනතාවගේ සමාජ විඥානය යි. මිනිසාගේ සංවේදී අත්දැකීම්, අදහස්, සංකල්ප විශ්වාස, ඇදහිලි යනාදියේ සමස්තය ලෙසද මෙය හඳුනාගත හැකි ය. ජන විඥානය යනු පුද්ගලයෙකුගේ ආත්මීය ප්‍රකාශනයේ සමස්තය ලෙස ද අර්ථ දැක්විය හැකි ය. පෙළඹවීම් සංකල්පයේ දී, නිර්මාණකරුවාට ජනවිඥානය හඳුනාගැනීමේ වැදගත් වන්නේ ඇයි? යන පර්යේෂණ ගැටලුව මුල් කොට ගනිමින් මෙම අධ්‍යයනය සිදු කර ඇති අතර ඒ සඳහා (Sunquick, commercial Credit, *Api wenuwen api*) යනාදී තෝරාගත් වෙළඳ දැන්වීම්හි අන්තර්ගතයන් විශ්ලේෂණයන්ට භාජනය කිරීම හා ඉලක්කගත ග්‍රාහකයින් වෙත ලබා දුන් ප්‍රශ්නාවලි මගින් ලබා ගත් දත්ත අධ්‍යයනය කිරීමත් කරන ලදි. මෙහි දී ජනශ්‍රැතිකාංග ලක්ෂණ සහිත ජන විඥානය පිළිබඳ අවබෝධයෙන් යුතු දැන්වීම් දැකීම මගින් ලාංකේය ග්‍රාහකයා ඒ හා සමීප වීමේ ප්‍රවණතාවක් ඇති බව නිගමනය කළ හැකි විය. මේ කියන්නා වූ ජනතාවගේ පොදු ඥාන මට්ටම අවබෝධ කර ගැනීමකින් තොර ව සාර්ථක පණිවිඩයක් සකස් කරගත නො හැකි අතර ඇතැම් සන්දේශ බලාපොරොත්තු නො වූ තරම් අසාර්ථක වීමට ප්‍රධාන හේතුව වන්නේ ද එම නිර්මාණ ජන විඥානයෙන් ඈත්වීම බව පසක් වී ය. මේ අනුව පෙළඹවීම් සංකල්පයේ දී, නිර්මාණකරුවා හැමවිට ම තම නිර්මාණය අභියස සිය ග්‍රාහකයාගේ පොදු ජන විඥානය දැන සිටීම වැදගත් වේ යන්න තහවුරු වී ය.

***ප්‍රමුඛ පදඃ*** *ජන විඥානය, නිර්මාණකරුවා, නිර්මාණාත්මක සන්නිවේදනය, වෙළඳදැන්වීම්කරණය, ප්‍රේක්ෂාමය සමාජය*

# ධීවර ජනතාවගේ උපසංස්කෘතිය වෙනස්වීම පිළිබඳ අධ්‍යයනයක් (හලාවත හා පුත්තලම ප්‍රදේශය ඇසුරින්)

වී. පී. එස්. එස්. බාලසූරිය* සහ එච්. ඩී. එල්. රන්දිකා

සමාජවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*sewwandibalasooriyasjp@gmail.com

21 වන සියවසේ විද්‍යා හා තාක්ෂණයේ දියුණුවත් සමඟ වර්තමාන සමාජය වෙනස් වෙමින් පවතී. මෙහි ප්‍රතිඵලයක් වනුයේ මහා සංස්කෘතිය හා සම්බන්ධ උපසංස්කෘතීන් වෙනස්වීමකට භාජනය වීම යි. ධීවර ප්‍රජාව හා සබැඳි ඔවුන්ට ආවේණික උපසංස්කෘතීන් වන භාෂාව, ආගම, සමාජ සබඳතා, ඥාතීත්වය හා ජීවන ශෛලීන් වෙනසකට ලක් වී ඇති බව සමාජය දෙස බැලීමේ දී පෙනී යයි. ඒ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ සංස්කෘතික විසරණය හමුවේ ධීවර උප සංස්කෘතිය වෙනස් වීමකට ලක් වී ඇති ආකාරය අධ්‍යයනය කිරීම යි. අධ්‍යයනය සඳහා නියැදි සමීක්ෂණ ක්‍රමය යොදා ගත් අතර හලාවත හා පුත්තලම යන ප්‍රදේශ මූලික කරගනිමින් අහඹු නියැදි ක්‍රමය යටතේ ධීවර පවුල් 25 ක් තෝරා ගත් අතර, දත්ත රැස් කිරීමේ ක්‍රම ලෙස ප්‍රශ්නාවලි හා කේන්ද්‍රීය සම්මුඛ සාකච්ඡා භාවිත කරන ලදි. මෙම නියදිය තුළ තවමත් තම රැකියාව ලෙසින් ධීවර කර්මාන්තයෙහි යෙදෙන පිරිස් 80% ක් වූ අතර, රියදුරු, කුලී වැඩ, විදේශගත වීම, ගුරු වෘත්තිය වැනි රැකියාවන් හරහා මහා සංස්කෘතියට අනුව වෙනස් වෙමින් නූතන ප්‍රවණතාවන්ගේ බලපෑමට යටත් වී ඇති පිරිස 20%ක් බව පැහැදිලි විය. මෙසේ පාරම්පරික ව උරුම වූ රැකියාවෙන් මිදී නූතන රැකියා ක්ෂේත්‍රයන්ට යොමු ව ඇත්තේ නව පරම්පරාවේ තරුණයන් වීමත් විශේෂත්වයකි. පවුලේ සිරිත්-විරිත් හා උත්සව අවස්ථා පිළිබඳ තොරතුරුවලට අනුව 30%ක ප්‍රජාව පවසා සිටියේ වැඩිවියට පත්වීම වැනි අවස්ථා උත්සවාකාරයෙන් සැමරීමට ධනවත් පවුල් පෙළඹී සිටින බව යි. මහ සමාජයත් සමඟ හඳුනා ගැනීමේ දී මෙම සමාජය තුළ පන්ති අතර ගැටුමක් දක්නට නො වුවත් ආදායම මත ඇති වී ඇති අසමානතා මොවුනට ද නො දැනුවත් ව පන්ති ක්‍රමයක් ඇති කිරීමට බලපා ඇති බව පැහැදිලි විය. සමාජ සම්බන්ධතා සහ ඥාතීත්ව රටාවන් අතීතයේ සහ වර්තමානයේ පවතින ආකාරය විමසීමේ දී 40%ක පමණ ප්‍රතිශතයක් පවසා සිටියේ තම තරුණ දරුවන් යම් යම් රැකියා සමඟින් නගරයට සංක්‍රමණය වීමත් සමඟ එම තත්ත්වයන් වෙනස්වීම්වලට යොමු වී ඇති බව යි. මේ අනුව ධීවර ජනතාව අන් සංස්කෘතීන් සමඟ ගැටෙමින් ඔවුන්ගේ උපසංස්කෘතිය ඉක්මවා ගොස් දියුණු වීම කෙරෙහි, අධ්‍යාපනය, රැකියාව, සමාජ තත්ත්වය වැනි හේතු බලපා ඇති බව පැහැදිලි වූ කරුණකි. උක්ත කරුණු අනුව පුත්තලම හා හලාවත ප්‍රදේශයන්හි ධීවර ජනතාවගේ උපසංස්කෘතික ලක්ෂණ මහා සංස්කෘතියේ පවතින යම් යම් බලපෑම් මත දෙදරා යෑම්වලට පත් ව ඇතත් වර්තමානය වන විටත් නො නැසී පවතින සංස්කෘතික ලක්ෂණයන් ද ඔවුන් සතු ව පවතින බව මෙම පර්යේෂණය හරහා තහවුරු වූ අතර ශ්‍රී ලංකාවේ ධීවර ජනතාව සතු ව පවතින ප්‍රධාන උපසංස්කෘතික ලක්ෂණ ඔවුන්ගේ රැකියාව මත ම පදනම් වී නිර්මාණ වී ඇති බවත් මෙහි දී පැහැදිලි විය.

***ප්‍රමුඛ පද:*** *සංස්කෘතිය, සංස්කෘතික විසරණය, උපසංස්කෘතිය, ධීවර ජනතාව, සංක්‍රමණය*

# Can We Treat Traditional Games as The Reflection of a Component of Implicit Culture?

H. P. N. Perera

Department of Sports Science, Faculty of Applied Sciences, University of Sri Jayewardenepura

*piumiri@sci.sjp.ac.lk*

Traditional games are still preserved in Sri Lankan context since it acts a major role in Sinhala new-year season. However, the proximity of the traditional games such as *Gudu paneema, Eluwan keemaare* gradually declining due to inception of new games to Sinhala New Year festival by unanimous people for different objectives. Traditional games had been so far identified as a reflection on explicit culture and therefore, the main aim of the study was to understand the relationship between traditional games and culture and to reveal whether the said is a sub section of implicit culture with the use of prevailing literature. The main concentration in this research was given to present a meta-analytic review of the creation of traditional games by our forefathers and to understand the blend of implicit and explicit cultural knowledge that had guided such activities. Thorough observations on traditional games played by different parties were also observed by the researcher to narrate the implicit cultural values imbedded in such games. Literature reveals that playing a game is explicit but molding a game is a part of the implicit culture. Traditional games are evolved throughout the years from its inception and had changed the basics time to time. Changes include costumes of the participants, equipment used, and the objective of playing such games. During the last few decades, the traditional games are mostly played during the new-year season and commonly in new year celebration festivals whereas as mentioned by our forefathers, those are played in households in earlier days by the family members for their satisfaction. The results of this study synthesized through observation, discussion and meta-analytic review established that it can be treated the traditional games of Sri Lanka as the reflection of component of implicit culture.

***Keywords:*** *Implicit Culture, Explicit Culture, Traditional Games, Sinhala New Year Festival, Meta-Analytic*

# Human Rights Violations and The Indian Caste System: With Special Reference to Dalit Caste System

P. K. B. I. Premarathna

University of Kelaniya

*Isurupremarathna100@gmail.com*

Anthropology's encounter with human rights is not, and never has been, one thing, a consensus, but is rather a thing of two sides, or even a multiplicity of approaches. Anthropology has been torn between analytic and critical dispositions toward human rights and divided about what substantive matters matter most, even as convergence around theory and method has been discernible since the late 1990s. Human rights are moral principles or norms that describe certain standards of human behavior and are regularly protected as natural and legal rights in municipal and international law. They are commonly understood as inalienable, fundamental rights "to which a person is inherently entitled simply because she or he is a human being" and which are "inherent in all human beings", regardless of their age, ethnic origin, location, language, religion, ethnicity, or any other status. Furthermore, Caste is a form of social stratification characterized by endogamy, hereditary transmission of a style of life which often includes an occupation, ritual status in a hierarchy, and customary social interaction and exclusion based on cultural notions of purity and pollution. Its paradigmatic ethnographic example is the division of India's Hindu society into rigid social groups, with roots in India's ancient history and persisting to the present time. In the present caste system, there are various human rights violations. This research study focuses on the Dalit caste system in the Indian community. The main objective of this research is to study human rights which are violated by the Indian caste system and the Dalit caste system in Indian society. Also, to study the impact on their traditional way of life. The research question is what human rights violations are in the Indian Dalit caste system. Research methods are qualitative research based on literature review and mainly carried out by the reference of secondary sources. According to the research, among the traditional way of life of these people, they do not have a single religion or language. At the same time, society is not a socially recognized community and can be identified as a group of people who are in severe distress and ethnic crisis. Major traditional aspects of existence, such as education, politics, health, marriage, and employment, have been severely degraded. Much of the civil rights of Dalit people have been violated due to the acute caste conflict in Indian society. The civil rights of the Dalit people are deprived of the right to education, access to health, health and nutrition, and political activities. Also, there are many Dalit people among the perpetrators. According to the statistics, there are currently 33.2% of prisoners and 24.5% of those sentenced to death. Furthermore, there are many acts of violence against Dalit women and girls. Aside from the Constitutional abolition of untouchability, there has been the Untouchability (Offences) Act of 1955, which was amended in the same year to become the Protection of Civil Rights Act. It was determined that neither of those Acts was effective, so the Scheduled Caste and Scheduled Tribe (Prevention of Atrocities) Act of 1989 (POA) came into force. But this too is not currently sufficient to prevent caste conflicts. Through this research conclusion, it is evident that Dalit people in India's society are undermined by human rights violations on caste.

***Keywords:*** *Dalit cast, Human, Rights, Human Rights violations, the Indian caste system*

# The Cultural Impacts of An Industrial Zone for the Suburban Areas: A Study Based on the *Ekala* Industrial Zone

M. D. N. G. Gunarathna

Department of Geography, Faculty of Social Sciences, University of Kelaniya

*narmadagayathrikln@gmail.com*

Culture is an umbrella term which encompasses the social behavior and norms found in human societies, as well as the knowledge, beliefs, arts, laws, customs, capabilities, and habits of the individuals in these groups. Commercial development in a sub-urban area is mainly due to the formation of industrial zones and migration. Most of the people were migrate from rural areas because of the employments. Therefore, mainly economic investments, promotion of inter-services, growth of inter-business space, development of production efficiencies and creation of partnerships are increasing around the industrial zone. This study develops our understanding on how industrial zone-based culture affects to the suburban areas. The study area is "*Ekala* industrial zone" which was the first industrial zone in Sri Lanka located at *Jaela* DSD. The main target of this study was to find out, how an industrial zone impacts to the cultural background of the society. To achieve the target, 30 individuals were selected through simple random sampling method as study participants. Observations and surveying techniques were used to collect data while other data gained from the books, magazines, and the web. Elderly persons in the study area were additionally employed as the resource persons. Most of the suburban dwellers were Buddhist and developing as a modernizing society. And the progress of communication in the area positively impact to the society. The trend of Knowledge sharing as a communication development is highly affected. The Migrants are live there for job purposely. Therefore, culture of renting houses rapidly increasing. Among the collected data, 75% of residents are having income through renting houses. As a negative impact of that, the young generation has got addicted drugs and selling drugs. According to the police reports, there are 128 people arrested because of drugs in 2020. And the religious obligation between the temples and the people is very low. Therefore, the behaviors, traditions, customs of people had been changed. We conclude that the industrial zones built up in suburban area can influence to the peoples' culture as positively and negatively.

***Keywords:*** *Impacts, Culture, Industrial Zone, Suburban*

## ජ්‍යෝතිෂයේ පොරොන්දම්වලින් විවරණය වන, විවාහ දිවියක සාර්ථකත්වයට බලපානු ලබන සමාජීය සාධක පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩබ්ලිව්. ජී. ඩී පෙරේරා* සහ එච්. කේ. ලොකුහැන්නදිගේ

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**wgihanhatton@gmail.com*

දේශීය සාම්ප්‍රදායික දැනුම් ප්‍රවර්ගයේ සුවිශේෂී අංගයක් වන ජෝතිෂ්‍යය දැනුම විවාහයේ දී නූතන ජනයා ද භාවිතය තුළින් ප්‍රකට වනුයේ ජන දිවියට කිඳාබැස ඇති බව යි. විවාහය යනු ස්ත්‍රියක් හා පුරුෂයෙක් අතර ඇති වන සමාජීය, සංස්කෘතික වශයෙන් ද තීරණාත්මක සබඳතාවකි. නූතනයේ සිදු කළ පර්යේෂණයන්ට අනුව ලිංගික තෘප්තිය, සන්නිවේදනයේ ගුණාත්මකභාවය, ආත්මාවබෝධය හා අන්‍යෝන්‍ය පරිපූර්ණත්වය යන සමාජීය සාධකයන් සාර්ථක විවාහයකට බලපාන සාධක ලෙස හඳුනාගනී, විවාහයට බලපාන කරුණු පිළිබඳ ව වූ සාම්ප්‍රදායික විවරණයක් වු පොරොන්දම් තුළින් ඒ සඳහා බලපාන නූතන සමාජීය සාධක කොතෙක් දුරට විග්‍රහ වනවා ද යන්න අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වු අතර මෙහි දී ද්විතීයික මූලාශ්‍රයන් භාවිත කරමින් පොරොන්දම් තුළින් විවරණය වන සමාජීය සාධක මතුකර ගැනීමට උත්සාහ දරයි. ගණ පොරොන්දම් තුළින් ස්ත්‍රිය හා පුරුෂයා එක ම ගණයට අයත් වේ නම් යහපත් වේ යැයි දැක්වේ. ගණය යනු පුද්ගලයා අයත් වන ගෝත්‍රය වර්ගය හෝ ස්තරයයි. සමාජ විද්‍යාත්මකව විමසන විට මෙය සමාජ ස්තරායනය හා සම්බන්ධ කළ හැක. ඒ අනුව සමාන ස්තරයන් අතර සිදුවන විවාහයන් සාර්ථක වීමට වැඩි ඉඩකඩක් පවතීන අතර එය දෙදෙනා අතර ඇතිවන සන්නිවේදනයට වැදගත් වේ. විවාහයක දි වැදගත් වන සාධකයක් ලෙස ලිංගිකත්වය හඳුනා ගතහැකි අතර ලිංග හා යෝනි පොරොන්දම තුළින් එකී සාධකය පිළිබඳ යම් පූර්වකථනයක් සපයයි. නූතනයේ දී උක්ත දැක්වූ සමාජීය සාධකවලට අමතර ව ජීව විද්‍යාත්මක කරුණු පිළිබඳව අවධානය යොමු කරයි. නාඩි පොරොන්දම මෙකී තත්ත්වයට අදාළව පැවතියා වූ සාම්ප්‍රදායික දැනුමේ භාවිතය විශද කරයි. විවාහයක තෘප්තිය රඳා පැවතීම සඳහා බලපාන සාධකයක් ලෙස දරුවන් හඳුනාගත හැකි ය. ඒ පිළිබඳ වෘක්ෂ හා දින පොරොන්දම තුළින් සිදු කරන විවරණය හා ගැලපීම එකී සාධකය කෙරෙහි සාම්ප්‍රදායික සමාජය දැක්වූ අවධානය ප්‍රකට කරවයි. දෙදෙනා අතර පවතින සන්නිවේදනයේ ගුණාත්මකභාවයට වූ පූර්වකථනයක් ස්ත්‍රී දීර්ඝ පොරොන්දම තුළින් හඳුනාගත හැකි ය. පුද්ගල දෘෂ්ටිය පුද්ගල සබඳතාවලට බලපාන තවත් ප්‍රබල සාධකයක් වේ. පක්ෂි පොරොන්දම එහි දී වැදගත් ය. මෙම කරුණුවලට අනුව විමසා බලන විට සාම්ප්‍රදායික වශයෙන් පවතින දැනුම ප්‍රවර්ගයක් වන පොරොන්දම් සංකල්පය තුළින් විවාහයක දී වැදගත් වන නූතන සමාජීය සාධක පිළිබඳ ස්වාභාවික සංකල්පයන් අනුසාරයෙන් යම් පූර්වකථනයන් ඉදිරිපත් කිරීම දැකගත හැකි ය. ඒ අනුව සාම්ප්‍රදායික දැනුම ප්‍රවේශයන් තුළින් ද නූතන සමාජ ප්‍රපංචයන්හි ලක්ෂණ විවරණය වීමක් මෙයින් ප්‍රකට වේ.

***ප්‍රමුඛ පදඃ*** *සාම්ප්‍රදායික දැනුම, පොරොන්දම්, විවාහ, සමාජීය සාධක, ජ්‍යෝතිෂය*

# ජන සමාජය හා සංස්කෘතිය පිළිබඳ බ්‍රිතාන්‍ය ආකල්පः මිෂනාරී වාර්තා ඇසුරින්

එස්. ඒ. ඩී. ඩී. ධනවර්ධන

ඉතිහාස අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

*dulanjalidhanawardhana@gmail.com*

බ්‍රිතාන්‍ය මිෂනාරීන් යනු කිතු දහම ව්‍යාප්ත කිරීමේ අරමුණින් මෙරටට ක්‍රි.ව. 18, 19 සියවස්හි පැමිණි පිරිසක් වුව ද ඔවුන් දේශීය ගැමි ජීවන රටා, සංස්කෘතිය පිළිබඳ ව කුතුහලයකින් යුක්ත ව මෙන් ම පසුගාමී සමාජ ලක්ෂණ පවතින සමාජ ක්‍රමයක් ලෙස රචනා කරන්නට විය. ජේම්ස් කෝඩිනර්, මිරන් වින්ස්ලෝ, ස්පෙන්සර් හාර්ඩි, එම් ඩබ්ලිව් ලීච්, හීබර් රෙජිනෝල්ඩ් සහ ඩබ්ලිව්. එම්. හාවර්ඩ් වැනි මිෂනාරී වාර්තාවන්හි මෙරට ආගම් පිළිම වන්දනා කරනු ලබන මිථ්‍යාදෘෂ්ටික ආගම් ලෙස දැඩි විවේචනයට ලක් කිරීම එම වාර්තාවන්හි මූලික අරමුණ වුව ද යටත්විජිත සන්දර්භය තුළ දේශීය ගැමි සමාජය, සංස්කෘතිය පිළිබඳ ව අධ්‍යයනය කිරීමට ශක්‍යතාවක් පැවතීම මෙම වාර්තාවන්හි පවතින සුවිශේෂීත්වය යි. එනම් බ්‍රිතාන්‍යය මිෂනාරීන්ගේ පෙරදිගවාදී ප්‍රවේශය තුළ පැවති දේශීය සමාජය අවතක්සේරු කිරීමේ දැක්ම තුළ මෙරට උඩරට, පහතරට තුළ පැවති කුල ක්‍රමය පිළිබඳ පමණක් නො ව ලීච්ගේ වාර්තාවන් ඇසුරින් යාපනයේ හින්දු පාසල්හි කුල පිළිබඳ දරුවන් තුළ පැවති බිය, කුලය මත ම විවාහය සිදු වූ ආකාරය පිළිබඳ අධ්‍යයනය කළ හැකි ය. කාන්තාවට සම්පූර්ණයෙන් ම තහනම් ව මෙරට උසස් පවුල්වල පිරිමින්ට පමණක් විවෘත ව පැවති අධ්‍යාපනය පිළිබඳ වාර්තා කරනු ලබන මිරන් වින්ස්ලෝගේ වාර්තා ඇසුරින් ම මෙරට ප්‍රාථමික අධ්‍යාපනය වැලි, තල්කොළ මත මෙන් ම කටපාඩම් කිරීමේ ක්‍රමවේදය තුළ සිදු වූ ආකාරය පිළිබඳ අධ්‍යයනය කළ හැකි ය. සිංහලයන් තුළ පැවති නිමිති විශ්වාසයන් හා බැඳි මඩු ශාන්තිකර්ම, ග්‍රහයන් මත ජීවිතය තීරණය කරගත් ආකාරය, මෙන් ම මෙරට ජනතාවගේ ප්‍රාථමික නිවාස, ඇඳුම්-පැළඳුම්, ආහාර ආදි සියලු දෑ මිෂනාරි වාර්තාවන්හි අන්තර්ගත ය. දේශීය සමාජය පිළිබඳ මිෂනාරි වාර්තා ඇසුරින් යටත්විජිත සන්දර්භයේ මෙරට ග්‍රාමීය ජන ජීවිතය හා සංස්කෘතිය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන අතර මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වන්නේ යටත්විජිතකරණයට පෙර සාම්ප්‍රදායික සමාජය කෙබඳු වේ දැයි අධ්‍යයනය කිරීම යි. බ්‍රිතාන්‍යය පරිපාලකයන්ගේ වාර්තාවලින් ව්‍යුත්පන්න ව දේශීය ගැමි සමාජය පිළිබඳ ආගමික කණ්ඩායමක් වූ බ්‍රිතාන්‍යය මිෂනාරින්ගේ පෙරදිගවාදී ප්‍රවේශය ඇසුරින් අධ්‍යයනය කිරීමට හැකි වීම මෙම පර්යේෂණයෙහි පර්යේෂණ වැදගත්කම යි. දේශීය ගැමි සමාජය හා සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී සාහිත්‍ය මූලාශ්‍ර හමුවන ඉතා වැදගත් ම අවධියක් වන්නේ බ්‍රිතාන්‍ය යටත්විජිත සන්දර්භය යි. මෙම අවධිය තුළ සිට සමස්ත දිවයින ම බටහිරකරණයට ලක් වූ අතර මේ අනුව මෙයට පෙර පැවති සාම්ප්‍රදායික ජන සමාජය හා සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී බ්‍රිතාන්‍යය මිෂනාරි වාර්තා ඉතා වැදගත් ය. ඔවුන්ගේ ප්‍රාචීනවාදී දෘෂ්ටිය තුළ දේශීය සමාජය, සංස්කෘතිය විවේචනය කිරීමක් පැවතිය ද එම දැක්ම ඇසුරින් ම සාම්ප්‍රදායික ජන ජීවිතය හා සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනය කළ හැකි බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදः*** *මිෂනාරීන්, කුලය, විවාහය, අධ්‍යාපනය, නිමිති*

# Folk Tradition of Tamils with Special Reference to the *Villuppaatu*

N. Baskaran

Department of Sociology, South Asian University, New Delhi

*bassau2014@gmail.com*

The folk tradition is an important aspect of human life in a certain community or territory. People of different religious, cultural backgrounds possess unique attitudes, values, norms, practices that reflect their traditional folk. The origin of Tamil folk art and literature are shrouded in obscurity. Primarily, people engaged in agriculture are concerned, from the 'folk' of *Tamilnadu*. *Villuppattu* is a melodious storytelling folk art form hugely revered by the Tamils. In this context, this paper focuses on *Villuppattu* practices and religious devotions in Tamil society and culture in the present. Also, the study enables them to gain a broad understanding of *Villuppattu* folk sound and sites as a tool of people experiencing in past and present among Tamils. This study relies heavily on visual narratives about *Villuppattu's* performance. In this context, qualitative data is important to understand deeply about the narratives of how the performance and audiences themselves describe their experience during the performance. The *Villuppattu* is a melodious storytelling art form hugely revered by the Tamils in *Tamilnadu* and Sri Lanka. The *Villuppaatu* is performed during temple festivals and cultural events. The festivals have gained worldwide popularity, as many organizations are involved in preserving these ancient arts. Thus, this was the traditional art form that originated in the Southern districts of *Tamilnadu*. Nowadays, these are performed in the open stage of the temples all over *Tamilnadu*, and various folk institutes and social media are giving opportunities for *Villuppaattu* by sharing the visual representation of previous videos of the performance. It shows the memories and re-articulation of the traditional form of *Villupattu* performances in the social media spaces.

**Keywords:** *Folk Traditions, Tamils, Villuppaatu, Sound and Site, Social Media*

# වතුර කළ මැතිරීමේ සංස්කෘතික චාරිත්‍රය පිළිබඳ ව මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

එච්. පී. සී. දේශානි

සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*deshanihewapathirana@gmail.com*

මිනිසා සිය පරිසරයට අනුවර්තනය වීම සහ අවශ්‍යතා ඉටු කරගැනීම සඳහා සංස්කෘතිය නිපදවාගෙන ඇති අතර ඒ තුළ එන සියලු සංස්කෘතික අංග මිනිසාගේ විශ්වාස පද්ධතිය සමග අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පැවති. දකුණු පළාතට ආවේණික වූ සුවිශේෂී චාරිත්‍රයක් ලෙස වතුර කළ මැතිරීමේ චාරිත්‍රය හඳුන්වා දිය හැකි ය. මිරිස් පිච්චීම, අබ පිපිරවීම, දෙහි කැපීම වැනි ලංකාව පුරා පවතින පොදු චාරිත්‍ර හැරුණු කොට දකුණු පළාතට පමණක් සුවිශේෂී වූ මෙම චාරිත්‍රය ඇස්වහ කටවහ දුරු කිරීම සඳහා සිදු කරනු ලබයි. මෙම අධ්‍යයනය මෙකී චාරිත්‍රය හා සම්බන්ධ ක්‍රියාවලිය පිළිබඳ මානව විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් අධ්‍යයනය කිරීම හා එහි එන චාරිත්‍ර රටාවන් තුළින් සමාජය අපේක්ෂිත කාරණා මොනවා ද යන්න අධ්‍යයනය කිරීම අරමුණු කරගෙන සිදු කරන ලදි. විවරණාත්මක පර්යේෂණ ක්‍රමය යටතේ සිදු කරනු ලැබූ මෙම අධ්‍යයනය සඳහා දත්ත ඒකරාශී කිරීම හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන් සිදු කරන ලදි. දත්ත ඒකරාශී කිරීම සඳහා මේ පිළිබඳ දැනුම ඇති වැඩිහිටි පුද්ගලයින් 20ක් සමග සම්මුඛ සාකච්ඡා පවත්වන ලද අතර සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනය ද සිදු කරන ලදි. වතුර මැතිරීම දකුණු පළාතට ආවේණික වූ සුවිශේෂී චාරිත්‍රයකි. ඇස්වහ කටවහ දුරු කරලීම සඳහා වතුර කළ මැතිරීම සිදු කරනු ලබයි. මුලින් කපුරාල විසින් යොදාගත් දින උදෑසන රෝගාතුර පුද්ගලයා නිවසේ ඉදිරිපස අසුන් ගන්වා මෙම චාරිත්‍රය ආරම්භ කරනු ලබයි. මෙකී චාරිත්‍රය සඳහා නැවුම් කළයක්, කපු පුළුන්, දෙහි කොළ 7ක් සහිත අත්තක් යන ද්‍රව්‍ය අවශ්‍ය ය. රෝගාතුර වී සිටින පුද්ගලයා පේ වීමේ සිට මතුරන ලද වතුර කළයක් ස්නානය කොට අවසන් කිරීම දක්වා චාරිත්‍ර විධි සමුදායක් මේ තුළ වෙයි. රෝගියා දිනකට පෙර හෝ මස් මාංශවලින් තොර වීම, කාක්කන් හැඬලීමට පෙර වතුර ගැනීම, වතුර ලබා ගැනීමේ දී දිය නැවුම් කළයකට දැමීම, ඊට කහ සහ කපු පුළුන් දැමීම, මැතිරීම සඳහා යොදා ගන්නා දෙහි අත්ත දෙහි කොළ හතකින් සමන්විත වීම, මැතිරීමෙන් වරු තුනක් ගත වන තුරු නිවසින් බැහැරට නො යෑම, කිලි යැයි සම්මත දෙයින් බැහැර වීම යනාදි චාරිත්‍ර විධි ගණනාවක් මේ තුළ වෙයි. මෙහි අවසානයේ දෙහි දුර්වර්ණ වී තිබීම ඇස්වහ කටවහ ඉවත් වීමක් ලෙස ජනයා විශ්වාස කරති. වතුර කළ මැතිරීම දකුණු පළාතට සුවිශේෂී චාරිත්‍රයක් වුව ද වර්තමානයේ මේ සඳහා යොමුවීමේ ප්‍රවණතාවයේ අඩුවක් දක්නට ලැබේ. එබැවින් මෙවැනි චාරිත්‍ර විධීන් අධ්‍යයනය හරහා සාම්ප්‍රදායික සමාජ සංස්කෘතික දැනුම සුරක්ෂිත කිරීම වැදගත් ය.

***ප්‍රමුඛ පදඃ*** *වතුර කළ මැතිරීම, දකුණු පළාත, චාරිත්‍ර විධි, සංස්කෘතිය*

# දහවන සියවසේ සෙල්ලිපි මඟින් එවක සමාජ පාලන ක්‍රමයන් හා නීතීන් පිළිබඳ හෙළි වන කරුණු පිළිබඳ අධ්‍යයනයක්

යූ. කේ. ආර්. එස්. පී. විජේසිරි*, ඇල්පිටියේ විමලධම්මික හිමි සහ ඩී. එන්. ටී. හේවාමාන්න

මානව විද්‍යා අධ්‍යයනාංශය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**pradeepikalk@gmail.com*

ලෝකයේ කුමන සංස්කෘතියක වුව ද ඓතිහාසික තොරතුරු විවරණය කර ගැනීමට හැකි ප්‍රමුඛතම මූලාශ්‍රයක් වන්නේ ශිලා ලේඛනයන් ය. එය අප රටේ ද වැදගත් මූලාශ්‍රයකි. රටක සමාජ පාලන ක්‍රමයන් හා නීතිය යනු සියලු සමාජ සංස්ථා පාලනය වන අද්විතීය බලවේගයක් වන නිසා එම යුගයේ සමාජ සංස්ථාවන්ගේ ක්‍රියාකාරීත්වයට පෙරවදනක් ද මෙම අධ්‍යයනය තුළින් අවබෝධකර ගත හැකි ය. මෙම අධ්‍යයනයෙන් දහවන සියවසේ සෙල්ලිපි මඟින් අනාවරණය වන සමාජ පාලන ක්‍රම හා නීතිය පිළිබඳ විමර්ශනය කෙරෙන අතර මෙහි දී සිංහලයාගේ සමාජ පාලන ක්‍රම හා නීතිය ක්‍රියාත්මක වූයේ කෙසේ ද? එම නීතීන් මොනවා ද? යන්න පර්යේෂණ ගැටලුව කර ගනිමින් අධ්‍යයනය සිදු කෙරුණි. අතීත සෙල්ලිපි මඟින් විවරණය වන නීතීන් හා සමාජ පාලන ආකාර පිළිබඳ අවබෝධයක් නූතන දැනුම් ලෝකයට දායාද කිරීම පර්යේෂණයේ මූලික අරමුණ විය. මෙහි දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් සම්මුඛ සාකච්ඡා, විශ්වවිද්‍යාලයේ ඒ හා ප්‍රවීණ ආචාර්යවරුන් දෙදෙනෙකු සමඟ ද, ශිලා ලේඛන අතර මිහින්තලා පුවරු ලිපි, බදුලු ටැම්ලිපිය, වේවැල්කැටිය ලිපිය සහ කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරුලිපිය ද, ද්විතීයික මූලාශ්‍රය වශයෙන් මේ සම්බන්ධයෙන් ඇති කෘති හා අන්තර්ජාලය භාවිතයට ගැනිණි. ලෙන් ලිපි, ගිරිලිපි, ටැම්ලිපි, පුවරුලිපි හා වෙනත් ලිපි වශයෙන් වන ශිලා ලේඛන තුළ, සිටවූ ගල්වල රචිත ටැම් ලිපිවල භික්ෂූන්ට ප්‍රදානයන්, ගම්-ඉඩම්, විහාර අයබදු එකතු කිරීම ආදි විවිධ නීති-රීති වැඩි වශයෙන් අන්තර්ගත ය. රුවන්වැලි සෑය හා බදුලු ටැම් ලිපිය මේ සඳහා නිදසුන් ය. විවිධ සමාජ පාලන නීති-රීති භික්ෂූන් ඇතුළු ආරාමික සේවකයන් ද, රජයේ නිලධාරින් හා සංවිධාන ව්‍යූහයට අදාළ නීති ද දන්වා ඇත. IV වන මිහිඳුගේ මිහින්තලා පුවරුලිපි, V වන කාශ්‍යපගේ පුවරුලිපිය, බදුලු ටැම් ලිපිය හා වේවැල්කැටිය යන සෙල්ලිපි තුළ රාජ්‍ය නායකත්වය පිළිබඳ ව හා එම නායකත්වය පැවතෙන, පැවරෙන ආකාරයන් ද රජවරුන්ට පවරන විවිධ උපාධි නාම හා රජුගේ කාර්යයන්, බලය බෙදී යාම සඳහා නිලතල පැවරූ අමාත්‍ය මණ්ඩල විස්තර ද මේවායේ අන්තර්ගත වේ. මහරද්, සෙනවි, රදොලන්, දඩනායක, සම්දරුවන්, කණක්කරු, උල්වාඩු, මෙකාප්පර්, ගම අඩවිය අටදෙනා, පිරිවහන්නා, කුඩසාලා, අරක් සමණන් ආදි විවිධ නිලධාරින්ගේ තොරතුරු දැක්වේ. එසේ ම විවිධ රාජ්‍ය සංවිධාන පිළිබඳ ව බදුලු ටැම් ලිපියෙන් කරුණු දක්වන අතර අධිකරණ සංවිධානය පිළිබඳ ව වේවැල්කැටිය ලිපිය තුළ විශාල තොරතුරු ප්‍රමාණයක් අන්තර්ගත ය. එතුළ එවක ලංකාවේ පැවති අපරාධ නීතිය පිළිබඳ ව කරුණු බොහොමයක් හමුවේ. උසාවි ක්‍රමයක් ක්‍රියාත්මක වීම හා දණ්ඩනායකවරයා යටතේ එම ක්‍රියාවලිය සිදු වීම ද, දඬුවම් ක්‍රම අතර මරණීය දඬුවම දක්වා පුළුල් වූ දඬුවම් ආකාර පැවති බව ද මේ සෙල්ලිපි තුළින් අවබෝධ කරගත හැකි ය. සාමාන්‍ය දෛනික දිවිය ගෙවීමට හා වෙළඳාම් කිරීමට, ඉඩම් පාලනයට, කිරුම් මිනුම් ක්‍රම, අයබදු ආදි බොහෝ කාරණා පිළිබඳ කරුණු ඇතුළත් වන අතර ඓතිහාසික වශයෙන් මෙරට සමාජ පාලන හා නීති ක්‍රමයන් පිළිබඳ විමසීමේ දී මෙම දහවන සියවසේ ඉතා දියුණු හා ක්‍රමවත් පාලන ක්‍රමයන් පැවති බව නිගමනය කිරීමට හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *දහවන සියවස, සෙල්ලිපි, නීතිය, සමාජ පාලනය, ඓතිහාසික*

# A Comparative Study on Foundation Myths of Sri Lanka and Korea

C. V. Diddeniya

Department of Modern Languages, University of Kelaniya

*vivanthi@yahoo.com*

Foundation myths (also called origin myths or creation myths) explain the origin of nations or countries. Most of the countries have their own anecdotal legends. The creation myth of a country originated more than thousands of years ago and have been transferred from the generation to generation until today. In the Sri Lankan context, the story of 'Vijaya' reported in 'Mahawansa' is considered as the story of the origin of 'Sinhalese' ethnic group. 'Vijaya' is believed to be a descendent from a lion and an exiled prince from India, who landed to Sri Lanka with his 700 colleagues. 'Sinhalese' people think that 'Vijaya' was the founder hero of Sinhala civilization. Similarly, Korea has many folk tales about the foundation myths of the origin of the Korean people. Among those, 'Dangun' is the most treasured story that they have. It is a story of the sky father and earth mother. Dangun's father was the heaven's son and mother was a bear who transferred to a woman. 'Dangun' was the progenitor of the Korean peninsula and the first king of 'Gojoseon' dynasty. The aim of this study was to conduct a comparative study on the Sri Lankan and Korean foundation myths specially by comparing the stories of 'Vijaya' and 'Dangun'. Through this study it was able to find out not only the similarities and differences, but also social environment and historical background of both countries in ancient times. As a conclusion, some facts can be identified as similarities in both myths, such as the appearance of animals, human characters, social environment, and rooted religious facts, recorded in historical documents. Both the countries created their kingdoms because of the arrival of anecdotal legends, King 'Vijaya' and 'Dangun'. Finally, this study gives guidelines to understand the history, social environment, and the beliefs of both countries.

***Keywords:*** *'Dangun', Foundation Myths, Folk Tales, Korea, Sri Lanka*

# ඉසදිය නෑම ලාංකික කුටුම්බ සංස්කෘතිය කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ සමාජීය සහ නෛතික විශ්ලේෂණයක්


ආර්. පී. එස්. එස්. රාජපක්ෂ

නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

*shashirajapaksha2016@gmail.com*



අතීත ලාංකික ජන සංස්කෘතිය පවුල මත ගොඩනැගුණ අතර කාන්තාව පිළිබඳ පැවති ගතානුගතික ආකල්පය වූයේ කායික බුද්ධිමය සහ ආධ්‍යාත්මික වශයෙන් ස්ත්‍රිය පුරුෂයා සමග සම නො වන බවත් මවක සහ භාර්යාවක වශයෙන් බහුවිධ කාර්යභාරයක් ඉටු කළ යුතු බවත් ය. ලාංකේය ජන ජීවිතයෙහි කුටුම්බ සංස්ථාවට මූලික ස්ථානයක් හිමි වූ අතර එහි දී කාන්තාව ඉසදිය නෑම හෙවත් කන්‍යාභාවය පරීක්ෂා කිරීමේ පිළිවෙත කුටුම්බ සංස්ථාවේ මූලික අත්තිවාරම වී ඇත. මෙය ලාංකේය නීතියේ පවතින 1907 අංක 19 දරන සාමාන්‍ය විවාහ ආඥා පනතෙහි සහ සිවිල් නඩු විධාන සංග්‍රහයේ විවාහය සහ දික්කසාදය සඳහා සැපිරිය යුතු සුදුසුකමක් නො වූව ද අප විවාහ සංස්කෘතියෙහි මූලික සාධකයක් වී හමාර ය. ඒ අනුව විවාහ දිනයේ දී සිදු වන ඉසදිය නෑම හෙවත් කන්‍යාභාවය පිළිබඳ පරීක්ෂණය ලාංකේය ජන ජීවිතය කෙරෙහි අහිතකර ලෙස බලපෑමක් සිදු කර ඇත් ද? ඒ සඳහා පවතින සමාජීය සහ නීතිමය බලපෑම්  කවරේ ද? යන්න මෙහි අධ්‍යයන ගැටලුව විය. ලාංකේය ජන ජීවිතයෙහි ඉසදිය නෑමට අදාළ වන සමාජීය සහ නිතීමය කරුණු සියුම් ව අධ්‍යයන කිරීම මෙහි පවතින දුර්වලතා හඳුනාගැනීම සහ ඒ සදහා අවශ්‍ය නිර්දේශයන් ඉදිරිපත් කිරීම අධ්‍යයනයෙහි අරමුණු වේ. මෙම අධ්‍යයනය ගුණාත්මක අධ්‍යයන ක්‍රමය මත පදනම් විය. ඒ අනුව ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රයන් භාවිත කරනු ලැබූ අතර ප්‍රාථමික මූලාශ්‍ර ලෙස අණපනත්, නීති රෙගුලාසි, නඩු තීන්දු ද ද්විතීයික මූලාශ්‍ර ලෙස ශාස්ත්‍රීය ලිපි, අන්තර්ජාල ලිපි භාවිත කරනු ලැබී ය. කරුණු වැඩිදුර තහවුරු කිරීම සඳහා නීතිවේදීන් සහ පාරම්පරික කුල කාන්තාවන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වී ය. මෙහි දී ආදර සබඳතා මගින් සිදු වන විවාහයන්වල දී  ඉසදිය නෑම පරීක්ෂා කිරීම අවම මට්ටමක පවතින නමුත් යෝජිත විවාහයන්වල දී සක්‍රීය ව ක්‍රියාත්මක වන බවත්, දික්කසාදය සඳහා මූලික පදනමක් සේ ම කාන්තාවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන බවත් අනාවරණය විය. එහි දී ස්වාභාවික ව ම කන්‍යාපටලය පිහිටා නො තිබීම, බාහිර ක්‍රියාකාරකම් කිරීම සහ පරීක්ෂණය ක්‍රියාවට නංවා එහි ප්‍රතිඵල විමසා බැලීම හේතුවෙන් පවුල් සංස්ථාව බිඳ වැටීම, දරුවන්ගේ සුජාතභාවය ගැටලුසහගත වීම සහ දූෂිත තරුණියක් ලෙස අපවාදයන්ට ලක් වීම ආදි ගැටලු රැසක් පැන නැගී ඇත. දැනට පවතින නීතියේ මෙයට විසඳුම් නොමැති අතර සමාජීය සහ නීතිමය ආරක්ෂණයක අවශ්‍යතාව පැන නැගී ඇත. මේ සඳහා ලිංගික අධ්‍යාපනය විධිමත් ලෙස අධ්‍යාපන ක්‍රමයට එකතු කිරීම, ගැහැනු ළමුන් බාහිර ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී කන්‍යාභාවය ආරක්ෂා කර ගනිමින් කටයුතු කිරීම සඳහා දැනුවත් කිරීම සහ කාන්තාවගේ පිරිසිදුභාවය තහවුරු කිරීම සඳහා වෛද්‍යමය සහ නීතිමය රැකවරණය ලබා දීමේ නීති සම්පාදනය සහ ආයතන ඇති කිරීමේ අවශ්‍යතාව පැන නැගී ඇත. මෙනිසාවෙන් සුචරිතවත් දියණියක් සෙවීම අවශ්‍ය වන නමුත් වඩාත් හරවත් වන්නේ සුචරිතවත් පුතුට සුචරිතවත් දියණියක් සෙවීම යන්න සමාජ මතය වී ඇත.



***ප්‍රමුඛ පදඃ*** *කාන්තාව, ජන සංස්කෘතිය, ඉසදිය නෑම, නීතිය*

# සිංහල හා ද්‍රවිඩ සංස්කෘතීන් තුළ මල්වර චාරිත්‍ර වාරිත්‍රයන්හි වෙනස්කම් පිළිබඳ අධ්‍යයනයක් (බදුල්ල හොප්ටන් වතුකරය ඇසුරෙන්)

ආර්. ඩබ්. ජේ. කේ. විජේරත්න[1*] සහ එම්. එස්. ඩී. වීරසූරිය[2]

[1]සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, [2]පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*kumudumaliwijerathne@gmail.com

ද්වාරකර්ම චාරිත්‍රයක් ලෙස සැලකෙන මල්වර චාරිත්‍රය පුරාතනයේ සිට පැවත එන්නකි. දැරිවියක වැඩිවියට පත්වීමේ දී පැවැත්වෙන මෙම චාරිත්‍රය ප්‍රදේශයෙන් ප්‍රදේශයට මෙන් ම එක ම ප්‍රදේශයක වුව ද විවිධ ආගම් අනුව වෙනස්කම් හඳුනාගත හැකි ය. මල්වරය විශේෂයෙන් ම මාතෘත්වයේ ආරම්භය මෙන් ම සෞභාග්‍යයේ සංකේතය ලෙස ද පැරණි ශාස්ත්‍ර විශාරදයින් පවසා ඇත. කාන්තාවකගේ ජීවිතයේ සිදු වන මෙම සුවිශේෂී අවස්ථාව සෑම කාන්තාවකට ම පොදු වූව ද ආගමික විවිධත්වය හේතුවෙන් ඉටු කරන චාරිත්‍ර-වාරිත්‍රවල විවිධත්වයක් දැකිය හැකි ය. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ එකී විවිධත්වය හඳුනාගැනීම යි. එනම් එක ම ප්‍රදේශයක වෙසෙන බෞද්ධ හා හින්දු ආගම්වල මල්වර චාරිත්‍රයන්හි වෙනස්කම් මෙහි දී අධ්‍යයනය කොට ඇත. ඒ අනුව අධ්‍යයන ප්‍රදේශය ලෙස බදුල්ල දිස්ත්‍රික්කයේ ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හොප්ටන් ගම්මානය යොදා ගැනුණි. මෙහි සිංහල හා ද්‍රවිඩ යන ජන වර්ග දෙක ම ජීවත් වුව ද වතු කර්මාන්තය හා බැඳි ද්‍රවිඩ පවුල් වැඩි වශයෙන් ජීවත් වේ. මේ අනුව සමස්ත පවුල් 350න් සිංහල පවුල් 10ක් ද ද්‍රවිඩ පවුල් 15ක් ද අධ්‍යයනය සඳහා යොදාගන්නා ලදි. එම පවුල්වල වැඩිහිටියන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා මඟින් මල්වර චාරිත්‍රයන් සම්බන්ධ ව තොරතුරු ලබා ගත්හ. ද්විතීයික දත්ත රැස් කිරීමේ දී කෘතීන් හා අන්තර්ජාලය භාවිත කෙරුණි. වැඩිවියට පත් දැරියක නහවා ගෙට ගැනීම සිංහල මෙන් ම ද්‍රවිඩ චාරිත්‍රවල ද පවතින්නක් වුව ද එම වත්පිළිවෙත් සිදු කෙරෙන ආකාරය විවිධ ය. එසේ ම දැරිවියගේ සංක්‍රාන්තික අවධිය ගෙවන කාලය මෙන් ම නැකැත් සිදු කරන පිළිවෙත එකිනෙකට වෙනස් වේ. සිංහල ජනයා "රෙදිනැන්දා" ද්‍රවිඩ ජනයා හඳුන්වන්නේ "ඩෝබි" යන නාමයෙන් ය. මෙහි දී සිංහල ජන කොටස්හි අතීතයේ දී විවිධ චාරිත්‍ර රෙදි නැන්දා අතින් සිදු වුව ද වර්තමානයේ එම චාරිත්‍රය වෙනස් වී ඇත. නමුත් ද්‍රවිඩ පවුල්වල ඩෝබි අතින් සිදු වන චාරිත්‍ර අදටත් එලෙස ම සිදු වන බව හඳුනාගත හැකි ය. ද්‍රවිඩ චාරිත්‍රවලට අනුව දැරිවිය සංක්‍රාන්තික අවධිය දින 16ක් අනිවාර්යෙන් ම විසිය යුතු අතර සිංහල චාරිත්‍රවලට අනුව දැරිවිය සංක්‍රාන්තික අවධිය තීරණය වන්නේ නැකැත් පත්‍රය අනුව යි. එම කාලය අතරතුර ද්‍රවිඩ දැරියන්ට තලතෙල් හා බිත්තර පානය කිරීමට ලබා දීම අනිවාර්ය යි. සිංහල චාරිත්‍රවලට අනුව දැරිවියට තෙල් ආහාර ලබා දීමෙන් වළකියි. මේ ආකාරයට සිදු කරන සෑම චාරිත්‍රයකට ම විවිධ අරුත් ද ගැබ් වී ඇත. ඒ අනුව මෙම අධ්‍යයනය මඟින් සිංහල හා ද්‍රවිඩ ජනයා අතර මල්වර චාරිත්‍ර වාරිත්‍රයන්හි වෙනස්කම් රැසක් හඳුනාගත හැකි වුව ද මෙම චාරිත්‍රවලින් සිංහල මෙන් ම ද්‍රවිඩ යන දෙපාර්ශ්වය ම බලාපොරොත්තු වන්නේ දැරිවියගේ අනාගතයේ විවාහ දිවිය සාර්ථක වීම, දරු සම්පත්තිය ලැබීම, ග්‍රහ දෝසවලින් ආරක්ෂා කිරීම මෙන් ම ගෞරවාන්විත ව සමාජගත කිරීම වැනි දැරිවියගේ සුබසිද්ධිය සඳහා වන කාරණාවන් ය.

***ප්‍රමුඛ පද:*** *මල්වර සිරිත්, ද්‍රවිඩ මල්වර සිරිත්, සිංහල මල්වර සිරිත, හොප්ටන් වතුකරය*

# A Livelihood Analysis on the Fishing Community in Southern Coastal Area, Sri Lanka

M. S. A. Mendis* and M. R. A. Mendis

Department of Sociology, University of Sri Jayewardenepura

*rojianusari@gmail.com

The concept of livelihood is being increasingly applied in research on regional development, poverty alleviation, rural agricultural development, and rural resource management. The sustainable livelihood denotes people's capacity to maintain living by surviving shocks, stress and enhancing quality of life on log-term basis. This paper is based on a study of fishing community substantially depend on the harvest processing of fishery resources in southern coastal area in Sri Lanka. Within the sustainable livelihood framework, this study was geared to assess the livelihood assets and strategies of the fishing community, to find relationships between the fishery industry and the development of livelihood, to identify the problems of livelihood and examine institutional intervention and to discuss how the livelihood relate to their asset base and vulnerability context. A sample of 10% out of 713 households was selected according to stratified random sampling method and five different data collection methods were employed for data collection: questionnaire survey, semi structured interviews, direct observation and case studies. Data were analyzed using qualitative and quantitative methods. The study found that 86% of households were undertaken fishing while 15% engaged in fish drying process as supplementary means of income. Conditions of houses were very low with 86% of cadjan huts. The majority (66%) had education level up to grade 8 while few of them (44%) had no education. The study further ascertained that the people are generally deprived of basic utilities. The lack of intervention by government and geographical location were the main cause for inadequate facilities. The study finally concluded with the suggestion that the relevant government institutes must be taken action to overcome issues on a long-term basis to facilitate for the means of livelihood of fishing community in southern coastal area.

***Keywords:*** *Fishing community, Livelihood, Southern coastal area, Sustainability, Strategies*

# Folklore and Power Relations: A Study on the Resurgence of *Theyyam*

P. F. Fasleena* and P. K. Anju Krishna

Jamia Millia Islamia, Delhi, India

**faslinrahiman@gmail.com*

Theyyam is a folk-art form performed annually in Northern part of Kerala, India. It emerged as a living cult with several thousand-year-old traditions, rituals, and customs. The myth of Theyyam deities connects local heroes and incidents and thus it can be considered as a historical documentation of society. The performers of Theyyam belongs to lower castes and is performed in separate shrines or Kavus established by the ruling clans of performers. Being performed by lower caste people, the myth behind this folk art depicts the cruelty and exploitation faced by the downtrodden. During the performance, the performers are elevated as God like figures and after the transformation they are said to transcend the boundaries of caste system. As it was a tool for empowerment and upliftment for lower caste people, the performance of Theyyam had been suppressed by the Brahminic elite society in the 19$^{th}$ century. But it was reemerged in the recent years as a model of resistance by lower castes. The objectives of this research were to critically study the various nuances of Theyyam as a folk art and how it has become a form of resurgence for lower caste marginalized sections in the society. Its reemergence and the relevance in the contemporary society was the major concern of the study. Research methods incorporated were, in depth interviews conducted with Theyyam performers and various literatures about folk art traditions in Kerala. Historical documents were also taken as one of the major sources of reference. By studying mythical and historical background of Theyyam, the paper investigated caste hierarchy and its effects on the lower castes in Kerala. The result of the research paper included detailed delineation of Theyyam as an art and cultural resistance from lower caste people in Northern Kerala.

***Keywords***: *Theyyam, Caste hierarchy, Resistance, Indian folk art, Resurgence*

# A Study on the Cultural Barriers Effect to Impede the Carrier Development of Rural Women

B. V. N. Wijewardhana* and M. M. M. Dias

Department of Criminology, University of Sri Jayewardenepura

*neranji@sjp.ac.lk

Sexual characteristics are attributes commencing from the birth of the human being, and this biological substance has generated certain tribulation within the cultural context ever since the origin of the human society. The objective of this research was to substantiate the fact that the cultural role of the women could impede the national development of Sri Lanka. Female workers in comparison to males encounter a series of specific challenges culturally, and it is emphasized that the rural women more frequently adopt traditional gender roles in terms of caring and household responsibilities. This research focused to study the effects of impartial dissimilar concerns on women in carrier development initiatives. The inclusive sample of 400 interviewees between the ages of 18-55 years, selected from Beddegama, Galle in Galle and Damana, Ampara in Ampara Districts respectively 100 employees and 100 non-employees from both Districts. Data were collected through interviews, questionnaires, observations, case studies, and through focused group discussions. Data were analyzed using SPSS (V24). Existing blockades suppressing the efforts on long-term education can be seen due to prevailed low tendency to explore educational opportunities. After adopting the domestic role, 69 % of respondents failed to develop their carrier as difficulties encountered on travel (31%), associating domestic activities (52%), and lesser support from family members (8%). Further, study reveals, that there are obstacles for women to seek employment within their fields of professions (94%), and there is specific consideration and acceptance towards male than female (56%), while respondents believe that woman has the physical and mental strength to provide an energetic contribution to strengthening domestic economy (89%). The study suggests a partnership-oriented approach to empower women diagnosing sensitive problems through Rural Women's Societies, pursued ensuring the welfare of women commencing broader dialogue on women's rights subjected to avoid cultural barriers existing against sexual education while the village-based partnership approach recommends advancing from village to the national level. This study has determined that the Sri Lankan culture is providing blockades affecting the carrier of women either the prior or the post on adopting the domestic role and it is apparent that, the decisions making is also affected.

***Keywords:*** *Carrier development, Culture, Domestic role, Rural Society, Women*

*Acknowledgement: The researchers like to acknowledge the Research Council of the University of Sri Jayewardenepura for providing a research grant to undertake this research under the grant no. of ASP/01/ RE/HSS/2018/08.*

# Marriage by Cohabitation and Repute within the Sri Lankan Culture; A Legal Perspective

S. R. L. Rosa

Department of Legal Studies, The Open University of Sri Lanka

*ruchirarosa@gmail.com*

When two party's cohabite or live together as the husband and the wife and are recognized as a married couple by relatives and friends, it is referred as "the marriage by cohabitation and repute." In a such situation, the law will presume, unless and until the contrary is proved, that they are living together in consequence of a lawful marriage and not in a state of concubinage. However, "this presumption is prone to rebuttal, if it can be proven the fact that the parties concerned are not living together in consequence of a valid marriage. If so, the law will not recognize their marriage as valid at all. The objective of this research was to identify the rural Sri Lankan marriage culture and its legal recognition at present. This research is a qualitative research based on statutes and decided cases in Sri Lankan legal system. In a long line of reported judgments, Sri Lankan Courts have recognized the validity of marriage by cohabitation and repute. In *Walliamma v. Anammah* (1900) a man after the death of his wife brought his late wife's sister to his home and started living together with her as husband and wife about 20 years. They had 7 children. In *Dinohamy v. Balahamy* (1927) where a man after the death of his wife brought another woman and lived with her as husband and wife for about 20 years till his death. In both instances, the courts recognized there were valid marriages, although those were not registered or not conducted following the customary marriage rituals. However, in subsequent decisions, the courts have insisted on the importance of the performance of the customary rituals, when determining whether there was a marriage by cohabitation and repute. For instance, in *Gunaratne v. Punchihamy* (1912) based on the failure on the part of one party to prove that customary rituals were performed at the time of the alleged marriage, the presumption of marriage by habit and repute was rebutted. The above discussion reflects how the concept of marriage by cohabitation and repute has evolved and been used to identify a valid marriage. In the current legal framework of Sri Lanka, General Marriage Registration Ordinance, No.19 of 1907 and Muslim Marriage and Divorce Act, No.13 of 1951 accept customary marriage but Kandyan Marriage and Divorce Act, No. 44 of 1952 does not accept customary marriage and therefore a Kandyan marriage should be registered under section 3 (1) (a).

***Keywords:*** *Marriage, Sri Lanka, Cohabitation and Repute, Law, Presumption*

# The Role of Folk Tales in Enhancing Reading Comprehension and Good Attitudes of the Learners in the English Language Classrooms in Sri Lanka

Y. Atchuthan

Advanced Technological Institute, Vavuniya

*atchuuoj2510@gmail.com*

Folk tale could be considered as fictional genera in literature which emphasis the moral values and justice which should be adapted by the man kind for the peaceful existence and mutual understanding in the ever-changing world. As such these genera has been widely used in the textbooks used for the language development of the learners with a focus of developing reading comprehension, attitudes, and socialization by giving an interesting exposure for the students into those texts. However, according to the studies, its importance in the English language development specially in the enhancement of reading skills has not been realized adequately in Sri Lanka. Hence, this study investigated the reasons for such lapses in the teaching and learning contexts of English as a second language. This study was conducted in Marailluppai village in Vavuniya District using a mixed method. Forty students between grade six to eleven studying at Special Intensive English Language Teaching (SIELT) program were taken randomly for the study and it was conducted for one year of time. Teaching methodology, assessment methods, evaluation procedure and perceptions of both students, parents and teachers were taken as independent variables for the study. The findings revealed that the lack of awareness of teachers, parents, and students in realizing its importance in the language development specially in the enhancement of the students' moral values and attitudes was seen. Though folk tales adapting the modernized concepts have been included in the textbooks, the teachers' practice to enhance the reading skills along with good attitudes is not in a satisfactory level. In many circumstances, such texts have been neglected or inappropriately used by the majority of the teachers in the class. As it has been abandoned in the teaching contexts, in the process of assessments and evaluations too, they were not materialized which shows the lack of application of the theoretical knowledge by the teachers teaching English as a second language in the scenario. Further, it questions the concern of students' attitudes though the development of knowledge and skills are given importance.

***Keywords:*** *attitudes, English, learners, folk tales, reading comprehension, skills*

# පාරම්පරික ධීවර ගම්මානයන් හි සංස්කෘතියේ, වත්මන් තත්ත්වය පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක් (කුඩාවැල්ල ධීවර ගම්මානය ආශ්‍රයෙන්)

එල්. එච්. එච්. කුමුදුමලී*, ඩබ්ලිව්. ඩී. ජී. පෙරේරා සහ එස්. සමරසේකර

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*harshanilokuhennadi@gmail.com

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජීවනෝපායක් වන ධීවර කර්මාන්තය හරහා ගොඩනැගී ඇති ධීවර උපසංස්කෘතිය අතුරින් දකුණු පළාත වැදගත් වේ. දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රිකයේ පිහිටා ඇති "කුඩාවැල්ල ධීවර ගම්මානය" ස්වාභාවික කුඩා වරායකින් හා භූමිමානයෙන් ද සමන්විත ය. අතීතයේ සිට ගම්මානය පුරා ජීවත් වූයේ බෞද්ධයන් මුත් ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ ධීවර කර්මාන්තය හා ඒ ආශ්‍රිත රැකියාවන් ය. බාල-මහලු, ස්ත්‍රී-පුරුෂ, සියල්ලෝ ම එකතු වී මෙම කටයුතුවල නිරත වේ. අධ්‍යාපනය, ආර්ථිකය, සමාජ ස්වභාවය යන ප්‍රධාන අංශයන්හි වත්මන් තත්ත්වය අධ්‍යයනය කිරීම අරමුණු කරගනිමින්, කුඩාවැල්ල උතුර ග්‍රාමසේවා කොට්ඨාසයේ පවුල් 410 අතුරින් අහඹු ලෙස තෝරගත් පවුල් 150ක් සමග සිදු කළ ඍජු සම්මුඛ සාකච්ඡා හරහා මෙම අධ්‍යයනය සිදු කරයි. එහි දී පරම්පරා හතරක් තුළ සමාජ විකශනය වී ඇති ආකාරය අනුව පළමු හා දෙවන පරම්පරාවලට වඩා තෙවන පරම්පරාව වන තරුණ පරපුරේ අධ්‍යාපන තත්ත්වය දියුණු මට්ටමක පවතී. වැඩිහිටියන් ධීවර කර්මාන්තයෙහි නියැළීම හේතුවෙන් පිරිමි ළමයි 95%ක් ම, අවුරුදු 15/16 පමණ වන විට යොමු වී ඇත. උසස් පෙළ දක්වා අධ්‍යාපනය හදෑරීමට පිරිමි දරුවන්ට සාපේක්ෂ ව ගැහැනු දරුවන් 30% වැඩියෙන් යොමු වී ඇත. අතීතයේ දී කුඩා පරිමාණයෙන් සිදු කළ ධීවර කර්මාන්තය අද වන විට මහා පරිමාණ මත්ස්‍ය සම්පතක් ගොඩට ගෙන ඒමට හා ඒවා රට පුරා විකිණීමේ මහා පරිමාණ ව්‍යාපාරිකයන් බවට පත් ව ඇති අතර නියැදියේ 90කට වඩා පිරිසක් ආදායමෙන් සෑහීමකට පත් වේ. ගම්මානයෙන් පිටත ප්‍රදේශවල පිරිස් ද ධීවර කර්මාන්තයේ නියැළෙයි. ආර්ථිකය හා අධ්‍යාපනයේ ඉහළ තත්ත්වය නිසාවෙන් මෙම ග්‍රාමයේ ධීවර කර්මාන්තය තුළ දියුණු තාක්ෂණික ක්‍රමවේද භාවිත කරයි. අවුරුදු 16-25 පමණ වන විට විවාහ වී දරුවන් ද ලැබ හමාර ය. තුන්වන පරම්පරාවේ පිරිස අධ්‍යාපනය හමාර කර රැකියාවකට ඉක්මනින් යොමු වේ. එබැවින් තුන්වන පරම්පරාව ආර්ථික ව ශක්තිමත් පිරිසකි. පළමු පරම්පරාව හා තුන්වන පරම්පරාව අතර අදහස් හා සිතුම් පැතුම්වල ගැටීම් ඇති වන අතර තුන්වන පරම්පරාව ඉතා ඉක්මනින් ග්‍රාමීය සමාජයේ බලවත් පිරිසක් බවට පත්වෙයි. තරුණ පරපුර අවාසනාවන්ත ලෙස 98%ක් ම මත්ද්‍රව්‍යවලට යොමු වී ඇති බැවින්, පවුල් පරිසරය හා සමාජය තුළ ගැටුම් බහුල ය. ඉක්මනින් ආර්ථිකය ශක්තිමත් කරගත හැකි මාර්ගයක් නිසා තරුණ පරපුර ද ධීවර මානසිකත්වයෙන් මිදීමට උනන්දුවක් නැත. කෙසේ නමුත් රටට ම අත්‍යවශ්‍ය සේවාවක් සපයන ධීවරයින්ට මහා සමාජය තුළින් මීට වඩා අවධානයක් හා ගෞරවනීය බවක් ලැබිය යුතු ය යන්න ඔවුන්ගේ ඉල්ලීමක් ද විය.

***ප්‍රමුඛ පදඃ*** *ධීවර සමාජය, කුඩාවැල්ල ධීවර ග්‍රාමය, ධීවර සංස්කෘතිය, ධීවර ගම්මානය*

# සාම්ප්‍රදායික ජන සමාජයක ගැටුම් නිරාකරණය සඳහා උපයෝගී කරගන්නා උපාය මාර්ග පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (මීමුරේ ගම්මානය ඇසුරින්)

ජී. ජී. ඒ මධුහංසි* සහ ආර්. බී. එන් සුනිල්

අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*asankaganegama17@gmail.com

වර්තමාන සංකීර්ණ සමාජ වපසරිය තුළ සාම්ප්‍රදායිකත්වය සුරක්ෂිත කරගැනීම යනු අසීරු වන්නා වූ ක්‍රියාවලියකි. ලාංකේය සමාජය නවීන සමාජ ක්‍රමයකට යොමු ව පවත්නා තත්ත්වයක් තුළ වුව ද අතීතයේ පවත්නා සාම්ප්‍රදායික ක්‍රමයන් රැක ගනිමින් පවතින ප්‍රදේශයන් ද ලාංකේය ගැමි සමාජය තුළ හඳුනාගත හැකි ය. මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති මීමුරේ ගම්මානය ද පාරිසරික සාධක හමුවේ තවමත් නූතන ලෝකයට නිරාවරණය නො වූ සාම්ප්‍රදායික ජීවන රටාවක් පවත්නා ගම්මානයක් ලෙස හඳුනාගත හැකි ය. ගම්මානයේ ඇති සාම්ප්‍රදායික ජීවන රටාවන් අතරින්, ගැටුම් නිරාකරණය සඳහා උපයෝගී කරගන්නා උපාය මාර්ගයන්හි සාම්ප්‍රදායික ලක්ෂණ පිළිබඳ ව මෙම අධ්‍යයනය මූලික වශයෙන් සිදු කර ඇත. මීමුරේ සාම්ප්‍රදායික ග්‍රාමීය ප්‍රදේශය තුළ පවත්නා සුවිශේෂී ගැටුම් නිරාකරණ ක්‍රමවේදයන් මොනවා ද යන්න අධ්‍යයනයේ ගැටලුව වූ අතර සාම්ප්‍රදායික ග්‍රාමීය ප්‍රදේශයක ගැටුම් නිරාකරණය සඳහා උපයුක්ත කරනු ලබන ක්‍රමෝපායන් හඳුනාගැනීම සහ එම ක්‍රමෝපායන් තවමත් ගම තුළ භාවිතයේ පවතී ද යන්න හඳුනාගැනීම අධ්‍යයන අරමුණු විය. මෙම අධ්‍යයන ප්‍රදේශය තුළ පවුල් 120ක් ඇති අතර ඉන් පවුල් 50ක් අධ්‍යයනයේ නියැදිය වශයෙන් තෝරා ගැනුණි. සම්මුඛ සාකච්ඡා, ක්ෂේත්‍ර නිරීක්ෂණය සහ සාහිත්‍ය මූලාශ්‍රය භාවිතය අධ්‍යයන ක්‍රමවේද ලෙස භාවිත කරන ලදි. මීමුරේ ගම්මානය තුළ වර්තමානයේ ජීවත් වන පවුල් සංඛ්‍යාව වර්ධනය වී ඇත්තේ ඥාති පරම්පරා කිහිපයක එකතුවකිනි. එබැවින්, ඔවුන් අතර දැඩි ඥාති සම්බන්ධතාවක්, අන්‍යෝන්‍ය විශ්වාසයක් හා අවබෝධයක් පවතී. මෙම හේතුව නිසා, මීමුරේ ජනතාව අතර ගැටුම් ඇති වීම අවම මට්ටමක් ඇති බවත්, සුළු ගැටුම් ඇති වූ විට, ඒවා සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගන්නා බවත් අධ්‍යයනය මගින් අනාවරණය විය. එමෙන් ම, නියැදියෙන් නිරූපිත පවුල්වල සාමාජිකයින් පසුගිය අවුරුදු දෙක තුළ කිසිදු ආකාරයේ බරපතල ආරවුලකට මුහුණ දී නො තිබෙන අතර බහින්බස්වීමක්, ඉඩමක වැටමායිම පිළිබඳ ගැටලු වැනි සුළු ආරවුල් සඳහා ද මුහුණ පෑමට ලක් වී ඇත්තේ 4%ක් (02) පමණි. තරමක් සංකීර්ණ ගැටුම් ඇති වන අවස්ථාවල, ග්‍රාමීය ජනතාව ආරච්චි මහත්තයා ලෙස හඳුන්වන ග්‍රාම නිලධාරි මඟින් එම ගැටුම් නිරාකරණය කර ගනියි. පොලීසිය, අධිකරණය, සමථ මණ්ඩලය වැනි නූතන අපරාධ යුක්ති ක්‍රමයේ ආයතන මඟින් ගැටුම් නිරාකරණය කිරීම ඉතා අවම මට්ටමක ඇත. ඒ අනුව, එම ආයතන වෙත කිසිදිනක හෝ යොමු වී නැති පිරිස 96% (48) කි. ගම තුළ ගැටුම් අවම වීම සඳහා එහි භූගෝලීය පිහිටීම හේතුවෙන් හුදෙකලා ගම්මානයක් වීම යන කරුණ ද බෙහෙවින් බලපා ඇති බව අධ්‍යයනය මඟින් අනාවරණය විය. ඒ අනුව, සාම්ප්‍රදායික මීමුරේ ගම්මානය තුළ ගැටුම් නිරාකරණයයේ දී ඥාතීත්වය යන කරුණ කේන්ද්‍රීය සාධකයක් බවට පත් ව ඇති බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද:** *ගැටුම් නිරාකරණය, ඥාතීත්වය, සාම්ප්‍රදායිකත්වය, ගැමි සමාජය, අපරාධ යුක්ති ක්‍රමය*

# Folk Life of the Sri Lankan Society with Special Reference to *Sihalawaththupakaranaya*

P. N. Hansani

Department of Archaeology, University of Peradeniya

*nararchi0726@gmail.com*

Considering the spectrum of sources in Sri Lankan history, *Sihalawaththupakaranaya* is one of the significant literary sources to study the socio, economic and religious background existed in the ancient folk society. The reconstruction of the folk life which hidden from the great tradition became the aim of this study. Literature survey was conducted using the main source "*Ithā Perani Sinhala Banakathā*" which is the translation of *Sihalawaththupakaranaya,* written by *Polwaththe Buddhadaththa* Thero. The stories are mostly related with the Buddhist context, while those folklores help to understand the nature of the contemporary society. Village prevailed as a unit of production in fact the village names derived with the related occupation or the craft of the unit. Villages mentioned as *Kinihiragama, Kumbalgama,* and *Thammena* in the stories can be suggested as the centers of blacksmith, potters, and coppersmiths, respectively. With reference to the folklores, the society was based on hunting, gathering and the dominance of paddy cultivation. Both the males and females are engaged in occupations while females are working as brick makers and servants in the labor scheme. Other modes of folk lives connected with animal husbandry where cattle rearing is prominent. In addition, labourers, clothiers, traders, craftsmen like goldsmiths, silversmiths, and blacksmiths were prevailed in the society. Officers, chiefs, treasurers, ministers, soldiers, and village heads can be identified as the high status. Within the society, inter-cast marriages occurred. The household instruments and tools are recognized as sickle, mortar, knife, pestle, adze, axe, bowl, *Dhamakarakaya*, *Kambili* and *Kirichchiya*. Most probably people engaged in the occupations to conduct the alms giving and offerings for the clergy during the contemporary period. The folk lives connected with the merit and the sin. In fact, raising flags, sound offerings were performed in the form of religious rituals. Though some exaggerations are, variety of habits linked with the folk life can be read from the stories in *Sihalawaththupakaranaya*.

***Keywords:*** *Folk Life, Sihalawaththupakaranaya, Society*

# ආරවුල් සමථකරණයෙහි ලා ජන විශ්වාසයේ නූතන භාවිතය හා එහි බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

එච්. ඊ. එන්. ප්‍රියදර්ශනී,[1*] එම්. කේ. ජී. අයි. ධර්මසේන[2] සහ එච්. පී. කේ. එන්. හේවාවසම්[3]

[1]දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, [2]සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශය, [3]අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*nilupriyadarhani@sjp.ac.lk*

ආරවුල් යනු පුද්ගල සාධක හෝ කණ්ඩායම් සාධක මත පදනම් ව ඇති වන කලහකාරි තත්ත්වයකි. නූතන ආරවුල් සමථනය අපරාධ යුක්ති ක්‍රමය හරහා සිදු වන අතර අතීතයේ මේ සඳහා යොමු වූයේ තොවිල් පහ එක් ව සැදුම්ලත් වරිගසභාව වෙත ය. එමෙන් ම විශ්වාසය මත පදනම් ව ආරවුල් නිරාකරණයට බැඳි ආකාරය ජනශ්‍රැතියේ විග්‍රහ කරයි. මෙවැනි ක්‍රම තාක්ෂණික දියුණු නූතන සමාජයේ ද අඩු-වැඩි වශයෙන් දැකිය හැකි ය. ඒ අනුව ආරවුල් සමථනයේ විධිමත් ක්‍රම පවත්නා සමාජයක ජන විශ්වාසයන් මත පදනම් වූ සාම්ප්‍රදායික ක්‍රමයන් කෙරෙහි යොමුවන්නේ ඇයි? යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. අධ්‍යයන අරමුණු වූයේ ආරවුල් නිරාකරණය කරගැනීමේ ජන විශ්වාසයන් හා එහි නූතන භාවිතය අධ්‍යයනය කිරීම හා ආරවුල් විසඳීම සඳහා භාවිත කරන නූතන ක්‍රමවේදයන් විමර්ශනය කිරීම යි. අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් මාතලේ දිස්ත්‍රික්කයේ පුබ්බිලිය ග්‍රාමයේ දී විනිශ්චයාත්මක නියැදීම යටතේ තෝරාගන්නා ලද පුද්ගලයින් 25ක් සමග සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා පදනම් කරගන්නා ලදි. ආරවුල් සමථ කිරීමෙහි ලා සාම්ප්‍රදායික ක්‍රමයන් ලෙසට දෙවියන් කෙරෙහි විශ්වාසය තබා ආරවුල් බේරාගැනීම යටතේ දෙස්-දෙවොල් තැබීම, දේවාලවලට ගොස් දෙවියන් ඉදිරියේ දිවීරීම, තමන් අදහන දෙවියන්ට පඬුරු බැඳ "දෙවියෝ සාක්කි" වන්නට ඉල්ලීම, තමන්ට අවැඩක් සිදු වූ විට යකා ගහපිය, හෙන ගහපිය, හෙණ හත ම වැදියන් වශයෙන් දෙස් දෙවොල් තැබීම, ගම්භාර දෙවියන්ට පඬුරු ගැටගසා පිහිට පැතීම, සතුරාට වස් කවි කීම, දෙපක්ෂයේ ආරවුලක් ඇති වූ විට බුදුන් හෝ දෙවියන් ඉදිරියේ දෙපාර්ශ්වය ම එක් වී දිවුරා ආරවුල විසඳා ගැනීම, එමෙන් ම ශරීරයට වධ දී නිර්දෝෂීභාවය ඔප්පු කිරීම තවත් ක්‍රමයකි. වරදකරු යැයි සැකකරන තැනැත්තා උතුරන තෙල් බඳුනකට අත දැමීම, නයෙකු සිටින පෙට්ටියකට අත දැමීම, ගිනි පන්දමකට අත ඇල්ලීම වැනි ඒවා කරනු ලබයි. නූතනයේ ශාරීරික පීඩාකාරී ක්‍රමවේද භාවිත නො කළත් දෙස්-දෙවොල් දීම දෙවියන්ට භාරවීම සාප කිරීම ආදිය තුළින් යුක්තිය ලබා ගැනීමට උත්සාහ ගන්නා ආකාරය හඳුනා ගැනුණි. එමගින් කාලය, මුදල්, ශ්‍රමය විනාශ වන බවට ජනතාව විශ්වාස කිරීම, වර්තමානයේ යුක්තිය පසිඳලන ආයතනයන්හි ස්වාධීනතාව පිළිබඳ විශ්වාසයක් නොමැති වීම හා පාරම්පරික ව පැවත එන ජන විශ්වාස පිළිබඳ ව පවත්නා දැඩි හා අපරිමිත විශ්වාසය මෙන් ම බැඳීම යනාදිය හේතු වී ඇත තව ද, ජන විශ්වාසයන් නූතනයට ගලපාගැනීමේ දී වැරදි අවබෝධයන් හේතුවෙන් ගැටලු තීව්‍ර වීමේ ප්‍රවණතාවත් දැකිය හැකි ය. එමෙන් ම දෙවියන් හා බුදුන් ඉදිරියේ ආරවුල් සමථ කිරීමට ඉල්ලා සිටීමෙන් හා යුක්තිය අපේක්ෂා කිරීම තුළින් වින්දිතභාවය පත් තැනැත්තාට මානසික සුවය ද නැවතත් ආරවුල් ඇතිවීමේ ප්‍රවණතාව ද අවම වන බව පැහැදිලි වේ. කෙසේ වෙතත් මෙහි දී ආරවුල් සමථ කරගැනීම සඳහා නූතන ක්‍රමවේදයන් මගහැර ආත්ම විශ්වාසයන් මත පදනම් වූ අනතුරුදායක ක්‍රමවේදයන් වෙත යොමු වීම නො කළ යුතු ය.

***ප්‍රමුඛ පද:*** *ජන විශ්වාස, ආරවුල්, සමථකරණය, පාරම්පරික, යුක්තිය*

# ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩී. එම්. කේ. ජී. කේ. දිසානායක[1*], ඩබ්ලිව්. කේ. එම්. විජයරත්න[2] සහ පී. ඒ. ඒ. එන්. ශ්‍රී ශාන්[3]

[1]ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, [2,3]මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*kaushdizz@gmail.com*

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික අධ්‍යාපනය අභිභවා යමින් ස්ථාපිත වර්තමාන අධ්‍යාපන ක්‍රමය තරගකාරී, සහතික පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමයක් ලෙස විද්වතුන්ගෙන් ඍණාත්මක මතවාද ඉදිරිපත් වේ. වර්තමාන මූලික අධ්‍යාපන ක්‍රමයට සමාන සාම්ප්‍රදායික මූලික අධ්‍යාපන ක්‍රමය අක්ෂර හැසිරවීම පමණක් නො ව ආගම, පරිසරය, ක්‍රීඩා, සෞඛ්‍ය සහ සාරධර්ම යන සියලු අංශ ආවරණය වන පරිදි නිර්මාණය වූවකි. මෙම අධ්‍යයනයේ දී නූතන හා සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමවේදයන් තුළ පූර්ව ළමාවිය සංවර්ධනය කිරීම සඳහා යොදාගත් න්‍යායන් සහ ක්‍රමවේදයන් මොනවා දැයි අධ්‍යයනය කරනු ලැබී ය. ගෙලිඔය, පිටවලවත්ත ග්‍රාමයේ පවතින පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ නූතන ඉගැන්වීමේ ක්‍රමය පදනම් කොට ගෙන, මෙරට සාම්ප්‍රදායික ප්‍රාථමික අධ්‍යාපන ක්‍රමයේ මූලික හරය පෙන්වන වංශකතා, සන්දේශ ආදී සමකාලීන සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය කළ අතර මූලික අධ්‍යාපනයේ දී අදාළ කරගත් ‘හෝඩිය’, ‘නම්පොත’, ‘වදන්කවි පොත’, ‘බුද්ධගජ්ජය’, ‘සකස් කඩය’, ‘සැහැල්ල’ ආදී ග්‍රන්ථ සහ සාම්ප්‍රදායික ක්‍රීඩාවන්, අධ්‍යාපනික උපකරණ හඳුනාගනිමින් ඒවා භාවිත කිරීමෙන් පූර්ව ළමාවිය සංවර්ධනය කරගන්නා වූ දරුවාට ඇතිවන බලපෑම සහ ඒවා නූතනයට ගැළපෙන ආකාරය පිළිබඳව විමර්ශනාත්මක හා සංසන්දනාත්මක අධ්‍යයනයක නිරත විය. සාම්ප්‍රදායික ග්‍රන්ථ පරිශීලනය කිරීම හරහා අක්ෂරයන් සහ විවරණ පිළිබඳ ව අවබෝධයක් ලබා දීම පමණක් අපේක්ෂා නො කළ අතර කුඩා දරුවාගේ වචන උච්චාරණය කිරීමේ ගැටලු නිරාකරණය සහ වණපොත් කිරීම මගින් ධාරණය සහ මතක ශක්තිය වර්ධනය කිරීම වැනි බුද්ධි වර්ධනය පිළිබඳව කරුණු ද සම්පූර්ණ කරන ලදි. නම් පොත වැනි ග්‍රන්ථ සරල අක්ෂරවල සිට මහප්‍රාණ අක්ෂර දක්වා සංකීර්ණ අක්ෂරවලට දරුවා හුරු කරවීම පමණක් නො ව පරිසරය සහ ස්ථානය නාම ආදිය කුඩා මනසට හුරු කරනු ලැබේ. මෙවැනි ශාරිරික ගැටලු සඳහා. ‘ටන්ග්-ට්විසටර්ස්’ වැනි භාෂා උපක්‍රම නාගරික මට්ටමින් භාවිත වුව ද ග්‍රාමීය අධ්‍යාපනයේ දී එය එතරම් ප්‍රචලිත නොවේ. වර්තමානයේ පවතින ප්‍රාථමික අධ්‍යාපන ක්‍රමය, බටහිරකරණයට ලක් වීමත් සමඟ තරගකාරී බව වැඩිවීම නිසා දරුවාවාගේ නිර්මාණශීලී හැකියාව සහ සාමාන්‍ය දැනීම වර්ධනය කරවනු ලබන ප්‍රාථමික අධ්‍යාපනයක් වෙනුවට වණපොත් කරවීමන අධ්‍යාපන ක්‍රමයකට මඟ පාදනු ලැබේ. කුඩා දරුවන්ගේ ස්නායු වර්ධනය හා ක්‍රියාකාරීත්වය වැඩි කිරීම සඳහා වැලි සෙල්ලම් යොදා ගැනීම වැනි ක්‍රියාකාරකම් වර්තමානය වන විට වෛද්‍යවරුන් පවා නිර්දේශ කරන අතර ඒවා නූතන ප්‍රාථමික අධ්‍යාපන ක්‍රමය තුළ අතරින් පතර දැකිය හැකි වුවත් එය ඍජු ලෙස අධ්‍යාපනය නිර්වචන අවාසනාවට කරුණකි. මේ සියලු කාරණා විමර්ශනය කිරීමෙන් සාම්ප්‍රදායික ප්‍රාථමික අධ්‍යාපන ක්‍රමය කුඩා දරුවාගේ මනස තමාගේ එදිනෙදා අවශ්‍යතාවන් තමන් විසින් ම ඉටු කරගැනීමට සාමාන්‍ය දැනුම ලබාදෙන අංගසම්පූර්ණ අධ්‍යාපන ක්‍රමයක් යැයි පැවසීම අතිශෝක්තියක් නො වේ.

***ප්‍රමුඛ පද:*** *අධ්‍යාපනය, ප්‍රාථමික අධ්‍යාපනය, සාම්ප්‍රදායික, ළමාවිය*

# Change of Cultural Norms in Japanese Young Adults and Middle-Aged

D. T. D. Weerathunga[1*] and N. Kanthilatha[2]

[1]Faculty of Engineering, Kyushu University, Fukuoka, Japan, [2]Department of Anthropology, University of Sri Jayewardenepura, Sri Lanka

*dhammikaweerathunga@yahoo.com

Japan is a country rich in unique cultural norms cascaded through generations. This uniqueness was enhanced by both Japan's geological isolation from mainland Asia and imposed trade restrictions by native rulers for centuries. In the modern era of cheap air travel coupled with free global trade, Japan is no more isolated. This could impose gradual changes to the cultural norms of Japanese, especially in the young generation. The objective of this research was to observe and analyze the change of cultural norms in Japanese young adults and middle-aged people. As the sample, 101 Japanese individuals were selected between 20 – 40 years of age. 66.3% of them were employed while the rest were university students. A digital questionnaire, written in Japanese was given to the selected with 11 questions related to norms governing daily interactions. Japanese culture respects seniority. When calling a senior, appropriate honorific nouns were used, they were never called only by name. Young generation fully obeys this tradition. Traditionally Japanese avoid body touch including shaking hands even when greeting friends. A huge majority (97.1%) of the young still follows this. However, during interactions with foreigners, shaking hands has no issue. However, in a totally Japanese set-up, shaking hands between two Japanese are regarded as an odd behavior. Majority (56%) of youngsters wanted to live outside Japan. First three choices were 1- USA, 2- Switzerland and 3- Australia / New Zealand. Many replied, "I want to live a stress-free relaxed life". Another 41% feels safe living by the cultural norms of the Japanese society. Many replied, "I feel Japan is the safest country in the world". Further 61% and 91% are respectively willing to start a conversation and deprecate once opinion in public, showing a high self-confidence. In conclusion, young adults and middle-aged people in Japan greatly follow cultural norms and traditions that are valued by the older generation while experimenting new opportunities and slowly adopting new norms.

***Keywords:*** *Japan, Culture, Norms, Young, Middle-aged*

# සංස්කෘතියේ  මුල් පරම්පරාවක් වන "මහඇළගමුවා වාරි පරපුර" පිළිබඳ ජනප්‍රවාදාත්මක අධ්‍යයනයක්

එච්. එච්. ඒ. කරුණාරත්න

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, නාගානන්ද විශ්වවිද්‍යාලය

*hha.karunarathna@gmail.com*

උතුරු මැද පළාතේ කැකිරාව දිස්ත්‍රික්කයට අයත් මහඇළගමුව ග්‍රාමයේ පිහිටා ඇති මහඇළගමුව වැව කේන්ද්‍ර කරගනිමින් පැවත එන ප්‍රබල ජන විශ්වාසයක් වන්නේ වාරි කර්මාන්ත කටයුතුවලට සම්බන්ධ මුල් පරම්පරාවක් එම ග්‍රාමයේ ජීවත් වූ බව යි. ඒ බව තහවුරු වන සාධකය වන්නේ මහඇළගමුව වැවෙන් නිකුත් වන පළමු දියවරෙන් පෝෂණය වන කුඹුරුවල අයිතිය එම පරම්පරාවට හිමි වී තිබීම යි. මෙය පාරම්පරික ව පැවත එන ජන විශ්වාස මත පදනම් වූ නෛතිකමය රාමුවක් වුව ද එම ප්‍රදේශයේ ගැමියන් එම පරම්පරාවේ අවශේෂ පුරුක් වෙත වර්තමානයේ ද දැඩි ගෞරවකින් ක්‍රියා කරයි. පර්යේෂණයේ දී මෙම වාරි සංස්කෘතියේ මුල් පරම්පරා හා ඔවුන්ගේ සමාජ භූමිකාව තහවුරු කර ගැනීමත් එම වාරි ශිල්පී පරපුර හා ගොඩනැගුණු සංස්කෘතික පසුබිම ගොඩනැගීමත් අරමුණු විය. පර්යේෂණ ගැටලුව ලෙස වාරි කර්මාන්තය කටයුතු නොකඩවා පවත්වා ගෙන යාම සඳහා වාරි පරම්පරවලට සිදු වූ අභියෝග කවරේ ද? යන්න තහවුරු කරගැනීම සිදු වේ. සාහිත්‍යගත මූලාශ්‍රවලට අනුව වාරි කර්මාන්තය හා සම්බන්ධ විවිධ පුද්ගල නාම හා නිලධාරින් පිළිබඳ නාමිකව සඳහන් ය. ඓතිහාසික සාධක වන සෙල්ලිපිවල අන්තර්ගතයන් හි ද වාරි නිලධාරින් ගැන සඳහන් වේ. එහෙත් කිසිදු සාහිත්‍ය හා පුරාවිද්‍යා මූලාශ්‍රයක වාරි තාක්ෂණය හා සම්බන්ධ වාරි ශිල්පි පරම්පරා හා ඒ සම්බන්ධ තාක්ෂණික ශිල්පීන්ගේ කාර්යභාරය සඳහන් නොවේ. අධ්‍යයනයේ දී කැකිරාව මහඇළගමුව ගම්මානයේ එවැනි වාරි පරපුරක් පිළිබඳව ජනප්‍රවාදාත්මකව පැවත එනු ලබයි.  මහ ඇළගමුව වැව නිර්මාණය සහ එහි ආරක්ෂාව එම ශිල්පිය පරපුර භාරව සිට ඇත. විටෙක වැව් බැම්ම බිඳී ගිය කල එම පරපුරේ ප්‍රධානියා වැව් බැම්ම කැඩී ගිය ස්ථානයේ සකසන ලද ආධාරක ආකෘතියකට බිලිවීමෙන් ජල පහර පාලනය කර ඇත. මෙයට සමාන ප්‍රවෘත්තියක් කලාවැව සම්බන්ධයෙන් ද පවතී. වර්තමානයේ ද එම වැවෙන් පෝෂණය වන පළමු කෘෂිකාර්මික බිම් එම පරපුර සතු ය. මේ අනුව සෑම වාරි කර්මාන්තයකට ම විශේෂ පරපුරක් සිටි බවත් ඒ සම්බන්ධ සෘජු දායකත්වයක් සැපයූ ශිල්ප පරම්පරාව කාලය සමග දිගුවක් නො වූයේ එක් අවධියක එම පිරිස සෘජු මර්දනයකට ලක් වූ බැවින් විය යුතු ය. නො එසේ නම් කුල සම්මිශ්‍රණයකි. පර්යේෂණයේ දි මහඇළගමුව වැව කේන්ද්‍ර කරගනිමින් හඳුනාගත හැකි "මහඇළගමුවා" වාරි පරපුර ආශ්‍රයෙන් සමස්ත රජරට වාරි තාක්ෂණික ශිල්පීන්ගේ පසුබිම ගොඩනැගීම සිදු විය. වර්තමානයේ වුව ද මෙම පාරම්පරික පරපුර උදෙසා සිදු කරන චාරිත්‍ර, පුද සිරිත් ගැමියන් විසින් නො පිරිහෙළා ඉටු කරනු ලබයි. එහි මූලිකත්වය ගනු ලබන්නේ වැවේ මුල් දියවරෙන් කුඹුරු අස්වද්දන මුල් පරම්පරාවට සම්බන්ධ අයෙකු වීම විශේෂත්වයකි.

***ප්‍රමුඛ පදඃ*** *වාරි සංස්කෘතිය, තාක්ෂණික ශිල්පීන්, ජල කළමනාකරණය*

# FOLK MEDICINE

# සෙල් ලිපිවලින් හෙළි වන පුරාණ අක්ෂි වෛද්‍ය ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනයක්

පූජ්‍ය උල්පතගම අමිතරතන හිමි

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

*uamitha@gmail.com*

අතීතයේ මානවයා විසින් අක්ෂි රෝග නිවාරණය කිරීම සඳහා භාවිත පුරාණ වෛද්‍ය ක්‍රමවේද පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍ර හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර මගින් විමර්ශනයක් කිරීම මෙහි දී සිදු කරනු ලැබේ. අක්ෂි රෝග හා ඒ සම්බන්ධයෙන් අතීතයේ වෛද්‍යවරුන් අනුගමනය කළ වෛද්‍ය ක්‍රමවේද හඳුනාගැනීම. මෙම පර්යේෂණය සඳහා ප්‍රධාන වශයෙන් සාහිත්‍ය මූලාශ්‍ර මෙන් ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් උපයෝගී කොටගෙන සිදු කරනු ලැබේ. මිනිසාගේ ඇසෙහි හටගනු ලබන අක්ෂි රෝග පිළිබඳ ව කරුණු අධ්‍යයනය කිරීමේ දී ඒවා හට ගැනීමට රෝග නිධානයක් ඇති බව අක්ෂි චිකිත්සා සංග්‍රහයේ කරුණු දක්වා තිබේ. අව් රශ්මියෙන් රත් වූ ශරීර ඇති තැනැත්තේ එකෙනෙහි ජල ස්නානය කිරීමෙන් ද දුර වස්තු බැලීමෙන් ද අතිසූක්ෂම වස්තූන් බැලීමෙන් ද දහවල් නිදා ගැනීමෙන් ද රාත්‍රී නිදිවර්ජිත කිරීමෙන් ද අධික ඩහදිය වැගිරීමෙන් ද ඩාදිය දූලි දුම් ආදිය ඇස් ඇතුළට ප්‍රවේශ වීමෙන් ද නිතර හැඬීමෙන් ද හිස තැලීමෙන් ද අධික මද්‍ය පානයෙන් ද කඳුළු වේග වැළැක්වීමෙන් ද අධික මෛථුන සේවනයෙන් ද ගිනි පුපුරු රට අඟුරු තෙල් වර්ග, විෂ බූව ඇති බට කොළ, ගොයම් කොළ, වී කරල්, දලුක් කිරි, පත්තෑ, ගෝනුසු, දිමියන්, වේයන්, මැසි මදුරු සැපීමෙන් ද, ඇස්හි වාතාදි තුන් දොස් කෝප වීමෙන් රෝග හට ගන්නා බවත් ඒ ඒ රෝගයන්ට අවස්ථානුකූල ව ප්‍රතිකාර යෙදීමෙන් රෝග ව්‍යුපසමනය කළ හැකි බවත් දක්වා තිබේ. පුරාණයේ ද අද මෙන් වෛද්‍යවරුන් ඒ ඒ රෝග සඳහා විශේෂඥයන් වශයෙන් වර්ග කොට තිබූ බව දක්නට ලැබේ. ජේතවනාරාම ශිලා ලිපියේ ''අඳුන් වෙජ්'' යනුවෙන් සඳහන් ව තිබීමෙන් ඒ බව සනාථ වේ. අනුරාධපුර රාජධානියේ රජ කළ බුද්ධදාස රජතුමන් විසින් රචනා කරන ලද සාරාර්ථ සංග්‍රහයෙහි අක්ෂි චිකිත්සාව සම්බන්ධයෙන් කරුණු දක්වා තිබේ. එහි දී අක්ෂි රෝග හට ගන්නා ආකාරය සහ ඒවාට පිළියම් යොදන ආකාරය ආදි කරුණු රාශියක් පෙන්වා දී තිබේ. ඒ අනුව අතීතයේ සිට වර්තමානය දක්වා ම අක්ෂි වෛද්‍ය විද්‍යාව පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමේ දී මිනිසාගේ නො සැලකිල්ල හා යම් යම් පාරිසරික සාධක පදනම් කොට ගෙන අක්ෂි රෝග හට ගන්නා බවත් ඒවායෙන් මිදීම සඳහා අනුගමනය කළ යුතු කරුණු රාශියක් මෙම පර්යේෂණය තුළින් හඳුනා ගන්නා ලදි. අතීතයේ මෙන් ම වර්තමානයේ ද එවැනි දක්ෂ පාරම්පරික අක්ෂි වෛද්‍යවරුන් ශ්‍රී ලංකාව තුළ සිටින බව දැකගත හැකි වේ.

***ප්‍රමුඛ පදඃ*** *චක්ඛු රෝග, ඇස් රෝග, අක්ෂි රෝග, අඳුන් වෙජ්*

# Anatomical Vital Points in the Human Body in Ayurveda

N. S. Abegunasekara[1*] and K. M. Chandimal[2]

[1]Department of Ayurveda Basic Principles, Gampaha Wickramarachchi Ayurveda Institute, University of Kelaniya, Sri Lanka, [2]Department of Anatomy, Faculty of Medicine, Wayamba University of Sri Lanka

*nadeeabegunasekara@gmail.com

*Marma* science is one of the special aspects deeply elaborated by Ayurveda. *Marma* is defined as superficial body point where muscles, veins, ligaments, bones, and joints meet together. *Marma* considered as vital points on the human body which give rise to traumatic effect once the point is elicited or injured. Once these points are elicited or injured these points generate the symptoms pain and even fatal effect. Therefore, *Marma* are considered as critical points and these points should be protected from injuries. Thus, this research aims to provide an overview on *Marma.* The data collection was done by using Ayurveda classics including relevant commentaries regarding the concept of *Marma Shareera*. The interview of traditional Ayurveda practitioners was also done to collect the data. There are one hundred and seven (107) *Marmas* (vital spots) out of which eleven are present in each limb, twenty-six in trunk (03 in abdomen, 09 in thorax, 14 in the back) and 37 in head neck region. Depending upon traumatic effects and prognosis, various types of *Marmas i.e Sadhyapranahara* (sudden death), *Kalantarpranahara* (death within short period), *Vaikalyakara* (deformity due to trauma), *Vishalyaghna* (person lives until removal of foreign body), *Rujakara* (continuous pain due to trauma) mentioned in Ayurveda. Every *Marma* point has their measures and they should be stimulated according to their measure in *Marma* therapy. Although the *Marma* are points on the superficial body surface identified as vital points, *Marma* therapy has promising results in most of systemic disorders in the field of Ayurveda. The literature on gross anatomical consideration of the *Marma* is very scanty. Exploration of Anatomy of *Marma* is timely needed as the basic science of *Marma* point should be elaborated to explore the mechanism of action of *Marma* points.

***Keywords:*** *Marma, Shareera, Gross Anatomy, Basic Sciences*

# Anatomical Consideration of Daivakruta chhidra Concept in Ayurveda

G. V. P. Samaranayake[1*] and K. M. Chandimal[2]

[1]Department of Ayurveda Basic Principles, Gampaha Wickramarachchi Ayurveda Institute, University of Kelaniya, [2]Department of Anatomy, Faculty of Medicine, Wayamba University of Sri Lanka

** prabashi185@gmail.com*

The process of ear piercing is known as *Karnavedhana*. Susruta *Samhita* has very specially elaborated positive effects of *Karnavedhana*. To avoid bleeding, pain and post procedure complications *Susruta* has explained specific site for ear piercing called as *Daivakruta chhidra*. According to the *Chakrapaani* commentary on *Susruta, Daivakruta Chhidra* is the hole made by god for *Karnavedhana. Susruta* recommended avoiding piercing execution at the site which is other than *Daivakruta Chhidra*, because pain and bleeding occurs due to injury to specific *sira* present in the vicinity of *Daivakruta Chhidra*. Injury to these specific *sira (Kalika*, *Marmarika & Lohitika)* shows variety of complications. To identifying *Daivakruta Chhidra*, *Susruta* elaborated a test called as translucency test. By holding ear lobule in left hand sunlight is illuminated on ear and from other side the ear is examined. The maximum translucent point present on ear lobule is *Daivakruta Chhidra*. According to modern literature review, ear lobule is composed of fibrous fatty tissue and blood vessels. It contains no cartilage; hence, it is easily pierced. Ear lobule is supplied by posterior auricular artery accompanied with posterior auricular vein, greater auricular nerve, lymphatic drained in to superficial cervical nodes. Considering the reasoning of complications in scrutiny of modern science, there is no any reference regarding *Daivakruta Chhidra* or *Karnavedhana*. But the stages of inflammation can be correlated with complications caused by piercing ear lobule other than the site of *Daivakruta Chhidra*. After the review of both Ayurveda and modern literature, it was concluded that, signs and symptoms of complications are correlated with stages of inflammation, complications of *Kalika* as stage 1, *Marmarika* as stage 2 and *Lohitika* as stage 3 of inflammation. The aim of this study is anatomically analyzing the *Daivakruta Chhidra* concept in Ayurveda.

***Keywords:*** *Daivakruta Chhidra, Karnavedhana, Ayurveda*

# අතීත සමාජයෙහි පැවති දේශීය වෙදකමෙහි අන්තර්ගත සත්ත්ව විෂ උදෙසා සිදු කළ ප්‍රතිකර්ම පිළිබඳ අධ්‍යයනයක්

එම්. නිශාන්ති

පුස්තකාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*nishanthi@sjp.ac.lk*

අපේ අතීත මුතුන්මිත්තන් නිරෝගී බවින් ද ආයුෂයෙන් ද වැඩි වූයේ බටහිර දෙසට වහල් නො වී දේශීය වශයෙන් සොයා දැනගෙන භාවිත කළ දේශීය වෙදකම නිසා බැව් අමුතුවෙන් කිව යුතු නො වේ. ඔවුන් විසින් අනාවරණය කරගත් වෙදකම සම්බන්ධයෙන් වන දැනුම වර්තමානයේ සුළු වශයෙන් භාවිත වන්නේ වර්තමාන සමාජය බටහිර ආකල්ප දෙසට යොමුවීම ය. එම නිසා දේශීය වෙදකමෙහි අන්තර්ගත වටිනාකම වර්තමාන සමාජයේ බොහෝ දෙනෙකුට වටහා ගැනීමට නො හැකි වී ඇත. නමුත් ආදිකාලීන පාරිසරික සමාජ තත්ත්වය යටතේ කාර්යක්ෂම බවින් ඉහළ මට්ටමක දේශීය වෙදකම පැවතුණු බවට පුරා විද්‍යාත්මක සාධක මෙන් ම ලිඛිත සාධක ද දක්නට ඇත. අතීතයේ දී මිනිසාට වැලඳුණු සියලු රෝග සඳහා ප්‍රතිකාර කර ඇති බව පුස්කොළ පොත්වල සඳහන් වන අතර සත්ත්ව විෂ (සර්පයන් හා මකුළුවන් දෂ්ඨ කිරීම්, බල්ලන් සපාකෑම්) සඳහා ප්‍රතිකාර කර ඇති බවට සාධක වර්තමානයේ දක්නට ලැබේ. දේශීය වෙදකමේ අන්තර්ගත සත්ත්ව විෂ උදෙසා සිදු කළ ප්‍රතිකර්ම පිළිබඳ අධ්‍යයනයෙන් දේශීය වෙදකමේ වටිනාකම පිළිබඳ ව අවබෝධයක් නූතන සමාජයට ලබා දිය හැකි ය. මෙම අධ්‍යයනයේ දී පාදක කර ගනු ලැබුවේ අතීත වෛද්‍යාචාර්යවරුන් විසින් ලියා තබන ලද වෙදකම සම්බන්ධයෙන් වන ප්‍රකාශයට පත් නො වූ අත් පිටපත් වන අතර එම අත් පිටපත් මාතර කිරින්ද පුහුල්වැල්ල ප්‍රදේශයෙන් සොයා ගන්නා ලදි. එම අත් පිටපත් අධ්‍යයනයේ දී පැහැදිලි වූ විශේෂත්වයක් වූයේ සත්ත්ව විෂ ශරීරගත වූ අවස්ථාවන්වල දී ප්‍රතිකාර කරන ආකාරය ගද්‍ය ස්වරූපයෙන් ලියා තැබීම ය. රෝගියාගේ රෝග ලක්ෂණ නිරීක්ෂණය කර දෂ්ඨ කළ සතුන් හඳුනා ගැනීමට තරම් ඔවුහු දක්ෂ වූහ. මෙහි දී යම් සර්පයෙක් දෂ්ඨ කළ විට ප්‍රථම කොට දූත ලක්ෂණයෙන් දෂ්ඨ කළ සර්පයා හැඳින, කාලය ගණනය, පැත්ත (දිශාව), විෂ පිහිටි ස්ථානය ආදිය පිළිබඳ ව අවධානය යොමු කළ යුතු බව සඳහන් වේ. එසේ ම කාල දූත ලක්ෂණයෙන් විෂ බැස්ස වීම සිදු කිරීමට නො හැකි නම් (දේශීය ඖෂධ උපයෝගී කරගෙන සාදාගන්නා) බෙහෙත් හෝ මන්ත්‍ර බලයෙන් විෂ බැස්සවීම සිදු කර ඇත. ඇතැම් අවස්ථාවල දී වෛද්‍යාචාර්යවරයා රෝගියා කරා කැඳවාගෙන යන අවස්ථාවේ දී සිහි කළ යුතු මන්ත්‍ර මෙන් ම කඬුලු පසු කරන අවස්ථාවන්වල දී සිහි කළ යුතු මන්ත්‍ර පිළිබඳ ව ද මෙහි සඳහන් වේ. මන්ත්‍ර බලයෙන් රෝගියාගේ ශරීරයේ විෂ බැස්සවීම කළ නො හැකි නම් විෂ ශරීරයේ පැතිරීම වැළැක්වීම සඳහා විරේක බෙහෙත් රෝගියාට ලබා දිය යුතු ය. අනතුරු ව මන්ත්‍ර ජප කරමින් ඖෂධ ගෑම හා බැඳීම සිදු කරනු ලබයි. මෙහි දී එළඹිය හැකි නිගමනය වන්නේ දේශීය වෙදකම තුළින් සියලු රෝගවලට මෙන් ම ශරීරගත වූ සත්ත්ව විෂ ශරීරයෙන් ඉවත් කිරීම (විෂ බැස්ස වීම) සඳහා දේශීය ඖෂධ මෙන් ම මන්ත්‍ර උපයෝගී කරගෙන ඇති බව ය.

***ප්‍රමුඛ පද:*** *දේශීය ඖෂධ, දේශීය වෙදකම, මන්ත්‍ර, මානව රෝග, සත්ත්ව විෂ*

# සබරගමු දෙහි මඩුව ශාන්තිකර්මයේ අන්තර්ගත මනෝ චිකිත්සන ප්‍රතිකර්ම පිළිබඳ අධ්‍යයනයක්

එච්. පී. අලුත්ගේ

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*heshanialuthge94@gmail.com*

අණ-වින, කොඩි-විණ, හදි-හූනියන්, ඇස්වහ-කටවහ දෝෂ, සමනය කර ගැනීම උදෙසා සබරගමු පළාතේ පවත්වනු ලබන චූල ශාන්තිකර්මයකි දෙහි මඩුව. 'සූනියම් කැපීම', 'බඹපාද ශාන්තිකර්මය'යන නම්වලින් ද මෙම ශාන්තිකර්මය හඳුන්වනු ලබයි. දෙහි කැපීමේ චාරිත්‍රය මූලික වන හෙයින් මෙය දෙහි මඩුව නැතහොත් දෙහි තොවිලය නමින් ප්‍රචලිත වී ඇත. මෙය විණ කැපීම සඳහා ම පවත්වනු ලබන ශාන්තිකර්මයකි. දෙහි මඩුව ශාන්තිකර්මය හා බැඳි ජන විශ්වාසයන් පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. දෙහි මඩුව මනෝ චිකිත්සන ප්‍රතිකර්ම ක්‍රමයක් වශයෙන් සමාජීය පිළිගැනීමට ලක්වනවා ද? යන්න අධ්‍යයන ගැටලුව විය. දෙහි මඩු ශාන්තිකර්ම අවස්ථාවන් සුලබ ව දක්නට ලැබෙන සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කය අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් යොදා ගෙන ඇත. ගුණාත්මක දත්ත විග්‍රහ කිරීමේ ක්‍රමවේදය යටතේ මෙම පර්යේෂණය සිදු කරනු ලැබිණ. දත්ත රැස් කිරීමේ දී ප්‍රධාන වශයෙන් පුස්තකාල අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යයනය යන ද්විත්ව ක්‍රමවේද යොදා ගැනිණ. පුස්තකාල අධ්‍යයනය යටතේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය උපයෝගී කොට ගෙන ඇත. ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ දත්ත රැස් කිරීමේ දී සම්මුඛ සාකච්ඡා ප්‍රධාන වූ අතර වර්තමානයේ දී ද දෙහි මඩු ශාන්තිකර්ම සිදු කරනු ලබන ඇදුරන් දත්ත ලබා ගැනීමේ ප්‍රධාන මූලාශ්‍රයන් ලෙස යොදා ගැනිණ. නූල් බැඳීම මෙහිදී ප්‍රධාන ව සිදු කරනු ලබන අතර නක්ෂත්‍ර නියමයන්ට අනුව දෙහි මඩුව පැවැත්වීමේ දී එක් එක් ග්‍රහයන් උදෙසා යන්ත්‍ර දැමීම සිදු කරයි. යන්ත්‍ර පැළඳීම මඟින් වින දොස් දුරු වන බව ජන විශ්වාසය වේ. බුදු ගුණ මුල් කොට ගනිමින් අභිසම්භිදාන යන්ත්‍රය, බුදුගුණ යන්ත්‍රය, රතන යන්ත්‍රය, ආදි වූ යන්ත්‍ර දැමීම මෙහි දී සිදු වේ. ආතුර ශරීරයෙහි වින හිර වන ස්ථාන ඇති බවට විශ්වාස කරන ඇදුරන් එම විණ ඉවත් කිරීම උදෙසා දෙහි කැපීම සිදු කරයි. විණ දුරු කිරීමට අඹ ශාකය සුදුසු යැයි ජන විශ්වාසයක් පවතී. එහෙයින් අඹ අත්තෙන් මැතිරීම දෙහි මඩුවේ දී සිදු කරනු ලබයි. මෙලෙස අතීතයේ සිට පැවතගෙන ආ ජන විශ්වාස දෙහි මඩුවේ චාරිත්‍ර සමඟ බැඳී ඇත. එම විශ්වාසයන් ආතුර මනසට කිසියම් අස්වැසිල්ලක් එක් කරනු ලබයි. ආතුරයා හට බුදු ගුණ සිහිපත් කොට නූල් බැඳීමේ දී, යන්ත්‍ර දැමීමේ දී මානසික වශයෙන් සුවයක් ගෙන දෙන අතර, හිස සිට දෙපතුල තෙක් ඇති වින දොස් දුරු වේවායි සෙත් කොට දෙහි කැපීමෙන් ද, තමාගේ ශරීරයේ වූ සියලු දොස් දුරු වූවා යැයි විශ්වාසයක් ආතුරයාගේ සිත තුළ හට ගනී. එලෙස ලැබෙන්නා වූ මානසික සුවය හේතුවෙන් රෝගී මනස සුවපත් කරවන මනෝ චිකිත්සන ප්‍රතිකර්ම ක්‍රමවේදයක් වශයෙන් දෙහි මඩුව සමාජයේ පිළිගැනීමට ලක් වන බැව් අධ්‍යයනයෙන් නිගමනය වේ.

***ප්‍රමුඛ පදඃ*** *දෙහි මඩුව, අඹ අත්තෙන් මැතිරීම, චූල ශාන්තිකර්මය, මනෝ චිකිත්සනය, විණ කැපීම*

# ගර්භිණී කාන්තාවට ලබාදෙන ආයුර්වේදීය ප්‍රතිකාර පිළිබඳ අධ්‍යයනයක්

එස්. ටී. රාජපක්ෂ

ආයුර්වේද අධ්‍යයන අංශය, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය

*sanjanitharaka@yahoo.com*

සෑම කාන්තාවක් ම දරුවකු බිහි කිරීම සඳහා ස්වභාවයෙන් ම නිර්මාණය වී ඇත. විවාහයෙන් පසු ව මවක වීම සියලු ම කාන්තාවන්ගේ සිහිනයකි. ගර්භිණී සමය යනු, කාන්තාවක් ශාරීරික හා මානසික යුග්මයෙන් ම වෙනස් වන අවධියකි. ව්‍යුහාත්මක, හෝමෝනමය, පරිවෘත්තීය, මානසික ක්‍රියාවන්ගේ විපර්යාස නිසා විවිධ අපහසුතා මෙම දස මසකට ආසන්න කාලය තුළ හටගනී. මෙය සාමාන්‍ය සංසිද්ධියක් වුවත් ගැබ තුළ සිටින දරුවා මව හරහා සියලු ක්‍රියා සිදු කරන බැවින් ගර්භිණී තොමෝ තම සෞඛ්‍ය තත්ත්වය පිරිහීමට නො දී රැකගැනීම අභිප්‍රායක් කරගත යුතු ය. ආදි කාලයේ දී ජන සමාජය තුළ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම අනුව යමින් අවට වටපිටාවේ පහසුවෙන් සොයාගත හැකි ශාක, ද්‍රව්‍ය භාවිතයෙන් සරල ප්‍රතිකාර හා සරල ශිල්පීය ක්‍රම මඟින් මෙම අපහසුතා දුරු කරගෙන ඇත. අප ජනශ්‍රැතියේ පැවති වත්මන් සමාජයෙන් ගිලිහී යන්නා වූ මෙවැනි වටිනා සරල ප්‍රතිකාර හා සරල ශිල්පීය ක්‍රම නැවත සමාජගත කිරීමේ අවශ්‍යතාව මතු වී ඇත. මෙම පර්යේෂණය සම්මුඛ සාකච්ඡා, ද්විතීයික මූලාශ්‍ර, නියැදි හා ක්ෂේත්‍ර පර්යේෂණයන් සිදු කිරීමෙන් අනතුරු ව ක්‍රමානුකූල ව වාර්තාගත කර ඇත. ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රයට අනුව ගර්භිණීන්ට ගර්භය හේතු කොටගෙන ප්‍රධාන උපද්‍රව හෙවත් රෝග අටක් උපදිත්. වියළීම, කෙළ ඉනීම, වමනය, උණ, ඉදිමුම, අරුචිය, අතීසාරය, විවර්ණය ලෙස යි. මීට අමතර ව ඇති වන අපහසුතා ද ඇත. මෙම උපද්‍රවවලට සුබාරක්ෂණ පිළිවෙත් අනුගමනය කළ යුතු වන අතර නො කර සිටීමෙන් උපද්‍රව ඇතිවේ. 'ගර්භිණී පරිචර්යා' ලෙස ආයුර්වේද ග්‍රන්ථවල ගර්භිණිය එක් එක් මාසයන් තුළ කළ යුතු හා නො යුතු දෑ සඳහන් කරයි. එහි අරමුණ වනුයේ ගර්භිණී සමයේ හටගන්නා අපහසුතා වළකාලමින් නිරෝගිමත්, බුද්ධිමත්, ප්‍රසන්න දරු සම්පතක් සහ වේදනාවෙන් තොර පහසු සාමාන්‍ය ප්‍රසවයක් ලබාගැනීමයි. කළලයේ හිසකෙස් වර්ධනය වන සමයේ දී උදරයේ කැසීම ඇති වීම ඉතා සුලබ කරුණකි. වෙනිවැල්ගැට, කොහොඹ කොළ, නිදිකුම්බා, රත්මල්, බෙලි කොළ, නික කොළ, රෝස මල්පෙති තම්බා සේදීම මඟින් මෙම තත්වය දුරු කරගත හැකි ය. එමෙන් ම වාත දෝෂය ශමනයත්, පියයුරුවල ඇති වන තත්ත්වත් මඟ හරවාගත හැකි ය. රතු වර්ණයෙන් සැරසීම නො කළ යුතු අතර සුදු හා ළා වර්ණයන් ඇඳීම කළ යුතු ය. යම් රක්ත වහනයක් සිදු වුවහොත් හඳුනාගැනීම හා අධික ව උණුසුම උරා ගැනීමෙන් වැළකීමට යි. ගර්භිණී කාන්තාවක් ඇයගේ ජීවන රටාව, ආහාරපාන, සමාජ සම්බන්ධතා හා මානසික තත්ත්වය ගර්භිණීභාවයට සුදුසු වන පරිදි සකසා ගත යුතු අතර ගර්භිණියක් කටගාවට පිරුණු කළයක් එක බිංදුවක්වත් පිටතට නො යන සේ ආරක්ෂා කරන පරිද්දෙන් ආරක්ෂා කළ යුතු ය. සියලු කරුණු විමසා බලන කල ජනශ්‍රැතිය තුළ කළලයේ මාසානුමාසික වර්ධනයට සරිලන පරිදි ඉතා ම විද්‍යානුකූල ව සරල වෛද්‍ය උපදෙස් ලබා දී ඇත.

***ප්‍රමුඛ පදඃ*** *ගර්භිණී පරිචර්යා, උපද්‍රව, ප්‍රතිකාර, ගර්භිණිය*

# ගව රෝගවලට පිළියම් ලෙස භාවිත කරනු ලබන පැරණි කෙම් ක්‍රම

එස්. ඒ. එල්. අයි. නවරත්න* සහ එච්. එම්. ජේ. ඒ. හේරත්

සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*lakmaliishara12@gmail.com

ගවයා අතීතයේ පටන් ම මිනිසාට සමීප සත්ත්වයෙකි. ඒ බවට සාධක ඇත ශිෂ්ටාචාරවලින් පවා හමු වේ. සෑම සත්ත්වයෙකුට මෙන් ම ගවයින්ට ද ලෙඩරෝග රැසක් ම ඇති වේ. කෙම්ක්‍රම ඒ සඳහා පිළියම් ලෙස භාවිත කරනු ලබන වැදගත් ප්‍රතිකාර ක්‍රමයකි. කෙම්ක්‍රම, බොහොමයක් ගව රෝග සඳහා පිළියම් ලෙස යොදා ගනු ලබන අතර මෙම අධ්‍යයනයේ පරමාර්ථය වන්නේ අස්පර්ශීය උරුමයක් ලෙස ද සඳහන් කළ හැකි, ගව රෝග සඳහා පිළියම් ලෙස භාවිත කරනු ලබන, කාලයත් සමඟ වැනසෙමින් යන එම දේශීය කෙම්ක්‍රම හඳුනාගෙන ඒවා මතු පරපුර වෙනුවෙන් රැකගැනීම යි. මෙම පර්යේෂණය සිදු කිරීමේ දී පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රාථමික, ද්විතීයික මූලාශ්‍ර හා ක්ෂේත්‍ර ගවේෂණය ද ඉතා වැදගත් විය. මෙහි දී අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස ගව පාලනය අදටත් සිදු කරනු ලබන ගල්ගමුව, එප්පාවල හා කුරුණෑගල යන ප්‍රදේශ යොදාගන්නා ලදි. පොලොන්නරු යුගයේ දී ඇති වූ හින්දු සංස්කෘතියේ ප්‍රබෝධයත් සමඟ මෙරට සමාජයට සමීප වූ ගවයා මේ දක්වා ම මෙරට වැසියාගේ විවිධ කාර්යයන් සඳහා යොදාගනු ලබයි. ඉහතදී කී පරිදිම සෑම සත්ත්වයෙකුට මෙන් ම ගවයින්ට ද ලෙඩරෝග රැසක් ම ඇති වේ. පෙර කී අධ්‍යයන ක්‍රමවේදයන්ට අනුව මේ පිළිබඳ අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වූයේ එළගවයින්ට පමණක් රෝග 16400 ක් වැළඳෙන බව යි. මෙවැනි විශාල සංඛ්‍යාවක් වූ ගව රෝග සඳහා භාවිත කළ හැකි වැදගත් පිළියමකි, මෙම කෙම්ක්‍රම. සාමාන්‍ය ව්‍යවහාරයට අනුව කෙම්ක්‍රම දෛනික ජීවිතයේ විවිධ කාර්යයන්ටත් කෘෂිකාර්මික කටයුතුවල දී පැන නගින උපද්‍රවවලින් අස්වැසිල්ලක් ලබාගැනීම පිණිසත් භාවිත කරනු ලබයි. කෙම්ක්‍රම මුඛ පරම්පරාවෙන් පැවත එන රෝග නිවාරණය සඳහා වාචික සන්නිවේදනයකින් තොරව කරන ලද ගුප්ත පිළිවෙතකි. මෙම කෙම්ක්‍රම ගව රෝග සුව කිරීමටත්, ගවයින් අතුරු අන්තරාවලින් මිදීමටත් භාවිත කරනු ලබයි. අධ්‍යයනයට අනුව මේවා ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් බව පැහැදිලි වුව ද, සියල්ල ම සිදු කරනුයේ දැඩි ශ්‍රද්ධාව පෙරදැරි කොට ගෙන ය. මේ පිළිබඳ සිදු කරන ලද අධ්‍යයනයෙන් එළඹිය හැකි නිගමනය වූයේ වර්තමානය වනවිට කෙම්ක්‍රම සමාජයෙන් වියැකෙමින් පවතින බවයි. ඊට හේතු බොහොමයක් බලපා ඇත. නූතන සමාජය ගවරෝගවලට පිළියම් සෙවීමේ දී කෙම්ක්‍රම විශ්වාස නො කිරීමත්, ලේඛන මාධ්‍යයෙන් පැවත නොආ නිසා වර්තමාන සමාජයට ඒවා සම්ප්‍රේෂණය නො වීමත් යන හේතු ඒ අතර ප්‍රධාන වේ. කෙසේ වුවත් මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වන්නේ ගව රෝග සඳහා භාවිත කරන, සිංහල සභ්‍යත්වයත්, ගොවිජන උරුමයත් විදහා දක්වන, සමාජයෙන් වියැකෙමින් යන මෙම කෙම්ක්‍රම රැකගැනීම අප සැමගේ වගකීමක් බව යි.

***ප්‍රමුඛ පදඃ*** *ගවයා, ගව රෝග, දේශීය ගව වෙදකම, කෙම්ක්‍රම, ගවයින්ගේ රෝග සඳහා කෙම්ක්‍රම*

# පුද්ගල රෝගීභාවය සහ අධිස්වාභාවික වත්පිළිවෙත් අතර පවතින සහසම්බන්ධතාව (මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය ප්‍රදේශයේ ඓතිහාසික ගැටබරු දේවාලය ඇසුරෙන්)

එන්. ජී. පෙරේරා

සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

*nimanthagayashanperera@gmail.com*

සෑම සමාජයක් ම සුරක්ෂිත පැවැත්ම තහවුරු කිරීමට නම් පොදුවේ ප්‍රජාවගේ සෞඛ්‍ය කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතු ය. රෝග මගින් කිසියම් සමාජයක සාමාන්‍ය පැවැත්මට බාධා එල්ල කරයි. එම නිසා පුද්ගලයාගේ ප්‍රතිකාර අපේක්ෂිත චර්යාව ද එකිනෙකට වෙනස් ය. එහි දී අතීතයේ සිට නූතනය දක්වා ම ලෙඩ රෝග සුව කරගැනීමට අධිස්වාභාවික වත්පිළිවෙත්වලට ජනතාවගේ යොමු වීම දැකගත හැකි ය. අධිස්වාභාවික වත්පිළිවෙත් අනුගමනය කරමින් පුද්ගලයන් කායික, මානසික සහනය ළඟා කරගැනීම පිළිබඳ ව මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය ප්‍රදේශයේ පිහිටි ගැටබරු දේවාලය ඇසුරින් අධ්‍යයනය කිරීම සිදු කරන ලදි. මිනිසාගේ සෞඛ්‍ය අවශ්‍යතාවන් ඉටු කරගැනීමට යාමේ දී අධිස්වාභාවික වත්පිළිවෙත් වෙත ප්‍රවේශ වන ආකාරය හඳුනාගැනීම සමාජවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් විශ්ලේෂණය කිරීම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ යි. නියැදිය සඳහා සසම්භාවී නියැදි ක්‍රමය යටතේ ගැටබරු දේවාලයට පැමිණි පුද්ගලයන් 50 දෙනකු අහඹු නියැදිකරණයෙන් තෝරා ගන්නා ලදි. ප්‍රාථමික දත්ත රැස්කිරීමේ ක්‍රම වශයෙන් සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි ආදිය ද ද්විතීයික දත්ත රැස්කිරීමේ ක්‍රම වශයෙන් අන්තර්ජාලය, සඟරා භාවිත කරන ලදි. "රුහුණේ පුංචි කතරගම" ලෙස හඳුන්වන ගැටබරු දේවාලයේ රජ්ජුරුබණ්ඩාර දෙවියන් පිළිබඳ විශාල පිළිගැනීමක් එම ප්‍රදේශය තුළ හා ඉන් පිටත ද ඇති බව අධ්‍යයනය මගින් තහවුරු විය. ගැටබරු දේවාලය සුවිශේෂී වන්නේ සුදුඅභිචාර හා කළුඅභිචාර යන අභිචාරයන් දෙවර්ගය ම එක ම භූමිය තුළ සිදු කිරීම නිසා ය. පස්වරු කාලයේ කළුඅභිචාර විධි සිදු කරයි. එය නියැදියෙන් 25%කි. එහි දී පොල් ගැසීම, දෙවියන්ට කන්නලව් කිරීම, කොඩිවින කැපීම ආදිය සිදු කරයි. මෙම පූජාවන් ''අවලාද පූජාවන්" ලෙස හඳුන්වයි. පෙරවරු කාලයේ සුදුඅභිචාර සිදු කරයි. ග්‍රහ අපල දුරු වීමට, අධ්‍යාපන කටයුතු සාර්ථක වීමට, මානසික, කායික ගැටලුකාරී තත්වයන්ගෙන් මිදීමට භාර-භාර වීම වැනි සුදු අභිචාරවිධි අධ්‍යයනයේ දී නිරීක්ෂණය විය. එය නියැදියෙන් 75%ක ප්‍රතිශතයකි. නිදන්ගත බෝ නො වන රෝගී තත්ත්වයන් (NCD) සුවකර ගැනීමට පැමිණි පුද්ගලයින් සංඛ්‍යාව ඒ අතරින් 45% කි. එහි දී දීර්ඝ කාලීන ව කායික රෝගී ගැටලු සඳහා 30% ක් පමණ පිරිසක් ද පළමු වරට රෝග සුවකරගැනීමට පැමිණි පිරිස නිරීක්ෂිත නියැදියෙන් 15%ද වේ. අධ්‍යයනය මගින් නිගමනය කළ හැකිවන්නේ විද්‍යාව, තාක්ෂණය කෙතරම් දියුණු වුව ද පුද්ගලයා අතීතයේ සිට සිය විශ්වාස පද්ධතිය තුළ පැවති අධිස්වාභාවික බලවේග සමඟ දැඩි ව බද්ධ වී ඇති අතර ජීවිත අවදානම ද නො තකා රෝග සුව වීම සඳහා අධිස්වභාවික වත්පිළිවෙත්වලට හැකියාවක් ඇති බව විශ්වාස කරයි. ලංකා සමාජයෙ පවතින සෞඛ්‍යමය බහුත්වවාදය තුළ රෝග සුවකර ගැනීම සඳහා අධිස්වාභාවික වත්පිළිවෙත්වලට යොමු වීමේ සාම්ප්‍රදායානුකූල ප්‍රවණතාවක් නූතන සමාජක්‍රමය තුළ ද තවමත් නිරූපණය වේ. ඒ තුළ පවතින්නේ මනෝවිද්‍යාත්මක පදනමකි.

***ප්‍රමුඛ පදඃ*** *ප්‍රතිකාර අපේක්ෂිත චර්යාව, අධිස්වාභාවික වත්පිළිවෙත්, අභිචාර, වෛද්‍ය විද්‍යාව, සෞඛ්‍යමය බහුත්වවාදය*

# ශ්‍රී ලාංකේය ශාන්තිකර්මයන්හි චිකිත්සන ක්‍රමවේදයක් ලෙස ප්‍රහසනය භාවිත වී ඇති ආකාරය පිළිබඳ අධ්‍යයනයක් (පහතරට සන්නියකුම ශාන්තිකර්මය ඇසුරින්)

කේ. සී. සම්පත්

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

*chamarasampath228@gmail.com*

ශ්‍රී ලාංකේය ශාන්තිකර්ම යනු කායික හා මානසික ව්‍යාධීන් සුව කිරීම සඳහා වන වෛද්‍ය විද්‍යා විශේෂයකි. ගැමි සමාජයේ ශාන්තිකර්ම පවත්වනු ලබන්නේ විශේෂ ව්‍යාධීන් නිවාරණය කිරීමටත් පොදුවේ වස්-දොස් දුරු කිරීම සඳහාත් ය. ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයට අනුව චිකිත්සන ක්‍රමයක් යනු යම් පුද්ගලයෙකුට මානසික සුවයක් දැනීමට හා කායික ව ශක්තිමත් වීමට උපකාර වන මානසික ප්‍රතිකාරයකි. ශාන්තිකර්ම අන්තර්ගතය නිරීක්ෂණය කිරීමේදී ද ඒ තුළ විවිධ චිකිත්සන ක්‍රමවේද අන්තර්ගත වන බව පෙනේ. ප්‍රහසනය හෙවත් සිනහව පිරිවැය රහිත වඩාත් ඵලදායී ආශ්චර්යවත් විශ්වීය ඖෂධයකි. ඒ අනුව ශ්‍රී ලාංකේය ශාන්තිකර්මයන්හි ව්‍යාධි සමනය සඳහා වූ චිකිත්සන ක්‍රමවේදයක් ලෙස ප්‍රහසනය භාවිත වන ආකාරය පිළිබඳ ව විමසා බැලීම මෙම අධ්‍යයනයේ මුඛ්‍ය පරමාර්ථය විය. මෙම පර්යේෂණයේ ගැටලුව ලෙස සන්නියකුම ශාන්තිකර්මයේ ව්‍යවහාර ප්‍රහසනාත්මක රංග අවස්ථාවන් මගින් චිකිත්සන ක්‍රියාවලියක් සිදු වේද යන්න පිළිබඳ ව අධ්‍යයනය කරනු ලැබී ය. මේ සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කළ අතර ඒ යටතේ ප්‍රාථමික මූලාශ්‍රයන් ලෙස දේශීය ශාන්තිකර්ම හා ද්විතීයික මූලාශ්‍රයන් වශයෙන් සම්මුඛ සාකච්ඡා, අන්තර්ජාල ප්‍රකාශන, පර්යේෂණ ග්‍රන්ථ, සහභාගීත්ව නිරීක්ෂණ, ක්ෂේත්‍ර අධ්‍යයන මගින් එක්රැස් කරගත් දත්ත පදනම් කරගනු ලැබී ය. සන්නියකුම ශාන්තිකර්මයේ ව්‍යවහාර ප්‍රහසන උත්පාදක රංග අවස්ථා ලෙස සූනියම් යක්ෂණියගේ නිරූපණය, පාළි දොළහ නැටීම, සන්නි දහඅට නැටීම හා ඒ සමග යෙදෙන දෙබස් හා සංවාද අවස්ථා දැක්විය හැකි ය. ඒ තුළ බටහිර වෛද්‍ය විද්‍යාවේ භාවිත අනුපූරක වෛද්‍ය ක්‍රමවේදයක් වන ප්‍රහසන චිකිත්සාවට අදාළ න්‍යායයන් හා මූලධර්ම අන්තර්ගත වන අතර එම මූලධර්ම පදනම් කර ගනිමින් සන්නියකුම ශාන්තිකර්මයේ ප්‍රහසන චිකිත්සන ක්‍රියාවලිය විග්‍රහ කිරීම මෙහි දී සිදු විය. මෙහි දී පුද්ගලයෙකු යම් ප්‍රහසනාත්මක අවස්ථාවක් සඳහා මනෝවිද්‍යාත්මක හා ජීවවිද්‍යාත්මක වශයෙන් දක්වන ප්‍රතිචාර පිළිබඳ අධ්‍යයනය කරන ලදි. වෛද්‍ය විද්‍යාත්මකව පුද්ගලයෙකු සිනාසීමේ දී ආතතිය මුදාහැරීම සඳහා කෝර්ටිසෝල් හෝර්මෝන තත්ත්වය අඩු වීම, ස්වාභාවික වේදනානාශකයක් වන එනඩෝර්ෆින් හෝර්මෝනයත්, ප්‍රීතිමත් බව ඇති කිරීම සඳහා වන සෙරොටොනින් හා ඩොෆමයින් හෝර්මෝනත් උත්පාදනය වීම, මාංශ පේශීවල ආතතිය ලිහිල් වීම, ධමනිවල පවතින තද ගතිය ලිහිල් වීම යනාදි ප්‍රතිලාභ රාශියක් හිමි වේ. මෙම පර්යේෂණයේ අවසන් නිගමනය වූයේ සන්නියකුම ශාන්තිකර්මයේ ඇතුළත් ප්‍රහසනාත්මක රංග අවස්ථාවන් ආතුරයාගේ අහිතකර මනෝභාවයන් හිතකර තත්ත්වයට පරිවර්තනය කිරීමටත්, ව්‍යාධි සමනයටත් චිකිත්සන ක්‍රමවේදයක් ලෙස භාවිතයට ගැනෙන බවයි. පර්යේෂණ යෝජනා ලෙස ශ්‍රී ලාංකේය සෞඛ්‍යය සේවා පද්ධතිය තුළ කායික හා මානසික ව්‍යාධීන් සමනය කිරීම සඳහා යොදා ගන්නා සායනික ප්‍රතිකාරයක් ලෙස ප්‍රහසන චිකිත්සන ක්‍රියාවලිය සංවර්ධනය කළ හැකි බව පෙන්වා දිය හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *ශාන්තිකර්ම, ප්‍රහසනය, චිකිත්සනය, මනෝවිද්‍යාව, අනුපූරක වෛද්‍ය ක්‍රමවේද*

# Screening of Phytochemicals, *In-vitro* Antioxidant, Anti-Inflammatory and Antimicrobial Activities of Commercially Available *Paspanguwa*

C. S. Fernando* and L. C. D. Peiris

Department of Zoology, Faculty of Applied Sciences, University of Sri Jayewardenepura

*samindi1993@gmail.com

Commercially available *Paspanguwa* is a mixture of dried medicinal herbs and widely partake by the native community to combat inflammation including cough, sneezing and body aches. The aim of the study was to determine the effectiveness of decoction and methanol extract of *Paspanguwa,* to be accepted as a scientifically validated product. The decoction was prepared as indicated in the packet. Methanol extraction was conducted using maceration method. Phytochemical screening, total phenol, flavonoid and tannin contents were determined using standard methods. Antioxidant activities and anti-inflammatory activities were determined through *in vitro* methods. Antimicrobial potential was evaluated via agar disc diffusion method and the minimum inhibitory concentration. Phytochemical screening showed the presence of saponin, unsaturated sterols, triterpenes, phenols, tannins, flavonoids, alkaloids and leucoanthocyanin in both extracts. The total phenol, flavonoid and tannin contents in the decoction were 14.89±0.06 mg GAE/g, 5.97±0.02 mg CE/g and 3.86±0.01 mg CE/g respectively. DPPH and $H_2O_2$ free radical scavenging potentials indicated antioxidant activities of the decoction ($IC_{50}$ values; 121.45±0.92 and 386.25±2.94 µg/ml respectively) compared to standard; ascorbic acid ($IC_{50}$ values; 53.69±1.54 and 128.33±0.87 µg/ml). Considerable anti-inflammatory potentials in membrane stabilization, proteinase inhibition and inhibition of bovine serum albumin denaturation were shown by the decoction ($IC_{50}$ values; 980.53±0.88, 109.31±1.09 and 40.50±0.99 µg/ml respectively) compared to standards; diclofenac sodium, aspirin and aspirin respectively used in the assays ($IC_{50}$ values; 367.38±1.13, 33.35±1.04 and 21.70±0.99 µg/ml respectively). Only the methanol extract of *Paspanguwa* (60 mg/ml) had shown inhibition zones against *Staphylococcus aureus* (1.82±0.03 cm), *Bacillus cereus* (0.74±0.03 cm) and *Candida albicans* (1.53±0.04 cm). Minimum inhibitory concentration ranges were, 1.25- 0.625 mg/ml for *S. aureus* and *B. cereus*, 0.3125- 0.15625 mg/ml for *C. albicans.* This study revealed high antioxidant, ani-inflammatory activities of the decoction and high antimicrobial activity of the methanol extract of *Paspanguwa* and it justifies the traditional use against inflammatory circumstances.

***Keywords:*** *Paspanguwa, Decoction, Antioxidant, Anti-Inflammatory, Antimicrobial*

# Protecting Heritages within a Legal Regime: Need for a Sui Generis Regime for Non-Codified Traditional Medicine in Sri Lanka

U. A. T. Udayanganie

Faculty of Law, University of Colombo

*uathakshila@yahoo.com*

Sri Lanka's folk medicine system has been inherited for centuries-old and co-exists with the Ayurveda practice. Presently, a considerable number of the rural population relies on traditional and natural medicine for their primary health care in Sri Lanka and the Covid 19 pandemic has augmented its usage. This Traditional Knowledge relating to folk medicines is codified partly, that is, formalized in certain ways (eg Ayurveda). A greater part of it is non-codified, which is based on traditional beliefs, norms and practices gathered during centuries-old experiences passed to successive generations through oral tradition. The community relies on this system for many treatments. There are more than 8000 Traditional Medical Practitioners practicing medicines who are decedents of reputed families with secret formulae to cure deceases engaged in Public Health Care. Horiwila, Wedagama and Banagala are famous families for secret formulas of their own. The objectives of this paper are twofold: to identify drawbacks of existing international and domestic IPR regime and to emphasize the necessity of having a sui generis system of protection. Hence the paper addresses two questions; why Conventional system of IPR protection is inadequate to protect the non-codified folk medicine system and how it can be well protected within a sui generis system? This study engages in qualitative assessment exerting an exploratory research method and a comparative analysis to make necessary recommendations. The Intellectual Property Rights (IPR) Act No: 36 of 2003 has provided umbrella protection and folk medicine is considering under the traditional knowledge. Even though, the Act remains silent about the explicit protection of folk medicine, undisclosed information stipulated under Article 161 shed the light on its protection. However, the findings reveal that the absence of explicit provisions in the Act leads to exploitation and misuse of these folk medicine formulae. Thus, the current legal regime should introduce a sui generis system of protection for folk medicines.

***Keywords:*** *Folk Medicines, Traditional Knowledge, Intellectual Property Rights, sui generis protection, Secret formulae*

# වකුගඩු රෝගය සඳහා රස වෛද්‍ය විද්‍යාවේ නිර්දේශිත ඖෂධ පිළිබඳ අධ්‍යයනයක්

ඒ. ඒ. ඩී. එස්. එන්. දිල්කි අබේසිංහ* සහ කේ. එම්. එස්. සමරසේකර

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*dilkiabeysinghe1997@gmail.com

හෙළ වෙදකම හෙවත් දේශීය වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලාංකේය සංස්කෘතියට අනන්‍ය වූ වෛද්‍ය ක්‍රමයකි. රාවණා රජ සමයේ පටන් ම එය මෙරට පැවතී ඇත. රස වෙදකම යනු රසදිය ප්‍රධාන කොටගෙන නිපදවනු ලබන ඖෂධ භාවිත කරමින් සිදු කරන ප්‍රතිකාර ක්‍රමයකි. ඊට බටහිර වෛද්‍ය ක්‍රමයෙන් සුවපත් කළ නො හැකි උග්‍රතර රෝග නිවාරණයේ හැකියාවක් ඇත. වකුගඩු රෝගය සඳහා නිර්දේශිත රස ඖෂධ පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීම හා එහි කාලානුරූපී වෙනස්කම් පිළිබඳ ව විමර්ශනය කිරීම මෙහි අරමුණ වේ. ශ්‍රී ලංකාවේ, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, රත්මලාන සහ මහරගම යන ප්‍රදේශ අධ්‍යයනය සඳහා අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් යොදා ගැනුණි. ඊට හේතුවූයේ බස්නාහිර පළාත තුළ රස වෙදකම සඳහා යොමු වී තිබුණේ එම ප්‍රදේශයන්හි වෛද්‍යාචාර්යවරුන් වන බැවිනි. පර්යේෂණ අරමුණට අදාළව ප්‍රාථමික දත්ත රැස්කිරීමේ දී සම්මුඛ සාකච්ඡා උපලේඛනයක් භාවිත කළ අතර රස වෙදකමෙහි නිරත දේශීය වෛද්‍යාචාර්යවරුන් 5 දෙනෙක් හා ඔවුන්ගෙන් ප්‍රතිකාර ගන්නා රෝගීන් 25 දෙනෙක් නියැදිය ලෙස යොදා ගැනිණි. ද්විතීයික දත්ත රැස්කිරීමේ දී සාහිත්‍ය මූලාශ්‍රය හා අන්තර්ජාලය භාවිතයට ගැනිණි. වෛද්‍යවරුන් ට අනුව මෙම ඖෂධ නිපදවීමේ දී රසදිය, ගෙන්දගම්, සාදිලිංගම්, මනෝසීල, රත්හිරියල්, රත්‍රං, ආසනික් ආදිය විධිමත් ක්‍රමවේදයකින් ශෝධනය කර, විෂ නිශේධනය කර, විෂ හරණය කරයි. බැරලෝහ අධික උෂ්ණත්වයක් යටත අඹරා බුලත් කොළ යුෂ, සුදුළුණු, අරළු, එළගිතෙල්, වියං දුඹුලු මගින් විෂ හරණය කිරීම සිදුකරයි. විශේෂයෙන් ආසනික් නිස්සාරණය කර කැරට් 24 රත්‍රං සමග මිශ්‍ර කර එම ඖෂධ නිපදවයි. නියැදියෙන් 40%ක ප්‍රතිශතය මෙම ප්‍රතිකාරවලට යොමුවී ඇත්තේ එහි ඇති අතුරු ආබාධ රහිත බව නිසා ය. 60% ක ප්‍රතිශතය යොමු වී ඇත්තේ ක්ෂණික ප්‍රතිඵල ලබාගැනීමේ අරමුණෙනි. මෙම ඖෂධ නිපදවීමේ දී අතීතයට වඩා වර්තමානයේ ඖෂධ නිෂ්පාදනයේ වෙනස්කම් රැසක් ඇති බව හඳුනාගත හැකි විය. එනම් වර්තමානයේ ලෝහ නිස්සාරණයට අතීතයට වඩා හාත්පසින් වෙනස්, නවීන තාක්ෂණික උපක්‍රම භාවිත කරයි. නියැදිගත වෛද්‍යවරුන්ගෙන් 80%ක් ලෝහ සංයෝජනයේ වෙනස්කම් සිදු කර ඇත. 20%ක ප්‍රතිශතයක වෛද්‍යවරුන් අතීතයේ භාවිත නො කළ කංසා පත්‍ර වර්තමානයේ දී ඖෂධ නිපදවීමට භාවිත කරයි. ඒ ඖෂධ රුධිරයට අවශෝෂණය කිරීමේ වේගය වැඩි කිරීම සඳහා ය. රුධිර සංයුතියේ වෙනස්කම් හා අවශෝෂණ වේගය පරීක්ෂා කිරීමට විද්‍යුත් පරිලෝකන යන්ත්‍ර භාවිත කරයි. යුරෝපීය පර්යේෂණ ආයතන සමග එක් වී වකුගඩු රෝගය නිවාරණයට වෙනත් බැරලෝහ උපයෝගී කරගැනීම සම්බන්ධ ව අත්හදාබැලීම් සිදු කරයි. මේ අයුරින් උක්ත පරිදි වන දත්ත විශ්ලේෂණය කිරීමේ දී වකුගඩු රෝග නිවාරණය සඳහා රස ඖෂධ භාවිතය ඉතා ම ප්‍රතිඵලදායක වන බව කිව හැකි ය. රස ඖෂධවල ඇති වැදගත්කම වන්නේ ශාක ඖෂධවලට වඩා ඉතා වේගයෙන් සුළු මාත්‍රාවක් වුව ද ශරීරයට අවශෝෂණය වීම යි. එමෙන් ම ශාක වඳ වීමේ තර්ජනයට මුහුණ පා ඇති බැවින් ද ලෝහ එසේ ක්ෂය නො වන බැවින් ද 21 වන සියවසේ ප්‍රතිකාර සඳහා වඩාත් යෝග්‍යතම ක්‍රමය රස වෙදකම බව මින් නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** *හෙළ වෙදකම, දේශීය වෛද්‍ය ක්‍රමය, රස වෙදකම, වකුගඩු රෝගය, විෂ හරණය*

# දේශීය ගැමි සර්ප විෂ වෛද්‍ය ක්‍රමය හා එහි ප්‍රතිකාර ක්‍රමයෙහි සුවිශේෂත්වය පිළිබඳ සිදු කරන සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

එස්. පී. නිශාදි*, ඒ. එම්. යූ. එස්. කුමාරතිලක සහ එම්. එල්. එච්. එස්. නිරාශා

සමාජ විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

*nishadhisp92@gmail.com

දේශීය ගැමි පාරම්පරික වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ප්‍රතිකාර ක්‍රමයක් වේ. ඒ අතර පාරම්පරික විෂ වෛද්‍ය ක්‍රමය සුවිශේෂ වේ. වසර දෙදහස් ගණනකට ප්‍රථම ව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සමාජය තුළින් බිහි වූ මෙම වෛද්‍ය ක්‍රමය අතිශය සාර්ථක හා අතුරු ප්‍රතිඵලයන්ගෙන් තොර වූවක් ලෙස ප්‍රචලිත ව පවතී. ඒ අනුව දේශීය ගැමි පාරම්පරික සර්ප විෂ වෛද්‍ය ක්‍රමය හා සුවිශේෂ වූ එහි ප්‍රතිකාර ක්‍රමය කෙබඳු ද යන්න විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. ඒ සඳහා ශ්‍රී ලංකාවේ මාතර දිස්ත්‍රික්කයේ මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කැටියපේ ග්‍රාම සේවා වසමෙහි පදිංචි ප්‍රසිද්ධ පාරම්පරික සර්ප විෂ වෛද්‍යවරියක් හා අහඹු නියැදිය යටතේ තෝරාගත් ඇයගෙන් ප්‍රතිකාර ලැබූ පුද්ගලයින් විසි දෙනෙකුගෙන් තොරතුරු ලබා ගන්නා ලදි. ඒ සඳහා සම්මුඛ සාකච්ඡා හා සරල නිරීක්ෂණ භාවිත කළ අතර දත්ත රාශීකරණය කර ගැනීම සඳහා තේමාකරණය භාවිත කරන ලදි. ප්‍රතිකාර කිරීමේදී දෂ්ඨ කරන ලද සර්පයා හඳුනා ගන්නා ආකාරයත්, ඒ අනුව ප්‍රතිකාර කරන ආකාරයත් සුවිශේෂී වේ. එහි දී දූත ලක්ෂණ මගින්, දෂ්ඨ මුඛය පරීක්ෂා කිරීමෙන්, රෝගියාගේ බාහිර ලක්ෂණ පරීක්ෂා කිරීමෙන්, පළමු ප්‍රතිකාරය කිරීමෙන් පසු විෂ ක්‍රියා කරන ආකාරය පරීක්ෂා කිරීමෙන් හා සර්පයා දෂ්ඨ කළ දිනය, වේලාව, ස්ථානය හා රෝගියාගේ මානසික ස්වභාවය අනුව දෂ්ඨ කරන ලද සර්පයා හා විෂ ශරීරගත වී ඇති ප්‍රමාණය තීරණය කරනු ලබයි. එහි දී දූත ලක්ෂණ අනුව, දෂ්ඨ මුඛය පරීක්ෂා කිරීම හා දිනය හා වේලාව අනුව නිගමනය කිරීම සුවිශේෂ වන අතර එම ක්‍රමයන් ප්‍රමුඛ කොට සලකන ලදි. විෂ ඉවත් කිරීම සඳහා බෞද්ධ මන්ත්‍ර හා බුදුගුණ මූලික කරගනිමින් තමා තුළ ධෛර්යයක් ඇති කර ගන්නා අතර ඒ තුළින් ම රෝගියාගේ මානසික තත්ත්වය යහපත් කර සුව වන බවට චිත්ත ධෛර්යය ඇති කරවීම විශේෂිත වේ. එසේ ම ඉහළ ගුණාත්මක බවක් සහිත දේශීය ශාක ද්‍රව්‍ය පමණක් ප්‍රතිකාර සඳහා යොදා ගැනීම ද විශේෂ වේ. ඕනෑම සර්ප විෂක් සඳහා කරපිංචා, දෙහි, වෙනිවැල් යනාදී ශාක ද්‍රව්‍ය සමග අනෙක් ඖෂධ භාවිත කරන අතර මෙම ඖෂධ විෂබීජහරණය සඳහා යොදාගන්නා ප්‍රධාන විෂබීජ නාශකයන් වේ. මෙම ප්‍රතිකාර මගින් රෝගී පුද්ගලයාගේ ශරීරය තුළ පැතිරුණු විෂ මුළුමනින් ම ඉවත් කිරීමත්, අභ්‍යන්තරික වශයෙන් පවතින රෝග තත්ත්වයන් පාලනය කර උපරිම සුවතාවක් ඇති කිරීමත් සිදු කරනු ලබයි. ඒ අනුව බටහිර වෛද්‍ය ක්‍රමය අභිබවා සර්ප විෂ හඳුනා ගැනීමෙහිත්, ප්‍රතිකාර කිරීමෙහිත් සුවිශේෂත්වයක් හා විස්මිත බවක් පාරම්පරික ගැමි සර්ප විෂ වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමයෙහි පවතින බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** *සර්ප විෂ, වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමය, ගැමි, රෝගී පුද්ගලයා, පාරම්පරික*

# ශ්‍රී ලංකාවේ ආදිවාසී ශාන්තිකර්මවලින් හෙළිවන ගර්භිණී කාන්තාවන්ගේ රෝග නිවාරණය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ජී. එච්. එම්. කේ. පී. ජී. සී. එස්. ගමකුමාර* සහ ඊ. ඒ. එන්. නිශ්ශංක

සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*chanuherath110@gmail.com1

ආදිවාසීන් යනු පරිසරයට විවෘත ව ජීවත්වූ සුවිශේෂී ජන කොට්ඨාසයකි. එකිනෙකාගේ ආරක්ෂාව සහ නිරෝගීකම අපේක්ෂාවෙන් ආදිවාසීන් විවිධ ශාන්තිකර්මයන් සිදු කරයි. එකී ශාන්තිකර්මයන් තුළින් ගර්භිණී කාන්තාවගේ ආරක්ෂාව හා නිරෝගීකම සැලසීම පිළිබඳ විශේෂ අවධානයක් යොමුකරන්නේ ද යන්න අධ්‍යයනය කිරීම පර්යේෂණ ගැටලුව යි. ඒ අනුව ආදිවාසී ජන සමාජයේ දී ගැබිණි කාන්තාව උදෙසා සිදු කරනු ලබන ශාන්තිකර්මයන් මොනවා දැයි යන්න හඳුනාගැනීම මෙහි මූලික අරමුණ වේ. ලිඛිත මූලාශ්‍රයන් සහ අන්තර්ජාලය ආදි ක්ෂේත්‍ර නො වන ද්විතීයික දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයන් ආශ්‍රිත ව ඌව පළාතේ ආදිවාසී ජන සමාජය ආශ්‍රිත ව දත්ත රැස් කිරීම සිදු කරන ලදි. ආදිවාසිහු වසංගත ලෙඩරෝග උපද්‍රවවලින් වැළකී සිටීම සඳහා විවිධාකාර වූ ශාන්තිකර්මවල නියැලෙති. එහි දී ගර්භිණී කාන්තාවට ආරක්ෂාව සැලසීමේ මූලිකත්වයෙන් ඔවුන්ට ම ආවේණික ශාන්තිකර්ම රැසක් සිදු කරයි. දරු ප්‍රසූතියේ දී ගැබිනි කාන්තාවන්ට ඇති වන අත් පා වේදනා, බඩ රිදීම්, කොන්දේ වේදනා හා ලේ පිටවීම් ආදිය සඳහා "පැහැදුන් යැදීම" නම් ශාන්තිකර්මය සිදු කරයි. කඩවර යකුන්ට සහ තුම්පාලි යකුන්ට අඩුක්කු තබා මෙම ශාන්තිකර්මය සිදු කරයි. මෙහි දී දරුවා ලැබී මාස තුනේ සිට මාස හත අතර කාල සීමාවේ දී අඩුක්කු උයා පිදේනි තබමින් භාර-භාර ඔප්පු කළ යුතු වේ. එයින් මවගේ සහ බිළිඳාගේ යහපත අපේක්ෂා කරයි. තව ද "මිරිස්ගේ මුල" ශාන්තිකර්මය තුළදී මිරිස්ගේ ලොකුවන්ට භාර වී ගර්භිණී කාන්තාවගේ  සියලු රෝග නිවාරණය හා යහපැවැත්ම ලබා දෙනමෙන් අයැදී. මෙය අගින් පලනල ද අඟල් හයක පමණ කෝටුවක ගම්මිරිස් මුලක් බැඳ එල්ලා කරන ලද භාරයකි. ගැබිනි කතුන්ගේ සියලු රෝග නිවාරණයන් සඳහා මෙවැනි භාරභාර පමණක් සිදු කරයි. ආදිවාසී ජනයා ගර්භිණී කාන්තාවගේ නිරෝගීකම ආරක්ෂා කිරීමට ද නිතර ම කැප වුණි. එහි දී සිදු කරන තවත් එක් ශාන්තිකර්මයක් වන්නේ " මැතිරීම" යි. තුම්පාලි යකුන් වෙනුවෙන් කරන මෙම ශාන්තිකර්මය තුළින් ගැබිණි මව්වරුන්ගේ සියලු ම දෝෂ දුරුකරන බව විශ්වාස කරයි. පොල්තෙල් හා නූල් මැතිරීම මෙහි දී සිදුකරයි. මෙවැනි ක්‍රම නිසා ඇය දෙවියන්ගෙන් හා මළගිය යකුන්ගෙන් ආරක්ෂා වන බව ආදිවාසීහු විශ්වාස කරති. දරු ප්‍රසූතිය සිදුවන තෙක් ගර්භිණිය නිරෝගී ව සිටීම හා වසංගත රෝග ආදියෙන් වැළකීම මින් අපේක්ෂා කරයි. තවද ගැබිනියගේ ආරක්ෂාව හා රෝග නිවාරණය උදෙසා කරනු ලබන තවත් ශාන්තිකර්මයක් ලෙස " පට්ට යකා පූජාව"  දැක්විය හැකි ය. පට්ට යකා පූජාවේ අදාළ වැදි ඇදහිල්ල වන්නේ "පට්ට යකා" වේ. ඔහු වෙනුවෙන් පුදපූජා පවත්වා ඇය ආරක්ෂා කරදෙන මෙන් අයැදී. මේ අනුව ආදිවාසින් ගර්භණී රෝග සමනය කිරීමේදී ශාන්තිකර්මයන්ට ප්‍රමුඛස්ථානයක් ලබා දෙයි. කෙසේවූව ද අතීතයේ දී ලංකාවේ ආදිවාසී හෙවත් වැදි ජනයාගේ ශාන්තිකර්ම ගර්භිණියගේ ආරක්ෂාව, නිරෝගිකම හා යහපැවැත්ම ආදිය සඳහා සිදු කළ ද, වත්මන් නව්‍යකරණයත් සමඟ ආදිවාසීන් ද නව සංස්කෘතියකට හුරුවීම නිසා මෙවැනි ශාන්තිකර්ම ක්‍රම ක්‍රමයෙන් පරිහානියට ලක් වෙමින් පවතී.

***ප්‍රමුඛ පදඃ*** *ආදිවාසීන් ,ගර්භණී කාන්තාව, ශාන්තිකර්මය, ආරක්ෂාව, නිරෝගිකම*

# හෙළ වෙදකම උදෙසා මැතිරීම නම් අභිචාර විධික්‍රමය යොදාගැනීම

එස්. එම්. එම්. එච්. සෙනෙවිරත්න

මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය

*maheshisenevirathna12@gmail.com*

පරිසරය හා එහි සංසිද්ධීන් සමඟ අන්‍යෝන්‍ය සම්බන්ධයක් පවත්වා ගෙන යන මිනිසා ප්‍රාථමික අවධියේ සිටම අදෘශ්‍යමාන බලවේගයන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ දැඩි ව විශ්වාස කරන්නට විය. ලාංකේය ජන සමාජය තුළ ද දුරාතීතයක සිට පරම්පරානුගත ව ක්‍රමයෙන් විකාශයට ලක් වූ අභිචාර විධි අතර නිසි ප්‍රතිපත්තිමය ක්‍රියාදාමයක් තුළ ශක්ති පිහිටුවා පබඳින ලද වචන සමූහයක් නිසි ලෙස උච්චාරණය කිරීම තුළින් බිහි කර ගන්නා මන්ත්‍ර ද පවතී. බොහෝ විට මේවා බෞද්ධාගමික මුහුණුවරක් ගැනීම විද්‍යාව හා තාක්ෂණයෙන් අනූන විසිඑක්වන සියවසේ දී ද හෙළ වෙදකම උදෙසා භාවිතයට ගැනීමට ජනතාව පෙළඹීමට ද හේතුවකි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ හෙළ වෙදකම උදෙසා මැතිරීම නම් අභිචාර විධික්‍රමය භාවිතය තුළින් ජනතාවගේ රෝගී තත්ත්වයන් සුව කිරීම සඳහා සාර්ථක ප්‍රතිඵල අත්පත් කර ගත හැකි වේ ද යන්න විමර්ශනය කිරීම යි. පර්යේෂණයේ ප්‍රධානතම ගැටලුව වන්නේ අතීතයේ සිට ම පැවත ආ මැතිරීම නම් අභිචාර විධික්‍රමය හෙළ වෙදකම ඔස්සේ ජනතාවගේ රෝගී තත්ත්වයන් සුව කිරීමට බලපෑමක් ඇති කරන්නේ ද? යන්න යි. ඒ සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තිරප්පනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 529 පෙරිමියන්කුලම තුලානයෙන් පිරිසක් නියැදිය වශයෙන් තෝරා ගැනිණි. මේ සඳහා පර්යේෂණ ක්‍රමවේදය ලෙස සමීක්ෂණ ක්‍රමය යොදා ගෙන ඇත. එහි දී ප්‍රාථමික දත්ත ලෙස ප්‍රශ්නාවලි ක්‍රමය, සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණයත් ද්විතීයික දත්ත ලෙස පොත්, පුවත්පත් වාර්තා හා අන්තර්ජාල ප්‍රකාශනත් භාවිත කෙරිණි. මෙහි දී අදියර තුනක් ඔස්සේ පරීක්ෂණය සිදු කළ අතර ප්‍රථමයෙන් මැතිරීම නම් අභිචාර විධික්‍රමය පිළිබඳ ග්‍රාමීය ජනතාව දරන ආකල්පය හඳුනාගැනීමත්, දෙවනු ව අවුරුදු 18ට වැඩි තෝරාගත් පුද්ගලයින් විසින් මෙකී අභිචාර විධික්‍රමය භාවිතය පිළිබද විමර්ශනය කිරීමත්, තෙවන අදියර ලෙස තෝරා ගත් සංසන්දනාත්මක දත්ත හා සාධක ඇසුරින් නිගමනය කරා එළඹීමත් සිදු කර ඇත. මෙම පර්යේෂණයේ ප්‍රතිඵලය වන්නේ අභාවයට යමින් පවත්නා මෙම මැතිරීම නම් අභිචාර ක්‍රමයෙහි සාර්ථකත්වය සමාජයට වටහා දීමටත්, ඒ සඳහා තරුණ ප්‍රජාව යොමු කිරීමට හැකි වීමත් ය. කායික, මානසික යන රෝග දෙවර්ගය සඳහා ම සාර්ථක ප්‍රතිඵල මේ තුළ පවත්නා බව නියැදියෙන් 92%ක් පිළිගනු ලැබී ය. ඒ අනුව අතීතයේ සිට ම පැවත ආ මැතිරීම නම් අභිචාර විධික්‍රමය මගින් තෙල්, තැඹිලි, වැලි හා විවිධ ඖෂධ වර්ග මැතිරීමෙන් ග්‍රාමීය ජනතාවගේ රෝගී තත්ත්වයන්ට සුවයක් ලබා ගැනීමට හැකියාවක් පවතින බවට ඔවුන් තුළ ප්‍රබල විශ්වාසයක් පවතින බව ද මෙම පර්යේෂණය මගින් නිගමනය විය.

***ප්‍රමුඛ පදඃ*** *මන්ත්‍ර, අභිචාර විධි, බලපෑම, ආකල්පය, පාරම්පරික*

# Medical Rituals to Heal Female Infertility; An Analysis of *Riddi Yagaya* and Psychological Treatments

V. Gunawardana

Psychological Counselor, Sri Lanka Navy

*gunawardanavishanka@gmail.com*

*Riddi Yagaya* or *Rata Yakuma* is one of the public healing rituals belongs to the low country dancing tradition of Sri Lanka. This is performed to bless infertile women. Similarly, there are psychological treatments for couples who are infertile due to both internal and external factors. The main aim of this paper was to comparatively analyze the dramatic scenes of *Riddi Yagaya* and psychological treatments to find its aims and similarities of these east-west treatments. Psychodynamic and Psychoanalysis Theory and Object Relations Therapy were used to analyze the dramatic scenes of *Riddi Yagaya*. The Psychodynamic and Psychoanalysis approach mainly emphasis on development and historical factors for present treatments. Specially, Sigmund Freud focused on sexual and aggressive drives and Carl Jung focused symbolism, archetypal imagery, synchronicity, and unconscious. These approaches are basically individual therapeutic treatments. There are similar interventions of *Riddi Yagaya* by focusing individual sexual and aggressive drives, past life, and even previous births. For example, "*Nanumuraya*" teaches how to prepare properly for a successful sexual relationship while arousing erotic senses and the frenzy dance of the client (*Athuraya*) helps to release her aggressive drives unconsciously. "*Darunelavilla*" is an example for goal setting in psychotherapy. Object Relations Therapy in psychology focuses primarily on interpersonal relationships. It has expanded as Object Relation Couple Therapy and Object Relations Family Therapy. These therapies consider human contact and relatedness as well as collaborative environment to achieve the goal. *Riddi Yagaya* also helps the client to obtain the support and blessing from husband, then family, and finally the villagers. Hence, there are many similarities between psychological treatments and *Riddi Yagaya* dramatic scenes. It is evident that while western psychologists develop scientific treatments, rituals of Sri Lankan low country dancing tradition have possessed its unique way of healing methods. It is also proved that the ways of intervention to overcome female infertility are universal.

***Keywords:*** *Riddi Yagaya, Psychological Treatments, Female Infertility, Medical Ritual*

# ලෝකයෙන් තුරන් කිරීමට නියමිත හෙපටයිටීස් A (සෙංගමාලය) රෝගය හා බැඳි ජන වෙදකම පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

ඩබ්ලිව්. එස්. ටී. විතාරම

සමාජවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*sachinithiwanka94@gmail.com*

දේශීය වෙදකම යනුවෙන් ජන වෙදකම හඳුන්වනු ලබයි. සෑම රටක ම ජන වෙදකම අඩු වැඩි වශයෙන් හඳුනාගත හැකි අතර පෙරදිග රටවල මෙහි වැඩි ව්‍යාප්තියක් දැකිය හැක. හෙළ වෙදකම, බටහිර වෙදකම ආදිය ශ්‍රී ලංකාවේ මානව රෝග නිවාරණය සඳහා යොදාගනු ලබන වෛද්‍ය ධාරාවන් වේ. හෙපටයිටීස්-ඒ රෝගය බටහිර වෛද්‍ය විද්‍යාවට අනුව Hepatovirus-A නැමැති වෛරසය මගින් ආසාදනය වන රෝගී තත්ත්වයක් ලෙස දැක්විය හැකි ය. මෙය සෙංගමාලය නමින් ලාංකේය සම්ප්‍රදාය තුළ හඳුන්වනු ලබයි. ජන වෙදකම සඳහා ලාංකේය ජනතාවට ඇත්තේ දැඩි විශ්වාසයකි. ජන වෙදකම තුළ විවිධ අභිචාර ක්‍රම, සිරිත් විරිත්, ආගමික චර්යාවන් ද අන්තර්ගත ව ඇත. මේ අනුව ජන වෙදකම යනු ප්‍රතිකාර ලබා දීමේ සංස්කෘතියකි. අතීත ජනයා විසින් අර්ථ ගන්වන ලද විවිධ අධිස්වාභාවික බලවේග මෙම වෙදකම සමඟ බැඳී පවතී. සෙංගමාලය රෝගය සමග ලාංකේය ජන වෙදකමට සමීප සබඳතාවක් පවතී. සෙංගමාලය රෝගය නිවාරණය උදෙසා ජන වෙදකමෙහි උපයෝගීතාව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වේ. අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්ත රැස්කිරීම සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ සෙංගමාලය රෝගය සඳහා වෙදකම් කරනු ලබන වෙදමහතුන් 10 දෙනෙකු මෙන් ම, සෙංගමාලය රෝගය සඳහා ප්‍රතිකාර ගනු ලැබූ රෝගීන් 20 දෙනෙකුගෙන් ද අවශ්‍යතා නියැදීමේ ක්‍රමයට තෝරා ගත් අතර මෙහි දී, ග්‍රාමීය හා නාගරික ජනයා සෙංගමාලය රෝගය නිවාරණය උදෙසා බටහිර වෛද්‍ය ක්‍රමයන් සහතික කළ ද, 80%ක ප්‍රතිශතයක් ප්‍රධාන වශයෙන් ම යොමු වී ඇත්තේ ජන වෙදකම සඳහාය. නියැදියට අනුව 20%ක ප්‍රතිශතයක් බටහිර වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමෙන් පසු ව ජන වෙදකම සඳහා යොමු වී ඇත. එම පිරිස අතරට බටහිර වෛද්‍යවරයකු ද ඇතුළත් ය. තැඹිලි වතුරට ඔවුන් සාදාගත් ද්‍රව්‍යක් යොදා බීමට දීම, දෙහි ඇට හැපීමට දීම වැනි ක්‍රම මගින් රෝග නිශ්චය කර, රෝගයට ප්‍රතිකාර කිරීම සඳහා සියලු ම වෙදමහතුන් තමාට ම තම පරම්පරාවෙන් ආවේණික වූ ඖෂධ වට්ටෝරුවක් භාවිත කිරීම සුවිශේෂීත්වය වේ. එක් රෝගයක් සඳහා විවිධ ඖෂධ භාවිත වුව ද සුව වීමේ ප්‍රවණතාව 100%ක ප්‍රතිශතයකි. රෝගය සුව වූ පසු ව 90%ක් වෙද මහතුන් විසින් ප්‍රතිශක්තිකරණය වර්ධනය සඳහා අනුගමනය කළ යුතු ඖෂධ වට්ටෝරුවෙහි සමානතා ඇති බව අධ්‍යයනය තුළින් තහවුරු විය. මෙම පර්යේෂණය තුළින් එළඹිය හැකි නිගමනය වූයේ නූතන ගෝලීයකරණයට ලක් වූ සංස්කෘතිය තුළ ජන වෙදකම අභියෝගයට ලක් වෙමින් පැවතිය ද, සෙංගමාලය රෝගය නිවාරණය උදෙසා ජන වෙදකම හා බැඳි විශ්වාසය නාගරිකත්වයට වඩා ග්‍රාමීය ව ප්‍රබල ලෙස මුල් බැසගෙන පවතින බව අධ්‍යයනය තුළින් නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *ජන වෙදකම, සෙංගමාලය රෝගය, හෙපටයිටීස්-ඒ*

# ජනශ්‍රැතිය, කිරිමඩුව ශාන්තිකර්මය හා එහි වෛද්‍ය විද්‍යාත්මක පැතිකඩ

පී. එච්. සී. ආර්. ලක්මාල්[1], ඩබ්ලිව්. බී. ඒ. විතාන[2], එම්. ඒ. එස්. මනෝෂිකා* සහ අයි. ජී. ටී. එන්. පතිරත්න[4]

[1,2,3]අපරාධ විද්‍යා අධ්‍යයනාංශය, [4]මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**shashinimanoshika123@gmail.com*

මිනිසාගේ දෛනික ජීවිතය තුළ ලද අත්දැකීම් මතින් ප්‍රභවය වී කටවහර ඔස්සේ සමාජගත වූ සාම්ප්‍රදායික දැනුම් සම්භාරය ජනශ්‍රැතිය යි. සාමූහික උපතකින් මූලෝත්පාදනය වන්නා වූ මානව ශිෂ්ටාචාරයේ සංස්කෘතිකාංග සම්භාරය එයට අදාළ වන්නේ ය. ''ජන'' යන්නෙන් ''සමූහය'' යන්නත්, ''ශ්‍රැතිය'' යන්න ''රිද්මය'' යන අර්ථයත් හඟවයි. ජනශ්‍රැතිය මත පදනම් වූ කිරිමඩුව, සබරගමු සම්ප්‍රදායට අයත් සත්ත්ව වර්ගයා වෙනුවෙන් පවත්වන එක ම ශාන්තිකර්මය වේ. විශේෂයෙන් ගව මහීෂාදි සම්පත් හා සතුන්ගේ ආරක්ෂාවත්, පොදුවේ සශ්‍රීකත්වයත් සලකා කිරිමඩු ශාන්තිකර්මය පැවැත්වීම සාමාන්‍ය සිරිත යි. රත්නපුර දිස්ත්‍රික්කයේ ඇළපාත ග්‍රාමය ආශ්‍රය කොට ගනිමින් විවරණාත්මක පර්යේෂණ කාණ්ඩය යටතේ මෙම ශාන්තිකර්මය පිළිබඳ ව අධ්‍යයනය සිදු කරන ලදි. පර්යේෂණ ක්‍රමවේදය යටතේ සහභාගිත්ව නිරීක්ෂණය, සහභාගී නො වන නිරීක්ෂණ ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිත කළ අතර පරමාර්ථගත නියැදි ක්‍රමය යටතේ පුද්ගලයන් 50 දෙනෙකුගෙන් යුත් නියැදියක් තෝරාගන්නා ලදි. ගවයාගෙන් ජනතාවට සිදු වන්නා වූ මෙහෙය හේතුවෙන් ගවයා සුරක්ෂිත කිරීමෙහිලා, සිංහලයා නියුතු වී ඇති බව කිරිමඩුව ශාන්තිකර්මයෙන් ගම්‍යමාන වේ. කිරිමඩු යාගයේ දී මංගර දෙවියන් ප්‍රමුඛ කොට පුදනු ලබන අතර පත්තිනි දේවියට ද සත්කාර කරනු ලැබේ. බඳ මනට විශේෂ දස්කම් දැක් වූ මංගර, කඳිරාගොඩ ප්‍රදේශයෙහි ගවයන් විනාශ කරන ලද්දා වූ මීමා බැඳීමේ කාර්යයට හවුල් වී මීමාගෙන් මැරුම් කෑ බවත්, ඉන්පසු මංගර නමින් පුද පූජාවට පාත්‍ර වූ බවත් උත්පත්ති කතාවෙන් හෙළි කෙරේ. මයුරාපුරය කන්නගිය විසින් ගිනි තැබීමේ දී, ඇගේ පැතුම වූයේ ධාර්මිකයන්, ගවයන්, ස්වාමිභක්තික වනිතාවන්, ළදරුවන් හා මහල්ලන් හැර ඉතිරි සියල්ලන් ම ගින්නෙන් විනාශ වීම ය. එබැවින් කිරිමඩු යාගයට පත්තිනිය පුදනු ලැබේ. කිරි උතුරවා ගව පට්ටියට ඉසිමෙන් සෞභාග්‍යය ළඟා කර ගැනීමත්, වසුරු වසංගත රෝග පීඩාදියෙන් ගව සම්පත ආරක්ෂා කර ගැනීමත් කිරිමඩුව යාගයේ මූලික පරමාර්ථය යි. ශාන්තිකර්ම රෝගපීඩාදිය සඳහා මානසික සුවය සලසන බව ගැමියන්ගේ විශ්වාසය යි. කිරිමඩුව ශාන්තිකර්මයේ වෛද්‍ය විද්‍යාත්මක පසුබිම ද ආධ්‍යාත්මික සුවය හා බැඳී ඇත. මෙම ශාන්තිකර්මයේ දියකෙළි සමයම, පොරපොල් සමයම, අංකෙළි සමයම, දුනුගත් සමයම ආදී සමයම් 12ක් අන්තර්ගත ය. අද්‍යතනයේ බටහිර හා දේශීය වෛද්‍ය ක්‍රමෝපායන් හේතුවෙන් මෙම ශාන්තිකර්මය සබරගමුවෙන් ඈත් වී ඇති බව පෙනෙයි. සබරගමු සම්ප්‍රදායට ආවේණික මෙම යාගය පිළිබඳ ව නූතන පරම්පරාව අල්ප දැනුමෙන් යුක්ත ය. මෙම අධ්‍යයනය හරහා අනාවරණය කොට ගත් තොරතුරු අනුව ගත් කල ක්ෂීණ වන සාම්ප්‍රදායික චාරිත්‍ර විධි ආරක්ෂා කර ගැනීම උදෙසා නූතන සමාජ මාධ්‍යයන් හරහා තොරතුරු සංසරණය කිරීම කාලෝචිත ය.

***ප්‍රමුඛ පදඃ*** *ජනශ්‍රැතිය, ගවයා, ශාන්තිකර්මය, සබරගමු සම්ප්‍රදාය*

# කෙම් ක්‍රම තුළින් හෙළි වන සත්ත්ව අවිහිංසාව පිළිබඳ ව අධ්‍යයනයක්

ඩබ්ලිව්. ඒ. ඩී. වී. මධුෂාණි* සහ පී. එන්. රාජපක්ෂ

මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*vasana.madushani@gmail.com

කෙම් ක්‍රම යනු සාම්ප්‍රදායික පැරණි ගැමි විශ්වාස මෙන්ම අත්දැකීම් මත පදනම් වූ සුවිශේෂී ආරක්ෂක ක්‍රමවේදයකි. එසේ ම කෘෂිකර්මාන්තයේ දී ගොඩමඩ මෙන් ම හේන් ගොවිතැනේ දී ද භාවිත වන කෙම්ක්‍රම ගණනාවකි. කෙම්ක්‍රම හා බැඳුණු සත්ත්ව අවිහිංසාව, කෙම්ක්‍රම හා බුදුදහමේ අභාසය අතර ඇති සබඳතාව කෙබඳු දැයි යන්න හඳුනාගැනීම අරමුණ වේ. සත්ත්ව අවිහිංසාව කෙම් ක්‍රම තුළින් ආරක්ෂා වන්නේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව යි. මෙම ක්ෂේත්‍ර අධ්‍යයනය නොච්චියාගම ප්‍රදේශය ආශ්‍රිත ව සිදු කරන ලදි. ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ සම්මුඛ සාකච්ඡා සහ ක්ෂේත්‍ර නො වන අධ්‍යයනය යටතේ ද්විතීයික මූලාශ්‍ර යොදාගෙන දත්ත රැස්කරන ලදි. කෘෂිකාර්මික ජන සමාජයේ වගාවන් ආරක්ෂා කරගැනීමට ගොවියන් විසින් විවිධ කෙම් ක්‍රම භාවිත කරන ලදි. අලි ඇතුන්ගෙන් වගාවට වන හානිය වළකාගැනීමට අලි ඇතුන් බියක් දක්වන අතිදුර්ලභ මදාරා ගසේ කෝටුවක් හෝ ලී කැබැල්ලක් ගෙන කථා නො කර ආරක්ෂා සහිත ස්ථානයක, දුරක සිට අලි ඇතුන්ට දර්ශනය කරයි. "කළුව කෙරීම" යන්න ඇඳිරියේ ආරක්ෂාව පිණිස සන කළුවරේ ගමනක් යෑමට පෙර "ඉතිපිසෝ" ගාථාව කියා බුදුගුණ සිහිපත් කර කථා නො කර ඉරි තුනක් සමාන්තර ව පොළොවේ අඳිනු ලබයි. ඉබ්බන්ගෙන් වන හානිය මර්දනයට නොයිඳුල් වරකා ගෙඩියක් කැලි අටකට කඟ ජීවම් කර හැන්දෑවක කුඹුරේ අටකොනේ තබයි. වගාවන් සතුන්ගෙන් ආරක්ෂා කර ගැනිමට අන්නාසි කොළවල ඉරි ඇඳ ලියැදිවල දමයි. එමගින් කුඹුරේ සර්පයන් සිටින බව කුරුල්ලන්ට හැඟී යෑමෙන් කුරුල්ලන් නො පැමිණෙයි. කෘමි විකර්ශක කොහොඹ, එඬෙරු, දුම්කොළ තෙල් ගෑ ලණුවක් දෙදෙනෙකු විසින් දෙපැත්තේ සිට කතා නො කර ලණුවක ඇදගෙන යයි. ඉත්තෑකුරු, කබල්ලෑ කටු, අලි බෙටි හා කප්පරවල්ලිය යන සතර වර්ගය එක් කොට පොට්නියක් සාදා දුම් ගැසීම සිදු කිරීමෙන් කුඹුරේ සිටින  ගොයම් මැස්සා වගා බිමෙන් පලවා හැර ඇත. සවස් යාමයේ දී නිවසට පැමිණෙන මෙරු රංචු නිවසට ඒම වලක්වා ගැනීමට කථා නොකොට දෙහි කොළ අත්තක් උළුවස්සේ එල්ලා තැබීමෙන් නිකුත්වන පැඟිරි සුවඳ නිසාවෙන් මෙරු නිවසට නො පැමිණේ. පැරණි ගැමි ජනයා ප්‍රාණඝාතය පිටු දකින බුදුදහමේ අභාසය කෙම් ක්‍රම තුළට ආරෝපණය කොටගෙන ඇත. අවිහිංසාවාදි කෙම් ක්‍රම අනුගමනය කළ නිසා පරිසරයේ සමතුලිතතාවයත්, වගාවත්, ශික්ෂාපදයත් යන ත්‍රිත්වය ම ආරක්ෂා වී ඇත.

***ප්‍රමුඛ පදඃ*** *අලිඇතුන්, අවිහිංසාව, කෙම් ක්‍රම, කෘමි විකර්ශක, බුදුදහම*

# දේශීය සර්ප වෙදකමෙහි එන ප්‍රතිකාර ක්‍රම හා එහි නූතන ස්වභාවය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ලග්ගල ප්‍රදේශය ඇසුරින්)


ආර්. එම්. අයි. ජී. ඩී. කේ. රත්නායක* සහ කේ. ඩී. ජී. කරුණාතිලක

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*deepikaarcc@gmail.com



ශ්‍රී ලාංකික සංස්කෘතියේ සුවිශේෂ වූ අංගයක් වන දේශීය වෙදකම පරපුරෙන් පරපුරට ගුරු ගෝල හෝ පිය පුතු සම්බන්ධතාවයෙන් යුතු ව පවත්වාගෙන පැමිණේ. නමුත් මෙම වෛද්‍ය ශිල්පය වර්තමාන පරම්පරාව තුළින් වියැකෙමින් පවතී. දේශීය සර්ප වෙදකම තුළ භාවිත කරනු ලබන ප්‍රතිකාර ක්‍රම හා එහි නූතන ස්වභාවය පිළිබඳ ව මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල ප්‍රදේශය ඇසුරින් අධ්‍යයනය කිරීමට මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කෙරේ. මෙම ප්‍රදේශයේ පවුල් 3500 පමණ වන අතර සමස්ත ජනගහනය 13,250කට ආසන්න වේ. පර්යේෂණය සිදු කිරීමේ දී දත්ත ලබා ගැනීම උදෙසා, අධ්‍යයනය ප්‍රදේශය තුළ සහභාගීත්ව නිරීක්ෂණය (ප්‍රතිකාර කිරීම නැරඹීම), වෙදමහතුන් හය දෙනකු සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මෙන් ම මූලාශ්‍ර පරිශීලනය ද සිදු කරන ලදි. සර්ප බයක් (සර්පයකු දෂ්ඨ කළ විට) ඇති වූ පුද්ගලයකුට කරනු ලබන ප්‍රතිකාර ලෙස, මනස නිරවුල් කිරීම, කසාය ලබා දීම, තෙල් සාත්තුව, නස්න ප්‍රතිකාරය, යන්ත්‍ර මන්ත්‍ර, බෙහෙත් ගැල්වීම, පන්දම් බැස්සීම හෙවත් සිරස පත්තුව යනාදි ක්‍රම පෙන්වා දිය හැකි ය. දෂ්ඨ කර ඇති සර්පයා හඳුනාගැනීම දූත ලක්ෂණ, දිනය හා වේලාව, දළ ගණන අනුව සිදු කෙරේ. මුලින් ම විෂ බැස්සවීම සඳහා දෙහි අත්තක් රැගෙන මතුරනු ලැබේ. රෝගියා පැමිණෙන විට සිහිය නැත්නම් නස්න ප්‍රතිකාරය කර සිහිය පැමිණි පසු රෝගියාට හිසේ කැක්කුම සඳහා තෙල් ගැල්වීම, ඇස් පෙනීම දුර්වලනම් අංජනම ගැල්වීම, පපුවේ සෙම ගතිය හා හුස්ම ගැනීමේ අපහසුව ඇත්නම් කසාය ලබාදීමත් සිදු කරනු ලබන අතර බඩ පිපුම, බඩේ කැක්කුම සඳහා විරේකය ලබා දේ. හිසේ සිට ක්‍රමයෙන් විෂ පහළට ගෙනවිත් පිට කරනු ලැබේ. තුවාලය පැසවයි නම් තෙල් හිඳ ඒවා තුවාලය මත ගල්වනු ලැබේ. මරණාසන්න රෝගියකු සඳහා කරනු ලබන ප්‍රතිකාරයක් වශයෙන් පන්දම් බැස්සීම හෙවත් සිරස පත්තුව පෙන්වා දිය හැකි ය. එහි දී රෝගියාගේ හිස් මුදුන තුවාල කර ගිනියම් කරනු ලබන යකඩයක් හිසට ඉහළින් අල්ලා එයට බෙහෙත් යුෂ මිරිකීමෙන් ඒවා හිස්මුදුනේ තුවාලයට වැටීමට සැලැස්වීම යි. ප්‍රතිකාර අවසන් කළ පසුත් විෂ රැඳී ඇත්නම් අව්වේ සිටීමට ඇති අපහසුව, කෑම අරුචිය, ස්නානය විෂ වීම යනාදිය සිදු වන අතර ඒ සඳහා නැවත ප්‍රතිකාර සිදු කරනු ලැබේ. මෙම ප්‍රදේශයේ වෙදකම සමඟ යක්ෂ දේව ඇදහිල්ල ද බද්ධ වී පවතින බව ඇතැම් වෙදමහතුන් ප්‍රතිකාර කිරීම උදෙසා තම නිවසින් බැහැර වීමට පෙර නිවස සීමා කර යකින්නන් බාපතට හිර කර යෑම සිදු කිරීම තුළින් පෙනී යයි. නූතනය වනවිට ජනතාව බටහිර වෛද්‍ය ක්‍රමය කරා යොමු වී ඇති අතර එයින් සුවයක් නො ලද අවස්ථාවක දී හෙළ වෙදකමෙහි සහාය පතයි. මිල-මුදල් මත පදනම් නො වී මෙය සිදු කරනු ලබන අතර වර්තමාන පරම්පරාව මෙම ප්‍රතිකාර ක්‍රමයට යොමු නො වීමත්, දේශීය වෛද්‍ය ක්‍රමය ඉගෙනීමට ඇති අකැමැත්ත ද පදනම් කර ගනිමින් දේශීය සර්ප වෙදකම මෙම ප්‍රදේශයෙන් වියැකී යන ආකාරය හඳුනාගත හැකි ය.



***ප්‍රමුඛ පදඃ*** *සර්ප වෙදකම, ප්‍රතිකාර, ලග්ගල, සර්ප විෂ*

# පාරම්පරික හෙළ වෙද-හෙදකම හා ජනවිඥානය සතු රෝග නිවාරණ විධික්‍රම පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක් (ලග්ගල ප්‍රදේශයේ පාරම්පරික දේශීය වෙදකම ඇසුරින්)

එච්. කේ. මිල්ලගහතැන්න* සහ ඩබ්ලිව්. කේ. දිසානායක

භාෂා අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ

*harshimtc2010@yahoo.com

පාරම්පරික හෙළ වෙදකම පුලතිසි සෘෂි හා රාවණ රාජ්‍ය යුගයට අයත් වූවක් බවට සාක්ෂි වේ. උඩ්ඩිශ තන්ත්‍ර, අර්ක ප්‍රකාශ, නාඩි පරීක්ෂා හා කුමාර තන්ත්‍ර ආදී වූ වෛද්‍ය ශාස්ත්‍ර සම්බන්ධ රචනා රාවණ රජුගේ බවට මතයක් පවතී. ලග්ගල ප්‍රදේශයේ දේශීය වෛද්‍යවරුන්ගේ මතය වන්නේ රාවණ රජුගෙන් පසු ව මෙකී වෙදකම අංශ දෙකක් ඔස්සේ වර්ධනය වූ බව යි. එනම් රාක්ෂස වූ රාවණ රාජ්‍ය නිමාවීමෙන් දේශීය වෙදකම යක්ෂ ගෝත්‍රියින් අතට පත්වූ බවත්, බුදු දහමට අනුගත වූ යක්ෂ ගෝත්‍රිකයින්ගේ පරපුර තුළ (ලග්ගල ජනයා මේ ගණයට වැටේ) එක් පසෙකින්  වැඩෙද්දී අනෙක් පසින් වැදි ජනයා අත මෙම වෙදකම වර්ධනය වූ බවත් ය. ලග්ගල ප්‍රදේශාශ්‍රිත ව පවතින දේශීය වෙදකම මෙසේ අතිදීර්ඝ කාලයක සිට නො නැසී පැවතෙන බව ඔවුන්ගේ විශ්වාසය යි. කෙසේ වෙතත් පසුකාලීන ව පාරම්පරික දේශීය වෙදකම උත්තර භාරතීය ආර්යයන් හා දේශීය යක්ෂ ගෝත්‍රිකයින්ගේ සම්මිශ්‍රණයෙන් නිපන් සිංහල ජනයා ඔස්සේ රටපුරා ව්‍යාප්ත වූ බැව් සිතීම සහේතුක ය. මෙම ප්‍රදේශයේ ඓතිහාසික තත්ත්වය සාහිත්‍ය මූලාශ්‍රගත තොරතුරුවලින් ද අනාවරණය වේ. ආර්යලංකාවතාර සූත්‍රයෙහි ලංකාගිරි නමින් ද, රාමායණයෙහි රත්නගිරි, රත්නපර්වත, ලංකාගිරි, ලංකාපුර යන නම්වලින් ද ප්‍රකාශිත රාවණනගරය, ලග්ගල, මිණිපේ, මහියංගණය ආශ්‍රිත පිහිටි බවට මහාචාර්ය විමලවිජයසූරිය ද අවධානය කරන්නකි. මහාවංශයේ සත්වන පරිච්ජේදයේ 31-34 ගාථාවන්හි සඳහන් යක්ඛ නගරය හෙවත් ලංකානගරය, ලකේගල හෙවත් ලග්ගල වශයෙන් ද බුදුන්වහන්සේගේ ප්‍රථම ලංකාගමනේ දී මහියංගණ උයනට රැස් වූ යක්ෂ ගෝත්‍රිකයින් අතර ලග්ගල ප්‍රදේශයේ පදිංචි ව සිටි අයද වූ බව සමන්තකූට වර්ණනාවෙන් හෙළි වේ. දේශීය හෙළ වෙදහෙදකමෙහි ආදිතමයන්ගේ නිජබිම වූ ලග්ගල ප්‍රදේශයේ පවතින පාරම්පරික හෙළ වෙදහෙදකමෙහි ජනවිඥානය සතු රෝග නිවාරණීය විධික්‍රම පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක් සිදු කිරීම මෙහි අරමුණයි. ලග්ගල, නාරංගමුව ප්‍රදේශාශ්‍රිත ව සිදු කළ ක්ෂේත්‍ර අධ්‍යයන ඔස්සේ අක්ෂිරෝග, සර්පවිෂ හරණය, සර්වාංග රෝග, කැඩුම් බිඳුම්, ගව වෙදකම හා මනෝ වෛද්‍ය ප්‍රතිකාර සිදුකරන  දේශීය වෛද්‍යවරුන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා හා සහභාගීත්ව නිරීක්ෂණය තුළින් අවශ්‍ය දත්ත ලබා ගැනුණි. එමගින් අනාවරණය වූයේ විශ්වශක්ති බලය භාවිතයට ගැනීම, පාරම්පරික ගුරු ඇදුරන්ගේ වෙදකම පිළිබඳ විශ්වාසය, සොබාදහම පූජනීයත්වයට පත්කිරීම, වෙදදුරන්ගේ චිත්ත ශක්තිය, ජ්‍යොතිෂ්‍ය, අභිචාර, මන්ත්‍ර කෙම්ක්‍රම හා වත්පිළිවෙත් ආදිය එකිනෙකට බද්ධ වූ යාන්ත්‍රණයක් ඔස්සේ රෝගනිවාරණීය ජනවිඥානය සකස්වන බව යි. මෙකී යාන්ත්‍රණයේ අංග බොහොමයක් මේ වන විට බටහිර වෛද්‍ය පර්යේෂණ ඔස්සේ තහවුරු වෙමින් පැවතීම විශේෂත්වයකි. අතීතයේ දී උත්කෘෂ්ට ඇගයුමට ලක් වූ දේශීය හෙළ වෙදකම මේ වන විට හායනීයත්වයට පත්වෙමින් පවතී. එවැනි යුගයක සාම්ප්‍රදායික ජනවිඥානගත දැනුම ක්‍රමවත් හා විධිමත් ලෙස සංරක්ෂණය කිරිම සහ නැවත සමාජගත කිරීම තුළින් සාම්ප්‍රදායික රෝගනිවාරණ ක්‍රමශිල්ප නැවත පණගැන්වීමට පිටිවහලක් සැපයෙනු ඇත.

***ප්‍රමුඛ පදඃ*** *පාරම්පරික හෙළවෙදකම, වෛද්‍යවරු, ලග්ගල, ජනවිඥානය, රෝගනිවාරණ විධික්‍රම*

# දේශීය වෛද්‍ය ක්‍රමය හා බැඳුණු චාරිත්‍ර-වාරිත්‍ර සහ සම්ප්‍රදායයන් පිළිබඳ මානවංශවිද්‍යාත්මක අධ්‍යයනයක්

එස්. හතරසිංහ[1*], ඒ. බණ්ඩාරනායක[2], ඒ. කුලරත්න[3], ජී. විදානපතිරණ[4] සහ ජී. බදුරලිය[5]

[1,3]මධ්‍යම සංස්කෘතික අරමුදල, [2]පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, [3,4]ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, [5]පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

*sakuni.hatharasinghe@gmail.com*

දේශීය වෛද්‍ය සම්ප්‍රදාය නොයෙකුත් අභියෝග හමුවේ වුව ද එදා පටන් අද දක්වා ම නො නැසී පවතින බව හඳුනාගත හැකි ය. මෙකී දේශීය වෛද්‍ය කර්මයන්ගේ පවතින චාරිත්‍ර-වාරිත්‍ර සහ සම්ප්‍රදායයන් මෙන් ම ඒවායෙහි ආවේණික ලක්ෂණ පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. දත්ත රැස් කිරීම සඳහා හොරිවිල, නැදුන්ගමුව, පල්ලේවෙල ආදී දේශීය වෛද්‍ය පරම්පරාවන් කිහිපයකට අයත් වෛද්‍යවරුන් දසදෙනෙකුගෙන් (10) යුත් විනිශ්චයගත නියැදියක් තෝරාගෙන අනාකෘතිමය සම්මුඛ සාකච්ඡා පවත්වන ලදි. මෙයට අමතර ව ලිඛිත මූලාශ්‍රය ද පරිශීලනය කෙරිණි. කැඩුම්-බිඳුම්, සර්ප විෂ, විරේක ක්‍රම, නස්න ආදී සම්ප්‍රදායික දේශීය වෛද්‍ය ප්‍රතිකර්ම, අතීතයේ දී මෙන් ම වර්තමානයේ දී ද රෝගීන්ගේ අවධානයට වැඩි වශයෙන් ලක් වන අතර එබඳු දේශීය වෛද්‍ය ක්‍රම යෙදවීමේ දී ඖෂධ සඳහා අමුද්‍රව්‍ය ඒකරාශී කිරීම, ඖෂධ නිෂ්පාදනය, රෝගීන් පරීක්ෂා කිරීම සහ ප්‍රතිකර්ම කිරීම යන අවස්ථාවල දී ඒ සඳහා වෙන්වූ චාරිත්‍ර-වාරිත්‍ර අනුගමනය කෙරෙන බව පර්යේෂණ ප්‍රතිඵල මඟින් විශද විය. ශාකවල පොතු ලබාගැනීමේ දී වෘක්ෂ (නුග, නා වැනි) වටා ආරක්ෂාවන් කොට මන්ත්‍ර ආදිය මැතිරීම, වෙදකම් කිරීමේ දී මුණිවත රැකීම වැනි කෙම් ක්‍රම (උදා:-සර්ප විෂ වෙදකම් සඳහා), නැකත් බැලීම, චන්ද්‍රයාගේ සහ සූර්යයාගේ බලපෑම මත කාල-හෝරාවන් නිර්ණය, කිල්ල මගහැරීම වැනි විශ්වාසයන් එහි ලා උදාහරණ වේ. විවිධ ශාකවලින් කොටස් ලබාගැනීමේ දී ඒ සඳහා වෙන් වූ කාලයන් පවතින අතර කෙම්මුර, පොහොය හා රිට්ටාව යනාදි සුවිශේෂ දින ද ඒ අතර වේ. එසේ ම ආරක්ෂාව සඳහා පළඳින හෙණරාජ තෛලය, ඉරුදපන තෛලය, කෛයෝරු තෛලය, මහා යක්ෂභූත තෛලය, ශ්‍රී විෂ්ණුරාජ තෛලය, සර්වජනවශී තෛලය ආදී තෙල් වර්ග වන අතර 'හෙණරාජ තෛලය' නිෂ්පාදනයේ දී ඉන්ධන වශයෙන් භාවිත කරන්නේ අකුණු (හෙණ) ගසන ලද ශාකවල කොටස් පමණි. සර්ප දෂ්ඨන සිදු වූ කාල-හෝරාව අනුව විෂ ශරීරයට බලපෑමේ ස්වභාවය ද හඳුනාගෙන ඒ ඒ නිර්ණයන් අනුව කරනු ලබන ප්‍රතිකර්මයන්හි විවිධත්වයක් ද දක්නට ලැබේ. මෙම දැනුම පාරම්පරික ඥානය මඟින් ගොඩනැගී ඇත. මෙම චාරිත්‍ර-වාරිත්‍ර සහ සම්ප්‍රදායයන් සඳහා වූ විද්‍යාත්මක පසුබිම පිළිබඳ ව ද අධ්‍යයනයේ දී අවධානයට ලක් විය. ශාකවල කොටස් යම් නිශ්චිත වූ කාල-හෝරාවන්වල දී ලබාගැනීමේ චාරිත්‍රය සහ ඒවා ලබාගන්නා ආකාරය සඳහා පදනම් වී ඇත්තේ චන්ද්‍රයාගේ සහ සූර්යයාගේ බලපෑම, පෘථිවියේ ගුරුත්වාකර්ෂණය හේතුවෙන් ශාකවල පරිවෘත්තීය ක්‍රියාවන්වල ඇතිවන රසායනික වෙනස්කම් ආදි හේතූන් ය. ස්වභාවධර්මය මුල්කොටගත් දේශීය වෛද්‍ය ක්‍රමයන් හා සබැඳි චාරිත්‍ර-වාරිත්‍ර සහ සම්ප්‍රදායයන් හුදෙක් විශ්වාසයන් මත පමණක් ම පදනම් නො වන බව පර්යේෂණ ප්‍රතිඵලවලින් පැහැදිලි විය.

***ප්‍රමුඛ පද:*** *දේශීය වෛද්‍ය ක්‍රම, චාරිත්‍ර-වාරිත්‍ර, පාරම්පරික ඥානය, සම්ප්‍රදායයන්*

# ඓතිහාසික වෛද්‍ය ග්‍රන්ථවලින් හෙළි වන "පූහුඬා වෙදකම" පිළිබඳ අධ්‍යයනයක්

එම්. පී. ඒ. එල් චතුරංග*, ඊ. ඩී. ඒ මවිත් සහ එම්. ආර්. ආර්. ප්‍රියන්ත

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*anjanamavith1995@gmail.com

ශාරීරික ස්වස්ථතාව හෙවත් සෞඛ්‍ය පවත්වාගෙන යෑම සඳහා"පුහුඬා වෙදකමට" විශේෂ තැනක් හිමිව තිබේ. පුහුඬා වෙදකමට යනු දිය කුඩැල්ලන් ඇඟ ඇල්ලීමේ වෛද්‍ය ක්‍රමය යි. මෙම පුහුඬා වෙදකම අතීතයේ ද භාවිත වූ බව ක්‍රිස්තු වර්ෂ 10 වන ශත වර්ෂයට අයත් IV මිහිඳු රජුගේ (ක්‍රි.ව. 952-972) මිහින්තලා පුවරු ලිපියෙන් ද හඳුනාගත හැකි ය. අතීතයේ මෙන් ම වර්තමානයේ ද රෝග නිවාරණයට යොදාගන්නා සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයක් ලෙස පුහුඬා වෙදකමෙහි ඇති වැදගත්කම හඳුනාගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ යි. මෙහි දී උපයුක්ත ක්‍රමවේදය ලෙස ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර භාවිත කර ඇති අතර එහි දී පුස්තකාල අධ්‍යයනය යන ක්‍රමවේද හරහා දත්ත රැස් කෙරිණි. කුඩැල්ලා "ඇනලීඩා වංශයේ හිරුඩීනියා වර්ගයේ ලේ උරන්නා" යන පොදු ජීව විද්‍යාත්මක නාමයෙන් හඳුන්වයි. කුඩැල්ලන් වර්ග 12ක් පමණ හඳුනාගත හැකි අතර ඉන් වර්ග 6ක් පමණ විෂ සහිත වේ. විෂ රහිත කපිලා, පිංගලා, ශංඛමුඛී, මූෂිපා, පුණ්ඩරික මුඛී, සාවරිකා, යන කුඩැල්ලන් වර්ග 6 මෙම වෙදකම සඳහා යොදා ගනී. අවයව දැවිලි සහිත වූවන්, රක්තවාත රෝගීන්, කුෂ්ඨ රෝගීන්, වේදනා සහිත වාත රෝගීන්, විවිධ විෂ හේතුවෙන් රක්ත දූෂණය වූවන් සඳහා බහුල ව මෙම වෛද්‍ය ක්‍රමය යොදා ගනී. රක්ත මෝක්ෂණයට පෙර කුඩැල්ලන් සහ රෝගීන් සූදානම් කළ යුතු ය. කුඩැල්ලන් ඇල්ලීමට පෙර කහ මිශ්‍රිත ජලයේ මිනිත්තු 7ක් පමණ ගිල්වා තැබිය යුතු ය. එමගින් කුඩැල්ලන්ගේ ආමාශගත විෂ වමනය කරවීමත් බඩගිනි ඇතිකරවීමත් සිදු වේ. රෝගියාට කුඩැල්ලන් ඇල්ලීමට පෙර ලේ ඉරීමට සලස්වන ස්ථානය හොඳින් පිරිසිදු කළ යුතු ය. පසු ව කුඩැල්ලා අදාළ ස්ථානයේ තබන අතර ලේ උරා නො බොයි නම් තනකිරි, රුධිරය හෝ මී පැණි එම ස්ථානයේ තැවරිය යුතු ය. රක්ත මෝක්ෂණය පසු ව ද කුඩැල්ලන් සහ රෝගීන් සුරක්ෂිත කළ යුතු ය. කුඩැල්ලා දූෂිත රුධිරය උරා මත් වී ගැලවී වැටුණු කල්හි උගේ ඇඟෙහි හාල් පිටි ආලේප කොට තල තෙල් ගල්වා රුධිරය වමනය කරනතෙක් වලිගයේ සිට මුඛය දෙසට පිරිමැදිය යුතු ය. ලේ වමාරන්නේ නැතිනම් උගේ මුඛයෙහි හෝ පිට දිගෙහි හුණු හෝ දුම්කොළ ඇතිල්லිය හැකි ය. පසු ව පිරිසුදු ජලයට මුදා හළ යුතු ය. කුඩැල්ලන් ඇල්ලීමෙන් ඇති වූ තුවාලය මත මී පැණි ආලේප කළ හැකි ය. වර්තමානයේ භාවිත බටහිර වෛද්‍යය ක්‍රමවේද හේතුවෙන් මෙම වෛද්‍ය ක්‍රමය අභාවයට යමින් පවතී. නමුත් දේශීය වෛද්‍ය ක්‍රමය තුළ රෝග රැසකට ප්‍රත්‍යක්ෂ විසඳුමක් ලෙස මෙම වෛද්‍ය ක්‍රමයට සුවිශේෂී තැනක් හිමි විය යුතු ය.

**ප්‍රමුඛ පදඃ** *ස්වස්ථතාව, පුහුඬා වෙදකම, රක්ත මෝක්ෂණය, රක්ත දූෂණ, ආමාශගත*

# “*Davum Pilissum*” A Type of Sri Lankan Folk Medicine for the Treatment of Burns

J. I. D. Diddeniya

Institute of Indigenous Medicine, University of Colombo, Rajagiriya

*jidd1524@gmail.com*

“*Davum Pilissum*” is one of the of Sri Lankan folk medicine type which has been practiced over many centuries to cure injuries caused by burns. Before the invention of modern medicine, folk medicine was used to cure such injuries. Burns can be occurred due to acids, current exposures, lightening, hot water, alcohol, kerosene, and toxic substances etc. Folk medicine can relieve burns by applying drugs on and around the wound. The objective of this study was to examine the remedies documented in traditional documents related to folk medicine such as “*Deshiya Chikitsa Sangrahaya*”, “*Vatika Prakaranaya*”, and “*Thalpathe Piliyam*” to heal burn injuries. Symptoms occur due to burns such as burning sensation, excessive thirst, pain, swelling, fever, vomiting can be relieved by both external and internal preparations mentioned in these books. To minimize burning pain juice of ash banana (*Musa spp*) stem is applied over the affected area. Decoction made of *Venivelgeta* (*Coscinium fenestratum*), *Kottamalli* (*Coriandrum sativum*), *Belimul* (*Aegle marmelos*) and “*Vee pori*” can be used to relieve the thirst. To minimize fever, “*Seetharaama*” pills can be given orally. Hiccough can be cured by giving a paste of “*Vel Mee*” (*Glycyrrhiza glabra*) and bee’s honey. Constipation is treated by giving “*Aralu*” (*Terminalia chebula*) decoction with castor oil. The important fact identified through this study was that "*Davum Pilissum Chikitsa*” has mentioned about the scar removing treatments as well. When comparing with allopathic medicine and western medicine, this is one of the specific features included in the folk medicine. For the scar removing, flowers of “*Dam*” (*Syzygium cumini*) trees are roasted, and its powder mixed with sesame oil are applied on the scar. In the last stages of burn injuries, patients could get disfiguration. It can be treated using “*Behet kiri”*, which is a specific preparation found in the traditional medicine. Chanting mantra plays a major role as the victim is believed to be surrounded by unseen spiritual aspects. Ancestors believed the supernatural entities and their attraction on the individuals who had oozing and rotten wounds. In order to escape from them, fumigation has also been prescribed in folk medicine. If left untreated, in general the victims of burn injuries die from Pneumonia as a complication. Even though allopathic medicine prescribes egg white, yoghurt, milk, beef etc., folk medicine refuses them due to its ability of increasing phlegmatic conditions. Foods such as snake gourd, ridged gourd, green leaves, soup, and beans have been mentioned as favorable foods in folk medicine. With the above-mentioned procedures, burn injuries can be treated without causing any scars. Therefore, these types of treatments can be used efficiently to heal burn injuries. In addition, these types of traditional medicines can be used at present where more injuries are reported and occurred due to the massive number of industry related accidents.

***Keywords:*** *“Davum Pilissum Chikitsa”, Sri Lanka, Burn Injuries, Drug Preparations*

# FOLK MUSIC, POEM, & TALES

# සීගිරි ගී තුළින් නිරූපිත තත්කාලීන සමාජයේ ස්ත්‍රී භූමිකාව පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

එම්. එස්. සෙව්වන්දි

සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*Sachinimadurapperuma23@gmail.com*

අතීත ශ්‍රී ලාංකේය ජන විඥානය හෙළි කරන ජන ගී අතර සීගිරි ගී සුවිශේෂීත්වයක් උසුලයි. ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ පැරණිතම සිංහල පද්‍ය දක්නට ලැබෙන්නේ සීගිරි කැටපත් පවුරෙහි ය. ක්‍රි.ව. 526 - 552 අතර කාලවකවානුව තුළ සීගිරියේ වූ සිතුවම් නැරඹීමට පැමිණි ජනයාගේ කවි සංකල්පනාවන් සීගිරි ගී යනුවෙන් අද්‍යතන සමාජය හඳුනාගනී. මෙම අධ්‍යයනයේ දී සීගිරි ගීය තුළින් නිරූපිත තත්කාලීන සමාජයේ ස්ත්‍රිය පිළිබඳ ව සාහිත්‍යාත්මක ප්‍රවේශය යටතේ සිදු කරන ලදි. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ සීගිරි ගී තුළින් නිරූපිත තත්කාලීන සමාජයේ ස්ත්‍රියගේ සමාජමය භූමිකාව අධ්‍යයනය කිරීම යි. මෙම අධ්‍යයනයේ අධ්‍යයන ගැටලුව වූයේ තත්කාලීන සමාජය තුළ ස්ත්‍රියට හිමි සමාජමය භූමිකාව කුමක් ද යන්න සමාජ විද්‍යාත්මක ව අධ්‍යයනය කිරීම යි. මෙම සාහිත්‍යාත්මක ප්‍රවේශය තුළ දී අනාවරණිත ප්‍රමුඛතම සාධකය නම් එකල සමාජය තුළ ස්ත්‍රියගේ බාහිර ස්වරූපය ශෘංගාරය මතු කරමින් දැක්වීම යි (යොමු කෙහෙ මල්දමබැඳ නිල්තැලි දිගැස් මල ලූ කතක්..). එමෙන් ම එකල ද කාන්තාවන් ලිංගික සේවනයේ යෙදීම හා බහුභාර්යා සේවය තිබී ඇත (නොමන්ද් නොද් සිල් ලිය පියන් එක් ජෝ ගිය දවස්, ගලක් දැන් කළ විද ..). තම ස්වාමියාගේ ආර්ථිකය දුර්වල නම් කාම සේවනයේ යෙදී මුදල් උපයන ලෙස කෙරෙන කාව්‍යමය ආරාධනයන් එහි වේ. තව ද කුලපදනම මත කාන්තාවන්ට වන විවේචන එහි වේ (වෙසෙය් රිදියක් බෙයන්ද්හි රන්වනුන් අතුරෙ..). එසේ ම ස්වාමියා මිය ගිය කාන්තාවන් ආභරණ ඉවත ලා හුදෙකලා ජීවිත ගත කළ යුතු බව දැක්වේ (හො වියු නොවෙද හිමියා වියොවැ වියරුවක්..). තම ස්වාමියා පරදාර සේවනයේ යෙදුණ ද කාන්තාවන් ඉවසා දරා ගත යුතු බව කියැවේ. බින්න විවාහ ක්‍රමය එකල ද පැවත ඇත. තව ද කාන්තාවන් සිය ඔසප් සමයේ දී ස්වාමියා කෙරෙන් වෙන් ව බිම සැතපිය යුතු ය යන අදහස් සීගිරි ගී තුළ වේ (නැතැප් ඒ කළු රුතු ගැළහි හොවිත් බීමා..). බහුභාර්යා සේවනය අනුමත කෙරුණ ද බහුපුරුෂ සේවනය අනුමත නො කරයි (වරද ලෙදම නොගත් කී වදන් තා අතින්..). කාන්තාවන්ගේ වීණා වාදනය වැනි සෞන්දර්යාත්මක අංග පිළිබඳ සිගිරි ගී තුළ දැක්වේ (ගත රිසි කොට් වෙණ ළඟ නිරිද් ඉසිරා..). මෙම අධ්‍යයනය තුළින් ප්‍රකට වනුයේ සීගිරි ගී තුළින් කාන්තාවගේ රූපකාය පිළිබඳ කාව්‍යාත්මක අපූර්වත්වයකින් දක්වන අතර ම තත්කාලීන සමාජය තුළ කාන්තාව පුරුෂ මූලික සමාජ ක්‍රමය තුළ පීඩාවන්ට ලක් වූ අයුරු ද ඒ තුළ නිරූපණය වන බව යි.

***ප්‍රමුඛ පදඃ*** *සීගිරි ගී, කාන්තාව, ජන සමාජය*

# බුදු දහමින් පෝෂණය වූ ශ්‍රී ලාංකේය ජන කවිය පිළිබඳ විමර්ශනාත්මක විමසුමක්

කේ. ජී. සී. ඩී. කිරිඇල්ල*, ජේ, කේ. එස්. එම්. පෙරේරා සහ ඩී. ජී. අයි. එම්. කරුණාරත්න

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ

*kgchathuri22@gmail.com

ලක්වැසියා සැබෑ ලෙස ම බෞද්ධයන් බවට පත් වන්නේ ආනුභාව සම්පන්න අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේගේ සම්ප්‍රාප්තියෙන් පසු ව යි. විහාරස්ථානයක් කේන්ද්‍ර කරගනිමින් ග්‍රාමීය සංස්කෘතියක් නිර්මාණය විය. ඒ නිසා බෞද්ධ ජනතාවගේ සිතුම්-පැතුම්, අදහස්-උදහස්, ආකල්ප බුදු දහමින් පෝෂණය විය. ඇතැම් විට ග්‍රාමීය ජනතාවගේ සිතු-පැතුම්, අදහස්-උදහස් පවා සැකැසී ඇත්තේ බුදු දහමෙහි ආභාසයෙනි. දැන උගත්කමින් හීන වූ නූගත් ගැමියන් තම දෛනික ජීවිතයෙහි වෙහෙස මහන්සිය නිවා ගැනීම උදෙසා කරුණා රසයෙන් යුක්ත ජන කවි ගායනා කොට ඇත. එම ජන කවිය තුළ බෞද්ධ ආභාසය කොතෙක් දුරට අන්තර්ගත ව ඇත් ද සහ මතු පරම්පරාව යහපතෙහි පිහිටුවීමට ඔවුන් දරා ඇති ප්‍රයත්නයන් කොතෙක් ද යන්න විමර්ෂණයට ලක් කිරීම අපගේ පර්යේෂණයේ අරමුණ යි. මූලාශ්‍රය අධ්‍යයනය මගින් හා සම්මුඛ සාකච්ජා යන ක්‍රමවේදයන් යොදා ගනිමින් මෙය විමසුමට ලක්කරනු ලබයි. බෞද්ධ සංකල්ප පාදක කර ගනිමින් කර්මය, දුක්ඛ, දෝමනස්සය, සංසාරය, අනිත්‍යතාව, පාදක කර ගනිමින් මේවා නිර්මාණය වී ඇත. "පව් කළ ගොනෝ ඇදපන් හපුතල් යනවා.." මෙම කරත්තකරුවා ගැල අදින ගොනු ගැන දක්වන්නේ දයානුම්පාවකි. ඌ තිරිසනෙක් වීමට හේතුව පව් කළ බව එයින් ගම්‍යමාන වේ. අප විසින් තොරතුරු ලබා ගත් ගැමියන් පැවසුයේ ගොනා වැනි සතෙකු තුළින් මෙය නිරූපණය කරනු ලැබූයේ සමාජය තුළ නිතර දක්නට ලැබෙන දර්ශනයක් නිසා මිනිසාගේ මනසට ඉතා ඉක්මනින් ග්‍රහණය වන නිසා බවත් ය. "බුදුන් වදින ලෙස වැඳපන් අම්මාට" ගැමියන් අපට පැවසූයේ සිගාලෝවාද සූත්‍රය වැනි ගිහි ජීවිතයට අදාළ කරුණු පිළිබඳ ව නිරූපිත සූත්‍රගත කරුණු ජන කවිය තුළින් ඉදිරිපත් කිරීමට මෙය යොදා ගන්නට ඇති බව යි. "මල්ලියෙ ඔහොම නොකරන් අපෙ අම්මාට" යන්නෙන් දෙමාපියන්ට රිදවීම පාපයක් බව දැක්වේ. "නිවන් පුරේ පලයන් තලගොයි පැටියා" යන්නෙන් නිර්වාණය පසක් වේ. "සාදුකාර දී ඔරුවක නැගී වරෙන්" මේ තුළින් ගම්‍යමාන වන්නේ විපත්ති අවස්ථාවක පවා බුදු දහමේ පිහිට ආරක්ෂාව ප්‍රාර්ථනා කොට ඇති බව යි. බෞද්ධ ජනයා කෙතරම් කාර්යබහුල වුව ද ලැබෙන සුළු නිමේෂයෙන් වුව ද තමාගෙන් ඉටු විය යුතු යුතුකම් අමතක නො කරයි. "යන්නේ කවදා ද මව්පියො දකින්නට" යන්නෙන් ඒ බව පැහැදිලි වේ. මේ අනුව අප විසින් සිදු කරන ලද පර්යේෂණය මගින් නිගමනය කළ හැකි වන්නේ එකල ජන සමාජය බෞද්ධ ආභාසය ලබමින් ජන හදවත් තුළට බෞද්ධ සාරධර්ම නිරායාසයෙන් සම්ප්‍රේෂණය කිරීමට උත්සාහ දරා ඇති බවත් පුද්ගලයා යහපතෙහි යොදවා ආධ්‍යාත්මික ජීවිතය යහපත් කිරීමට ජන කවිය ඉවහල් කර ගෙන ඇති බව යි.

***ප්‍රමුඛ පද :*** *බුදු දහමින් පෝෂණය වූ ජන කවිය , බෞද්ධ ආභාසය, බෞද්ධ ආකල්ප*

# ජනකථාවෙන් ගොඩනැගෙන සමාජයඃ සමාජානුයෝජන කාරකයක් වශයෙන් ජනකථාවෙන් සිදු කරන කාර්යය

ඩබ්ලිව්. එස්. එන් සිරිවර්ධන[1*] සහ අයි. එම්. දිසානායක[2]

[1]සමාජ විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, [2]ප්‍රජා විද්‍යා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

*wsnsusi@gmail.com*

ජනකථා යනු සුවිශේෂී සාම්ප්‍රදායික මාධ්‍යය විධි ක්‍රමයකි සමාජානුයෝජනය සඳහා ජනකථා මගින් ඇති කරනු ලබන බලපෑම කෙබඳුද යන්න මෙම පර්යේෂණය තුළ ප්‍රධාන පර්යේෂණ ප්‍රස්තුතය විය. සමාජානුයෝජනය යනු සමාජයට එක්වන නවක සාමාජිකයන් එම සමාජ සංස්කෘතිය අනුව හැඩගැස්වීම යි. මෙහි දී ප්‍රධාන පර්යේෂණ අරමුණ වූයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රදේශයේ සුදර්ශනගම තුළ සමාජානුයෝජන කාරකයක් වශයෙන් ජනකථාවල වැදගත්කම අධ්‍යයනය කිරීම යි. උපඅරමුණු අතර ජනකතාවට අන්තර් පුද්ගල සන්නිවේදනය ඉක්ම වූ භාවාත්මක සබඳතාවක් ඇති කිරීමට දක්වන හැකියාව හඳුනාගැනීම සහ ජනකථා ඔස්සේ ඉලක්ක කරන ග්‍රාමීය සමාජ අවශ්‍යතාවන් මොනවා ද යන්න හඳුනාගැනීම විය. මෙම පර්යේෂණයේ දී අරමුණු සහගත නියැදි ක්‍රමය යටතේ ලබාගත් පරම්පරා තුනක් නියෝජනය වන සාමාජිකයන් සහිත පවුල් පහළොවක් නියැදිය විය. මිශ්‍රිත පර්යේෂණ එළඹුමට යටත් ව මෙම නියැදිය තුළින් සම්මුඛ සාකච්ඡා සහ ව්‍යුහගත ප්‍රශ්නාවලි ක්‍රමය මෙන් ම සෘජු නිරීක්ෂණය යොදාගන්නා ලදි. තේමා විශ්ලේෂණ ක්‍රමය දත්ත විශ්ලේෂණ සඳහා යොදාගන්නා ලදි. පරම්පරාගත ව එන ප්‍රදේශයට ආවේණික වන ජනකථා ප්‍රධාන විය. ජනකථා ඔස්සේ සමාජානුයෝජනය වූ තුන්වන පරම්පරාවේ වැඩිහිටියන්ට සැලකීම, ගුරුවරුන්ට සැලකීම, බෞද්ධ වත්පිළිවෙත් සඳහා දක්වන ළැදියාව, ප්‍රාසංගික ලක්ෂණ සහ ඉදිරිපත් කිරීමේ නිපුණතා වර්ධනය වීම සහ අපගාමී චර්යාවලින් වැළකීම වැනි තත්ත්වයන් වර්ධනය වීම කෙරෙහි ජනකථා සමාජානුයෝජන කාරකයක් වශයෙන් මැදිහත්වීමක් සිදු කර තිබුණි. විශේෂයෙන් සිංහල බෞද්ධ පදනමක් සහිත ග්‍රාමීය පරිසරයක් පර්යේෂණ ක්ෂේත්‍රය තුළ විය. ඒ අනුව ජනකථා තෝරාගැනීමේ දී විශේෂයෙන් සාම්ප්‍රදායික පිළිගැනීම් සහ බෞද්ධ පිළිගැනීම් ජනකතාව ඔස්සේ සමාජානුයෝජනය සඳහා ඉහළ පරම්පරා විසින් තෝරාගෙන තිබුණි. අපාගාමී චර්යාවලින් අනාගත විපාකය සිදු වන බවත්, යහපත් චර්යා ඔස්සේ යහපත් ජීවිතයක් උදාවෙන බවත් මෙහි දී ප්‍රේරණය කර තිබුණි. බෞද්ධ ජනකථා ඔස්සේ විනය ගොඩ නැංවීමත්, ප්‍රාදේශීය තොරතුරු රැගත් කතා ඇසුරින් විනෝදය මෙන් ම පසු සාකච්ඡාවක් තුළින් උපදේශනයත් හඳුනාගත හැකි විය. විශේෂයෙන් ම ප්‍රදේශයට ආවේණික රජ කථා සහ දේව කථා ඇසුරින් ජාත්‍යාලය උදෙසා මනස මෙහෙයවීමක් සිදු වේ. ආශ්චර්යයන් සහිත අත්භූත කථා හරහා එම සමාජයේ පවතින සංස්කෘතික වටිනාකම් පිළිගැනීමට පෙළඹවීමක් සිදු කර ඇත. පෙළඹවීම සහ අභිප්‍රේරණය යන මනෝ විද්‍යාත්මක එළඹුම් ජනකථා ඔස්සේ නිර්මාණශීලි ව සිදු කළ හැකි වීම මෙහි දී වැදගත් වේ. එසේ ම අපාගාමී චර්යාවන් තුළ නියැළෙන සාමාජිකයන් සහිත පවුල් සංස්ථා තුළ ද ජනකථාව යොදාගැනීම හඳුනාගත හැකි විය. ජනකතාව දරුවන් සමඟ රූපණය සහිත ව ඉදිරිපත් කිරීම ද, පරිකල්පනය ගොඩනංවන භාෂා හැසිරවීම ද, ජනකතාවෙන් පසුව ගොඩනැගෙන පසු සාකච්ජාව ද මෙම අරමුණු වඩාත් සාක්ෂාත් කිරීමට මැදිහත් ව තිබුණි. ඒ ඔස්සේ පවුල් සන්දර්භය තුළ ජනකථා යොදාගනිමින් වෙනසක් ඇති වූ බව හඳුනාගත හැකි විය. ඒ අනුව ජනකථා සමාජානුයෝජන කාරකයක් වශයෙන් දක්වන ප්‍රශස්ත බලපෑමක් ඇති කරන බව මෙම පර්යේෂණයේ දී හඳුනාගන්නා ලදි.

***ප්‍රමුඛ පදඃ*** *ජනකථා, ජීවන රටාව, පසු සාකච්ජාව, සමාජානුයෝජනය, සාම්ප්‍රදායික මාධ්‍ය*

# උතුරු ඉන්දියානු කජරී ගී සඳහා දේව සංකල්ප බලපා ඇති ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

ජී .කේ. සුභාෂ්

සංගීත හා නිර්මාණාත්මක තාක්ෂණවේදය  අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*subashkavidhu1@gmail.com*

උතුරු ඉන්දියානු  ජන ගායන සම්ප්‍රදායයක් වන කජරී ගායන ශෛලිය ඉන්දියාවේ උත්තර ප්‍රදේශය ආශ්‍රිත ව ව්‍යාප්ත ව පවතී. මෙම ගී විශේෂයෙන් වර්ෂා කාලයේ දී ගැයේ. කාන්තාවන් සඳහා විශේෂ වූ ගායන සම්ප්‍රදායයක් වන මෙම ගී ඇසුරු කරගත් ගැමි නර්තන සම්ප්‍රදායයක් ද පවතී. කජරී ගායන සම්ප්‍රදායය ට වසර සියයකට වැඩි ඉතිහාසයක් පවතින බව හඳුනාගත හැකි වේ. ගැමි ගායන සම්ප්‍රදායයක් ලෙස ආරම්භයේ දී  භාවිත වූ කජරී ගීත වර්තමානයේ දී  සංගීතමය වශයෙන් දියුණු වී ඇත. භාරතීය සංස්කෘතියේ ස්වභාවය දෙස බලන කල්හි හින්දු දේව සංකල්පයේ ආභාසය බොහෝ සංස්කෘතිකාංගයන් ට බල පා තිබෙන බව හඳුනාගත හැකි ය. ඒ අනුව භාරතීය සංගීත සම්ප්‍රදායයන් කෙරෙහි ද දේව සංකල්ප ඍජු ව බලපා ඇති බව හඳුනාගත හැකි වේ. මෙම අධ්‍යයනය සඳහා පර්යේෂණ ගැටලුව වන්නේ 'කජරී ගීතයන්ට දේව සංකල්ප බලපා ඇත්තේ කෙසේද' යන්න ය . මෙහි දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ කජරී ගීත විස්සක  නියැදියක් තෝරා ගන්නා ලදි. එම ගීවල පදමාලා භාෂා ප්‍රවීණයන් ලවා පරිවර්තනය කරනු ලැබී ය. දත්ත එක් රැස් කර ගැනීමේ මූලාශ්‍රය වශයෙන් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය යොදා ගන්නා ලදි. ප්‍රාථමික මූලාශ්‍රය යටතේ විධිමත් සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය ඔස්සේ උතුරු ඉන්දියානු සංගීතය ප්‍රගුණ කළ ලාංකේය ගුරුභවතුන් හා සංගීත ශිල්පීන් හමු වී දත්ත එක් රැස් කිරීම සිදු කෙරුණි. ද්විතීයික මූලාශ්‍රය වශයෙන් අන්තර්ජාලය භාවිත කෙරුණි. සොයාගැනීම්වලට අනුව කජරී ගීතයන්ගෙන් 'ප්‍රේමය, විරහව, පරිසර වර්ණනා' ආදි විවිධ තේමා නියෝජනය වුවත් මුල් කාලීන කජරී ගී දේව භක්තිය හා ඇදහිල්ල ප්‍රමුඛ කොටගෙන ම ගැයුණු  බවට හඳුනාගත හැකි විය. පර්යේෂණ නියැදියට අදාළ ගී පද මාලාවන්ගෙන් 70%ක විෂ්ණු දේව අවතාර සංකල්පය (රාම හා කෘෂ්ණ සංකල්ප ) ද, 20%ක ශිව දේව සංකල්පය ද, 10%ක වෙනත් සංකල්ප ද අන්තර්ගත වන බව තහවුරු වූ අතර පුරුෂ දෙවිවරුන් කෙරෙහි විශේෂ අවධානයක් ලබා දී ඇති බව හඳුනාගැනිණි. කජරී ගී ගැයෙන සමය තුළ දෙවියන් වෙනුවෙන් විශේෂ වශයෙන් පුදපූජා පැවැත්වේ. දේවාල ඇසුරු කරගෙන ගයනු ලබන කජරී ගී විශේෂයක් ද හඳුනාගත හැකි වූ අතර එම ගී 'භජන්' හෙවත් භක්ති ගී සම්ප්‍රදායට සමානකම් දක්වන බව ද අනාවරණය විය. මේ අනුව කජරී ගී තුළින් දේව භක්තිය, ඇදහිලි හා දේව කතා ආදි සංකල්ප ඉස්මතු වන බව තහවුරු වේ. ඒ ඔස්සේ කජරී ගීතයන්ට දැඩි ව දේව සංකල්ප බලපා ඇති බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** *ජන විශ්වාස, කජරී ගී, දේව සංකල්ප*

# ශ්‍රී ලාංකේය වතුකර දමිළ ජන සංගීතයෙහි සුවිශේෂීතාව පිළිබඳ ව අධ්‍යයනයක්


ආර්. එම්. පී. එස්. වීරසූරිය

ජාතික තාක්ෂණික ඩිප්ලෝමා ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය

*prasad.weerasooriya1@gmail.com*



දමිළ ජනතාවට ඔවුන්ට ම ආවේණික වූ වතුකර දමිළ සංස්කෘතියක් ඇත. විශේෂයෙන් ම මෙම සංස්කෘතිය ගොඩනැගෙන්නේ ඔවුන්ගේ ජීවන වෘත්තිය වූ වතු කම්කරු වෘත්තියත් සමඟ ය. දකුණු ඉන්දියාවෙන් වතු ශ්‍රමික පිරිසක් ලෙස බ්‍රිතාන්‍ය ජාතිකයින් විසින් දෙමළ පිරිස මෙරටට රැගෙන එන ලදි. නමුත් මෙරටට පැමිණි පසු වතු වගාව ආශ්‍රිත ව කටුක ජීවිතයක් ගෙවීමට ඔවුනට සිදු වූහ. මෙලෙස වතු වගාව ජීවන වෘත්තිය කර ගනිමින් ජීවත් වන විට එහි ආරක්ෂාව, විනෝදය ආදිය උදෙසා මොවුන් විසින් විවිධ කලාංග භාවිතයට ගෙන ඇත. තම ජීවිතයෙහි ආරක්ෂාව ප්‍රාර්ථනය කරමින් දෙවියන් පිදීමේ ක්‍රම ලෙස ද කටුකවූ දිවිපෙවෙතේ විනෝදය උදෙසා ද මොවුන් විවිධ ආකාරයේ ගායන, නර්තන ක්‍රම භාවිත කරන ලදි. ඇතැම් ගායන හා නර්තන ක්‍රම වතුකරයට ම  පමණක් සීමා වූ හා ඔවුන්ට ම පමණක් අනන්‍ය වූ ඒවා ලෙස හඳුනාගත හැකි ය. ඔවුන්ගේ වෘත්තියේ ඇති දුඩි වෙහෙස බව තුරන් කර ගැනීම උදෙසා ඔවුන් විසින් විවිධ වූ කවි ගායන සිදු කර ඇති අතර ඒවා වතුකර දමිළ ජන ගායන ලෙස හැඳින්විය හැකි ය. ශ්‍රී ලාංකේය වතුකර දමිළ ජන සංගීතයෙහි සුවිශේෂතාවක් පවතී ද යන ගැටලුව මූලික වෙමින් මෙම පර්යේෂණය සිදු කළ අතර වතුකර දමිළ ජන සංගීතයෙහි සුවිශේෂතාවක් පවතිනවා මෙන් ම භාවිතය හා ක්‍රියාව අනුව මෙය වෙනස් වේ යන උපන්‍යාසය මත දත්ත රැස්කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදි. මෙහි දී වතුකරයට විශේෂ වූ දමිළ ජන සංගීතය, ජීවන වෘත්තීන් හා බැඳි සංගීතය පිළිබඳ ව අධ්‍යයනය කිරීම ආදිය අන්තර්ගත විය. දත්ත රැස්කිරීමේ පර්යේෂණ ක්‍රමවේද ලෙස ගුණාත්මක දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය හා කතිකා විග්‍රහය නැමැති පර්යේෂණ ක්‍රමවේද භාවිත විය. එහි දී ප්‍රාථමික මූලාශ්‍රය මඟින් දත්ත රැස්කිරීමේ දී ක්ෂේත්‍ර අධ්‍යයනය හා හපුතලේ, තලවකැලේ, පූඩළුඔය ආශ්‍රිත ව පුද්ගලයන් හමු වී සම්මුඛ සාකච්ඡා සිදු කළ අතර ද්විතීයික මූලාශ්‍රය මඟින් දත්ත රැස්කිරීමේ දී ග්‍රන්ථ පුවත්පත්, ලිපි ලේඛන පරිශීලනය සිදු කරන ලදි. මෙම දත්ත විශ්ලේෂණය මඟින් ශ්‍රී ලාංකේය වතුකර දමිළ ජන සංගීතයෙහි ජන ගායන අංග, පුද්ගල ක්‍රියාව, ඉදිරිපත් කිරීම හා ඒවා භාවිතයෙහි සුවිශේෂතාවක් පවතින බව ද, පුද්ගල ආරක්ෂාව, ඇදහිලි විශ්වාස, සමාජීය කාරණා, රැකියාව, විනෝදය ආදිය උදෙසා මොවුන් විසින් විවිධ ගායන භාවිතයට ගෙන ඇති බව ද ඒවා වතුකරයට ම පමණක් සීමා වූ හා ඔවුන්ට ම පමණක් අනන්‍ය වූ ජන ගායන විශේෂ බව ද පැහැදිලි විය.



***ප්‍රමුඛ පදඃ*** *දමිළ සංගීතය, වතුකර දමිළ ජන ගීතය, ජන කලාංග, වතුකර දමිළ සංස්කෘතිය, දමිළ වතු වගාව*

# ජනකවියෙන් හෙළි වන සාම්ප්‍රදායික ජන ජීවිතයේ සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

එන්. ජී. ආර්. එල්. එන්. කුමාරි* සහ කේ. එම්. ඩී. පී. ගුණසිංහ

සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*lakmininimesha95@gmail.com

ජනකවිය මිහිපිට සිංහල ජාතිය ආරම්භ වන්නට පෙර සිට ම පවතින්නට ඇත. ගැමියාගේ සංකල්පනා තුළ සොබාදහමේ රිද්මය අවිඥානික ව ලැගුම් ගෙන තිබුණි. දහසකුත් එකක් දෛනික ජීවිත මෙහෙයවීමේ දී ඔවුන්ගේ ජීවිතය හා බද්ධ වූ වෘත්තීන්හි විවිධත්වය, සමාජ ආර්ථික තත්ත්වයන් ජන කවිය ඔස්සේ සමාජයට නිරාවරණය කළ අයුරු සැබැවින් ම උත්කෘෂ්ට ය. ඒ අනුව මෙම පර්යේෂණයෙහි අධ්‍යයන ගැටලුව බවට පත්වූයේ ජන කවිය තුළින් සාම්ප්‍රදායික ගැමියාගේ ජීවිතයේ සමාජ ආර්ථික තත්ත්වයන් නිරූපණය වන්නේ කෙසේ ද යන්න යි. ජනකවි අධ්‍යයනය ඔස්සේ සාම්ප්‍රදායික ගැමි ජීවිතේ සමාජ ආර්ථික තත්ත්වය හඳුනාගැනීම අධ්‍යයනයේ මූලික අරමුණ විය. අධ්‍යයනයේ පහසුව තකා පුස්තකාල අධ්‍යයනයන් යොදාගත් අතර එහි දී විවිධ වර්ගයේ ජන කවි අතරින් සාම්ප්‍රදායික ගැමි ජීවනයේ ආර්ථික හා සමාජ අංශයන් නිරූපණය වන පරිදි ජනකවි 30ක් අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදී. ඒ පැල් කවි, පතල් කවි, බඹර කවි, කරත්ත කවි, පාරු කවි හා ගොයම් කවි යන ජන කවි ප්‍රභේදයන්ට අදාළ ව ය. අධ්‍යයනය හරහා අනාවරණය කරගත් ප්‍රතිඵලවලට අනුව ගැමි ජීවිතය ප්‍රථම වරට නිරාවරණය කරන ලද පර්යේෂකයන් පිරිස ලෙස ජන කවීන් හඳුනාගත හැකි ය. සාම්ප්‍රදායික ගැමියා තම පවුලේ ආර්ථික අවශ්‍යතාව සඳහා ජීවිතයත්, මරණයත් අතර ගැටෙමින් කෙතරම් දුෂ්කර හා අභියෝගජනක ජීවිතයක් ගෙන ගියේ ද යන්න ජන කවිය තුළින් මනා ව නිරූපණය කරයි. පතල් කර්මාන්තය, බඹර කැපීම ආදි දුෂ්කර වෘත්තීන්හි නියැළෙන විට ගැමියාගේ මුවින් ගලා අව්‍යාජ නිර්මාණ ඒ අවදානම් සහගත ජීවිතය නිරූපණය කරයි. පවුල තුළ මෙවැනි දුෂ්කර කාර්යයන්වල නිරත වූයේ ආර්ථික සම්පාදිතයා වශයෙන් පුරුෂයා ය. තත්ත්වය හා කාර්යභාරයන් සාම්ප්‍රදායික ගැමි සමාජය තුළ බෙදී පැවති බවක් ඒ අනුව පැහැදිලි වේ. එකල සමාජයේ ගමනාගමනය සඳහා පාරුව, කරත්තය යොදා ගැනීම තුළින් මංමාවත් හා ප්‍රවාහන තත්ත්වය කෙබඳු වී දැයි අවබෝධ කොට ගත හැකි ය. ගැමි ජීවනයේ සරල බව ජන කවිය තුළින් රසාලිප්ත ව සන්නිවේදනය කර තිබේ. එමෙන් ම සාම්ප්‍රදායික ගැමි සමාජය තුළ අන්‍යෝන්‍ය සහයෝගය, එකමුතුකම, ආචාරධාර්මික බව ගොයම් නෙළීම, පැල් රැකීම ආශ්‍රිත ව බිහි වූ ගොයම් කවි, පැල් කවි තුළින් නිරූපිත ය. ගැමි සංස්කෘතිය තුළ ද ඇදහිලි හා විශ්වාස පද්ධතියක් ජීවිතය හා බද්ධ ව පැවති අයුරු ද ගැමියාගේ මුවින් අව්‍යාජ ගලා ආ ජන කවි තුළින් විදහා දක්වයි. ඒ අනුව ජන කවිය වූ කලී සාම්ප්‍රදායික ගැමි ජීවනයේ සමාජ හා ආර්ථික පැතිකඩයන් නිරාවරණය කරන්නා වූ අව්‍යාජ නිර්මාණයන් බවත්, එම නිර්මාණ අනාගතය වෙනුවෙන් සංරක්ෂණය කිරීම කාලීන අවශ්‍යතාවක් බවත් නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** *ජන ජීවිතය, ජන කවිය, සමාජ ආර්ථික තත්ත්වය, සොබාදහම*

# ශ්‍රී ලාංකේය රබන් ගීයෙන් හෙළි වන බෞද්ධාගමික පසුබිම

එන්. ඩබ්. ඊ. ඩී. ඩී. ඉසුරංග

භාෂා සංස්කෘතික අධ්‍යයනය හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*dilankadishan2018@gmail.com*

ශ්‍රී ලාංකේය ජන සමාජයේ සංස්කෘතිය හා බද්ධ වූ අවනද්ධ වාද්‍ය භාණ්ඩයක් ලෙස රබාන දිගු කාලීන ඉතිහාසයකට උරුමකම් කියයි. ලාංකේය ගැමි ජනතාව තම විනෝදාස්වාදය සඳහා ද, ජාතික උත්සව, විවාහ මංගල උත්සව, පෙරහැර මංගල උත්සව හා ආගමික උත්සව යනාදි අවස්ථාවන්හි දී රබන් වාදනය සිදු කොට ඇත. එහි දී ගායනය කරන ලද මෙම රබන් ගී සඳහා බෞද්ධ ආගමික පසුබිම බලපා ඇති බව හඳුනාගත හැකි වේ. වර්තමානය වන විට ලාංකේය සංස්කෘතියෙන් බොහෝ සංස්කෘතිකාංග අභාවයට යමින් පවතී. ඒ අනුව, මෙම රබන් ගීත කලාව ද ශ්‍රී ලාංකේය ජන සංස්කෘතියෙන් ගිලිහී, ඈත් ව යන ජන කලාවක් බවට පත් ව ඇත. එහි දී මෙම ජන සංස්කෘතිය රැක ගැනීමටත් මතු පරපුරට දායාද කිරීමටත් ශ්‍රී ලාංකේය වත්මන් පරපුර අතර ප්‍රවණතාවක් පවතින අතර ඒ අනුව ශ්‍රී ලාංකේය ජන ගායන විශේෂයක් වශයෙන් රබන් ගී පිළිබඳ අධ්‍යයනය කිරීමේ වැදගත්කමක් පවතී. එහි දී මෙම අධ්‍යයනය සඳහා පර්යේෂණ ගැටලුව වශයෙන් ''රබන් ගී සඳහා බෞද්ධ ආගමික පසුබිම බලපා ඇත්තේ කෙසේ ද?'' යන්න හඳුනාගන්නා ලදි. මෙහි දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ අහඹු ලෙස තෝරාගත් රබන් ගී තිහක නියැදියක් තෝරා ගන්නා ලදි. මෙහි දී දත්ත එක් රැස් කරගැනීමේ ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් විධිමත් සම්මුඛ සාකච්ඡා දූරකථන සංවාද ආදිය ඔස්සේ රබන් නිර්මාණ ශිල්පීන්, රබන් වාදකයින් හා පාරම්පරික නර්තන ශිල්පීන් සමඟ සම්බන්ධ වී දත්ත එක් රැස් කිරීම සිදු කරන ලදි. ද්විතීයික මූලාශ්‍ර වශයෙන් ග්‍රන්ථ, සඟරා, ලිපි, පුවත්පත්, හා අන්තර්ජාලය උපයෝගී කරගනු ලැබී ය. එම මූලාශ්‍රවලට අනුගත ව බලන විට බොහෝමයක් මෙම රබන් ගීතවල පදමාලා පිළිබඳ අධ්‍යයනයේ දී බුද්ධ චරිතය, ජාතක කතා, වත් පිළිවෙත්, ත්‍රිවිධ රත්නයේ ගුණ වස්තු විෂය වී ඇති බව හඳුනාගත හැකි විය. රබන් සෙල්ලමෙහි එන ස්තෝත්‍ර ගායනය, අවසර කවි ආදි අංගයන්හි තුණුරුවන් සිහිකර ආගමික වත්පිළිවෙත් අනුව රබන් වාදනය හා නර්තනයට ප්‍රවිෂ්ට වීම ද දක්නට හැකි සුවිශේෂී ලක්ෂණයක් විය. සම්මුඛ සාකච්ඡා ඇතුළු මූලාශ්‍රවලින් ලබාගත් තොරතුරු අනුව, රබන් ගී තුළින් බෞද්ධ සාහිත්‍යයට, බෞද්ධ සංස්කෘතියට, බෞද්ධ දර්ශනයට හා බෞද්ධ ඉතිහාසයට අදාළ කරුණු මෙන් ම බෞද්ධ ආගමික සංකල්පවලට සමගාමී වූ දේව සංකල්ප පිළිබඳ ව ද හෙළි විය. මේ අයුරින් විමසා බලන විට ශ්‍රී ලාංකේය රබන් ගී සඳහා බෞද්ධාගමික ආභාසයක් ලැබී ඇති බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** *ජන කලාව, අවනද්ධ භාණ්ඩ, ගැමි ආගම*

# අද්‍යතන සිංහල කිවිඳියන්ගේ කාව්‍ය නිර්මාණ සඳහා ජනශ්‍රැතියේ ආභාසය (තෝරාගත් කිවිඳියන් තිදෙනෙකුගේ කාව්‍ය නිර්මාණ ඇසුරෙනි)

එස්. ආර්. කෞශල්‍යා

සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

*rash.kaushalya@gmail.com*

දහනව (19) වන සියවසෙන් පසු අද්‍යතන සිංහල කවියට පදනම සැකසුණු බව විද්‍යමාන ය. ක්‍රමික ව නැවුම් වෙමින් හා වර්ධනය වෙමින් වර්තමානය දක්වා අඛණ්ඩ ව පවත්නා අද්‍යතන සිංහල කවිය විවිධාකාරයෙන් පෝෂණය වී ඇත. අතීතයේ පටන් මුඛ පරම්පරානුගත ව පවතින සාහිත්‍යයක් ලෙස ජනශ්‍රැති හඳුන්වා දිය හැකි ය. ජනශ්‍රැති සාහිත්‍ය ශානරයට අයත් උපශානර ලෙස ජන ගී, ජන කවි, ජන කතා, ජන නාට්‍ය, ජන ක්‍රීඩා, ජන සංගීතය, ජන ඇදහිලි හා ප්‍රස්තා පිරුළු ආදිය හැඳින්විය හැකි ය. ඒ අනුව මෙම අධ්‍යයනයේ දී අවධානය යොමු කෙරෙනුයේ අද්‍යතන සිංහල කවිය ජනශ්‍රැතියෙන් ලද ආභාසය විමසා බැලීමටයි. අද්‍යතන සිංහල කවිය සම්බන්ධයෙන් විවිධ පර්යේෂණ සිදුකෙරී ඇතත්, කිවිඳියන්ගේ නිර්මාණ සඳහා ජනශ්‍රැතියේ ආභාසය සම්බන්ධයෙන් සාකච්ඡා වී ඇත්තේ සුළු වශයෙනි. එහෙයින් මෙම පර්යේෂණය විශේෂකොට සැලකිය හැකි ය. මෙහි දී පර්යේෂණ සීමාව ලෙස අද්‍යතන අවධියට අයත් වර්ෂ 2016-2018 කාල පරාසයත්, අද්‍යතන කිවිඳියන් තිදෙනෙකුගේ නිර්මාණත් පාදක කර ගන්නා ලදී. අද්‍යතන කිවිඳියන් සිංහල කාව්‍ය නිර්මාණයේ දී ජනශ්‍රැතියෙන් ලද ආභාසය කෙබඳු ද? යන්න විමසා බැලීම පර්යේෂණ ගැටලුව වෙයි. ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය යටතේ මෙම පර්යේෂණය සිදුකළ අතර එහි දී ප්‍රාථමික දත්ත ලෙස මඳහසක මැදියම, ඔබ ගැඹුරු නින්දක හා පත්මේ පළාතෙන් හිරිකඩ හමාගෙන යන ග්‍රන්ථ පරිශීලනය කරන ලදී. ද්විතීයික මූලාශ්‍රය ලෙස න්‍යායික ග්‍රන්ථ හා අන්තර්ජාලය පරිශීලනය සිදු කරන ලදි. අනුරාධා නිල්මිණී කිවිඳියගේ මඳහසක මැදියම කෘතියේ " අනුලා බිසවගේ සිරියහන් ගැබට රහසින් පිවිසි ආගන්තුකයා" කාව්‍යය සඳහා ඓතිහාසික කතාවක් වන අනුලා බිසවගේ කතාව වස්තු විෂය කොටගෙන තිබේ. ඇයගේ ම "දයාබර දස්කොන්" නම් කාව්‍යය, දස්කොන්-ප්‍රමිලා ප්‍රේම පුරාණය විෂය කර ගනිමින් ලියන ලද්දකි. එම පුරාණෝක්තිය පාදක කර ගනිමින් නිර්මාණය වූ ජන කවියක් ලෙස "සක්මන් කරන මලුවෙදී බැඳි හාද" යන්න දැක්විය හැකි ය. මාලතී කල්පනා කිවිඳියගේ ඔබ ගැඹුරු නින්දක කෘතියේ "බිතු සිතුවම්" නම් කාව්‍යයෙන් සෙසු ජනශ්‍රැතිකාංගයක් වන තේරවිලිවල ආභාසය පිළිබිඹු වේ. "මාරයාගේ තොල සකි නුඹ දන්නවද" යන තේරවිලි කවිය ඊට නිදසුන් වේ. ඇයගේ "නො තෙත් හිත් මත කාසල් කඳුළු" යන කාව්‍ය නිර්මාණයෙහි ජනකවි ආභාසය දක්නට ලැබේ. චතුරි දමයන්ති කිවිඳියගේ සිරිපාද වන්දනාව වස්තු විෂය කර ගත් කවියක සිරිපා කරුණාව පිළිබඳ ජනශ්‍රැති අන්තර්ගත කොට තිබේ. සබරගමුවට ආවේණික ජනශ්‍රැති රැසක් ඇගේ පත්මේ පළාතෙන් හිරිකඩ හමාගෙන කෘතියේ අන්තර්ගත වේ. අනාවරණය වූ සාධක සලකා බලන කල්හි අද්‍යතන පද්‍ය සාහිත්‍යය පෝෂණයෙහි ලා ජනශ්‍රැතිකාංග ප්‍රබල ලෙස උපස්ථම්භක වී ඇති බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** *අද්‍යතන කිවිඳියන්, අද්‍යතන සිංහල කවිය, ආභාසය, ජනශ්‍රැති, වර්ෂ 2016-2018*

# හෙළ ඡන්දස් ශාස්ත්‍රයේ එන 'යවහන්' දෝෂය හා ජනකවිය පිළිබඳ අධ්‍යයනයක්

එම්. ඒ. ජී. ජේ. සමීරා

සිංහල අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය රුහුණ විශ්වවිද්‍යාලය

*jayani.sameera7@gmail.com*

ජනකවිය සාමාන්‍ය ජනයා අතුරෙන් සම්භවය වූ ජනශ්‍රැතිකාංගයක් වන හෙයින් ජනකවියා ඡන්දස් හා අලංකාර පිළිබඳ සැලකිල්ලෙන් කාව්‍ය පබඳින බවක් හුවා නො දැක්වෙයි. එහෙත් ඇතැම් අර්ථාලංකාර හා ශබ්දාලංකාර භාවිතයෙන් අලංකාර පිළිබඳ යම් සැලකිල්ලක් දක්වා ඇති බව පැහැදිලි වුවත්, ජන කවියා ඡන්දස කෙරෙහි දක්වා ඇති අවධානය විමසා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ යි. ඒ අනුව මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ හෙළ ඡන්දස් ශාස්ත්‍රයේ එන යවහන් දෝෂය කෙරෙහි ජන කවියා දක්වා ඇති සැලකිල්ල කෙබඳු ද? යන්න විමසා බැලීම යි. කාව්‍ය පබැඳීම හා සබැඳි ඡන්දස් ශාස්ත්‍රයේ රීති බොහෝ වෙතත්, මෙහි දී පර්යේෂණ සීමාව ලෙස සලකනුයේ හෙළ ඡන්දස් ශාස්ත්‍රයේ එන යවහන් දෝෂය පිළිබඳ ව යි. මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාලය පරිශීලනයෙන් සපයාගත් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය දත්ත ඇසුරින් සිදු කරන ලද්දක් වන අතර ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් එළු සඳැස් ලකුණ හා සිදත් සඟරාවත්, ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ජනකවි අන්තර්ගත වන ග්‍රන්ථ, සඟරා හා ලිපිලේඛනත් පරිශීලනය කරන ලදි. දත්ත මැනවින් පාඨනය කොට, විශ්ලේෂණය කොට ඇගයීමෙන් නිගමන සඳහා එළැඹෙන ලදි. සාහිත්‍ය විමර්ශනයේ දී ඡන්දස් ශාස්ත්‍රය සම්බන්ධයෙන් සහ ජනකවිය සම්බන්ධයෙන් පූර්ව අධ්‍යයන සිදු කෙරී ඇති බව තහවුරු වුවත්, ඡන්දස් ශාස්ත්‍රයේ එන යවහන් දෝෂය කෙරෙහි ජනකවියා දක්වා ඇති සැලකිල්ල පිළිබඳ අධ්‍යයන අල්ප වන හෙයින් මෙම අධ්‍යයනය විශේෂ වෙයි. පද්‍යයක් බන්ධනයේ දී එයින් ගුණ-දොස් ජනනය වන බව පෙරදිග ශබ්දවේදීහු විශ්වාස කළහ. මේ හේතුවෙන් දෝෂ රහිත කාව්‍ය පබැඳීමට කවීහු නිරන්තරයෙන් උත්සාහ කළහ. පද්‍යයක දෝෂහරණය කිරීමේ ශාස්ත්‍රය වශයෙන් ඡන්දස් ශාස්ත්‍රයට මුල් තැනක් දෙමින් කාව්‍ය ගෙතීමට ඔවුන් පෙලඹී ඇත්තේ එහෙයිනි. එළු සඳැස් ලකුණෙහි හා සිදත් සඟරාවෙහි හෙළ ඡන්දස් ශාස්ත්‍රය සම්බන්ධයෙන් සිංහලයට පමණක් ආවේණික කාව්‍ය දෝෂයක් ලෙස යවහන් දෝෂය හඳුන්වා ඇත. මෙහි දී ය, ව, හ, න් යන අක්ෂර සතර පාදන්තයේ එළියට යෙදෙන කල්හි ඊට පූර්වයෙහි ද අන්‍ය අක්ෂරයකින් එළි සම කිරීමෙන් දෝෂහරණය වන බව කියැවේ. කවි පදයක් අගට යෙදෙන මේ අකුරු සතර බොහෝ විට අර්ථ ශූන්‍ය වීම ඊට හේතුව යි. මෙම කාව්‍ය රීතියට අනුගත ව කාව්‍ය පබැඳීමට ඇතැම් ජනකවීන් සමත් වී ඇති බවට සාධක හමුවීමෙන් තහවුරු වන්නේ, ජනකවියා ඡන්දස කෙරෙහි දක්වා ඇති අවධානයයි. දත්ත විශ්ලේෂණයට අනුව ජනකවි ද උසස් කාව්‍ය ගුණවලින් යුත් පද්‍ය ශාඛාවක් බැව් නිගමනය කළ හැකි ය. ජන කවියාගේ ශක්‍යතාව හා ජන කවියේ නිර්මාණාත්මක පක්ෂය හඳුනාගැනීමට මෙබඳු පර්යේෂණ වැදගත් වෙයි.

***ප්‍රමුඛ පද:*** *ජනකවිය, ජනකවියාගේ ශක්‍යතාව, ජනකවියේ නිර්මාණාත්මක පක්ෂය, යවහන් දෝෂය, හෙළ ඡන්දස් ශාස්ත්‍රය*

# වැදි ජන නාදෝත්පාදක උපකරණවලින් හෙළි වන සංගීතමය ලක්ෂණ

එල්. එන්. බන්දුසේන

ප්‍රාසංගික කලා හා දෘශ්‍ය කලා සැලසුම්කරණ ඒකකය, මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

*lakshanimusic@gmail.com*

සංගීතය යනු ශබ්දය හෝ ශ්‍රවණය පිළිබඳ වූ ධ්වනි විද්‍යාවකි. මිනිස් සිතෙහි හටගනු ලබන භක්තිය, විශ්වාසය, චිත්තවේගී ආමන්ත්‍රණ වැනි හැඟීම් ප්‍රකාශනය සඳහා නාදය යොදා ගැනුණි. තම වින්දනීය අවශ්‍යතා, ආධ්‍යාත්මික අවශ්‍යතා, සමාජ අවශ්‍යතා පිරිමසා ගැනීමට නාදය උපයෝගී කරගත් වැදි ජනතාව එම නාදවල ලාලිත්‍යය අවස්ථානුකූල ව රිද්මයන් කරා හැසිරවූයේ ප්‍රාථමික නාදෝත්පාදක උපකරණ නිර්මාණයෙනි. වැදි ජනතාව යනු සොබාදහම ආස්වාදනය කරමින් ඒ තුළ ම කලාව නිර්මාණය කරගන්නා වූ ජන කොට්ඨාසයකි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ වැදි ජනතාව නාදයක් උත්පාදනය කිරීමේ පරමාර්ථයෙන් නිෂ්පාදනය කර ඇති ප්‍රාථමික නාදෝත්පාදක උපකරණ පිළිබඳ අධ්‍යයනය කිරීම හා ඒවායේ සංගීතමය ලක්ෂණ හඳුනාගැනීම යි. පර්යේෂණය සඳහා ප්‍රාථමික ගුණාත්මක දත්ත රැස් කිරීම දඹාන වැදි ගම්මානය ආශ්‍රිත ව සිදු කළ අතර දත්ත රැස් කිරීමේ ක්‍රමවේද ලෙස නිරීක්ෂණ ක්‍රමවේදය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය භාවිතයට ගැනිණි. ද්විතීයික දත්ත රැස් කිරීමේ දී ලිඛිත සාහිත්‍යය අධ්‍යයනය කරන ලදි. වැදි ජනයා මූලික වශයෙන් දඩයම, කෘෂිකර්මාන්තය, නෑ යකුන් ඇදහීම, දෙවියන් ඇදහීම, වැදි ශාන්තිකර්ම, වැදි පෙරහැර සහ විනෝදාස්වාදය, යන ආගමික, සමාජීය, සංස්කෘතික, අවශ්‍යතා සඳහා නාදෝත්පාදක උපකරණ භාවිතයට ගෙන ඇති අතර එම උපකරණ ස්වර (Notes), කාලය (Time) රිද්මය (Rhythm) ලය (Tempo) යන ප්‍රධාන සංගීතමය මූලධර්ම ඔස්සේ ගොඩනැගී ඇති බව අධ්‍යයනයේ දී හෙළි විය. වැදි ජනතාව සතු කඳේ කොටන යමකය, දඬු කඳ, බිම පොජ්ජ ටකාරන යමකය, බටේ, බටිත්තා, රම්මානිස්ස, කුකුළ් වේවැල් හොරණෑව, බෙලිගෙඩි පොජ්ජ, තල් රැකුම් පොජ්ජ, වාකරල්, ඇත්දුම් බෙරේ, හාතා බඹරා, පොල්කටු වීණාව යන උපකරණ සෙලවීම, ඇතිල්ලීම, පිඹීම, තට්ටු කිරීම යන නාදෝත්පාදක ක්‍රම මත නිර්මාණය වී ඇති අතර තාලය සහ රිද්මය යන සංගීතමය මූලධර්මය පදනම් කරගනිමින් අවනද්ධ සහ ඝන වාද්‍ය (Percussion) භාණ්ඩ ප්‍රධාන ව වැදි ජනයාගේ දෛනික අවශ්‍යතා සපුරාලීමට මෙම නාදෝත්පාදක උපකරණ භාවිත කර ඇති බව පර්යේෂණය ඔස්සේ නිගමනය විය.

***ප්‍රමුඛ පද:*** *සංගීතය, වැදි ජනතාව, නාදෝත්පාදක උපකරණ, හඬ උත්පාදනය, නාදය*

# නූතන සිංහල කවියා ඓතිහාසික ප්‍රවාද ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා දැක් වූ ශක්‍යතාව (තෝරාගත් නූතන සිංහල කාව්‍ය නිර්මාණ කිහිපයක් ඇසුරෙන්)


අපරැක්කේ සිරිසුධම්ම හිමි

සිංහල අධ්‍යයන අංශය, රුහුණ විශ්වවිද්‍යාලය

*sudhaaparekke@gmail.com*



ඓතිහාසික ප්‍රවාද, ජනශ්‍රැති හා පුරාණෝක්ති වැනි දෑ ඔස්සේ සාහිත්‍යකරුවා නිර්මාණකරණයේ යෙදීම, ඕනෑම සාහිත්‍යයක දැකගත හැකි විශේෂ ලක්ෂණයකි. යම් යම් කරුණු වාර්තා කිරීමේ දී සාහිත්‍යකරුවාගේ හා ඉතිහාසකරුවාගේ ප්‍රස්තුතය සමාන වුවත්, එය රචනා කිරීමේදී ඔවුනොවුන් විසින් භාවිත කරන ලද රචනා උපක්‍රම, පරිකල්පනීය ලක්ෂණ හා විවිධ ප්‍රතිනිර්මාණ විධි වෙනස් විය හැකි ය. ඊට ප්‍රධාන හේතුව වන්නේ ඉතිහාසකරුවාට තමන්ට අවශ්‍ය ඕනෑ ම දෙයක් ලිවීමේ නිදහස නොමැති වීම හා සාහිත්‍යකරුවාට ඕනෑ ම ඓතිහාසික කරුණක් තමාගේ පරිකල්පනය අනුව ප්‍රතිනිර්මාණයට නිදහස පැවතීම යි. මෙම කාරණාව ඇරිස්ටෝටල් විසින් පවසන ලද පහත ප්‍රකාශයෙන් තවදුරටත් සනාථ කරගත හැකිය. "කවියාගේ කාර්යය වන්නේ ඇත්ත වශයෙන් ම සිදු වූ දෑ විස්තර කිරීම නො ව, සිදු වෙතියි සැලකිය හැකි - එනම් ඒ ඒ අවස්ථාව අනුව විය හැකි හෝ සිදු වුවමනා දේ විස්තර කිරීම යි." සම්භාව්‍ය සිංහල සාහිත්‍යය අධ්‍යයනය කිරීමේ දී බුදුසිරිත හෝ වෙනත් ඉතිහාසගත සංසිද්ධි සාහිත්‍යානුසාරයෙන් ඉදිරිපත් කෙරෙන විවිධ නිර්මාණ දැකගත හැකි ය. එහෙත් ඒ නිර්මාණ සඳහා බල පෑ දේශපාලනික, ආගමික, සංස්කෘතික හා සාහිත්‍යික නියමයන් අනුව විවිධ සීමාවලට ලක්වීමට සිදු විය. එකල සාහිත්‍යකරුවගේ පරිකල්පනය හා ප්‍රතිනිර්මාණය එකී ආකෘති නියම අතර යම් තාක් දුරකට සීමා විය. එහෙත් නූතන සිංහල කාව්‍ය නිර්මාණ අධ්‍යයනය කිරීමේදී කිසිදු ආකෘතියකට, නියමයනට හෝ සීමාවකට ලක්නොවී නිදහස්ව ඉතිහාසගත සිදුවීම් නිර්මාණකරණයට යොදාගන්නා අයුරු දැකගත හැකිය. එහිදී සම්භාව්‍ය සාහිත්‍ය අධ්‍යයනයේදී හමුවන සිදුවීම්, චරිත, පුරාණෝක්ති හා ජනශ්‍රැති වැනි දෑ නව්‍ය දෘෂ්ටිකෝණයකින් කියවීමට නූතන සිංහල කවියා සමත් ව ඇති අයුරු මෙම පර්යේෂණයෙන් සනාථ විය. එකී නිර්මාණවල පවතින ස්වාධීනතාව, විවෘතතාව, සහනුකම්පනය, පරිකල්පනයේ විශිෂ්ටතා අනෙකුත් සම්භාව්‍ය සාහිත්‍ය නිර්මාණ, ජනශ්‍රැති, ඓතිහාසික ප්‍රවාද හා සංසන්දනාත්මක ව විමසීම මෙම පර්යේෂණයේ අරමුණ යි. නූතන සිංහල කවියා ඉතිහාසය ප්‍රතිනිර්මාණය කිරීමේ දී දැක්වූ ශක්‍යතාව කෙබඳු ද? යන්න සහ ඒ සඳහා බලපෑ හේතු සාධක මොනවා ද? යන්න මෙහි පර්යේෂණ ගැටලු ය. ඒ සඳහා නූතනයේ පළ වූ තෝරාගත් කාව්‍ය නිර්මාණ පමණක් ඇසුරු කිරීම මෙහි පර්යේෂණ සීමාව යි. මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණයක් වන අතර පුස්තකාලය හා අන්තර්ජාල මූලාශ්‍රයන් ඔස්සේ ඒ සඳහා කරුණු ගවේෂණය කර ඇත. තව ද මෙම පර්යේෂණයේ ප්‍රතිඵල වශයෙන් ඓතිහාසික මූලාශ්‍රය, සම්භාව්‍ය සාහිත්‍ය මූලාශ්‍රය හා නූතන සිංහල කාව්‍ය මූලාශ්‍රය යන කරුණු සංසන්දනාත්මක ව විමසීමේ දී නූතන සිංහල කවියේ විශේෂතා, විවිධතා, ස්වාධීනතා මෙන්ම නව්‍ය පරිකල්පන ලක්ෂණ හඳුනා ගැනීමට හැකි විය.



***ප්‍රමුඛ පදඃ*** *ඉතිහාසය, සාහිත්‍යය, කවිය, පරිකල්පනය, ප්‍රතිනිර්මාණය*

# ගිරා සන්දේශය තුළින් හෙළි වන කාන්තා වර්ණනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ජී. එච්. එම්. කේ. පී. ජී. සී. එස්. ගමකුමාර

සමාජ විද්‍යා හා මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*chanuherath110@gmail.com*

සාම්ප්‍රදායික කාව්‍ය රීති අනුගමනය කරමින් වර්ණනා චාතුර්යය මොනවට විහිදාලන ගිරා සන්දේශයේ දී කාන්තාව යනු සෞන්දර්යයයෙන් අනූන වස්තුවක් බව වර්ණනයට ලක් කරන අන්දම පිළිබඳ මෙහි දී විශේෂ අවධානයක් යොමු කරයි. කාන්තාව රූප ශෝභාවෙන් පරිපූර්ණ අයෙක් ලෙස මින් දක්වන්නේ කෙසේද යන්න පර්යේෂණ ගැටලුවයි. මෙහි විස්තර කිරීම් හමුවේ කාන්තාව යනු ඉතා ම සුන්දර වස්තුවක් බව හඳුනාගැනීම අරමුණ වේ. ලිඛිත මූලාශයන් හා ක්ෂේත්‍ර නො වන අධ්‍යයනයන් මෙහි දත්ත රැස් කිරිමේ ක්‍රමවේදය වේ. සන්දේශ සම්ප්‍රදායානුකූල ව දූත වර්ණනයෙන් අරඹන ගිරා සන්දේශයේ දී තෙදිනක් පුරා ගිරවාගේ ගමනාන්තය තුළ දී ඇසට අසුවන කාන්තාව යනු සුබ නිමිත්තක් මෙන් ම සෞන්දර්ත්වයෙන් ආඪ්‍යය වස්තුවක් බව දක්වයි. විවිධාකාර වූ වාග් චිත්‍රයන් මවමින් කාන්තාවගේ අසිරිය දක්වන අතර කාන්තාවගේ පයෝධරයන් දුටු රණහංසයින් පවා ලැජ්ජාවට පත් වී පලා යන ආකාරය "පියකරු තෙනෙන් පැරදි පිවිසි වන විල" යන්නෙන් දක්වයි. තවත් විටෙක දී ''කන කෙළවර වූ කියඹුවැල මුතුපට හා ගොතා බැඳ සිටින කාන්තාවන් දිව්‍යාංගනාවන්ට උපමා කරන අතර හිරුගේ රශ්මියට විකසිත වන පියුම් පවා කෝමළ වූ කාන්තාවගේ සඳක් බඳු මුහුණ නිසා මුකුලිත වෙන අන්දම "හැම සියපත් හැකිලෙන් සොබා තරිඳුට" ලෙසින් දක්වයි. ඇගේ දෙබැම කුඩා දේදුනු ද්විත්වයකට සමාන කරන අතර මුහුණ සොළොස්කලා පිරි පූර්ණ චන්ද්‍රයා මෙන් පිරිපුන් බව "කලා සපිරි සිසි වත මන කලාවන් - නිලා තිබෙන බැම ඉඳු දුනු පිලාවන්" යන්නෙන් අතිශයෝක්තියෙන් පෙන්වා දෙයි. තව ද කාන්තාවගේ දෙතොලේ රත්පැහැය රූ සපුව හා මනාව ගැළපෙන බව කතුවරයා පවසයි. නව්‍ය වූ භාෂා රීතියකට අනුව රචිත මෙම සන්දේශය අතීත ස්ත්‍රියගේ වත්කම වන රූපය පිළිබඳව අසන්නාට පවා තේරෙන සරල සුගම බසින් රචනා කර ඇත. අතරමගදි හමුවන කාන්තාවන් දියේ ගිලෙමින් ඉල්පෙමින් දිය කෙළියේ යෙදෙන විට ඔවුන්ගේ පතුල්වල ආලේප කරන ලද කුංකුමාලේපය ගංගාව පුරා විසිරී යන්නේ අපූර්ව සිත්තම් මවමින් බව "විසිරී ගිය ගඟ ලතු කොකුමඟරා" ලෙස දක්වයි. ඒවා ද කාන්තාව තරම් ම මනහර බවත් දිය කෙළියේ යෙදෙන ඇය අහසේ ලෙළ දෙන සුන්දර වූ රන් දද පෙළක් මෙන් බවත් "ලෙළෙනා නිලඹර රන් දද මෙන් සොඳ" වශයෙන් පවසයි. මෙම සන්දේශය තුළ දී කාන්තාවගේ වරලස සමන්තකූඨයෙන් ඇද හැලෙන සමන් මලින් යුතු ව පෙණපිඬු නංවමින් ගලන ජලය මෙන් බවත් අතිශයෝක්තියෙන් දක්වයි. එමෙන් ම කාන්තාව යනු නා ලොවින් සපැමිණි නාග කන්‍යාවන් මෙන් බව " සෙදනා ලොවිනා ළඳුනා ලෙසිනා" යන්නෙන් දක්වයි. ඒ අනුව ගිරා සන්දේශය තුළින් කාන්තාව යනු ඉතා සුන්දර වස්තුවක් බව ගම්‍යමාන කරන අතර වර්තමානයේ දී පවා අතීත සන්දේශයේ වර්ණනා චාතුර්යය පිළිබඳ සාකච්ඡාවට ලක් වෙන්නේ එහි පවතින අර්ථාන්විත බව නිසා ම බව දැක්විය හැකි ය.

***ප්‍රමුඛ පදඃ** කාන්තාව, අපූර්වත්වය, සන්දේශය, අතිශයෝක්තිය, සෞන්දර්යත්වය*

# සිංහල හා දෙමළ ජන සංස්කෘතිවල පවතින මුහුදු ජන කවියේ භාෂාත්මක සුවිශේෂතා

බී. ඩී. මාඹුලගේ

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*bhagyadilhani1@gmail.com*

ජන කවිය වූකලි සමාජ සාමූහික ක්‍රියාකාරිත්වයෙත්, රසඥතාවෙත් සුසංයෝගයයි. එය නිර්මාණය කරන ලද්දේ අසවල් පුද්ගලයා විසින් යැයි ඉඳුරා කීම උගහටය. කෙසේ නමුත් ජන කවිය කිසියම් රසඥතාවකින් හෙබි පුද්ගල කණ්ඩායමකට අයත් ලෙස නිගමනය කළ හැක්කේ ඇතැම් කවියක පවතින අවියත්, සරල බස මගින් ගැඹුරු ජීවිත විවරණයත්, පබැඳුමෙන් ගම්‍ය වන ශබ්ද රසයත් නිසාය. වෘත්තිය පදනම් කර ගත් ජන කවි ප්‍රභේද රාශියක් සිංහල හා දෙමළ ජන සංස්කෘතිවල දක්නට ලැබේ. එකී ජන සංස්කෘතිවලට අයත් මුහුදු ජන කවියෙහි පවතින භාෂාත්මක සුවිශේෂතා කවරේ ද? යන්න මෙහිදී ඇති වූ ගැටලුවකි. ඒ අනුව සංස්කෘති දෙකට අයත් මුහුදු ජන කවි අතර පවතින භාෂාත්මක සම-විෂමතා පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. මේ සඳහා ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ජන කවිය පිළිබඳ භාෂා ද්විත්වයෙන් ම ලියැවී ඇති ශාස්ත්‍රීය ලේඛන යොදා ගැනුණු අතර ද්විතීයික මූලාශ්‍රය ලෙස ඒ සම්බන්ධයෙන් පළවී ඇති පුවත්පත් වාර්තා හා අන්තර්ජාල සටහන් අධ්‍යයනය කරන ලදි. මුහුදු රැකියාවේ නිරතවූවෝ දින ගණන් තම හිතෛෂීන්ගෙන් වෙන් ව තෙරක් නොපෙනෙන කරදිය වළල්ලෙහි හුදෙකලා වන කල්හි දැනෙන කාන්සියත්, ජීවිත අවදානමත් මදකට හෝ යටපත් කර ගැනීමට කවි පබැඳුම් කළෝ ය. ජන සංස්කෘති ද්විත්වයේ ම පවතින එකී පබැඳුම් ඔවුන් විසින් ගායනා කරන ලද්දේ දෙවියන් උදෙසා වන කන්නලව්වක ස්වරූපයෙන් බව අධ්‍යයනයේ දී පැහැදිලි විය. භාෂා දෙකෙහි ම මුහුදු කවිවලින් පිහිට අයදින දෙවියන් අතර ස්කන්ධ කුමාර හෙවත් කතරගම දෙවියන් හට ප්‍රමුඛතාව හිමි ව ඇත. මුහුදු කවි අතර දැල් කවි ගායනය ද සුවිශේෂ වේ.  දියඹෙහි සිට මා දැල් ඇදීමේ දී ගායනා වන බොහෝ සිංහල මුහුදු කවිවල 'ඕඩි හෙලෙයි හෙලෙය්යා' යන පද පෙළ ඇතුළත් වේ. මේ හා සමාන වූ ශබ්ද රසයකින් යුත් පද කිහිපයක් 'ඕඩි ඒලේ ඒලෙක්කිලම් ඒලේ' යනුවෙන් දෙමළ මුහුදු ජන කවියේ ද භාවිත වේ. එපමණක් නො ව භාෂා දෙකෙහි ම ගායනයේ තාල රටාව බොහෝ සෙයින් සමාන ය. අලුයම් කාලයෙහි අහසෙහි දක්නට ලැබෙන උදා තරුවට අනුව මග සලකුණු කිරීම, වැස්ස වලාහක දෙවියන්ගෙන් පිහිට පැතීම හා මුහුද මව් සේ සලකා කටයුතු කිරීම යනාදිය භාෂා ද්විත්වයේ ම මුහුදු කවිවල දක්නට ලැබෙන ලක්ෂණ වේ. ඒ අනුව සිංහල හා දෙමළ මුහුදු ජන කවියේ භාෂාත්මක සමානතා රාශියකි. එසේම එකී භාෂාත්මක සමානතා ඇති වීමට භාෂා සංස්පර්ශය හේතුවන්නට ඇතැයි අවසාන වශයෙන් නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *ජන කවිය, ජන සංස්කෘතිය, භාෂා, මුහුදු කවි, ශබ්ද රසය*

# A Study on The Poems of *Vimalarathna Kumaragama* Based on Misery of Rural People

Ven. Indunilpura Indananda* and Ven. Nikagoda Nagitha

Department of Sinhala, University of Peradeniya

**indunilpura.indananda@arts.pdn.ac.lk*

A poet always tries to reform the society. He encounters subtleties and complexities of human lifestyles, different incidences, and other situations and by them perceives the life in new ways. Then, he turns them into his own experiences with the help of his cognitive and aesthetic skills. Therefore, the poet is a renderer of his innumerable thoughts of happiness and sadness to the connoisseur by the means of creative writing skills. It is known that Sinhala Poets also have illustrated the rural life of Sri Lankan people in a critical and analytical way. Poets who had critically observed the society composed their poems about those social scenarios. Some of those poems are reflections of the miserable side of the lives of the people in rural areas who experience immense sufferings, unfairness, and social stress. An in-depth and critical investigation into such scenarios is witnessed in *Vimalarathna Kumaragama's* poems as well such as in *'Ayyanayaka, Kalawanedi Asarana geheniya'.* He reveals many contemporary socio-political issues in those poems such as sexual exploitation of young women from lower-class by high-class and the injustice occurred to them. His empathetic view towards the rural people, who have been framed as lower cast and constantly abused by the hierarchy, and who are dogmatic, is evident in some of his works like *Herathhami* and *Ayiyanayaka*. Further, taking the relation between the human and the nature into his account kindly, the poet refers to how rural people work with the nature and species. With this bond, the poet builds up a discourse extracting some qualities even from animals' behavior. On the other hand, he illustrates how the human values are deteriorating because of the social gap between poor and well-to-do people, and the true nature of social, economic, and political aspects. His writings reveal the bitter truth of the society though they gently touch the contemporary socio-political problems, and his inspiration was the compassion towards the humanity. In conclusion, it is understood that *Vimalarathna Kumaragama's* compositions are poetic reconstructions of the despair and miseries of the rural people.

***Keywords:*** *Sinhala Poem, Rural life, Desperation, Social Reality*

# ජන කවියෙන් නිරූපිත මුල් බුදු සමයේ දාර්ශනික භාවිතයන් පිළිබඳ අධ්‍යයනයක්

මහකච්චකොඩියේ පඤ්ඤාසේකර හිමි* සහ පනාමුරේ චන්දිම හිමි

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය අනුරාධපුරය

*mpannasekara@yahoo.com

ජනශ්‍රැති යනු ප්‍රාථමික හෝ සංකීර්ණ බවට පත් නූතන ජනසමූහයක් අතර කාලයක් තිස්සේ මුඛ පරම්පරාගත සම්ප්‍රදායෙන් ව්‍යාප්ත වූ ඥාන සම්භාරය යි. එය ගද්‍යයෙන් හෝ පද්‍යයෙන් හෝ ඒ දෙකෙන්ම නිර්මාණය වී පරම්පරාවෙන් පරම්පරාවට පැවත යනු දැකිය හැකි ය. ඒ අතුරින් ජනකවිය ඉතා ජනප්‍රිය මෙන්ම සෞන්දර්යාත්මක ජනශ්‍රැති විශේෂයකි. ස්වභාවධර්මය හා බද්ධ වුණ ජීවන අරගලය තුළ ගොඩ නැගෙන කායික හා මානසික වේදනාවන් දුරු කරගැනීමට මෙන් ම මානසික තෘප්තිය ගොඩනගා ගැනීමට කවි ගායනවට ගැමියන් හුරු වී ඇත. එසේ ගොඩනැගෙන කවිය තුළ ඔවුන් විශ්වාස කරන ආගමික හරයන් ප්‍රමුඛ කරගෙන තිබීම සුවිශේෂී වේ. බෞද්ධ දර්ශනයෙන් හා බෞද්ධ සංස්කෘතියෙන් පෝෂණය වූ සිංහල ජන සමාජයේ ගැමියන් බුදුරජාණන් වහන්සේ හා බෞද්ධ දර්ශනයෙන් කියැවෙන දෙවි වරුන් තම කවි ගායනාවල වස්තු විෂය බවට පත් කරගෙන ඇත. එ පමණක් ද නොව තම ජීවන අරගලය හා සම්බන්ධ යම් යම් සංසිද්ධිවලට අනුරූපී වන මුල් බුදුසමයේ හරයන් ද වස්තු විෂය වී ඇත. ඒ අතුරින් ශ්‍රද්ධාව, අනිත්‍ය ධර්මතාව, කර්මය, පුනර්භවය, චතුරාර්ය සත්‍ය, හේතුඵල ධර්මය, සීලය, දානය මෙන්ම කරුණාව හා මෛත්‍රිය ද සුවිශේෂි වේ. තම ජීවිතය හා සම්බන්ධ සමීපතමයන්ගෙන් වෙන්වීම දරාගත නො හැකි තැන එය අනිත්‍ය ධර්මයෙන් දැක සිත පාලනය කරගත් ආකාරය කවිය තුළින් පෙන්වා දී ඇත. එමෙන් ම ලෙඩ දුක්, දුක් දොම්නස් උපන් කර්මයට අනුව සිදු වන්නක් ලෙසින් තමන් ඒ සියල්ලට මුහුණ දෙන ආකාරය කවි මගින් සමාජ ගත කර ඇත. එවැනි මනෝභාවයන් හා සැබැඳි ජන කවියෙන් නිරූපණය වන මුල් බුදු සමයේ භාවිතයන් මොනවා ද යන ගැටලුව මුල් කරගෙන මෙම පර්යේෂණය සිදු කරන ලදි. සාම්ප්‍රදායික ජන සමාජයේ ගැමියන්ගේ බෞද්ධ දාර්ශනික භාවිතාවන් ජන කවිය ඇසුරෙන් අධ්‍යයනය කිරීම ප්‍රධාන පරමාර්ථය වශයෙන් ගෙන ජන කවියෙන් ගොඩනැගුණ ආකල්ප සංවර්ධනය, නායකත්වය, නොපසුබට වීර්ය වැනි අවශේෂ අරමුණු මෙම පර්යේෂණයෙන් සාධනය කරගත්හ. නිදසුන් ලෙසින් කර්ම සංකල්පය විදහාපාන ජනකවියක් ලෙසින්'' තණ්ඩලේ දෙන්නා දෙපොළේ දක්කනවා..''යන කවියත් පුරුෂාර්ථ සාධනයේ දී ''කල්බලා නො වෙද ගොවිතැන් කරන්නේ'' යනාදි වශයෙන් පර්යේෂණයේ දී හඳුනාගෙන තිබේ. එම හඳුනාගැනීම්වලට අනුව, ගැමියන් ජීවන රටාව මුල්කරගෙන ඇතිවන කායික හා මානසික වේදනාවන් දුරු කරගැනීමට බෞද්ධ දාර්ශනික හරයන් ඉතා මැනවින් භාවිත කරමින් පැල්කවි, කරත්ත කවි, ගොයම් කවි, නෙළුම් කවි, පාරු කවි, ඒ ඒ අවස්තාවන්ට උචිත ආකාරයෙන් ගායනා කොට දුක් දොම්නස් තුලිත කොට කායික හා මානසික වෙහෙස සම්පර්ෂණය කරගැනීම මැනවින් සිදුකර ඇති බව මෙම පර්යේෂණයෙන් අනාවරණය විය.

***ප්‍රමුඛ පදඃ*** *ජනකවිය, බෞද්ධ දර්ශනය, ගැමිජීවිතය*

# බඹර කවියෙන් නිරූපණය වන සිංහල විවාහය සහ ඥාතීත්ව රටා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ඌව පළාතේ බඹර කවි ආශ්‍රයෙන්)

කේ. ඒ. සී. එස්. ආනන්ද,* එම්. ආර්. ගුණරත්න සහ එස්. සමරසේකර

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*chamathsame@gmail.com

සාම්ප්‍රදායික මානව ඥානය සංචිත ව පවත්නා වූ සුවිශේෂී ඥාන ප්‍රපංචයක් ලෙසින් 'ජනකවිය' හැඳින්විය හැකි ය. අතීතයේ සිට පාරම්පරික ව පැවත එන්නා වූ ජනකවිය හරහා ලාංකේය සංස්කෘතියට අනන්‍ය වූ විවාහය සහ ඥාතිත්ව රටා පිළිබඳ ව ඉතා වැදගත් තොරතුරු රැසක් හෙළි කරයි. ශ්‍රී ලාංකේය ගැමි ජන ජීවිතය තුළ පාරම්පරික ව උරුම වූ අතිශය අවදානම් සහගත ජීවන වෘත්තියක් ලෙස බඹර කැපීම හඳුනාගත හැකිය. සිය ජීවිකාව තුළ ඇති දුක, සතුට, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව ආදි ඔවුන් සතු වේදිතයන් සමුදාය නිර්ව්‍යාජ, සරල සහ ගීතවත් ස්වරයක් එක්වී 'බඹර කවි' ජනශ්‍රැතිය තුළ නිෂ්පත්තිය ලබා ඇත. අතීත සිංහල සමාජය තුළ වූ ආචාර ධර්ම පද්ධතිය මත ගොඩනැගුණු විවාහය සහ ඒ මත පදනම් වූ ඥාතීත්ව රටා බඹර කවි හරහා නිරූපණය වන්නේ කෙසේ ද යන්න මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව යි. ඒ අනුව සාම්ප්‍රදායික සිංහල විවාහය මත ගොඩනැගුණු ඥාතීත්ව රටා බඹර කවි තුළින් හඳුනාගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ යි. ඌව පළාතේ බඹර කවි විමර්ශනයට ලක් කරමින් පුස්තකාල පර්යේෂණයක් වශයෙන් සිදු කරන ලද මෙම පර්යේෂණය සඳහා දැනට ප්‍රකාශයට පත් ව ඇති බඹර කවි ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් යොදා ගන්නා ලදී. සාම්ප්‍රදායික සිංහල විවාහ ක්‍රමය තුළ ඒකභාර්යා විවාහය මෙන් ම බහුභාර්යා විවාහය ද හඳුනාගත හැකි වුවත් ඌවේ බඹර කවි හරහා මැනවින් නිරූපණය වන්නේ ඒක භාර්යා විවාහ ක්‍රමය යි. එය ගැමි ජීවිතය තුළ වන අපරිමිත ස්වාමී භාර්යා සෙනෙහස බඹර කවි තුළින් විද්‍යමාන වන්නේ 'රූබර මගේ හිමි ගියදැයි තව නැත්තේ - හිමි නැතිනම් මගෙ පණ දෙමි උන් මත්තේ' යනුවෙනි. සිංහල සමාජය තුළ මව් පාර්ශවීය මාමාවරුන්ට හිමිවන වගකීම් සහගත ප්‍රමුඛත්වය අනෙකුත් සියලු කටයුතුවල දී මෙන් ම බඹර කැපීමේ දී ද ලැබී ඇත. එමෙන් ම සිංහල ඥාති ක්‍රමය තුළ මුල්බැසගෙන පැවති කුසඹුරු ඒකාබද්ධතාව බඹර කවි තුළින් නිරූපණය වන්නේ 'කුසේ උපන් ලොකු අයියා කළ අයුතී - ගසේ ඉන්දදී හැරපට කපායතී' ආකාරයට ය. බඹර කපන්නට ගල්කුළු බඳෙහි පහතට බසින විට බඹර කපන්නා කඹය භාර කරනු ලබන්නේ තම බිරිඳගේ එක කුස උපන් සොහොයුරාට ය. එකී කරුණ අධ්‍යයනය හරහා ප්‍රත්‍යක්ෂ කොට ගත් හේතු සාධක ද්විත්වයක් වේ. එනම්, සිය නැගණිය අනාථ කිරීමට අකමැති මස්සිනා කඹය අත්නොහරින බවත්, ඔහුගේ වරදකින් හෝ අත්වැරදීමකින් බඹර කපන්නා මියගියහොත් තමන්ගේ බිරිඳ සහ දරුවන් රක්ෂා කිරීම මස්සිනා විසින් සිදු කරනු ඇතැ'යි යන බලාපොරොත්තුවෙනි. වර්තමානය වන විට බඹර කැපීම මෙන් ම එකී වෘත්තීන් සමඟ බද්ධ ව පැවති සිංහල ඥාති සබඳතාවලට ලැබී තිබූ වටිනාකම ද ක්‍රමයෙන් පරිහානියට පත් වෙමින් තිබේ. ඒ අනුව සාම්ප්‍රදායික සිංහල විවාහය සහ ඥාතීත්ව රටා මනාව පිළිබිඹු වූ කැඩපතක් ලෙස බඹර කවි පෙන්වා දිය හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *බඹර කවි, ජනශ්‍රැතිය. සිංහල විවාහ ක්‍රම, ඥාතීත්ව රටා*

# පතල් කවියෙහි භාරතීය අලංකාර භාවිතය පිළිබඳ අධ්‍යයනයක්

එස්. පී. ඩබ්ලිව්. රණවක

සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය

*sunimaliranawaka95@gmail.com*

හෙළ ජන ගී වර්ගීකරණයෙහි ගැමි ගී ගණයට අයත් මෙහෙ ගී විශේෂයක් වන පතල් කවි පතල් ආශ්‍රිත කර්මාන්තවල යෙදෙමින් ගායනා කරන සීපද විශේෂයකි. මහනුවර යුගයේ මුල් භාගයේ සිට කොළඹ යුගය වන තෙක් කාල පරිච්ඡේදයේදී නිර්මිත වූහයි සැලකෙන ගැමි ගී සිංහල ගැමි කාව්‍යයේ ලාක්ෂණික අංගවලින් පමණක් සමන්විත සරල කලා මාධ්‍යයකැයි සාමාන්‍යකෘත මතයක් පවතී. මෙම පර්යේෂණය සඳහා පාදක වූ ගැටලුව වන්නේ පතල් කව්වල භාරතීය අලංකාරවාදයන්හි ආභාසය පිළිබිඹු වන්නේ කවරාකාරයෙන්ද යන්නයි. එහිදී මූලික විචාර ප්‍රවේශය ලෙස අලංකාරවාදය භාවිත කළ අතර ගුණාත්මක ක්‍රමවේදය ඔස්සේ දත්ත විශ්ලේෂණය කරන ලදි. අලංකාරවාදය භාරතීය සම්භාව්‍ය කාව්‍ය විචාරවාද අතුරින් ප්‍රචලිතම විචාරවාදය ලෙස හැඳින්විය හැකි ය. 'කවියේ ආත්මය අලංකාරය' යන්න ආලංකාරිකයන්ගේ පොදු මතය වූ අතර ඒ අනුව උපමා රූපකාදී අර්ථාලංකාරත් යමක අනුප්‍රාසාදී ශබ්දාලංකාරත් කවියක වැදගත්ම අංග ලෙස සලකා තිබේ. 'සරල හා සුගම' ලෙස අතිසරල අර්ථකථනයනට බඳුන් වන ජන ගීවල අලංකාර භාවිතය පිළිබඳ ප්‍රාමාණික අවධානයක් යොමු කිරීමට හැකි වීම මෙම පර්යේෂණයට ශාස්ත්‍රීය වැදගත්කමක් ආරෝපණය කරන අතර ඒ ඔස්සේ සිංහල සේ ගීවල පමණක් නොව ගැමි ගීවලද භාරතීය ආභාසය ඇති බව සනාථ කිරීම මෙහි අරමුණයි. පතල් කව්වල පදමාලාවන්හි අන්තර්ගතය පරීක්ෂා කිරීමේදී ඒවා කෙරෙන් විවිධ ශබ්දාලංකාර සහ අර්ථාලංකාර හඳුනාගත හැකිය. මුල-අග එළිසම ගැලපීම ඇතුළු ශබ්ද, අක්ෂර, පද හා අර්ථ අනුප්‍රාස පතල් කවි බොහෝමයක අන්තර්ගත වන ශබ්දාලංකාර කිහිපයකි. සැම කවියකම එළිවැට අන්තර්ගත වන අතර බොහෝ කව්වල මුල් එළියද අන්තර්ගත වේ. නිදසුනක් ලෙස එක් පද්‍යයක 'දඩි බිඩි', 'රට වෙඩි', 'මඩ යට', 'උඩ වැඩ' ලෙස මුල් එළිය තබා 'වටියේ', 'කැටියේ', 'සැටියේ', 'පඩියේ' ලෙස එළිවැට බැඳ ඇත. උක්ත පද්‍යයෙහි පද සංඝටනාව වෙත විමසිලිමත් වීමේදී මුල-අග එළිසම ගැලපීම සේම ර, ට, ඩ යන කයෝර ශබ්ද එක ළඟ යෙදීමෙන් මතු කරන අනුප්‍රාස රසයද මතු වී පෙනේ. ගායනයේ දී මුල් පාදයේ අවසාන පද කිහිපයත් දෙවන පාදයේ මුල් පද කිහිපයත් එක් ව ගයන අතර එහි දී 'රට වටියේ' සහ 'රට වෙඩි දමා' යන පද යමකයක ස්වරූපයක් ද ප්‍රදර්ශනය කරයි. පතල් කව්වල අර්ථාලංකාර භාවිතය වෙත විමසිලිමත් වීමේදී කම්කරුවාගේ නිර්ව්‍යාජ අදහස් එළිගැන්වීමට ස්වභාවෝක්ති අලංකාරය යොදා ඇති ආකාරය ප්‍රකට වේ. 'ඩබර කරකවා අත් දෙක වෙව්ලනවා', 'ඉන්නේ දුම්බරයි මහ කලු ගලක් යට', 'දඩි බිඩි ගගා කරනා වැඩ රට වටියේ' වැනි පතල් කවි මීට නිදසුන්ය. තවද උචිත උපමා භාවිතය පතල් කව්වලින් හඳුනාගත හැකි ය. එක් පද්‍යයක මිනිරන් පතල ගෙදරටත් කෝකියා මැණියන්ටත් ලියන්නා ලොකු අප්පොටත් පරීක්ෂකවරුන් යමපල්ලන්ටත් උපමා කර තිබේ. ව්‍යංගයාර්ථවත් පද භාවිතය ද මෙම කවි කෙරෙන් හඳුනාගත හැකි වන අතර 'කළුවන් කළුරුවයි මංගෝ දිලිසෙනවා' පද්‍යය එවැන්නකි. මේ ආකාරයට පිරික්සා බැලීමේ දී දේශපාලන-සංස්කෘතික සාධක අනුසාරයෙන් සිංහල කාව්‍ය සම්ප්‍රදාය සඳහා බලපෑ භාරතීය අලංකාර ශාස්ත්‍රාභාසය සම්භාව්‍ය ඡේක පද්‍යයට සේම පොදු ගැමි ජන කලාවටද එක සේ සාධාරණ වෙතැයි කිව හැකිය. විශේෂත්වය වන්නේ සේ ගීයට සාපේක්ෂ ව ගැමි ගීයේ අලංකාර භාවිතය භාෂා, සංස්කෘතික අංශ ද්වයෙන් ම දේශීයකරණය වී තිබීම යි.

***ප්‍රමුඛ පද:*** *අර්ථාලංකාර, අලංකාරවාදය, පතල් කවි, ශබ්දාලංකාර*

# කුඩාමඩුවැල්ල දේවස්ථානයේ කන්තාරු ගායනා පිළිබඳ අධ්‍යයනයක්

ඊ. ඒ. එස්. මල්ෂාන්

සංගීත පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

*salankamalshan76@gmail.com*

කිතු දහම ලොවට දායාද වීමත් සමඟ ඒ හා සම්බන්ධ ගායන ප්‍රකාර කිහිපයක් බිහි විය. එම ගායන ප්‍රකාර අතුරින් කන්තාරු, පසම්, කැරොල් හා ළතෝනි යන ගායන ශෛලීන් ප්‍රචලිත විය. මෙම සෑම ගායන ශෛලියක් ම පොදුවේ " කිතු බැති ගී " ලෙස හඳුන්වන්නට පුළුවන. මෙම ගායන ප්‍රකාර ගායනා කරන කාල වකවානු, ගායන විලාසය, ශෛලීය යනාදියෙන් මෙම ගායන ප්‍රකාර එකිනෙකින් වෙනස් වෙයි. ලතින් භාෂාවේ 'canter' යන වචනයෙන් බිඳී ආ පදය හෙළ බසින් කන්තාරු නම් විය. බටහිර රටවල කන්තාරු යනුවෙන් හැඳින්වෙන්නේ කන්තාරු ගායනා කරන ගායක මඬුල්ල මෙහෙයවන තැනැත්තා ය. කන්තාරු ගායන ශෛලීය සඳහා ඉතාලියේ කැන්ටාටා ගායන ශෛලීයේ ආභාසයක් තිබෙන බවට බටහිර සංගීතඥයන් සඳහන් කරයි. කන්තාරු යනු පල්ලියේ දේව මෙහෙය පවත්වන අවස්ථාවේ දී ගයන ස්තෝත්‍ර ගායනාව යි. වර්තමානයේ මෙම ගායන ශෛලීය ගීතිකා ලෙස හැඳින්වෙයි. "ජාකෝමේ ගොන්සාල්වෙස් " පියතුමාට අනුව කන්තාරු යනු දෙවරක් යැදීම යන අරුත් ගැන්වේ. විවිධ වූ භාෂාවන්ගෙන් රචිත කන්තාරු යනු ශ්‍රී ලංකාවේ අනෙකුත් කතෝලික දේවස්ථානයන් හි දක්නට නොලැබෙන මුත් කුඩාමඩුවැල්ල දේවස්ථානයේ භාෂා කිහිපයකින් ම කන්තාරු ගායනා කරන්නේ කුමන හේතුවක් නිසා ද යන්න පර්යේෂණ ගැටලුව වේ. භාෂා කිහිපයකින් ම මෙම දේවස්ථානයේ කන්තාරු ගායනා කිරීමට හේතුව ලෙස අධ්‍යයනයට අනුව පෙනී ගියේ කුඩාමඩුවැල්ල ග්‍රාමය ජනවර්ග කිහිපයකින් ම සමන්විත සමාජයකින් යුක්ත වීමය. එබැවින් සිංහල, දෙමළ, ඉංග්‍රීසි, ලතින්, ඉතාලි හා ස්පාඤ්ඤ යන භාෂා කිහිපයකින්ම කන්තාරු නිර්මාණය කර තිබුණි. දේවස්ථානයේ කන්තාරු ගායනය සඳහා යොදා ගැනෙන සංගීත භාණ්ඩ හඳුනා ගැනීම, සමහර කන්තාරු වලට තනු නිර්මාණය කිරීමේ දී ආශ්‍රය කර ගත් අනෙකුත් ශෛලීන් හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණු වේ. එහිදි යොදා ගත් සංගීත භාන්ඩ වනුයේ චර්ච් ඕගනය, වයලීනය, බටනළාව, තබ්ලාව හා ගිටාරයයි. තනු නිර්මාණයේ දී ආශ්‍රය කරගත් අනෙකුත් ශෛලීන් ලෙස උත්තර භාරතීය ගායන ශෛලීය හා දේශීය ජන ගායනා ශෛලීන් යොදා ගෙන ඇති බව අධ්‍යයනයේ දී තහවුරු විය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ලිඛිත හා අලිඛිත මූලාශ්‍ර භාවිත කළ අතර ලිඛිත මූලාශ්‍ර යටතේ පොත්පත්, සඟරා, ලිපි ලේඛන පරිශීලනය කෙරිණි. ලිඛිත නොවන මූලාශ්‍රය යටතේ සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත එක් රැස් කෙරිණි. අනෙකුත් දේවස්ථාන හා සැසඳීමේ දී අද්‍යතනය වන විට කන්තාරුවල අතීත ස්වභාවය දක්නට නොලැබෙන නමුත් කුඩාමඩුවැල්ල දේවස්ථානයේ අදටත් පැරණි කන්තාරු ගායනා විලාසය දක්නට ලැබේ. සෑම දේවස්ථානයකට ම පාහේ ගයනු ලබන කන්තාරු ගායනා කිරීමට ඒ සඳහා අනුමැතිය ලැබිය යුතු මුත් මෙහි ගැයෙන කන්තාරු ඔවුන් විසින් ම නිර්මාණය කර දේව සභාවේ අනුමැතියකින් තොර ව ම ගායනා කරනු ලබයි.

***ප්‍රමුඛ පදඃ*** *කන්තාරු, කැරොල් හා ළතෝනි, කුඩාමඩුවැල්ල දේවස්ථානය, දේශීය ජන ගායනා ශෛලිය*

# කුල ස්තරායණය අන්තර් පුද්ගල සබඳතාවට බලපෑම් සිදු කිරීම ජන කවිය ආශ්‍රයෙන් විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩබ්ලිව්. අයි. ජේ. එම්. ආර්. එන්. කුමාරි* සහ එම්. ඒ. එන්. පී. මල්ලවආරච්චි

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*rasikanilmini94@gmail.com*

සමාජයේ අසමානතාව තීරණය කරන ප්‍රධාන සාධකයක් ලෙස කුල ස්තරායණය හැඳින්විය හැකි ය. භාරතීය සමාජයේ පැවති කුලභේදයේ ආභාසය ලාංකේය සමාජයේ කුලභේදය නිර්මාණය වීමට බලපෑම් කර ඇත. උප්පත්තියෙන් ම කුලය තීරණය වූ අතර සම කුලවලට අයත් පිරිස් ඥාතීන් ලෙස සබඳතා ගොඩනගා ගත්තේ ය. පැරණි ශ්‍රී ලාංකේය සමාජයේ පැවති කුලභේදය පිළිබඳ කරුණු රැසක් ජන කවිවලින් හෙළි වෙයි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ කුලභේදය අන්තර් පුද්ගල සබඳතාව කෙරෙහි බලපෑම් කරන ආකාරය ජන කවියෙන් නිරූපණය කර ඇත්දැයි විමර්ශනය කිරීම ය. මෙම පර්යේෂණයේ අධ්‍යයන ක්‍රමවේදය ලෙස පුස්තකාල පරිශීලනය සිදු කිරීම ප්‍රධාන වශයෙන් සිදු විය. විවාහය, සංස්කෘතිය හා වෘත්තීය ආශ්‍රිත ජන කවි වර්ග රාශියක් ඇසුරින් මෙම කුල භේදය නිරූපණය කර ඇත. ජීවිතයේ විශේෂ අවස්ථාවල දී කුල භේදය පුද්ගලයන්ට බලපෑම් කරන ලද සාධකයක් විය. එහිදී සම කුල විවාහය සමාජ සම්මතයක් විය. "සම කුලයෙන් ගරු බුහුමන් ලබා දෙන" කුලවත් පුරුෂයෙකු අඩු කුලයක ස්ත්‍රියක සමඟ ලිංගික සබඳතා සහ ඇසුර පවා කුලවත් සමාජය තුළ ප්‍රතික්ෂේප විය."සැඩොල් කුලයේ නීච අගනක් සාමිනී මම නීති" තව ද රැකියාව පදනම් කරගෙන කුල සාධකයට වටිනාකමක් හිමි වී තිබුණි. එමෙන් ම පැරණි සමාජය තුළ කුලහීනයන් හා කුලීනයන් තුළ විවිධ මත පැවති නිසා කුලහීනයන් සමඟ සම්බන්ධතා පැවැත්වීමට කුලවත්තු මැළි වූහ. ඒ නිසා කුලහීනයන් ස්නානය කරන දියෙහි පවා උසස් කුලවතුන් ස්නානය කිරීමට අකැමැති වූ අතර කුලවතුන් සමඟ කුලහීන පිරිස් ආහාර පාන ගැනීමෙන් වැළකී සිටියහ. "කොතලවල වතුර අඩු කුලට නොමදෙති" එකල සමාජයේ අන්තර් සම්බන්ධතා පැවැත්වීමේදී, කිසියම් නිවසකට යෑම සිදුවිය යුත්තේ අදාළ නිවැසියන්ගේ කුලවත්භාවය පිරික්සීමෙනි."තරාතිරම දැන අන් ගෙදර ගොඩවෙනු" ගැමි ජන සමාජවල ඉහළ තනතුරු, නම්බුනාම හිමි වූයේ කුල ධුරාවලියේ උසස් ම කුලය වූ ගොවිගම කුලයටයි. පැරණි සමාජය තුළ කුලය නොතකා කටයුතු කිරීම සමාජ අපවාදයට හේතුවක් වූ අතර එම නිසා තම කුලයේ ගෞරවය ආරක්ෂා කර ගැනීමට සියලු දෙනාම පෙළඹුණහ. "කුලේ නැසෙන වැඩකට ඉඩ තියනු එපා","පාලු කර ගනී ගොවි වංසෙත් එවර " පහත් කුලවල ඉපදීම නිසා දුකට පත් වූ ආකාරය ද ජන කවියෙන් විද්‍යමාන වේ. "අඩු කුලේ ඉපිද මොකවත් බැරිය බොලන්","රන්කරු ලියක් වූයේ පවකින්ද පෙර" එකල ගැමි සමාජයේ කුලීනයන් හා කුලහීනයන් අතර අන්තර් සම්බන්ධතාව බිඳ වැටීමට කුල භේදය ප්‍රබල බලපෑමක් කර ඇත. අතීත සමාජයේ අන්තර් පුද්ගල සබඳතාවට තර්ජනයක් වූ කුල භේදය ජනකවි පරිශීලනයෙන් අනාවරණය කර ගත හැකි වූ අතර වර්තමානයේ දී එය දුර්වල වී ඇති බව ද අවබෝධ කර ගත හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *ස්තරායණය, ධුරාවලිය, කුලීන, විමර්ශනාත්මක, ආභාසය*

# ජනකවියේ මාතර ප්‍රදේශයේ අනන්‍යතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එස්. කහඳගමගේ

සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

*spkahandagamage@gmail.com*

දකුණු පළාතේ ගාල්ල, මාතර, හම්බන්තොට යන දිස්ත්‍රික්ක ත්‍රිත්වය අතුරින් ස්වකීය ප්‍රදේශයේ අනන්‍යතාව සහ හැඩතල මතු කර දිනා ගැනීමට මාතර දිස්ත්‍රික්කය සමත් ව ඇත. අතීතයේ මහතොට නමින් හැඳින්වුණු මාතර නැගෙනහිරින් බටහිර ගිරුවාපත්තුව ද, බටහිරින් ගාලු දිස්ත්‍රික්කයද, උතුරෙන් සබරගමු දිස්ත්‍රික්කය ද, දකුණින් මහ මුහුද ද යන සීමාන්තරයෙහි පිහිටියේ ය. ලංකා සාහිත්‍යය ඉතිහාසයෙහි රජකු නොමැති ව වර්ධනය වූ ලිඛිත සාහිත්‍යය යුගයක අනන්‍යතාව, හිමිකාරිත්වය දරන මාතර, චූල සාහිත්‍යය තුළින් ද ස්වකීය අනන්‍යතාව තහවුරු කරයි. සීතාවකින් පිපිරී ගිය සාහිත්‍ය යුගය නැවත ප්‍රාණවත් ව ගොඩනැගෙනුයේ මාතර සාහිත්‍ය උන්නතියත් සමග ය. සාහිත්‍යයෙහි පැවති ගුණාත්මක ස්වරූපයෙහි යම් අඩුවක් ප්‍රකට වන මුත් සාහිත්‍ය ප්‍රබෝධයෙහි නව ප්‍රවේශ මාර්ග රැසක් මේ යුගයෙහි ගොඩනැගිණ. මාතර ලිඛිත සාහිත්‍ය සේ ම අලිඛිත සාහිත්‍යයක් ද පවතියි. මිනිසාගේ විවිධ වූ භාව ප්‍රකාශන නිසර්ගයෙන් ඉදිරිපත් වන ආකෘතියක් ඔස්සේ ජනකවිය, ජන සමාජයෙහි පාරම්පරික ව සම්ප්‍රේෂණය විය. ජනකවියේ ආරම්භය හඳුනාගැනීම අපහසු වුවත් ජනකවියෙන් මාතර දිස්ත්‍රික්කයේ අනන්‍යතාව ප්‍රකට වේ. ජනකවියේ වස්තු විෂය, ප්‍රදේශය, ග්‍රාම නාමය අනුව එකී අනන්‍යතාව හඳුනාගැනීම පහසුය. ජනකවි සාහිත්‍යය තුළ 'මාතර' දිස්ත්‍රික්කයේ අනන්‍යතාව ප්‍රකට වන ජනකවිවලින් හෙළිවන මාතර අනන්‍යතාවයේ ස්වභාවයේ කෙබඳු ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වන අතර එමගින් ජන සම්ප්‍රදායානුගත ව පැවති මාතර දිස්ත්‍රික්කයේ අනන්‍යතාව හඳුනාගැනීම අරමුණ යි. මෙම පර්යේෂණය මාතර දිස්ත්‍රික්කයේ කේන්ද්‍ර කරගත් ක්ෂේත්‍ර අධ්‍යයනයකට මෙන් ම ප්‍රශ්නාවලි භාවිතයට ද ප්‍රමුඛත්වය ලබා දෙයි. ඊට අමතර ව මාතර ප්‍රදේශය පිළිබඳ ව ලියැවී ඇති පොත්පත් ආශ්‍රිත පුස්තකාල අධ්‍යයනයක් ද යොදා ගනු ලැබිණ. ප්‍රවාදගත ග්‍රාම නාම සම්බන්ධ ජනකවි පාරම්පරික සම්ප්‍රේෂණයෙන් වර්තමාන ප්‍රජාව දක්වා ම පැතිර පවතියි. නිදසුනක් වශයෙන් පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මොරවක ග්‍රාමනාමය සම්භවය පිළිබඳ ව රචනා වී ඇති ''නම්බුව කවදත් පවතින සිරිතෙක ...'' යන ජනකවිය දැක්විය හැකි ය. ඊට අනුව මොරවක නම ගොඩනැගීමෙහි ලා හේතු වී ඇත්තේ මෙම ප්‍රදේශයෙන් ගලා බස්නා ගඟෙහි කොම්බුවක් තරමට ම වක්‍ර වී ඇති භූගෝලීය ස්වරූපයත් එකී ස්ථානයේ පැවති මොරගසත් ය. මේ අනුව මාතර ග්‍රාමනාම සම්භවය පිළිබඳ ව ජනකවි අධ්‍යයනයෙන් මාතර ප්‍රදේශයේ අනන්‍යතාවද ප්‍රකට වෙයි. එම ජනකවිවලින් මාතර පැවති වෘත්තිය ජන ජීවිතය, සමාජ ස්තරායනය පිළිබඳ ආකල්ප, මාතර ප්‍රදේශයේ සෞන්දර්යාත්මක ප්‍රබල හා ප්‍රකට ස්ථාන, ගමන් මාර්ග පිළිබඳව තොරතුරු වැනි වූ විවිධ අංශ හඳුනාගැනීමට හැකි වේ. හම්බන්තොට මෙන් ම මාතර ද පැඟිරි වගාව ප්‍රචලිත ව පැවතිණ. දිවියන්ගලවත්ත නම් වූ පැඟිරි හේනේ අස්වනු නෙළීමට අකුරුගොඩ, වරකාපිටිය, වැලිහිඳ, හලල්ල, කම්මල්ගොඩ, උඩුකාව, කොක්මාදූව, දෙණිපිටිය, ඌරුපිටිය යන අවට ගම්වාසී යුවතියෝ පැමිණියහ. තෙරිය තබා රතු කම්බා රෙදි හැඳ හිස ඔලියල් බැඳ දැකැති ගෙන අස්වනු නෙළන ළඳුන් කවියා දකින්නේ ''පැඟිරි කපන්නට පැඟිරි ළමාවරු දියන්ගල වත්තට එන්නේ..' වශයෙන් ජනකවි රිද්මයකින් සහ ශෘංගාරාත්මක රස ජනනය වන ඇමතුමකින් යුතුවය. මාතර ජනකවියේ අනන්‍යතාව මාතර ප්‍රදේශයේ ග්‍රාමනාම, පුරාවෘත්ත සම්බන්ධ ජනකවිවලින් අනාවරණය වන අතර ප්‍රදේශයේ ජන ජීවිතයේ පැවති ස්වභාවය ද පැහැදිලි ව හඳුනාගැනීමට අවස්ථාව ලැබේ.

***ප්‍රමුඛ පදඃ*** *අනන්‍යතාව, ග්‍රාමනාම, ජනකවිය, ජනප්‍රවාද, මාතර*

# ජන ගී නාද මාලා ආශ්‍රිත ව නිර්මාණය වූ සිංහල ගීතයන්හි ජන ගී ආභාසය ඉස්මතු කිරීමෙහි ලා ගී පද මාලාවේ භාවිතය

එච්. එස්. ආර්. ප්‍රනාන්දු

සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණවේද අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*Sankalani133@gmail.com*

සිංහල ගීතය පෝෂණය කළා වූ ජනශ්‍රැතියේ එක් අංගයක් වන ජන ගීයෙහි, නාද මාලාවන් ආශ්‍රයෙන් නිර්මාණය වූ සිංහල ගීත අධ්‍යයනයක් මෙම පර්යේෂණයෙන් සිදු කොට ඇත. ජන ගී ආශ්‍රයෙන් නිර්මාණය වූ සිංහල ගීත අධ්‍යයනය බොහෝ අවස්ථාවන්හි දි සාහිත්‍යමය පැතිකඩ ඔස්සේ විමර්ශනයට ලක් වුව ද එක් පර්යේෂණ කෘතියක ජන ගී නාද මාලා ආශ්‍රයෙන් පමණක් නිර්මාණය වූ සිංහල ගීත එකතුවක, නාද මාලාවේ සහ පද මාලාවේ භාවිතය පිළිබඳ සිදු කර ඇති පර්යේෂණයක් මෙතෙක් හමු නො වේ. ජන ගී නාද මාලා ආශ්‍රිත ව නිර්මාණය වූ සිංහල ගීතයන්හි ජන ගී ආභාසය ඉස්මතු කිරීමෙහි ලා පද මාලාවේ භාවිතය කෙසේ ද යන්න අධ්‍යයනය මෙම පර්යේෂණයේ ගැටලුව සහ ප්‍රධාන අරමුණ විය. එහි දී ජන ගී අධ්‍යයනය කරමින් සිංහල ගීතය පෝෂණය කළා වූත් කරන්නා වූත් සංගීතඥයන් හඳුනා ගැනීම, ඔවුන් විසින් ජන ගී නාද මාලා ආශ්‍රිත ව සිදු කරන ලද ගී නිර්මාණයන් ඒකරාශී කිරීම, එම නාද මාලාවන්ට අයත් ජන ගී සම්ප්‍රදායයන් හඳුනා ගැනීම සෙසු අරමුණු විය.පර්යේෂණ ක්‍රමවේදයේ දී පර්යේෂණ සීමාව වශයෙන් ජන ගී පර්යේෂණයෙහි ලා පුරෝගාමී වූ නිර්මාණකරුවන් අතරින් මුල් යුගයේ සිට නූතනය දක්වා ගී නිර්මාණකරුවන් හය දෙනෙකුගේ අහඹු ලෙස තෝරා ගන්නා ලද ගීත පහ බැගින් ගීත තිහක නියැදියක් යොදා ගනු ලැබීය. පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ ගීත නිර්මාණකරුවන්, ජන ගී ආචාර්යවරුන් සහ ජන ගී කණ්ඩායම්වල සාමාජිකයන් හා සම්මුඛ සාකච්ඡා පැවැත් වීම, පුස්තකාල ග්‍රන්ථ අධ්‍යයනය, ආයතනික මූලාශ්‍රය පරිශීලනයෙන් ගීත ශ්‍රවණය කිරීම සහ තොරතුරු රැස් කර ගැනීම සිදු කරන ලදී. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය යටතේ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන් ද ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් ද පුස්තකාලය, ප්‍රකාශිත පොත්පත්, සඟරා, අන්තර්ජාලය පරිශීලනයෙන් ද තොරතුරු රැස් කර ගන්නා ලදී. පර්යේෂණයේ සොයා ගැනීම් වශයෙන් ගී පද මාලා, ගීතයට භාවිත නාද මාලාවන්ට අයත් ජන ගී සම්ප්‍රදායට ම ගැළපෙන ලෙසත්, ඇතැම් අවස්ථාවල වෙනස් ම වූ සන්දර්භයකත් රචනා කොට ඇත. ජන ගී ආභාසය ඉස්මතු කිරිමෙහි ලා ගී පද මාලාවේ භාෂා භාවිතය (ගැමි/වියත් බස් වහර, ගීත සන්දර්භය, සංකල්ප රූප, අලංකාර පද, ව්‍යංගයාර්ථ, අනුප්‍රාසය, ධ්වනිතාර්ථ යෙදුම්) ප්‍රබල සාධකයකි. එය ජන ගී පර්යේෂණ කෘති බිහි වූ සි. ද. එස් කුලතිලකගේ යුගයේ පටන් නූතන යුගය දක්වා ගීත නිර්මාණය වූ කාල වකවානුව, නිර්මාණකරුවාගේ නිර්මාණාත්මක කුසලතාව, සමාජ මෙහෙවර සහ දැක්ම යන කරුණු මත පදනම් වේ. ජන ගී අභාසය ඉස්මතු කිරීමෙහි ලා ගී පද මාලාව සහ නාද මාලාව අන්‍යෝන්‍යව බැඳී පවතින බව ද හඳුනාගත හැකි විය.

***ප්‍රමුඛ පදඃ*** *ගීත සාහිත්‍යය, ගී නිර්මාණ, ගීත විචාර, ජන ගී*

# කෙත හා බැඳි ජනකවිවල අතීත හා වර්තමාන භාවිතය පිළිබඳ අධ්‍යයනයක් (කෑගල්ල දිස්ත්‍රික්කයේ මාළිගාතැන්න ග්‍රාමය ඇසුරෙනි)

කේ. ඩී. එම්. එල්. යූ. දහනායක* සහ කේ. එම්. එස්. සමරකෝන්

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*sureshasajeewani@gmail.com

දුරාතීතයේ සිට ම ශ්‍රී ලංකාව කෘෂි ආර්ථික රටාවකින් හෙබි රාජ්‍යයකි. අතීත රජ දවස සිට කෙත්වතු අස්වද්දා බත බුලතින් සාරවත් වූ පවුල් ඒකකයන්ගෙන් සමන්විත සශ්‍රීක දිවිපෙවතක් එකල ජනයා ගෙවූහ. වර්තමානයේ මෙන් දියුණු සන්නිවේදන ක්‍රම හෝ මානව සබඳතා, තාක්ෂණික මෙවලම් නො තිබුණු යුගයක ඔවුහු කය වෙහෙසා තම ශක්තියෙන් ශක්තිමත් මනසින් යුතු ව රාජකාරි කළහ. කෙසේ වෙතත් කාන්සිය වෙහෙස දුරුකර ගැනීමට ඔවුන් ගැයූ කවි අද ජනකවි බවට පත් වී ඇත. නෙළුම් කරන අවස්ථාවේ නෙළුම් කවි ද, කරල් කපන අවස්ථාවේ ගොයම් කවි ද, ගොයම් කපා පාගන අවස්ථාවේ කමත් කවි ද එසේ එලෙස ගායනා කළහ. වී ගොවිතැන හා සබැඳි කාරණා ඔවුන් ඉතා ගෞරවයෙන් භක්තියෙන් යුතු ව සිදු කළ අතර, එසේ හෙයින් කෙත හා ජනකවි අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවකි. නමුත් වර්තමානය වනවිට මෙරට කෘෂිකර්මාන්තය පැවතුණ ද, ජනකවිවල භාවිතය අතීතයේ මෙන් පවතී ද යන්න සැකයකි. එමනිසා කෙත හා බැඳි ජනකවිවල අතීත හා වර්තමාන භාවිතය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. මෙම අධ්‍යයනයේ දී අධ්‍යයන ප්‍රදේශය වශයෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තලේවෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මාළිගාතැන්න ග්‍රාමයේ වසර විස්සකට වඩා පදිංචි කුටුම්බ හතලිහක් අහඹු නියැදි ක්‍රමයට තෝරා ගන්නා ලදී. සම්මුඛ සාකච්ඡා උපලේඛනයක් භාවිතයෙන් ඔවුන්ගෙන් තොරතුරු සටහන් කර ගන්නා ලදි. ද්විතීයික මූලාශ්‍රය ලෙස ජනකවි පිළිබඳ ලියවී ඇති පොත්පත්, සඟරා ආදිය අධ්‍යයනය කරන ලදී. අතීතයේ මෙන් සාම්ප්‍රදායික ක්‍රම උපයෝගී කොටගෙන වී ගොවිතැන් සිදු කිරීම විරල සමාජයක කෙත හා බැඳි ජන ගී ක්‍රම ක්‍රමයෙන් අභාවයට යන අයුරු අපට මෙහි දී දැකගත හැකි විය. එහි දී අතීතයේ මෙන් ජනකවි ගායනා කරමින් කෙත වැපිරීම, අස්වනු නෙළීම ආදිය වෙනුවට යන්ත්‍රසූත්‍ර භාවිත කිරීම, අත්තමට වැඩ කිරීම ආදිය වෙනුවට ශ්‍රමය මිලට ගැනීම වැනි කරුණු නිසා අතීත ජනකවි සම්ප්‍රදාය එලෙස අභාවයට ගොස් ඇත. නූතන වාණිජකරණයට ලක් වූ සමාජය තුළ මිනිසා දැඩි ලෙස කාර්යබහුල වීම තුළ ජනකවි භාවිතය මෙලෙස වියැකී යාම නිසා අතීතයේ මෙන්ම වර්තමානයේ දී ද කෙත හා සම්බන්ධ කාරණාවල දී ජනකවි භාවිතය වැදගත් බව මෙම අධ්‍යයනය තුළින් වැටහුණි. මතු පරම්පරාවක් උදෙසා ජනකවි සංරක්ෂණය කොට තැබීමේ අවශ්‍යතාව මෙතුළින් පැහැදිලි වන අතර, මේ අධ්‍යයනය මෙරට වියැකී යන කලාවක් නැවත ජනගත කිරීම අරමුණු කොටගෙන සිදු කරන ලදි.

***ප්‍රමුඛ පදඃ*** *ජනකවි, සාම්ප්‍රදායිකත්වය, සංස්කෘතිය, සමාජය, වාණිජකරණය*

# සීගිරි කුරුටු ගීයෙන් අනාවරණය වන බෞද්ධාගමික සංකල්ප පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

යූ. ඩී .එස් මධුෂාන්* සහ කේ. එස්. තුෂීර

මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*shehanthushira@gmail.com

ශ්‍රී ලංකාවේ අභිලේඛන මූලාශ්‍රය අතර ක්‍රි.ව. 5 වන සියවසයේ දී රචිත සීගිරි කුරුටු ගීත ප්‍රධාන වේ. සීගිරි කුරුටු ගී රචකයින් කව්රුන් ද යන්න නිශ්චිත ව ම කිව නො හැකි වුව ද සීගිරිය නැරඹීමට පැමිණි පිරිස විසින් රචනා කරන්නට ඇතැයි යන්න පිළිගත් මතය යි. සීගිරි කුරුටු ගීයෙන් වඩාත් තීව්‍ර වන්නේ ලෞකිකත්වය වූව ද ඒ තුළ ගැඹුරු ආගමික සංකල්පයන් ගැබ්වී ඇති අතර ඒ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් මෙහි දී සිදු කෙරේ. සීගිරි කුරුටු ගීත තුළින් සමාජයට දායාද කළ ආගමික සංකල්පයන් මොනවා ද යන්න පර්යේෂණ ගැටලුව බවට පත් කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කොට ඇත. සාහිත්‍යමය මූලාශ්‍රය අධ්‍යයනය කිරීම උක්ත පර්යේෂණය සඳහා තොරතුරු අනාවරණය කර ගනු ලැබූ ප්‍රධාන ම ක්‍රමවේදය යි. පූර්ව ආත්මයේ කළ කර්ම පසු කලෙක කුමන අවස්ථාවක දී  හෝ විපාක ගෙන දෙන බව අතීත මිනිසුන් දැන සිට ඇත. අංක 385 දරන කුරුටු ගීයෙහි දක්වා ඇත්තේ "පෙර ජාතියක කළ පින්වල පලය විඳීමේ කාලය තොපා හට එළඹියේ ය" යනුවෙනි. මෙහි බෞද්ධාගමික ප්‍රබල මූලධර්මයන් අන්තර්ගත වී ඇත. ලොව පවත්නා සියලු භෞතික වස්තූන්හි අනිත්‍යතාව සමකාලීන කුරුටු ගී රචකයින් දැන සිට ඇත. 'ඇයගේ අවයව පිරිහුණු නමුත් ඇය කෙරෙහි දැකුමකුදු ඇත්තේ ය. යහලුව ඉවත දැමූ කුණු කන්දක් බඳු මහනෙල් වන් තැනැත්තිය' යනුවෙන් දක්වා ඇත. බෞද්ධාගමික දර්ශනයට අනුව මිනිසුන් අත්හළ යුතු අන්ත දෙකකි. කාමසුඛල්ලිකාව හා අත්ථකිලමතාව වශයෙනි. ලෞකික හා ලෝකෝත්තර ජීවිතයන් හී පැවැත්ම තීරණය වන්නේ මෙම සාධකයන් මත ය. සීගිරි කවියා ඒ බව දකින්නේ "තමා යෙදෙන රති ක්‍රීඩාදියෙහි අධික ලෙස ඇලීම දුකට මාවත ය. දුක නම් සුව විඳීම බඳු ය" යනුවෙනි. ඉවසීම උතුම් මානව ගුණාංගයකි. ඉවසීමේ ගුණය තුළ ඇති බෞද්ධාගමික සංකල්පය ඉස්මතු කොට ඇත්තේ මෙපරිද්දෙනි. "ජනයා ලියූ තාක් දෙය ඇස් හමුවෙහි බලා සිටිමින් මියුලැසියෝ ඉවසා සිටිති. එසේ ඉවසන ඔවුහු බැනවුව ද නොබිනුහ" යනා දී ලෙසිනි. මිනිසාට ළඟා කර ගත හැකි හා ළඟා කර ගත නොහැකි දේ බොහෝ ය. ළඟා කර ගත නොහැකි දේ පිළිබඳ ව උපේක්ෂාසහගත ලෙස බැලීමට මිනිසා පෙළඹිය යුත්තේ ය. ඒ බව සීගිරි කවියා දකින්නේ මෙසේ ය." පුෂ්පය කෙරෙහි නොමඳව ලෝභී වී උගුලක අසු වූ මත් බමරා පුෂ්ප කේශරයන් නිසා තමා උගුලක හසු වී යැයි ගුමු නද දෙමින් එය සපා කෑවේ ය... ඇය කෙරෙහි අනුකූලතාව නැත්තේ ය. එසේ නොවී අපි යමු" සීගිරි කුරුටු ගීත ලෞකික උපදේශයන්ට නැඹුරුව නිර්වචනය කිරීමට විද්වතුන් උත්සාහ කළ ද ගැඹුරු ලෝකෝත්තර යථාර්ථයක් අන්තර්ගත වී ඇති බව මෙමගින් නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *පූර්ව ආත්මය, ලෝකෝත්තර, අත්ථකිලමතාව, කාමසුඛල්ලිකාව, රති ක්‍රීඩා*

# ජනකතා හා ජාතක කථා අතර ඇති සම්බන්ධය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක් (පන්සිය පනස් ජාතක කථා පොතෙන් තෝරාගත් කතා දහයක් ඇසුරෙන්)

එස්. යූ. ජයමාලි, ඩී. එම්. එම්. එච්. දසනායක* සහ පී. එච්. තරංගනී

සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

*malishaharuhuna@gmail.com

පාලි ජාතකට්ඨ කථාව ඇසුරින් රචිත පන්සිය පනස් ජාතක කථා පොතෙහි අන්තර්ගත කතා, පොදු ජනයා අතර නිතර ගැවසෙන කතාවලින් පරිපූර්ණ ය. වෙනත් ලෙසකින් පවසන්නේ නම් ජනකතා සහ ජාතක කථා අතර සාම්‍යත්වයක් දැකිය හැකි ය. ජනකතා යනු ජනශ්‍රැතියේ අංශුමාත්‍රයකි. පළමුවෙන් බිහි වූ ජන කතා, ජාතක කතාවලට මූල බීජයක් වූ නමුදු ජාතක කථා රචනා වීමෙන් පසු ව නැවත ඒවා වෙනස් ස්වරූපවලින් ජනකතා ලෙස සමාජගත වන්නට විය. මේ දෙයාකාරයෙන් ම සිදු වූයේ ජන කතා සහ ජාතක කථා අතර සම්බන්ධයක් ගොඩනැගීම යි. මෙකී සම්බන්ධය පිළිබඳ සංසන්දනාත්මක ව අධ්‍යයනය කරමින් ජනකතා සහ ජාතක කථා අතර පවතින සාම්‍යයත්වය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම මෙම පර්යේෂණයේ අරමුණ යි. එහි දී මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වන්නේ ජනකතා සහ ජාතක කථා අතර ඇති සම්බන්ධය කෙබඳු ද? යන්න යි. මෙකී සම්බන්ධය පිළිබඳ විමර්ශනයේ දී ජාතක කථා අතුරෙන් දහයක් පිළිබඳ පමණක් දැනට අවධානය යොමු කරමින් අධ්‍යයන සීමාව ගොඩනගා ඇත. මෙම අධ්‍යයනයේ දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගෙන ඇති අතර පුස්තකාල අධ්‍යයනයෙන් හා අන්තර්ජාල පරිහරණයෙන් අවශ්‍ය දත්ත සම්පාදනය කරගන්නා ලදි. 'ඉබ්බා සහ මිනිසා' නම් ජන කතාව ඉන්දියාවේ පවතින රතු ඉන්දියානු ගෝත්‍ර අතර දැකිය හැකි ප්‍රකට ජනකතාවකි. මෙම ජන කතාව ජාතක කතා අතර ඇති 'වානරින්ද' ජාතකයට යම් සාම්‍යතාවක් දක්වයි. ලක්දිව පවතින 'ඉබ්බා දියේ දැමීම' නම් ජනකතාව ද මීට සමාන වූවකි. ඉතාලියේ නිර්මාණය වී ඇති රසවත් ජනකතාවක් වන 'ගෙඹි කුමාරයාගේ කතාව' ද ජාතක කතා අතර ඇති 'කුස ජාතකයට' සමාන වේ. ග්‍රීකයේ ප්‍රකට ජනකතා ග්‍රන්ථයක් වන ඊසොප්ගේ උපමා කතා ග්‍රන්ථයෙහි ඇතුළත් 'උපායෙන් අපායට' යන ජනකතාව හා 'සීහචම්ම ජාතකය' අතර ද යම් සාම්‍යතාවක් පවතින බව දැකිය හැකි ය. ජාතක පොතෙහි එන 'සත්ථිකුම්භ ජාතකය' ද ඊසොප්ගේ උපමා කතා අතර එන 'ඇතිදැඩි කිරීමෙන් ඇති වන වෙනස' යන ජනකතාවට සම්‍යතාවක් දක්වයි. ග්‍රීකයේ තවත් ප්‍රකට ජනකතාවක් වන 'කපුටා සහ නරියාගේ කතාව' ද ජාතක පොතෙහි ඇතුළත් 'ජම්බුඛාද ජාතකයට' සාම්‍ය වන බව දැකිය හැකි ය. මේ අනුව මෙම සංසන්දනාත්මක අධ්‍යයනයෙන් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ මෙන්ම වෙනත් රටවල ද ව්‍යාප්ත වූ ජනකතා සහ ජාතක කතා අතර තේමාවෙහි වෙනස්කම් පැවතිය ද අරමුණු හා වස්තු විෂය එක හා සමාන බව යි. මෙකී සාම්‍යත්වය ජනකතාවලට මෙන්ම ජාතක කතාවලට ද පොදු ජන අවධානය යොමු වීමට හේතු වී ඇත.

***ප්‍රමුඛ පද:*** *ජාතක කථා, ජන කතා, පන්සිය පනස් ජාතකය, ලංකාවේ ජනකතා*

# පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මගින් හෙළිවන පුරාතන ලංකාවේ සංගීත භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

යූ. ඩී .එස් මධුෂාන්* සහ කේ. එස්. තුෂීර

මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*udsmadushan@gmail.com

පුරාතන යුගයේ මිනිසා තම ජීවිතයේ දී සෞන්දර්යාත්මක අංශයට ද ප්‍රමුඛස්ථානයක් ලබා දී ඇත. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මගින් හෙළිවන පුරාතන ලංකාවේ සංගීත භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් මෙහි දී සිදු කෙරේ. පුරාතන ලංකාවේ සංගීත භාවිතය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මගින් ලැබෙන මූලාශ්‍රමය දායකත්වය කෙබඳු ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. අභිලේඛන පිළිබඳව රචනා වූ සාහිත්‍යමය මූලාශ්‍රත් මිහින්තලා පරිශ්‍රය තුළ සිදු කරනු ලැබූ ක්ෂේත්‍ර ගවේෂණයත් මෙහි අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් යොදාගනු ලැබී ය. කොරවක්ගල ලිපිය, සැස්සේරුව ලිපිය, දූවේගල ලිපිය යනාදී ලිපිවල 'භරත' යන්න වචනයකි. ඉන්දියානු සමාජ පසුබිම තුළ භරත ගෝත්‍රිකයන් යනු වෘත්තීය සංගීතඥයින් ය. 'භරත' යන්නෙහි තේරුම භාවය, රාගය හා තාලය යන්න යි. රාගය හා තාලය සංගීතයේ ප්‍රධාන අවස්ථාවන් ය. උක්ත අභිලේඛනයන්හි 'භරත' යනුවෙන් දක්වන්නට ඇත්තේ සංගීතඥයින් වන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. මිහින්තලා පුවරු ලිපියේ 'මගුල්ජෙට' නමින් තනතුරකි. එහි අර්ථය 'උත්සව සංවිධානය කරන්නා' යන්න යි. උත්සව සංවිධානය සඳහා වෙන ම නිලධාරියෙකු සිටීම තුළ පුරාතන යුගයේ සංගීත භාවිතය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගත හැකි ය. මිහින්තලා කණ්ඨක චෛත්‍ය වාහල්කඩෙහි සංගීත භාණ්ඩ වාදනය කරන කණ්ඩායමක් දක්වා ඇත. එහි වස්දඬු වයන පුද්ගලයා තාත්විකව දක්වා ඇත. රුවන්වැලිසෑය, ලෝවාමහාපාය වැනි ගල් කුලුණුවල වාමන රූප කොටා ඇත. එහි බෙර වයන්නන්, හක් පිඹින්නන්, වීණා වයන්නන්, උඩැක්කිකරුවන්, පෙරහැර කරුවන් දක්වා ඇත. රජගලින් හමු වූ ශිලා ලේඛනයකට අනුව විධිමත් ව පවත්වාගෙන ගිය නාට්‍යශාලාවක් පිළිබඳ තොරතුරු හෙළිදරව් වේ. ප්‍රවේශපත් පවා ලබා ගනිමින් නාට්‍ය සංදර්ශන නැරඹීමට තරම් එකල දියුණු කලාත්මක අංගයන් පවතින්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. පොලොන්නරු යුගයේ කලාංගයන්ට අයත් වන නටරාජා මූර්තිය ශිවගේ භරත සාම්ප්‍රදායික නර්තන ඉරියව්වක් අනාවරණය කරයි. නර්තනයෙහි පැවැත්මට සංගීතය අනිවාර්ය සාධකයකි. මෙසමයෙහි විධිමත් සංගීතයක් පවතින්නට ඇති බව මෙමගින් ද අනාවරණය වේ. ඇම්බැක්කේ දේවාලයෙහි 'දිග්ගෙය' නමින් හඳුන්වනු ලබන ශාලාවෙහි නර්තන විලාසයන් මූර්තිමත් කරන ලද සියුම් කැටයම් දක්නට ලැබේ එහි රබන් වයන්නන් මෙන් ම ලී කෙළි කණ්ඩායම් ද නිරූපිත ය. පොලොන්නරු යුගයේ සිතුවම් අතර වෙස්සන්තර ජාතකය නිරූපණය කරනු ලබන සිතුවම්වල සංගීත කණ්ඩායම් නිරූපණය කොට ඇත. නිශ්ශංකමල්ල රාජ්‍ය සමයට අයත් ලතා මණ්ඩපය නර්තනය පමණක් නොව සංගීතය ද රස විඳීම සඳහා භාවිත කරන්නට ඇත. අතීත මානවයා තම සෞන්දර්යාත්මක ජීවිතය තුළ සංගීතය කලාත්මත අංගයක් වශයෙන් තම ජීවිතයට සුසංයෝග කර ගන්නට ඇතැයි මෙමගින් නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *භරත, වාමන රූප, සංගීතඥයින්, දිග්ගෙය, මගුල්ජෙට*

# වහකෝට්ටේ ප්‍රදේශයේ ප්‍රචලිත ක්‍රිස්තියානි පසන් ආගමික ගායනාවල විද්‍යමාන දේශීය ජනනාද රටා හා එම ප්‍රදේශය හා බැඳි ජනශ්‍රැතිය පිළිබඳ අධ්‍යයනයක්

එච්. එම්. එම්. එල්. නිශාද්

මානවවංශ සංගීත විද්‍යා අධ්‍යයනාංශය, සංගීත පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

*malshanlahiru22@gmail.com*

ජනශ්‍රැතිය යනු ප්‍රාථමික හෝ සංකීර්ණ බවට පත් ජනසමූහයක් අතර කාලයක් තිස්සේ මුඛපරම්පරාගත ව සම්ප්‍රදායෙන් ව්‍යාප්ත වූ ඥාන සම්භාරය යි. අතීතයේ සිට ම ඉතා ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියනු ලැබූ ශ්‍රී ලංකාව නොයෙකුත් කාලවකවානුවල දි විවිධ ජාතීන්ගේ ආක්‍රමණවලට ලක් වූ දේශයකි. පෘතුගීසින්ගේ පැමිණීම නිසා ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතියට නොයෙකුත් දායාදයන් එක් විය. එහි දී ඔවුන්ට ආවේණික බටහිර නාද රටා රැගත් ගී වර්ග දෙකක් ලාංකේය සමාජයට දායාද විය. වහකෝට්ටේ ශුද්ධ වූ අන්තෝනි මුනිඳුන්ගේ දේවස්ථානයේ සිදු වන ක්‍රියාකරකම් හා එහි වෙසෙන ජනතාවගේ සමාජ සංස්කෘතිය ශ්‍රී ලංකාවේ අනෙකුත් දේවස්ථාන හා සංසන්දනාත්මක ව බැලීමේ දි බොහෝ දුරට වෙනස් වේ. පසම් ගායනයන්හි අඩංගු වන්නේ අපගේ දේව ගැලවුම්කාරයා වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අප ප්‍රාණ ගැලවීම උදෙසා වින්ද වේදනා හා දේව මෑණියන්ගේ ශෝක විලාප දුක් ගායනාවල් ය. වහකෝට්ටේ දේවස්ථානයේ පසන් ගායනාවල ඇතුළත් දේශීය ජන නාද මාලාවන් හා ඔවුන්ගේ සමාජ සංස්කෘතික හර පද්ධතින් හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණයි. ශ්‍රී ලංකාවේ අනෙකුත් දේවස්ථානයන් හැරුණු කල වහකෝට්ටේ දේවස්ථානයේ පමණක් පසන් ගායනය සඳහා දේශීය නාද මාලා එක් වී තිබීම මෙම පර්යේෂණයේ ගැටලුව යි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ලිඛිත හා අලිඛිත මූලාශ්‍ර භාවිත කළ අතර ලිඛිත මූලාශ්‍ර යටතේ පොත්පත්, සඟරා, ලිපිලේඛන පරිශීලනය කෙරිණි. ලිඛිත නො වන මූලාශ්‍රය යටතේ සම්මුඛ සාකච්ඡා මගින් දත්ත එක් රැස් කෙරිණි. වෙරළබඩ ප්‍රදේශයේ එනම් මීගමුව, දූව, පිටිපන ආදී ප්‍රදේශවල පමණක් නො ව රට අභ්‍යන්තරයේ වන මාතලේ දිස්ත්‍රික්කයේ වාසලකෝට්ටේ හෙවත් වත්මනෙහි වහකෝට්ටේ ජනතාව ද ඈත අතීතයේ සිට ම දේශනා නවයෙන් යුත් පසන් පොත ගායනා කරති. නමුත් මෙහි ඇති සුවිශේෂත්වය වනුයේ මීගමුව, දූව, පිටිපන ආදී ප්‍රදේශ හා ගත් කල වහකෝට්ටේ ප්‍රදේශයේ ගයනු ලබන පසන්වල නෙළුම් කවි, පිරිත් ඕස හා පැල් කවි නාද රටා විද්‍යමාන වීම යි. සිංහල බෞද්ධ ජනයාගෙන් වට වූ ප්‍රදේශයක් හා කෘෂිකර්මය ජීවනෝපාය කරගත් ඔවුන්ගේ ආගමික පුද සිරිත් තුළ සිංහල බෞද්ධ හා දේශීය සංස්කෘතික ලක්ෂණ ප්‍රබල ලෙස ම ගැබ් ව ඇත. ශ්‍රී ලංකාවේ අනෙකුත් දේවස්ථානවල බටහිර ශෛලියට දේව ගායනයන් සිදු කළ ද වහකෝට්ටේ දේවස්ථානයේ ගයනාවන්වල දේශීය නාදරටා ගැබ් ව ඇත්තේ අතීතයේ පටන් කෘෂිකාර්මික දිවි පෙවෙතක් ගත කල ඔවුන් තම රැකියාවේ නිරත වන විට ගායනා කරන ලද ගායනයන්හි නාද මාලා දේවස්ථානයේ ගායනයන්වලට ද එක්කර තිබීම නිසාවෙනි.

***ප්‍රමුඛ පද:*** *පසන්, සංස්කෘතිය, පාස්කුව, ජනනාද, ජනශ්‍රැතිය*

# Elephants and Tuskers: Sri Lankan Folk Poem Based Study

P. I. Umayangani, W. D. Navodha* and P. A. N. T. Palamure

Department of Pali and Buddhist Studies, University of Sri Jayewardenepura

*dilkinavodha789@gmail.com

Elephants and Tuskers have a special place the animals used in Sri Lankan tradition and religion. The Sanskrit Name "Gaja" is used to refer to the elephant in Hindu, Buddhist, and Jain texts. Elephants were used by ancient Sinhala Kings as a part of their fourfold army, and sometimes exchanged for diplomatic exchanges and friendship. Getting their services done by taming elephants took place in the distant past and the social division to which the duty was assigned belonged to the "Dura" caste. Human and elephants have had an inseparable relationship since ancient times. Elephants can be identified as a respectable animal in Sinhala society. But in agriculture, elephants are a troublesome animal. Therefore, the mantras that chase away or the mantras that tame the elephants have been practiced by the Sinhalese villagers for a long time. In folk poems Elephants are described as a part of the animal kingdom and as group of animals that has close relationship with the people. Accordingly, the research question of this research was whether the elephants are described in Sinhala folk poetry. This research was based on qualitative research methodology and was based on both primary and secondary sources. The Sinhala community was nurtured by Buddhism. It is also evident in Sinhala folk poetry. "*Uthum ape pera Bsath pera kale, Ipida sitiya sadhasaki saddantha wile, Dala deka kappa dandee weddakuta Bole, Budu bawa patha pathuwai saddantha kule*". The Buddha sometimes even used elephants as examples in his sermons. Because of this, elephants are considered as a troublesome animal but are still revered under the influence of Buddhism. Thus, it is clear that elephants and tuskers have a special place among the Sinhalese people due to the fact that the culture of this country is feeding by Buddhism.

***Keywords:*** *Elephants, Tuskers, Folklore, Folk Poems*

# FOLK RELIGION

# භූත විද්‍යාව මඟින් මිනිස් මනස හා ව්‍යාධීන් සුවපත් කරගැනීමේ දී බුදු දහමේ උපයෝගීතාව කෙබඳු ද යන්න පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩී. ඩී. ඉන්ද්‍රචාපා,[1*] පූජ්‍ය කෝන්කොටන්මුල්ලේ සංකිච්ච හිමි[2] සහ එච්. ඒ. එන්. මධුවන්ති[3]

[1,2]පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, [3]පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*dilhaniindrachapa@gmail.com

ඈත අතීතයේ ඇතැම් ගුරුන්නාන්සේලා විසින් ගුප්ත විද්‍යාව භාවිත කොට මිනිසුන් බරපතල ලෙස රෝගී කර හෝ මරා දැමීම හෝ සිදු කර ඇත. මිනිසාගේ ලෙඩ රෝග හා ග්‍රහ අපල නිවාරණය කර ගැනීම සඳහා ගුප්ත විද්‍යාව භාවිත කිරීමට පෙළඹී ඇත. බටහිර සමාජය තුළ ද යම් තරමක් දුරට මෙම තත්ත්වය ප්‍රචලිත වී ඇත. අන්තර්ජාලය තුළ ඇති ජනප්‍රිය චිත්‍රපටවලිනුත්, එනම් ඇමරිකාවේ රූගත කළ" ඉන්ඩියස්", "එක්සොසිස්ට්" වැනි චිත්‍රපට රූප රාමු තුළින් ද ගුප්ත විද්‍යාවේ උපයෝගීතාව සමාජගත කිරීම සඳහා යම් උත්සාහයක් දරා ඇති බව පෙනේ. වර්තමානය වන විට හින්දු, මුස්ලිම්, බෞද්ධ හා ක්‍රිස්තියානි යන සෑම ආගමකම මේවා සාධාරණීකරණය කිරීමට යන්ත්‍ර-මන්ත්‍ර, ගුරුකම් යොදා ගෙන ශාන්තිකර්මයෝ කරනු ලැබෙති. බුදුසමයට අනුව මනස දියුණු කරගැනීම සඳහා භාවනාව උපයෝගීකර ගත්ත ද ගුප්ත විද්‍යාව නො සලකා හරී. එහෙත් හින්දු ආගමේ ආභාසයත් සමඟ බෞද්ධයෝ අන් සැමට ම වඩා යන්ත්‍ර-මන්ත්‍ර හදි හූනියම් ආදිය කෙරෙහි අනුකූලත්වයක් දක්වති. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ගුප්ත විද්‍යාව කෙරෙහි බුදුදහමේ බලපෑම කෙබදු ද යන්න පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීමයි. පර්යේෂණ ගැටලුව වන්නේ යන්ත්‍ර-මන්ත්‍ර, ගුරුකම් තුළින් ලෙඩ රෝග සුවකර ගත හැකි ද යන්න සහ බුදු දහමෙන් ඊට ලැබෙන පිටිවහල කෙබඳු ද? යන්න ය. එක් කලක ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරුන් නීච කුල බන්ධනයකට හසු ව තිබූ අතර එය නිෂ්ක්‍රිය කිරීම සඳහා ජලනන්දන පිරිත උපයෝගී කරගත් බව කියවේ. බලය ඇත්තේ මෙම යන්ත්‍ර-මන්ත්‍ර, ගුරුකම්වල ද නැතහොත් බුද්ධ මන්ත්‍රයේ ද යන්න ගැන විවාදයක් ද පවතී. පර්යේෂණයේ වැදගත්කම හා ප්‍රයෝජනය වන්නේ යථාර්ථවාදී ව බලන කල යන්ත්‍ර මන්ත්‍ර, තෙල්, බෙහෙත් යෝජිත නියමිත වාරගණන විශේෂයෙන් ලක්ෂවාර ගණන් ජීවන්කර පළඳිනවානම් එහි ප්‍රතිඵල ගෙනදෙයි. එසේ ම ජීවන් කරන වාර ගණනේ මහා බලගතුකමක් ඇත. එය විද්‍යාත්මකව ද ඔප්පුකර ඇත. එහි දී බුදුගුණ සහ පිරිත් ද උපයෝගී කර ගනු ලැබේ. පර්යේෂණ ක්‍රමවේදය වූයේ මිශ්‍ර ක්‍රමවේදය යි. නිගමනය වන්නේ බොහෝ දුරට යන්ත්‍ර-මන්ත්‍ර, ගුරුකම්වලින් ලෙඩ රෝග සුවකර ගැනීමට බෞද්ධයන් බුදුගුණ සහ බෞද්ධ පිරිත් ආදිය භාවිත කරන බවයි. ඒ අතර රතන සූත්‍රය, කරණීයමෙත්ත සූත්‍රය ආදිය ප්‍රධාන වේ. එහි දී එදිනෙදා පුද්ගලයාට වැළඳෙන සාමාන්‍ය රෝග සඳහා මෙහි දී සුව ලබාගත හැකි ය. උදාහරණ වශයෙන් ජීර්ණය, අධික වමනය, බඩේ අමාරුව, දත් කැක්කුම ආදි සරල රෝග සඳහා පිරිත් නියමිත වාර ගණනක් සජ්ඣායනා කොට එම රෝගියාට පානය කිරීමට ලබා දෙනු ලබයි. එමඟින් එම ලෙඩ රෝග සුවකරගත් පුද්ගලයන් බෞද්ධයන් අතර දක්නට ලැබේ. මෙලෙස යන්ත්‍ර-මන්ත්‍ර, ගුරුකම් ආදිය තුළ දී බොහෝ දුරට භාවිත කරනු ලබන බෞද්ධ පිරිත්, බුදුගුණ ආදිය යොදා ගැනීම මඟින් ලෙඩ රෝග සුව කරගත හැකි වේ.

***ප්‍රමුඛ පදඃ*** *යන්ත්‍ර-මන්ත්‍ර, ගුරුකම්, බුදු දහම, පිරිත, භූත විද්‍යාව*

# හලාවත ප්‍රදේශයේ කතෝලික ආගමික සංස්ථාවේ නව ප්‍රවණතා කෙරෙහි සංස්කෘතික විසරණයේ බලපෑම පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්


පී. අභයසුන්දර, ඩබ්ලිව්. කේ. එම්. විජයරත්න,* ඩී. එම්. කේ. ජී. කේ. දිසානායක සහ ජී. ඒ. ඒ. ඒන්. ශ්‍රී ශාන්

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**wkmyc94727@gmail.com*



ජේසුතුමන්ගේ දර්ශනයන්, කියැවීම්, සහ අනේකවිධ පුරාණෝක්ති, ඓතිහාසික කතන්දරයන්ගෙන් ආඪ්‍ය වී තැනුණු කිතුණු දහම තුළ කතෝලික සභාව ලෝකයේ බලවත් ම ආගමික නිකාය බවට පත් වී ඇත. ලාංකේය කිතුණු දහමේ වපසරින් ගත් කල ද කතෝලික ජනගහනය දරන්නේ සුවිශේෂී වටිනාකමකි. එයිනුදු හලාවත ප්‍රදේශය ශ්‍රී ලංකාවේ කිතුණු දහමේ ප්‍රබල මර්මස්ථානයක් ලෙස හැඳින්විය හැකි ය. මෙම අධ්‍යයනය දියත් වන්නේ ලාංකේය කතෝලික දහමේ නව ප්‍රවණතා කෙරෙහි සංස්කෘතික විසරණය නමැති සිද්ධාන්තයේ බලපෑම විමසා බැලීමට ය. ලාංකේය ක්‍රිස්තියානි ආගමේ වැඩි ම නිකායන් ප්‍රමාණයක් හමුවන්නේ පුත්තලම දිස්ත්‍රික්කයෙනි. හලාවත ප්‍රදේශය ආශ්‍රිත කතෝලික දේවස්ථාන ත්‍රිත්වයක් පාදක කරගෙන, නිශ්චිත ව තෝරාගත් පියතුමන්, සහෝදරියන්, සහෝදරයන් සහ බැතිමතුන් 40කගේ නියැදියක් යටතේ සම්මුඛ සාකච්ඡා, සහභාගීත්වය නිරීක්ෂණය යනාදී ක්‍රම ඔස්සේ මෙම ගවේෂණාත්මක පර්යේෂණය සිදු කරන ලදි. සංස්කෘතික විසරණය තුළ සිදු වන බලවත් සංස්කෘතිකාංගයන්ගේ එන්නත් වීමේ යාන්ත්‍රණය යථෝක්ත අධ්‍යයන වපසරිය තුළ දී ද මනා ව ඉස්මතු විය. ජනප්‍රිය බුදුදහම තුළ හමුවන දන්සැල්, පෙරහැර යනාදී අංගයන් කතෝලික ජනතාව තුළට ද පැමිණ ඇති බව ගම්‍යමාන විය. කතෝලික දහමේ හරයන්ගේ වෙනස් වීමක් සිදු වී ඇත් ද යන්න විමසීමේ දී ඊට ලැබුණු පිළිතුරුවලින් පැහැදිලි වූයේ විශ්වාස පද්ධතියේ මුඛ්‍ය හරයේ පරිණාමික ලක්ෂණ කිසිවක් නැති වග යි. ඒ කෙසේ වෙතත් කතෝලික දහමේ නව ප්‍රවණතාවන්ගේ ආරම්භය සිදු වන්නේ 1959 දී පැවැත්වුණු දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ තීන්දු තීරණයන්ගෙන් පසු බව ලබාගත් දත්ත ආශ්‍රිත ව නිගමනය කරගැනීමට හැකි විය. විශේෂයෙන් ම කතෝලික පල්ලියේ තිබූ ඒකාධිපතිවාදයේ සහ අන්තගාමී මානව කේන්ද්‍රණගත ප්‍රතිපත්තීන්ගෙන් බැහැර ව නම්‍යශීලී පරිපාලනයක්; සම්බන්ධීකරණයක් ඇරඹෙන්නේ මෙම සම්මේලනයෙන් පසු ව බව ලබාගත් සුවිශේෂී නව්‍ය කරුණකි. ජේකම් ගොන්සල් පියතුමන් ලාංකේය කතෝලික සාහිත්‍යයේ සුවිශේෂී සංධිස්ථානයක් හොබවන්නෙකි. උන්වහන්සේ විසින් 'පසම්' නමැති ගීත විශේෂය ලාංකේය සංස්කෘතියට හඳුන්වා දුන් අතර අදටත් ඒවායේ භාවිතය උක්ත ප්‍රදේශයේ දේවස්ථාන ආශ්‍රිත ව දැකගැනීමට හැකි විය. විධිමත් පරිපාලනමය ක්‍රමයක් යටතේ ස්වකීය ආගමික වපසරිය පවත්වාගෙන යන හලාවත කතෝලික සභාව මුහුණ දෙන ප්‍රධානතම ගැටලුව ලෙස සොයාගනු ලැබුවේ මූලධර්මවාදීන්ගේ උග්‍ර ආගමික පරිවර්තනයන් ය. එහි ප්‍රබල ම ගොදුරු වී ඇත්තේ කතෝලික ජනතාව වග දත්ත දායකයින්ගේ ප්‍රකාශවලින් තහවුරු විය. මෙය ද සංස්කෘතික විසරණයේ ප්‍රතිඵලයකි. යොහොවා, බයිබල් කණ්ඩායම් වැනි අනේකවිධ නිකායන්ගේ ආගමික ප්‍රතිසංස්කරණයන් හරහා කතෝලික ජනතාවගේ ආගමික නිදහස සම්බන්ධ ව ප්‍රබල අර්බුදයක් පවතින බව උක්ත අධ්‍යයන ප්‍රදේශය තුළින් ගම්‍යමාන විය.



***ප්‍රමුඛ පද:*** *කිතුණු, විසරණය, ප්‍රවණතා, මූලධර්මවාදීන්, නිකායන්*

# රංවල දේවාලය ආශ්‍රිත යාතුකර්මීය පුදපූජා, ඇදහිලි හා විශ්වාස පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

ඒ. එන්. රේණුකා* සහ එස්. ඩබ්ලිව්. පී. කුමාර

පර්යේෂණ අංශය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ආරක්ෂක අමාත්‍යාංශය

**nilanirenuka@gmail.com*

යාතුකර්ම කිසියම් ආගමක් හෝ අභිචාර විශ්වාසයක් මත රඳා පවතින්නක් වන අතර එහි දී දේව ඇදහිලි හා විශ්වාස සඳහා ද ප්‍රමුඛත්වයක් හිමි වේ. උපතේ සිට මරණය දක්වා ස්වකීය ජීවිතයේ විවිධ අවස්ථාවල දී ආගම හා බැඳි යාතුකර්මීය ඇදහිලි හා විශ්වාස මත පදනම්ව ජීවත් වන පුද්ගලයින් අතීතයේ පමණක් නො ව වර්තමාන සමාජයේ ද සිටිනු දැකිය හැකි ය. ගම්පහ දිස්ත්‍රික්කයේ පූගොඩ ග්‍රාමයේ නිකවල බෞද්ධ මධ්‍යස්ථානයේ රංවල දේවාලය ආශ්‍රිත ව ද යාතුකර්මීය ඇදහිලි හා විශ්වාස පවතී. මෙම අධ්‍යයනයේ මුඛ්‍ය පරමාර්ථය වූයේ එම යාතුකර්මීය ඇදහිලි හා විශ්වාසයන්හි ස්වභාවය හඳුනාගැනීම යි. එමෙන්ම රංවල දේවාලය ආශ්‍රිත ව යාතුකර්මීය පුද පූජා සිදු කරනු ලබන ආකාරයත් එවැනි යාතුකර්මීය පුදපූජා පවත්වනු ලබන්නේ පුද්ගල ජීවිතයේ කවර අවස්ථාවන්වල දී ද යන්න හඳුනාගැනීමත් එම යාතුකර්මීය පුද පූජා පැවත්වීමට ප්‍රධාන සාධක හඳුනාගැනීමත් අධ්‍යයනයේ සෙසු සුවිශේෂී අරමුණු විය. රංවල දෙවියන් වෙනුවෙන් පුද පූජා පැවැත්වීමට පැමිණෙන බැතිමතුන් 30 දෙනෙකු අරමුණු සහගත නියැදි ක්‍රමය යටතේ මෙම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලද අතර සහභාගී නිරීක්ෂණය සහ සම්මුඛ සාකච්ඡා විධික්‍රම භාවිත කරමින් දත්ත එක්රැස් කරන ලදි. අධ්‍යයන අනාවරණයන්ට අනුව පූගොඩ ග්‍රාමයේ ජනතාව ළිං කැපීම, වැලි තොටුපලක් ආරම්භ කිරීම, ගඩොල් පෝරණයකට ගින්දර දැමීම, කඩ සාප්පු විවෘත කිරීම, විභාග වලට පෙනී සිටීම වැනි සුභ කටයුතු වල දී මෙන්ම විවිධ බෝවන සහ බෝ නොවන අසනීප තත්ත්වයන් සුවපත් කර ගැනීම සඳහා ද රංවල දේවාලය ආශ්‍රිතව විවිධ යාතුකර්මීය වත්පිළිවෙත් සිදු කරනු ලබයි. මිනිසුන්ගේ යහපත සඳහා පමණක් නොව සතුන් සඳහා ද සෙත් පතා රංවල දෙවියන්ට භාරහාර වීම ද අධ්‍යයනයේ දී හඳුනාගත හැකි වූ සුවිශේෂී කරුණක් විය. බෝධි පූජා පැවැත්වීම, පුහුල් පහන් හතක්, දහහතරක් හෝ විසි එකක් බාරවීම, පූජා වට්ටි දීම, රංවල දේව දාන දීම ගම්මඩු පැවැත්වීම රංවල දෙවියන් වෙනුවෙන් සිදු කරනු ලබන පුදපූජාවල විවිධ ස්වරූප ලෙස හඳුනාගත හැකි විය. රංවල දෙවියන් වෙනුවෙන් විවිධ යාතුකර්මීය පුදපූජා පැවැත්වීම මඟින් සිය ප්‍රාර්ථනා බලාපොරොත්තු ඉටුවන බව පූගොඩ ග්‍රාමයේ ජනතාවගේ විශ්වාසය වී ඇත. රංවල දෙවියන් වෙනුවෙන් පවත්වනු ලබන විවිධ යාතුකර්මීය පුද පූජා මඟින් ගම්වැසියන් සිය ජන ජීවිතය සාර්ථකව පවත්වාගෙන යන බවට අධ්‍යයනය තුළින් තොරතුරු අනාවරණය විය. එමඟින් තහවුරු වන්නේ රංවල දේවාලය ආශ්‍රිතව සිදු කරනු ලබන යාතුකර්මීය පුදපූජා හා ඒ ආශ්‍රිත ඇදහිලි හා විශ්වාස පුද්ගල ජීවිතයට සහ ඔවුන්ගේ යහපැවැත්මට හේතු වී ඇති බව යි.

***ප්‍රමුඛ පද:*** *යාතුකර්ම, ඇදහිලි විශ්වාස, අභිචාර, ජන ජීවිතය, රංවල දෙවියන්*

# මහනුවර ගුරුදෙණිය ග්‍රාමයේ පිටිය දෙවියන් උදෙසා සිදු කරන අඩුක්කු මංගල්‍යය

ජේ. එම්. සී. එච්. ජයසිංහ

මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*chamodikahansini@gmail.com*

සමාජයක පැවැත්ම නිර්ණය කරන එම සමාජයේ සංස්කෘතියට පාරම්පරිකත්වය පමණක් නො ව ජීවන රටාවන්, ගැමි විශ්වාසයන් ද අයත් වේ. මහනුවර ගඟවට කෝරළයට අයත් ගුරුදෙණිය ග්‍රාමයේ 'පිටිය දෙවියන්' උදෙසා සිදු කරනු ලබන අඩුක්කු මංගල්‍යය එලෙස ගැමි සංස්කෘතිය විදහා දක්වන අංගයකි. පිටිය දෙවියන් ඉන්දියාවේ සිට පැමිණි යක්ෂ සේනාධිනායකයෙක් වන අතර නාථ දෙවියන් හා යුද්ධ කොට එළවා කුණ්ඩසාලේ නරේන්ද්‍රසිංහ රජු ලවා දේවාලයක් සාදවා ගත් බව ගැමි විශ්වාසය යි. කරුණු අධ්‍යයනයේ දී වෙනත් නම් හමු නො වූ අතර ගුරුදෙණිය ග්‍රාමයට ආවේණික දෙවියෙක් යැයි සිතිය හැකි ය. පිටිය දෙවියන් වෙනුවෙන් ලබා දෙන දානය අඩුක්කු පිදීම ලෙස හඳුන්වනු ලබයි. අඩුක්කු මංගල්‍යය සිදු කිරීමට ගැමියන් තුළ පවතින විශ්වාස කොතෙක් දුරට ඉවහල් වී ඇත් ද යන්න පිළිබඳවත් එය සිදු කිරීමේදී සැලකිල්ලට ගන්නා කරුණු විමර්ශනය කිරීමත් මෙහි අරමුණ වේ. මෙහි අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් මෙකී සංස්කෘතිය අංගය සිදු කරන පිටිය දේවාලයේ ප්‍රධාන කපුමහතා වන සාලිය ජයසිංහ සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වූ අතර ඒ ආශ්‍රයෙන් අදාළ තොරතුරු ලබා ගන්නා ලදි. වසරක් පාසා සිදු කරන මෙම අඩුක්කු මංගල්‍යයේ දී හැටහත්දෙනෙකුට එනම් හැටහත් කට්ටුවකට දානය පිළියෙළ කරනු ලබයි. ගමේ ආරක්ෂාව, වසංගත රෝග ඇති නොවීමට, අස්වැන්න වැඩි වීමට, කුඹුරුවලට හානි නොවීමට මෙය සිදු කරයි. මෙනිසාවෙන්ම කිසිදු වසංගත රෝගයක් ගුරුදෙණිය ග්‍රාමයට සිදු නො වන අතර ඊට හේතුව අඩුක්කු මංගල්‍යය පැවැත්වීම යැයි ගැමියන් විශ්වාස කරනු ලබයි. අතෝරකාරයන් හෙවත් අත්උදව්කරුවන් හත්දෙනෙකුගේ සහයෙන් පිළියෙල කරන දානය සඳහා ගන්නා සහල් ප්‍රමාණය 'සහල් මනා' යනුවෙන් හඳුන්වයි. දානය දීමට පෙරාතුව සෙනසුරාදා රාත්‍රියේදී අවශ්‍ය සියල්ල පිළියෙල කොට පසුදා ඉරු දින පාන්දර තුනට පූජාවන් සිද්ධ කරනු ලබයි. ප්‍රධාන වශයෙන් අඩුක්කු මංගල්‍යයේ දානය සකස් කිරීම පාරම්පරික ව සිදු කරන්නේ 'හුන්කිරි මුදියන්සේ' පවුල විසිනි. වර්තමානයේ පවා මෙම පවුලේ සහයෝගයෙන් දේවාලයේ කපුමහතා විසින් ලබාදෙන පිරුවට පැළඳගෙන අඩුක්කු මංගල්‍යය සිදු කරනු ලබයි. නැවුම් මැටි මුට්ටි යොදා ගන්නා අතර වෙන ම මුළුතැන්ගෙයක් සාදා දානය පිළියෙල කරයි. දානය පිළියෙල කිරීම පිරිමි පාර්ශවය පමණක් සිදු කරන අතර වයෝවෘද්ධ කාන්තාවන් දෙදෙනෙකු කැවුම් පිළියෙල කිරීම පමණක් සිදු කරයි. මේ සඳහා තරුණ කාන්තාවන් සම්බන්ධ කර නො ගන්නේ 'කිල්ල' නම් සංකල්පයේ දැඩි විශ්වාසය මේ හා බැඳී පවතින නිසා ය. ලුණු බැලීමක් මෙන් ම පොල් කිරි දැමීමක් සිදු නො වන අතර පොල් කොටා දැමීම සිදු කරනු ලබයි. දානය අවසානයේ දී ගමේ පිරිස් සඳහා ආහාර බෙදා දීම සිදු කරනු ලබයි. මෙම අධ්‍යයනයේ දී අඩුක්කු පිදීම දෙවියන් උදෙසා සිදු කළ ද ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් සිදු කරන බවත් ගැමි විශ්වාස මෙහිදී සැලකිල්ලට ගෙන ඇති බවත් නිගමනය කළ හැක.

***ප්‍රමුඛ පදඃ** අඩුක්කු පිදීම, පාරම්පරික, පිරුවට, විශ්වාස, අතෝරකරුවන්*

# මානව සමාජීය හා සංස්කෘතික යහපැවැත්ම උදෙසා ත්‍රිලක්ෂණය සර්ව අශුභවාදී දර්ශනයක් වේ ද නොවේ ද යන්න පිළිබඳ ත්‍රිපිටකාගත ඉගැන්වීම් ඇසුරින් විමර්ශනාත්මක අධ්‍යයනයක්

සඳලංකාවේ සීලරතන හිමි* සහ කුඹල්ගොඩ සමිත හිමි

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

*sandalankaweseelarathanathero@gmail.com

සත්ත්වයා හා ලෝකය යනු සංස්කාර සමූහයක එකතුවකි. සංස්කාරයන්ගේ යථාර්ථය නම් අනිත්‍ය දුක්ඛ හා අනාත්ම බවයි. මෙම ඉගැන්වීම් බුදුදහමේ කේන්ද්‍රීය න්‍යාය වන අතර නිර්වාණය එය අවබෝධකරණයෙන් සාක්ෂාත් වේ. මානව සමාජීය හා සංස්කෘතික යහපැවැත්ම උදෙසා ත්‍රිලක්ෂණය සර්ව අශුභවාදී දර්ශනයක් වේ ද නොවේ ද යන්න හටගන්නා ගැටලුවකි. එකී ගැටලුවට පර්යේෂණාත්මකව විසඳුම් සෙවීම අත්‍යවශ්‍ය කරුණකි. එය සඳහා පර්යේෂණ ක්‍රමවේදය ලෙස ත්‍රිපිටක ග්‍රන්ථ හා තත් අට්ඨකථා පරිශීලනය ද, පුස්තකාල පරිශීලනය ද භාවිත කෙරේ. ත්‍රිලක්ෂණ සංකල්පය මඟින් සමාජයට සර්ව අශුභවාදී දර්ශනයක් ඉදිරිපත් වේ ද එසේ නොවන්නේ ද යන්න මතවාදයන් අවිදග්ධ සමාජය තුළ ජනනය වී ඇත. මෙම පර්යේෂණය මඟින් ත්‍රිලක්ෂණය සර්ව අශුභවාදී දර්ශනයක් නොවන බව ප්‍රත්‍යක්ෂාවබෝධ වේ. බුදු දහමේ මූලික අභිප්‍රාය වනුයේ යථාභූත ඤාණදස්සනය හරහා භව පටිලාභීය සංයෝජන ප්‍රහාණයෙන් සසර නිමකරලීම උදෙසා මානව දෘෂ්ටිය යොමු කිරීමයි. සත්‍යය පිළිබඳ යථාර්ථාවබෝධය හා තත්ත්වාවබෝධය ලැබීම එතරම් පහසු නොවේ. එය සඳහා තීක්ෂණ වූ ප්‍රඥාව අත්‍යවශ්‍ය සාධකයකි. බුදු දහම අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන සංකල්ප තතු පරිදි ඉගැන්වූහ. හටගත් සියලු ධර්මයන්ගේ මොහොතක් පාසා විනාශ වීම අනිත්‍ය බවය. යමක් අනිත්‍ය වේ නම් එය දුක් සහගත වූවකි. ව්‍යවහාරික ලෝකය නිරතුරු ව ම අනිත්‍යය බැවිනි. ඒ හා සමාන ව ම දුක් සහගත ද වේ. යමක් අනිත්‍ය ද දුක් සහගත වේ ද එය නියත වශයෙන් අනාත්ම වූවකි. පුද්ගලයා පෞද්ගලිකත්වය මත සිට "මම වෙමි" හා "මගේ වෙමි" යන මත දරුව ද සත්‍යය ලෙස එහි පවත්නා යමක් නොමැත්තේ ය. වෙනස් නො වන සැපය සෙවීම බුදු දහමේ ප්‍රධාන අරමුණ වේ. එය පරමාර්ථ සැපයකි. ලෞකික ජීවිතය තුළ සුඛ කාම ආස්වාදය ප්‍රඥාවෙන් විඳිය යුතු බව අස්සාද පියේසන සූත්‍රයේ දක්වයි. කාම සුඛයට වඩා සුඛයක් අෂ්ටධ්‍යානයෙන් ලැබෙන බව බහු වේදනීය සූත්‍රයේ දක්වා ඇත. ගිහි පුද්ගලයාට ගෘහස්ථ කාමභෝගී ජීවිතයක් ගෙවීමට ත්‍රිලක්ෂණය හරහා වාරණ යොදා නොමැත. ගිහි කාම සුඛය බුදුරජාණන් වහන්සේ අනුමත කළ බව ව්‍යග්ඝපජ්ඣ සූත්‍රයෙන් පෙනේ. ආර්ය ශ්‍රාවක ගිහියා දනය උපයා සැප විඳීම අනුමත කර ඇත. එමෙන්ම ගීතයෙන් ලබා දෙන වින්දනය බුදුදහම අගය යි. එය ද ඇලීමකින් තොරව වින්දනය කළ යුත්තකි. බුදුරජාණන් වහන්සේ කිඹුල්වතට හා විශාලාවට වඩින විට පරිසරය වර්ණනා කර ඇත. මීට අමතරම ථේර-ථේරී ගාථාවන්හි ද පාරිසරික වර්ණනාවන් දක්වයි. බුදු දහමෙහි කිසි තැනක මිනිසාගේ ලෞකික වින්දනයේ සොඳුරු අවස්ථා ප්‍රතික්ෂේප කර නොමැත. ත්‍රිලක්ෂණය යනු සංස්කාරයන්හි සත්‍යය පෙන්වා දෙන්නක් බවත් එය සැපයට බාධාවක් නොවන බවත්ය. මෙමගින් පෙනෙන්නේ ත්‍රිලක්ෂණය සර්ව අශුභවාදී දර්ශනයක් නොවන්නා සේ ම එය නියමාකාරයෙන් අවබෝධ කරගත යුත්තක් බව යි. එමෙන් ම පුද්ගල ජීවිත කෙරෙහි හා සංස්කෘතිය කෙරෙහි බුදුදහම බලපෑමක් නො වන අතර ජීවිතයේ යථා ස්වභාවය පෙන්වා ඇති අතර එය අන්තවාදී නො වී මධ්‍යස්ථ බවින් යුක්ත ව තේරුම්ගත යුත්තකි.

***ප්‍රමුඛ පද:*** *ත්‍රිලක්ෂණය, අශුභවාදී, සැපය, ප්‍රඥාවෙන්, වින්දනය*

# A Study on the "*Kaderi*" Worship that Prevails among Rural Tamil Folks

S. Muhunthan

Department of Hindu Civilization, Faculty of Hindu Studies, University of Jaffna

*jaisriram2577@gmail.com*

The word '*Kaderi'* really denotes a person who had once lived as a member of a village or town society and had later renounced such a life due to some reasons and had found resort in a forest locality. His bitter experiences in the previous locality might have compelled him to undergo such a change in his life environment. The worship of the woman deity "*Kaderi*" being one of the folk deities in the Tamil society, needs much attention from a socio – anthropological point of view. "*Kaderi*" is a fearful and ferocious deity who frightens and causes harm to conceived females and girls who have attained puberty. In the most Hindu rural traditions, the word *"Kadu"* (forest) is interpreted as a natural field as against a general field of livelihood. Besides, the space referred to as "*Kadu*" is also used to indicate anger, fear, a state of having no family ties, and one's departure. The main objective of this research is to bring out the significance of *Kaderi* worship based on Hindu Folk worship tradition. Based on Victor Turner's theory related to "Liminal in religious rituals" and with the help of the foregoing information, this article attempts to elucidate the myths related to *Kaderi.* Basically, this article is a descriptive research. Collected data will be subject to content analysis in appropriate instances. This research article identifies several local religious traditions prevailing in South India and Sri Lanka in relation to *Kaderi* as may be seen below: *Kaderi* is a dreadful female deity, it moves about particularly during mid-day and midnight times. It attacks pregnant females, matured girls and teenage males. It dwells along lakes, ponds, paddy fields and forests that are out of the village boarders. The following forms of worship pertaining to Katteri have also been identified in this article, viz. A ritual by the name "*Mayanankkollai*" which literally means robbery at the crematorium. An important offering known as '*Kalicchelavu*' made to *Katteri,* providing a specially prescribed diet for pregnant women.

***Keywords:*** *Kaderi, Liminal, Hindu Folk, Ritual*

# නේපාලයේ කපිලවස්තු දිස්ත්‍රික්කයේ සමායි මායි ඇදහීම හා ශ්‍රී ලංකාවේ නුවර කලාවියේ පුල්ලෙයාර් ඇදහීම අතර ඇති සම-අසමතා පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්

ඩී. එස්. ඒ. මුණසිංහ,[1*] එන්. ඒ. එස්. එන්. හංචාපොළ,[2] එන්. ඒ. ඩී. එම්. නිස්සංක[3] සහ ඒ. එච්. ඒ. එච්. එම්. ජේ. එම්. අතපත්තු[4]

[1]පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, [2,3,4]පුරාවිද්‍යා පශ්චාද් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය

*anuzone92@gmail.com

සශ්‍රීකත්වය අරමුණු කොටගෙන ලොව බොහෝ කෘෂිකාර්මික ජන සමාජ, විවිධාකාර ඇදහිලි, විශ්වාස හා අභිචාර විධි අනුගමනය කරයි. නේපාලයේ තරායි තැනිතලාවේ කපිලවස්තු දිස්ත්‍රික්කයේ සමායි මායි ඇදහීම හා ශ්‍රී ලංකාවේ වියළි කලාපීය තැනිතලාවේ නුවර කලාවියේ පුල්ලෙයාර් ඇදහීම එයට මොනවට සාක්ෂි සපයයි. මෙම පර්යේෂණයේ අරමුණ වනුයේ එම උභය ඇදහිලි සංසන්දනාත්මක ව අධ්‍යයනය කිරීම ය. මෙම පර්යේෂණයේ දී දත්ත එක්රැස් කිරීමේ විධික්‍රම කිහිපයක් අනුගමනය කරන ලද අතර සමායි මායි ඇදහීම සම්බන්ධයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනය, ව්‍යූහගත නො වන සම්මුඛ සාකච්ඡා, සෘජු නිරීක්ෂණය මගින් ප්‍රාථමික ගුණාත්මක දත්තයන් ද පුල්ලෙයාර් ඇදහීම සම්බන්ධයෙන් පුස්තකාල ගවේෂණය මගින් ද්විතීයික දත්තයන් ද එක්රැස් කිරීම සිදු කරනු ලැබී ය. එහි දී අහඹු ක්ෂේත්‍ර අධ්‍යයනයක් මගින් ඡායාරූපගත කිරීම ද සිදු කෙරිණ. සම්මුඛ සාකච්ඡා සඳහා කපිලවස්තු දිස්ත්‍රික්කයේ තිලවුර්කොට් ප්‍රදේශයේ ගැමියන් හා යුනෙස්කෝ කපිලවස්තු ව්‍යාපෘතියේ පුරාවිද්‍යාඥයින්ගෙන් සමන්විත නියැදියක් යොදාගනු ලැබී ය. සාම්ප්‍රදායික කෘෂිකාර්මික දිවි පෙවෙතක් ගෙවන කපිලවස්තු හා නුවර කලාවියේ ජනයා එම කර්තව්‍යය සාර්ථක කර ගනු වස් සමායි මායි දේවඟන හා පුල්ලෙයාර් දෙවියන් වන්දනා කරනු ලබන අතර ම එම ද්විත්ව ඇදහීම් ඔස්සේ නිර්මාණය වූ විශ්වාසයන්, චාරිත්‍ර-වාරිත්‍ර, පුද පූජා, අභිචාර විධි හා එහි ලා පසුබිම් වූ සන්නිවේදනාත්මක ස්වරූපයන් රාශියක් හඳුනාගත හැකි ය. සමායි මායි කිසිදු අවස්ථාවක මානවරූපීය ව නිරූපණය නො කරනු ලබන අතර දේවඟන සංකේතවත් කිරීමේ දී තෝරාගත් වෘක්ෂ මත ඔතන ලද වර්ණවත් නූල්, තෝරාගත් වෘක්ෂ මත කහ දියර ගැල්වීම් හා වනසතුන් පිරිවරාගත් හස්ති ප්‍රතිමා ආදිය භාවිත කරයි. එමෙන් ම නුවර කලාවියේ ගම්මාන ආශ්‍රිත ව පුල්ලෙයාර් දෙවියන් ද මානවරූපීය ව නිරූපණය නො කරන අතර අවරෝහණ ආකාරයට එක මත එක තබනු ලබන ගල් හා බෝල ගල් මත අඳිනු ලබන තිලක සංකේත මගින් පුල්ලෙයාර් නිරූපණය කරයි. මෙම කෘෂි ජන සමාජවල නිවාස, ඉඩකඩම්, වගාභූමි හා පශු සම්පත වැව් හා වෙනත් ජල සම්පාදන හා කැලෑරොද ආදි සියලු සංස්ථාවන්හි ආරක්ෂාව හා සමෘද්ධිය භාරවූයේ උභය දෙවියන් හට ය. අස්වැන්න නෙළා ගැනීමෙන් අනතුරු ව ගැමියන් එක් ව එහි පළමුභාගය සමායි මායි දේවඟනට කැප කරමින් සරස්වතී දින පූජාව පවත්වන අතර ම නුවර කලාවියේ ජනයා ද දිනයක් බේරා ගැනීමෙන් අනතුරු ව පුල්ලෙයාර් දානය පවත්වනු ලබයි. අරමුණු හා පරමාර්ථ අතින් සමානතා රාශියක් දරන මෙම ඇදහීම් බොහෝ දුරට අසමාන වනුයේ එහි ඇතැම් භෞතිකමය ස්වරූපයන් හේතුවෙනි. ඒ අනුව මෙම ද්විත්ව ඇදහීම් තුළ ඒවාට ම ආවේණික වූ මානව විද්‍යාත්මක වටිනාකම් ගොඩනැඟී පවතින අතර ම ඒවා බොහෝ සම-අසමතා සහිත ව අනාදිමත් කාලයක පටන් වර්තමානය දක්වා කෘෂි ආර්ථික පදනම මත ක්‍රියාත්මක වෙමින් පවතින ආකාරය පෙන්වා දිය හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *කෘෂි ජනසමාජ, පුල්ලෙයාර්, සමායි මායි, සන්නිවේදනාත්මක ස්වරූපයන්, සශ්‍රීකත්වය*

# තරුණ අපේක්ෂාවන් කෙරෙහි සුදු අභිචාරවල මැදිහත්වීම

ඩබ්ලිව්. එස්. එන්.සිරිවර්ධන

සමාජ විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

*wsnsusi@gmail.com*

ඕනෑම සමාජයක තරුණයන්ගේ අපේක්ෂා සමාජ අපේක්ෂාවන්ට අනුපාතික ව ගොඩනැගේ. ළමා අවධිය පරිපූර්ණභාවයෙන් වර්ධනය වෙත් ම තරුණ තරුණියන් සමාජය තුළ තම අනන්‍යතාව ගොඩනගා ගැනීමට උත්සාහ දරයි. එම අනන්‍යතාව ගොඩනගා ගැනීමේ දී අපේක්ෂාවන් ඔවුන් සතුවන ප්‍රධානතම අභියෝගය බවට පත් වේ. උසස් අධ්‍යාපනය, රැකියාව, විවාහය, අමතර ආදායම්, විදේශ ගතවීම්, දරුඵල මෙම අපේක්ෂාවන් අතර ප්‍රධානතම සමාජ අවශ්‍යතාවන් ලෙස තාරුණ්‍යය තුළ නිරූපණය වේ. තරුණ පිරිස් සිය අපේක්ෂා ඉටුකරගැනීම සඳහා අභිචාර වෙත යොමුවන්නේ ඇයි යන ප්‍රධාන පර්යේෂණ ප්‍රශ්නය ඔස්සේ මෙම පර්යේෂණය සිදු කරන ලදි. පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස තෝරාගන්නා ලද අනුරාධපුර, ඉසුරුපුර පත්තිනි දේවාලයට පැමිණෙන තරුණ පිරිස් අතරින් 50 දෙනෙකු අහඹු නියැදියක් ලෙස පර්යේෂණය සඳහා තෝරාගන්නා ලදි. සම්මුඛ පරීක්ෂණ සහ සෘජු නිරීක්ෂණය ඔස්සේ දත්ත ලබාගන්නා ලදි. පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ සම්මත සහ ප්‍රධාන ධාරාවේ ක්‍රමවේදයන් තිබුණ ද තරුණ පිරිස් සිය අපේක්ෂා ඉටුකරගැනීම සඳහා සුදු අභිචාර වෙත යොමු වීම සඳහා බලපාන සාධක හඳුනාගැනීම වේ. උපඅරමුණු අතර තරුණ පිරිස් යොමුවන අභිචාර මොනවා ද හඳුනාගැනීම, ඒ ඔස්සේ ළඟා කරගත් අපේක්ෂා මොනවා ද හඳුනාගැනීම විය. මෙහිදී තාරුණ්‍යය සිය අපේක්ෂා වෙනුවෙන් සුදු අභිචාර වෙත යොමුවීමේ ප්‍රවණතාව හඳුනාගන්නා ලදි. භාර-භාර වීම, බෝධිපූජා, සෙත්කවි, යන්ත්‍ර සහ මතුරන ලද නූල් භාවිතාව, සූර දැමීම මෙහි දී ප්‍රධානතම අභිචාර පිළිවෙත් ලෙස හඳුනාගන්නා ලදි. එයින් යන්ත්‍ර සහ මතුරන ලද නූල් භාවිතාව සඳහා යොමු වූ විසි දෙනෙකු අරමුණු සහගත ව සිද්ධි අධ්‍යයනයන් සඳහා යොමුකරන ලදි. යන්ත්‍ර සහ මතුරන ලද නූල් භාවිතාව ඔස්සේ ඔවුන්ට අධිෂ්ඨානය, මග පෙන්වීම, ආරක්ෂාව, ආවේග පාලනය, මානසික සුවය ලැබෙන බව ප්‍රතිචාරිකයන් දක්වන ලදි. යන්ත්‍ර සහ මතුරන ලද නූල් භාවිතය ඔස්සේ ඔවුන් අපේක්ෂා කරනු ලබන කෘත්‍යාත්මක පදනම මෙහි දී වැදගත් විය. විද්‍යාත්මක විසඳුමක් හෝ සම්මත පිළිවෙත් අනුගමනය කරන අතරතුර මේ සඳහා යොමු වී තිබීම මෙහි දී සුවිශේෂී හඳුනාගැනීම විය. විශේෂයෙන් ම නිදන්ගත රෝග සඳහා ප්‍රධාන ධාරාවේ ප්‍රතිකාර ලබාගන්නා අතරතුර අභිචාර වෙත යොමුවීම. සම්මත ක්‍රමවේදයන් තුළ සුදුසුකම් සපුරා තිබිය දී රැකියා සහ අධ්‍යාපන අපේක්ෂාවන් ලබාගැනීම උදෙසා යන්ත්‍ර සහ මතුරන ලද නූල් භාවිතය එනම් සුදු අභිචාර වෙත යොමුවීම හඳුනාගත හැකි විය. අපේක්ෂාවන් ඉටුකරගැනීමේ දී ඒ සඳහා නව තාක්ෂණය, නව ගෝලීය රටාවන් භාවිතය සම්බන්ධ ව අවබෝධය සහිත වුව ද, සුදු අභිචාර වෙත පෙළඹීම දැකගත හැකි විය. ඒ සඳහා අභිචාර ඔස්සේ කරනු ලබන අභිප්‍රේරණය මෙහි දී හඳුනාගත හැකි විය. ඒ අනුව අපේක්ෂාවන් ඉටුකරගැනීම උදෙසා තරුණ පිරිස් නවීන සමාජ සන්දර්භයක දී වුව ද සුදු අභිචාර වෙත විශ්වාසයෙන් යුතු ව යොමු වන බව පර්යේෂණයෙන් හඳුනාගන්නා ලදි.

***ප්‍රමුඛ පද:*** *අපේක්ෂා, තරුණයා, සම්මත ක්‍රමවේදයන්, සුදු අභිචාර*

# සියනෑ කෝරළ පහතරට රංග ශෛලියේ යක්ෂ ශාන්තිකර්ම තුළ විද්‍යමාන වන විශේෂ ලක්ෂණ

කේ. ඩී. එස්. එස්. කේ. එදිරිසිංහ

බප/කැල/ක්‍රිස්තුරාජ මහා විද්‍යාලය, වත්තල
මානව ශාස්ත්‍ර පීඨය, ලලිත කලා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*subaviranga@gmail.com*

පහතරට නර්තන සම්ප්‍රදායේ සිව්වැදෑරුම් රංග ශෛලීන් අතරින් සියනෑ කෝරළ රංග ශෛලියේ යක්ෂ ශාන්තිකර්ම තුළ අන්තර්ගත විශේෂ ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. එමෙන් ම අද්‍යතනය වන තුරුත් මෙකී රංග ශෛලියේ යක්ෂ ශාන්තිකර්ම පිළිබඳ කිසිදු පර්යේෂණයක් හෝ කතිකාවක් සිදු වී නොමැති ඌනතාව පිරිමැසීම ද මෙම පර්යේෂණයේ තවත් එක් අරමුණක් ලෙස දැක්විය හැකි ය. මෙහි දී මෙම කලා නිර්මාණය පිළිබඳ විමර්ශනය කරනු වස් ක්ෂේත්‍ර ගවේෂණය, ශිල්පීන් සමඟ සාකච්ඡා, තත් විෂයික අත් පිටපත් හා පුස්කොළ පොත් මෙන් ම ප්‍රායෝගික අත්දැකීම් තුළින් ලබාගත් දත්ත උපයෝගී කොටගෙන ඇත. යක්ෂ ශාන්තිකර්ම යනු හදි-හූනියම්, අදෘශ්‍යමාන බලවේග මඟින් ඇති වූ ලෙඩරෝග නිවාරණය කර සෙතක්, ශාන්තියක්, චිරජීවනයක් ළඟා කරගනු වස් සිදුකරන්නා වූ පූජා කර්මයක් වේ. "තොවිල්" යනුවෙන් ද ව්‍යවහාර කරන්නා වූ මෙම යක්ෂ ශාන්තිකර්ම ලෙස සූනියම් කැපීම, සන්නි යකුම, මහ සොහොන් සමයම, කළස් යාගය ආදිකොට විවිධ කාරණා අරමුණු කරගනිමින්, පැවැත්වීම හේතුපාදක කරගනිමින් විවිධ වූ නාමකරණයන් ද පවතී. මාතර, බෙන්තර, රයිගම් කෝරළය යන පහතරට නර්තන සම්ප්‍රදායේ රංග ශෛලීන්හි පවත්වන්නා වූ යක්ෂ ශාන්තිකර්ම පිළිබඳ තොරතුරු විවිධ පර්යේෂකයන් විසින් පෙන්වා දෙනු ලබයි. එහි දී සාකච්ඡාවට බඳුන් වී නොමැති සියනෑ කෝරළ රංග ශෛලියේ යක්ෂ ශාන්තිකර්ම තුළ ඇති ගර්භ සංරක්ෂණ ශාන්තිකර්මයක් වන "කළස් යාගය" යන්න මෙම පර්යේෂණයේ සීමාව ලෙස දැක්විය හැකි ය. මෙකී සියනෑ කෝරළ රංග ශෛලියේ යක්ෂ ශාන්තිකර්ම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොමැත්තේ එකී පූජා කර්මයන් පිළිබඳ තොරතුරු අප්‍රචලිත ව පවතින නිසා බව උපකල්පනය කළ හැකි ය. පහතරට රංග ශෛලියේ කෝෂ්ඨ ලක්ෂණ ප්‍රදර්ශනය කරන්නා වූ එක් පැතිකඩක් වන යක්ෂ ශාන්තිකර්ම තුළ අන්තර්ගත කළස් යාගයේ යාග භූමි සැරසිලි, පූජාවිධි රටාව, නර්තන අංග හා රංග භාණ්ඩ අධ්‍යයනය තුළින් එකී රංග ශෛලිය සතු ජීවමාන ලක්ෂණ හඳුනා ගනිමින් සවිස්තර ව තොරතුරු ඉදිරිපත් කිරීමට යොමු වීම මෙම පර්යේෂණයේ වැදගත් ලක්ෂණයකි. පහතරට නර්තන සම්ප්‍රදායේ අනෙකුත් රංග ශෛලීන් තුළින් වෙනස් ව සියනෑ කෝරළය තුළ පවත්වන්නා වූ යක්ෂ ශාන්තිකර්ම තුළින් එකී රංග ශෛලීය විශේෂතාවන් සමුදායක් විද්‍යමාන වන බව මෙම පර්යේෂණය තුළින් නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** *පහතරට නර්තන සම්ප්‍රදාය, නර්තන ශෛලීන්, යක්ෂ ශාන්තිකර්ම, ගර්භ සංරක්ෂණ ශාන්තිකර්ම, කළස් යාගය*

# "*Katthavarayan*" Worship in Jaffna Villages

S. Muhunthan

Department of Hindu Civilization, Faculty of Hindu Studies, University of Jaffna

*jaisriram2577@gmail.com*

Out of the village folk deities adored by Sri Lankan Hindus, considerable importance is attributed to "*Katthavarayan*". This deity, who is also known by the names *Katthan, Katthamutthu, Katthalingasamy* and so on, is identified as a village folk deity belonging specially to Jaffna district. In Jaffna District more than 75 *Katthavarayan* temples are sparsely identified and these are not Sanskritised. The main objective of this research was to bring out the significance of *Katthavarayan* worship on the basis of Hindu Folk worship tradition. It becomes necessary to view the worship of "*Katthavarayan*" as to have appeared from amidst social structural forces, as a mark of protest similar to that of "*Mathuraiveeran*" in South India. Basically, this article is a descriptive research. Collected data were subject to content analysis in appropriate instances. The worship of *Katthavarayan* has been constructed on the social complications that developed over a young man called "*Panchavarnam*" from a "*Parayar*" (low caste) family falling in love with a Brahmin (High caste) girl called "*Ariyapoomalai*". "*Katthavarayan*" has also been identified among some marginal communities in the South Indian Tamil society. However, there he is known as an incarnation of Lord *Murugan*. But in Sri Lanka and particularly in the *Katthavarayan Katthavarayan* among the Jaffna Tamil society, he is depicted as an adopted child of Mari. In the Jaffna Tamil society immersed in its caste structure, a young man from a marginal community trying to gain social upward mobility through a marital relationship is sent to gallows after being punished by the center of social authorities. At this juncture the grace of *Mariamman* brings out the truth behind his previous birth, whereby he is elevated to a godly status. Generally, a vertical social mobility is impossibility under a closed social structure. As a solution, tracing out the identities and trails of the past generations of the person who seeks to attain such vertical social mobility; and considering the feasibility of promoting him to a higher social status is a practice going on to date, within the caste structure of Jaffna. This is the untold reality revealed in the "*Katthavarayan*" scenario also.

***Keywords:*** *Katthavarayan, Vertical- Social Mobility, Marginal Communities, Folk Deities*

# A Study on the Importance of *Theravāda Tipitaka* and Conservation it as a National Heritage

Ven. Girandurukotte Sasanarathana

Department of Buddhist and Pali Studies, Bhiksu University of Sri Lanka, Anuradhapura

*vengsthero@gmail.com*

The expounder of the Buddhism, the Buddha preached his doctrine throughout 45 years for the sake of compassion of all living beings. After his great passing away, erudite Arahant monks including Great Arahant *Mahā Kassapa* discussed the necessity of protecting the Doctrine preached by the Buddha and they categorized the doctrinal factors proclaimed by the Buddha at the various occasions. Basically, Buddha's word divided into two parts as Vinaya and Sutta as well as both Vinaya and Sutta were handed over two generation to keep those teaching and protecting without harming it. As the time went on, the Buddha's doctrine was categorized by the erudite monks with the permission of Arahant monk. In this manner, the Doctrine was kept on protecting by the *Bhikkus* by recitation generation to generation. According to the *Mahāvamsa*, the doctrine that kept on by recitation was composed at the *Aluvihara* in the duration of king *Valagamba*. The term '*Pitaka'* defines several means and mostly used that term with sense of 'Scriptures' according to the explanation of Commentary. As a result of three major conversations (*Samgāyana*) the doctrine of the Buddha was comprised into three sects as Vinaya, Sutta and *Abhidhamma*. Inclusion of these three sects depict as the Tipitaka. Here, fundamentally, *Theravāda* Tipitaka is concerned here to identify the specialty of it as the major objective of this research. In this research primary and secondary sources were used. Therein was able to find out as results that most scholars have accepted and Theravada Tipitaka is being followed as the pure doctrine of the Buddha considering the revealing factors of the Theravada *Tipikata* such as doctrinal, historical, political and geographical, in conclusion, it clear that it gives clear image on having a proper understanding about the importance of Theravada Tipitaka and conservation it as national heritage is essential for the future generation.

***Keywords****: Buddha, Theravada, Conservation, Tipitaka*

# රටයකුම හෙවත් රිද්දියාගයෙහි අන්තර්ගත බෞද්ධාගමික පැතිකඩ පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

කේ. ඒ. සී. එස්. ආනන්ද*, එම්. ආර්. ගුණරත්න, එම්. හිත්තැටියගේ, ඕ. වී. ඒ. ජයනන්ද සහ ජී. ආර්. පී. රණසිංහ

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**chamathsame@gmail.com*

ආගම, අභිචාර හා පුදපූජා මානව සමාජ ආරම්භයේ පටන්ම විවිධ ස්වරූපයන්ගෙන් හඳුනාගත හැකි ප්‍රපංචයන් ය. බුදුදහමේ ආභාසයත් සමඟ ලාංකික ගැමි ජනතාව ශිෂ්ට සම්පන්න වීමේ ප්‍රතිඵලයක් ලෙස ලක්දිව පැවති ශාන්තිකර්ම විෂයෙහි ද බෞද්ධාගමික මුහුණුවරක් ගොඩනැගීමට බොහෝ දෙනා උත්සුක වී තිබේ. පහතරට ශාන්තිකර්ම සම්ප්‍රදාය තුළ ගර්භ සංරක්ෂණය මූලික ලෙස අරමුණු කරගනිමින් පවත්වනු ලබන රටයකුම හෙවත් රිද්දියාගය සමාජ ස්තරයේ විශාල ආකර්ෂණයක් මෙන් ම දැඩි ගෞරවාදරයට පාත්‍ර වූ සහ පාත්‍ර වන ශාන්තිකර්මයකි. රිද්දියාග ශාන්තිකර්මය තුළ විකාශනය වන කතා පුවත සහ එහි දී සිදු කරනු ලබන අභිචාර විධි සඳහා බුදුදහම තුළ සිදු කරනු ලබන පුදපූජා රටාව සහ සමාජයේ පැවති බෞද්ධාගමික වපසරිය ප්‍රබල ව බලපා ඇත, යන උපන්‍යාසය මත පිහිටා මෙම පර්යේෂණය සිදු කරන ලදි. මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වන්නේ රටයකුම ශාන්තිකර්මය තුළ අන්තර්ගත ව පවතින බෞද්ධාගමික පර්යාවලෝකනයන් පිළිබඳ ව විශ්ලේෂණාත්මක ව අධ්‍යයනය කිරීම යි. එමෙන් ම රටයකුම ශාන්තිකර්මය සිංහල ජන සමාජය තුළ කොතරම් දුරට මුල්බැස ගෙන ඇත් ද යන්න පිළිබඳ ව සොයා බැලීම ද මෙහි පරමාර්ථ අතර ප්‍රධාන වේ. මෙම පර්යේෂණය ද්විතීය මූලාශ්‍ර හා ප්‍රාථමික මූලාශ්‍ර මත පදනම් ව සිදු කළ අතර ද්විතීය මූලාශ්‍ර සඳහා පොත්පත් හා පර්යේෂණ ලිපි ආදිය යොදාගනු ලැබීය. ප්‍රාථමික මූලාශ්‍ර ලෙස රිද්දියාග නටන යකැදුරන් සමඟ සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ භාවිත කරමින් පර්යේෂණයේ අරමුණුවලට අනුකූල ව දෙවිනුවර සහ කෝට්ටේගොඩ යන ප්‍රදේශ අධ්‍යයන ප්‍රදේශය ලෙස යොදා ගනිමින් පරමාර්ථගත නියැදිය ඔස්සේ මෙම පර්යේෂණය සිදු කරන ලදි. රටයකුමේ උප්පත්ති කථාව තුළින් නමස්කාර සන්නය, කඩතිර ඇදීමේ කවි, ආශිර්වාද කවි, සිරසපාද කවි ආදී ගායනා තුළින් මෙන් ම පහන් දැල්වීම, සතරවරම් දෙවියන්, සමන් දෙවියන් මල්යහනට කැඳවීම හා දලුමුර පිදීම ආදි පුදපූජා රටාවන් තුළින් හෙළි වන බෞද්ධාගමික පසුබිම මෙහි දී විශේෂ කොට සැලකිය හැකි ය. කර්ම කර්මඵල පිළිබඳ විශ්වාසයන්, යකැදුරා හා ආතුරයන් පේ වීම තුළින් ඉස්මතු වන පංචශීල ප්‍රතිපත්තිය, පාරිශුද්ධත්වය පිළිබඳ සංකල්පය ආදිය මෙම පර්යේෂණයේ උපන්‍යාසය තහවුරු කරන සාධක වේ. ඒ අනුව විද්‍යමාන වන්නේ ශාන්තිකර්ම සඳහා බෞද්ධාගමික ආභාසය ලැබීමත් සමඟ රටයකුම ශාන්තිකර්මය සාම්ප්‍රදායික හා කලාත්මක වශයෙන් පමණක් නො ව ආතුරයා තුළ යහපත් මානසික තත්ත්වයක් ගොඩනංවා කායික හා මානසික වශයෙන් සුවපත් කිරීමෙහි ලා මෙන් ම බෞද්ධ සාරධර්මයන් සමාජගත කරමින් සමාජ ඒකාබද්ධතාව, සාමූහිකත්වය පවත්වා ගෙනයාම විෂයෙහි ද වැදගත් වූ අභිචාර විධියක් වී ඇති බව යි. එකී කරුණුවලට අනුකූල ව සමස්ත පර්යේෂණය හරහා රිද්දියාගය තුළ අන්තර්ගත විවිධ නාට්‍යමය අවස්ථා සහ පුද සිරිත් බෞද්ධාගමික පසුබිමක් අනුව නිර්මාණය වී ඇති බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද :*** *අභිචාර, ගර්භ සංරක්ෂණය, බුදුදහම, රටයකුම, ශාන්තිකර්ම*

# A Study on The *Kabalewa* Deity and The Folk Life of The *Kabalewa* People in *Kuliyapitiya*, Sri Lanka

S. D. Y. Jayarathne*, N. L. K. Sandunika and N. Kanthilatha

Department of Anthropology, University of Sri Jayewardenepura

*yeshani.jayarathna@gmail.com

The legend of '*Kabalewa*' deity was gifted from ancient India. The *Kabalewa* deity is named as '*Suniyam Deviyo*' which has acquired supreme powers. As he was fed from cows' milk, lands and crops in the village was protected by him. Due to this offering, eventually, he was believed as a guardian of the village and people had worshipped him as a deity. The main objective of this research was to find out the attitudes of the people about the rituals which performed on behalf of the *Kabalewa* deity. This research was carried out at the main *Dewalaya* of "*Siddha Suniyam Shrine of God Kabalewa*" in *Kabalewa* Divisional Secretariat, *Kuliyapitiya*. Structured interviews and observations were used as the main methods of data collection. The sample size was 100 including the age groups of 50-70 and 20-30. Results indicated that 80% of the religious devotees of *Kabalewa* deity were belonged to the 50-70 age group. They believed that they are experiencing a good peaceful life because of these rituals. They are respecting to rituals and doing offerings to the deity as a part of their traditional faming culture. The age group 20-30 composed of 20% of the sample are participated in the rituals because parents have asked them to do so, especially in the special occasions of their life. They are afraid of discarding the belief of *Kabalewa* deity because several generations are worshiping as a habitual activity of their lives. Village people are experiencing a calm and quite life by engaging their faming activities. This kind of beliefs are important for them to have a good relationship with their neighbors and not engaging any bad habits and behaviors. Thus, *Kabalewa* deity plays a good role in villagers' life by strengthening their social relationships.

***Keywords:*** *Kabalawa, Deity Folk culture, Beliefs, Rituals*

# කොහොඹා කංකාරියෙන් පිළිබිඹු වන වැදි ජන ඇදහිලි ලක්ෂණ


ආර්. ඒ. බී. එස්. ඒ. මධුසංඛ

කැලණිය විශ්වවිද්‍යාලය

*bhagyanrdh@gmail.com*



සත් කෝරලය, සතර කෝරලය, මහනුවර ප්‍රදේශ ප්‍රධාන කොට ව්‍යාප්ත වූ කොහොඹා යක් කංකාරි ශාන්තිකර්මය ලාංකේය ගැමි සංස්කෘතියේ ඇදහිලි විශ්වාස, අරමුණු හා ජීවන රටාවන් විදහා දක්වන්නකි. සශ්‍රීකත්වය, සෞභාග්‍ය අරමුණු කරගනිමින් පැවැත්වෙන කොහොඹා කංකාරිය සඳහා පාදක වූ දේව යක්ෂ ඇදහිලි, වත්පිළිවෙත්, නර්තන හා ගායන සාහිත්‍යය තුළ ''වැදි'' යන පර්යාය නාමය සුලභව භාවිත වේ. එනයින් කොහොඹා කංකාරිය යනු වැදි අභිචාර ක්‍රමයක ආභාසය ලැබූ ශාන්තිකර්මයක් ද යන්න මෙහි අධ්‍යයන ගැටලුව විය. එමගින් කොහොඹා කංකාරිය සමග ස්වදේශික වැදි ජන ජීවිතය හා ඇදහිලි ක්‍රම අතර යම් සබඳතාවයක් ඇතිදැයි සොයා බැලීම මෙහි අරමුණ විය. මානවවංශ පර්යේෂණ යටතට ගැනෙන මෙම අධ්‍යයනයට දත්ත ලබාගැනීමේදී ප්‍රාථමික මූලාශ්‍ර හා ද්විතීයික මූලාශ්‍ර යොදා ගැනිණි. ක්ෂේත්‍ර අධ්‍යයනයේදී කෑගල්ල, කුරුණෑගල, මහනුවර ප්‍රදේශ වල කොහොඹා කංකාරි ශිල්පීන් දස දෙනෙකු සමඟ සම්මුඛ සාකච්ඡා කිරීමත්, මහියංගණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආදිවාසී ගම්මාන ආශ්‍රිතව හිමබෝල නියැදිය යටතේ තොරතුරු ලබා ගැනීම සිදු කෙරිණි. පුස්තකාල අධ්‍යයනය යටතේ ද්විතීයික මූලාශ්‍ර පරිශීලනය තුළින් ද නිගමන වලට එළඹිණි. මෙම ශාන්තිකර්මයේ දී ප්‍රධාන වශයෙන් පුද ලබන ඉරුගල් බණ්ඩාර, කන්දෙ දෙවි, කොහොඹා දෙවිවරු, කළුවැදි දෙවි, කොටුවැදි දෙවි, වැදි යකුන් ආදිය වැදි දෙවිවරුන් වන අතර වැදි ජන ජීවිතය තුල එම දෙවිවරු ප්‍රධාන වශයෙන් ඇදහීමට ලක් කොට ඇත. මෙම දෙවිවරුන් සාමාන්‍ය සිංහල ජන සංස්කෘතිය තුල සුලබව පුද ලබන දෙවිවරු නොවන බවද පැහැදිලි වේ. කොහොඹා කංකාරියේ අන්තර්ගත වැදි යකුන් නැටීම, වැදියක් කෝල්පාඩුව, වැදි යක්කම, වැදි දානය, දුණුමාලප්පුව යන පෙලපාලි අංගවල ද ''වැද්දන්'' යන පර්යාය නාමය හා දුන්න, ඊතලය වැනි රංග භාණ්ඩ භාවිත වේ. අයිලෙ යැදීම, වැද්දන් අඬගෑම, කන්දේ දෙවි කවි, ඉරුගල් දෙවියන්ගේ කවි සාහිත්‍ය තුල වැද්දන්ගේ සම්බන්ධය පැහැදිලි ව පෙනේ. එමෙන් ම කංකාරියේ ප්‍රධාන සැරසිල්ල වන යහන මත තැම්පත් කරන දුන්න, ඊතලය, කෙටේරිය, හෙන්ඩුව, කැත්ත, හෙල්ල යන ආයුධ වැදි ජන ජීවන රටාව තුළ භාවිතයට ගන්නා අතර මෙහි දී ඒවා දේවාභරණ ලෙස පුදනු ලැබේ. තව ද වැද්දන් ගිවිස්සීම, වැදි යක්කම, කප ගැලවීම අංගවලදී වැද්දෙකු ලෙස බාහිර සමාරෝප වී අනුරූපණය කරන අවස්ථා ද කොහොඹා කංකාරිය තුළ දක්නට ලැබේ. ද්විතීයික මූලාශ්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා ප්‍රශ්නාවලි හා ක්ෂේත්‍ර නිරීක්ෂණ පදනම් කොටගෙන ලබාගත් මෙම සාධක තුළින් කොහොඹා කංකාරියේ පුද ලබන දේව යක්ෂ කොට්ඨාස, දේවාභරණ, නර්තන පෙළපාළි, වත්පිළිවෙත් තුළ වැදි ජන සංස්කෘතික සේයාව පැහැදිලි වේ. ඒ අනුව ස්වදේශික වැදි ජන ජීවිතය හා ඇදහිලි ක්‍රම කොහොඹා කංකාරිය සමග යම් සබඳතාවක් ඇති බවත් අතීත වැදි අභිචාර ක්‍රමයක ආභාසය කොහොඹා කංකාරියට ලැබී ඇති බවත් අනාවරණය විය.



***ප්‍රමුඛ පද:*** *කොහොඹා කංකාරිය, වැදි, ඇදහිලි, දේව, යක්ෂ*

# කළුතර, කෙළින්කන්ද, මාකෙළි දේව වන්දනය පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

පී. වී. අයි. දමයන්ති* සහ පී. ඩී. එම්. එන්. ලක්ෂිත

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*chamaasha27@gmail.com

ඇදහිලි විශ්වාස යන්න සංස්කෘතිය තුළ පෝෂණය වූ සුවිශේෂී අංගයක් ලෙස සැලකිය හැකි ය. කෙළින්කන්ද ග්‍රාමයේ මාකෙළි ඇල්ල නමින් සුවිශේෂී දිය ඇල්ලක් පවතින අතර එය වීදිය බණ්ඩාර සෙනෙවියා පැළෑඳ ප්‍රදේශයේ බලකොටු ඉදිකරගෙන සිටි කාලයේ ඊට ආසන්නයේ දිය කෙළියෙහි යෙදුණු ස්ථානය වන බවත් එම නිසා දිය ඇල්ලට එනම ලැබී ඇති බවත් ජනප්‍රවාදවල සඳහන් වේ. මෙම ඇල්ල තුළ එතුමාගේ සිංහාසනය, වස්ත්‍රාභරණ ආදිය තැම්පත් කර ඇති බැවින් මෙම ස්ථානය ගම්වාසීන් පූජනීයත්වයෙහි ලා සලකනු ලබයි. වීදිය බණ්ඩාර සෙනෙවියා මාකෙළි දෙවියන්ගේ වේශයෙන් පැමිණ ගම්වාසීන් ආරක්ෂා කරන බව ඔවුන්ගේ විශ්වාසය යි. සෑම වර්ෂයක ම අගෝස්තු මස මෙම දෙවියන් උදෙසා පුද පූජා පවත්වනු ලබයි. පාරම්පරික ව පැවත එන මෙම පුද පූජා විධිවල වර්තමාන වටිනාකම් ආරක්ෂා කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. පරම්පරාගත ව සම්ප්‍රේෂණය වන මෙම පුද පූජා රටාවන් ඔවුහු තම සමාජයේ ප්‍රධාන සංස්කෘතික අංගයක් බවට පත් කරගෙන සිටිති. මෙලෙස පරම්පරාවෙන් පරම්පරාවට පිළිවෙළින් පැවත එන්නා වූ මාකෙළි දේව වන්දනය අද වන විට ක්‍රමයෙන් අභියෝගයට ලක්වෙමින් පවතී. මෙහි දී පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කෙළින්කන්ද ග්‍රාමය යොදාගන්නා ලදියි. 836 ජේ බාම්පාර ග්‍රාම නිලධාරී වසමේ පවුල් 400ක් පමණ ජීවත් වන අතර පර්යේෂණයට නතු වූ එම පවුල් අතරින් 40 දෙනෙකු පහසු නියැදි ක්‍රමය යටතේ තෝරාගන්නා ලදි. මෙහි දී ක්ෂේත්‍ර අධ්‍යයනය ප්‍රධාන වූ අතර අධ්‍යයන ප්‍රදේශයට ගොස් දත්ත එක්රැස් කිරීම්, ඡායාරූපගත කිරීමත් සහ සම්මුඛ සාකච්ඡාත් සිදු කරන ලදි. මෙහි දී මෙම ස්ථානය පිළිබඳ ලියැවුණු මූලාශ්‍රයන් පිළිබඳවත් වැඩි අවධානයක් යොමුකරන ලදි. මාකෙළි දේව වන්දනය ඉතා වටිනා අස්පර්ශනීය උරුමයකි. මෙම ගම්වාසීන් මාකෙළි දෙවියන් උදෙසා නිවසේ පහනක් දල්වමින් පුද පූජා පවත්වන අතර ප්‍රදේශයේ ස්ථාපිත මාකෙළි දේවාලයට පඬුරු දැමීමෙන් ද ගමන් බිමන් යෑමේ දී ආරක්ෂාව අපේක්ෂා කරයි. පුරාවෘත්තයන්හි දැක්වෙන ආකාරයට මාකෙළි දෙවියන් උදෙසා කරනු ලබන මෙම පූජාවන් තුළින් අස්වනු සරුසාර වී භව-භෝග සම්පත් ලබා ගැනීම, ගමට සෙත් පැතීම, වසංගත රෝගවලින් ආරක්ෂා වීම මෙන් ම විනෝදාස්වාදය ආදිය අපේක්ෂා විය. ගැමියන්ගේ විශ්වාසය වූයේ දේව වන්දනය නිසි ආකාරයට සිදු නො වුණහොත් ඔවුන්ට මරණය පවා ළඟා විය හැකි බව යි. එනම් ඔවුන්ගේ සියලු කටයුතු දෙවියන් ප්‍රමුඛ කොට සිදු කළ යුතු බව යි. ඒ තරමට ම මාකෙළි දෙවියන් ගැමි ජන ජීවිතය හා සමීප සම්බන්ධයක් දක්වයි. අප ප්‍රදේශයේ පන්සලේ පිහිටා ඇති මාකෙළි දේව මන්දිරයේ සිට පෙරහැරක් ආකාරයෙන් ගමන් කරන ගම්වාසීන් මාකෙළි ඇල්ලට පැමිණ පෙරහැර හමාර කරයි. එතැන මාකෙළි දෙවියන් වැඩවසනවා යැයි ගම්මුන්ගේ පිළිගැනීම යි. මෙම පර්යේෂණය තුළින් අනාවරණය වූයේ මෙම ජනතාව තවමත් ඇදහිලි විශ්වාස ක්‍රම මත යැපී සිටින බවත් විවිධ වෙනස්කම්වලට ලක්වෙමින් මාකෙළි දේව වන්දනය වර්තමානය වන විටත් දේව ඇදහිල්ලක් ආකාරයෙන් මෙහි ක්‍රියාත්මක වන බවත් ය.

***ප්‍රමුඛ පද:*** *දේව වන්දනය, පැළෑඳ, මාකෙළි ඇල්ල, වීදියබණ්ඩාර සෙනෙවියා, ඇදහිලි විශ්වාස, පාලින්දනුවර*

# සැඟවුණු ගැමි සුව: දෙවියන්ගේ ලෙඩ පිළිබඳ වෛද්‍ය සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්


ආර්. එම්. ආර්. එස්. රාජපක්ෂ

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්ව විද්‍යාලය

*ruwinirajapaksha7@gmail.com*



''දෙවියන් විසින් මිනිසුන් කිසිවිටෙකත් අසනීප නො කරයි'' ලෙස බයිබලය ආශ්‍රිත බටහිර මතයක් ගොඩනැගී තිබුණ ද දකුණු ආසියාතික සමාජ ක්‍රමයන්හි 'දෙවියන්ගේ ලෙඩ' ලෙස රෝගීභාවයන් වෙනස් ආකාරයකට සන්දර්භගත වී ඇත. ඒ අනුව ශ්‍රී ලාංකේය සමාජ සන්දර්භය තුළ ආවේණික සංස්කෘතික අගයයන්, ධර්මතා සහ ඇදහිලිවලට අනුරූප ව දෙවියන්ගේ ලෙඩ යන්න අර්ථ ගන්වයි. මෙම පසුබිම් සන්දර්භය පාදක කොටගනිමින් පශ්චාත් යටත්විජිත ලාංකේය සමාජය තුළ දෙවියන්ගේ ලෙඩ සඳහා වන ප්‍රතිකාර ක්‍රම ස්ථානගත වී ඇත්තේ කෙසේ ද යන්න වෛද්‍ය සමාජ විද්‍යාත්මක ව විමසුමට ලක්කිරීම පර්යේෂණයේ මූලික පරමාර්ථය විය. මෙම පර්යේෂණය සිද්ධි අධ්‍යයනයක් ලෙස සිදු කළ අතර ඒ සඳහා ප්‍රතිචාරිකයන් 25ක් තෝරාගනු ලැබූයේ අරමුණු සහගත නියැදි ක්‍රමයෙනි. නියැදිය තෝරාගැනීමේ දී පර්යේෂණ අරමුණ හා සමගාමී දැනුම සහිත ප්‍රධාන පුද්ගලයන් ද ග්‍රාමීය සහ නාගරික ජනතාව ද ඇතුළත් කරගන්නා ලදි. දත්ත එක්රැස් කිරීමේ දී ගැඹුරු සම්මුඛ සාකච්ඡා 15ක් ද අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා 10ක් ද සිදු කරන ලදි. ප්‍රධාන වශයෙන් ගුණාත්මක දත්ත විශ්ලේෂණයක් මත පදනම් වූ අතර එහි දී තේමා අන්තර්ගත විශ්ලේෂණය යොදාගන්නා ලදි. පර්යේෂණ සොයාගැනීම් පිළිබඳ ව අවධානය යොමු කිරීම් දී, මෙම රෝගීත්වය තුළ පුද්ගල හැසිරීම සහ සමාජ සන්දර්භය තුළ සාම්ප්‍රදායික ප්‍රතිකාර ක්‍රමයන් භාවිත කිරීමේ දී පැහැදිලි වෙනසක් ග්‍රාමීය ව සහ නාගරික ව හඳුනාගත හැකි විය. එහි දී පශ්චාත් යටත්විජිත ලාංකේය ගැමි සමාජයේ දෙවියන්ගේ ලෙඩ සඳහා වන විකල්ප ප්‍රතිකර්මයන් පරිසරය, අධිභෞතික බලවේග සහ පුද්ගල අන්තර් සබඳතා එක්තැන් කරමින් රෝගියා සුවපත් කිරීමට යොදා ගන්නා බව හඳුනාගන්නා ලදි. විශේෂයෙන් ම එහි දී කෙම්ක්‍රම, ඖෂධ ක්‍රම මෙන් ම පෝෂණ ප්‍රතිකාර ක්‍රමයන් ද පවතින බව හඳුනාගත හැකි විය. තව ද සංකේතීය වශයෙන් ද්‍රව්‍යය භාවිතය සහ භාෂා භාවිතය හරහා රෝගය ප්‍රජාගත වීම අවම කරගැනීමට උපක්‍රමයක් ලෙස යොදා ගන්නා බවත් අනාවරණය විය. නමුත් නාගරික සමාජය තුළ දෙවියන්ගේ ලෙඩ යන රෝගීත්වය ස්වදේශීය ඥානය පදනම් කරගත් සංස්කෘතිකමය සුවකිරීම් පද්ධතියෙන් ඈත් වන බවක් දැකගත හැකි වූ අතර ක්ෂණික බටහිර වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමුවන බවක් හඳුනාගත හැකි විය. මෙම පර්යේෂණ සොයාගැනීම්වලට සාපේක්ෂ ව පැහැදිලි වන්නේ, මෙවන් රෝගී තත්ත්වයන් සඳහා නූතනකරණයට සහ නාගරීකරණයට ලක් වූ පරිසරයන්හි බටහිර වෛද්‍ය ක්‍රමය වඩාත් උපයෝගී කරගත්ත ද ග්‍රාමීය ප්‍රදේශ තුළ අදටත් විකල්ප වෛද්‍ය ක්‍රම බොහෝ දුරට උපයෝගී කරගන්නා බව යි. ඒ අනුව යටත්විජිතකරණයත් සමඟ ශ්‍රී ලංකාව තුළ මුල් බැසගත් බටහිර වෛද්‍ය ක්‍රමයේ බලාධිකාරය නූතනකරණය සහ නාගරීකරණය මත පවතින දෙයක් ද? යන්න ප්‍රශ්න කිරීමකට ද භාජනය කළ හැකි ය.



***ප්‍රමුඛ පද:*** *දෙවියන්ගේ ලෙඩ, වෛද්‍ය ක්‍රම, ගැමි අංශය, සංස්කෘතිය, ශ්‍රී ලංකාව*

# ඒලුමුග කාලි අම්මන් කෝවිල සහ සප්ත කාලි සංකල්පය

කේ. බී. ඩී. ගුණසේන

භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*deepalgunasena@sjp.ac.lk*

ලාංකේය සංස්කෘතියෙහි ද්‍රවිඩ හා සිංහල යන ප්‍රධාන ජන වර්ග දෙකට ම අයත් පුද්ගලයින් විසින් වන්දනා කරනු ලබන පොදු දේව සංකල්පයක් ලෙස කාලි සංකල්පය අද්‍යතනයේ ඉතා ජනප්‍රිය දේව සංකල්පයකි. කාලිය විෂයෙහි වන්දනය කිරීමට මෙම ජාතීන් ද්විත්වයට ම අයත් පිරිස කාලි කෝවිල් වෙතම යෑම සුවිශේෂීත්වයකි. ලක්දිව පුරා කාලිය උදෙසා කැපවුණු ඉතා පෞරාණික කාලි කෝවිල් රාශියක් ඇත. ඒ අතුරින් මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ ඒලුමුග කාලි අම්මන් කෝවිල ඉතා සුවිශේෂී වේ. කාලියගේ භෞතික ස්වරූපය එක් මුහුණක් සහ හස්ත කිහිපයකින් යුතු ස්වභාවයකි. ඒලුමුග හෙවත් සත් මුහුණු කාලි කෝවිලෙහි කාලිය මුහුණු සතකින් යුක්ත ය. ලක්දිව ප්‍රචලිත අනෙකුත් කාලි කෝවිල් සමග සැසඳීමේ දී ඒලුමුග කාලියගේ සුවිශේෂීත්වය අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ විය. ශ්‍රී ලාංකේය සංස්කෘතියෙහි ප්‍රචලිත කාලි සත්කට්ටුව කෙරෙහි මෙම ඒලුමුග කාලි අම්මන් කෙතරම් බලපා තිබේ ද? යන්න මෙහි අධ්‍යයන ගැටලුව විය. මෙය මානව වංශ පර්යේෂණ යටතට ගැනෙන අධ්‍යයනයක් වන අතර දත්ත විශ්ලේෂණයේ දී ගුණාත්මක ක්‍රමවේදය යොදා ගනිමින් උද්ගාමී තර්කණය යටතේ නිගමනවලට එළැඹිණි. මෙහි දී ක්ෂේත්‍ර අධ්‍යයනය සහ ජනශ්‍රැති අධ්‍යයනය ප්‍රධාන විය. ලක්දිව ප්‍රචලිත පෞරාණික කාලි කෝවිල් නිරීක්ෂණය, ලක්දිව ඇදහිලි විශ්වාස හා බැඳි සප්ත සංකල්පය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමයත් පුස්තකාල අධ්‍යයනය යටතේ ද්විතීයක මූලාශ්‍ර පරිශීලනයත් සිදු විය. සප්ත (හත) සංකල්පය හින්දු දහමේ සුවිශේෂී වූවකි. ද්‍රවිඩ හින්දු විශ්වාසය අනුව මහේශ්වරයාණන්ගේ ප්‍රියාවගේ අතිබිහිසුණු ස්වරූපය වන කාලිය සප්තලෝක නායකිය යි. අතාල, විතාල, සුතාල, තලතාල, මහතාල, රස තාල, පාතාල යන ලෝක සතට නායකිය කාලිය යි. ඇයගේ ස්වරූප හත එනම් භද්‍ර (පත්‍ර) කාලි, මහා භද්‍ර (පත්‍ර) කාලි, මහා කාලි, රක්ෂ කාලි, රක්ත කාලි, සම්ශන කාලි සහ අග්නි කාලි එක් ව පුද ලබන ලක්දිව එක ම කෝවිල මාතලේ ඒලුමුග කාලි අම්මන් කෝවිල වේ. කාලි සත් කට්ටුවක් ලෙස සිංහල ජන සමාජයේ වඩාත් ප්‍රචලිත ය. භද්‍ර කාලි, මහා භද්‍ර කාලි, පේන කාලි, වදුරු කාලි, රීරි කාලි, සොහොන් කාලි, ගිනි කාලි එම සත් කට්ටුව යි. ලාංකේය සිංහල ජන සමාජයේ ප්‍රචලිත කාලි සත්කට්ටුව ද්‍රවිඩ හින්දු දහමෙහි එන සප්ත කාලි ( ඒලුමුග කාලි අම්මන්) ඇසුරෙන් බිහි වූවක් බව අනාවරණය විය.

***ප්‍රමුඛ පදඃ*** *ඇදහිලි විශ්වාස, දේව සංකල්ප, සප්ත ලෝක, සත් කට්ටුව, ජනශ්‍රැති*

# Remedies for Conflict Resolution: Through Buddhist Philosophy

A. S. Samarakoon[1*] and W. T. D. Wijethunga[2]

[1]Sri Lanka Law College, [2]Department of sociology, University of Sri Jayewardenepura

*avanisasanka95@gmail.com

The pali term '*Ghattana'* or '*samghattana'* is increasingly reasonable for the English expression 'conflict'. Oxford dictionary shows the meaning of conflicts as follows; (1) serious disagreements (2) a long-lasting armed struggle (3) a deference opinion. As per the above clarification, it is clear that when deference opinion or principles are existed their emerge conflicts. Then there is an ample space to raise an impact among the people because there are many people who belongs to separate religious groups. Those who firmly believes and follow strict guidance of a religion may conduce to conflicts. The objective of the research was to identify the remedies available in Buddhism to eradicate the conflicts. This research paper was based on primary and secondary sources. Both sources and the relevant monographs and religious and non-religious text were used to examine the proposed topic. Various discourages which arrangement to comprehend social issues, for example neediness, war, fight, and ethnic emergency are profoundly obvious in Buddhist teaching. '*jaya sutta*' in '*samyutta nikhaya'* shows about the conditions of the inner tangle and the outer tangle and the suitable solutions which ought to be achieved by everyone in order to overcome these problems. Desire or greed is the fundamental phenomenon which leads human mind to make many struggles. '*Madhupindika sutta'* clearly shows the process of greedy and benefits when someone is freed from greedy. 'K*alahavida sutta'* is a remarkable which speaks to the explanation of raising effects, arguments and it gives solution in philosophical view. '*Vitakkasanthana sutta*' demonstrates incredible approach to control terrible expectations of the psyche. In the Buddhist view on conflict, they occur due to the mental phenomenon by the way of grasping a wrong view as a right view. If a view does not produce welfare for the sake of both oneself and others it is concerned as a wrong view or false doctrine in the Buddhist explanation. In conclusion, it is clear that the Buddhism recognizes the reason for origin of conflicts gradually and fruitful solutions have been distinguished in a grand scale in the teaching of Buddhist philosophy.

***Keywords:*** *Conflicts, Conflicts Resolution, Buddhism, Buddhist Teachings*

# Ultimist Religious Pluralism and Its Influence on Moral Universe Among Peasants: An Ethnographic Study in Panampattuwa, Sri Lanka

S. Udayanga

Department of Sociology, University of Ruhuna

*senithsrisami@gmail.com*

The moral universe that consists of several religious principles significantly influences the peasants' mode of thought whilst determining the code of conduct in their everyday lives. A core religious belief system seems to be prominent in that moral universe, even though other related folk belief systems can also influence the worldview among peasants. This ethnographic study explores how peasants' worldview is embedded with different belief systems that create an ultimist religious pluralism where the core religious belief system is recognized following the contextual essentiality of the belief system in Sri Lankan peasantries. A lifeworld analytical ethnography in which phenomenological approach was embedded with ethnographic principles (such as observant participation) was employed in Panampattuwa, Sri Lanka to understand how peasants reflect on their religiosity in everyday lives. This study contends that peasants' moral universe has been constructed responding to sacred religious principles even though it seems to be closely related with mundane purposes of everyday life. Moral universe among peasants in Panama has been constructed like a hierarchically arranged belief system, each of which responds to the unique mundane or this-worldly need of people. Social identity among Panama peasants is likely to encapsulate with "Buddhism" that gives them a sense of identity in society, whereas rural-Hinduism helps people distinguish their position in society from other religious-based identity groups. Folk belief system around "the goddess Pattini" facilitates people to work with some mundane activities. The customs and rituals around black and white magic as the bottom layer of the religious hierarchy facilitates people to engage with what is not sanctioned (ex: sorcery) by higher-order religious belief systems such as Buddhism. Peasants thus adhere to different belief systems in accordance with the encountered societal context, that creates an ultimate religious pluralism where the prominence of a belief system is determined following its essentiality in each societal context.

***Keywords:*** *Folk beliefs, Moral Universe, Religiosity, Syncretism, Ultimate Pluralism*

# වැදි ජනයා මහලොකුවෝ කිරි අම්මා දේවිය පිදීම බෞද්ධයින් ශ්‍රී සිද්ධ පත්තිනි දේවිය පිදීමට සමාන යඃ කිරිඅම්මා දානය සහ කිරිකොරහා ශාන්තිකර්මය පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනයක්

ආර්. එන්. පැතුම්[1*] සහ අයි. එම්. නවරත්න[2]

[1]ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, [2]ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

*acd25psc@gmail.com*

ශ්‍රී ලංකාවේ මධ්‍යම හා ඌව පළාත් ප්‍රාදේශිය මට්ටම තුළ ගැටුම් ප්‍රවණතාවය වර්ධනය හෝ මැඩ පැවැත්වීම කේන්ද්‍රකොට ගනිමින් තත්ත්ව අවදානම් විශ්ලේෂණ (Situational Risk Analysis) පර්යේෂණය සිදු කරනු ලැබී ය. එහි දී වැදි ජනයාට සහ සිංහල බෞද්ධ ජනයාට පොදු ආගමික සහ සංස්කෘතික වැදගත්කමක් ඇති මහියංගන සමන්දේව පෙරහැර පිළිබඳව කළ අධ්‍යයනය යි. පාරම්පරික සංස්කෘතික ධාරාව තුළින් අභ්‍යන්තර සංහිඳියාව ගොඩනැගීම කළ හැකි ය යන උපන්‍යාසය මත වැදිජන සමාජය සහ සිංහල බෞද්ධ සංස්කෘතික ලක්ෂණ අධ්‍යයනය විය. ජන සංස්කෘතිය තුළ දේව වර්ණනාව විශේෂ තැනක් ගනී. රෝග පීඩාදියෙන් මිදීම, ආරක්ෂාව, ශාන්තිය සහ යහපත් ජීවිතය යන කරුණු සාක්ෂාත් කරගැනීමට කාන්තා දේවත්වයන් මත විශ්වාස තැබීම ජන විඥානයට පොදු ය. ගැටුම් අවම කරමින් සහජීවනය වර්ධනය සඳහා ඓතිහාසික මූලයන් ඉවහල් වී තිබේ ද යන්න මානවවංශ ලේඛන ක්‍රමවේදය (Ethnography) මත අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා (Semi-Structured Interviews) යොදා ගනිමින් දත්ත විශ්ලේෂණය සදහා සහභාගීත්ව නිරීක්ෂණය (Participant Observation) සිදු විය. දේවත්වයට පත් කාන්තාවක් වූ පත්තිනි ගම්මඩු ශාන්තිකර්මය, කිරිඅම්මා දානය ආදි පුදපූජා මඟින් සිහිපත් කරයි. මෙහි දී ගායනා කරන පත්තිනි හෑල්ල තුළ එන 'ග්‍රා හික සුර නර පූජිත නිත්‍යා හිලාෂි ජන පූජා කෘත්‍යං, වාදන ගායන ගීතික ඝෝෂා කීර්තිති අශෙෂා චිරකාලං, ආතුර රක්ෂ තු තෙ ජය මංගල ආයු ශ්‍රීවයා සුබ දාන කෘතං' වැනි  උච්ච ස්වරයෙන් යුතු යාදිනියක්  බිම්තැන්න මහියංගනයට ආවේණික 'කිරි කොරස් පොජ්ජ ඔටා දැමීම' ශාන්ති කර්මය තුළ නිරූපිත ය. දරුවන් වෙනුවෙන් පවත්වන මෙහි දී සමන් දෙවියන්ගේ ඥාතීවරියක, මැණියන්, වැඩි මහල් සහෝදරිය යයි පිළිගනු ලබන මහලොකුවෝ පිදීම සිදුවේ. බෞද්ධ සමාජයට ආවේණික  සත්පත්තිනි කිරිඅම්මා දානය වැදි සමාජයෙන් උරුම වූවකි. ඓතිහාසික මහියංගන සමන්දේවාල පෙරහැරෙහි නිරූපණය වන 'පත්තිනි පෙරහැර' සහ මහලොකුවන්ගේ 'කුණම පෙරහැර' වැඩම කිරීම යන කරුණු මත ප්‍රෞඪ සමාජය තුළ පැවති සමාජ, ආගමික බැඳීම ඉස්මතු වේ. බෞද්ධයින් පත්තිනිදේව වන්දනාවෙන් ලෙඩරෝග දුරුවී ශාන්තිය, ආරක්ෂාව, දිගාසිරි, දරු සම්පත් සහ නිරෝගී යහපත් බව අපේක්ෂා කරයි. ඒහා සමානව ඌව සංස්කෘතික ජන විඥානය තුළත්, වැදි සමාජය තුළත් එම අපේක්ෂාවන් යාදිනියක් වන්නේ මහලොකු අම්මාදේවිය නම් කාන්තා දේවත්වය ප්‍රදාන කොටගෙන ය. මහලොකුවන් සහ පත්තිනි සමන් දේව පෙරහැරේ අනුකණ්ඩයන් වූවත් අවසානයේ වැදි සහ බෞද්ධ අභිචාරවිධීන් එක් කළ කිරිඅම්මා සහ කිරිකොරහා ශාන්තිකර්ම ද්විත්වයන් මඟින් පිං පමුණුවා පෙරහැර චාරිත්‍ර අවසන් වේ.

***ප්‍රමුඛ පදඃ*** *ගැටුම් ප්‍රවණතාව, පත්තිනි, මහලොකුවෝ, සංස්කෘතිය, සමන්දේව පෙරහැර.*

# සමන් දේවාලය ආශ්‍රය කරගනිමින් පවතින අභිචාර හා ආගමික විශ්වාසයන්හි වර්තමාන තත්ත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

ඩබ්ලිව්. එස්. ටී. විතාරම* සහ එච්. ඩී. එල්. රන්දිකා

සමාජවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*sachinithiwanka94@gmail.com

අදෘශ්‍යමාන බලවේගයක් වන දෙවියන් පිළිබඳ විශ්වාසය මානව ඉතිහාසයේ ඈත අවධියක සිට ම පැවත එන්නකි. ලක්දිව ආරක්ෂා කරනු ලබන සතරවරම් දෙවිවරුන් අතර සමන් දෙවියන් පිළිබඳ ව පවතින ළැදියාව හා විශ්වාසය ද එවැන්නෙකි. සමන් දෙවියන් මූලික කරගනිමින් විවිධ වූ ආගමික විශ්වාස හා අභිචාර සමාජය තුළ පවතී. ආගමික විශ්වාසයක් යනු සමාජ ක්‍රියාවන් කෙරෙහි බලපෑම් කරනු ලබන සෑම සමාජයකම දක්නට ලැබෙන විශ්වාස හා භාවිත පිළිබඳ ක්‍රමයකි. අභිචාර යනු අස්වාභාවික බලවේග යම්කිසි ක්‍රමයක් මගින් නතුකර ගැනීමය. හොඳට හෝ නරකට මෙම අභිචාර ක්‍රම යෙදවිය හැකිය. ඒ අනුව මෙම අධ්‍යයනය සිදු කිරීමට පාදක වූ ප්‍රමුඛ අරමුණ වූයේ වර්තමානයේ සමාජ වෙනස්වීමේ ක්‍රියාවලිය තුළ දේවාලය හා ඒ ආශ්‍රිත ව පවතින අභිචාර හා ආගමික විශ්වාස කෙබඳු ද යන්න අධ්‍යයනය යි. මෙම පර්යේෂණය සඳහා අධ්‍යයනය ප්‍රදේශය ලෙස තෝරා ගනු ලැබුවේ රත්නපුර සමන් දේවාල භූමිය යි. අධ්‍යයනය සඳහා මූලික වශයෙන් සාහිත්‍ය විමර්ශනයක් හා ප්‍රශ්නාවලී ක්‍රමය මෙන් ම සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිත කරන ලදි. අහඹු නියැදිය ක්‍රමය ඔස්සේ දත්ත දායකයන් 20 දෙනෙකුගේ දත්ත විශ්ලේෂණය සිදු කළ අතර දේවාල භූමියට පැමිණි බැතිමතුන් 20ක් හා දේවාල භූමියේ වෙළඳුන් 05 දෙනෙකු සහභාගී වූ අතර සමන් දෙවියන් උදෙසා පවත්වන ඇසළ මහ පෙරහැර පැවැත්වීමෙන් කලට වැසි වසින් බවත්, බව-බෝග සාර වන බවත්, මැණික් ඉල්ලම් මතු වන බවත් දත්තදායකයන් සියල්ලන් ම අනුමත කළ කරුණකි. නමුත් පුදබිම තුළ සමන් දෙවියන් උදෙසා පවත්වන පුදපූජා, භාර-හාර ආදිය වාණිජකරණය වී ඇති බව 70% ක මතය විය. 80% ක පිරිසක් දෙවියන් කෙරෙහි දැඩි භක්තියක් හා විශ්වාසයක් පැවති අතර ඔවුන් බහුතරයක් ප්‍රකාශ කරනු ලැබුවේ සමන් දෙවියන් ඇදහීමෙන් ඔවුන්ගේ ගැටලු රාශියකට ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල ලද බව ය. 20% දෙවියන් පිළිබඳ විශ්වාසය මධ්‍යස්ථ ය. එක් පුද්ගලයෙකු පමණක් දේව විශ්වාස ප්‍රතික්ෂේප කරන ලදි. එමෙන් ම අතීතයේ පැවතියා වූ ගොවිතැන් කටයුතුවලට සහාය වන ගවයින්ගේ රෝග සඳහා සිදු වූ ගවරෝග අඳෝනා, ආශිර්වාද පිළිබඳ දැනුවත් බවින් යුතු පිරිස 6% පමණක් විය. ඒ අනුව මෙම පර්යේෂණය තුළින් එළඹිය හැකි නිගමනය වූයේ ආගමික අභිචාර අතීතයේ සිට කාලීන ව යම් යම් වෙනස්වීම්වලට ලක් වූව ද ලක්දිව මිනිසුන් තුළ දෙවියන්ගේ පිහිට සම්බන්ධ දැඩි විශ්වාසයක් පවතින බවත්, නමුත් විවිධ අභිචාරවිධි නූතනය වන විට ගිලිහී ගොස් ඇති බවත් නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** *සමන් දේවාලය, අභිචාර, ආගමික විශ්වාසය, අභිචාර*

# ගැමි සංස්කෘතික ලක්‍ෂණ හා බැඳි තුන්දා ගම්මඩු ශාන්තිකර්මය පිළිබඳ අධ්‍යයනයක් (ශ්‍රී ලංකාවේ පහතරට මොරවක් කෝරළය ඇසුරින්)

එම්. එම්. ආර්. උපාලි

මානව ශාස්ත්‍ර පීඨය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*ruwanthimaduka123@gmail.com*

සිංහල යාග ශාන්තිකර්ම බිහිවූයේ ප්‍රාථමික සමාජයේ පැවති ගැමියන්ගේ සංස්කෘතික ලක්‍ෂණ පාදක කොටගෙන ය. ඒවායින් එදිනෙදා ගැමි ජීවිතය හා තදින් ම බද්ධ වූ ශාන්තිකර්මයක් ලෙස ගම්මඩු ශාන්තිකර්මය දැක්විය හැකි ය. ඒවා අතරින් ද තුන්දා ගම්මඩු ශාන්තිකර්මය පහතරට නර්තන සම්ප්‍රදායේ රුහුණු යන ප්‍රදේශයෙහි මොරවක් කෝරළයට පමණක් ආවේණික වූ සුවිශේෂ ශාන්තිකර්මයකි. සිංහල යාග ශාන්තිකර්ම බිහිවූයේ අතීත සමාජයේ ගැමියන්ගේ සංස්කෘතික ලක්ෂණ පාදක කොටගෙන ය. ගැමි ජීවිත හා තදින් බද්ධ වූ තුන්දා ගම්මඩු ශාන්තිකර්මය දෙවියන් සතුටු කිරීමටත් දෙවියන්ගේ පිහිට ආරක්ෂාව ලබා ගැනීමටත් බෝවන රෝග පාලනය කිරීමේ අරමුණින් මෙම තුන්දා ශාන්තිකර්මය පවත්වනු ලබයි. තුන්දා ගම්මඩුව ශාන්තිකර්මයේ දක්නට ලැබෙන ගැමි සංස්කෘතික ලක්‍ෂණ හඳුනාගැනීම ප්‍රධාන අරමුණ වන අතර දේව වන්දනාව ප්‍රමුඛ කරගත් තුන්දා ගම්මඩුව ශාන්තිකර්මය ගැමි සංස්කෘතික ලක්‍ෂණ විශද කරන්නේ ද? යන්න පිළිබඳ ව සොයා බැලීම පහතරට මොරවක් කෝරළය ඇසුරින් සිදු කරනු ලබයි. දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය යටතේ නිරීක්‍ෂණක්‍රමය, සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස් කරන ලදි. තුන්දා ගම්මඩු ශාන්තිකර්මය තුළින් මානවයා හා ගැමි සංස්කෘතිය අතර ඇති සබඳතාව මැනවින් උපලක්ෂිත වේ. තුන්දා ගම්මඩු ශාන්තිකර්මය තුළ ද ප්‍රාථමික ගැමි සමාජයන්හි පැවති ඇතැම් ඇදහිලි සහ විශ්වාසයන් අන්තර්ගත බව පෙනී යයි. මෙහි දී ප්‍රධාන වශයෙන් පුද ලබනුයේ පත්තිනි දේවතාවිය යි. ගැමි සමාජය තුළ වර්තමානයේ දී ද මතු බුදු වන දේවතාවියක ලෙස පත්තිනි දෙවියන් වන්දනාමාන කිරීම තුළ මෙම ශාන්තිකර්මයට ගැමි ආභාසය සහිත බෞද්ධාගමික මුහුණුවරක් ලබා දී තිබේ. ප්‍රාථමික ඇදහීම් බෞද්ධාගමික ලක්‍ෂණයන් සමඟ පැවති මානව සබඳතාව මෙන් ම ගැමියන්ගේ සෞන්දර්යාත්මක සබඳතාව ද මෙම ශාන්තිකර්මය තුළින් දෘශ්‍යමාන වේ. තුන්දා ගම්මඩුව පැවත්වෙන්නේ විහාරභූමියක නම් ස්වාමීන් වහන්සේ නමක හෝ වෙනත් ස්ථානයක නම් වෙනත් වැඩිහිටි අයෙකු විසින් පැමිණ සිටින සියල්ලන් තුණුරුවන් සරණයැම සඳහා බුදුන් වැඳ දෙවියන්ට පින් දීම සිදු කරයි. සම්ප්‍රදායෙන් පැමිණි විෂ්ණු දෙවියන්ට ද, සුමන සමන් දෙවියන්ට ද, දෙවොල් දෙවි සත් කට්ටුව ද ශාන්තිකර්මයේ දී පුද ලබති. ඕනෑ ම කාර්යයක් කිරීමට පෙර බුදුන් ප්‍රමුඛ සංඝරත්නය වන්දනා කර දෙවියන්ට පින් අනුමෝදන් කිරීම ලාංකේය ගැමි ජන සමාජය දැකිය හැකි ලක්ෂණයකි. මෙම ශාන්තිකර්මය තුළ ද එවැනි ගැමි සංස්කෘතික ලක්‍ෂණ හඳුනාගත හැකි ය. මේ අනුව මඩු යාගයන් තුළ දේව විශ්වාසයන් ප්‍රබලව දැකිය හැකි බව පැහැදිලිය. ථෙරවාදී බෞද්ධ ක්‍රමයට අනුව වෙනත් ඇදහීම මිථ්‍යාදෘෂ්ටික ඇදහීම් ලෙස සැලකීම සිදු වුව ද එවැනි දේ මඩු යාගයෙන් ඉවත් කිරීම වෙනුවට ඊට පූජා අංගයන් බෞද්ධාගමික ලක්ෂණ ගැමි ලක්ෂණ හා මිශ්‍ර ව ඉස්මතු කිරීමට උත්සාහ කර ඇති බව පෙනී යයි.

***ප්‍රමුඛ පදඃ*** *ශාන්තිකර්ම, ගම්මඩු, ගැමි, සංස්කෘතිය, බෞද්ධාගමික*

# ශ්‍රී ලංකාවේ පාරම්පරික තේවා සම්ප්‍රදාය (මැදගොඩ පත්තිනි දේවාලයේ සන්නස් පත්‍රය ඇසුරෙන්)

බොරලංකඩ වංසරතන හිමි

පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

*boralankadawansa@gmail.com*

ලාංකික දේව සංකල්පය භෞතික වස්තූන් කෙරෙහි දේවත්වයක් ආරෝපිත වූ හින්දු දේව සංකල්පය සමග සංකලනය වූ දේව සංකල්පයකි. එහි ආරම්භය ක්‍රි.පූ. 3 සියවසට පෙර කාලපරාසය දක්වා දිව යයි. බෞද්ධ සංකල්පය හා හින්දු දේව සංකල්ප සංකලනය මත ගොඩනැගුණු දේවාල සහ එකී දේවාල සම්බන්ධ තේවාවන් පිළිබඳ ක්‍රමවේදයන්ගේ ඓතිහාසිකත්වය අස්පර්ශීය පුරාවිද්‍යා සාධක තුළින් ඉස්මතු වේ. රාජකීය දේවාලයක රාජකාරි පිළිබඳ ව සහ එම රාජකාරිවල ස්වභාවය පිළිබඳ සඳහන් මැදගොඩ සන්නස වැදගත් ඉපැරණි ලේඛනයකි. ඒ අනුව මෙම අධ්‍යයනයේ දී පර්යේෂණ ගැටලුව ශ්‍රී ලංකාවේ පාරම්පරික තේවා සම්ප්‍රදාය හා බැඳුණු සංස්කෘතික සන්දර්භය හඳුනාගැනීමේ දී මැදගොඩ පත්තිනි දේවාල සන්නස කෙතෙක් දුරට වැදගත්වන්නේද ? එසේම ඒ හා බැඳුණු සංස්කෘතික ගතිකයන් කෙසේද යන්න විමසා බැලීම යි. මෙම ලේඛනය ප්‍රකාර ව සීතාවක රාජසිංහ රජු විසින් මැදගොඩ පත්තිනි දේවාලය ඉදිකොට එහි තේවාවන් සිදු කරන පංගුකාරයින්ට භුක්ති විඳීමට ඉඩ-කඩම් බෙදා දී ඇති අතර එකී භුක්තිකාරයින්ට දේවාලය නඩත්තු කිරීමට සන්නස මගින් ආඥා කොට ඇත. මෙහි තේවාවන් වශයෙන් කපුගේ පංගුව, ලෙවන්ගමගේ පංගුව, හේනේමාමාගේ පංගුව, නක්කාවල මනන්නාගේ පංගුව ආදි තේවාවන් විසි එකක් සඳහන් කොට ඇත. එපමණක් ද නො වේ, එම තේවාවන් පාරම්පරික පංගුකාරයින් විසින් මෑතක් වන තුරු ම නො කඩවා සිදු කොට තිබේ. මැදගොඩ සන්නස ප්‍රකාර ව තේවාවන් පංගුකාරයින් විසි එක් දෙනෙක් අතර බෙදී ගියත් අද වන විට ඉතිරි වී ඇත්තේ ඇතුළු කට්ටලේ ප්‍රධානියා වන කපුරාළගේ පංගුව පමණි. මුරුතැන් බැම හෙවත් දේව පූජාව පැවැත්වීම, යාතිකා කිරිම, පහර දීම යනාදි තේවා රාජකාරි දහයක් කපු පංගුවට අයත් වේ. නමුත් අනෙක් පංගුකාරයින් අද වන විට එකී දේවාලයට අයත් ඉඩ-කඩම්වල දැකගැනීමට නො හැකි ය. බොහෝ දෙනෙකු එම රාජකාරි පැහැර හැර සමාජයේ ඉහළ පැලැන්තියේ රාජකාරීන් බවට පත්වීම හා එම නවීන සමාජය සමග ජීවත්වන්නන් ඒ සමාජයේ විවිධ තරාතිරම්වලට අයත් ජනයා ඇසුරු කිරීමට සිදුවීම ය. එපමණක් ද නො ව එම තනතුරු දෙස හා ඔවුන් දෙස නවීන සමජය පිළිකුලෙන් බැලීම ද එයට හේතු වී ඇත. එම කාර්යයන් භාර ව කටයුතු කළ පරපුර තේවාවන් පැහැර හැර ඇති බැවින් වර්තමානයේ එය සිදු කළ යුත්තේ කුලියක් ගෙවා වෙන අයෙකු මාර්ගයෙනි. දත්ත රැස් කිරීමේ දි ප්‍රාථමික මූලාශ්‍රයක් ලෙස සීතාවක රාජසිංහ රජු විසින් ප්‍රදානය කරන ලද මැදගොඩ සන්නස මගින් දත්ත සමුදායක් ඉස්මතු වේ. එකී මූලාශ්‍ර පරිශීලනය, දේවාල පරිශ්‍රය තුළ ක්ෂේත්‍ර අධ්‍යයන ඇසුරෙන් කේවල අධ්‍යයනය, පාරම්පරික ඇතුළු කට්ටලේ ප්‍රධානියා වන වර්තමාන කපුරාල සමග යෙදුණු සම්මුඛ සාකච්ඡා ක්‍රමවේද යොදා ගැනිණි.

***ප්‍රමුඛ පදඃ*** *තේවා සම්ප්‍රදාය, මැදගොඩ සන්නස, මැදගොඩ දේවාලය, පත්තිනි දේවාලය*

# පොලොන්නරු රාජධානි සමයේ පැවති විෂ්ණු දේව වන්දනය පිළිබඳ කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්

කේ. එම්. ජී. ඒ. මානගේ

පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණි විශ්වවිද්‍යාලය

*geeth.a.manage@gmail.com*

හින්දු ආගමික ත්‍රිමූර්ති සංකල්පය තුළ ප්‍රබල දෙවිකෙනෙකු වන විෂ්ණු දෙවියන් හා සබැඳි ආගමික විශ්වාස හා ඇදහීම් ලක්දිව සංස්කෘතිය තුළට ද මුල් බැස ඇත. ඓතිහාසික මූලාශ්‍රය අනුව, විෂ්ණු දේව වන්දනය සමාජීය වශයෙන් ජනප්‍රිය වන්නේ පොලොන්නරු සමය වන විට ය. මෙවැනි පසුබිමක, පොලොන්නරු සමය තුළ ඉතා සංවිධිත වූ ආගමික විශ්වාසයක් ලෙස විෂ්ණු දේව වන්දනය ගොඩනැගුණු ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙහි අරමුණ විය. පොලොන්නරු සමය වන විට විෂ්ණු දේව වන්දනය ජන සමාජගතව පැවතියේ කෙසේ ද? යන්න පර්යේෂණ ගැටලුව යි. මෙහි දී පුස්තකාල පරිශීලනය, පැරණි පොලොන්නරු නගරයත්, ත්‍රිකුණාමලය වෙල්ගම්වෙහෙරත් ක්ෂේත්‍ර අධ්‍යයනය ලෙස යොදාගැනීම, විෂයය පිළිබඳ ප්‍රාමාණිකයින් ඇසුරෙන් ගුණාත්මක ක්‍රමවේදය ඔස්සේ දත්ත රැස්කිරීම ආදිය තුළින් පොලොන්නරු සමය වන විට විෂ්ණු දේවාල ගොඩනැගීම හා දේව සංකල්පය ප්‍රචලිත වීම සම්බන්ධ ව අධ්‍යයනය කිරීමත්, ඉන් අනතුරු ව මෙම දේව සංකල්පයේ හා වන්දනයේ සමාජීය පිළිබිඹුව අධ්‍යයනය කිරීමත් පියවරගත පර්යේෂණ ක්‍රමවේදය ලෙස දැක්විය හැකිය. පොලොන්නරු යුගය ආරම්භයේ සිට පැවති චෝළ පාලනයත් සමඟ සංවිධිත ලෙස ව්‍යාප්ත වූ 'වෛෂ්ණවම්' නම් හින්දු නිකායික දේවාල කිහිපයක් ම පැරණි පොලොන්නරු නිර්මිත පරිසරය තුළ දැකගත හැකි ය. එසේ ම සමකාලීන මූර්ති, චිත්‍ර වැනි පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මගින් ද විෂ්ණු දේව වන්දනය සම්බන්ධ ව තොරතුරු හමුවේ. මෙහි දී හින්දු ආගමික විෂ්ණු දේව වන්දනය සේ ම බෞද්ධාගමික සංකල්පයන්ට මුසු වූ විශ්වාසයන් කෙබඳු වූයේ ද යන්න හඳුනාගැනීමට මෙම පර්යේෂණයෙන් හැකි විය. එසේම දේශපාලන හා සමාජ ව්‍යුහය තුළ පැවති විෂ්ණු වන්දනාවෙහි භාවිතය ස්වරූප දෙකකින් හඳුනාගැනීමට හැකි විය. චෝළ පාලනය පැවති සමයේ දී බුදුරජාණන් වහන්සේ යනු විෂ්ණු දෙවියන්ගේ අවතාරයක් (ආත්මයක්) ලෙස සලකා ක්‍රියා කිරීම ද, සිංහල පාලකයන් විසින් විෂ්ණු දෙවියන් යනු බුදුරජාණන් වහන්සේ සරණ ගිය සම්‍යග්දෘෂ්ටික දෙවියකු ලෙස සැලකීම ද ප්‍රධාන වේ. එහි දී වංශකතා සාහිත්‍යයට අනුව මහා පරාක්‍රමබාහු ආදි සිංහල රජවරුන් හින්දු දේවාල සඳහා අනුග්‍රහ දක්වා ඇත. එසේ ම පොලොන්නරු සමයට අයත් යැයි කාලනීර්ණය කර ඇති මහියංගනය ධාතුගර්භ සිතුවම් හා ගල්විහාරයේ විද්‍යාධාර ගුහාවේ දේවතා රූප තුළින් බෞද්ධාගමික මුහුණුවරක් ගත් විෂ්ණු දෙවියන්ගේ නිරූපණයක් හඳුනා ගැනීමට හැකි විය. චෝළයින් ද සැමවිට ම බෞද්ධ විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කර නැති බව ද පෙනේ. ත්‍රිකුණාමලය වෙල්ගම්වෙහෙර, චෝළයන් විසින් උක්ත දැක්වූ පරිදි බුදුන්වහන්සේ වනාහි විෂ්ණුගේ අවතාරයක් යැයි සලකා වන්දනාව සඳහා භාවිත කර ඇත. මෙහි දී 'රාජරාජපෙරුම් පල්ලි' යන ව්‍යවහාරය වෙල්ගම්වෙහෙර හා සම්බන්ධ වන්නේ ද එහි ප්‍රතිඵලයක් ලෙසින් බව හඳුනාගත හැකි විය. විමර්ශනය කරන ලද කරුණුවලට අනුව හින්දු දේව වන්දනයක් ව පැවතුණු විෂ්ණු දෙවියන් ඇදහීම සම්බන්ධ සංකල්පය, සාම්ප්‍රදායික හින්දු මුහුණුවරින් පමණක් ම නොව, බෞද්ධාගමික නැඹුරුවකින් ද සමන්විත ව පොලොන්නරු යුගයේ දී ජන සමාජයේ ව්‍යාප්ත ව පවතින්නට ඇති බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය, පොලොන්නරුව, විෂ්ණු දෙවියන්, හින්දු දේව වන්දනය*

## පානම ප්‍රදේශයට ආවේණික අභිචාර විධි හා ඒවායේ වර්තමාන තත්ත්වය පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක් (අම්පිටිය දේවාලයේ අංකෙළිය ඇසුරින්)

ඒ. ජී. එම්. පබසරා*, ආර්. ඒ. එස්. එම්. රූපසිංහ, ජී. ජී. යූ. ජීවන්ත සහ එස්. සමරසේකර

මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*pabasaramalithi8@gmail.com.

නැගෙනහිර, අම්පාර දිස්ත්‍රික්කයෙහි පානමපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි පානම ගම්මානය ඉතා සුවිශේෂී වැදගත්කමක් පෙන්නුම් කෙරේ. මෙම ගම්මානය සිංහල දෙමළ සම්මිශ්‍රණයක් සහිත සංස්කෘතික විවිධත්වයකට උරුමකම් කියයි. මොවුන්ගේ ජන ජීවිතයේ සෑම අංශයක් ම අභිචාර සමඟ බැඳී පවතී. අම්පිටිය දේවාලයෙහි පවත්වන අංකෙළිය ක්‍රීඩාව ආගමික විශ්වාස මෙන්ම අභිචාර විධිවලින් සමන්විත ය. පානම ප්‍රදේශයේ පවත්වන අංකෙළිය ජන ක්‍රීඩාවෙහි වර්තමාන තත්ත්වය හා එහි අන්තර්ගත අභිචාර අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙම අධ්‍යයනයේ ගැටලුව ලෙස අපට හඳුනාගත හැකි වූයේ කාලාන්තයක් තිස්සේ මෙහි පැවති අභිචාර විධි අතීතයේ පැවති ආකාරයට ම වර්තමානය වන විට පවතිනවා ද වෙනස් වී ඇති ඇත් ද යන්න අධ්‍යයනය කිරීම යි. මෙහි දී පානම ප්‍රදේශයේ කරන ලද ක්ෂේත්‍ර අධ්‍යයනයක් මඟින් අහඹු නියැදියක් ඇසුරින් තෝරාගත් පවුල් 15කින් සම්මුඛ සාකච්ඡා උපලේඛනයක් ඇසුරින් ලබාගත් දත්ත හා ලිඛිත මූලාශ්‍ර මඟින් ලබාගත් දත්ත ඇසුරින් මෙම අධ්‍යයනය සිදු කරන ලදි. පානම ජන සංස්කෘතිය හා අත්‍යන්තයෙන් බැඳී ඇති ප්‍රධානතම පුදබිම අම්පිටිය දේවාලය යි. මෙහි දී යල කන්නයේ අස්වනු නෙළා ගැනීමෙන් පසු ව අම්පිටිය දේවාලයේ වාර්ෂික මංගල්‍යය ආරම්භ වේ. මෙම මංගල්‍යය පුරා දින පහළොවක් පුරා පැවැත්වෙන අතර එම සෑම දිනයක දී ම අංකෙළිය පැවැත්වේ. මෙහි දී ගමේ පිරිස් පිල් දෙකකට බෙදී අංකෙළිය රාත්‍රී කාලයේ දී සිදු කෙරේ. මෙහි උඩුපිල අලුත් බණ්ඩාර දෙවියන් නියෝජනය කරන අතර යටි පිල පත්තිනි දෙවියන් නියෝජනය කෙරේ. මෙහි දී අංකෙළිය සඳහා කාන්තාවන් සහභාගී නො වන අතර මෙම මංගල්‍යය පවත්වන කාලය තුළ ගමෙහි කිලි සහිත කාන්තාවන් ගමෙන් බැහැරට යා යුතු ය. අංකෙළිය ආශ්‍රිත ව අභිචාරාත්මක ක්‍රියාවන් රැසක් සිදු වේ. ඒ අතර පුරුෂ පාර්ශ්වය හිසතෙල් නො ගෑම, කහ, බටු, අඹ ආහාරයට නො ගැනීම හා නැවුම් මැටි භාජන පරිහරණය කිරීම දැක්විය හැකි ය. මීට අමතර ව ගැමියන් හාල් පිටි කෙටීම නො කිරීම, විවාහ සිදු නො කිරීම හා මාංශ ගම තුළට නො ගැනීම සිදු කරයි. මෙම අධ්‍යයනයෙන් ගම්‍ය වනුයේ මෙම අංකෙළිය සඳහා වැඩිහිටියන් වැඩිපුර නැඹුරු වන අතර ඔවුන් එය මහත් භක්තියකින් සිදු කරන බවයි. නමුත් වර්තමාන පරපුර මෙම ජන ක්‍රීඩාව සඳහා වැඩි නැඹුරුවක් නො දක්වන අතර නවීකරණය හා නාගරීකරණය හේතුකොට ගෙන සාම්ප්‍රදායික අංකෙළිය ආශ්‍රිත අභිචාරාත්මක ක්‍රියාවන් වෙනස් වී ඇති අතර ම එම අභිචාරායන් නිසි පරිදි ක්‍රියාත්මක නො කරන බව ද දක්නට ලැබේ.

***ප්‍රමුඛ පද:*** *අංකෙළිය, අභිචාර, අම්පිටිය දේවාලය, උඩුපිල, යටිපිල*

# පහතරට අත්බලි ශාන්තිකර්මය හා ගැමි සමාජය

කේ. කේ. පී. එම්. ජයතිලක

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*madarajayathilake@gmail.com*

මෙරට ජනයා විවිධ ඇදහිලි හා විශ්වාසයන් පෙරදැරි ව ජීවත් වූ බව ප්‍රාග් බෞද්ධ ඉතිහාසය පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වන්නකි. තමන් මුහුණ දෙන විවිධ රෝගාබාධ දුක් කම්කටොලු ආදිය කිසියම් අදෘශ්‍යමාන බලපෑමක් මත සිදුවෙතැයි යන්න ඔවුන් තදබල ලෙස විශ්වාස කිරීමට පුරුදු වී සිටියහ. මේ නිසා ස්වභාවික වස්තූන් මෙන් ම මළවුන් පිදීම තුළින් යම් සහනයක් ඔවුන් අපේක්ෂා කළහ. ඒ අනුව නව ග්‍රහයන්ගෙන් සිදු වන අපල උපද්‍රව දුරුකරලීම සඳහා පවත්වන ශාන්තිකර්ම 'බලි තොවිල්' ලෙසත් හඳුන්වන ලදි. ශ්‍රී ලංකාවේ පවත්වන බලියාග ශාන්තිකර්මයේ සම්ප්‍රදායන් කීපයක් පවතී. එම සම්ප්‍රදායයන් ප්‍රදේශ අනුව වෙනස් වේ. බලියාග පැවැත්වීමේ මූලික අරමුණ වනුයේ ග්‍රහ අපල සහ ඇස්වහ කටවහ දෝෂවලින් ආතුරයාට සිදුවන විපත් ආදිය දුරුකරලීම යි. මහා බලියාගයේ ප්‍රභේදයක් වන අත්බලිය වර්තමානයේ දී වෙනම, වෙන් වූ ශාන්තිකර්මයක් බවට දකුණු පළාතේ බොහෝ ප්‍රදේශවල භාවිත ආකාරයක් දක්නට ඇත.අත්බලි ශාන්තිකර්මය පහතරට ප්‍රදේශයේ දී වුව ද ක්‍රියාත්මක වීමේ දී විවිධ සම්ප්‍රදායන්ට අනුව ක්‍රියාත්මක වන ආකාරයක් දක්නට ඇත. මෙහි දී අත්බලි ශාන්තිකර්මය පිළිබඳ වර්තමාන ගැමි සමාජයේ පවතින විශ්වාසයක් පවතින්නේ ද? යන පර්යේෂණ ගැටලුව ප්‍රධාන කර ගනිමින් ප්‍රභවය හා ක්‍රියාකාරීත්වය විමසා බැලීම, විවිධ ප්‍රභේදයන් හඳුනාගැනීම හා අත්බලි ශාන්තිකර්මය පිළිබඳ ව පහතරට සමාජය තුළ පවතින විශ්වාස හා ආකල්ප අනාවරණය කර ගැනීම මෙහි අරමුණ වේ. මෙහි දී අධ්‍යයන ක්‍රමවේදය ලෙස සාහිත්‍ය විමර්ශන, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ යන ක්‍රමවේද භාවිත කරන ලදි. අත්බලි ශාන්තිකර්මය සම්පූර්ණයෙන් ම පාහේ බෞද්ධ ආගමික පදනමක් යටතේ සිදු කරනු ලබන ශාන්තිකර්මයකි. මෙම ශාන්තිකර්මයේ ආරම්භයේ සිට අවසානය දක්වා ම බුද්ධාභිවන්දනයට වැඩි ඉඩ ප්‍රස්තාව ලබා දී තිබේ. අත්බලිය පේ කිරීමේ දී විශේෂ කවි ගායනය කෙරේ. වර්තමානයේ දී අත්බලියේ විවිධතා රාශියක් හඳුනාගන්නට පිළිවන. ග්‍රහදොස් සමනය කිරීම සඳහා පහතරට ප්‍රදේශවල අත්තගහ මැතිරීම නම් ශාන්තිකර්මයක් සිදු කෙරේ. මෙය අත්බලිය සහිත ව සුළුවෙන් පවත්වන්නකි. 'අඹ අත්තේ මැතිරීම' ලෙස ද ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව මෙය හඳුන්වනු ලැබේ. අත්බලි ශාන්තිකර්මය හැඳින්වීමට යොදා ගන්නා නාමයන් පවා විවිධත්වයකින් යුක්ත ය. එසේ ම ශාන්තිකර්මයට සම්බන්ධ බෙන්තර ගුරුකුලය, මාතර ගුරුකුලය ආදි වශයෙන් ප්‍රධාන ගුරුකුල කීපයක් දක්නට ලැබේ. තමන්ට රෝගාබාධ, අපල උපද්‍රව ආදි යමක් තිබුණ ද, නො තිබුණ ද චාරිත්‍රයක් වශයෙන් වාර්ෂික ව ගැමියන් විසින් සිදුකරනු ලැබන අතර නාගරික ජනයාට වඩා ග්‍රාමීය ජනයා සිරිත් විරිත්වලට මුල්තැන දෙමින් අතීතයේ සිට පැවත එන චාරිත්‍ර චාරිත්‍රවලට ගරු කරමින් සිදුකරනු ලැබේ. මහබලි ශාන්තිකර්මයක් සිදු කිරීමේ දී විශාල මුදලක් වැය වන නමුදු අත්බලි ශාන්තිකර්මය සමාජයේ කුමන තරාතිරමක පුද්ගලයෙකුට වුව ද සිදු කළ හැකි වීම ජනතාව අතර අත්බලිය ජනප්‍රිය වීමට ප්‍රධාන හේතුවක් වී තිබේ. එමෙන් ම මේ පිළිබඳ වර්තමාන ගැමි සමාජය තුළ ද පවතිනුයේ විශ්වාසය මුසු වූ භක්තියකි. පහතරට ජන සමාජය අතීතයේ සිට ම වැළඳගත්, භාවිතයට ගැනුණු හා විශ්වාසය මත පදනම් වූ ශාන්තිකර්මයක් ලෙස අත්බලි ශාන්තිකර්මය හඳුන්වාදිය හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** *ගැමි සමාජය, විශ්වාස, පහතරට, සම්ප්‍රදායන්, බලි ශාන්තිකර්ම*

# රීරි යක්ෂ බන්ධනයෙහි හා රුවන් සන්නි බන්ධනයෙහි අන්තර්ගත බෞද්ධ-හින්දු සංස්කෘතික ලක්ෂණ පිළිබඳ විමසීමක්

එස්. පී. ඩබ්ලිව්. රණවක

සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය

*sunimaliranawaka95@gmail.com*

රීරි යක්ෂ බන්ධනය රීරි යක්ෂ දෝෂයෙන් ද, රුවන් සන්නි බන්ධනය සන්නි යක්ෂ දෝෂයෙන් ද මනුෂ්‍යයන්ට ඇති වෙතැයි කියනු ලබන රෝග නිවාරණය උදෙසා මතුරන මන්ත්‍ර විශේෂ දෙකකි. මෙම මන්ත්‍ර සංස්කෘත, පාලි, තෙළිඟු හා දෙමළ මිශ්‍ර සිංහල භාෂාවෙන් රචනා වී ඇත. රීරි යක්ෂ බන්ධනයේ දී පළමු ව යක්ෂ උත්පත්තියත් නරලොවට වඩින්නට වරම් ලැබූ ආකාරයත් දක්වා අනතුරු ව දෝෂය දුරු කළ හැකි ආකාරය දක්වන අතර අවසාන වශයෙන් රීරි යකුන් පළවා හැරෙන පාඨය අන්තර්ගත වෙයි. රුවන් සන්නි බන්ධනයේ අන්තර්ගතය මුළු සන්නි දේවතාවාගේ උපත, බන්ධන පටි, සන්නි දහ අටේ සාරාංශය සහ විෂ්ණු වරමින් සෙත්පැතීම යනාදියෙන් සමන්විත ය. මෙම පර්යේෂණය සඳහා පාදක වූ ගැටලුව වන්නේ උක්ත යක්ෂ බන්ධන ද්විත්වයෙහි අන්තර්ගත බෞද්ධ සහ හින්දු සංස්කෘතික ලක්ෂණ කවරාකාර වන්නේද යන්න යි. තව ද ඒවායෙහි අර්ථමය පක්ෂය ආගමික සංස්කෘති නියෝජනය කරන්නේ කෙසේ ද යන්න විමසීම මෙහි අරමුණ යි. සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතයෙන් මන්ත්‍රාචාර්යවරයෙකුගෙන් ලබා ගත් දත්ත සංස්කෘතික භාෂාවේදය පදනම් කොටගත් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණය කිරීමෙන් මෙම පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කරනු ලැබේ. උක්ත මන්ත්‍රද්වයෙහි ම ආරම්භක පාඨවල දැක්වෙන්නේ ඉන්දීය සම්භවයක් සහිත පුරාවෘත්ත දෙකකි. රීරි යක්ෂ බන්ධනය ''...හනුමන්තා දේශේ හනුමන්තා කෝවිලේ වැඩ වාසස්ථානය කරන ගිනිමරුලු යක්ෂණීගේ...'' ආදි ලෙස ආරම්භ වෙයි. රීරි යක්ෂයාත් යක්ෂණියත් දෙදෙනා දේව සමාගමට වඩින දෙවි පිරිසකගෙන් නරලොවට වඩින්නට වරම් ඉල්ලූ කල්හි දෙවි පිරිස ඔවුනට තුන් යාමයෙන් විනාඩි තුනකට වරම් දුන් බව පැවසේ. මේ දෙවි පිරිස සමනල සමන් දෙවියන්, ඊශ්වර දෙවියන් සහ මහා විෂ්ණු දෙවියන් ප්‍රමුඛ දේව මණ්ඩලයකි. මොවුන් පිළිවෙළින් සිංහල-බෞද්ධ, හින්දු සහ මේ ආගම් දෙකට ම අයත් දෙවිවරුන් පිරිසක් බව සැලකිය යුතු ය. මේ අනුව උක්ත මන්ත්‍රවල දේව සංකල්ප භාවිතය බෞද්ධ-හින්දු මිශ්‍ර ලක්ෂණ පෙන්නුම් කරන බවක් පෙනේ. තව ද ඒවායෙහි දෙවියන්, යක්ෂයන් සේ ම ඍෂිවරුන් වැනි අතිමානුෂික පුද්ගලයන් පිළිබඳ ව ද සඳහන් වෙයි. රීරි යක්ෂ බන්ධනයේ සුරඟපත්ම නම් ඍෂිවරයා ගැනත් රුවන් සන්නි බන්ධනයේ කපිල, එළවාඩු සහ ප්‍රමේහ නම් ඍෂිවරුන් ගැනත් සඳහන් වන්නේ යක්ෂයන් හා සටන් කිරීමට සමත් බලයක් සහිතවුන් ලෙසිනි. යක්ෂයන් සහ දෙවියන් අතර සම්බන්ධයට මැදිහත්කරුවන් වන්නේ ඍෂිවරුන් බව මේවායින් එළිගැන්වේ. රීරි යක්ෂ බන්ධනයේදී ඊශ්වර බන්ධන මන්ත්‍රයක් ලෙස ''ඕං රීං මරු රීරි කට්ටු පූට්ටු බන්ධ බන්ධ ඊස්වා හඃ'' යන්නත් අවසානයේ ''තුප්සේ තන්නීරාල් ඔඩු ඒලේන්දී'' යන්නත් සිංහල වැකි අතරට ම එක් කොට ඇත. යථෝක්ත ඉන්දීය භාෂාවල සංකලනයෙන් මන්ත්‍ර රචනා කර තිබීමෙන් ම ප්‍රකට වන්නේ ඒවාට බලපා ඇති ඉන්දීය ආභාසය යි. බෞද්ධ සංස්කෘතිය නාම මාත්‍රික වැදගත්කමක් සහිත ව දක්වා ඇතත් වැඩි වැදගත්කමක් හා භාවිතයක් දක්වන්නේ හින්දු සංස්කෘතියට බව මෙම මන්ත්‍රවල අන්තර්ගතය පිරික්සීමේ දී පසක් වෙයි.

***ප්‍රමුඛ පදඃ*** *භාෂා භාවිතය, රීරි යක්ෂ බන්ධනය, රුවන් සන්නි බන්ධනය, සංස්කෘතිය*

# සියනෑ හේවාගම් දෙකෝරළයට අධිපති වූ රංවල දෙවියන් පිළිබඳ අධ්‍යයනයක්

අයි. ඩී. ආර්. එල්. ජයන්ත

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*ravindulakshan1212@gmail.com*

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික අවධියේ සිටම ඇදහීම් විශ්වාස පැවති බවට සාක්ෂි හමුවේ. දේව වන්දනය පිළිබඳ ව පැහැදිලි සාක්ෂි මතු කෙරෙන්නේ අනුරාධපුර මුල් අවධියේ සිට ම ය. දේව සංකල්පයන් ජීවිතය හා සබැඳි විවිධාකාර ගැටලු නිරාකරණය කරගැනීම පාදක කොට ගෙන නිර්මාණය වී තිබේ. රංවල දෙවියන් පිළිබඳ ගැමියන් තුළ විශ්වාසය ඇති වුයේ ද ඒ අයුරිනි. රංවල දෙවියන් යනු සියනෑ හේවාගම් දෙකෝරළය තුළ දේවත්වයට පත් සාමාන්‍ය වැසියෙකි. ඔහු පිළිබඳ ජනප්‍රවාද කතා ගණනාවක් පවතී. රංවල දේව ඇදහීම කැලණි ගං මිටියාවතේ ගම්පහ දිස්ත්‍රික්කයට අයත් සියනෑ කෝරළේ ප්‍රදේශ කිහිපයකටත්, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයට අයත් ප්‍රදේශ කිහිපයකටත් සීමා වූ දෙයකි. බුදුරජාණන් වහන්සේ මූලිකත්වයෙහි ලා පවත්වාගෙන ගිය අතිරේක ඇදහිලි සියල්ල සම්බන්ධ කර ගැනීමෙන් ගැමියෝ බුදු සමය පුළුල් කර ගත්හ. එම ඇදහීම් රටාව අනුව බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ ව සිටි සේක. ඊට අප්‍රධාන ව සතරවරම් දෙවිවරු ද විෂ්ණු, සමන්, කතරගම, නාථ දෙවිවරු ද සිටියහ. එසේම ඒ ඒ ප්‍රදේශ භාර ව නැතිනම් ප්‍රාදේශීය දෙවිවරු ද සිටියහ. ඒ අතර රංවල දෙවියන් ද කෙනෙකි. පර්යේෂණය සඳහා පාදක කරගනු ලබන්නේ රංවල සහ කිරිදිවැල ආශ්‍රිත භූමි ප්‍රදේශය වන අතර ගැමියන් හා රංවල දේව සංකල්පය කොතරම් දුරට ජනජීවිතය හා බද්ධ වී පැවතියේ ද? යන්න පර්යේෂණ ගැටලුව යි. ගැමියන් තුළ පවතින ඇදහීම් විශ්වාස හා ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණ යි. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනය, ක්ෂේත්‍ර අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා මඟින් තොරතුරු ලබාගැනීම සිදු කරන ලදි. රංවල දෙවියන්ගේ ප්‍රභවය පිළිබඳ විවිධ මත පවතී. උප්පත්ති කතාව විවිධාකාරයෙන් ගැමියෝ දක්වති. රංවල දෙවියන්ගේ උපත පිළිබඳ ව සිංහල දේව පුරාණයේ සඳහන් වේ. බුදුන් ප්‍රමුඛත්වයෙහි ලා ගම්භාර දෙවියන්ට හා රංවල දෙවියන්ට ගොටු දෙකක් මල් පැළ දෙපැත්තේ සදා මල් පැළෙහි සතරවරම් දෙවියන් වෙනුවෙන් පහන් දල්වා වන්දනාමාන කරනු ලබයි. රංවල දෙවියන් වෙනුවෙන් තැනූ ප්‍රතිමා හෝ ජල මූලාශ්‍රයක් ආසන්නයේ පුහුල් පහන් සදා භාරයන් ඔප්පු කිරීම සිදු කරයි. පුරුෂ පාර්ශ්වය මූලිකත්වය ගෙන සිදු කරන මෙම වන්දනයේ දී රංවල දෙවියන්ට භාරවීම, රංවල දේව දානය, රංවල දෙවියන් හා බැඳුණු ජනප්‍රවාද, ජන ගී හා ගාථා යන කාරණාවන් ග්‍රාමීය ජනයා තුළ හොඳින් මුල් බැස ගෙන තිබෙන කාරණා වේ.

***ප්‍රමුඛ පදඃ*** *දේව වන්දනය, රංවල දෙවියන්, ප්‍රභවය, වන්දනාමාන ක්‍රම, ජනශ්‍රැතිය*

# උඩරට ''කලඑළි මංගල්‍යය'' හා බැඳි ගැමි විශ්වාස

කේ. ඒ. එස්. ප්‍රසාදිකා සහ පී. පී. මධුභාෂණී

භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*Kasachiniprasadika3@gmail.com*

ලාංකේය සංස්කෘතික අනන්‍යතාව විද්‍යමාන කෙරෙන එක් පැතිකඩකි දේශීය නර්තන කලාව. ඒ අතුරින් උඩරට නර්තනයට ප්‍රමුඛස්ථානයක් හිමිවන අතර ආධුනික නර්තන ශිල්පියා ශිල්පීය මට්ටමට පැමිණෙන සුවිශේෂි අවස්ථාව කලඑළි මංගල්‍යය ලෙස හැඳින්විය. ලාංකේය සමාජය තුළ කලඑළි මංගල්‍යය හා බැඳි චාරිත්‍ර වාරිත්‍රයන් සියල්ලක් ම ජන විශ්වාස හා බැඳී පවති. ඒ අනුව කලඑළි මංගල්‍යය තුළ ඇති ජන විශ්වාස හා ඒ හා බැඳි චාරිත්‍රයන් කවරේ ද යන්න හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ යි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ බස්නාහිර හා සබරගමු පළාත් අධ්‍යයන ප්‍රදේශ ලෙස යොදා ගනිමින් කලඑළි මංගල්‍යයන් නිරීක්ෂණය කිරීම මඟින් මෙම පර්යේෂණය  සිදු කර ඇත. ප්‍රවීණ ඇදුරන් කලඑළි බැසීමට ලක් වූ ශිල්පීන් හා කලඑළි මංගල්‍යය නැරඹීමට පැමිණ සිටි ප්‍රේක්ෂක ජනයා සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සහ පුස්තකාල අධ්‍යයනය යටතේ ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය කිරීමෙන් මෙම පර්යේෂණය සිදු කෙරුණි. මෙම චාරිත්‍ර-වාරිත්‍ර සියල්ල බුදුන් ප්‍රමුඛ දෙවියන් මුල් කොටගෙන ගොඩ නැඟී ඇත. මෙහි දී කිලිවලින් ආරක්ෂා වීම, ආභරණ පේ කිරීම, වතුර කොරහින් මුහුණ බැලීම, කිරි එළදෙනෙකු දැකීම, කිරි ගසට කොටා කිරි දෙස බැලීම, ආදි වූ චාරිත්‍ර රැසක් දැකිය හැකි ය. මෙහි කිරි ගසකින් කිරි දැකීම, කිරි එළදෙනෙකු දැකීම සුබ පරමාර්ථය මත ගොඩ නැගුණු චාරිත්‍රයකි. හිස වෙස් බැඳි ආධුනික ශිල්පියාගේ අත දරන පැන්කළයෙන් ජලය හිස මත තබන ලද කෙසෙල් කොළට දැමීම මඟින් දෝෂ දුරු වේ යැයි යන විශ්වාසය ගැමි සමාජය මත ප්‍රචලිත ව පවතින්නකි. නර්තනය ඉදිරිපත් කළ හිස වෙස් බැඳි ශිල්පීන් හට අවසානයේ දෙහි කැපීම, ගරා නැටීම ආදි චාරිත්‍ර සියලු දෝෂාන්ධකාර දුරු වේ යැයි යන විශ්වාසය මත සිදු වේ. මෙම චාරිත්‍ර අද වන විට ද සිදු කරන අතර මේ අනුව පැහැදිලි වන්නේ උඩරට නර්තන සම්ප්‍රදාය හා බැඳි කලඑළි මංගල්‍යයෙහි චාරිත්‍ර වාරිත්‍ර ගැමි සමාජය තුළ පවතින ජන විශ්වාස, කෘෂිකර්මාන්තය, දේව ඇදහිලි ආදි වූ සංස්කෘතිකාංග මත ගොඩනැගී ඇති බව යි. සමස්තයක් ලෙස කලඑළි මංගල්‍යය ගැමි සමාජයට අනුකූල ව, ගැමි විශ්වාස පදනම් කොටගෙන නිර්මාණය වූ සංස්කෘතික මංගල්‍යයක් බව මෙම පර්යේෂණය තුළින් අනාවරණය වේ.

***ප්‍රමුඛ පදඃ*** *චාරිත්‍ර, කිලිදෝෂ, පේ කිරීම, කලඑළි මංගල්‍යය, උඩරට*

# ජන සංස්කෘතියේ අභිචාර විධි තුළින් ප්‍රතීයමාන වන "වින කැපිල්ල" පිළිබඳ ව වන විමර්ශනාත්මක අධ්‍යයනයක්

එල්. එච්. එන්. එම්. කේ මැණිකේ

සමාජීය විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය

*lhmadhushani0096@gmail.com*

උපතේ සිට සෑම මනුෂ්‍යයෙකු ම තම සමාජ සංස්කෘතීන්ට අනුව හැඩගැසීමේ දී මුතුන් මිත්තන් මෙන් ම සිය අභිමතාර්ථ සාධනයෙහි ලා නො පෙනෙන බලවේගයන්හි පිහිට පැතීම ප්‍රාථමික සමාජයේ මෙන් ම නූතන දියුණු යැයි සම්මත සමාජය තුළින් ද සුලබ ව හඳුනාගත හැකි ය. එම අභිචාරයන්හි කළු අභිචාරයන් අතර එන හදිහූනියම් කෙරෙහි මිනිසුන් තුළ අනියත බිය සහ සැකය මුසු වූ හැඟීම් මිශ්‍ර වුව ද ඒ කෙරෙහි යොමු වීමේ ප්‍රවණතාව ඉහළ මට්ටමක පවතී. හදිහූනියම් තුළින් ඇති වන පීඩාකාරී යැයි සැලකෙන තත්වයන්ගෙන් මිදීමට ඔවුන් සහනයක් ලෙස යොදාගෙන ඇත්තේ වින කැපිල්ල යි. ඒ තුළින් පිළිබිඹු වන කායික, මානසික සහ භෞතික සහනය සැබෑවක් ද යන්න විමසීම මෙහි මූලික අරමුණ වේ. මෙම පර්යේෂණය ක්ෂේත්‍ර සහ ක්ෂේත්‍ර නො වන අධ්‍යයන ක්‍රමවේද යටතේ සහ පුරාණ සූනියම් දේවාලයක සිදුවීම්වල ප්‍රතිඵල ආශ්‍රයෙන් අධ්‍යයනය සිදු කර ඇත. පොදු අරමුණු සහිත ව ගොඩනැගුණු සෑම සමාජයක ම පුද්ගල දියුණුව ඉවසාගත නො හැකි ව සිදු කරන හදිහූනියම්, අන-වින, කොඩි-වින පිළිබඳ ව පවතින විශ්වාසය අද-ඊයේ සිට පවතින්නක් නො වේ. මෙම යන්ත්‍රමන්ත්‍ර ගුරුකමට යටත් ව සිදු කරන ඉනාවින හදිහූනියම් බුදුන් දවස පටන් පැවති බවට ඓතිහාසික සාධක සාක්ෂි සපයයි. රෝගාබාධ, ආදායම් පාඩු, වගාහානි, ව්‍යාපාර බංකොලොත්භාවය, පවුල් ආරවුල් ආදි දහසක් විනාශකාරී අරමුණු ඇති ව දැඩිමුණ්ඩ, ඔඩ්ඩිෂ, සූනියම් දෙවියන් මුල් කරගනිමින් සිදු කරන අඳුරු බලවේගයන්ගේ බන්ධනයන් එනම් සොහොන් අළු මිහිදන් කිරීම්, පිල්ලි යැවීම්, වැල් පැන්නුම්, ඉරි පැන්නුම්, කටු ගැසීම් යනාදිය හේතුවෙන් ඇති වූවා යැයි සැලකෙන මානසික බිඳවැටීම්, රෝගාබාධ යන තත්වයන්ගෙන් මිදෙනුවස් උන්වහන්සේලාගේ ආශිර්වාදයෙන් ම සිදු වන වින කැපිල්ලට යොමු වූවන් දහස් ගණනකි. ගැඹුරින් විහිදී ගිය අදෘශ්‍යමාන බලවේගයන්ගේ බලපෑම් යටපත් කිරීමට පුහුල් කැපීම්, අහු ජීවම් කිරීම්, නියඟලා වැල් ජීවම් කිරීම් යනාදී වශයෙන් වින කැපීමේ ක්‍රමවේදයන්ගෙන් පුද්ගල සහ දේපළ සම්බන්ධයෙන් යහපත් ප්‍රතිඵල ලබාගත් ආතුරයන්ගේ සංඛ්‍යාවද සුළුපටු නොවේ. විද්‍යාත්මක කරුණු මත ඇතැම් අවස්ථාවල දී මෙකී තර්කය පසුබෑමට ලක්වුව ද මනෝවිද්‍යාත්මක විශ්ලේෂණයන් තුළ මෙහි සත්‍යතාව පවතින බවටත් විටෙක එය අවිඥානික මනස තුළ තැන්පත් ව ඇති මුතුන් මිත්තන්ගෙන් පැවත එන අවරෝධනයකට ලක්වූ චිත්තධාරාවන් බව හැඟුණ ද එහි පවත්නා සමාජ වැදගත්කම සහ කායික, මානසික මෙන් ම භෞතික සුවය සැබෑවක් වශයෙන් අගය කළ යුතු ය.

***ප්‍රමුඛ පදඃ*** *කළු අභිචාර, කායික මානසික භෞතික සුවය, හදි-හූනියම්, වින කැපීම,*

# Multi-Religious Phenomena and the Religious Harmony in Folk Religion: A Study Based on the Folk Belief of the *Gale Baṇḍāra* Deity

K. M. D. L. Kariyapperuma

Department of Sinhala, University of Peradeniya

*dinushalakmalkar@gmail.com*

Among the Sri Lankan Sinhalese religious folk beliefs, local deities have a significant place. Most of those folk beliefs are coming from generation to generation and they are strongly linked with the rituals of the traditional Sinhalese society. Some legends are even connected with the history. In some particular contexts, it can be identified that some folk religious beliefs are operated as multi-religious forms. The research problem of this study was how does religious harmony reflects through the multi-religious faiths among the Sinhalese religious folk beliefs. The belief of the *Gale Baṇḍāra* can be considered as such context. The main purpose of this research was to investigate the multi-religious context of the *Gale Baṇḍāra* belief and to introduce it as a way of making the religious harmony. Data were collected through interviews based on the *Gale Baṇḍāra Devalaya* in Kurunegala and also through literary sources. The *Sathkoralaya* which belongs to the Kurunegala district in Sri Lanka is the realm of this deity. In accordance with the legends and historical sources the story of this deity dates back to the reign of the king *Parakramabahu II* (13 BC). At present this deity is known as the *Gale Baṇḍāra*, was the prince *Waṭhimi Baṇḍāra* that was killed by being pushed down from the mountain of *Athugala*. According to folklore, although he was the heir to the throne, he was assassinated because his mother was of Muslim decent and he too followed her intentions to seize state power. He became a deity after the death to avenge for his injustice. However, he was famous as a Sinhalese Buddhist deity among the Sinhalese folk beliefs and especially Muslims also started to worship *Gale Baṇḍāra* as a belief of *Sufi* related to the Islam. Even today both ethnic-religious groups worship *Gale Baṇḍāra* and they use to go to the shrines associated with the *Gale Baṇḍāra* on either side without any contradiction. According to the above-mentioned facts, it can be concluded that the *Gale Baṇḍāra* folk belief reflects about the multi-religious features and religious harmony within the Sri Lankan folk religious beliefs.

***Keywords:*** *Gale Baṇḍāra, Folk Religious Beliefs, Multi-Religious Context, Religious Harmony*

# දේව දානය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

වෙලම්පැලේ රතනසාර හිමි

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

*wrthero.wr1996@gmail.com*

ලංකාවේ දේව සංකල්පය විවිධ ආකාරයෙන් ප්‍රචලිත ය. ඒ අනුව දේව ඇදහිලි ප්‍රදේශීය සංස්කෘතිය හා සභ්‍යත්වයට ආවේණික ව නිර්මාණය වී තිබේ. ගොවි ජනතාවගේ දේව විශ්වාස හා ඇදහිලි අනුව දේව දානය පවත්වනු ලබයි. වෙලම්පැල ග්‍රාමයට ආවේණික දේවදාන සංකල්පයේ විශේෂත්වය කුමක් ද? යන්න මෙම පර්යේෂණයේ ගැටලුව විය. දේවදාන සංකල්පයේ විවිධත්වය වත්මන් ලාංකේය සමාජය වෙත දැනුවත් කිරීම හා එමගින් ගොවි ජනතාව ඉටු කරගැනීමට බලාපොරොත්තු වන අභිප්‍රායන්හි විශේෂත්වය අධ්‍යයනය කිරීම මෙහි අරමුණු වේ. ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය යොදා ගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදි. වෙලම්පැල ග්‍රාමය ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයට රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වේ. මෙම ග්‍රාමයේ ගොවි ජනයා සමන් දෙවියන් සහ කතරගම දෙවියන් තම කෘෂිකාර්මික කටයුතුවල දී අදහනු ලබයි. මහියංගන රාජමහා විහාරස්ථානයේ ප්‍රධාන සමන් දේවාලයක් තිබීම සමන් දෙවියන් ඇදහීමට හේතුව වේ. උක්ත සදහන් දෙවිවරුන්ගේ ආශිර්වාදය හා ආරක්ෂාව ලබා ගැනීමට මාස් කන්නයේ ගොවිතැන් කටයුතු නිමාවෙන් පසු ව හෝ යල කන්නයේ ගොවිතැන් කටයුතුවලින් පසු ව මෙම දේවදානය පවත්වනු ලැබේ. මාස් කන්නය හා යල කන්නය ලෙස වසරකට කන්න දෙකක් වන නමුත් දේවදානය පවත්වන්නේ වසරකට එක් වතාවක් පමණි. කමතෙන් බැත ඉවත් කරන විට පළමු ව මෙම දේවදානය සඳහා අස්වැන්නේ කොටසක් වෙන් කිරීම සිරිත යි. ඉන් පසු පළමු ව ගෙට ගන්නේ දේවදානය සදහා වෙන් කළ කොටස යි. අස්වැන්න ගෙට ගැනීමෙන් පසු විහාරස්ථානයට සාංඝික ව දන් පිරිනැමීමට කොටසක් වෙන් කෙරේ. දේවදානය ඉහත දෙවිවරු දෙදෙනා සදහා තම ගෙවත්තේ නැගෙනහිර දිශාවට මුහුණලා ඉදිකරන ලද මල් පැලක සැකසූ දානය තබා ගුරුන්නාන්සේ කෙනෙකු ලවා දෙවියන් වෙත පුද කරනු ලබයි. මෙයින් ඔවුන් බලාපොරොත්තු වන්නේ ලැබූ අස්වැන්න මෙන් සමෘද්ධිමත් අස්වැන්නක් මීළඟ කන්නවල ලබාගැනීම යි. ගොවිතැන් කටයුතුවල දී ඇති විය හැකි විපත් දුරු කරගැනීම හා තම පවුලේ සැමට සමෘද්ධිය උදාකර ගැනීම මෙහි අභිප්‍රායන් වේ. දේවදානය පැවැත්වෙන දිනයේ ගෘහ මූලිකයා විසින් ස්වකීය භාර්යාවගේ ඥාති පාර්ශ්වයට ආරාධනා කරනු ලැබේ. එමෙන් ම අනාරාධිත ව පැමිණෙන සැමටත් දේව දානය බෙදා දීමට කටයුතු සිදු කරයි. ගොවිතැන් කටයුතු සාර්ථක කරගැනීමට උපකාර කළ සැමට ආරාධනා කරනු ලබන්නේ කෘතගුණ සැලකීමක් වශයෙනි. උක්ත පර්යේෂණ දත්ත මගින් වෙලම්පැල ග්‍රාමයේ දේවදාන සංකල්පය බුදුදහමේ ඉගැන්වෙන පංචබලි සංකල්පය සහ හින්දු දේව සංකල්පය අනුබද්ධිත ව සිදු කරන ජන ඇදහිල්ලක් බව තහවුරු විය.

***ප්‍රමුඛ පදඃ*** *කන්නය, ගුරුන්නාන්සේ, දේවදානය, වෙලම්පැල, සංකල්පය*

# ඓතිහාසික, සංස්කෘතික හා ජනශ්‍රැතික සන්සිද්ධීන් ඔස්සේ ගොඩනැගෙන ජන ආගමික ප්‍රවණතා පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක් (ඌවේ අප්‍රකට රාක්ෂ බලි ඇසුරින්)

එච්. කේ. මිල්ලගහතැන්න

භාෂා අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*haßhimtc2010@yahoo.com*

කිසියම් ප්‍රදේශයක පවතින ඓතිහාසික සංස්කෘතික හා ජනශ්‍රැතික සංසිද්ධීන් ඔස්සේ එකී ප්‍රදේශයේ ජන ආගමික ප්‍රවණතා හටගන්නා අයුරු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මේ සඳහා ඌවේ අප්‍රකට ඇඹුම්බලි ඇතුළත් අඹන්ඇල්ලේ සොමියා බෙරකරුගේ ඇඹුම්බලි කවි සහිත පුස්කොළ පොතෙහි අන්තර්ගත රාක්ෂ බලි යොදා ගැනුණි. මිනිසාට හිරු, සඳු ප්‍රමුඛ නවග්‍රහයින්ගේ අහිතකර කිරණ ශක්තීන් හේතුවෙන් සිදු වන මාරක ඒරාෂ්ටක අපල, උපද්‍රව, රෝග පීඩා නිවාරණය කරනු පිණිස අතීතයේ උත්කෘෂ්ඨ ඇගයුමට පාත්‍ර වූ ඇඹුම්බලි ශාන්තිකර්ම ලක්දිව උඩරට, පහතරට, නුවරකලාවිය, සබරගමු හා ඌව ප්‍රදේශ ආශ්‍රය කරගනිමින් ආවේණික සම්ප්‍රදායන් හා ප්‍රාදේශීය ඇදහිලි විශ්වාස සමඟ සම්මිශ්‍ර වී රට පුරා ක්‍රියාත්මක ව පවතී. රෝග නිවාරණීය මනෝචිකිත්සක ක්‍රමයක් වූ මෙය ඇදුරු ජනවිඥානය පෙරදැරි ව සාධනීය ප්‍රතිඵල රෝගියාට ලබා දී සුවපත්භාවයට පත් කරනු ලබන සුදු අභිචාර ක්‍රමයක් ලෙසට හඳුනාගත හැකි ය. ඌවේ රාක්ෂ බලි වැඩි ප්‍රමාණයක් පවතින බවට තොරතුරු ඉහත පුස්කොළ පොත පරිශීලනය කිරීමෙන් අනාවරණය විය. ඌව පිළිබඳ පවතින පුරාවෘත්ත, ජනශ්‍රැති මෙන් ම ඓතිහාසික පුවත් ඔස්සේ තහවුරු වන්නේ අතීතයේ දී ඌව පළාත රාක්ෂසයින්ගේ නිජබිමක් ව පැවතුණු බව යි. රාමායනයේ අන්තර්ගත රාවණ කතා පුවත, හා ත්‍රි සිංහලේ කඩයිම් පොත මීට සාක්ෂි සපයයි. එසේ ම ලංකාවතාර සූත්‍රය බුදුන්වහන්සේ දේශනා කොට ඇත්තේ රාක්ෂයින් උදෙසා ය. තව ද දකුණු ඌවේ තාරක නම් වූ රාක්ෂස අධිපතියෙකු පිළිබඳ ජනශ්‍රැති සාධක ස්කන්ධ දේව ආගමනය පිළිබඳ ඇතුළත් කතා පුවත් තුළ අන්තර්ගත වේ. බුදුදහම ඔස්සේ රාක්ෂයින් දමනය කිරීමේ මෙකී ඓතිහාසික සංසිද්ධීන් රාක්ෂ බලි ඌව තුළ වැඩි ප්‍රමාණයක් පැවතීමටත් බුදුගුණයෙන් පමණක් ඌවේ බලි ශාන්තිකර්මය සිදු කිරීමටත් හේතු වූවාට සැක නැත. ඌවේ රාක්ෂ බලි තුළ දී සොබාදහමේ සංසිද්ධීන් රාක්ෂයින් බවට පත්කර එම රාක්ෂයින් ආතුරයා ලෙඩ කළ බවට දක්වා මැටියෙන් අඹා, ජීවය දී, කවි කියා, අඬගසා පුදපිදිවිලි දී, බුදුන්ගේ අණසකින් යටත් කොට, පලවා හැර ආතුරයාගේ මනෝභ්‍රාන්ති ඉවත් කෙරේ. එමඟින් ආතුරයාගේ නිෂේධනාත්මක සිතුවිලි ඉවත් වී ශාරීරික නිරෝගීභාවයට අවශ්‍ය මානසික ඒකාග්‍රතාව වර්ධනය කෙරේ. සර්ව රාක්ෂ හෙවත් අෂ්ට රාක්ෂ, වායු රාක්ෂ, මාන්ස, නාග රාක්ෂ, මේඝ රාක්ෂ, අග්නි රාක්ෂ, ශ්‍රවණ රාක්ෂ, ජල රාක්ෂ, පඬුවන් රාක්ෂ ආදිය වූ බලි ඉන් කිහිපයකි. මෙහි දී වායු, මේඝ, අග්නි හා ජල ආදිය වූ කලී සොබාදහමේ සංසිද්ධි වේ. වා, පිත්, සෙම් දෝෂ ජනිත වන්නේ ද මේ ඔස්සේ ය. කෙසේ වෙතත් අතීතයේ උත්කෘෂ්ඨ ඇගයුමට පාත්‍ර වූ ඌවේ යක් හා රාක්ෂ බලි වර්තමානය වන විට හායනීයත්වයට පත්වෙමින් පවතී. එසේ ම කිසියම් ප්‍රදේශයක ජනිත වන පුදපූජා ශාන්තිකර්ම සඳහා තත් ප්‍රදේශාශ්‍රිත ඓතිහාසික හා සමාජ සංස්කෘතික මූලයන් ඍජුවත් වක්‍රාකාරවත් බලපාන බව මෙමගින් සනාථ වේ.

***ප්‍රමුඛ පදඃ*** *ඌව, ඓතිහාසික සංසිද්ධි, ජන ආගම, රාක්ෂ බලි, මනෝ චිකිත්සා*

# ගමවෙල දේවාලයේ පුද ලබන පුංචි අලුත් බණ්ඩාර දෙවියන් පිළිබඳ අධ්‍යයනයක්


ආර්. එම්. එස්. ඒ. රත්නායක

ගැමුණුපුර මහා විද්‍යාලය, මහියංගනය

*shashikaashangi@gmail.com*



ලාංකේය දේව ඇදහීම් හා විශ්වාස විමසුමට ලක් කරන කල්හි ඌව පළාතේ ජනතාව එක්තරා අනුස්මරණීය ඇදහීම් රටාවකට උරුමකම් කියති. ඔවුහු කතරගම, සමන්, පත්තිනි, ඉන්දක ආදි ප්‍රධාන දෙවිවරුන් උදෙසා පුද පූජා පවත්වන අතරෙහි ප්‍රදේශීය ආධිපත්‍යය දරන දෙවිවරුන් උදෙසා පුද පූජා පවත්වති. ඒ අතර කන්දකැටිය ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ ඌවේ ගම්බාර දෙවිවරු කොට්ඨාසයටත්, ඌවේ ප්‍රදේශීය දෙවි දොළොස් කට්ටුවටත් අයත් පුංචි අලුත් බණ්ඩාර දෙවියන් මෙම අධ්‍යයනයේ දී මූලික කොට ගැනේ. ගමවෙල දේවාලයේ පුද ලබන ප්‍රධාන දේව සත්කට්ටුව අතරින් පුංචි අලුත් බණ්ඩාර දෙවියන් පිළිබඳ ව සුවිශේෂී කොට අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ යි. ප්‍රදේශයේ පුද ලබන අනෙක් දෙවිවරු අභිභවා පුංචි අලුත් බණ්ඩාර දෙවියන් පිළිබඳ ව ජනයා සතු ව පවතින විශ්වාසය කවරාකාර ද? යන්න හඳුනාගැනීම අධ්‍යයන ගැටලුව යි. මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමයක් ලෙස ඉදිරිපත් කෙරෙන අතර ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ මඟින් නිගමනයන්ට එළඹිණි. ඒ අනුව කන්දකැටිය කිරිවෙහෙර පූජා භූමියේ ඉදි ව ඇති කතරගම, විෂ්ණු, සමන් දේවාල අතරට කිවුලෙගෙදර දේවාලය එක්වීමත් වාර්ෂික ව කිරිවෙහෙර පුදබිම මඟින් පවත්වන පෙරහැර කිවුලේගෙදර ගම්බාර දේවාලයේ චාරිත්‍රවලින් අවසන් වීමත් විශේෂත්වයකි. කිවුලේගෙදර ගම්බාර දෙවි, කිවුලේගෙදර අප්පුහාමි දෙවි, කිවුලේගෙදර අලුත් දෙවි යනුවෙන් පුද ලබන පුංචි අලුත් බණ්ඩාර දෙවියන් යනු, 1818 උඩරට මහකැරැල්ල මෙහෙය වූ සහ නිදහස් අරගලයේ නායකත්වය ගෙන සටන් කළ සටන්කාමියෙකු වූ කිවුලේගෙදර මොහොට්ටාල යි. ඌව නිදහස් කැරැල්ලේ දී රට වෙනුවෙන් දිවි කැප කළ මොහු ජනතාව විසින් පුංචි අලුත් බණ්ඩාර දෙවියන් යනුවෙන් දේවත්වයට පත්කොට ඇත. ඌව පළාතේ දේව ධුරාවලිය අතරින් ඌවේ පස්මහ දෙවිවරු, ඌවේ ගම්බාර දෙවිවරු, කිවුලේගෙදර දේව පරපුරේ දේව සත්කට්ටුවට සහ දොළහ දෙවිවරු යටතට මෙම දෙවියන් අයත් වේ. කිවුලේගෙදර පරපුරේ දේවත්වයට පත් අවසාන දෙවි වන්නේ මොහු ය. මෙතුමා කාව්‍යය රචකයෙකි. කන්දකැටිය ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට ඇතුල්වන ස්ථානයේ කිවුලේගෙදර මොහොට්ටාලගේ ප්‍රතිමාවක් සාදා තිබීමෙන් ද සෑම ප්‍රධාන ගොඩනැගිල්ලක ම ඔහුගේ නම සඳහන් වීමෙන් ප්‍රදේශය තුළ ආධිපත්‍යය පැතිරී ඇති ආකාරය පෙන්නුම් කරයි. ගමවෙල ගම් වැසියෝ වාර්ෂික ව අස්වනු නෙළීමෙන් පසු ව ඉදිරි අස්වනුවල සාර්ථකත්වයටත්, කෙත්වතු ආරක්ෂාවටත්, ලෙඩ රෝග දුරුකර ගැනීමටත් මේ දෙවියන් සිහිකර පුද පූජා පවත්වති. ගමේ පන්සලට පැමිණෙන සෑම කෙනෙකු ම ගම්බාර දෙවියන් වැඳපුදා පඬුරු පූජාකිරීම, දේව පූජා පැවැත්වීම, භාරවීම, ගමෙහි පැවැත්වෙන ගම්මඩු ශාන්තිකර්මවල දී දෙවියන්ට පහනක් පූජා කිරීමෙන් දෙවියන් කෙරෙහි ජනතාව සතු භක්තිය, විශ්වාසය මැනවින් ප්‍රකට කරයි.



***ප්‍රමුඛ පදඃ*** *කිවුලේගෙදර මොහොට්ටාල, පුංචි අලුත් බණ්ඩාර දෙවියන්, අභිචාර විධි*

# ලාංකේය සංස්කෘතිය හා බැඳුණු සූනියම් දේව සංකල්පය

ඒ. ඒ. එම්. එම්. එම්. අමරතුංග

භාෂා, සංස්කෘතික අධ්‍යන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*medhilvushi@gmail.com*

සූනියම් දෙවි ඉන්දියානු සම්භවයක් සහිත ලංකාවේ වන්දනාවට පත්වන දෙවි කෙනෙකු වන අතර ඔඩ්ඩිස, ගම්භාර, සිද්ධ සූනියම් ආදි නාමයන්ගෙන් ලංකාව තුළ ව්‍යවහාර වේ. වඩිග දේශයේ වඩිග රජුට දාව යෞදගිරි හෙවත් තුසරී බිසවගේ කුසින් සූනියම් දෙවි උපත ලද බව ජන විශ්වාසයේ පවතින්නකි. සූනියම් දෙවියන්ගේ අතේ ගිනි කබලක් හා කටේ ලේ පොළඟෙකු දරා සිටින වේශය යක්ෂ වේශය ලෙසත් හිසේ ජටාවක් බැඳ හැරමිටියක් ගෙන සිටින වේශය තාපස වේශය ලෙසත් විශ්වාසයේ ඇත. සූනියම් දෙවියන් මහා විෂ්ණු දෙවියන්ගේ අග්‍රාමාත්‍ය ලෙස ද කතරගම දෙවියන්ගේ අග්‍ර පුරෝහිත ලෙස ද කටයුතු කරන බව ජනශ්‍රැතියේ දැක්වේ. ලාංකේය ජන සංස්කෘතිය තුළ සූනියම් දෙවි ඇදහීම හා එහි විශ්වාස අතර පවතින සම්බන්ධතාව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ යි. ගුණාත්මක ක්‍රමවේදය මේ සඳහා යොදා ගත් අතර එහි දී ජනශ්‍රැති අධ්‍යයනය ප්‍රධාන විය. ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම බල ප්‍රදේශයේ කිරිවත්තුඩුව ග්‍රාමය ආවරණය වන පරිදි ගුප්ත විද්‍යාව සම්බන්ධ විශේෂඥයන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීමත් පුස්තකාල අධ්‍යයනය යටතේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර පරිශීලනය කිරීමත් තුළින් දත්ත ලබා ගැනීම සිදු කෙරිණි. සූනියම් දෙවියන්ගේ වරම කලාතුරකින් කෙනෙකුට ලැබෙන බව ජන විශ්වාසයේ පවතින්නකි. දෙවියන්ට පහන් දල්වා පින් දීම තුළින් විභාග කටයුතුවලින් ජය ලබා ගැනීමට හැකි වීම, සොරසතුරු උවදුරුවලින් මිදීම, ගෙවල් දොරවල් ආරක්ෂා කර දීම ආදී කටයුතුවලට අමතරව අණ විණ කොඩිවිණ කැපීම හා සාස්තර මගින් අනාගත අභිවෘද්ධිය මිනිසා වෙත ලඟාකර දීම මෙම සූනියම් දේව වන්දනයෙන් ඉටුවන බවත් ප්‍රාදේශීයව අනෙකුත් දෙව්වරුන් අභිබවා සූනියම් දෙවි කෙරෙහි ප්‍රබල විශ්වාසයක් ජනතාව තුළ ඇති බවත් මෙම පර්යේෂණය තුළින් අනාවරණය විය.

***ප්‍රමුඛ පදඃ*** *විෂ්ණු දෙවි, කතරගම දෙවි, විශ්වාස, සූනියම් දෙවි*

# දෙහි කැපීමේ අභිචාරය හා බැඳි ජන විශ්වාස

යූ. එච්. ගීතාංජලී

භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*haßhanigeethanjalee@gmail.com*

මිනිසුන් තුළ ඇතිවන්නා වූ තුන්දොස් සමනය කිරීම, ඇස්වහ කටවහ දුරුකිරීම, ග්‍රහදෝස දුරුකිරීමට හා වින බන්ධනයන් ඉවත් කිරීම උදෙසා සිදුකරන සුදු අභිචාර විධික්‍රමයක් ලෙස දෙහි කැපීම හඳුන්වා දිය හැකි ය. අතීතයේ දී මැණික්පාල බිසවට ඇති වූ විත දෝසය දුරු කිරීම උදෙසා ඇගේ සහෝදරයා වන විෂ්ණු දෙවියන්ගේ ආරාධනයෙන් පැමිණි පුරාණ ඍෂිවරුන් විසින් 'සන්නියකුම' නම් ශාන්තිකර්මය සිදුකර ඇති බව ජන විශ්වාසය යි. දෙහි කැපීම යනු එකී ශාන්තිකර්මය පදනම් කොටගෙන ප්‍රභවය ලත් සුවිශේෂී අභිචාර විධියකි. දෙහි කැපීමේ අභිචාරය පසුකාලීන ව ගෘහස්ත ව සිදු කෙරිණි. දෙහි කැපීමේ අභිචාරය කෙරෙහි ජනයා තුළ පවත්නා විශ්වාස හඳුනාගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ යි. කළුතර දිස්ත්‍රික්කයේ තෝරාගත් ග්‍රාමසේවා කොට්ඨාස දෙකක පාරම්පරික ඇදුරන් දස දෙනෙක්, අහඹු ලෙස තෝරාගත් ආතුරයන් 25 දෙනෙක් හා දෙහි කැපීමේ අභිචාරය නැරඹීමට පැමිණි පුද්ගලයන් 20 දෙනෙකු සමඟ කළ සම්මුඛ සාකච්ඡාවෙන් සහ පුස්තකාල පරිශීලනයෙන් ලබාගත් ද්විතීයික තොරතුරු විශ්ලේෂණය කිරීම මඟින් මෙම නිගමනවලට එළඹිණි. දෙහි කැපීමේ දී සූනියම් යකා, රීරි යකා, මහසෝනා, තොට යකා, අභිමාන යකා, මදන යකා, සන්නි යකා යන යකුන් අට දෙනා හා නිවසට අරක්ගත් ප්‍රේතයෙකු පුද ලබයි. දෙහි කැපීම උදෙසා බුදුගුණ හෝ දෙවියන් ඇදහීමක් සිදු නො වේ. ඒ වෙනුවට මරු සිටින දිශාවට මල් බුලත් තටුවක් සාදා යකැදුරා විසින් මන්ත්‍ර ජප කරමින් දෙහිවලට ජීවන් කරනු ලබයි. මෙහි දී ශබ්ද තරංග මඟින් විශ්වශක්තිය දෙහිවලට පිරවීම සිදු කරයි. මේ සඳහා එක නැට්ටේ දෙහි තුනක් වන පරිදි දෙහි ගැට විසි එකක් තෝරා ගැනීම විශේෂ වේ. නො පිරුණු දෙහි ගැටවලට විශ්වශක්තිය පිරවිය හැකි බව ජන විශ්වාසයේ පවතින්නකි. ආතුරයා මරු සිටින දිශාවට පිටුපාන ලෙස සිටුවා හිසේ සිට දෙපතුල දක්වා ගිරයක් භාවිතයෙන් යකැදුරා විසින් දෙහි කැපීම සිදු කරයි. කපන ලද දෙහි වතුර බඳුනකට දැමීම විශේෂ වූවකි. දෙහි වතුර මත පාවෙන ආකාරය අනුව දෝස සමනය වීම පිළිබඳ ව තීරණය කරයි. දෙහි කැපීමෙන් ආතුර මනස සුවපත් වීම, ඇස්වහ කටවහ හා අදෘශ්‍යමාන බලවේග දුරු වේ. එමෙන් ම මෙහි විද්‍යාත්මක පසුබිමක් ද ඇත. එනම් සිංහල ආයුර්වේදයට අනුව දෙහි විෂබීජ නැසීය හැකි ඖෂධයකි. එය ශරීරය මත තබා කැපීමෙන් රෝග දුරු වන බව ජන විශ්වාසයේ පවතී. තව ද ගැබ්ගත් මව්වරුන්ගේ දරු ප්‍රසූතිය ප්‍රමාද වූ විට දෙහි කැපීමෙන් සියලු බන්ධනයන් බිඳී දරු ප්‍රසූතිය සිදු වේ' යැයි ජන විශ්වාසයේ පවතින බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය විණි.

***ප්‍රමුඛ පද:*** *ජප කිරීම, මල් බුලත් තටුව, තුන්දොස්, සූනියම, විත බන්ධන*

# අනුරාධපුර පැරණි නගරය ආශ්‍රිත නටබුන් අවශේෂ තුළින් පිළිබිඹුවන ප්‍රාග් බෞද්ධ ඇදහිලිවල විකාශය හා බෞද්ධාගමික සහජීවනය


එම්. කේ. එල්. අයිරාංගනී

මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*iranganimkl@yahoo.com*



ක්‍රිස්තු පූර්ව තෙවැනි සියවසේ දී නිල වශයෙන් ලංකාද්වීපයට බුදු දහම ආගමනය වීමට පෙර දිවයින්වාසීහු තම දෛනික ජීවිතයේ ගැටලු නිරාකරණය කරගැනීමේ දී නාග, යක්ෂ, භූත, දේව, ජෛන, බ්‍රාහ්මණ, පරිබ්‍රාජක, ආජීවක, වෘක්ෂ හා පර්වත යනාදි විවිධ වන්දනාවන් වෙත යොමු වූහ. අශෝක අධිරාජයාගේ ධර්ම විජය ප්‍රතිපත්තියේ සහ දෙරටේ රාජතාන්ත්‍රික සබඳතාවල ප්‍රතිඵලයක් ලෙස බුදු දහම මෙරටට ආගමනය වී රාජ්‍ය අනුග්‍රහය ලැබ දිවයින පුරා ප්‍රචලිත විය. භික්ෂු-භික්ෂුණී, උපාසක-උපාසිකා පිරිසගෙන් සුසැදි ජන සමාජයක් ක්‍රමයෙන් වර්ධනය වූවත් එතෙක් දේශීයන් තම ජීවන රටාවට සමෝධානය කරගෙන තිබූ ඇදහිලි විශ්වාසයන්ගේ පූර්ණ ඉවත්වීමක් සිදු නොකළහ. එහෙයින් අනුරාධපුර පැරණි නගරය ආශ්‍රිත පුරාවිද්‍යාත්මක අවශේෂ තුළින් පිළිබිඹු වන ප්‍රාග් බෞද්ධ ඇදහිලිවල විකාශයත්, බෞද්ධ පරිශ්‍රයන් තුළ ම ඒවා පවත්වාගෙන ගිය ආකාරයත් විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ යි. එහි දී සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය තුළින් දේශීය ව පැවති ඇදහිලි සම්බන්ධ ව අධ්‍යයනය කරන අතර අනතුරු ව මහාවිහාරය, ජේතවනාරාමය, අභයගිරිය ආදි වූ බෞද්ධාගමික පරිශ්‍රයන් මෙන් ම, කාලි කෝවිල සහ ශිව කෝවිල ආදි අන්‍යාගමික නටබුන් ද ක්ෂේත්‍ර ගවේෂණයන් ඔස්සේ සියුම් පරීක්ෂාවකට ලක් කළෙමි. බුදුන් වහන්සේගේ ලංකාගමනය තුළින් ද තහවුරු වන පරිදි චූලෝදර-මහෝදර, මණිඅක්ඛිත ප්‍රමුඛ වූ නාග ගෝත්‍රික ප්‍රජාවක් මෙරට වාසය කර ඇති අතර නාගයන්ට අධිපති විරූපාක්ෂ ඇතැම් බෞද්ධ ස්තූපයන්හී දකුණු දිශාවෙහි ආරක්ෂාව පිණිස යොදා ඇත. ජේතවන, අභයගිරිය ආදී ස්තූප ආයකයන්හී නාගරාජ මෙන් ම, ඡත්‍රයක් යට හිඳින නාගරූව ද කැටයම්කර ඇති අතර අනුරාධපුරයෙන් හමුවන බොහෝ මුරගල් නාගරාජ රූපයන්ගෙන් අලංකාර කර ඇත. නාග වන්දනය කළවුන් බුදු දහම වැළඳගත්ත ද ඔවුන්ගේ මුල් ඇදහීම් ප්‍රතික්ෂේප නො කර බෞද්ධ සංකල්පයන්ට ගැලපෙන පරිදි එම ඇදහීම විධිමත් කර ඇත. පණ්ඩුකාභය රජු අනුරාධපුරයේ ග්‍රාම සීමා නියම කිරීමේ දී 'චිත්‍රරාජ යකු අභයවාපී යට භාගයෙහි වාසය කරවී' යැයි මහාවංසය සඳහන් කරන අතර අභය වැව ඉවුරෙහි අද දක්නට හැකි ශිව කෝවිල වූ කලී පුරාණ චිත්‍රරාජ යක්ෂ ඇදහීම හින්දු ආභාසයන් මත සංවර්ධනය වීමකි. පණ්ඩුකාභය රජු ඇතුළුනුවර බටහිර ද්වාරයෙහි කරවූ බටහිර රාජිණී දෙවොල වත්මනෙහි කාලිකෝවිල නමින් හැඳින්වේ. හින්දු ගෘහනිර්මාණ ශෛලීන් ඇසුරින් නිර්මිත මෙම කෝවිල් ද්විත්වයම පුරාතන ඇදහීම් හින්දු ආභාසය සමගින් සමාජයෙහි තහවුරු වීමකැයි හඳුන්වාදිය හැකි ය. වෘක්ෂ ඇදහූවන් බෝධි සංකල්පයටත්, පර්වත ඇදහූවන් ස්තූප සංකල්පයටත් ගොනු කරමින් සමාජය සියුම්ව ස්පර්ෂ කරන්නට බුදුදහම සමත් වූ අතර එයින් බාහිර අනෙකුත් ඇදහීම් ද ගැටුමකින් තොර ව පවත්වාගෙන ගොස් ඇති ආකාරය මෙයින් තහවුරු වේ.



***ප්‍රමුඛ පදඃ*** *අනුරාධපුර, නටබුන්, ඇදහිලි හා විශ්වාස, බුදු දහම, ආගමික සහනශීලීත්වය*

# A Criminological Analysis of the Deviant Behaviors in Sri Lankan "*Shanthikarma*"

W. G. W. M. S. N. K. Weerakoon*, K. S. Dharmasiri and K. B. N. De Silva[3]

Department of Criminology and Criminal Justice, University of Sri Jayewardenepura

*sandiweerakoon@gmail.com

Dance has always been a massive part of cultural identity in Sri Lanka. The history of Sri Lankan dance seemed to have begun approximately 2,500 years ago to ease illnesses and as a religious ritual. Along with other spiritual believes, the concept of crime emerged in medieval society. Deviant behaviors were not considered illegal in many situations. However, forms of worship called *Shanti Karma* originated in the legendary *Maha Sammatha* era. During the end of the Polonnaruwa era (15th century A.D.), dance styles have been influenced by South Indian dance cultures. With time, people have developed three different forms of dance styles named as the Kandyan dancing of the Up Country, the low country dancing of the southern plains, and Sabaragamuwa dancing. These dancing styles were shaped by Buddhist and non-Buddhist developments. The main objective of this research was to analyze the above traditions from a criminological perspective, with the respective legends and mythologies discussed in *"Kohomba Kankariy*a" that belongs to the Kandyan dance tradition, *"Sanni Yakuma Shanthikarma"* from low country dance tradition, and *"Suuniyam Yaaga Shanthi Karmaya"* from Sabaragamuwa dance tradition. Books, articles, and research papers written on *Shanthikarma* were used as secondary data while 3 subject experts were interviewed to gather data on the above topic. Even though this research area has been addressed by both western and oriental scholars there are limited works done on the Sri Lankan context. The study relieved common beliefs, myths, and practices of the above traditions from a criminological perspective as how the concept of murder has been identified in different situations. The latter part of the study was explained by how the concept of deviant behavior evolved from a traditional society to modern society. The study summarized scenes that depict crimes link beliefs, myths, and traditional practices to the lives of people and how deviant behaviors were discussed during ancient times in Sri Lanka. Overall, the study aimed to analyze the Sri Lankan dance culture in a criminological point of view.

***Keywords:*** *Dance, Deviant Behavior, Myths, Sri Lanka, Tradition*

# සිංහල කුල ධුරාවලිය හා දේවාලයන්හි පැවැත්ම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (බලංගොඩ ප්‍රදේශයට විශේෂිතව)

ජී. ඩී. මද්දුමාගේ

සබරගමු අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

*gayanideepikam@gmail.com*

නූතන සිංහල සමාජ ස්තරය තුළ ජාතිය ආගම කුලය පන්තිය වයස යනාදී බෙදීම් දැකගත හැකි ය. මේ අතරින් කුලය දකුණු ඉන්දියානු ආභාසයන් සමග සමාජ ආර්ථික සංස්කෘතික ප්‍රපංචයන් තුළින් නිර්මාණය වී පෝෂණය වූ ස්තරායන සාධකයක් බැවින් දකුණු ආසියානු සමාජයට විශේෂ වේ. කුල ක්‍රමයේ විකාශනය සහ දේවාලයන්හි පැවැත්ම ලාංකේය ආයතනික පරිපාලන වටපිටාව සමඟ ද බද්ධ වී ඇත. එබැවින් දේවාලයන්හි පැවැත්ම තීරණය කරන පරිපාලන ව්‍යුහය සඳහා කුල ධුරාවලිය අනිවාර්ය සාධකයක් වී ද? යන ගැටලුව පර්යේෂණය සඳහා යොදා ගනු ලැබුණි. කුල ධුරාවලිය හා දේවාලයන්හි පැවැත්ම පිළිබඳ කරන ලද මෙම පර්යේෂණයේ දී සමාජ පරිණාමයත් සමඟ කුල ක්‍රමයේ විකාශනය සිදු ව ඇති ආකාරයත්, සමාජ වෙනස් වීමේ ක්‍රියාවලිය තුළ කුල ක්‍රමය ද වෙනස් වෙමින් පවතින බවත්, සිදු ව ඇති වෙනස්කම් පිළිබඳවත්, ශාස්ත්‍රීය වශයෙන් අධ්‍යයනයට ලක් කිරීම අරමුණ වී ය. පර්යේෂණයේ නියැදිය ලෙස සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බළන්ගොඩ හා ඉඹුල්පේ යන ග්‍රාමයන් තෝරා ගත්තේ ය. දේවාලයන්හි පැවැත්ම විමර්ශනාත්මක ව අධ්‍යයනයක යෙදී ඇති මෙම පර්යේෂණයේ සමාජ ස්තරයන් වෙනස් වීම සම්බන්ධ බැවින් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක, යන විශ්ලේෂණ ක්‍රම දෙක ම යොදා ගත් අතර දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම ලෙස නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය, සමීක්ෂණය ක්‍රමය, භාවිත කළේ ය. මෙම පර්යේෂණයේ ද්විතීයික දත්ත මූලාශ්‍ර ලෙස පර්යේෂකයින්ගේ කෘති, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ලබාගත් සංඛාලේඛන තත්ත්ව වාර්තා තුළින් පූර්ණ කරගත් අතර ප්‍රාථමික දත්ත ලෙස ක්ෂේත්‍ර අධ්‍යයනයේ යෙදී දේවාල පරිපාලන නිලධාරින් හමු වී සම්මුඛ සාකච්ඡා මගින් සම්පූර්ණ කරගත්තේ ය. පර්යේෂණ තුළින් සමාජයේ දැඩි ලෙස මුල්බැස ගෙන තිබූ කුල ක්‍රමය සමන් සහ කතරගම දේවාලයන්හි පරිපාලන ව්‍යුහය පත්කිරීමේ ප්‍රබල සාධකයක් ව පැවති බවත්, වර්තමානය වනවිට කුල ක්‍රමය පරිපාලන ව්‍යුහය තුළ යොදා ගැනීමේ දී විවිධ වෙනස්කම්වලට භාජනය වී ඇති බවත්, දේවාලය මුල්කොට ගනිමින් පරිපාලන ව්‍යුහය ක්‍රියාත්මක වීමේ දී එහි ඇතුල්කට්ටලයේ සහ පිටකට්ටලයේ නමින් හැඳින්වෙන අංශ දෙකක් ක්‍රියාත්මක වන බවත් තහවුරු විය. තව ද මෙම අධ්‍යයනයේ දී බළන්ගොඩ සමන් සහ කතරගම දේවාලයන්හි ඇතුල්කට්ටලයේ පරිපාලන ව්‍යුහය පත්කිරීම සඳහා කුල ක්‍රමය මූලික වන බව නිගමනය වී ය. එහි දී ඊට සාපේක්ෂ ව පිටකට්ටලයේ සහ සෙසු අංශයන්හි පරිපාලන ව්‍යුහයන් සාම්ප්‍රදායික සමාජය තුළ දක්නට ලැබුණු කුල ක්‍රමය සමාජ ව්‍යුහයට සමගාමී ව වෙනස්කම්වලට භාජනය වුව ද, වත්මන් සමාජ වෙනස්කම්වලට සාපේක්ෂව කුල කාර්යයන් තව දුරටත් පවතින බව දක්නට ලැබුණි.

***ප්‍රමුඛ පද:*** *කුලධුරාවලිය, දේවාල පැවැත්ම, සමාජ විකාශනය, පරිපාලන ව්‍යුහය*

# Blessing and Cursing; Practice among Urban People in Sri Lanka: With Reference to the Maharagama Secretariate Division

D. T. H. Ananda

Department of Anthropology, University of Sri Jayewardenepura

*tharakaananda@sjp.ac.lk*

Though it is difficult to state a definite period for the beginning of the blessing and cursing these have been included in the belief system of the human being from the time of their first contact with the supernatural entities. Most of the cultures of the world have unique patterns and methods of blessings and curing. Blessing and cursing are expressed through an act, orally, by prayer or a wish, and as wordings written on boards, cloths, etc. These two concepts represent the good and the bad which in some cultures it represents a god and the evil. The most specific feature that we can see in cursing is that its use in harming, revenging, etc. This can be defined based on the law of similarity and contact introduced by James Frazer. The types of cursing phrases, ideas, etc. are developed according to the culture of that society. In Sri Lanka, where the majority of the population represent by Sinhalese Buddhists, most of the common cursing phrases are related to Buddhism and associated belief systems. In Sri Lanka oldest evidence on cursing was found on inscriptions belong to 300 BC. Cursing impacts individuals as it is associated with sensitive behavioral and thinking patterns. Especially it deals with the mentality of an individual. Sinhalese Buddhists are afraid of cursing than that of the physical harm they face during their lifetime. Therefore, various types of cursing phrases are used in controlling others and to avoid misdeeds. The present research was conducted to find out the contemporary practice of cursing and blessing among Sri Lankan people. The basic consideration was the use of these concepts in a digital era where much attention is not given to the supernatural/traditional belief systems. Wattegedara, Maharagama, and Wijerama Grama Niladhari Divisions in Magaragama Secretariate Division were selected as the study fields to observe the urban people's perception of cursing and blessing. Observation methods and interview methods were used for the data collection. Ten household owners that had displayed cursing boards in front/near their houses were interviewed with their consent. For education purposes, business, eradicate the unluckiness, to gain the power and the blessings of the supernatural entities people still use blessing phrases without a difference to the traditional societies. Besides, cursing is used as a method of controlling illegal behaviors of people such as illegal waste disposal, to protect the harvest, taking revenge, etc. Even cursing and blessing phrases have been digitalized and used in digital platforms as well. Thus, it can be concluded that the use of cursing and blessings are associated with the culture and the belief system of the people for a very long period. Though the physical/material culture has changed the nonmaterial culture of the people has not yet changed which can alco considered under the concept of cultural lag.

***Keywords:*** *Blessing, Cursing, Sri Lankan Buddhist, Culture*

# FOOD CULTURE

# A Study on the Historical Significance of Traditional Cinnamon Cultivation

H. G. S. Deepthika

Department of Geography, University of Kelaniya

**sanjideepthikagamage@gmail.com*

The cinnamon tree is introduced as *Cinnamon Verum presell* or *Cinnamomum zeylanicam Blume*. It is a native crop of Sri Lanka and the leading supplier of cinnamon to the world market. Some 500 years ago, *Columbus* sailed in search of new sea routes, and the main spice he needed was cinnamon. The taste and quality of cinnamon in Sri Lanka are not similar to those found in other countries. Accordingly, this cinnamon crop can be identified as one of the most important crops in the world as well as in Sri Lanka. The main objective of this study was to study the historical significance of traditional cinnamon cultivation with economic and cultural significance. Secondary data were used to achieve this objective. Secondary data were collected from books, articles, magazines, newspapers, and web sites. According to the findings, the historical significance could be identified as the cultural and economic significance. Cinnamon was also the main commodity crop during the kingdoms periods and as well as colonial periods starting from 1505 AD. In the year 1850, the total extent of cinnamon cultivation in Sri Lanka was about 50,000 acres. Through, the book of "Wonders of India" (written by *Buzurg B. Shariyar*) can be identified cinnamon was exported to foreign countries from Sri Lanka in ancient. It was the earliest written evidence of cinnamon in Sri Lanka dates back to the 10th century. As well as Cinnamon was used as an export crop during the *Anuradhapura, Polonnaruwa,* and *Yapahu* periods. As the cultural significance in this study was identified, the major community were separated as classes of society because of cinnamon cultivation (*kurudukara*). Specific Applied words can be identified through the study of traditional cinnamon cultivation. International relationships were created with other countries because were exported cinnamon crop in history. Accordingly, it is important to study the native agricultural crop of historical value and it protects Sri Lanka's heritage and enhances the economic growth of Sri Lanka.

***Keywords**: Cinnamon, Economic Significance, Cultural Significance*

# A Study on The Relationship Between Sri Lankan Food Culture Practices and The Concept Of *Āhāravidhi Viśeṣāyatana* In Ayurveda

H. P. I. J. Kaldera[1*], U. Samaratunga[2], W. M. K. A. Wijesundara[3] and S. L. Wewalwala[4]

[1,2,4]Department of Ayurveda Basic Principles, Gampaha Wickramarachchi Ayurveda Institute, University of Kelaniya, [3]Medical officer, Rural Hospital, Handaganawa

*[*]inokak@kln.ac.lk*

Diverse forms of indigenous medical treatments have been in practice for preserving well-being of the ancient Sri Lankan society. This indigenous system of medicine is a Sri Lankan inherited form of medicine evolving on the basis of fundamentals of Ayurveda. The food culture practices too in the ancient society have been derived from these fundamentals. Since Ayurveda recommends a holistic approach to life and health, food (*āhāra*), regimen (*viharaṇa*) and medicine (*auṣada*) are prescribed in an integrated manner to achieve the overall health of the individual, which can simply be interpreted through the concept of *Āhāravidhi Viśeṣāyatana*. This research was primarily designed to investigate the relationship between Sri Lankan food culture practices and Ayurveda concept of *Āhāravidhi Viśeṣāyatana*. Data were collected through structured interviews conducted among randomly selected fifty (50) respondents from Batumulla Grama Niladhari Division, of the Minipe A. G. A Division of Central Province in Sri Lanka. This sample consisted of both male and female adults of over 50 years of age. The findings of the study support the claim that the Sri Lankan food culture practices are based on eight (8) main factors (*Aṣtavidha Āhāravidhi Viśeṣāyatana)* namely *prakṛti* - inherent qualities of food (e.g., when consume the seeds of *Mucuna pruriens (Vanduru maa)*, it is believed compulsory to boil and drain the excess water prior to consumption. Otherwise, one can subjected to feel drowsy), *karaṇa*-processing of food (e.g., *Mee* oil (*Madhuca longifolia*) has been frequently used in the preparation of green leaves. However, prior to use for food, small amount of boiled rice, 10 mustard seeds and a slice of red onion was added to the oil to remove the *kuwila* (bad odor) contained in the *mee* oil)*, saṁyoga* - combination/mixing (e.g., It is quite common to consume the meat of wild boar in this region. However, people avoid consuming it with bee honey or use honey to preserve the meat. According to Ayurveda, consumption of this meat with honey is poisonous.), *rāśi* - quantity, *deṣa*- habitat, *kāla* - time and seasonal variation, *upayoga samsthā* - dietetic rules, *upayoktā* - the person who takes the food. It can be concluded that these eight factors correspond to those mentioned in Ayurveda.

**Keywords:** *Sri Lankan Food Culture Practices, Āhāravidhi Viśeṣāyatana, Upayoktā, Upayoga Samsthā*

# Temporal Changes of Socio-Economic Factors in Chena Cultivation of the Dry Zone of Sri Lanka

S. H. S. M. Siriwardana

Sri Lanka Military Academy, Diyathalawa

*s.h.s.m.siriwardana@gmail.com*

Chena cultivation holds a prominent place in Sri Lankan agriculture, due to its prevalence over long periods of time. At present, the traditional Chena cultivation is undergoing drastic changes. Though there were specific cultivation patterns, labor use, water use and land use in the traditional Chena cultivation, they have undergone various changes due to population increase, developments, and socio-economic transitions. Therefore, the aim of this study was to examine the alternations that have occurred in the selected geographical area. Pahala Mattala Grama Niladari division of Lunugamwehera Divisional Secretariat in Southern province has been chosen as the study area and it consists of 278 families; of which 96% is engaged in Chena cultivation. As the sample, 45 of families have been selected by using random sampling method and data was collected through questionnaires and direct observations. Data was analyzed qualitatively, and simple statistical parameters were used. It was evident through results that have taken form the questioner survey, the traditional cultivation practices have changed temporally due to the socio-economic transitions. The findings revealed that the temporal socio-economic changes in the selected study area has resulted in significant changes in the factors such as patterns of land use, labor and cultivation in Chena traditions and has affected the changes in the lifestyle of the farmers. In conclusion, it can be emphasised that changes need to be made to aspects such as permanent land use instead of alternative land use, hired labor instead of collective labor and crop specification instead of crop diversification.

***Keywords***: *Chena cultivation, socio-economic, Temporal*

# ක්‍රි. පූ. දෙවන සියවසෙහි විසූවන්ගේ ජීවානෝපායයන් හා ආහාර සංස්කෘතිය පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක් (සීහළවත්ථුප්පකරණය, රසවාහිනීය කෘති ආශ්‍රයෙන්)

ඒ. අනෝමදස්සි හිමි

සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, රජරට විශ්වවිද්‍යාලය

*anomadassi156@Gmail.com*

ක්‍රි. පූ. දෙවන සියවස සිංහල සංස්කෘතිය වර්ධනය වෙමින් පැවති යුගයකි. මෙකල දේශීයන්ගේ ආහාර සංස්කෘතිය හා ජීවනෝපායන් පිළිබඳ විමසා බැලීමේ දී සාහිත්‍ය මූලාශ්‍ර වශයෙන් මෙම කාලයේ රචිත 'සීහළවත්ථුප්පකරණය' හා 'රසවාහිනීය' වැදගත් මූලාශ්‍ර වේ. මෙම කෘතීන්හි අන්තර්ගත කතා තත් කාලීන සමාජ වටපිටාව පිළිබඳ ව වැදගත් තොරතුරු රැසක් ම අනාවරණය කරයි. මෙම කාලයේ දී ගොඩ-මඩ ගොවිතැන ප්‍රධාන ජීවනෝපායක් වූ අතර ඒවාහි මුං, මෑ, ඇල් වී, අමු, මෙනේරි ආදි ධාන්‍ය වර්ග ද වගා කළ බව සීහළවත්ථුප්පකරණයේ 'හංකාලාවගේ' හා 'මහදේව උපාසකගේ' කතාවෙන් පෙනේ. පැල් රකිමින් වගාව ආරක්ෂා කරගත් අයුරුත් කුලියට ගොයම් කැපීම කළ බවත් 'හරිතාලතිස්සගේ' කතාවෙහි දැක්වේ. එහි දී කුලිය වශයෙන් වී අමුණක් ද ලැබී තිබේ. ප්‍රමාණවත් වී ගොවිතැනක් නො වූ කල්හි ලැබුණු වී පරිස්සමට තබා අල-එලාදියෙන් ජීවත් වූ නිර්ධනයෝ ද සිටියහ. ගොවිතැන පමණක් ප්‍රමාණවත් නො වූවන් ගඩොල් කැපීම කළ බවත් සීහළවත්ථුප්පකරණයේ 'දුගී ගොවියගේ' කතාවෙහි දැක්වෙයි. ගවයන් කුලී වැඩට යොදවමින් කළ ගව පාලනය ද මෙකල ප්‍රධාන ජීවනෝපායක් වූ බවට රසවාහිනියේ 'උත්තරෝලිය' කතාවෙන් පෙනේ. පේෂ කර්මාන්තය පිළිබඳ තොරතුරු රසවාහිනියේ 'ධර්මාවගේ' හා සීහලවත්ථුප්පකරණයේ තිස්ස සන්නාලියාගේ කතාවලින් පෙනේ. 'ධර්මාගේ' පුවතේ දී ස්ත්‍රීන් ජීවනෝපාය වශයෙන් ගොවිතැන්, දර දිය ඇදීමාදි කටයුතුද කුලියට කළ බව දැක්වේ. මෙකල ලෝහ කර්මාන්තය ද පැවති අතර පොරව, වෑය. කිරිච්චියාදි ආයුධ ද භාවිත කළ බවට සීහලවත්ථුප්පකරණයේ කතාවන්හි දැක්වේ. මෙකල ආහාර රටාව පිළිබඳ ව විමසා බැලීමේ දී 'මනෝරමංස' කතාවෙහි නිවුඩු හාල් හා කාඩි හොදි සහිත ආහාරයක් පිළිබඳ ව දැක්වේ. මෙකල ආහාර රටාවේ ප්‍රධාන වශයෙන් කිරි හා තදාශ්‍රිත නිෂ්පාදන වූ බව පෙනේ. ඇල්හාලේ බතත් දීකිරිත් උසස් ආහාර ලෙස සලකා තිබේ. භික්ෂූන්ට පිදීමේ දී උසස් අයුරින් පස්ගොරස, චතුමධුර, ගිතෙල් ව්‍යඤ්ජන සහිත බත්, මාංස ආදිය ලබා දුන් බව සඳහන් වේ. මාංස ආහාරය මොවුන්ගේ ආහාර රටාවේ ප්‍රධාන අංගයක් විය. මොනර මාංසය, සූකර මාංසය බොහෝ සෙයින් මෙකල ප්‍රධාන වශයෙන් අනුභව කර තිබේ. අමතර ව හා මාංසය ද අනුභව කළ බව රසවාහිනියේ 'කිඤ්චිසංඝාවගේ' කතාවෙන් පෙනේ. ගුණාත්මක පර්යේෂණයක් වශයෙන් ද්වීතියික මූලාශ්‍ර ඔස්සේ දත්ත රැස් කරමින් මෙකල විසූවන්ගේ ජීවානෝපායන් හා ආහාර රටාවන් පිළිබඳ විමසීම කාලීන වශයෙන් වැදගත් මෙන් ම මෙයාකාර සංස්කෘතියක් තුළ ඔවුන් සෞඛ්‍යාරක්ෂිත ව සිටි අයුරු අපට හඳුනාගැනීමට ද හැකි ය. ක්‍රිස්තු පූර්ව දෙවන සියවස ලක්වැසියන් සරල හා සෞඛ්‍යසම්පන්න ආහාර රටාවක් තුළ විධිමත් ජීවන වෘත්තීන් සහිත ව ජීවත් වූවන් බව තත් මූලාශ්‍රානුකූල ව අපට පැහැදිලි ය.

***ප්‍රමුඛ පදඃ*** *ආහාර සංස්කෘතිය, ජීවනෝපායන්, රසවාහිනිය, සාහිත්‍ය මූලාශ්‍ර, සීහළවත්ථුප්පකරණය*

# Study on the Relationship between Sri Lankan Food Culture and Tourists Satisfaction: Special Reference with Anuradhapura

P. B. S. N. Kumara

University College of Anuradhapura

*sumithranandana@gmail.com*

Food tourism is one of the newly emerging alternative tourism concepts in recent decades. Also, food culture is a part of the socio-cultural, environmental & economic sector in the country and its people. Traditional meals and intangible food cultures create additional value for the destination. It creates competitiveness in the tourism industry. Food culture is one of the best pathways to deliver our traditional experience to the international level. Sri Lanka has more than a thousand years of history about traditional food culture. The aim of this research is to gain knowledge about food culture in Sri Lanka and how it affects the tourism industry. Especially the analysis of the relationship between Sri Lankan food culture & tourist satisfaction. The researcher focused on Anuradhapura as a major tourism destination in the north-central province to collect data. Because most of the food and beverage providers who are located in both urban and rural areas provide traditional food culture for tourists. Primary data was collected through a self-administrative five-point Likert scale questioner. Secondary data had been collected from websites, journal articles, and eBooks. The researcher used a simple random sampling technique. Demographic and statistical analysis has been done using SPSS. This study answered how the Sri Lankan food culture affects tourist satisfaction. Also, research objectives are defined as to find out whether there is a relationship between food culture in Sri Lanka and tourists' satisfaction, to find out the impacts of Sri Lankan food culture toward tourists' satisfaction, and to make a recommendation for the food tourism in Sri Lanka. According to the selected 100 foreign tourists who consume Sri Lankan traditional food and its service, the results of the study emphasize that there is a strong positive relationship created by Sri Lankan traditional foods, food attributes with tourist satisfaction. But the service quality of the Sri Lankan food culture has created a weak positive relationship with tourist satisfaction. Tested variables of Results imply that Sri Lanka can differentiate in the tourism market by using its unique food culture also it can be developed as a marketing strategy for the tourism market. This highlights the importance given to food culture by tourists who identify and get satisfaction through Sri Lankan traditional food culture.

***Keywords:*** *Food Culture, Tourism, Tourist Satisfaction*

# මැක්ඩොනල්ඩ්කරණයෙන් දේශීය ආහාර සංස්කෘතිය මියදීමට පෙර

ඩී. ජී. සී. එච්. යාපා

දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

*haßhaniyapa1994@gmail.com*

ශ්‍රී ලංකාව යනු අතීතයේ සිට ම සුවිශේෂී ආහාර සංස්කෘතියක් හිමිකරගත් සහ ඊට ම ආවේණික වූ ආහාර රටාවක් හිමිකර ගත් රාජ්‍යයකි. ඓතිහාසික සාධක විමසා බලන්නෙකුට ඒ බව මහාවංශය, රසවාහිනිය, ථූපවංශය, මහාබෝධිවංශය මෙන්ම, පුරාවිද්‍යාත්මක සාක්ෂි දෙස බලන්නෙකුට තෝනිගල, මැදිරිගිරිය, බදුලු ටැම්ලිපි බැලීමෙන් ද සාක්ෂාත්කර ගත හැකි ය. නමුත් මෙසේ අතීතයේ සිට පැවත ආ දේශීය ආහාර සංස්කෘතික රටාව 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් සමග වෙනසකට භාජනය වන්නට වූ හෙයින්, එය කාර්යක්ෂම හා ක්ෂණික ආහාර රටාවක් සහිත සංස්කෘතියක් බවට පත් වන්නට විය. එහෙයින් සිදු වූයේ සෞඛ්‍ය සම්පන්න දිවිපෙවත හා බැඳුණු ප්‍රධාන සාධකය වූ පෝෂ්‍යදායී ආහාර යන්න නිෂේධනය වීමත්, නාගරික ජනතාව මැක්ඩොනල්ඩ්කරණය නම් වූ ක්ෂණික, කාර්යක්ෂම, සැහැල්ලු ආහාර රටාවට අනුගත වීමත් ය. ඒ අනුව රටවල් 118ක් පුරා දිවෙන මැක්ඩොනල්ඩ්කරණය තුළ ලංකාවේ දැනට ස්ථාපිත ආයතන 11 ක් ඇති අතර ඒ සියල්ල පාහේ නගරය කේන්ද්‍රය කොට ගෙන පවතී. එහි දී නාගරික ජන ප්‍රජාව බොහෝ කොට මේවායේ ඍජු පාරිභෝගිකයෝ ද වෙති. ග්‍රාමීය ජනයාට සාපේක්ෂ ව පෝෂ්‍යදායී මිල දී ගැනීම් විහීනතාවකින් පෙළෙන මෙම ජනතාවගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් විවිධ රෝගාබාධවලට ද ගොදුරු ව සිටී. ඒ අනුව මා විසින් ගොඩ නගන ලද මූලික තර්කණය වූයේ, මැක්ඩොනල්ඩ්කරණ ආහාර සංස්කෘතියේ අහිතකර ප්‍රතිවිපාක කුඩා දරුවාගේ සිට වැඩිමහලු පුද්ගලයා දක්වා ඇතිව තිබියදීත්, තවදුරටත් ඒ කෙරෙහි සැලකිය යුතු පාරිභෝගික ප්‍රජාවක් ගනුදෙනු කරනු ලබන්නේ ඇයි ද යන්න යි. ඒ අනුව කොළඹ නගරය කේන්ද්‍ර කොට ගනිමින් කරන ලද ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී මූලික වශයෙන් ප්‍රධාන මැක්ඩොනල්ඩ් ආයතන ද්විත්වයක් පර්යේෂණයට බඳුන් කරන ලද අතර ක්ෂේත්‍රීය දත්ත හරහා 65% ක් අනාවරණය කර ගත හැකිවූයේ, මැක්ඩොනල්ඩ්කරණය නම් වූ නාමකරණය හා උසස් බව හෙවත් පැලැන්තිය, නියෝජනය වීම සඳහා ඒ කෙරෙහි අනුගත පාරිභෝගික ප්‍රජාවක් බිහි වන බව යි. එනම් එහි වූ සම්මුඛ සාකච්ඡා හා ඍජු ප්‍රශ්නාවලි ඇසුරෙන් පාරිභෝගිකයින් 25 දෙනෙකුගෙන් ලබා ගත් නියැදි තොරතුරු අනුව එක් පාරිභෝගිකයකු දක්වන්නට වූයේ, "මැක්ඩොනල්ඩ් අවන්හල් අලුත් ය. සේවකයන් තරුණ ය. උනන්දුසහගත ය. කළමනාකරුවන් මෘදු ය. සත්කාරශීලී ලෙසය." ඒ අනුව මේ ඔස්සේ ගොඩනැගෙන විඥානය සමස්තයක් ලෙස ගත් කල මෙකී පාරිභෝගික ප්‍රජාව කාර්යබහුල ජීවිතය නිසාවෙන් මැක්ඩොනල්ඩ්කරණයට පිවිසීම නො ව එහි තිල නාමය නිසාවෙන් පිවිසීම හා පිවිසීම තුළින් උසස් පැළැන්තියක සිටින්නන් බව හැඟවීමට යත්න දැරීමක් බවද, පාරිභෝගික පිරිස ලෙස ගනුදෙනු කරන්නා එදිනෙදා කුලී රැකියාවක නිරතවන්නෙකු නො වන බව ද හඳුනා ගන්නා ලදි.

***ප්‍රමුඛ පදඃ*** *මැක්ඩොනල්ඩ්කරණය, ආහාර සංස්කෘතිය, විහීනතාව, පාරිභෝගික ප්‍රජාව*

# සිංහල නවකතා කෙරෙන් නිරූපිත, ශ්‍රී ලාංකේය ආහාර සංස්කෘතිය (තෝරා ගත් නවකතා කිහිපයක් ඇසුරෙන්)

එන්. ඊ. එච්. ලංකා

සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

*hasini.lanka.@gmail.com*

ශ්‍රී ලාංකේය ආහාර සංස්කෘතිය අධ්‍යයනය කරන කල්හි ගම්‍ය වනුයේ, ඊට ම ආවේණික වූ ඉවුම් පිහුම් කලාවක් සහ ආහාර රටාවක් පවතින බවයි. හුදෙක් ජෛවීය පැවැත්මට පමණක් නො ව සිරිත් විරිත් චර්යා සහ සාමූහික ක්‍රියාකාරකම් කෙරෙහි ද මෙය හේතුකාරක වී ඇත. සාහිත්‍යය වනාහි සංස්කෘතියේ ම සෞන්දර්යාත්මක නිෂ්පාදනයකි. එහෙයින් නිර්මාණකරුවා විසින් නිර්මාණකරණයට අවශ්‍ය නිර්මානුභූති ස්ව ජන සමාජය ආශ්‍රයෙන් ම උපයා ගනු ලබයි. නවකතාව යනු ප්‍රබන්ධාත්මක ආඛ්‍යානයක් වුව, ඒ කෙරෙන් නිරූපණය වනුයේද තථ්‍ය මනුෂ්‍ය ජීවිතයෙන් පැතිකඩකි. එහි දී ඇතැම් නවකතාකරුවන් ස්වකීය නිර්මාණවල චරිත, සිද්ධි හා පසුබිම ගොඩනැගීමේ දී, ආහාර සංස්කෘතිය ආශ්‍රිත විවිධාංග අපූර්වාකාරයෙන් උපයුක්ත ය. නවකතාවේ දී කිසියම් චරිතයක් හරහා "අපි දහවල් ආහාරය ගත්තෙමු" යනුවෙන් පමණක් ප්‍රකාශ නො කර එම ආහාර වට්ටෝරුව සහ එය සකස් කළ ආකාරය චරිතය හරහා ම නිරූපණ ය, බොහෝ නවකතාවල දැකිය හැකි ලක්ෂණයකි. පර්යේෂණයේදී ලාංකේය ආහාර සංස්කෘතිය හා සිංහල නවකතාව අධ්‍යයන ක්ෂේත්‍ර කොට ගැනුණි. 'ශ්‍රී ලාංකේය ආහාර සංස්කෘතිය සිංහල නවකතාවේ නිරූපණය කරනුයේ කෙලෙසද?' යන්න පර්යේෂණ ගැටලුව විය. සුනේත්‍රා රාජකරුණානායක, සුමිත්‍රා රාහුබද්ධ, ශාන්ති දිසානායක හා අනුල ද සිල්වා යන ලේඛිකාවන්ගේ තෝරා ගත් කෘති දහයකට පර්යේෂණය සීමා විය. පුස්තකාලය පරිශීලනය, විෂය ප්‍රාමාණික සම්මුඛ සාකච්ඡා මගින් දත්ත ඒකරාශී කරන ලදි. විවිධ ජන කණ්ඩායම්වල ආහාර පුරුදු හා සිරිත් නවකතාවේ නිරූපිත අයුරු අධ්‍යයනය, ආහාර සංස්කෘතියේ විවිධාංග ප්‍රබන්ධයට එක් කිරීමේ දී රචකයා පරිසේවිත ශිල්පීය උපක්‍රම හඳුනාගැනීම පර්යේෂණයට අරමුණු විය. පර්යේෂණයේදී ගම්‍ය වූයේ, ආහාර පිහුම් ක්‍රම, ආහාර වට්ටෝරු කාන්තා චරිත ආශ්‍රය කරගනිමින් ලේඛිකාවන් විසින් භාවිත කරන ලද බවයි. පොදුපුරුෂයා නවකතාවේ වර්ණාසිගේ චරිතය ආශ්‍රය කොට ගනිමින් ජාඩි දැමීම වැනි ආහාර කල්තබා ගැනීමේ පිළිවෙත් හා ව්‍යංජන සැකසීමේදී කුළුබඩු භාවිත කරන දේශීය ක්‍රමවේදත් නිරූපණය කර තිබීම එහි දී සුවිශේෂ වේ. සඳුන් ගිර ගිනි ගනී නවකතාවේ මෙහෙකාරිය නගරයේ බංගලාවේදී පිළියෙල කළ කෙසෙල්මුව සම්බෝලය ස්වීය ග්‍රාමීය ප්‍රදේශයට ගොස් එහි හිතවතුන්ටද අනුභවය සඳහා සකසන විට, කෙසෙල්මුව ව්‍යංජනය පමණක් අනුභව කිරීමට පුරුදු ව සිටි ගැමියන් විසින් ඇය උපහාසයට ලක් කරනු ලැබීම, නවකතාවේ සිද්ධි හා ක්‍රියාදාම සංවිධානාත්මක ව පෙළගැස්වීමේ දී ලේඛිකාවන් ආහාර සංස්කෘතිය හා සම්බන්ධ සිරිත් සහ පුරුදු භාවිත කර ඇති බැව් සනාථ කරවන්නකි. නවකතාවේ කලාත්මක ගුණය තීව්‍ර කරනු වස් නවකතාවේ තේමා ආශ්‍රිත සංකේත ගොඩනැගීමට අවුරුදු කැවිලි, ආහාර බඳුන් , මළ බත වැනි ආහාර සංස්කෘතියේ විවිධාංග භාවිත බවද සමාලෝචනයේ දී විශද විය.

***ප්‍රමුඛ පද-*** *නවකතාව, චරිතනිරූපණය, ආහාර රටා, ආහාර වට්ටෝරු, සංකේත*

# හලාල් ආහාර සංස්කෘතිය හා ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාවඃ මග්ගොන අක්කරමලේ ග්‍රාමය ඇසුරෙන්

පී. ඩී. එම්. එන් ලක්ෂිත*, පී. වී. අයි. දමයන්ති සහ එස්. සමරසේකර

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

*maleeshanadun19@gmail.com

ආහාර රටා හා බැඳි ආකල්ප, පිළිවෙත්, විශ්වාස සංස්කෘතියෙන් සංස්කෘතියට වෙනස් වේ. ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාවගේ ආහාර රටාව හා ඊට අදාළ චර්යයා එයට හොඳ නිදසුනකි. අල්ලාහ් සහ ඔහුගේ දූතයාණන් අනුමත කොට ඇති සියලු ම දේවල් අරාබි බසින් හලාල් යැයි කියනු ලැබේ. හලාල් ආහාර සංස්කෘතිය මුස්ලිම් ජන ජීවිතය හා බැඳී පවතින ආකාරය විමසීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය පරමාර්ථය යි. පර්යේෂණ නියැදිය වශයෙන් මග්ගොන අක්කරමලේ ග්‍රාම නිලධාරි වසමේ පවුල් 612 ක් අතරින් පවුල් 40ක සසම්භාවී නියැදීම යටතේ තෝරාගත් අතර ඊට අමතර ව ප්‍රදේශයේ ජීවත් වන තතුදත් ග්‍රාම නිලධාරිනී, මස්ජිඩ්හී ප්‍රධාන පූජකතුමා, ගමේ පාසලේ ගුරුවරියක් ඇතුළු පිරිස පරමාර්ථගත නියැදීම යටතේ තෝරාගන්නා ලදි. දත්ත රැස් කිරීමේ දී සම්මුඛ පරීක්ෂණ උපලේඛන, සම්මුඛ සාකච්ඡා හා ගැඹුරු සම්මුඛ සාකච්ඡා පවත්වන ලද අතර නිරීක්ෂණ ක්‍රමවේදය ද යොදා ගැනුණි. මේ පර්යේෂණයේ මූලාශ්‍ර ලෙස ප්‍රාථමික ලිඛිත මූලාශ්‍ර වන ප්‍රදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත් වාර්තා, ලිපි, සිතියම්, ලේඛන ආදිය ද, ප්‍රාථමික අලිඛිත මූලාශ්‍රය වශයෙන් දත්ත දායකයින්ගෙන් තොරතුරු ලබා ගන්නා ලදි. ලිඛිත ද්විතීයික මූලාශ්‍ර ලෙස පර්යේෂණයට අදාළ පොත්පත් සඟරා, ලිපි භාවිත කරන ලදි. අවසාන වශයෙන් අලිඛිත ද්විතියීක මූලාශ්‍ර ලෙස මේ හා සම්බන්ධ වීඩියෝපට, පින්තූර හා හඬපට යොදා ගැනුණි. පර්යේෂණ ප්‍රතිඵල අනුව අනාවරණය වන්නේ මුස්ලිම් ජනතාව හලාල් ආහාර ගැනීමේ ප්‍රධාන අරමුණු වන්නේ දෙවියන්වහන්සේ ළඟට සමීප වීම, ආගමේ දියුණුවට උර දීම, තමන්ගේ නීරෝගීභාවය ලබාගැනීම, දෙවියන් වහන්සේ නිර්මාණය කරන ලද දෑ තමන්ගේ කරගත හැකිවන්නේ හලාල් කිරීමෙන් පමණයි යන විශ්වාසය යන කාරණා ත්‍රිත්වය ම දැක්වූවන් 58%කි. ඒ අතරින් වැඩිදෙනාගේ විශ්වාසය වූයේ තමන්ගේ නීරෝගීභාවය පවත්වා ගැනීම වේ. එය 97%ක ප්‍රතිශතයකි. මෙසේ දත්තදායකයන්ගෙන් වැඩිදෙනෙක් වැඩිහිටියන් වන අතර තරුණයින්ගෙන් 20%කි. මොවුන්ගේ සුළු පිරිසකගේ අදහස නම් මෙම හලාල් ආහාර පමණක් ආහාරයට ගැනීම අපහසු දෙයක් බව යි. මේ අනුව පෙනී යන්නේ මෙම සමාජයේ ජීවත්වන මිනිසුන් හලාල් සංස්කෘතියත් සමඟ තදානුබද්ධ ව බැඳී ඇති ආකාරය යි. එමෙන් ම මොවහු මෙම හලාල් ආහාර සංස්කෘතියෙන් වෙන් වීමට අකමැත්තක් දක්වති. නමුත් තරුණ ප්‍රජාව කෙරෙහි අවධානය යොමු කිරීමේ දී ඔවුන්ගෙන් සුළු පිරිසක් මේ පිළිබඳ ව එතරම් සැලකිල්ලක් නොමැති බව පෙනී යයි' මේ අනුව පෙනීයන්නේ මුස්ලිම් ජනයා ඔවුන්ගේ හලාල් ආහාර සංස්කෘතියත් සමඟ ඉතාමත් තදින් ව්‍යුත්පන්න විය නො හැකි තරමට ම බැඳී පවතින බව යි. මෙම හලාල් ආහාර සංස්කෘතිය සුපිරි වෙළඳසැල්, වෙළඳසැල්, වෙළඳ දැන්වීම් ආදියට පැමිණ ඇත. එය සාමාන්‍ය සමාජයට යම් යම් අර්බුදකාරී තත්වයන් උදා කරන බව පෙනී යයි' නූතන සමාජ සංස්කෘතික වෙනස්කම් සමඟ මෙහි යම් වෙනස් වීම් දැකිය හැකි විය.

***ප්‍රමුඛ පදඃ*** *හලාල්, මුස්ලිම් සංස්කෘතිය, හරාම්, ආගම, ආහාර*

# A Study on The Traditional Eco-Friendly Food Packaging Methods in Sri Lanka

K. G. N. U. Ranaweera* and M. P. A. A. Buddhadasa

Department of Criminology and Criminal Justice, University of Sri Jayewardenepura

*ranaweera@sjp.ac.lk*

Food is an essential human need, and food packaging is an integral part of food that exposes and mirrors the social-cultural values. The purpose of food packaging is based on relocation and consumption as needed. One of the main functions of food packaging is to keep minimal contact or little in common with others; especially from the outside environment by protecting from or avoiding external contamination. Food packaging can prevent or control damage and decomposition of food, keep the maximum beneficial constituents of the product, extend the date of expire, and maintain a good quality of the products. The objective of the research was to identify the traditional food packaging methods in Sri Lankan context with reference to Southern Province. Purposive sampling method was used to select 20 people from Deniyaya area in Matara District. Open discussions were conducted to collect data on traditional eco-friendly food packaging methods. According to the research findings, the essential functions of traditional food packaging were protection, communication, convenience, and containment. The research revealed that Leave cover of areca: *Areca catechu* (*Kolapoth*) was the standard method of food packaging in traditional societies. People have used *kolapoth* after a fermentation method of keeping underwater for several days and excoriating by unthreading the cover. It could reuse for several times if it used for short-term packaging purpose. The same *kolapoth* were used to store honey after making a bag-shaped cover. Half tempered raw banana: *Musa* leaves were used to pack rice and curry while dried banana leaves were used for jaggery. *Kenda*: *Macaranga peltate* leaves were used for packaging of traditional sweetmeats and main courses of the breakfast and as evening snacks while using for the purpose of instant consume. Lotus: *Nelumbo nucifera* leaves (*Nelum kola*) were used instead of banana leaves and had dine-in at the paddy fields. Covering foods (fruits) from *Makulatha*: *Gliricidia sepium* bunches was another food packaging system used predominantly in transportation. Half tempered *Makulatha* leaves were used to quicker ripe of fruits. Cinnamon: *Cinnamomum verum* leaves and curry leaves were used for packaging of dried fish and pickle. The cover of cinnamon sticks was used for the packaging of tea leaves. This cinnamon cover tea was a brand of some tea estates used for communication purpose. *Pan:* Typha angustifolia baskets and small *pan* boxes also used for packaging of tea leaves and sweet meats in the New Year season. Sandboxes were used to preserve lime, jack seeds, and make sweet jack seeds (*weli kos eta*) in traditional folk society in Sri Lanka.

***Keywords:*** *Contamination, Eco-Friendly, Food Packaging, Traditional*

# Banana Leaf Meal: A Tamil Traditional Way of Eating

M. Sivakaran

Home Economics, Faculty of Arts, University of Jaffna

*jmenakaj@yahoo.com*

Leaves are the prime plates to serve food since the time human lived in forests. Serving food on banana leaves is a long-standing Tamil culinary tradition especially in Sri Lanka and South India. Following the traditions serve as an avenue for creating lasting memories of the families. The study was conducted with the objective of studying the value of banana leaf meal in Jaffna district. Data collection was made via interview and discussion from the local elders Thenmaradchi area. Visits were made to the food corners and banquet halls to observe the use of banana leaves for serving foods. Banana leaves are used to serve vegetarian foods in temple festivals, family functions and religious functions. Fresh banana leaves are considered as more sterile during fasting periods. The leaves are thick, large, and flexible to accommodate multicourse Hindu meal and liquid dishes. The leaves cannot be punctured, and they are waterproof. When a hot food served on the leaf, it imparts unique flavour and polyphenols, which are the natural antioxidants on the leaves, are activated. The eco-friendly, non-sticky leaves are free from detergents and the used leaves can be given as livestock feed. The traditional banana leaf meal is eaten with hands by sitting on the floor. The meal is still practised by Hindus in Friday lunch. Banana leaves play major role in offering food in Hindu temples, as they are clean and pure. A meal is generally served on a half leaf and full single leaf is used serve an important and respectable person in the family. Vegetarian food corners use the leaves to serve the customers and the leaves give livelihood for the banana cultivators. Eating on leaves is slowly disappearing with the buffet culture and busy lifestyle. However, people like to follow the traditions and the leaves are cut to fit the dimension of the plate to serve food in banqueting halls. Having food on banana leaves are economical and the use of banana leaf was the backbone of Tamil cutlery. The tradition of eating food on banana leaf should be followed to build up a plastic free healthy nation.

***Keywords:*** *Banana leaf, Tamil Cuisine, traditional, Vegetarian, Hindu*

# නාහෙට්ටිකුලම පුරාණ වැව් ගම්මානයේ සාම්ප්‍රදායික ජලජ ශාකමය ආහාර සංස්කෘතිය

යු. බී. ජී. එස්. එස්. කුමාරි[1] සහ ඩබ්ලිව්. ඒ. එම්. සී. එම්. අධිපත්තු[2]

[1]භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, [2]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*suranjikadhrmasiri@gmail.com*

අතීතයේ පටන් ම ජලය මිනිසාගේ පරිවෘත්තිය ක්‍රියාවන්ගේ සිට නොයෙකුත් අවස්ථාවන්හි දී අතිශය වැදගත් ස්වාභාවික ජීවන සාධකයකි. මෙම අධ්‍යයනය මඟින් පුරාණ වැව් ගම්මානයක් වන වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයට අයත් ජනගහනය දහසක් පමණ වූ පවුල් 250ට අධික නාහෙට්ටිකුලම ග්‍රාමීය ජනතාවගේ සාම්ප්‍රදායික ජලජ ශාක ආහාර රටාව හා ඒ සමඟ බද්ධ වූ සංස්කෘතික ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කිරීම අරමුණු වේ. මෙම අධ්‍යයනයේ දී කරුණු රැස් කිරීම ඩබ්. ඒ. එම්. ටිකිරිමැණිකා, කේ.ඒ.එස්. රත්නලතා, ඩී.එම්. පුංචි මැණිකා, ඩබ්.ඒ.එම් නන්දාවතී, ටී.එම්.එන්.කුමාර, ඩී.එම්. ධර්මදාස යන අයවලුන් ඇතුළු ව පුද්ගලයින් 10ක් සමඟ සම්මුඛ සාකච්ඡා හා සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමය යොදාගනිමින් දත්ත රැස්කිරීම සිදු කරන ලදි. නාහෙට්ටිකුලම ගම්මානයේ මහ වැව නමින් හඳුන්වනු ලබන විශාල වැව හා අනෙකුත් අගාර වැව් හා කොටු වැව් මෙම ආහාර සම්පාදනය සඳහා භාවිත කර ඇත. මෙකී බොහොමයක් වැව් මහ කන්නයේ දී අලුත් වතුරින් පිරුණු පසු වැව්වල හටගන්නා කෙකටිය, ඕලු, මානෙල්, නෙලුම් වැනි ජලජ පැළෑටි වර්ග එක් එක් අවධිවල ආහාරයට ගැනීමට ගැමියන් පුරුදු වී සිට ඇත. කෙකටිය මල් පිපී මාස තුනක් පමණ ගිය පසු ඒවායෙහි හටගන්නා අල ගැමියන් විසින් ලී උල් මඟින් හෑරීම සිදු කරනු ලබයි. එසේ ගලවා ගත් කෙකටිය අල මඩ ගඳ යනතුරු හොඳින් සෝදා නිවෙස්වලට රැගෙන ගොස් ලුණු වතුර දමා තැම්බීම සිදුකරනු ලබයි. එය තැම්බූ පසු ඉතා රසවත් ආහාරයක් වන අතර පොල් සමඟ ආහාරයට ගනු ලබයි. එසේ ම කෙකටිය දළු තෙලට දමා රසවත් ව්‍යංජනයක් පිළියෙළ කරගැනීම ද ගැමියන් විසින් සිදුකර ඇත. ඕලු ගෙඩි හා ඕලු දඬු ගැමියන්ගේ සාම්ප්‍රදායික ජලජ ආහාරවල ප්‍රධාන අංගයක් වේ. ඕලු මල් පිපී අවසන් වන කාලය බලා ගැහැනු උදවිය වැවට බැස මෙම ඕලු ගෙඩි කූඩවලට කඩාගැනීම සිදු කරනු ලබයි. මේ සඳහා සියුම් තරගකාරිත්වයක් දක්නට ලැබෙන අතර එය ඕලු බත්වල ඇති ගුණය හා රසයට ඇති ගිජු බව නිසා ඇතිවන එකක් බව පැහැදිලි විය. මෙම ඕලු ගෙඩි නිවෙස්වලට ගෙනවිත් මුට්ටියක බහා අළු සමඟ මිශ්‍ර කොට කට වසා සතියක් පමණ කුණු වීමට තබා කහට යන තුරු හොඳින් සෝදා ගනු ලැබේ. අනතුරු ව එහි පොත්ත යන තුරු හොඳින් එල කරගනු ලබයි. එසේ එල කරගත් ඕලු ඇට ඕලු හාල් ලෙස හඳුන්වනු ලබන අතර කැකුළු බත් සමඟ කවලම් කොට ඉවීම සිදු කරනු ලබයි. මෙමඟින් හාල් පිරිමැසීම සිදු වන අතර ගුණදායක ආහාරයකි. ඕලු දඬු තෙල් දමා ව්‍යංජනයක් ලෙස සකස්කරගෙන ඇත. මීට අමතර ව අමු නෙළුම් ඇට හා නෙළුම් අල කිරට ඉවීම එදා මෙන් ම අදටත් සිදු කරනු ලබයි. මෙම බොහෝමයක් කටයුතු බවලත් උදවිය විසින් සිදු කරනු ලබන සාමූහික ක්‍රියාවක් ලෙස හා පැරණි සමාජයේ විස්තෘත පවුල්වල සාමූහිකත්වයේ අංගයක් ලෙස හා ග්‍රාමීය ජනයාගේ සෞඛ්‍යයේ සමබරතාව රැකගත් ක්‍රමවේදයක් ලෙස දැක්විය හැකි ය.

***ප්‍රමුඛ පද:*** *වැව් ගම්මාන, සාම්ප්‍රදායික සමාජ, ජලජ, ආහාර සංස්කෘතිය*

# TAMIL ABSTRACTS

# மட்டக்களப்பு மாவட்ட நாட்டார் மருத்துவ மரபுகள் (Folk Medicine Traditions of Batticaloa District)

T. Megarajah

Arts & Culture, Eastern University

*megarajaht@yahoo.com*

இயற்கையோடு பொருந்தி நின்று வாழத்தலைப்பட்ட மனிதர் அவ்வியற்கையை தம் வாழ்வியலின் நிலைபேற்றுக்கேற்பவும் மாற்றியமைத்து வெற்றிகண்டனர். அத்தகைய வாழ்கைக் கூறுகளுள் பாரம்பரிய மருத்துவமுறைகள் முக்கியமானவையாகும். ஆரம்பகால மனிதரின் நீடித்த ஆயுளுக்கும் ஆரோக்கிய வாழ்வுக்கும் இப் பராம்பரிய மருத்துவ முறைகளே அடிப்படையாக அமைந்தன. கிழக்கிலங்கையின் மட்டக்களப்பு மாவட்டம் மருத்துவிச்சி வைத்தியம், சித்த வைத்தியம், ஆயர்வேத வைத்தியம் முதலான நாட்டார் மருத்துவ மரபுகளின் நிலைக்களமாக விளங்குகின்றது. விவசாய பண்பாட்டுச் சூழல் இத்தகைய நாட்டார் மருத்துவ மரபுகளுக்கு அடிப்படையாக அமைந்துள்ளது. உலகமயமாக்கலும் அதன் காரணமாக மரபுகள், பண்பாட்டு வேர்கள், பாரம்பரிய சமூக நடத்தைகள் என்பவற்றை மறுதலிக்கின்ற போக்கும் மேலோங்கியிருக்கும் இன்றைய காலத்தில் மிக நீண்ட காலமாகச் சமூகத்தில் மேலோங்கிக் காணப்பட்டதும் இன்று பேசாப்பொருளாக ஆக்கப்பட்டிருப்பதுமாகிய மருத்துவிச்சி வைத்தியமுறை பற்றிச் சிந்திப்பது முக்கியமானதாகும். அவ்வகையிலேயே இவ்வாய்வு மட்டக்களப்பு நாட்டார் மருத்துவ மரபுகளுள் முதன்மையானதாக விளங்குகின்ற மருத்துவிச்சி வைத்திய முறை பற்றியதாக அமைகின்றது. மகப்பேற்று வைத்தியம் செய்யும் கிராமிய வைத்தியரே மருத்துவிச்சியாவார். இவரால் மேற்கொள்ளப்படும் பாரம்பரிய முறையிலான மகப்பேற்று வைத்தியமே மருத்துவிச்சி வைத்தியம் என்பதாகும். குறிப்பாக கர்ப்பவதியொருவரை அவரது வீட்டிலேயே வைத்து குழந்தையைப் பெற்றெடுப்பதற்காக மேற்கொள்ளப்படும் பாரம்பரிய வைத்திய முறையே மருத்துவிச்சி வைத்தியமுறையாகும். குழந்தை பிறப்பதற்குரிய வைத்தியத்தினைச் செய்யும் மருத்துவிச்சி குழந்தை பிறந்த பின்னரும் குறித்த தாயின் உடல் நலம்பெறும்வரை குறிப்பாகக் குழந்தை பிறந்து பன்னிரண்டாம் நாள் வரையும் தனது சேவையினை ஆற்றுபவராகக் காணப்பட்டுள்ளார். தேவைப்படுகின்ற சந்தர்ப்பத்தில் சித்த வைத்தியரும் மருத்துவிச்சிக்குத் துணையாக இருந்துள்ளார். இவ்வைத்திய முறையில் மந்திரத்தின் செல்வாக்கும் இருந்துள்ளது. மட்டக்களப்புப் பிரதேசத்தில் பல மருத்துவிச்சிகள் இருந்து தன்னலமற்ற, உயிர் காக்கும் பணியை மேற்கொண்டுள்ளனர். போர்க்காலங்களில் மருத்துவிச்சிகளின் பணி மிகவும் தேவைப்பாடுடையதாக இருந்துள்ளது. போக்குவரத்து மற்றும் வைத்தியசாலை வசதிகள் விருத்தியடையாத கிராமியச் சூழலில் வாழ்ந்த மக்கள் மருத்துவிச்சிகளினூடாகவே பயன்பெற்றனர். இன்றைய வைத்திய முறை வியாபாரத் தன்மையுடையதாக மாறியிருக்கிறது. ஆனால் நாட்டுப்புற மருத்துவிச்சிகள் பணம்பெறும் நோக்கமின்றி மனிதாபிமானப் பணியாகவே தம் சேவையை மேற்கொண்டுள்ளனர். பண்பாட்டு மரபினைப் பேணுகின்றவர்களாகவும் இரக்க சுபாவமும் பிறர் சந்தோசத்தைத் தம் சந்தோசமாகக் கருதி மகிழும் மனப்பாங்குடையவர்களாகவும் இவர்கள் திகழ்ந்துள்ளனர். குழந்தை பிறந்தபோது மனம் மகிழ்ந்து இவர்கள் பாட்டுப்பாடும் வழக்கமுடையவர்களாகவும் இருந்துள்ளனர். இப்பாடல் மரபு நாட்டார் இலக்கியத்தில் மருத்துவிச்சி பாடலாக வளர்ந்துள்ளதுடன் மருத்துவிச்சிகளின் மனிதநேயப் பண்பினையும் புலப்படுத்துகின்றன. மருத்துவிச்சி வைத்தியம், மருத்துவிச்சியின் மனிதநேயப் பணி, அதனூடாகப் பண்பாட்டு மரபுகள் பேணப்பட்டமை, மருத்துவிச்சி வைத்தியத்தின் இன்றைய நிலை முதலானவற்றை எடுத்துக்கூறுதல், மருத்துவிச்சி மருத்துவ முறையை ஆவணப்படுத்துதல் முதலானவை இவ்வாய்வின் நோக்கங்களாகும். மட்டக்களப்பு மாவட்டத்திலுள்ள கிராமங்களை ஆய்வின் எல்லைப் பிரதேசங்களாகக்கொண்டு இவ்வாய்வு பகுப்பாய்வு மற்றும் மானுடவியல் நோக்குகளின் அடிப்படையில் அமைகின்றது. கள ஆய்வுகள் மூலம் பெறப்பட்ட நேர்காணல்கள், தகவல்கள் முதலானவை இவ்வாய்வுக்குரிய முதனிலைத் தரவுகளாகவும் சிறு பிரசுரங்கள், பிரதேச செயலக ஆண்டு மலர் வெளியீடுகள் முதலானவற்றில் வெளிவந்த தரவுகள் துணையாதாரங்களாகவும் கொள்ளப்படுகின்றன. மேலைத்தேய வைத்திய முறைகள் விருத்தியடையாத நீண்டதொரு காலப்பகுதியின் மக்களின் மகப்பேற்று வைத்தியத் தேவையை மருத்துவிச்சிகள் மனிதாபிமானச் சேவை நோக்குடன் நிறைவேற்றியுள்ளனர் என்பதும் மேலைத்தேய வைத்திய முறையின் படிப்படியான விருத்தி காரணமாகவும், பாரம்பரிய வைத்திய முறைகளுக்கு முக்கியத்துவம் கொடுக்கப்படாமை காரணமாகவும் இன்று இவ்வைத்திய முறை வீழ்ச்சியடைந்துள்ளது என்பதும் இவ்வாய்வின் முடிவுகளாக முன்வைக்கப்படுகின்றன.

***திறவுச்சொற்கள்:*** *நாட்டார், மருத்துவ முறை, மருத்துவிச்சி, மகப்பேற்று வைத்தியம்*

# கிராமியத் தெய்வ மேன்நிலையாக்கமும் அரசியலும் - அண்ணமார் வழிபாட்டை அடிப்படையாகக் கொண்ட ஓர் ஆய்வு (Politics and Upliftment of The Village God Faith)

J. Thevarajah

Department of Tamil, University of Peradeniya

*jeganpdn@gmail.com*

